මෙය දෙමළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් වෙනම මුද්‍රණය කර ඇත.

අංක. I දරන සැසි වාර්තාව - 2000

# බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව.

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2000 මාර්තු

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේදී මුද්‍රණය කරන ලදී.

කොළඹ 1 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ගත හැකිය.

මිළ : රු.පි. 84.00 තැපැල් ගාස්තුව : රු.පි. 10.00

1-H 007107

H 007107 (2000/05)

# බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව.

PL 15169 - 375 (2025/03)

## ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව හා එහි ප්‍රධාන නිලධාරීන්



වමේ සිට දකුණට: ජී.කේ.ජී.පෙරේරා මහතා ( ලේකම්) එස්.සී.පතිරණ මහතා ( ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී), යසන්ත කෝදාගොඩ මහතා (රජයේ නීතිඥ) ජ.නි., ආර්.අයි. ඔබේසේකර මහතා, ගරු ඩී. ජයවික්‍රම මහතා ( අභියාචනාධිකරණයේ විනිශ්චයකාර- සභාපති), ගරු ජ.නි. එන්.ඊ.දිසානායක මහතා (මහාධිකරණ විනිශ්චයකාර - සාමාජික), සරත් ජයමාන්න මහතා ( රජයේ නීතිඥ), ටී.වී. සුමනසේකර මහතා ( නියෝජ්‍ය පොලිස්පති), එච්.එච්.එම්.ආර්.ප්‍රේමරත්න මහතා (පොලිස් අධිකාරී),

## පටුන

පිටුව


I. වන පරිච්ඡේදය — වාර්තාගත වියයුතු කරුණු 08

II. වන පරිච්ඡේදය — පුද්ගලයින් සමහරක් දෙනා ගැන හැඳින්වීම 15

- කීර්ති අතපත්තු 15
- නලින් දෙල්ගොඩ 15
- එම්. එම්. ආර්. (මෙරිල්) ගුණරත්න 16
- අජිත් ජයසිංහ 16
- අර්නස්ට් පෙරේරා 16
- ඩග්ලස් පීරිස් 17
- රෝහිත ප්‍රියදර්ශන 21
- රනිල් වික්‍රමසිංහ 21
- රන්ජිත් වික්‍රමසිංහ 22

III. වන පරිච්ඡේදය — ආරක්ෂක තත්ත්වය පිරිහීම හා ප්‍රචණ්ඩ ක්‍රියා වැඩිවීම 23

- ජනතා විමුක්ති පෙරමුණ 23
- ජ. වි. පෙ. තහනම් කරනු ලබයි
- ප්‍රචණ්ඩ ක්‍රියා ආරම්භ වේ. 27
- ප්‍රතිවිරුද්ධ පියවර 30
- ජ. වි. පෙ. පාලනය කරනු ලබයි 32

IV. වන පරිච්ඡේදය — බටලන්ද නිවාස යෝජනා ක්‍රමය 34

V. වන පරිච්ඡේදය — නීති විරෝධී රැඳවුම් මධ්‍යස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම 42

- පොලිස් නිලධාරීන්ට නිවාස වෙන්කරදීම 42
- බටලන්ද නිවාස නීති විරෝධී ක්‍රියා සඳහා පාවිච්චි කිරීමට හේතු 52
- බටලන්ද නිවාස පුද්ගලයින් නීති විරෝධීව රඳවා ගෙන ඔවුන්ට වධදීමට පාවිච්චි කිරීම 56
- කාඩන පීඩනවලට ගොදුරු වූවෝ
  - අර්ල් සුගී පෙරේරා 57
  - වාසල ජයසේකර 63
  - තලේරත්න මුදලිගේ බන්දුල 68
  - අතුරනගේ විමල් අත්තනායක 73
- අජිත් ජයසිංහ 76
- තිස්ස පළිපාන 78
- කාඩන පීඩනවලට ලක්වූ තවත් බොහෝ අය 79
- එම ක්‍රියාවලියට වගකිවයුතු වූවෝ 79

| | | පිටුව |
|---|---|---|
| | ● නීති විරෝධී වැඩපිළිවෙලට සම්බන්ධ වෙනත් අය | 81 |
| | ● වින්සන්ට් ප්‍රනාන්දු | 81 |
| | ● බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙහි පැවැති රැස්වීම් | 87 |
| | ● නීතිඥ විජයදාස ලියනාරච්චි | 92 |
| VI. වන පරිච්ඡේදය | සපුගස්කන්ද පොලිස් ස්ථානයට පහරදීම | 99 |
| | ● ඊට අනතුරුව සිදුකෙරුණු විමර්ශණයන් | 102 |
| VII. වන පරිච්ඡේදය | උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන ඇතුරුදහන්වීම | 109 |
| | ● පසුබිම | 109 |
| | ● අතුරුදහන්වීම | 111 |
| VIII. වන පරිච්ඡේදය | උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ අත්අඩංගුවට ගැනීම හා රඳවා තබාගැනීම | 120 |
| | ● පසුබිම | 120 |
| | ● ප්‍රියදර්ශන සොයා යාම | 120 |
| | ● ජයසිංහ අත්අඩංගුවට ගැනිණි | 121 |
| | ● ජයසිංහ රඳවා තබාගැනීම ඇරඹෙයි | 124 |
| | ● ජයසිංහ නිදහස් කෙරිණි | 127 |
| | ● කඩකප්පල්කාරීන් සමග ජයසිංහට හා ප්‍රියදර්ශනට තිබූ සම්බන්ධකම් ...? | 128 |
| | ● ජිනේගේ වැදගත්කම ...? | 129 |
| | ● ජිනේ අත්අඩංගුවට ගැනිණි | 129 |
| | ● ජිනේ පාපෝච්චාරණය කරයි | 130 |
| | ● ප්‍රියදර්ශන හා ජයසිංහ ප්‍රහාරයට සම්බන්ධවීම | 132 |
| | ● කලුවා සහ ශාන්තලාල් | 134 |
| | ● පාපෝච්චාරණය කුමන අරමුණක් සඳහා ද? | 136 |
| — | ● ජිනේට සිදුවූයේ කුමක් ද | 138 |
| | ● ජිනේ අතුරුදහන් වෙයි | 140 |
| | ● ජිනේට විරුද්ධව නඩු පවරයි ... අනභිමුඛයේ වරදකරු කරනු ලබයි. | 143 |
| IX. වන පරිච්ඡේදය | තීරණ | 147 |
| | තීරණ සාරාංශය | |
| | අදහස් දැක්වීම් හා නිරීක්ෂණ | |
| | සමාප්ති සටහන් | 160 |
| X. වන පරිච්ඡේදය | නිර්දේශය | 162 |
| ඇමුණුම ඒ | : අධිකාර පත්‍රය | 165 |
| ඇමුණුම බී | : කොරතුරු කැඳවීමේ නිවේදන .. | 193 |
| ඇමුණුම සී | : සාක්ෂිකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු | 196 |

පිටුව

| | | | |
|---|---|---|---|
| ඇමුණුම ඩී | : | විමර්ශන කණ්ඩායම | 197 |
| ඇමුණුම ඊ | : | කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය | 198 |
| ඇමුණුම එෆ් | : | ආදර්ශ සිතාසි | 199 |
| ඇමුණුම ජී | : | සාක්ෂිකරුවන්ගේ නාම ලේඛනය | 201 |
| ඇමුණුම එච් | : | ලියවිලි හා ඉදිරිපත් කිරීම්වල ලැයිස්තුව | 204 |

## 1 වන පරිච්ඡේදය

## වාර්තාගත විය යුතු කරුණු

වර්ෂ 1995 සැප්තැම්බර් මස 21 වන දින දරන අධිකාර පත්‍රයේ සඳහන් කරුණු ගැන පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා, 1950 අංක 8, 1953 අංක 40, 1955 අංක 8, 1955 අංක 29 යන පනත් වලින් සංශෝධිත, 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය ප්‍රකාර අතිගරු ඔබතුමිය විසින් මෙම කොමිෂන් සභාව ûõßæØù ලදි. අදාල පරීක්ෂණය කළයුතු වූ කාරණා සම්බන්ධව වඩාත් පුළුල් ක්ෂේත්‍රයකට විහිදෙන අතුරු, කාරණා සැලකිල්ලට ගෙන අතිගරු ඔබතුමිය 1995 දෙසැම්බර් මස 15 වන දින, යට සඳහන් අධිකාර පත්‍රය අවලංගු කර 1995 දෙසැම්බර් මස 15 වන දින දරන නව අධිකාර පත්‍රයක් ප්‍රකාශයට පත් කළේය. මෙම අධිකාර පත්‍රයේ අඩංගුවූ කරුණු ඉක්බිතිව 1995 දෙසැම්බර් මස 19 වන දින හා අංක 902/8 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ( A ඇමුණුම - A 1 හා A 2 ) පළකරන ලදි.

මුල් අධිකාර පත්‍රය අනුව පරීක්ෂණය නිම කොට 1995 සැප්තැම්බර් මස 20 වන දින වන විට වාර්තාව ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවට නියම කරන ලදි. එසේ වුවද, ඉහතින් සඳහන් කරන ලද පරිදි අතිගරු ඔබතුමිය විසින් අලුත් අධිකාර පත්‍රයක් ප්‍රකාශයට පත්කරන ලදි. එම අධිකාර පත්‍රය අනුව, පරීක්ෂණය නිම කොට 1996 මාර්තු මස 14 වන දින වන විට වාර්තාව ඉදිරිපත් කරන ලෙසට මෙම කොමිෂන් සභාවට නියම කරන ලදි. එසේ වුවද, කොමිෂන් සභාවට පරීක්ෂණයට ලක්කරන ලෙස නියම කරන ලද කරුණුවල සංකීර්ණත්වයත් වෙනත් කරුණු රැසකුත් සැලකිල්ලට ගෙන අතිගරු ඔබතුමිය කොමිෂන් සභාවට දෙන ලද එම කාලසීමාව අවස්ථා දොළහක දී (12) දීර්ඝ කලෙහිය. එම කාලසීමාව දීර්ඝ කිරීම්, 1996 මාර්තු මස 13 වන දින, 1996 මැයි මස 29 වන දින, 1996 සැප්තැම්බර් මස 10 වන දින, 1996 දෙසැම්බර් මස 14 වන දින, 1997 පෙබරවාරි 13 වන දින, 1997 මාර්තු මස 05 වන දින, 1987 මැයි මස 14 වන දින, 1997 ජූලි මස 11 වන දින, 1997 සැප්තැම්බර් මස 12 වන දින, 1997 නොවැම්බර් මස 13 වන දින, 1997 දෙසැම්බර් මස 31 වන දින, 1998 ජනවාරි මස 28 වන දින යන දිනයන්හි සිට ක්‍රියාත්මක වන ලෙසට දෙන ලදි. අවසන් වරට දෙන ලද දීර්ඝ කිරීම අනුව මෙම කොමිෂන් සභාවට නියම කරනු ලැබුයේ 1998 මාර්තු මස 26 වන දින වන විට අතිගරු ඔබතුමියට වාර්තාව ඉදිරිපත් කරන ලෙසටය.

1995 දෙසැම්බර් මස 15 වන දින දරන අධිකාර පත්‍රය අනුව, පහත සඳහන් කාරණා ගැන පරීක්ෂා කොට වාර්තා කරන ලෙසට මෙම කොමිෂන් සභාවට නියම කරනු ලැබින:

(අ) 1990 පෙබරවාරි මස 20 වන දින හෝ ඒ ආසන්නයේදී උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට අදාල අවස්ථානුගත කරුණු සහ ඒ අතුරුදහන්වීම ගැන වගකිවයුතු පුද්ගලයින්.

(ආ) 1990 පෙබරවාරි මස 24 වන දින හෝ ඒ ආසන්නයේදී, උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ අත්අඩංගුවට ගැනීම හා පසුව රඳවා තබාගැනීමට අදාල

අවස්ථානුගත කරුණු සහ එකී අත්අඩංගුවට ගැනීම හා රඳවා තබාගැනීම ගැන වගකිවයුතු තැනැත්තන්.

(ඇ) රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ යම් රඳවා තබාගැනීමේ ස්ථාන 1988 ජනවාරි මස 01 වන දින හා 1990 දෙසැම්බර් මස 31 වන දින අතර කාලසීමාව තුළ පිහිටුවා පවත්වා ගෙන යාම සහ එසේ රඳවා ගෙන සිටි පුද්ගලයින් අමානුෂික හා අවමන් සහගත සැළකිල්ලට (වධදීම් වලට) භාජනය කරනු ලැබුවේද යන වග සහ එකී නීති විරෝධී ක්‍රියාවන්ට වග කිවයුතු පුද්ගලයින්.

(ඈ) ඉහතකී කරුණු සම්බන්ධයෙන් යම් පරීක්ෂණයක් පවත්වනු ලැබුවේ ද යන වග සහ යම් තැනැත්තන් විසින් කෙළින්ම හෝ අනියම් ආකාරයෙන් එකී පරීක්ෂණයට මැදිහත් වූයේ ද යන වග.

(ඉ) යම් නීතියක් යටතේ යම් සාපරාධී වැරදි කිරීම සම්බන්ධයෙන් හෝ ඉහතකී යම් කාරණයක් සම්බන්ධයෙන් බලතල අයුතු බලපෑම් කිරීම හෝ වැරදි ලෙස හෝ අයථා ලෙස පාවිච්චි කිරීම සම්බන්ධයෙන් යම් නිලධාරියෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු වගකිවයුතු ද යන වග.

ඉහත සඳහන් කාරණා සම්බන්ධයෙන් උචිත නිර්දේශ ඉදිරිපත් කිරීමටද කොමිෂන් සභාවේ අධිකාර පත්‍රයෙන් කොමිෂන් සභාවට බලය දෙන ලදී.

පරීක්ෂණ කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ අතිගරු ඔබතුමියට ඔබතුමියගේ අභිමතය පරිදි කොමසාරිස්වරයෙකු ලෙස ඕනෑම තැනැත්තෙකු පත්කිරීමට හැකි වුවද, අතිගරු ඔබතුමිය කොමිෂන් සභාවට කොමසාරිස්වරුන් දෙදෙනෙකු පත්කිරීම සම්බන්ධයෙන් ඔබතුමියගේ ලේකම්තුමා මගින් ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගේ නිර්දේශ ඉල්ලා සිටි බව අපි දන්නෙමු. ගරු ඔබතුමිය අප පත් කළේ එසේ ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගේ නිර්දේශ මතය.

කොමසාරිස්වරුන් කොළඹදී නඩු විනිශ්චය සිදුකරන්නාවූ මුල් හා ඇපැල් යන දෙයාකාර නඩු විනිශ්චය සම්බන්ධ අධිකරණ බලය ඇත්තාවූ බස්නාහිර පළාතේ මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් බැවින් අදාල මහාධිකරණ දෙකට එදිනෙදා පැවරෙන අධිකරණ වැඩ කටයුතුවලට බාධාවක් නොවන ලෙසට කොමිෂන් සභාවට සම්බන්ධව වැඩ කටයුතු පස්වරුවට නියම කර ගන්නා ලදි. තවද, කොමිෂන් සභාවේ රාජකාරී පවරනු ලැබූ, නීතිපතිවරයා නියෝජනය කළ රජයේ නීතිඥවරුන් දෙදෙනාටද කොමිෂන් සභාවට සහායවීමට සිදුවුනේ සිය සාමාන්‍ය රාජකාරිවලට අමතරවය. කොමිෂන් සභාව ක්‍රියාත්මකවීම ආරම්භවීමෙන් පසු අධිකාර පත්‍රයේ නිර්ණේය විෂයයන්ගේ අතිශය වැදගත් අංශයන්ට අදාල තොරතුරු, කරුණු හා සාක්ෂි දීමට පෙර නොවූ විරූ සාක්ෂිකරුවන් විශාල සංඛ්‍යාවක් සිය කැමැත්තෙන්ම ඉදිරිපත් විය. එහෙයින් කොමිෂන් සභාවේ වැඩට වෙන්කොට සිටි විමර්ෂකයින්ට පූර්ණ හා විස්තරාත්මක විමර්ෂණයන් කිරීමට සිදුවිය. එහෙයින් මුල් අධිකාර පත්‍රයෙහි සඳහන් කර ඇති පරිදි වාර්තාව ඉදිරිපත් කිරීමට කාලසීමාවේ දීර්ඝ කිරීම් ලබාගැනීමට සිදුවිය.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හිටපු නිලධාරියකු වූත්, නීතිඥයෙකු වූත් එස්. ගුණවර්ධන මහතා කොමිෂන් සභාවේ ලේකම් ලෙස පත්කරන ලදී. කෙටි කාලසීමාවක් කොමිෂන් සභාවේ ලේකම් ලෙස කටයුතු කළ ගුණවර්ධන මහතා 1996 පෙබරවාරි මස 01 වන දින සේවයෙන් ඉල්ලා අස්විය. කෙටි කාලසීමාවකට සහකාර ලේකම් ඩේවිඩ් ගිගනගේ මහතා වැඩබලන ලේකම් ලෙස පත්කරනු ලැබුවේය. ඉක්බිතිව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන පංතියේ 1 වන ශ්‍රේණියේ නිලධාරියෙකු වූ ජී.කේ.ජී. පෙරේරා මහතා 1996 ජූනි මස 07 වන දින ලේකම් ලෙස පත්කරන ලදී. පෙරේරා මහතා කොමිෂන් සභාව අවසන් වන තෙක්ම එහි ලේකම් ලෙස මෙහි "E" ඇමුණුමෙහි නම් දැක්වෙන නිලධාරී මණ්ඩලයේ සහාය ඇතිව රාජකාරි කළේය.

ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ හිටපු රජයේ අධි නීතිඥයකුද , ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ( 1996 ) මානව අයිතිවාසිකම් කමිටුවේ සභාපතිවරයා ද වූ අතර, සුප්‍රසිද්ධ අපරාධ නඩු බොහෝ සංඛ්‍යාවකට රජය වෙනුවෙන් මෙන්ම විත්තිය වෙනුවෙනුත් පෙනී සිට ඇත්තාවූ ජනාධිපති නීතිඥ ආර්.අයි. ඔබේසේකර මහතාට කොමිෂන් සභාවට සහායවීමට ඉදිරිපත් වන ලෙස කොමිෂන් සභාව විසින් ආරාධනා කරන ලදී. කොමිෂන් සභාවට සහායවීමට රජයේ නීතිඥයින් දෙදෙනෙකු නම් කිරීමට එවකට ඇටෝර්නි ජනරාල්වරයා වූ ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසීස් මහතාට කරන ලද ආරාධනයක් අනුව, සරත් ජයමාන්න හා යසන්ත කෝදාගොඩ යන රජයේ නීතිඥවරුන් දෙදෙන නම් කරන ලදුව, රාජකාරි පවරනු ලැබිණ. දැනට ඇටෝර්නි ජනරාල් ධුරය දරන ජනාධිපති නීතිඥ ගරු සරත් එන්. සිල්වා මහතා විසින් පෙරකී රජයේ නීතිඥවරුන් දෙදෙනාට, ඔවුන්ගේ අප්‍රමාද අවධානයට ලක්වීම අවශ්‍ය වූ වෙනත් වෘත්තීයමය රාජකාරි කිරීමට ඔවුන්ට පවරා තිබුනේ වී නමුත් කොමිෂන් සභාව අවසානය දක්වා ඊට සහායවීම කරගෙන යාමට කාරුණිකව අවසර දෙනු ලැබිණ. සාක්ෂිකරුවන්ගේ සාක්ෂි පරීක්ෂාව මෙම නීතිඥවරුන් තිදෙනා විසින් කරන ලදී.

කොමිෂන් සභාවට අවශ්‍ය විමර්ශණයන් කිරීමට, නියෝජ්‍ය පොලිස්පති ටී.වී. සුමනසේකර සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එස්.සී. පතිරණ යන මහතුන්ගේ ප්‍රධානත්වයෙන් යුත් පොලිස් නිලධාරී කණ්ඩායම් දෙකක් කොමිෂන් සභාවට සහාය විය. පොලිස් අධිකාරී එච්.එච්.එම්.ආර්. ප්‍රේමරත්න මහතා, ටී. වී. සුමනසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් වූ ( අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ) විමර්ශන කණ්ඩාමයට, කොමිෂන් සභාව පත්කිරීමට ප්‍රථමයෙන් අධිකාර පත්‍රයේ යම් යම් අංශවලට අදාල ප්‍රාරම්භක විමර්ශණයන් කිරීමට අධාර කරන ලදී. කොමිෂන් සභාව පිහිටුවීමේදී එම තොරතුරුද සළකා බලන ලද බව අපට දැනගන්නට ලැබින. මෙම කොමිෂන් සභාව ආරම්භ වීමෙන් පසුවද, පෙරකී නිලධාරී කණ්ඩායම ඔවුන් විසින් එවකටත් විමර්ශණ පවත්වා ඇති යම් යම් කාරණා සම්බන්ධයෙන් විමර්ශණ පැවැත්වීම තවදුරටත් කරගෙන ගියේය. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එස්.සී. පතිරණ මහතාගේ ප්‍රධානත්වයෙන් වූ විමර්ශන කණ්ඩායම කොමිෂන් සභාවට ස්ථිර පදනමින් අනුයුක්ත කරන ලද නිලධාරීන්ගෙන් යුක්ත විය. මෙම කණ්ඩායමට ඊට විමර්ශන පවත්වා වාර්තා කරන ලෙස කොමිෂන් සභාව විසින් නියම කරන ලද සියළු කාරණා ගැන විමර්ශන පවත්වා කෙළින්ම කොමිෂන් සභාවට වාර්තා කළේය. විමර්ශණ ඒකකවල සේවය කළ පොලිස් නිලධාරීන්ගේ නම් "D" ඇමුණුමෙහි දැක්වේ.

කොමිෂන් සභාවේ අධිකාර පත්‍රයට හා නිර්ණේය විෂයයන්ට පෙර නොවූ විරු ලෙසින් පොදු මහජනයාගේ අවධානය යොමු විය. මෙය බොහෝ සෙයින්ම කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතුවලට මුද්‍රිත මෙන්ම විද්‍යුත් මාධ්‍ය විසින් දෙන ලද පුළුල් ප්‍රචාරය නිසා විය හැකිය. පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් කොමිෂන් සභාවේ රැස්වීම්වලට පැමිණ එම කටයුතු නිරීක්ෂණය කළ බවද

නිරීක්ෂණයට ලක්විය. කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත්වෙන ස්ථානවලට නිදහසේ හා බාධාවක් නොමැතිව පැමිණ එහි වැඩකටයුතු නැරඹීමට මහජනයාට හැකිවිය. කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ජනමාධ්‍යවල පළවූ වාර්තාවලට එළදායී ප්‍රතිචාරයක් ඇතිවිය. කොමිෂන් සභාවට භාර කාරණා පරීක්ෂණයට ලක් කිරීමෙන් පැන නැගී කාරණා ගැන ඉතා වැදගත් තොරතුරු කොමිෂන් සභාවට ලැබිණ. කොමිෂන් සභාවේ කටයුතුවලට ඉහළ මට්ටමක මහජන සහභාගීත්වයක් තිබූ බව සඳහන් කිරීමට කොමිෂන් සභාව කැමතිය. මෙයින් පෙනී ගියේ, පරීක්ෂණයට භාජනව තිබෙන කාරණා සම්බන්ධ සත්‍යාසත්‍ය භාවය තමන්ට ද විමසා දැනගැනීමට තදබල සැලකිල්ලක් හා උනන්දුවක් මහජනයා තුළ තිබුණු බවය.

ඇතැම් දිනවල කොමිෂන් සභාවේ කටයුතු නිසි අයුරු සිදුවන්නට සැලසීමටත්, කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි සාක්ෂිකරුවන්ගේ ආරක්ෂා සහිත බව හා ඔවුන්ට බියක් ඇති නොවීම සහතික කරනු පිණිසත් විශේෂ ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සිදුවිය. එක්තරා දිනෙක, එනම්, ගරු විරුද්ධ පක්ෂ නායකතුමා සාක්ෂි දීමට පැමිණි දිනෙක, කොමිෂන් සභාවේ හා අවට වූ කොළඹ මහාධිකරණ සංකීර්ණයේ උසාවිවල කටයුතු කඩා කප්පල් වීමක් සිදුවූ බව වාර්තාගත කරන්නේ කණගාටුවෙනි. මෙය සිදුවූයේ පෙරකී සාක්ෂිකරුට ජයඝෝෂා කිරීම සඳහා කොමිෂන් සභා පරිශ්‍රයට හා ඒ අවට ප්‍රදේශයට පැමිණි පුද්ගලයින් විසින් කිසියම් ප්‍රමාණයකට අසංවරව හා නොහික්මුණු ලෙසට හැසිරීම නිසාය. එක් මොහොතක කොමිෂන් සභා උසාවි කාමරය තුළ සිටි අයට හොඳින් හැසිරෙන ලෙසට අවවාද කිරීමට කොමිෂන් සභාවට සිදුවිය.

කොමිෂන් සභාවේ නිර්ණේය විෂයයන්ට සම්බන්ධ නියෝජනයන් කැඳවමින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා දිනපතා පුවත්පත්වල දැන්වීම් පළකිරීමට කොමිෂන් සභාව විසින් සළස්වන ලදී. ( "B" ඇමුණුමෙහි මෙම දැන්වීම්වල පිටපත් පළවේ.) නම හා ලිපිනය සඳහන් කරමින් අදාල ලිඛිත නියෝජනයන් ඉදිරිපත් කළ පුද්ගලයින්ගෙන්, පළමුව කොමිෂන් සභාවට සහාය වන පොලිස් නිලධාරීන් විසින් ප්‍රශ්න කරන ලදී. ඉක්බිතිව, කොමිෂන් සභාවේ නිර්ණේය විෂයයන් තුළට වැටෙන කාරණා ගැන විශ්වසනීය තොරතුරු සැපයිය හැකි යයි කොමිෂන් සභාව සළකන අය කොමිෂන් සභාව විසින් සාක්ෂිකරුවන් ලෙසින් කැඳවනු ලැබූහ. සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශන වාර්තාගත කර ගැනීම හා ඔවුන් කැඳවීම පිළිබඳ සියළුම තීරණ ගනු ලැබුවේ කොමසාරිස්වරුන් විසින් බව සැලකිල්ලට ගතයුතුය. තවද, එක් සාක්ෂිකරුවෙකුගේ ප්‍රකාශයේ ස්වභාවය සලකා බැලූ කොමිෂන් සභාව ඔහුගේ ප්‍රකාශය රහස්‍ය ලෙස වාර්තාගත කොට ගැනීමට තීරණය කළේය. අනිකුත් සියළුම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි කොමිෂන් සභාවේ විවෘත රැස්වීම්වලදී වාර්තාගත කර ගන්නා ලදී.

පරීක්ෂණ කොමිෂන් සභා පනතින් විධිවිධාන සළසා ඇති පරිදි සාක්ෂිකරුවන් නීතිඥයින් මගින් නියෝජනය කරනු ලැබීමට කොමිෂන් සභාව අවසර දුන්නේය. එම නීතිඥයින්ට තම තමන්ගේ සේවාදායකයින්ට විරුද්ධව සාක්ෂි දුන් සාක්ෂිකරුවන් විභාග කිරීමට එම ඉඩ දෙන ලදී. මෙම විභාගය හරස් ප්‍රශ්න ඇසීමක ස්වරූපය ගත් අතර, එම ක්‍රියාවලියේදී නීතිඥවරු සාක්ෂිකරුවන්ගේ විශ්වාසනීයත්වය දෝෂ දර්ශනයට ලක්කිරීමටත් , තම සේවා දායකයින්ගේ වාසියට සිටින සාක්ෂි ලබාගැනීමටත් තැත් කළහ. රහසේ සාක්ෂි දුන් එකම සාක්ෂිකරුද එසේ පරීක්ෂාවට භාජනය කරනු ලැබිණ. එසේ වුවද, යම් යම් සාක්ෂිකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයින්, එම සාක්ෂිකරුවන්ට විරුද්ධව නඟා තිබෙන චෝදනා ප්‍රතික්ෂේප කළ අතර, තමන්ගේ සේවාදායකයින්ට විරුද්ධව කලින් සාක්ෂි දී ඇති සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට ඉදිරිපත්වී නොමැති බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ලක්ව තිබේ. උචිත අවස්ථාවලදී මෙම

කොමිෂන් සභාව, යම් යම් සාක්ෂිකරුවන්ට විරුද්ධව කලින් සාක්ෂි දී ඇති සාක්ෂිකරුවන් විභාගයට ලක් නොකිරීම සම්බන්ධයෙන් බැය ගන්නා ලද අනුමිති අඩ වශයෙන් පාදක කොටගෙන තීරණවලට එළඹ ඇත. විශේෂයෙන් සඳහන් කළයුතු තවත් කරුණක් නම්, සාක්ෂිකරු ( එනම්, වැඩ තහනම් කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී) ඩග්ලස් පීරිස් ගේ ( මෙම පොලිස් නිලධාරියා කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ කැලණිය පොලිස් කොට්ඨාශයේ මෙහෙයුම දක්ෂ ලෙස සැලසුම් කොට ක්‍රියාත්මක කල මහ මොලකාරයා යයි කියනු ලැබේ . තවද, මෙම ඒකකය බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ සිට ක්‍රියාත්මක වූයේ යයිද කියනු ලැබේ.) අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පෙනී සිටි නීතිඥයා වූ තලින් ලද්දුවහෙට්ටි මහතා කොමිෂන් සභාවෙන් සාධාරණ විනිශ්චයක් තමාට බලාපොරොත්තු විය නොහැකි යයි කියමින් හදිසියේ කොමිෂන් සභාවෙන් පිටව ගිය අතර, විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මහතා කොමිෂන් සභාවට කැඳවන තුරු කොමිෂන් සභාවට නොපැමිණ සිටියේය. එකී අවස්ථාවෙහි මෙකී නීතිඥවරයා වික්‍රමසිංහ මහතාගේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ තැන වශයෙන් පෙනී සිටි හිටපු ඇටෝර්නි ජනරාල් ජනාධිපති නීතිඥ තිලක් මාරපන මහතාගේ කණිෂ්ඨ නීතිඥවරයකු ලෙස කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටියේය. පිට පිට දෙදිනක් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි මාරපන මහතා කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතු ගැන කොමිෂන් සභාව ඉදිරියේ විරෝධයක් නො පෑ ය. පෙරකී අධි නීතිඥවරයා කණිෂ්ඨ සහායකයා ලෙස සිටියදී මාරපන මහතා තවදුරටත් ප්‍රයෝජනවත් ලෙස කොමිෂන් සභාවට ආධාර කළේය. තවද විශ්‍රාමලත් ප්‍රධාන පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ (කලින් සඳහන් කල කඩා කප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය භාර නිලධාරියා) වෙනුවෙන් පෙනී සිටි අධි නීතිඥවරයා වූ නෙවිල් අබේරත්න මහතා මුල සිටම කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි අතර, එහි අවසානය දක්වාම එහි සැසිවාරවලට සහභාගී විය. සාක්ෂිකරුවන් වෙනුවෙන් පෙනීසිටි සියළුම නීතිඥවරුන්ගේ නාම ලේඛණයක් "C" ඇමුණුමෙහි දැක්වේ.

ඩග්ලස් පීරිස් මහතා ස්වේච්ඡාවෙන්ම 1996 පෙබරවාරි මස 02 වන දින කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් තමා වෙනුවෙන් පෙනී සිටින ලෙස නීතිඥ තලින් ලද්දුවහෙට්ටි මහතාට උපදෙස් දුන්නේය. මේ අනුව, තමන් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටි සියළුම සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට ඔහුට අවස්ථාව ලබාදෙන ලදී. එසේ වුවද කොමිෂන් සභා කටයුතු සිදුවූ දින කීපයකින් පසු පීරිස් මහතා කොමිෂන් සභාවේ කටයුතුවලට සහභාගීවීමෙන් වැලකී සිටින්නට විය. කොමිෂන් සභාව ඒ ගැන විමර්ෂණයක් කලේ නැත. කුමක් නිසාද යත්, පීරිස් මහතාට සියළුම දිනවල කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට බලකිරීමක් නොතිබුණු නිසා හා ඔහුට එසේ පෙනී සිටීමට සිතායි නිකුත් කොට නොතිබුණු නිසාත්ය. ඉක්බිතිව කලින් සඳහන් කරන ලද පරිදි 1996 .07.10 වන දින ලද්දුවහෙට්ටි මහතාත් කොමිෂන් සභාවෙන් පිටවී ගිය අතර, කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමෙන් වැලකී සිටියේය. පීරිස් මහතා රහසිගතව රටින් පිටවී ගොස් තිබෙන බව ඊට නොබෝ කලකට පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කොමිෂන් සභාවේ සැලකිල්ලට භාජනය කළේය. ඊට පසු පීරිස් මහතා කොතැනක සිටිද යන්න විමර්ෂනය කර බලන ලෙස කොමිෂන් සභාව විමර්ෂකයින්ට නියම කළේය. කුමක් නිසාද යත්, ඒ වන විට ඔහුගෙන් ප්‍රශ්න කොට ඔහුගේ ප්‍රකාශය වාර්තාගත කර ගැනීමට කොමිෂන් සභාවට අවශ්‍ය වූ හෙයිනි. කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතුවලට අදාලව ඔහු පරීක්ෂාවට ලක්කිරීමත් අවශ්‍ය විය. පීරිස් මහතා බොරු නමක් සඳහන් ව්‍යාජ ගමන් බලපත්‍රයක් උපයෝගී කර ගනිමින් ඉන්දියාව හා තායිලන්තය හරහා ස්විට්සර්ලන්තයට ගොස් තිබෙන බව විමර්ශනවලින් හෙළිවී තිබෙන බව 1995 ඔක්තෝබර් මස 15 වන දින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එච්.එච්.එම්.ආර්. ප්‍රේමරත්න මහතා කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් කීය. ඔහු ස්විට්සර්ලන්තයට සම්ප්‍රාප්තවී දේශපාලන රැකවරණය සොයා

ඇත. ඉක්බිතිව, පිරිස් මහතාට විරුද්ධව සාක්ෂිකරුවන් රැසක් විසින් එල්ල කර ඇති චෝදනා සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිලධාරීන්ට ඔහුගෙන් ප්‍රශ්ණ කිරීමට අවසර දෙන ලෙසට ස්විට්සර්ලන්ත නිසි බලධාරීන්ගෙන් ඉල්ලා සිටීමට කොමිෂන් සභාව ගරු ඇටෝර්නි ජනරාල්වරයාගේ ආධාරය ඉල්ලා සිටියේය. කරන ලදැයි කියන ලද වරදවල් බොහොමයක්ම පැහැරගෙන යාම්, මිනීමැරුම්, පුද්ගලයින්ට වධදීම්, අයුතු ලෙස පුද්ගලයින් රඳවා ගැනීම් ආදී වූ ස්වභාවයේ ඒවා විය. එම ක්‍රියා සියල්ලක්ම මානව අයිතිවාසිකම් බරපතල ලෙස උල්ලංඝණය කිරීම් විය. පිරිස් මහතාට විරුද්ධව ඇති ලබාගැනීමට තිබෙන කරුණුවල සම්පිණ්ඩනයක්ද "ඇමුණු කොමිෂන් රොගොටරි වාර්තාවක්" උචිත රාජ්‍ය තාන්ත්‍රික මාර්ග වලින් ස්විට්සර්ලන්ත බලධාරීන් වෙත සපයන ලදැයි ද, ස්විට්සර්ලන්ත බලධාරීන් ඊට පිළිතුරු සපයන අවස්ථාව වන විට, දේශපාලන රැකවරණ පතා ඔහු විසින් කරන ලද ආයාචනය ස්විට්සර්ලන්ත බලධාරීන් විසින් ප්‍රතික්ෂේප කරන ලදුව, ඔහු ස්විට්සර්ලන්තයෙන් අතුරුදහන්ව සිටියේ යයි ද ගරු ඇටෝර්නි ජනරාල්වරයා නියෝජනය කළ නීතිඥ තැන විසින් කොමිෂන් සභාවට දන්වන ලදී. ඊට පසු කොමිෂන් සභාවේ රැස්වීම් අවසන් වන තුරුම පිරිස් මහතා ගැන කිසිම තොරතුරක් කොමිෂන් සභාවට ලැබුනේ නැත. කෙසේ වුවද, පිරිස් මහතා විසින් එවන ලදැයි අදහස් කරන ලද දිවුරුම් පත්‍රයක් 1996 අගෝස්තු මස 14 වන දින කොමිෂන් සභාවට ලැබුනේය. මෙය මින් පසුව එන පරිච්ඡේදයකදී සලකා බලනු ලබනවා ඇත.

යම් යම් පුද්ගලයින් සාපරාධී වැරදි සිදුකර ඇති බවත් ඔවුන්ගෙන් සමහර දෙනා නිර්දේශ්‍ය විෂයයන්හි සඳහන් වන කාරණාවලට සම්බන්ධ බවත් හඟවන මුල් බැල්මට පෙනෙන සාක්ෂි ඇති බව සාක්ෂි වාර්තාගත කරගැනීමේදී හෙළිවිය. පරීක්ෂණ කොමිෂන් සභාවලට පැවරී තිබෙන්නේ සීමිත බලතල වන අතර, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ මොනු එබඳු පුද්ගලයින්ට "නොතීසි" නිකුත් කළ නොහැකිය. එහෙයින් කොමිෂන් සභාව විසින් පරීක්ෂාවට ලක් කළයුතු වූ සියළුම පුද්ගලයෝ සාක්ෂිකරුවන් ලෙසින් කැඳවනු ලැබූහ. එසේ වුවද, කොමිෂන් සභාවේ වැඩ කටයුතු ඉදිරියට යත්ම කොමිෂන් සභාව ඉදිරියේ තුන් වර්ගයක පුද්ගලයින් සාක්ෂි දුන් බව පෙනී ගියේය. එම තුන් වර්ගය මෙසේය:

I. තමන්ට විරුද්ධව හෝ තමන් දන්නා හඳුනන පුද්ගලයින්ට විරුද්ධව සාපරාධී වැරදි කරන ලදැයි පැමිණිලි කළ අය.

II. නිල සාක්ෂිකරුවෝ ( ඔවුන්ට විරුද්ධ චෝදනා නොතිබිණි)

III. නිර්දේශ්‍ය විෂයයන්හි විස්තර කොට දක්වා ඇති සාපරාධී වැරදි හා වෙනත් කාරණාවලට කෙළින්ම හෝ අනියමින් සම්බන්ධ යයි කියනු ලබන පුද්ගලයින්.

( සියළුම සාක්ෂිකරුවන්ට යවන ලද සිතාසි වල ආදර්ශ පිටපතක් "F" ඇමුණුමෙහි දැක්වේ.)

කොමිෂන් සභාවේ ප්‍රසිද්ධ රැස්වීම් 1996 ජනවාරි මස 16 වන දින ආරම්භ වූ අතර, එය එකසිය විසිහත් දිනෙක (127) රැස්විය. පුද්ගලයින් අසූ දෙදෙනෙකුට (82) සිතාසි භාරදෙන ලදුව, කොමිෂන් සභාව හමුවේ පෙනී සිටි අතර ඔවුන්ගේ සාක්ෂි විවෘත රැස්වීම්වලදී සටහන් කරගනු ලැබිණ. කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් සාක්ෂිකරුවන්ගේ නම් හා ලිපිනයන් "G " ඇමුණුමෙන් දැක්වේ. තඩු භාණ්ඩ අයිතම හා ලියවිලි එකසිය විසිහයක් (126ක්) සාක්ෂිකරුවන්

විසින් ඉදිරිපත් කරන ලදුව සලකුණු කරනු ලැබිණ. ඉදිරිපත් කරන ලද ද්‍රව්‍ය හා ලියවිලිවල ලැයිස්තුවක් "H" ඇමුණුමෙහි දැක්වේ. මේ කොමිෂන් සභාවේ විමර්ශකයින් විසින් ප්‍රකාශ සටහන් කර ගත් පුද්ගලයින් සංඛ්‍යාවෙන් ඉතා සුළු කොටසක් බව සැලකිල්ලට ගත යුතුය. තීරණ හා අනුමැතිවලට එළඹීමේදී කොමිෂන් සභාව කොමිෂන් සභාවට ලබාගතහැකිව තිබුණු සියළුම විශ්වාස කටයුතු හා අදාල කරුණු කොමිෂන් සභාව විසින් සලකා බලන ලද බව මෙම අවස්ථාවේ වාර්තාගත කරනු කැමතිය. මේ අතරට යට සඳහන් ප්‍රකාශද ඇතුලත් විය. එසේම සංඛ්‍යා ලේඛණ හා වෙනත් තොරතුරු ලැයිස්තුකොට දක්වමින් රජයේ සංවිධාන විසින් වැදගත් ප්‍රශ්න සම්බන්ධයෙන් කොමිෂන් සභාව ඉදිරියට පත් කල විශ්වාස කටයුතු වාර්තාද සලකා බලන ලදී.

කොමිෂන් සභාවේ සියළුම රැස්වීම් පවත්වනු ලැබුයේ කොළඹ 12, අලුත්කඩේ, මහාධිකරණ සංකීර්ණයේ පිහිටි කොළඹ මහාධිකරණ උසාවි අංක 2 දී ය. එම රැස්වීම්වල සභාපතිත්වය දැරූ විනිශ්වයකාරතුමා වූයේ කොමිෂන් සභාවේ සභාපතිවරයාය. මෙම ක්‍රියා මාර්ගය නිසා කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත්වීමට පරිශ්‍ර ලබාගැනීමෙන් වන වියදම වැළැක්වීමට කොමිෂන් සභාවට හැකිවිය. කොමිෂන් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලය පිහිටියේ අළුත්කඩේ උපරිමාධිකරණ සංකීර්ණයේ අංක 301A දරන කාමරයේය. ලේකම් කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා තවත් කාමරයක් මහාධිකරණ සංකීර්ණයේ පැවැත්විණ. කෙළින්ම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එස්. සී. පතිරණ මහතා යටතේ සේවය කළ ස්ථිර විමර්ෂන නිලධාරී කණ්ඩායම කොළඹ 7, කැප්පෙටිපොල මාවතේ සමිට් තට්ටු නිවාස වල අංක 18 හි පිහිටි කාර්යාලයකින් ක්‍රියාත්මක විය. සාක්ෂිකරුවන්ගෙන් ප්‍රාරම්භක වශයෙන් ප්‍රශ්න කර ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර ගන්නා ලද්දේ මෙහිදීය.

කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතු ශ්‍රව්‍ය පටිවල වාර්තා කොට ගනිමින් ලසුලේඛනගත කරගෙන ඊට අනතුරුව යතුරුලියූ කටයුතු වාර්තා ලෙසින් සකසන ලදී. මෙම කටයුතු වාර්තා පිටු 6780ක් වූ අතර, වෙලුම් 28 කින් ( සලකුණු කළ ලියවිලි) යුක්ත විය. එම වාර්තා හා විමර්ෂකයින් විසින් ප්‍රකාශ සටහන් කරගත් සියළුම පුද්ගලයින්ගේ ප්‍රකාශ සහ සලකුණු කෙරුණු ලියවිලි මේ සමග ඉදිරිපත් කරනු ලැබේ.

## II වන පරිච්ඡේදය

### පුද්ගලයින් සමහරක් දෙනා ගැන හැඳින්වීම

මෙම වාර්තාවෙහි ප්‍රකට ලෙයින් නම් හෙළිවන සමහර පුද්ගලයින් ගැන ලුහුවූ හැඳින්වීම් මෙහි පහත පළකරමු. ඔවුන්ගේ නම් මෙහි ලැයිස්තුගත කොට දැක්වෙන්නේ ඔවුන්ගේ පෙළපත් නාම වල මුල් අකුරු අකාරාදි පිළිවෙලට (ඉංග්‍රීසි) එන ලෙසටය. රෝහිත ප්‍රියදර්ශන හා අජිත් ජයසිංහ ගැන හැඳින්වීම් මෙම පරිච්ඡේදයෙහි ඇතුලත් කොට නැත. කුමක් නිසාද යත්, වෙන පරිච්ඡේද දෙකක් ඔවුන් සඳහා පාවිච්චි කොට තිබෙන බැවිනි.

### I. කීර්ති අතපත්තු

වර්ෂ 1972 දී පරිවාසික පොලිස් උප පරීක්ෂකවරයෙකු ලෙස පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණු මොහු 1990 වේ දී ප්‍රධාන පරීක්ෂක පදවියටත්, 1994 දී සහකාර පොලිස් අධිකාරී පදවියටත් උසස් කරනු ලැබුවේය. පොලිස් පරීක්ෂකවරයකු ලෙස ඔහු 1989 අගෝස්තු මස සිට 1994 දක්වා සපුගස්කන්ද පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරී ලෙස ක්‍රියා කළේය. ඔහු සපුගස්කන්ද පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරී ලෙස පත්වූයේ එම පොලිස් ස්ථානයට පහරදීම සිදුවීමෙන් නොබෝ කලකට පසුවය. ඔහු උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන 1990 පෙබරවාරි මස 20 වන දින රාත්‍රී අතුරුදහන්වූ අවස්ථාවෙහි සපුගස්කන්ද පොලිස් ස්ථානය භාරව සිටි හෙයින් ඔහුගේ සාක්ෂි බොහෝ වැදගත් විය.

### II. තලිත් දෙල්ගොඩ

පරිවාසික පොලිස් උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස 1961 දී පොලිස් සේවයට සම්බන්ධවන ලදුව මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන අතරතුර පොලිස් සේවයෙන් විශ්‍රාමගත් දෙල්ගොඩ මහතා වසර 36ක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කර තිබිණ. රටේ බොහෝ පළාත්වල සේවය කොට සිටි ඔහු 1978 ජනවාරි මස 01 වන දින සහකාර පොලිස් අධිකාරී පදවියට උසස් කරනු ලැබුවේය. ඔහු 1985 දී පොලිස් අධිකාරීවරයෙක් විය. පොලිස් අධිකාරීවරයකු ලෙසට ඔහුට 1987 සැප්තැම්බර් මස 15 වන දින කැලණිය පොලිස් කොට්ඨාසය පවරන ලදී. ඔහු 1994 පෙබරවාරි මස 24 වන දින නියෝජ්‍ය පොලිස්පතිවරයකු වන තුරුම දිගටම කැලණිය පොලිස් කොට්ඨාසය භාර නිලධාරියා ලෙස ක්‍රියා කළේය. දෙල්ගොඩ මහතා කැලණිය පොලිස් කොට්ඨාසයේ සේවය-කරන අතර තුර 1989 දී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයකු ලෙස උසස් කරනු ලැබුවේය. 1996 මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිදීමට පැමිණි අවස්ථාවේ ඔහු දකුණු පොලිස් දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විය.

නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්. ගුණරත්න මහතා 1989 දෙසැම්බර් මස 12 වන දින දෙල්ගොඩ මහතාට ප්‍රශංසා කරමින් පොලිස්පතිවරයාට ලිපියක් යැවිය. දෙල්ගොඩ මහතා " සිවිල් ඇඳුමින් සැරසුනු කුඩා කණ්ඩායම් විසින් සිදුකරන මෙහෙයුම්" පිළිබඳ සංකල්පය උද්‍යෝගිමත්ව ක්‍රියාත්මක කිරීමට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එඩ්මන්ඩ් කරුණානායක මහතා ( ගම්පහ පොලිස් කොට්ඨාසයේ කාර්ය භාර නිලධාරී) සමග සහභාගීවී යයි එම ප්‍රශංසාත්මක ලිපියේ සඳහන් කර ඇත. "එබඳු කණ්ඩායම්වලට කඩාකප්පල්කාරීන් සොයා අත්අඩංගුවට ගැනීමට/ විනාශ කිරීමට හැකිවේ යයි" එහි තවදුරටත් සඳහන් වේ. මෙම ප්‍රශංසාත්මක ලිපියේ පිටපතක් X 79 ලෙසින් සළකුණු කොට මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි. මෙම ප්‍රශංසාව පදනම් කොට, දෙල්ගොඩ මහතාට වැටුප් වර්ධක දෙකක් දීම නිර්දේශ කරමින් පොලිස්පතිවරයා රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට නිර්දේශයක් ඉදිරිපත් කළේය. මෙම නිර්දේශයේ පිටපතක් X 86 ලෙසින් සළකුණු කොට මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි.

## III. එම්.එම්.ආර්. (මෙරිල්) ගුණරත්න

ගුණරත්න මහතා කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන අවස්ථාවේ ඔහුගේ වයස අවුරුදු 54ක් විය. ඔහු ද ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකි. ඔහු 1965 දී පරිවාසික සහකාර පොලිස් අධිකාරිවරයෙකු ලෙස පොලිස් දෙපාර්තමේන්තුවට බැඳී 1973 දී පොලිස් අධිකාරිවරයෙක් විය. පොලිස් අධිකාරිවරයෙකු ලෙස ඔහු පොලිස් බුද්ධි අංශයට අනුයුක්ත කරනු ලැබිණි. ගුණරත්න මහතා 1978 දී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පදවියට උසස් කරනු ලැබිණ. 1985 දී ඔහු නියෝජ්‍ය පොලිස්පති පදවියට උසස් කෙරිණ. 1986 ඔක්තෝබර් මාසයේදී ගුණරත්න මහතා ජාතික බුද්ධි කාර්යාංශයේ අධ්‍යක්ෂ තනතුරට පත්කරනු ලැබිණ. 1989 අප්‍රේල් මස 20 වන දින ඔහු මහ කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ලෙස පත්කරන ලදි. 1993 දී ඔහු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් විය. ගුණරත්න මහතා කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් අවස්ථාවෙහි සහායක සේවා භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙසින් පොලිස් මූලස්ථානයට අනුයුක්තව සිටියේය. 1989 අප්‍රේල් සිට 1993 අගෝස්තු දක්වා වූ කාලය තුළ කැලණිය පොලිස් කොට්ඨාසය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වූයේ ගුණරත්න මහතාය.

## IV. අජිත් ජයසිංහ

කරුණාකර VIII වන පරිච්ඡේදය බලන්න.

## V. අර්නස්ට් පෙරේරා මහතා.

පෙරේරා මහතා මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් අවස්ථාවේ ඔහුගේ වයස අවුරුදු 64 කි. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු වූ ඔහු පරිවාසික

සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස 1957 දී පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණේය. 1968 දී පොලිස් අධිකාරී පදවියට උසස් කරනු ලැබූ ඔහු වසර 05ක් එම පදවියේ සේවය කළේය. ඉක්බිතිව ඔහු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට උසස් කරනු ලැබුවේය. එයින් පසුව 1977 වර්ෂයේදී ඔහු නියෝජ්‍ය පොලිස්පති තනතුරට උසස් කරනු ලැබුවේය. 1988 අගෝස්තු මස 01 වන දින ඔහු පොලිස්පති තනතුරට පත්කරනු ලැබුවේය. ඔහු 1993 නොවැම්බර් මස 28 වන දින දක්වා පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වය දැරුවේය. වයස අවුරුදු 61ට එළඹි විට ඔහු පොලිස් සේවයෙන් විශ්‍රාම ගත්තේය. එයින් නොබෝ කලකට පසු ඔහු මලයාසියාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස පත්කරනු ලැබුවේය. 1994 අගෝස්තු මාසයේදී සිදුවූ ආණ්ඩු වෙනසත් සමග ඔහු ශ්‍රී ලංකාවට ආපසු කැඳවනු ලැබීය. එවක් පටන් ඔහු රැකියාවක යෙදී නැත. මෙම කොමිෂන් සභාවේ නිර්ණය විෂයයන්ට අදාළ වැඩි කාලය තුළ ( එනම් 1988 ජනවාරි මස 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වනදා දක්වා) පෙරේරා මහතා ශ්‍රී ලංකාවේ පොලිස් සේවයේ ප්‍රධානියා ලෙස කටයුතු කළේය.

## VI. ඩග්ලස් පීරිස්.

ඩග්ලස් පීරිස් 1967 දී පරිවාසික පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණේය. ඔහුට උප පොලිස් පරීක්ෂක තනතුරකට තෝරා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් තිබුණු හෙයින් ඔහු 1971 වර්ෂයේදී එම තනතුරට තෝරා ගනු ලැබුවේය. 1979 දී ඔහු පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස පත්කරනු ලැබිණ. ඉක්බිතිව ඔහු 1985 දී ප්‍රධාන පොලිස් පරීක්ෂක ධූරයට උසස් කරනු ලැබිණ. ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස ඔහු පෑලියගොඩ පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක ලෙස ( H.Q.I.) කටයුතු කළේය. 1987 ජුලි මස 20 වන දින පීරිස් මහතා වැඩබලන සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස පත්කරනු ලැබිණ. සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස ඔහු කැලණිය පොලිස් කොට්ඨාසයේ " සහකාර පොලිස් අධිකාරී - මෙහෙයුම් " ලෙස ක්‍රියා කළේය. මෙම තනතුර දරමින් ඔහු කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ වැඩ කටයුතු අධීක්ෂණය කළ අතර, ඊට නායකත්වය දුන්නේය.

යමෙකු සහකාර පොලිස් අධිකාරී පදවියෙහි ස්ථිර කරනු ලැබීමට ඊට නියමිත විභාගයකට පෙනී සිට එම විභාගය වසර අවුරුදු 03 ක් වශයෙන් නියමිත කාලය තුළ සමත් වියයුතුය. පීරිස් මහතා අදාල විභාගයට පෙනී සිටියේය. එසේ වුවද විභාගයෙන් සමත්වීමට ඔහුට නොහැකි විය. මේ අනුව 1990 වන විට පීරිස් මහතා සිටියේ ස්ථිර කරනු නොලැබූ සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙසය. ඔහු විභාගයෙන් අසමත්වීම හේතු කොට ගෙන ස්ථිර කරනු නොලැබූ තත්ත්වයෙන් සිටි හෙයින් ඔහුට විභාගය සමත්වීමට නියම කෙරෙන කාලසීමාවෙහි දීර්ඝ කිරීමක් ඉල්ලීමට සිදුවිය. එසේ කරනු ලබන ඉල්ලීම් සාමාන්‍යයෙන් ඉටු කරනු ලැබේ. එසේ වුවද එසේ කරනු ලැබූ විට ඔහුට සේවා ජ්‍යෙෂ්ඨත්වය අහිමි වේ. කුමක් නිසාද යත් එම කාලය දීර්ඝ කිරීම දෙනු ලැබීමත් සමග ඔහු ජ්‍යෙෂ්ඨතා ලැයිස්තුවෙහි පහළට වැටෙන බැවිනි.

1990 මෙරට කඩාකප්පල්කාරී කැරැල්ල අවසන්වූ හයි හඟවන වර්ෂය ලෙස කෙනෙකුට පෙනී යයි. 1989 නොවැම්බර් මස 25 වන දින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ නියෝජ්‍ය පොලිස්පති ( මහ කොළඹ දිසාව) එම්.එම්.ආර්. ගුණරත්න මහතාට ලිපියක් යවමින් සහකාර පොලිස් අධිකාරී පීරිස් පොලිස් අධිකාරී තනතුරකට උසස් කිරීම නිර්දේශ කලේය. අදාල නිර්දේශය තමන් විසින් කරන ලද්දේ තමන්හට සහකාර පොලිස් අධිකාරී පීරිස් මහතා විසින්ම කරන ලද ඉල්ලීමක් අනුව යයි දෙල්ගොඩ ප්‍රකාශ කලේය. ( පීරිස් මහතා පළමුව සහකාර පොලිස් අධිකාරී තනතුරෙහි ස්ථිර කරනු නොලැබ සිටියදීත් මෙසේ උසස් කළහැක්කේ කෙසේදැයි දෙල්ගොඩ මහතා එම ලිපියෙහි විස්තර කර නොතිබුණේය) දෙල්ගොඩ මහතා ඔහුගේ නිර්දේශය තහවුරු කොට තිබුණේ කඩාකප්පල්කාරී කැරැල්ල පැවති කාලයේ සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින් ඉටු කරන ලද වැඩ කටයුතු පිළිබඳ විස්තර ලැයිස්තු කොට දක්වමිනි. අදාල නිර්දේශයේ පිටපතක් ( ඊට සම්බන්ධ ලියවිලි ද සමග) මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කොට තිබුණේය. එය සලකුණු කොට තිබුනේ "X 71" ලෙසිනි. දෙල්ගොඩ මහතා එම ලිපියෙහි සහකාර පොලිස් අධිකාරී පීරිස් " ඔහු (එනම් සහකාර පොලිස් අධිකාරී පීරිස්) කඩාකප්පල්කාරී ව්‍යාපාරය ඉදිරියට යැම වැලැක්වීමටත්, කඩාකප්පල්කාරී පුද්ගලයින් ඉවත් කොට දැමීමටත් වගකිවයුතු වන බව" වෙනත් දේ අතර සඳහන් කරයි. " ඉවත් කොට දැමීමට" යන වචනයෙහි තේරුම විමසා දැනගැනීම කෙරෙහි කොමිෂන් සභාව උනන්දුව දැක්විය. එම වචනය භාවිතා කල අවස්ථාවෙහි දෙල්ගොඩ මහතා එයින් අදහස් කලේ කුමක්ද? මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කරනු ලැබූ අවස්ථාවෙහි දෙල්ගොඩ සකස් කරන ලද පාඨයක් කියවීමෙන් කරුණු දැක්විය. මෙම කරුණු ඇතුලත්වූ පාඨය "X 72" වශයෙන් සලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි. ඉවත් කොට දැමීම යන වචනයෙන් අදහස් කරන ලද්දේ සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින් සිදුකරන ලද " යුක්ති සහගත මනුෂ්‍ය ඝාතන " යයි විස්තර කොට දැක්වීමට දෙල්ගොඩ පෙරකී පාඨයෙන් තැත් කලේය. සේවයෙන් උසස් කරනු ලැබීමේ සුදුසුකමකට යුක්ති සහගත මනුෂ්‍ය ඝාතන සිදුකිරීම සමාන වන්නේ කෙසේදැයි විස්තර කිරීමට දෙල්ගොඩ අසමත් විය.

(හදිසි අවස්ථා රෙගුලාසිවල විෂය පථයට අයත්වන) යුක්තිසහගත මනුෂ්‍ය ඝාතන හඳුන්වනු ලැබුනේ " 55FF ව්‍යවස්ථා මරණ" යනුවෙනි. අදාල කාලසීමාව තුලදී සම්පූර්ණ කැලණිය පොලිස් කොට්ඨාසයෙන්ම වාර්තාවී තිබුනේ එබඳු මරණ පහක් පමණකි. අදාල වචනයේ සාමාන්‍ය තේරුම " නැතිකර දමනවා" හෝ " මරණවා " යන්න බවට ඔහු තමාගෙන් ප්‍රශ්ණ කල නීතිඥයා සමග එකඟ විය. මෙම තත්ත්වය යටතේ අදාල කාලසීමාවේදී පාවිච්චි කරන ලද පොලිස් කථා ව්‍යවහාරය අනුව මෙම වචනයේ නියම ප්‍රායෝගික අර්ථය අනිකුත් සාක්ෂිකරුවන්ගෙන් අනාවරණය කර ගැනීමට නීතිඥවරයා ඉදිරිපත්ව ක්‍රියා කලේය. " ඉවත් කොට දැමීම" යන්නෙන් ඇත්ත වශයෙන්ම අදහස් කරන්නේ " අධිකරණ ක්‍රමයෙන් බාහිරව" (කඩාකප්පල්කාරීන්) ඝාතන කිරීම බව-එවකට සිටි පොලිස්පති (I.G.P.) ආර්නස්ට් එඩ්වර්ඩ් පෙරේරා මහතා අන්තිමේදී සාක්ෂි දෙමින් ඉතා අවංකව පිළිගත්තේය. එම නිසා සහකාර පොලිස් අධිකාරී පීරිස්ගේ සේවා උසස් කිරීමට ප්‍රධාන හේතුව වූයේ ඔහු " කඩාකප්පල්කාරීන් අධිකරණ ක්‍රමයට බාහිරව ඝාතනය කිරීමෙන්

කඩාකප්පල්කාරී ව්‍යාපාරය ඉදිරියට යාමෙන් වැලැක්වීම" බව දැන් ඉතා පැහැදිලිව පෙනී යයි.

යට සඳහන් නිර්දේශය ලද නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න 1989 දෙසැම්බර් මස 12 වන දින සහකාර පොලිස් අධිකාරී පීරිස් ගැන නිර්දේශයක් සකසා පොලිස්පතිවරයාට ඉදිරිපත් කළේය. එම නිර්දේශයේ පිටපතක් X 88 වශයෙන් ලකුණු කොට කොමිෂන් සභාව හමුවේ තබන ලදි. මෙම නිර්දේශයෙන් තහවුරු නොවෙතත්, එම නිර්දේශය තමා සකසා පොලිස්පතිවරයාට ඉදිරිපත් කළේ එසේ කරන ලෙස පොලිස්පතිවරයා තමාගෙන් ඉල්ලා සිටි නිසා යයි නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න ප්‍රකාශ කළේය. එකී නිර්දේශයට ඔහු වෙත ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දෙල්ගොඩ විසින් සහකාර පොලිස් අධිකාරී පීරිස් ගැන එවා තිබුණු නිර්දේශය අමුණා තිබුණේය. සහකාර පොලිස් අධිකාරී පීරිස් , සහකාර පොලිස් අධිකාරී ගාමිණී සිල්වා ( ගම්පහ කොට්ඨාසයේ) හා සමග ජනතා විමුක්ති පෙරමුණට විරුද්ධ ව්‍යාපාරය ගෙනයාමට "පුරෝගාමීව" ක්‍රියා කළ බව සඳහන් කර තිබේ. "ඔවුන් ජනතා විමුක්ති පෙරමුණ පළමුව අස්ථාවර කිරීමටත්, ඊට පසුව එහි පිරිහීම ඇති කිරීමටත් ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කළහ"යි එයින් තවදුරටත් සඳහන් කෙරේ. " ගරු රනිල් වික්‍රමසිංහ, ගරු ජෝෂප් මයිකල් පෙරේරා සහ ගරු ජෝන් අමරතුංග යන අය මෙම නිලධාරීන් දෙදෙනාගේ පැහැදිලි දායකත්වය ගැන හොඳින්ම දැන සිටියහ" කියාත් ඔහු ප්‍රකාශ කරයි. තමා අදාළ නිර්දේශය කිරීමෙන් හුදෙක් අපේක්ෂා කළේ සහකාර පොලිස් අධිකාරී පීරිස්ට වැටුප් වර්ධක දෙකක් ලබාදීම යයි නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න ප්‍රකාශ කළේය.

පෙරකී නිර්දේශ දෙක ලැබුණු පොලිස්පතිවරයා මෙම කාරණය ගැන රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිපියක් යැවීය. 1989 දෙසැම්බර් මස 21 වන දිනෙන් යුත් මෙම ලිපිය X 42 යනුවෙන් සළකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි. මෙසේ ඉදිරිපත් කරන ලද නිර්දේශය පදනම් කොට මෙම කාරණය ගැන රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කරන ලද බව පෙනී යයි. මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය කලින් සිටි ජනාධිපති රණසිංහ ප්‍රේමදාස විසින් 1990 පෙබරවාරි මස 06 වන දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදි. මෙම අමාත්‍ය මණ්ඩල සංදේශයේ අඩංගු නිර්දේශ පදනම් කොට අමාත්‍ය මණ්ඩලය පහත සඳහන් පියවර ගැනීමට තීරණය කළේය.

(අ) සහකාර පොලිස් අධිකාරී පීරිස් අදාළ සේවයේ ස්ථිර කිරීමේ විභාගය සමත්වීමෙන් නිදහස් කිරීමට.

(ආ) ඔහු එම පදවියෙහි අතීතයටද බලපවත්වන සේ එනම්, 1988 ජූලි මස 20 වන දින සිට ක්‍රියාත්මක වනසේ ස්ථිර කිරීමට සහ

(ඇ) ඔහු පොලිස් අධිකාරී (II වන ශ්‍රේණිය) තනතුරකට 1990 පෙබරවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කිරීමට.

අදාල අමාත්‍ය මණ්ඩල තීරණයේ පිටපතක් X 43 ලෙසින් සලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි. සාක්ෂිකරුවන් කිපදෙනෙක් කී පරිදි මෙය පෙර නුවූ විරූ ක්‍රියාමාර්ගයකි. ඩග්ලස් පීරිස්ට ලැබූ උසස්වීම් මාලාව නිසා ඔහු හිටි අඩියේම ගැසට් කල පොලිස් නිලධාරීන් 130 දෙනෙකු ඉක්මවා ජ්‍යෙෂ්ඨත්වයෙන් ඉහළ නැංගේය. පොලිස් දෙපාර්තමේන්තුවේ ඉතිහාසයේ වෙනත් කිසිත් පොලිස් නිලධාරියෙකු එබඳු සේවා උසස්වීමක් ලබා නැත. එය කවරදාකවත් පොලිස් සේවයේ සිදුකරන ලද " දිගම දුර පැනීම" යයි නීතිඥතැන සමග එකගවීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පාලන) ආචාර්ය ධර්මදාස සිල්වා මහතා විසින් පෙළඹිණ. අන්තිමට පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස් පොලිස් අධිකාරි ( 1 වන ශ්‍රේණිය) පදවියට උසස් කරනු ලැබිණ. ඉක්බිතිව ඔහු විසින් සිදුකරන ලදැයි කියන බරපතල වැරදි සම්බන්ධ විමර්ශණයක් සිදුවන්නේය යන්න පාදක කොට 1995 වර්ෂයේදී ඔහුගේ රාජකාරි තහනම් කරනු ලැබිණ.

මෙහි ආරම්භක පරිච්ජේදයෙහි සඳහන් කරන ලද පරිදි, සහකාර පොලිස් අධිකාරි පීරිස් හදිසියේම අතුරුදහන්ව කොමිෂන් සභාව ඉදිරියට පැමිණීම නැවතින. ඔහුට කොමිෂන් සභාව ඉදිරියේ අඛණ්ඩව පිළිවෙලට පෙනී සිටීමට බැඳීමක් තොවූයෙත්, කොමිෂන් සභාව එම කාරණය ගැන කිසිත් විමර්ශණයක් කිරීමට සැලසුවේ නැත. කෙසේ වුවද පීරිස් මහතා රහසිගතව රටින් බැහැරව ගොස් තිබෙන බව පසුව වාර්තා කරනු ලැබින. ඩග්ලස් පීරිස් 1996 ජූලි මස 20 වන දින රටින් බැහැරව ගොස් තිබෙන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් කරන ලද විමර්ශණයන්ගෙන් හෙළිවිය. පීරිස් මහතා රටින් පිටව යාමට පෙර " තල්පාවිල විදාන කංකානම්ගේ විමලසේන " යන නම පාවිච්චි කරන්නේය යන ව්‍යාජ හේතුව දක්වමින් ව්‍යාජ ගමන් බලපත්‍රයක් ලබාගෙන ඇත. මෙම ගමන් බලපත්‍රය ලබාගැනීම සඳහා ඔහු දී ඇති ලිපිනය " නො. 37, නුවර පාර, පීරිස් මාවත, කැලණිය" යන්නය. ගමන් බලපත්‍ර අයදුම්පතේ පිටපතක් ( මෙහි අඩංගු වන්නේ බොරු තොරතුරුය.) X 53 ලෙසින් සඳහන් කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි. එම අයදුම්පතෙහි ඩග්ලස් පීරිස්ගේ නිවැරදි ඡායාරූපයක් අන්තර්ගත විය.

පීරිස් ශ්‍රී ලංකාවෙන් පිටව ගියේ කෙසේදැයි ඔප්පු කොට දැක්වීමට නොහැකි විය. කෙසේ වුවද, ඔහු 1996 ජූලි මස 22 වන දින බොම්බායෙන් ටී.ජී. 970 යන අංකය දරන ගුවන් යානයකින් ගුවන් ගමනක යෙදී තිබෙන බව ජාත්‍යන්තර පොලිසියෙන් ලබා ගෙන තිබෙන කරුණුවලින් පෙනී යයි. අංක ටී.ජී. 970 දරන ගුවන් යානයෙන් එදිනම ඔහු බැංකොක් නුවරට සේන්දුවී ඇත. ඉක්බිතිව අගෝස්තු මස 09 වන දින පීරිස් ස්විට්ස්ර්ලන්තය බලා ගොස් තිබේ. ස්විට්සර්ලන්තයේ සූරිච් නුවරට සම්ප්‍රාප්තවී ඔහු දේශපාලන ආරක්ෂාව පතන්නකුගේ තත්ත්වය තමන්ට ලබාදෙන ලෙස ආයාචනා කර ඇත. දේශපාලන රැකවරණය සඳහා ඔහු විසින් ඉදිරිපත් කර තිබෙන අයදුම්පත සලකා බලන තුරු ස්විට්සර්ලන්තයේ රැඳී සිටීමට ස්විට්සර්ලන්ත බලධාරීහු ඔහුට තාවකාලික අවසරයක් දුන්හ. පීරිස් විසින් දේශපාලන රැකවරණය සඳහා හේතු වශයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රධාන කාරණය නම්, ශ්‍රී ලංකාවට පෙරලා පැමිණි විට හිංසා පීඩා කිරීමට භාජනය වන බවය. ස්විට්සර්ලන්ත බලධාරීහු ඩග්ලස් පීරිස් ඉදිරිපත් කරන කරුණු පිළිනොගැනීමට තීරණය කල අතර, ඔහුට දේශපාලන රැකවරණය සැලසීම ප්‍රතික්ෂේප

කළේය. පිරිස් විසින් දක්වන ලද හේතු ගැන ඔවුන් සෑහීමට පත්වූයේ නැත. කෙසේ වුවද ස්විට්සර්ලන්ත නීතිය අනුව, ප්‍රතික්ෂේප කිරීමේ නියෝගයට විරුද්ධව ඇපෑලක් ඉදිරිපත් කිරීමට ඔහුට 1997 ජනවාරි මස 31 වන දින දක්වා කල් ලැබිණ. එම කාලසීමාව තුළදී ඔහු නැවතත් අතුරුදහන් විය. එම මොහොතේ සිට ඩග්ලස් පිරිස් ආගිය අතක් හෝ සිටින තැනක් හඟවන කිසිත් තොරතුරක් කොමිෂන් සභාවට ලැබුනේ නැත. එසේ වුවද, ඔහුගේ නීතිඥයා වන නලින් ලද්දුවහෙට්ටි වරින් වර කොමිෂන් සභාවේ කටයුතු වාර්තාවල පිටපතුත්, කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලියවිලිවල පිටපතුත් සපයන ලෙස ඉල්ලීම් කළේය. මෙම අයදුම්පත් වලින් ඉල්ලා සිටින දේ සැපයීමට ඉඩ දෙන ලද අතර, අවශ්‍ය කටයුතු වාර්තා නීතිඥවරයා වෙත මුදාලන ලදී.

කෙසේ වුවද, 1996 අගෝස්තු මස 14 වන දින ඩග්ලස් පිරිස් විසින් එවන ලදැයි දැක්වුනු ලියවිල්ලක් කොමිෂන් සභාවට ලැබිණ. එය දිවුරුම් පත්‍රයක් බඳු විය. මෙම ලියවිල්ලේ නිර්ව්‍යාජත්වය නිශ්චය කරගනු පිණිස මෙම ලියවිල්ල සහතික කරන ලදැයි කියැවෙන සමාදාන විනිශ්චයකාරවරයා ඇත්ත වශයෙන්ම එසේ කරන ලද්දේදැයි දැනගැනීමට විමර්ෂණයන් කරන ලදී. ලියවිල්ලේ සඳහන් සමාදාන විනිශ්චයකාරවරයා එය සහතික නොකරන ලදැයි විමර්ෂණවලින් අනාවරණය විය. මෙම හේතුව නිසා, අදාල ලියවිල්ලේ අඩංගු කරුණු සලකා බැලූයේ නැත.

## vii. රෝහිත ප්‍රියදර්ශන

කරුණාකර VII වන පරිච්ඡේදය බලන්න.

## viii. රනිල් වික්‍රමසිංහ

පාර්ලිමේන්තුවේ වර්තමාන විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා එක්සත් ජාතික පක්ෂයේ නායකයාය. වරක් ශ්‍රී ලංකාවේ අග්‍රමාත්‍යවරයා වූ වික්‍රමසිංහ මහතා දේශපාලන කරලියට පැමිණියේ 1977 දී බියගම ආසනය නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ( එ.ජා.ප.) ලෙසටය. එවක් පටන් ඔහු අඛණ්ඩව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ක්‍රියා කර ඇත. 1978 දී ඔහු විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා ලෙස පත්කරනු ලැබුවේය. ඊට පසුව වික්‍රමසිංහ මහතා කැබිනට් අමාත්‍ය මට්ටමට උසස් කරනු ලැබ ඔහුට අධ්‍යාපන හා යෞවන කටයුතු අමාත්‍යාංශය භාර කරනු ලැබුවේය. 1993 දී ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා ඝාතනය කරනු ලැබීමෙන් නොබෝ දිනකින්ම ජනාධිපති ප්‍රේමදාස මහතාගේ රජයේ අග්‍රාමාත්‍යවරයා වූ ඩී.බී. විජේතුංග මහතා ජනාධිපති ලෙස පත්කරනු ලැබිණ. අග්‍රාමාත්‍ය තනතුරේ ඇතිවූ පුරප්පාඩුවට රනිල් වික්‍රමසිංහ මහතා පත්කැරිණ. 1994 අගෝස්තු මස 16 වන දින එක්සත් ජාතික පක්ෂ රජය පරාජය වන තෙක්ම එම මහතා අග්‍රාමාත්‍ය ලෙස කටයුතු කළේය. එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුවේ ප්‍රධාන විපක්ෂ දේශපාලන පක්ෂය වූ අවස්ථාවේ වික්‍රමසිංහ මහතා විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස පත් කරනු ලැබුවේ නැත. කුමක් නිසාද යත් 1994 අගෝස්තු මාසයේදී එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු

මන්ත්‍රීවරුන්ගේ රහස් ඡන්දයකින් ගාමිණී දිසානායක මහතා විපක්ෂනායක ලෙස තෝරා පත්කර ගත් බැවිනි. ඉක්බිතිව, හදිසියේ සිදුවූ ගාමිණී දිසානායක මහතාගේ ඝාතනය නිසා 1994 දෙසැම්බර් මාසයේදී රනිල් වික්‍රමසිංහ මහතා විපක්ෂ නායක ලෙස පත්කොට ගන්නා ලදී. පරීක්ෂණයට අදාල කාලය තුළ ( එනම්, 1988 ජනවාරි මස 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වන දින දක්වා) වික්‍රමසිංහ මහතා යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යවරයා ( 1989 ජනවාරි අග දක්වා) ලෙසද, ඉන්පසුව කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයා ලෙසද කටයුතු කළේය. මෙම කාලසීමාව තුළදී ඔහු පාර්ලිමේන්තුවේ ගම්පහ මැතිවරණ දිස්ත්‍රික්කය නියෝජනය කළේය. එසේ වුවද නියම වශයෙන්ම ( තත්වාකාරයෙන්ම) නියෝජනය කළේ ගම්පහ දිස්ත්‍රික්කයට අයත් වූ බියගම මැතිවරණ කොට්ඨාසයයි. සපුගස්කන්ද හා බටලන්ද ගම වැටෙන්නේ බියගම මැතිවරණ කොට්ඨාසය තුළටය.

## IX. රංජිත් වික්‍රමසිංහ

1958 දී පොලිස් කොස්තාපල්වරයකු ලෙස පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුනු ඔහු 1972 දී පොලිස් සැරයන් පදවියටත්, 1982 දී පොලිස් උප පරීක්ෂක පදවියටත් පත්කරන ලදී. 1988 දී පොලිස් පරීක්ෂකවරයෙකු වූ ඔහු 1994 දී ප්‍රධාන පොලිස් පරීක්ෂක පදවියට උසස් කරනු ලැබුවේය. කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිදීමට සති කිහිපයකට කලින් ඔහු පොලිස් සේවයෙන් විශ්‍රාම ගත්තේය:

1978 මාර්තු මාසයේදී ඔහු කැලණිය පොලිස් කොට්ඨාසයට මාරු කරනු ලැබුවේය. 1987 දී වික්‍රමසිංහ මහතා කැලණිය පොලිස් කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ කාර්ය භාර නිලධාරියා ලෙස පත්කරනු ලැබුවේය. ඔහු 1990 නොවැම්බර් මාසය වනතුරු මෙම තනතුර දරා තිබේ. කැලණිය පොලිස් කොට්ඨාසයෙන් පිට ටික කලක් සේවය කිරීමෙන් පසු ඔහු කැලණිය පොලිස් කොට්ඨාසයට යළි පැමිණ ඉන්පසු 1994 අවසන් වනතුරු එහි සේවය කර තිබේ. ආරම්භයේ දී කැලණිය පොලිස් කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය ක්‍රියාත්මක වී තිබෙන්නේ පැලියගොඩ පොලිස් ස්ථානයේය.

# III වන පරිච්ඡේදය

## ආරක්ෂක තත්ත්වය පිරිහීම හා ප්‍රචණ්ඩ ක්‍රියා වැඩිවීම

### ජනතා විමුක්ති පෙරමුණ.

ජනතා විමුක්ති පෙරමුණේ සම්භවය දක්නට ලැබෙන්නේ 1960 ගණන්වල පසු භාගයේය. මෙම පක්ෂයේ නායකයා පටබැඳි දොන් නන්දසිරි රෝහණ විජේවීර ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ පීකිං පිලේ පාක්ෂිකයෙකි. අළුතින් පිහිටුවන ලද ජනතා විමුක්ති පෙරමුණේ ( PEOPLES LIBERATION FRONT) ප්‍රාරම්භක සංවිධාන කටයුතු සිදුව තිබෙන්නේ 1967 වර්ෂයේ අග භාගයේදී කළුත්තැවේදි ය. ඊට පසු මෙම පක්ෂයේ ප්‍රධාන සංවිධාන කටයුතු මධ්‍යගතව තිබුණේ රටේ විශ්ව විද්‍යාලවලය. විශේෂයෙන්ම ලංකා විශ්ව විද්‍යාලයේ පේරාදෙණිය මණ්ඩපය 1960 ගණන්වල අග භාගයේදී ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියා ලහිලහියේ සිදුවූ ස්ථානයකි. ජනතා විමුක්ති පෙරමුණ, 1970 මහා මැතිවරණයේදී රටේ පාර්ලිමේන්තු දේශපාලනයට පිවිසීමට කිසිත් සෘජු මහන්සියක් දරා නොමැති බව පෙනෙන්නට තිබේ. 1970 මහා මැතිවරණයට සම්බන්ධ මැතිවරණ ව්‍යාපාරයේදී ජනතා විමුක්ති පෙරමුණු ක්‍රියාකාරීන් රටේ බොහෝ ප්‍රදේශවල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයින්ට සහයෝගය දුන් බව කවුරුත් පොදුවේ එකඟවන කරුණකි. එසේ වුවද, ජනතා විමුක්ති පෙරමුණ සෘජුව හෝ අනියමින් සම්ප්‍රදායික වාමාංශික පක්ෂවලට සහයෝගය නුදුන් බව මුල සිටම පෙනෙන්නට තිබිණ. ඇත්ත වශයෙන්ම, ඔවුන් පැරණි වාමාංශික පක්ෂවලට සතුරුව සිට ඇති බව ලබාගැනීමට තිබෙන කරුණුවලින් පෙන්නුම් කෙරේ.

නව රජය පිහිටුවනු ලැබූ විගසම ජනතා විමුක්ති පෙරමුණ සිය ප්‍රසිද්ධ රැස්වීම්වලදී රජය විවේචනය කිරීමට පටන් ගත්තේය. රජයට විරුද්ධව කැරැල්ලක් ගැසීමට එය පසුබිමෙන් සංවිධානය විය. 1971 අප්‍රේල් මස 05 වන දිනෙන් ආරම්භ කොට ජනතා විමුක්ති පෙරමුණ එකල පැවති රජයට විරුද්ධව දැවැන්ත ප්‍රහාරයක් එල්ල කළේය. පොලිස් ස්ථාන හා ප්‍රධාන රජයේ ආයතන 100කට පමණ පහර දෙන ලදී. පොලිස් ස්ථාන සුළු සංඛ්‍යාවක් ටික කලකට පමණක් කැරලිකරුවන්ගේ අතට පත්විය. නිදහස් ලංකාවෙහි මෙබඳු කැරැල්ලක් කිසි විටෙකවත් සිදුව නැත. ( වත්මන් රජයේද අග්‍රාමාත්‍යතුමිය වන හිටපු අග්‍රාමාත්‍යතුමිය වූ සිරිමාවෝ ආර්.ඩී.බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් වූ එකල පැවති එක්සත් පෙරමුණු රජය කැරැල්ලට ප්‍රතිචාර වශයෙන් හදිසි අවස්ථා පාලනය ප්‍රකාශයට පත් කළාය. මුළු රට තුළම ටික දිනක් ඇඳිරි නීතිය ක්‍රියාත්මක විය. ඉක්බිතිව, සන්නද්ධ හමුදා හා පොලීසිය කැරලිකරුවන් විශාල සංඛ්‍යාවක් අත්අඩංගුවට ගැනීමෙන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රහාරයන්ට ප්‍රතිචාරය දැක්විය. ජනතා විමුක්ති පෙරමුණේ නායක රෝහණ විජේවීර මහතා කැරැල්ල ආරම්භවීමට ප්‍රථමයෙන් අත් අඩංගුවට ගනු ලැබ කැරැල්ලේ අවසානය දක්වා යාපනේ බන්ධනාගාරයෙහි රඳවා සිටි බව සැළකිය යුතුය. 16,500ක් පමණ සංඛ්‍යාවක් කැරලිකාර ප්‍රහාරයේදී හෝ කැරලි මර්දන ප්‍රහාරයේදී මරණයට පත්වීම හෝ කැරැල්ලට සම්බන්ධ නීති විරෝධී ක්‍රියාවල යෙදීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබීම සිදුවූ බව ලබාගැනීමට තිබෙන තොරතුරුවලින් පෙන්නුම් කෙරේ.

කැරැල්ල සම්බන්ධයෙන් විමර්ශණවල යෙදුනු විමර්ශකයින් මුහුණ පෑ බොහෝ ප්‍රශ්න, කාර්ය පරිපාටිමය නීතියේ විධිවිධානවල ස්වභාවය, සාක්ෂිවල පිළිගත හැකි බව සම්බන්ධ විධි විධාන යන කරුණු සැළකිල්ලට ගෙන එකල පැවති රජය කැරලි සැකකරුවන් සම්බන්ධ නඩු ඇසීමට හා නිශ්චය කිරීමට නව නෛතික විනිශ්චය සභාවක් හඳුන්වා දුන්නේය. මෙය සිදුකරන ලද්දේ 1972 අප්‍රේල් මාසයේදී අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත පැනවීම වශයෙනි. කැරැල්ලට අදාලව හදිසි අවස්ථා රෙගුලාසි විධිවිධාන යටතේ අත්අඩංගුවට ගෙන රඳවාගෙන සිටින පුද්ගලයින් සම්බන්ධ නඩු විනිශ්චය කර නිශ්චය කිරීමට මෙම ස්ථිර කොමිෂන් සභාවට නීත්‍යානුකූල බලය පවරන ලදි. මෙම යුගයේ පත්කළ වෙනත් කොමිෂන් සභාවලට මෙන් නොව මෙම කොමිෂන් සභාවට වරදකරුවන් වන පුද්ගලයින් සම්බන්ධයෙන් දණ්ඩණ අයිතිය ක්‍රියාත්මක කිරීමට ( දඩුවම් පැනවීමට) බලය තිබිණ. නීතියේ සුවිශේෂ වූ එක් විධිවිධානයක් නම්, සැකකරුවන් විසින් පොලිස් නිලධාරීන්ට ( ඔවුන්ගේ පදවියේ තත්ත්වය නොතකා) කරන ප්‍රකාශ ( පාපෝච්චාරණද ඇතුළුව) සාක්ෂි වශයෙන් පිළිගැනීමට කොමිෂන් සභාවට බලය පවරා තිබීමය. විනිමය පාලන රෙගුලාසි උල්ලංඝනය හා විදේශ විනිමය නීති විරෝධී ලෙස රටින් බැහැරට ගෙන යෑම කරන ලදැයි චෝදනා ලැබ සිටි යම් යම් පුද්ගලයින්ට විරුද්ධව මෙම කොමිෂන් සභාව විසින්ම පරීක්ෂා කර බලන ලද බව සැළකිල්ලට ගතයුතුය. අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව එහි පරීක්ෂණ කටයුතු 1972.07.22 වන දින අරඹා නඩු විමසීම 1974.12.20 වන දින දක්වා සිදුකර ගෙන ගියේය. රජය පෙරළීමට කුමන්ත්‍රණය කිරීම, යුද්ධ කිරීම ආදී වැරදි කිරීම ගැන පුද්ගලයින් හතළිස් එක් (41) දෙනෙකුට චෝදනා නඟන ලදී. ජනතා විමුක්ති පෙරමුණේ නායකයා 13 වන චූදිතයා විය. සමහර චූදිතයින් වෙනුවෙන් නීතිඥයින් පෙනී සිටි අතර, විජේවීර තම නිදහසට තමන්ම කරුණු ඉදිරිපත් කළේය. පැමිණිල්ල මෙහෙයවන ලද්දේ ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ විශේෂ චෝදකයින් කණ්ඩායමක් විසිනි. ඊට එවකට රජයේ නඩු අධ්‍යක්ෂවූ රංජිත් අබේසූරිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ තිලක් මාරපන, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සරත් එන්. සිල්වා යන මහත්වරු අයත් වූහ. (අවසනට සඳහන් කළ මහතුන් දෙදෙනා ශ්‍රී ලංකාවේ ඇටෝර්නි ජනරාල්වරුන් වූහ). 1974.12.20 වන දින කොමිෂන් සභාව චූදිතයින් 36 දෙනෙකු වරදකරුවන් කරමින් තීන්දුව දුන්නේය. වරදකරුවූ චූදිතයෝ අත්හිටවූ සිර දඩුවම් කාලසීමාවන්හි සිට 12 වසරක සිර දඩුවම් දක්වා වන සිර දඩුවම්වලට යටත් කරනු ලැබූහ. මෙ අනුව ජනතා විමුක්ති පෙරමුණේ ඉහළම නායකත්වය දැරූ පුද්ගලයෝ සියළුදෙනා බන්ධනාගාර ගත කරනු ලැබූහ. ඔවුහු එක්සත් පෙරමුණු රජයේ ආණ්ඩු කාලය අවසන්වන තුරුම බන්ධනාගාර ගතව සිටියහ.

පක්ෂ නායකත්වය සිර අඩස්සි ගත කරනු ලැබුවද 1970 ගණන්වල මැද භාගය වන විට පක්ෂය ප්‍රතිසංවිධානයවීම ආරම්භවූ බව ලබාගැනීමට තිබෙන විස්තර කරුණුවලින් පෙන්නුම් කෙරේ. වර්ෂ 1977 මහ මැතිවරණය ප්‍රකාශයට පත්කළ අවස්ථාවේ ජනතා විමුක්ති පෙරමුණේ පර්යන්ත පෙදෙස් නායකයින් ක්‍රියාශීලීව සිටි අතර, ඔවුහු එම කාලසීමාවේ දක්ෂිණාංශික ධනවාදී දේශපාලන බලවේගයක් ලෙස වර්ග කරනු ලැබ සිටි එක්සත් ජාතික පක්ෂයට ඇත්ත වශයෙන්ම එළිපිටම කෙලින්ම සහයෝගය දීමට ඉදිරිපත් වූහ. බලාපොරොත්තු වූ පරිදිම 1977 ජූලි මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තු ආසන ගණනින් 4/5 පංගුවක්ම ලබාගනිමින් බලයට පැමිණියේය. එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණි විගසම, එනම්, 1977 ඔක්තෝබර් මාසයේදී රජය අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත අවලංගු කරමින් පාර්ලිමේන්තුවට කෙටුම්පත් පනතක් ඉදිරිපත් කළේය. මෙම නීතිය සම්මත කිරීමත් සමග අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවේ නියෝග පිට සිරගත කරනු ලැබ සිටි

සියළුදෙනා බන්ධනාගාරයෙන් මුදාලනු ලැබූහ. මෙසේ ඔවුන් සිර අඩස්සියෙන් මුදාලනු ලැබුවේ එකල අග්‍රාමාත්‍යවරයා වූ ජේ.ආර්.ජයවර්ධන මහතා විසින් දෙන ලද උපදෙස් ප්‍රකාර, එවකට වූ අග්‍රාණ්ඩුකාරතුමා විසින් දෙන ලද ක්ෂමාවක් යටතේය. මේ අනුව 1977 නොවැම්බර් මස 02 වන දින රෝහණ විජේවීර බන්ධනාගාරයෙන් නිදහස් කරනු ලැබිණ. රෝහණ විජේවීර හා ඔහුගේ කණ්ඩායම නිදහස් කිරීමට හේතුවූ කරුණු හොඳාකාරවම දනිතැයි සිතිය හැක්කේ අදාල තීරණය ගත් අයමය. අග්‍රාමාත්‍ය ජේ.ආර්. ජයවර්ධන මහතා දේශපාලන විශ්ලේෂක රොහාන් ගුණරත්න මහතා සමග පවත්වන ලද සම්මුඛ සාකච්ජාවකදී පවසා ඇත්තේ "ඔවුන් අපරාධකරුවන් නොව දේශපාලන සිරකරුවන් නිසා" මුදාලන ලෙ ස තමන් අග්‍රාණ්ඩුකාරවරයාට උපදෙස් දුන් බවය. " මා ඔහු නිදහස් නොකලේ නම්, ඔහු නෙල්සන් මැන්ඩෙලා වැනි අයෙකු වන්නට ඉඩ තිබුනා" යයි ඔහු තවදුරටත් පවසා තිබේ. එසේ වුවත් මෙම පියවරෙන් ප්‍රයෝජනය ලත් එක් ප්‍රධාන තැනැත්තකු කියා තිබෙන්නේ මෙයයි: "ශිෂ්‍යයින් හා බාල පරපුර ස්ථිරව අප පසු පස සිටිනවා. ඔවුන්ගේ කැගැසීමත්, අපරාධ යුක්ති විනිශ්චය සහා පනත යටතේ එක්සත් ජාතික පක්ෂයේ හිතවත් ආධාරකරුවන් කිහිපදෙනෙකු සිර අඩස්සිගත කොට සිටීමත් අප සියළුදෙනාම නිදහස් කිරීමට රජය පෙලඹීමට හේතුවුනා" යයි රෝහණ විජේවීර කියා ඇත. (1978 ජූලි මස 09 වන දින " වීක් එන්ඩ් සන්" පත්‍රය බලන්න.) එසේ වුවද, රෝහණ විජේවීර හා අන් අය නිදහස් කිරීම ගැන පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර බණ්ඩාරනායක මහතා කීවේ මෙයයි. " අප (මෙයින් කියැවෙන්නේ 1970 එක්සත් පෙරමුණු රජයයි) ඔවුන් ගැන නීත්‍යානුකූලව ක්‍රියා කළා. ඔවුන් බන්ධනාගාරගත කිරීම උසාවියෙන් නියම වුනා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විනාශ කිරීමේ ඔහුගේ උපාය මාර්ගයේ කොටසක් ලෙසට ජනාධිපති ජයවර්ධන ජේ.වී.පී. නායකයින් නිදහස් කළා. ඔවුන් ( ජනතා විමුක්ති පෙරමුණ ) තමන් බන්ධනාගාරගත කල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විරුද්ධවනු ඇතැයි ඔහු සිතුවා. මෙම උපාය මාර්ගය ඉතා නරක අන්දමට ආපසු කැරකී වැදුනා. ජේ .වී.පී. ය ඔවුන්ටත් විරුද්ධව නැගී සිටියා". (බණ්ඩාරනායක මහතා 1980 වර්ෂ අග හරියේදී දේශපාලන විශ්ලේෂක රොහාන් ගුණරත්න මහතා සමග පැවැත්වූ සම්මුඛ සාකච්ජාවකිනි.)

ජනතා විමුක්ති පෙරමුණ 1978 දි නිදහස ලැබූ විගසම ඔවුහු පක්ෂය ප්‍රතිසංවිධානය කිරීමට පටන් ගත්හ. ඔවුන්ගේ ප්‍රතිසංවිධානයේ ස්වභාවය ඔවුන්ගේ මැයි දින පෙලපාලි වලින් හා රැස්වීම් වලින් පැහැදිලිව පෙනිණ. පහරදීමේ ප්‍රධාන තේමාවන්ගෙන් එකක් වූයේ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ රජය 1971 කැරැල්ල යටපත් කළ ආකාරය මහජනයාට මතක් කොට දීමය. ජනතා විමුක්ති පෙරමුණ ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට ප්‍රවිෂ්ඨව පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය ගැන අවංකවම උනන්දුවන ලකුණු පෙන්නුම් කළේය. 1978 පළාත් පාලන ඡන්ද විමසීමට අපේක්ෂකයින් ඉදිරිපත් කිරීමට ඔවුන් තැත් කිරීමෙන් මෙය පැහැදිලිව පෙනිණ. කෙසේ වුවද, ඔවුහු ඉතා දුෂ්කර කටයුත්තකට මුහුණපෑහ. ජනතා විමුක්ති පෙරමුණ ලියාපදිංචි කල දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරන ලදී. විධායකයෙන් පලවූ මෙබඳු ප්‍රතිචාරයන් ජනතා විමුක්ති පෙරමුණ ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට පිවිස එහි රැඳී සිටීමෙන් වලක්වන කරුණක් වන්නට ඇත යන අදහස පළව තිබේ. තවද. මෙම කාලසීමාවේදී ජනතා විමුක්ති පෙරමුණ ``දේශපාලන මැරවරයින්ගෙන්`` උද්ගතවන බොහෝ ප්‍රශ්නවලට මුහුණ පෑවේය. එක් අවස්ථාවක ජීප් රථයකින් හා ලං.ග.ම. බස්රථයකින් කණ්ඩායමක් පැමිණ කොලඹ විශ්ව විද්‍යාලයේ සෞන්දර්යය අධ්‍යයන ආයතනයෙහි පිහිටි පක්ෂ කාර්යාලයේ සිටි පක්ෂ ක්‍රියාකාරීන්ට පහරදී දේපොලවලට හානි කරන ලදී. බලසම්පන්න බලවේගයන්ගෙන් පැන නගින විරුද්ධත්වය වැඩිවෙමින් තිබිණද, 1981 දි පළමුවරට පැවති දිස්ත්‍රික් සංවර්ධන සභා ඡන්ද විමසීම්වලට ජනතා විමුක්ති පෙරමුණ

අපේක්ෂකයින් ඉදිරිපත් කළේය. කොළඹ නගරයේ පමණක් ඔවුන්ගේ අපේක්ෂකයින්ට 8%ක ඡන්ද ප්‍රතිශතයක් ලැබිණ. ඇත්ත වශයෙන් ඇතැම් යම් යම් ප්‍රදේශවල ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කරන ලද අපේක්ෂකයෝ තෝරාගනු ලැබූහ. 1982 ඔක්තෝබර් 20 වන දින ශ්‍රී ලංකාවේ පළමුවරට පැවති ජනාධිපතිවරණය පැවැත්විනි. පිළිගත් දේශපාලන පක්ෂවලින් ඉදිරිපත්වූ අපේක්ෂකයෝ හය දෙනෙක් ඡන්ද විමසීමේදී තරඟ වැදුනහ. එවකට ජනාධිපති තනතුර දැරූ ජේ.ආර්. ජයවර්ධන, හෙක්ටර් කොබ්බෑකඩුව, ආචාර්ය කොල්වින් ආර්.ද සිල්වා, කුමාර් පොන්නම්බලම් , වාසුදේව නානායක්කාර, රෝහණ විජේවීර යන අය එම හයදෙනා වූහ. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා ඡන්ද විමසීමෙන් ජයගත් අතර, සම්ප්‍රදායික වාමාංශික පක්ෂවල අපේක්ෂකයින් පරදවමින් රෝහණ විජේවීර තුන්වැනි ස්ථානය ලබාගත්තේය. පක්ෂයක් ලෙසට ජේ.වී.පී.යට පාවිච්චි කළ ඡන්දයෙන් 4.19% ලැබිණ. ජනතා විමුක්ති පෙරමුණ ශක්තියෙන් වැඩීම මෙයින් පෙන්නුම් කෙරිණි.

1982 දෙසැම්බර් මස 22 වන දින මෙරට පළමුවරට පැවැත්වූ ජනමත විචාරණය පැවැත්විණි. මෙහිදී අසන ලද ප්‍රශ්නය වූයේ මහ මැතිවරණයක් පැවැත්වීමට නොගොස් එවකට පැවති පාර්ලිමේන්තුවේ ජීවිත කාලය දීර්ඝ කිරීමට ජනතාව කැමතිද යන්නය. සියළුම දේශපාලන පක්ෂ මෙම ජනමත විචාරණයට උද්‍යෝගයෙන් තරග වැදුනහ. පාලක එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුවේ නිල කාලය දීර්ඝ කිරීමට උද්ඝෝෂණය කළ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් කොමියුනිස්ට් පක්ෂය , ලංකා සමසමාජ පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ ආදී වාමාංශික පක්ෂත් ඊට විරුද්ධව උද්ඝෝෂණ කළහ. සුළු බහුතරයකින් ( ලියාපදිංචි කළ ඡන්ද දායකයින් අතුරින් 75.8%ක් ඡන්දය පාවිච්චි කොට තිබුණු අතර, "පක්ෂව" 54.7%ක් ද, "විරුද්ධව" 45.3ක් ද ඡන්දය පාවිච්චි කර තිබුණි.) මහා මැතිවරණයක් නොපවත්වා පාර්ලිමේන්තුවේ නිල කාලය දීර්ඝ කිරීමට තීරණය කරන ලදී.

1983 මැයි මාසයේදී රජය ජනමත විචාරණයේදී පරාජය වූ මැතිවරණ කොට්ඨාසවල අතුරු මැතිවරණ පැවැත්විය. මහ මැතිවරණයක් නොපැවැත්වූ හෙයින් මෙම අතුරු මැතිවරණ " කුඩා මහමැතිවරණයක්" මෙන් සළකන ලදී. සියළුම දේශපාලන පක්ෂ විසින් මීට ලොකු උනන්දුවක් යොමු කරනු ලැබිණ. ආසන 18ක අතුරු මැතිවරණ පවත්වන ලදී. එක්සත් ජාතික පක්ෂය ආසන 14කත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 03කත්, මහජන එක්සත් පෙරමුණ 01 ආසනයකත් ජය ලැබිය. ජනතා විමුක්ති පෙරමුණු අපේක්ෂකයින්ට සැලකියයුතු ඡන්ද ප්‍රමාණයක් ලැබිණ. අතුරු මැතිවරණ පැවැත්වූ විගස රජය රටේ හදිසි අවස්ථාව ප්‍රකාශ කළේය.

ජනමත විචාරණය පැවැත්වූ ආකාරය ගැනත් ඇතැම් බලසම්පන්න බලවේග ඡන්ද විමැසීමට පෙරාතුව වූ කාලසීමාවෙහි මෙන්ම ඡන්ද විමසීම පැවැත්වූ දින හැසිරුණු ආකාරය ගැනත් පැවති මතභේදයේ ප්‍රතිඵලය ලෙසට 1983 පෙබරවාරි මාසයේදී ජනතා විමුක්ති පෙරමුණේ නායකයා ජනමත විචාරණයේ නීත්‍යානුකූල බවට හා එහි ප්‍රකාශිත ප්‍රතිඵලවලට අභියෝග කරමින් අධිකරණයේ නඩු පැවරීය. මෙම නඩුව තීසි විනිශ්චයකට භාජනය කිරීමට ප්‍රථම ශ්‍රී ලංකාව පෙර නුවූ විරූ ස්වභාවයේ ව්‍යසනයකට මුහුණ පැවේය.

**ජනතා විමුක්ති පෙරමුණ තහනම් කරනු ලබයි. . . . . ප්‍රචණ්ඩත්වය ආරම්භ වෙයි.**

1983 ජූලි මස 21 වන දින මෙරට එකම ගිනිජාලාවක් විය. මෙය සිදුවූයේ බෙදුම්වාදී ත්‍රස්තවාදීන් විසින් යාපනයේදී සන්නද්ධ හමුදා සාමාජිකයින් 13 දෙනෙකු කෲර ලෙස ඝාතනය කරනු ලැබීමෙන් පසුවය. සිංහලයින් වැඩි සංඛ්‍යාංව ලෙස වාසය කළ පෙදෙස්වල සුළු ජාතික ද්‍රවිඩ ජනයාගේ වාසස්ථාන, ව්‍යාපාරික ස්ථාන සහ දේපොල ගිනිබත් කරනු ලැබිණ. . වාර්තා ගතනොවූනු ද්‍රවිඩ සිවිල් පුරවැසියන් සංඛ්‍යාවක් සාහසික ලෙස ඝාතනය කරන ලදී. උතුරු නැගෙනහිර පළාත්වලින් බැහැරව ජීවත්වූ ද්‍රවිඩ ජාතිකයෝ බොහෝ දෙනා සරණාගතයෝ වූහ. සමහර සරණාගතයින් උතුරු පළාතට ගිය අතර, අනිකුත් අය අසල පිහිටි ඉන්දියාවට පලා ගියහ. යම් ප්‍රමාණයක ප්‍රමාදයකින් පසු ඇඳිරි නීතිය ප්‍රකාශයට පත්කරනු ලැබූ අතර, අනුක්‍රමයෙන් රට සාමාන්‍ය තත්ත්වයට පැමිණියේය.

1983 ජූලි මස 31 වන දින ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා ජනතා විමුක්ති පෙරමුණ, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය හා නව සමසමාජ පක්ෂය යන පක්ෂ තහනම් කළේය. එම පක්ෂ දෙක එසේ තහනම් කරන ලද්දේ ඒවායේ ක්‍රියාකාරීන් ජාතිවාදී කෝලාහලවලට වගකිවයුතු වන්නේය යන පදනමිනි. බෙහෙවින් ස්වාභාවිකව අපේක්ෂා කළහැකි අන්දමට මෙම පක්ෂ දෙකේම නායකයෝ සැඟවුනහ. මෙම නායකයින් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට නියම කරනු ලැබුවද, ඔවුන්ට එසේ කිරීමට නොහැකි විය. ඉහළම නායකත්වය සැඟවී සිටියදී ක්‍රියාකාරීන් සමහර දෙනෙකු අත්අඩංගුවට ගැනීමට පොලිසියට හැකිවිය. 1983 ඔක්තෝබර් මස 08 වන දින දරන ලිපියෙන් තමන්ගේ පක්ෂය ජනවාර්ගික කෝලාහලයට කිසිත් සම්බන්ධයක් නැතැයි රෝහණ විජේවීර කී අතර, ජනතා විමුක්ති පෙරමුණට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය තුළ ක්‍රියා කිරීමට හැකිවන අයුරු තම පක්ෂය කෙරේ පනවා තිබෙන තහනම ඉවත් කරන ලෙස ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාට ආයාචනය කර සිටියේය.

මේ අතර තුර, පොලිසිය 1987 ජූලි මස සිදුවූ ජාතිවාදී කෝලාහල පැවති කාලයේ සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන විමර්ෂණය කළේය. ඒ ඒ විමර්ෂණවල තීරණ පදනම් කොට සැකකරුවෝ අත්අඩංගුවට ගනු ලැබූහ. ඉක්බිතිව ඇටෝර්නි ජනරාල්වරයා වරද කළ බවට ප්‍රමාණවත් සාක්ෂි තිබුණු පුද්ගලයින්ට විරුද්ධව අපරාධ නීති කෘත්‍ය ආරම්භ කළේය. මෙම නඩුවල ප්‍රතිඵලය සිත් ගන්නා සුළු විය. 1983 ජූලි ජාතිවාදී ගැටුම් පැවති කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ හෝ නව සම සමාජ පක්ෂයේ ක්‍රියාකාරීන් අතුරින් එක් අයෙකුවත් ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වරදකරුවී නොමැති බව රනිල් වික්‍රමසිංහ මහතාත් සාක්ෂි දෙමින් තමාගෙන් ප්‍රශ්න කළ නීතිඥ තැන සමග එකඟවිය. එහෙයින් ජනතා විමුක්ති පෙරමුණ සහ නව සම සමාජ පක්ෂය 1983 ජාතිවාදී කෝලාහලවලට වගකිවයුතු යයි ඔප්පු කළ නොහැකි විය. එසේ වුවද, ජනතා විමුක්ති පෙරමුණට පැනවූ තහනම තවදුරටත් ක්‍රියාත්මක විය. මේ වනවිට දිස්ත්‍රික් සංවර්ධන සභාවල අසුන් හිමිව සිටි· ජනතා විමුක්ති පෙරමුනේ නියෝජිතයින්ට එම සභාවල රැස්වීම් තුනකට පිට පිටම නොපැමිණීම නිසා එම අසුන් අහිමිවී තිබිණ. මෙහි ප්‍රතිඵලය ලෙසටූ ජනතා විමුක්ති පෙරමුණ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ආයතනවල නියෝජනය නොවිණ.

රටෙහි ජනතා විමුක්ති පෙරමුණේ ඒකාග්‍රතාවෙන් යුත් ප්‍රතිසංවිධානයක් සිදුවන බව පොලිසියේ රහස් තොරතුරු සංවිධානවලට 1985 වර්ෂයේ පමණ සිට තොරතුරු ලැබෙමින් තිබී

ඇත. 1960 ගණන්වල අග වර්ෂවලදී මෙන් විශ්ව විද්‍යාලවල ක්‍රියාශීලී දේශපාලන ප්‍රචාරක ව්‍යාපාර ගෙන යාමත්, දේශපාලන ප්‍රචාරක ව්‍යාපාර සංවිධානවීමත් සිදුවිය. මනා ලෙස සංවිධානය කොට ගෙන දිප ව්‍යාප්තව ගෙන ගිය පෝස්ටර් ගැසීමේ ව්‍යාපාරයක් ගෙන යාමෙන් දේශපාලන කරලියෙහි ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරීත්වය පැහැදිලිව පෙනෙන්නට තිබිණ. ජනතා විමුක්ති පෙරමුණ පෝස්ටර් බොහොමයක්ම කෙලින්ම රජය කැරවූ එක්සත් ජාතික පක්ෂ රජයට විරුද්ධ ඒවා විය. විවේචනයේ තේමාවන් පක්ෂය තහනම් කිරීමත්, මහජනයා අතර ආර්ථික සම්පත් අයිතියේ තිබෙන පරතරයත් මධ්‍යගත කොටගෙන තිබින. රජය ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකරයද , ඔවුන්ගේ අප්‍රසාදයට ලක්විය. ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරීන් විසින් දේශපාලන අරමුණු ඇතිව අපරාධ සිදුකරනු ලබන බවත්, මෙම කාලසීමාව තුලදීම පොලීසියේ රහස් තොරතුරු සේවාවන්ට තොරතුරු ලැබිණ. ප්‍රාරම්භකව සිදුවූ අපරාධ බොහොමයක්ම මංකොල්ලකෑම් හා සොරකම් බඳු ඒවා විය. මෙම අපරාධ කරන්නේ ජනතා විමුක්ති පෙරමුණට අරමුදල් ලබාගැනීමට බවට අනුමාන කරන ලදී. ඉන්පසුව වෙනත් ආකාරයේ අපරාධ ද සිදුවන්නට පටන් ගත්තේය. අවිආයුධ සොරකම් කිරීම හා රජයේ දේපලවලට හානි කිරීම ද ආරම්භ විය. පක්ෂයට සාමාජිකයින් බඳවා ගැනීම ක්‍රියාශීලිව සිදුවිය. ජනතා විමුක්ති පෙරමුණ එක්සත් ජාතික පක්ෂ රජයට විරුද්ධව තවත් සන්නද්ධ කැරැල්ලක් ගැසීම සඳහා සූදානම් වන බව තරමක් පැහැදිලිව පෙනෙන්නට වූ අතර, මෙම ප්‍රතික්‍රියාව ඇතිවී තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ අයුක්ති සහගතව තහනම් කරමින් එම පක්ෂය තම අදහස් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමෙන් වැලැක්වීම නිසා යයි යන මතය ඇතැම් දේශපාලන විශ්ලේෂකයින් විසින් පලකරන ලදී. මෙම තත්ත්වය නිසා ඔවුන්ට ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රධාන ප්‍රවාහයෙහි යම් කාර්ය භාරයක් ඉටුකිරීමට නොතිබිණ. එකල පැවති රජය විසින් ජනතා විමුක්ති පෙරමුණට මේ ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීමට බල කරන ලද්දේදැයි දේශපාලන විශ්ලේෂකයෝ ප්‍රශ්න කලහ.

1987 ජූනි මස 04 වන දින ඉන්දියානු ගුවන් හමුදාව විසින් ශ්‍රී ලංකාවේ උතුරට " මානවවාදී ආධාර" හෙළීමේ අපකීර්තිමත් සිද්ධියත් සමග බෙදුම්වාදී එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන්ට විරුද්ධව ගෙන ගිය වඩමාරච්චි මෙහෙයුම අත්හැර දැමීමට රජයට සිදුවිය. 1987 ජූලි මස 29 වන දින ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා ඉන්දියානු අග්‍රාමාත්‍ය රජීව් ගාන්ධි මහතා සමග ගිවිසුමකට පැමිණියේය. " ඉන්දු - ශ්‍රී ලංකා සාම ගිවිසුම" යනුවෙන් හඳුන්වනු ලැබූ මෙම ගිවිසුමට එළඹීමත් සමග රටෙහි ප්‍රචණ්ඩ ක්‍රියා රැල්ලක් ඇති විය. රජයේ ඒ ඒ ආයතන ගිනිබත් කරනු ලැබූ අතර, රජයේ දේපොලවලට හානි කරන ලදී. 1983 ජූලි මාසයේදී මෙන් නොව මෙවර ඉන්දු - ශ්‍රී ලංකා ගිවිසුමට විරුද්ධ වෙනත් බලවේග සමග ජනතා විමුක්ති පෙරමුණු ක්‍රියාකාරීන්ද මෙම සිද්ධිවලට සහභාගීවී තිබෙන බව ලබාගැනීමට තිබෙන කරුණු වලින් පැහැදිලිව පෙන්නුම් කෙරේ. එකල පැවති රජය තුල මෙන්ම බාහිරව ද සිටි යම් යම් දේශපාලන බලවේගද මෙම ගිවිසුමට විවෘතවම විරුද්ධ වූ බව සැලකිල්ලට ගතයුතුය. " සාම ගිවිසුමට" එළඹීමට ආසන්නතම වූ කාලයට ප්‍රථම, ජනතා විමුක්ති පෙරමුණ "දේශප්‍රේමී අරගලයක් තුලින් සමාජවාදී විප්ලවයක්" සිදුකිරිම අරමුණු කොට ක්‍රියාශීලී ප්‍රචාරක ව්‍යාපාරයක් ගෙන යමින් සිටියේය. රජය ඉන්දියාවත් සමග ගිවිසුමකට පැමිණීමෙන් පසු ජනතා විමුක්ති පෙරමුණ ඔවුන් කියූ පරිදි " ඉන්දියානු අධිරාජ්‍ය වාදයට" විරුද්ධව එලිපිටම උද්ඝෝෂණය කලේය. ශ්‍රී ලංකාවේ උතුරින් ඉන්දියානු සාමසාධක හමුදාව ආපසු කැඳවා ගතයුතු යයි ඔවුනු උද්ඝෝෂණය කලහ. ඒ වන විට, අග්‍රාමාත්‍ය රණසිංහ ප්‍රේමදාස මහතාත්, ඉන්දියානු සාමසාධක හමුදාව මෙරට සිටීම ගැන විරුද්ධ බව පුළුල් ලෙස පිළිගනු ලැබිණ. ඇත්ත වශයෙන්ම ජනාධිපතිවරණ ඡන්ද ව්‍යාපාරය තුලදී එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා වූ ප්‍රේමදාස මහතා තමා මෙරට

ජනාධිපතිවරයා වූ විට ඉන්දියානු සාමසාධක හමුදාව ආපසු යවනු ලැබීම සහතික කරන බව එලිපිටම කීය. "එල්.ටී.ටී.ඊ සංවිධානය හා ජනතා විමුක්ති පෙරමුණ ඔවුන්ගේ අරගලවල දිගටම යෙදී සිටින්නේ ඔවුන් සමාජ හා දේශපාලන අසාධාරණකම්වලට ගොදුරුවී සිටින නිසා යයි" පසුව 1988 අප්‍රේල් මාසයේදී ප්‍රකාශ කරමින් අග්‍රාමාත්‍ය රණසිංහ ප්‍රේමදාස මහතා එසේ කී බවට වාර්තාගත විය.

1987 අගෝස්තු මාසයේ සිට රටේ ආරක්ෂක තත්ත්වය අනුක්‍රමිකව හා අඛණ්ඩව පිරිහිණ. දේශපාලනඥයින්ගේ ජීවිතවලට බරපතල තර්ජනයක් එල්ලවිය. ප්‍රධානම ඉලක්ක වූයේ රජය කරවූ එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනඥයෝය. සම්ප්‍රදායික වාමාංශික පක්ෂවල නායකයෝ ද මෙම තර්ජනවල ඉලක්ක විය. ඉහල මට්ටමේ දේශපාලනඥයින් හැරුණු විට, සාමාන්‍ය පොදු ජනතාව අතර වූ දේශපාලන හිතවත්තු ද තර්ජනවල ඉලක්ක බවට පත්වූවෝය. එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයින් 1960 දෙනෙකු පමණ ඝාතනය කරනු ලැබූ බව ඇස්තමේන්තු කර තිබේ. ඔවුන් අතර අනුගාමීව තනතුරු ලැබූ එක්සත් ජාතික පක්ෂ ලේකම්වරු දෙදෙනෙක් වන හර්ෂ අබේවර්ධන ( මොහු 1987.12.23 වන දින ඝාතනය කරන ලදි.) හා නන්දලාල් ප්‍රනාන්දු යන මහත්වරුද, එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ටික දෙනෙක් ද වූහ. තවද, මොවුන්ගේ ප්‍රහාරවලට ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීහු ද ඉලක්ක බවට පත්වූහ. එවකට ජනතා විමුක්ති පෙරමුණේ ' ක්‍රියා ගැන රහස් තොරතුරු එක්රැස් කිරීමේ නිරතව සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ක්ලැරන්ස් පෙරේරා මහතා ජනතා විමුක්ති පෙරමුණ විසින් ඝාතනය කරනු ලැබිණ. ඉන්පසුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී. බෙනට් පෙරේරා මහතා ද ( මොහු කඩාකප්පල් කාරී ක්‍රියා ගැන විමර්ෂණ කිරීම ගැන තද උනන්දුවක් දැක්වූ නිලධාරියෙකි.) ඝාතනය කරන ලදි. රජයේ දේපලවලට සිදුකරන ලද හානිය බිය උපදවන තරමින් විශාලය. පර්යන්ත ප්‍රදේශවල පිහිටි රජයේ ආයතන ගිනිබත් කරන ලදි. තවත් සැලකියයුතු ලක්ෂණයක් වූයේ රජයේ සංවිධාන තුල මැනවින් සංවිධානය කරන ලද වැඩවර්ජන පැවැත්වීමය. අත්‍යවශ්‍ය සේවා අක්‍රිය තත්ත්වයටම වාගේ පත්කල එක් වැඩ වර්ජනයක් නම් ජාතික ප්‍රවාහන සේවකයින් විසින් දියත් කල වැඩ වර්ජනයයි. තවත් නොයෙක් රජයේ ආයතනවල අනුක්‍රමයෙන් වැඩ කටයුතු නතර විය. මෙය සිදුවූයේ " දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය (D.J.V.) " නමින් හැඳින්වුනු සංවිධානයක් විසින් එම ස්ථානවලට යැවුනු තුණ්ඩු කැල්ලකින් දුන් නියෝග සමගය. මෙම වැඩ වර්ජන සමග එම සංවිධානය විසින්ම ප්‍රකාශයට පත්කරන ලදැයි කියවුනු ඇත්ත වශයෙන්ම වූ ඇඳිරි නීති නියෝගද ක්‍රියාත්මක විය. "දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ" නියෝග නිකුත් කරනු ලැබූයේ "කීර්ති විජයබාහු" යන නමක් යටතේය. මෙහි ප්‍රතිඵලය ලෙසට රට තුල අරාජික තත්ත්වයක්ම බඳු තත්ත්වයක් පැවතිණ.

නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න මහතාගේ සාක්ෂි උපයෝගි කරගෙන තත්ත්වය සම්පිණ්ඩනය කර දක්වතොත්, රටේ පැවති තත්ත්වය " අතිවිශේෂ" එකක් විය. මෙම අති විශේෂ තත්ත්වය මැඩලීම සඳහා " අති විශේෂ ක්‍රියා මාර්ග ගතයුතු වී යයි" ඔහු තවදුරටත් කීය. සාක්ෂිකරු මෙම වචන ප්‍රකාශ කල අවස්ථාවෙහි ඔහු අදහස් කලේ කුමක් වියහැකිද යන්න අපි යථා කාලයේදී විශ්ලේෂණය කිරීමට තැත් කරන්නෙමු.

## ප්‍රතිවිරුද්ධ පියවර:

මෙරිල් ගුණරත්න හා නලින් දෙල්ගොඩ යන නියෝජ්‍ය පොලිස්පතිවරුන් දෙදෙනාම කියන අන්දමට ඉහත සඳහන් ප්‍රචණ්ඩ ක්‍රියා රැල්ලේ ආරම්භයේදී එම ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදුනවුන්ට විරුද්ධව පොලිසිය ලවා කාර්යක්ෂමව ප්‍රතිචාර දක්වන්නට සැලැස්වීම දුෂ්කර විය. ඔවුන්ට අනුව ඊට ප්‍රධානම හේතුව එම පොලිස් නිලධාරීන් එම ක්‍රියාවල යෙදුනවුන්ට බියවීමය. කණිෂ්ඨ පොලිස් නිලධාරීන් අතුරින් සමහර දෙනා ත්‍රස්තවාදීන්ගේ උද්ඝෝෂනයේ තේමාවන්ට එකඟවීම ඔවුන්ගෙන් පලවුනු අක්‍රියශීලී බවට තවත් හේතුවක් වන්නට ඇත යන්න දේශපාලන විශ්ලේෂකයින්ගේ මතය වී තිබේ. " ඉන්දියානු අධිරාජ්‍යවාදය නැවැත්වීම " , "ආර්ථික සම්පත් බෙදී යෑමේ සමානත්වයක් ඇති කිරීම", " ඉන්දියානු සන්නද්ධ හමුදා ආපසු යැවීම", ජනවාර්ගික ප්‍රශ්ණය විසඳීම, මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ස්ථාපනය කිරීම යන මේවා මෙම තේමාවන්ගෙන් සමහරකි.

1988 අග භාගයේදී ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන ක්‍රියාශීලී දේශපාලනයෙන් විශ්‍රාම ගත් අතර, 1988 නොවැම්බර් මාසයේදී ජනාධිපතිවරණයක් පවත්වන ලදී. ජනාධිපති තනතුර සඳහා තරඟ වැදුනු ප්‍රධාන තරඟකරුවන් වූයේ රණසිංහ ප්‍රේමදාස මහතා ( එක්සත් ජාතික පක්ෂ රජයේ අග්‍රාමාත්‍යවරයා), සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ( කලක් ප්‍රජා අයිතිවාසිකම් අහිමි කොට සිට මෑතදී එම අයිතිවාසිකම් හිමිවූ හිටපු අග්‍රාමාත්‍යවරිය) සහ ( එක්සත් සමාජවාදී පෙරමුණේ අපේක්ෂක) ඔසී අබේගුණසේකර මහතාය. ප්‍රචලිතව පැවති ප්‍රචණ්ඩ ක්‍රියා හා බියගැන්වීම් අතර තුරේම ජනාධිපතිවරණය පවත්වනු ලැබිණ. මෙහිදී රණසිංහ ප්‍රේමදාස මහතා ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා ලෙස ජන්දයෙන් තේරී පත්වූ බව ප්‍රකාශයට පත්කරනු ලැබිණ. පාවිච්චි වූ ජන්ද සංඛ්‍යාවෙන් ඔහු ලබාගත් ජන්ද ප්‍රමාණය 50.43% කි. එම ජනාධිපතිවරණය පැවැත්වූ විගසින්ම 1989 පෙබරවාරි මාසයේදී මහා මැතිවරණයක් පැවැත්වූ අතර, එහිදී එක්සත් ජාතික පක්ෂයට පාර්ලිමේන්තු ආසන 196 න් ආසන 125ක් ලැබිණ. ඩී.බී. විජේතුංග මහතා අග්‍රාමාත්‍යවරයා ලෙසත්, රන්ජන් විජේරත්න මහතා ජාතික ආරක්ෂක අමාත්‍යවරයා හා රාජ්‍යාරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙසත් පත්කරනු ලැබූහ. කඩාකප්පල්කාරීන්ගෙන් එල්ලවූ තර්ජනය මෙල්ල කිරීමේ කටයුත්ත භාර වූයේ විජේරත්න මහතාටය.

මෙමං කාලය තුළදී දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය විසින් නිකුත් කරන ලදැයි කියවුනු පෝස්ටර් මාලාවක්ම රට පුරා ප්‍රදර්ශණය කරනු ලැබිණ. සියළුම සන්නද්ධ හමුදා හා පොලිස් සේවා-සාමාජිකයින් ඉල්ලා අස් වියයුතු යයි එම පෝස්ටර් වලින් ඉල්ලා තිබිණ. ඔවුන් එසේ ඉල්ලා, අස් නොවුනහොත් ඔවුන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් මරණයට පත්කරන බවට එම පෝස්ටර් වලින් තර්ජනය කර තිබිණ. ඇත්ත වශයෙන්ම මෙම පෝසටර් ප්‍රදර්ශනය වීමෙන් පසු පොලිස් නිලධාරීන් ටික දෙනෙකු හා ඔවුන්ගේ පවුල් ඝාතනයට ලක්විය. නලින් දෙල්ගොඩ කියන අන්දමට, කඩාකප්පල්කාරීන්ට විරුද්ධව ගෙන යන ව්‍යාපාරයට එයින් පසු පොලිස් නිලධාරීන්ගේ සහාය ලබාගැනීම පහසු විය. පොලිස් නිලධාරීන් කැලඹිල්ලට පත්ව කෝපයට පැමිණි හෙයින් කඩාකප්පල්කාරීන්ට විරුද්ධව සටන ගෙනයාමට ඉදිරිපත්වූ අය එන්ට එන්ටම වැඩිවිය.

1980 වර්ෂවල අග හරියේ සිට කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකක පොලිස් කොට්ඨාසවල පිහිටුවනු ලැබිණ. කඩාකප්පල්කාරී ක්‍රියා සම්බන්ධ රහස් තොරතුරු එක් කොට ගෙන අධ්‍යයනය කිරීම, විමර්ශණ පැවැත්වීම, සැකකරුවන් අත්අඩංගුවට ගැනීම හා ත්‍රස්තවාදි මර්දන ක්‍රියා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම, ඒවායේ ප්‍රධාන නිල රාජකාරී විය. කාර්යභාර නිලධාරීන් යටතේ මෙම ඒකක පැවති අතර ඒවා අයත් වූයේ සහකාර පොලිස් අධිකාරීවරුන්ගේ විෂය පථයටය. එම සහකාර පොලිස් අධිකාරීවරුන් සහකාර පොලිස් අධිකාරී ( මෙහෙයුම්) යනුවෙන් හඳුන්වනු ලැබූහ. මෙම ඒකක පිහිටුවනු ලැබුයේ ඒ ඒ පොලිස් කොට්ඨාසවල ප්‍රධාන පොලිස් ස්ථානයේ ය. මෙම ඒකකවල නිලධාරීන්ට සිවිල් ඇඳුම්වලින් සැරසී ක්‍රියාත්මකවීමට බලය දෙනු ලැබිණ. මේ අනුව එම නිලධාරීන් ස්ථිරව පාවිච්චි කරන පොලිස් වාහනවලින් පමණක් නොව සිවිල් ලක්ෂණ දැරූ පවරාගත් ·වාහනවලද ගමන් කළහ. මෙම වාහන සමහරකට නිසි ලියාපදිංචි කළ අංක නොතිබුණු බවත්, ඒවායේ තිබුණේ "ගරාජ අංක" බවත් පරීක්ෂණ කටයුතුවලදී හෙළිදරව් විය. මෙම තත්ත්වය නිසා එබඳු වාහන නිත්‍ය වශයෙන් හඳුනාගැනීම දුෂ්කර විය. කඩාකප්පල්කාරීන්ගෙන් එල්ලවූ තර්ජනය කාර්යක්ෂමව මර්දනය කිරීමට හැකිවූයේ ඒ ඒ ප්‍රදේශවල කඩාකප්පල්කාරී මර්දන ඒකකවලට බව කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් සියළුම පොලිස් නිලධාරීන් ගෙන සිටි ස්ථාවරයයි.

1980 දශකයේ අග භාගයෙහි තරුණ තරුණියන් පෙර නොවූ විරූ තරමින් විශාල සංඛ්‍යාවක් අතුරුදහන්වීම ශ්‍රී ලංකාවේ දක්නට ලැබිණ. මෙයින් සමහර දෙනා පැහැර ගෙන යනු ලැබීමට සම්බන්ධ සාක්ෂි තිබුණ නමුත් අතිකුත් බොහෝ දෙනාට සිදුවූයේ කුමක්ද යන්න ගැන කිසිත් හෝඩුවාවක් නොතිබිණ. පැහැරගෙන යනු ලැබූ බොහෝ පුද්ගලයෝ සදහටම අතුරුදහන් වූහ. සමහරක් අවස්ථාවල ටික කලකට පසු, පැහැරගෙන යනු ලැබුවන්ගේ වෙඩි උණ්ඩ වලින් සිදුරුව ගිය හෝ පිලිස්සී ගිය මළ සිරුරු හමුවිය. මෙසේ ජීවිතක්ෂයට පත්කරන ලද හා අතුරුදහන්වුවන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව 40,000ක් පමණ වේ යයි නිල නොවන ඇස්තමේන්තුවලින් පෙන්නුම් කෙරේ. පැහැරගෙන යනු ලැබූ ඉතාම ටික දෙනෙකු පමණක් රජයෙන් පවත්වනු ලබන රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා සිටින බවටත්, තවත් ඇතැම් අය නිල නොවන රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා සිටින බවටත් සැහෙන තරම් දීර්ඝ කාලසීමාවකට පසු ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට දැනගන්නට ලැබිණ. මෙම පරීක්ෂණයේ ප්‍රධාන අංශය අදාළ වන්නේ "බටලන්දේ පිහිටි එබඳු නිල නොවන හා නීති විරෝධී රැඳවුම් මධ්‍යස්ථානයකටය".

මෙම කාලසීමාවේදී (ජනතා විමුක්ති පෙරමුණ හැරුණු විට) අතිකුත් විපක්ෂ දේශපාලන කණ්ඩායම්වල පුද්ගලයින්ද කඩාකප්පල්කාරීන් මර්දනය කිරීමේ මුවාවෙන් හිංසා පීඩාවලට ඉලක්ක වන බවට පැමිණිලි ලැබීම එන්ට එන්ටම වැඩිවිය. එබඳු පැහැරගෙනයෑම්/අතුරුදහන්වීම් සම්බන්ධයෙන් එවකට පැවති විපක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ අවස්ථාවලදී පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළ බව සාක්ෂිවලින් කියැවිණ. ප්‍රධාන චෝදනාව වූයේ තම දේශපාලන විරුද්ධවාදීන්ගෙන් " නිදහස්වීමට" රජයේ දේශපාලනඥයින් පොලිස් නිලධාරීන් පාවිච්චි කරන බවය. රට කරවූ එක්සත් ජාතික පක්ෂයේ ඇතැම් දේශපාලනඥයින් සමග ඇතැම් පොලිස් නිලධාරීන් පැවැත්වූ සමීප ආශ්‍රය නිසා මෙම චෝදනාව එල්ලවීමට පැහැදිලි පදනමක් පැවතියාක් මෙන් පෙනෙන්නට තිබේ. රනිල් වික්‍රමසිංහ මහතාගේ – ප්‍රධානත්වයෙන් බටලන්ද නිවාස සංකීර්ණයේ නිවාස දෙකක පැවැත්වූ රැස්වීම් මාලාවක් ගැන සාක්ෂිවලින් ප්‍රකාශ විය. මෙම රැස්වීම්වලට, එම ප්‍රදේශයේ තෝරාගත් පොලිස් නිලධාරීන් සමූහයක්, සුරනිමල රාජපක්ෂ බඳු එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනඥයින් ටිකදෙනෙකු සමග සහභාගිවූ බව එම

සාක්ෂිවලින් කියැවින. මෙරිල් ගුණරත්න, නලින් දෙල්ගොඩ, ඩග්ලස් පීරිස්, රාජා ඩයස් වැනි පොලිස් නිලධාරීන් එම රැස්වීම්වලට සහභාගිවූ බව කවුරුත් පිළිගත්හ. මෙම රැස්වීම්වල ප්‍රධාන ලක්ෂණ පිළිබඳව ඒකාකාර සාක්ෂිදීමට ඉහත සඳහන් පුද්ගලයින්ගෙන් කිසිවෙකුටවත් පුළුවන් වූයේ නැත. හැම පුද්ගලයකුගේ සාක්ෂි අනිකුත් අයගේ සාක්ෂි හා පරස්පර විරෝධී විය. මෙම රැස්වීම්වල වාර්තා හෝ සටහන් කිසිවක් තබා ගෙන නැත. මෙම රැස්වීම්වලදී සාකච්ජා කරන ලද මාතෘකා පිළිබඳ සාක්ෂි එතරම් පැහැදිලි නැත. කුමක් නිසාද යත්, සාක්ෂිකරුවන් ඒ පිළිබඳව දුන් සාක්ෂි පරස්පර විරෝධී වූ බැවිනි. නලින් දෙල්ගොඩ මහතා කියන අන්දමට මෙම රැස්වීම්වල පරමාර්ථය වූයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන කටයුතු ගැන රනිල් වික්‍රමසිංහ මහතා විසින් ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්ට " දේශපාලන නායකත්වය" දීම හා "නියමයන්" කිරීමය. කෙසේ වුවද " කර්මාන්ත අමාත්‍යවරයාට" පොලිස් නිලධාරීන් සමග කුමක් කිරීමට නීතියෙන් අපේක්ෂිතව තිබුනේද යන්න ගැන සාක්ෂිකරුට පැහැදිලි කිරීමක් කල නොහැකිවිය. මෙම විෂය ගැන පසුව එන පරිච්ඡේදයකදී තවදුරටත් කරුණු කියැවෙනු ඇත. සැලකිල්ල යොමු වියයුතු කරුණ නම්, පාලක පක්ෂයේ දේශපාලනඥයින් පලාතේ පොලිස් නිලධාරීන් සමග කිට්ටු සබඳතා පැවැත්වූ බවත්, එම සබඳතා පදනම් කොට කුමක් සිදුවූයේද යන්න එතරම් පැහැදිලි නැති බවත්ය.

## ජනතා විමුක්ති පෙරමුණ පාලනය කරනු ලබයි.

1989 වන විට රජය නායකත්වය දී ගෙන ගිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන මෙහෙයුම් උච්චතම අවස්ථාවට පැමිණ තිබිණ. පොලිසියේ හා සන්නද්ධ හමුදාවල විවිධ සංවිධානවලට අමතරව, යම් යම් වෙනත් කණ්ඩායම් ද ක්‍රියාකාරී වෙමින් තිබිණ. මෙම කණ්ඩායම්වලට පොදුවේ " සෝදිසි කණ්ඩායම් " කමිටු යන නම දී තිබිණ. එක් එක් නම වෙන වෙනම සඳහන් කරතොත්, "ප්‍රා", "කොල කොටි", "කළු බලල්ලු", " දිවි මකුළුවා", " කහ බලල්ලු" යන නම් වලින් ඒවා හඳුන්වනු ලැබිණ. මෙම කණ්ඩායම්වල ප්‍රධාන කාර්ය වූයේ කඩාකප්පල්කාරී සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඔවුන් විනාශ කිරීම බව පැහැදිලිය. මෙරිල් ගුණරත්න හා නලින් දෙල්ගොඩ යන දෙදෙනාගේම සාක්ෂිය වූයේ, මෙම කණ්ඩායම්වල සාමාජිකයින්ගේ නීති විරෝධී කියා ගැන පොලිසිය විසින් ඔවුන් අත්අඩංගුවට ගත් එක් අවස්ථාවක්වත් ඔවුන් නොදන්නා බවය. මෙම කණ්ඩායම්වලට පොලිසියේ අනුග්‍රහය ලැබුණේය යන්න ඇත්ත වශයෙන්ම, කොමිෂන් සභාවට ඇතිවූ පැහැදිලි හැඟීමයි. එහෙයින් මෙම කණ්ඩායම්වල සාමාජිකයින් හඳුනාගැනීම ඉතාම වැදගත් විය. මෙම කණ්ඩායම්වල සාමාජික සමූහයා විමසා දැනගැනීමෙන් මෙම කණ්ඩායම් හඳුනාගැනීමට කොමිෂන් සභාව නැත් කලේය. මෙම කාරණය ගැන නියත සාක්ෂියක් කලින් කැබිනට් අමාත්‍යවරයකුව සිටි වත්මන් එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝන් අමරතුංග මහතාගෙන් ලැබිණ. අමරතුංග මහතා කියන අන්දමට, ඔහු ( අමරතුංග මහතා) තුළ පැවති විශ්වාසය නම් කළු බලල්ලූ ශ්‍රී ලංකා පොලිසියේම සංවිධානයක් බවයි. අමරතුංග මහතාට එසේ විශ්වාස කිරීමට නිශ්චිත හේතු තිබෙන්නට ඇත. එසේ වුවද, ඔහුගේ කැබිනට් සගයන් වන රනිල් වික්‍රමසිංහ මහතා හා ජෝෂප් මයිකල් පෙරේරා මහතා එම අදහසට එකඟවීම ප්‍රතික්ෂේප කළහ. කොමිෂන් සභාව විසින් බටලන්ද නිවාස යෝජනා ක්‍රමය පරීක්ෂා කල අවස්ථාවෙහි ඩග්ලස් පීරිස් මහතාගේ නිවස ඉදිරිපිට වූ නිවසක ජනේලවල හා බිත්තිවල ( නිවසේ පීරිස් මහතාගේ ආරක්ෂක නිලධාරීන් නවතා සිටින ලදැයි ඔප්පුවී තිබිණ.) " කළු බලල්ලු" යන වචන ලියා තිබිණ. 1988 - 1990 කාලසීමාවේ මෙම ඉහතින් සඳහන් නම දී තිබුණු බව ඇත්ත වශයෙන්ම කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශවූ සාක්ෂිවලින් පැවසිණ. මෙම

"සෝදිසි" කණ්ඩායම්වල නීති විරෝධී ක්‍රියාවලට හේතු දැක්වීමක් නොකෙරිණ. ඒවාට රටේ සාමාන්‍ය නීතිය ක්‍රියාත්මකවීමෙන් මුක්තියක් තිබිණ. මෙම කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය හා ඇතැම් පොලිස් ඒකකවල ක්‍රියාකාරිත්වයේ ස්වභාවය, " ජනතා විමුක්ති පෙරමුණේ ත්‍රස්තවාදය රජයේ සංවිධාන විසින් ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය ත්‍රස්තවාදයෙන් හා " සෝදිසි " කණ්ඩායම් විසින් සිදු කෙරුණු ත්‍රස්තවාදයෙන් මෙල්ල කරනු ලැබූ බවට" වූ චෝදනාව එල්ල කිරීමට දායක වන බව එවකට වූ පොලිස්පති විසින් පිළිගන්නා ලදී.

1990 දී නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීහු ජනතා විමුක්ති පෙරමුණට විරුද්ධ සිය සටනෙහිලා ලොකු ප්‍රගතියක් ලබාගත්තේය. ඔවුන්ට ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය අත්අඩංගුවට ගැනීමට හැකිවිය. පක්ෂයේ නායක රෝහණ විජේවීර හා පක්ෂයේ ලේකම් උපතිස්ස ගමනායක ඒ අතර වූහ. එසේ එක් එක් පුද්ගලයා අත්අඩංගුවට ගැනීමෙන් සුළු කාලයක් ඇතුළතදී පුද්ගලයෝ දෙදෙනාම පොලිස් හමුදා භාරයේ සිටියදී අභිරහස් තත්ත්වයන් යටතේ මරණයට පත්වූහ. නායකත්වය අල්ලා ගැනීමත්, පක්ෂ ක්‍රියාකාරීන් විශාල වශයෙන් අල්ලා ගැනීමත් සමග ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරකම් අඩුවන්නට විය.

තමන්ට කුමක් සිදුවිය හැකිද යන්න ගැන තිබූ බිය නිසා ඇතැම් සාමාජිකයෝ පොලීසියට යටත් වන්නට විය. 1990 ගණන්වල අන්තිමේදී කඩාකප්පල්කාරීන් ගෙන් එල්ලවූ තර්ජනය අවසන්වූ බව අවිවාදාත්මකය. කෙසේ වුවද, කඩාකප්පල්කාරීන් මෙන්ම කඩාකප්පල්කාරී ක්‍රියා මාර්දන කණ්ඩායම් විසින්ද දියත් කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියාවලින් සමාජයට ඇතිවූ තුවාල සුව නොවී කලක් පැවතින. 1987 සිට 1990 දක්වා වූ කාලසීමාව " භීෂණ සමය" නමින් හඳුන්වනු ලැබිණ. මෙම කාලසීමාවේදී විශාල වශයෙන් සිදුවූ පුද්ගලයින් අතුරුදහන්වීමත් කෲර මිනිස් ඝාතනත් නිසා, ශ්‍රී ලංකාව ලෝකයේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය සුලබව සිදුවන ප්‍රධාන රටවල් අතුරින් ප්‍රමුඛ රටක් ලෙසට අපකීර්තියක් ලැබීය. එම කාලසීමාව තුළදී, මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ධෛර්යය දීම හා ඉවසීම ගැන ජාත්‍යන්තර සංවිධාන ශ්‍රී ලංකා රජයට චෝදනා නගන්නට විය. පුරවැසියන්ට සිදුවූ දේ ගැන රජය වගකිවයුතුයයි කියන ලදී. එක් අවධියකදී මානව හිමිකම් නිරීක්ෂණයෙහි යෙදුනෝ තත්ත්වය නිරීක්ෂණය සඳහා ශ්‍රී ලංකාවට එවනු ලැබූහ. විශේෂයෙන්ම පොලිස් භාරයේ සිටින සැකකරුවන්ට සළකන ස්වභාවය ගැන පරීක්ෂාකාරීව සිටීම ඔවුන්ගේ අරමුණ විය. මෙම මානව හිමිකම් රැකීමේ ව්‍යාපාරයේ ක්‍රියාකාරීන් පැමිණි ගමන්වල සමහර බලපෑම් ගැන පසුව කරුණු සඳහන් කරනු ලබනවා ඇත.

ඉහතින් සඳහන් කරන ලද කාරණා ගැන කරුණු සඳහන් කිරීම අවශ්‍ය යයි අප විසින් සළකන ලද්දේ අධිකාර පත්‍රයේ අඩංගු නිර්ණේය විෂයයන් ගැන කෙරෙන විමර්ශන එම කාරණා සමග අවියෝජනීය ලෙසින් බැඳී තිබෙන බැවිනි. අදාල සිද්ධීන් සිදුවූ පසුබිම කෙරෙහි නිසි සැලකිල්ල නොදක්වා නිර්ණේය විෂයයේ සඳහන් කරුණු වෙන් වෙන් වශයෙන් ගෙන පරීක්ෂණ කටයුතු කළ නොහැකි නිසාය.

## 1V වන පරිච්ඡේදය.

### බටලන්ද නිවාස යෝජනා ක්‍රමය

1990 දශකයේ මුල් කාලයේදී එවකට පැවති රජය ඇතැම් අත්‍යවශ්‍ය පොහොර ශ්‍රී ලංකාවේම නිෂ්පාදනය කිරීමට තීරණය කලේය. පොහොර වර්ග මෙරට නිෂ්පාදනය කිරීමේ ප්‍රතිඵලය ලෙසට පොහොර නිෂ්පාදනය සඳහා දරන වියදම් අඩුවනු ඇතැයි ද, ඒ හේතු කොට ගෙන කෘෂිකාර්මික ද්‍රව්‍ය නිෂ්පාදන වියදම් අඩුවනු ඇතැයි ද බලාපොරොත්තු වන ලදී. මෙම අරමුණු ඉටුකර ගැනීමට රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව පිහිටුවන ලදී.

අළුතින් පිහිටුවන ලද සංස්ථාවේ මූලික ව්‍යාපාති වලින් එකක් වූයේ යූරියා නිෂ්පාදන යන්ත්‍රාගාරයක් ස්ථාපනය කිරීමය. මීට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර එක්සත් රාජධානියේ කෙලොක් නමැති සමාගමකින් ලබාගන්නා ලදී. යන්ත්‍රාගාර ශ්‍රී ලංකාවේ එකලස් කොට එය කලක් නඩත්තු කිරීමේ කාර්යය එම සමාගමට භාර කරන ලදී. යන්ත්‍රාගාරය පිහිටුවීමත් , යූරියා යන්ත්‍රාගාරය සම්බන්ධ වැඩ කටයුතු සඳහා විශේෂ රසායනාගාරයක් පිහිටුවීම සඳහාත් සපුගස්කන්දේ පිහිටි භූමියක් තෝරාගනු ලැබිණ. මේ සඳහා විදේශීය කාර්මික විශේෂඥයින් ශ්‍රී ලංකාවේ සෑහෙන කාලසීමාවක් නැවතී සිටීමට අපේක්ෂා කරන බැවින්, ඔවුනට ශ්‍රී ලංකාවේ නැවතී සිටින කාලසීමාව තුල වාසය කිරීම සඳහා නිවාස යෝජනා ක්‍රමයක් ගොඩනැගීමට තීරණය කරන ලදී. මෙම කටයුත්ත සඳහා අක්කර 20ක පොල් ඉඩමක් තෝරා ගන්නා ලදී. මෙම ඉඩම පිහිටා තිබුනේ බටලන්ද ගමේය. බටලන්ද පිහිටියේ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ බියගම මැතිවරණ කොට්ඨාසයේය. කොළඹ - නුවර මාර්ගයෙන් ගමන් කරන විට කිරිබත්ගොඩ මංසන්ධියෙන් ඇරඹෙන මාර්ගයක් බියගම කරා දිවෙයි. මෙම මාර්ගය දිවෙන්නේ කොළඹ සිට යන විට දකුණු පැත්තටය. බියගම මාර්ගය සපුගස්කන්ද ටවුම ඔස්සේ බියගමට දිවෙයි. සපුගස්කන්ද ටවුමට ළඟාවීමට මඳකට කලින් වමට හැරී යන මාර්ගයකි. මෙම මාර්ගය පටන් ගන්නේ සපුගස්කන්ද පොලිස් ස්ථානය ඉදිරිපිටම වාගේය . ( සපුගස්කන්ද පොලිස් ස්ථානය පිහිටා තිබෙන්නේ කිරිබත්ගොඩ - බියගම මාර්ගයේ දකුණු පයිනි.) මෙම හන්දියෙන් හැරී කිලෝමීටර් දෙකක් යනවිට බටලන්ද ගම හමුවේ. නිවාස යෝජනා ක්‍රමය තැනීම සඳහා තෝරා ගන්නා ලද කලින් සඳහන් කල ඉඩම පිහිටා තිබෙන්නේ මෙම ගම මධ්‍යයේය. මෙම ඉඩම පිහිටා තිබෙන්නේ යූරියා නිෂ්පාදන යන්ත්‍රාගාරය හා රසායනාගාරය ඇතුලත් රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථා භූමියට කිලෝමීටර දෙකහමාරක් ඈතිනි.

1970 දශකයේ මුල් භාගයේදී විදේශික නිලධාරීන්ගේ පාවිච්චිය සඳහා මෙම නිවාස ක්‍රමයේ වැඩ නිමවන ලදී. එය වෙන්කල නිවාස ඒකක 64 කින් යුක්තවිය. මූලික වශයෙන් මෙහි තුන් වර්ගයක නිවාස තිබේ. " A" වර්ගයේ නිවාස 10කි. මේවා දෙමහල් නිවාසය. "B" වර්ගයේ නිවාස 15 කි. මේවා තනි මහලේ ගෙවල්ය. එක් ඒකකයක වෙන්කල නිවාස දෙකකි. "C" වර්ගයේ නිවාස 43 කි. මේවා නිදන ශාලා ස්වභාවයේ ඒකකය. සියළුම නිවාසවලට නොම්මර යොදා ඇත. මෙම නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ඒ සඳහා පාවිච්චි කර ඇති පොල් ඉඩමේ තැන තැන විසිර තිබේ. ඇත්ත වශයෙන්ම, මුලින් තිබුණු පොල් ගස් තවමත් ඇත. බටලන්ද ගමේ මාර්ගයේ සිට එක් ඇතුල්වීමේ / පිටවීමේ ගේට්ටුවක් බැගින් නිවාස යෝජනා ක්‍රමයට තිබේ. නිවාස යෝජනා ක්‍රමය තුල තාර දැමූ මාර්ග පද්ධතියක් තිබේ. නිවාස යෝජනා

X 110
97.9.1




TC - Torture Chambers.

Duglas Pieris
89.6.30 - A/2
89.6.30 1995 - A 2/5

89 Middle to Aug. 90
1 Residence - A2/2
2 Sec. Officers - A2/1, B01
1 B Keeper - A 2/3
1 Office - B02
5

A 2/2 - Circuit Bungalow 83.08.02 to 89.06.30
Official Residence 89.06.30 to 1990 Aug.
A 2/1 - Security Officers Temp. Res. 89 May to 90 Aug.
A 2/3 - Manpower Mobilization Min. 88.11.01 to 89.10.25.
Fernando (Keeper) 89.10.25 to 1994.
B.01 - Sec. Officers Temp. Res. 89 May to 90 Aug.
B.02 - Office of Industries Minister 89 May to 90 Aug.

ක්‍රමයේ වම් පසට හා දකුණු පසට බටලන්ද ගම විහිද ඇත. පසු පසට වන්නට විශාල වෙල් යායක් තිබේ. සම්පූර්ණ නිවාස යෝජනා ක්‍රමය ආරක්ෂක කටු කම්බි වැටකින් වට කර තිබේ.

නිවාස යෝජනා ක්‍රමය මැද කාර්යාල සංකීර්ණයක් තිබේ. එහි සමාජශාලා ගොඩනැගිල්ලක් හා පිහිනුම් තටාකයක් ද ඇත.

කොමිෂන් සභාව නිවාස යෝජනා ක්‍රමය සම්බන්ධව වැදගත් තොරතුරු රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරු වූ අශෝක සේනානායක මහතාගෙන් ලබාගත්තේය. සේනානායක මහතා වෘත්තියෙන් ඉංජිනේරුවෙකි. 1984 දී රජයට අයත් වාණිජ ව්‍යාපාරයක් වූ යුනයිටඩ් මෝටර්ස් සමාගමේ තිසි බලධාරියා ලෙස ක්‍රියා කළ ඔහු ඉක්බිතිව, එවකට කර්මාන්ත අමාත්‍යවරයා වූ අභාවප්‍රාප්ත සිරිල් මැතිව් මහතා විසින් ඔහු සංස්ථාවේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත් කළේය. එසේ පත්කරන අවස්ථාවේ, එම සංස්ථාව අඛණ්ඩවම අලාභ විඳින බැවින් එය ඇවර කිරීමට කල් ඇතිවම තීරණය කොට ඇතැයි සේනානායක මහතාට උපදෙස් දී ඇත. එසේ වුවද, මෙම ව්‍යාපෘතියට මුදල් ආධාර සපයා ඇති විදේශීය ආයතන එය ඇවර කිරීමට විරුද්ධවී ඇත. එහෙයින් සංස්ථාව නැවත ප්‍රාණවත් කොට එය අලාභ නොවිඳ පවත්වාගෙන යාහැකි තත්ත්වයට පත්කිරීමට තැත් කරන ලෙස සේනානායක මහතාට උපදෙස් දී ඇත. එසේ වුවද, කළමනාකාරිත්වය විසින් සංස්ථාව නැවත ප්‍රාණවත් කිරීමට ගත් මහන්සිය සාර්ථක වූයේ නැත. මෙම සංස්ථාව ඇවර කිරීමට හෝ සංස්ථාවේ කළමනාකරණය පෞද්ගලික සංවිධානයකට විකිණීමට 1986 දී රජය නැවත තීරණය කළේය. එවකට කර්මාන්ත අමාත්‍යවරයා වූ ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා විසින් සංස්ථාවේ ඇවරකරු ලෙසට අශෝක සේනානායක මහතා පත්කරන ලදී. 1997 දී සේනානායක මහතා සාක්ෂිදීමට කොමිෂන් සභාව ඉදිරියට කැඳවන විටත්, සංස්ථාව ඇවර කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණවී නොතිබිණ.

1980 දශකයේ මුල් භාගයේ දී විදේශිකයෝ දිවයිනෙන් බැහැරව ගියහ. රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව නිවාස යෝජනා ක්‍රමයේ නිවාස සමහරක් එහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට වෙන් කොට දුන්නේය. තවත් නිවාස සමහරක් විධිමත් ගිවිසුම් මත ලංකා විදුලිබල මණ්ඩලයට විධිමත්ව වෙන්කොට දෙන ලදී. මෙම නිවාස ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් සමහරක් විසින් පදංචියට යොදා ගන්නා ලදී. තවත් නිවාස ටිකක් "ඇල්පෙකස් සිකියුරිටි" නමින් හැඳින්වූ පෞද්ගලික ආරක්ෂක සමාගමක ආරක්ෂක නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන්කර දෙන ලදී. මෙසේ කරන ලද්දේ සංස්ථාවේ ආරක්ෂාව මෙම පෞද්ගලික ආරක්ෂක සමාගමේ නිලධාරීන්ට භාර කොට තිබුනු බැවිනි. මෙම බාහිර කණ්ඩායම් දෙකෙන්ම සංස්ථාව ගෙවල් කුලී අය කළේය. 1980 දශකයේ මැද භාගයේදී රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශය හා යුද්ධ හමුදා මූලස්ථානය යුද්ධ හමුදා කඳවුරක් පිහිටුවීම සඳහා නිවාස යෝජනා ක්‍රමයෙන් කොටසක් යුද්ධ හමුදාවට මුදාලන ලෙස සංස්ථාවට නිල වශයෙන් ඉල්ලීමක් කළේය. මේ අනුව නිවාස යෝජනා ක්‍රමයේ දොරටුවෙන් වම් පැත්තේ වූ පෙදෙසක් ( මේය නිවාස යෝජනා ක්‍රමයෙන් පිටතට නෙරා තිබෙන්නකි) යුද්ධ හමුදාවට දෙන ලදී. යුද්ධ හමුදාව මෙහි කඳවුරක් පිහිටවූ අතර, එම කඳවුර මෙම කොමිෂන් සභාව ක්‍රියාත්මකවූ කාලයේ ද ක්‍රියාත්මක විය.

සංස්ථාව ඇතුළත මෙන්ම පිටස්තර නිලධාරීන්ට විධිමත්ව නිවාස වෙන්කොට දීමෙන් පසුවද තවත් නිවාස ටිකක් හිස්ව තිබිණ.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ කටු සටහනක් X 110 ලෙසින් සළකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි.

රනිල් වික්‍රමසිංහ මහතාගේ උපදෙස් පිට වෙන් කරන ලද නිවාස

( පුද්ගලයින් නීති විරෝධීව රඳවා තබා වධ දීමට පාවිච්චි කරන ලද නිවාස අංක ඉදිරියේ * යන සලකුණ තබා ඇත.)

(1) කලින් සිටි අමාත්‍යවරයාගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ පාවිච්චිය සඳහා.

| අංකය | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|
| A 2/2 | I. රනිල් වික්‍රමසිංහ මහතා යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ සංචාරක බංගලාව. | 1983 මාර්තු 02 වන දින සිට 1989 අප්‍රේල් 30 දක්වා |
| | II. රනිල් වික්‍රමසිංහ මහතා කර්මාන්ත අමාත්‍යවරයාගේ නිල නිවස | 1989 අප්‍රේල් සිට 1994 අගෝස්තු මස දක්වා . |

| අංකය | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|
| A 2/1 | හිස්ව තිබුනා<br>රනිල් වික්‍රමසිංහ මහතාට වෙන් කරන ලද ආරක්ෂක නිලධාරීන් | 1987 සිට 1989 දක්වා<br>1989 මැයි සිට 1994 අගෝස්තු මස දක්වා |

| අංකය | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|
| A 2/3 | I. රනිල් වික්‍රමසිංහ මහතා යටතේ ක්‍රියාත්මක වූ මිනිස් බල උපයෝගිතා අමාත්‍යාංශයට පවරන ලද | 1988 නොවැම්බර් 01 සිට 1989 ඔක්තෝබර් 25 දක්වා |
| | II. වින්සන්ට් ප්‍රනාන්දු මහතා, රනිල් වික්‍රමසිංහ මහතාගේ බංගලා භාරකරු | 1989 ඔක්තෝබර් 25 වන දින සිට 1994 අගෝස්තු දක්වා. |

| අංකය | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|
| A 1/7 | I. රනිල් වික්‍රමසිංහ මහතාට වෙන් කළ ආරක්ෂක නිලධාරීන්. | දළ වශයෙන් 1989 සිට 1994 අගෝස්තු දක්වා. |

සටහන: A1/8 නිවස පිහිටා තිබෙන්නේ මේ නිවස ලඟට ආසන්නතමවය.( ඊට දකුණත පැත්තේ) ඇවරකරු කියා සිටියේ මෙම නිවස හිස්ව තබා තිබුනේ විශාල වශයෙන් අලුත්වැඩියාවන් කිරීමට තිබුනු නිසාය යන්නය. එසේ වුවද යම් යම් පොලිස් නිලධාරීන් එය අනවසරයෙන් අල්ලාගෙන සිටින බවට ඔහුට ආරංචි ලැබිණ. මෙහි මින්මතු සඳහන් කෙරෙන ක්‍රමය අනුව එය පොලිස් නිලධාරීන්ට වෙන් කළ නිවසක් නොවේ. පුද්ගලයින් නීතිවිරෝධීව මෙම නිවසෙහි රඳවා වධ දෙන ලද බව සාක්ෂිකරු අජිත් ජයසිංහ කියා සිටියේය. ඔහු මෙම නිවස කොමිෂන් සභාවට පෙන්නා දුන්නේය.

| අංකය | | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|---|
| * B 2 | I. | පොහොර නිෂ්පාදන සංස්ථාවේ සංචාරක බංගලාව | 1987 |
| | II. | හිස්ව තිබුනා | 1987 සිට 1989 මැයි දක්වා |
| | III. | රනිල් වික්‍රමසිංහ මහතාගේ කාර්යාලය | 1989 සිට 1994 අගෝස්තු දක්වා |

සටහන: තමා මෙම නිවසෙහි නීති විරෝධීව රඳවා වධ දෙන ලදැයි සාක්ෂිකරු වී.එම්.බන්දුල කියා සිටියේය. ඔහු රැඳවුම් භාරයෙන් පැන ගියේය. ඔහු නිවස කොමිෂන් සභාවට පෙන්නා දුන්නේය. (පරීක්ෂා කර බැලීම සඳහා කොමිෂන් සභාව නිවාස යෝජනා ක්‍රමයට ගිය අවස්ථාවෙහි) මෙම කාරණය ගැන පසුව කරුණු සඳහන් කරනු ඇත.

| අංකය | | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|---|
| * B 1 | I. | පොහොර නිෂ්පාදන සංස්ථාවේ සංචාරක බංගලාව | 1987 දක්වා |
| | II. | හිස්ව තිබුනා | 1987 සිට 1989 මැයි දක්වා |
| | III. | රනිල් වික්‍රමසිංහ මහතාට වෙන්කරන ලද ආරක්ෂක නිලධාරීන් | 1989 සිට 1994 අගෝස්තු දක්වා |

| අංකය | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|
| B 7 | පොලිස් පරීක්ෂක සුදත් චන්ද්‍රසේකර මහතා රනිල් වික්‍රමසිංහ මහතාගේ පෞද්ගලික ආරක්ෂක නිලධාරී | 1988 මැයි 01 සිට 1994 අගෝස්තු දක්වා |

සටහන : B 8 නිවස පිහිටා තිබෙන්නේ මෙම නිවස ළඟට ආසන්නතමවය. මෙම නිවසෙහි ( B 8) සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස් මහතාට වෙන්කරන ලද ආරක්ෂක නිලධාරීහු පදිංචිව සිටියහ. තමා මෙම නිවසෙහි නීති විරෝධීව රඳවා තබාගෙන වධ දෙන ලද බව සාක්ෂිකරු අජිත් සුගී පෙරේරා සාක්ෂි දෙමින් කිය. සාක්ෂිකරු කොමිෂන් සභාවට නිවාසය පෙන්නා දුන්නේය.

II. රනිල් වික්‍රමසිංහ මහතාගේ නියමය පරිදි සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස් මහතාට වෙන් කරන ලද

| අංකය | | පදිංචිව සිටියේ | කාලසීමාව |
|---|---|---|---|
| A 1/ 2 | (I) | ඩග්ලස් පීරිස් මූලස්ථාන පොලිස් පරීක්ෂක පෑලියගොඩ. | 1984 අගෝස්තු 18 වන දින සිට 1988 ජුනි මස 20 දින දක්වා |
| | (II) | ඩබ්ලිව්. මහනායක මූලස්ථාන පොලිස් පරීක්ෂක පෑලියගොඩ. | 1988 ජුනි මස සිට 1990 මැද දක්වා. |
| | (III) | එච්.ජ්. වික්‍රමසිංහ සහකාර පොලිස් අධිකාරි කැළණිය. | 1990 නොවැම්බර් 15 දින සිට 1996 දක්වා. |
| A1/4 | (I) | සහකාර පොලිස් අධිකාරි, ආර්. ධර්මරත්න | 1986 දෙසැම්බර් 16 දින සිට 1989 ජූලි මස 31 වන දින දක්වා |
| | (II) | සහකාර පොලිස් අධිකාරි එච්. චන්ද්‍රදාස | 1989 අගෝස්තු මස 02 දින සිට 1996 දක්වා |
| A 1/5 | (I) | පොලිස් අධිකාරි නලින් දෙල්ගොඩ | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1990 මැයි මස 05 දින දක්වා |

| | | |
|---|---|---|
| A2/5 | සහකාර පොලිස් අධිකාරී<br>ඩග්ලස් පීරිස් | 1989 අගෝස්තු<br>02 දින සිට<br>1995 මැද දක්වා |

සටහන: හඳුනාගත් නීති විරෝධී රැඳවුම් මධ්‍යස්ථානයක් හෙවත් වධකාගාරයක් ඉදිරිපිට ආසන්නතවම පිහිටා තිබේ. ( B 8)

| | | |
|---|---|---|
| A 2/12 | (1) කාර්ය භාර නිලධාරී,<br>පොලිස් ස්ථානය, කැලණිය | 1989 අගෝස්තු<br>02 දින සිට<br>1990 මැද දක්වා |

( පාවිච්චියට ගන්නා ලදී. නමුත් කවුරුන් විසින් පාවිච්චි කරන ලද්දේද යන්න ගැන වාර්තා කිසිවක් නැත.)

(II) පොලිස් පරීක්ෂක, 1990 සැප්තැම්බර්
එන්.එම්.එස්.බී. තිශ්සංක මස 10 දින සිට
කාර්ය භාර නිලධාරී, කැලණිය 1996 දක්වා

| | | |
|---|---|---|
| B 6 | කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට අනුයුක්ත නිලධාරියෙකු පදිංචිව සිටින බව සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් 1989 අගෝස්තු මස 02 වන දින දරන ලිපියකින් පිළිගෙන ඇත. (X 65) යනුවෙන් සළකුණු කර ඇති ලියවිල්ල) මෙම නිලධාරියාගේ අනන්‍යතාවය ගැන සාක්ෂියක් නැත. | |

| | | |
|---|---|---|
| *B 8 | සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතාට වෙන් කරන ලද ආරක්ෂක නිලධාරීන් | 1988 සිට 1991 දක්වාවූ කාලසීමාව |

සටහන : තමා නීති විරෝධීව රඳවා ගෙන වධ දීමට ලක් කළ නිවස වශයෙන් සාක්ෂිකරු අර්ල් සුගී පෙරේරා විසින් හඳුනා ගන්නා ලදී. සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස් වාසය කළ නිවස ඉදිරිපිට ඊට ආසන්නතමව පිහිටා තිබේ. මෙම නිවස පිහිටා තිබෙන්නේත් රනිල් වික්‍රමසිංහ මහතාගේ පෞද්ගලික ආරක්ෂක නිලධාරි, පොලිස් පරීක්ෂක, සුදත් චන්ද්‍රසේකර පදිංචිව සිටි නිවසට ආසන්නතමව යාබදවය.

| | | |
|---|---|---|
| B 10 | (1) පොලිස් කොස්තාපල් රණතුංග කැලණිය කඩාකප්පල්කාරි ක්‍රියා මර්දන ඒකකයට අනුයුක්ත නිලධාරි | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1990 අග හරිය දක්වා |
| | (II) පොලිස් කොස්තාපල් ඩී.ජී. සුනිල් පෙරේරා | 1991 පෙබරවාරි මස 15 වන දින සිට 1996 දක්වා |

| | | |
|---|---|---|
| B 13 | ප්‍රධාන පොලිස් පරීක්ෂක, රංජිත් වික්‍රමසිංහ කාර්ය භාර නිලධාරි, කඩාකප්පල්කාරි ක්‍රියා මර්ධන ඒකකය කැලණිය | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1996 දක්වා |
| B 20 | කාන්තා පොලිස් කොස්තාපල්, කාන්ති ප්‍රනාන්දු කැලණිය කඩාකප්පල්කාරි ක්‍රියා මර්දන ඒකකයට අනුයුක්ත නිලධාරිනී | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1996 දක්වා |

| | | |
|---|---|---|
| B 21 | පොලිස් සැරයන් ලක්ෂ්මන් ඩයස් කැලණිය කඩාකප්පල්කාරි ක්‍රියා මර්දන ඒකකයට අනුයුක්ත නිලධාරි | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1996 දක්වා |

| | | |
|---|---|---|
| B 23 | පොලිස් කොස්තාපල් හින්ඩබණ්ඩා කැලණිය කඩාකප්පල්කාරි ක්‍රියා මර්දන ඒකකයට අනුයුක්ත නිලධාරි | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1996 දක්වා |

*B 34 සපුගස්කන්ද පොලිස් ස්ථානයට පවරා දෙන ලදී.

**සටහන: තමා නීති විරෝධීව රඳවා ගෙන වධ දෙනු ලැබූ ස්ථානය ලෙස සාක්ෂිකරු වාසල ජයසේකර විසින් මෙම නිවස හඳුනා ගන්නා ලදී.**

III කිසිත් අවසරයක් නොමැතිව පොලිස් නිලධාරීන් විසින් පාවිච්චි කරන ලද නිවස

* ඒ1/8 අළුත්වැඩියා කිරීම අවශ්‍යවීම නිසා අත්හැර දමන ලද නිවාසය

මෙහි පොලිස් නිලධාරීන් නිතර ගැවසුන බව රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ නිලධාරීන්ට පෙනී ඇත. සංස්ථාවේ ඇවරකරුවන අසෝක සේනානායක මහතාට ඒ බව දන්වන ලදි. ඔහු පැලියගොඩ පොලිස් ස්ථානයට දන්වා ඇත. රනිල් වික්‍රමසිංහ මහතාටත් ඔහු දන්වා ඇත. මේ ගැන ක්‍රියා කර නැත. තත්ත්වය එසේම පැවතී ඇත. පුද්ගලයින් නීතිවිරෝධීව රඳවා තබාගෙන වධ දුන් ස්ථානයක් ලෙසට සාක්ෂිකරු අජිත් ජයසිංහ මෙය හඳුනා ගත්තේය. රනිල් වික්‍රමසිංහ මහතාගේ ආරක්ෂක නිලධාරීන් පදිංචිව සිටි ඒ 1/7 නිවාසයට යාබදවම පිහිටා ඇත.

**පොලිස් නිලධාරීන්ගේ සංවිධානමය ව්‍යුහය**

**(කොමිෂන් සභාවට අදාළ අය)**



# V වන පරිච්ඡේදය

## නීති විරෝධී රැඳවුම් මධ්‍යස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම

### පොලිස් නිලධාරීන්ට නිවාස වෙන්කරදීම

ලබාගැනීමට තිබෙන කරුණු වලින් පෙනෙන ලෙසට එවකට සිටි කර්මාන්ත අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරුවූ අසෝක සේනානායක මහතාට දුරකථනයෙන් කථා කොට, බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ටිකක් පොලිස් නිලධාරීන්ට වෙන්කොට දෙන ලෙස උපදෙස් දී තිබේ. ඇමතිවරයා විසින් විධිමත් උපදෙස් ලිඛිතව දී නැත්තාක් මෙන් පෙනේ. සංස්ථාව , කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය තුළට අයත් වූයෙන් අදාල අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමයන් පිළිපැදීමට ඇවරකරු බැඳී සිටියේය. මේ අනුව සේනානායක මහතා, නිවාස සංකීර්ණ ක්‍රමයේ නොයෙක් නිවාස විවිධ අවස්ථාවලදී පොලිස් නිලධාරීන්ගේ පාවිච්චිය සඳහා මුදාහැර තිබේ. මෙම නිලධාරීන් ප්‍රධාන වශයෙන්ම කැලණිය පොලිස් කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට අයත් වූවෝ වූහ. කැලණිය පොලිස් කොට්ඨාසයේ වෙනත් නිලධාරීන්ටද යම් යම් නිවාස වෙන්කොට දෙන ලදී.

පොලිස් නිලධාරීන්ට නිවාස වෙන්කොට දීම සම්බන්ධයෙන් තමාට එකල ප්‍රබල පාලනයක් නොවූ බව සේනානායක මහතා සාක්ෂි දෙමින් කීය. ඔහු හුදෙක්ම තමාට රනිල් වික්‍රමසිංහ මහතා විසින් දෙන ලද උපදෙස් පිළිපැද තිබේ. වික්‍රමසිංහ මහතා එබඳු උපදෙස් නොදුන්නේ නම්, තමා බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ඒ ආකාරයෙන් වෙන්කොට නොදෙන බව සේනානායක මහතා සාක්ෂි දෙමින් පැවසීය. මෙම නිවාස ගැන සංස්ථාවේ තිබෙන සියළුම ලියවිලි පදනම් කොට සේනානායක මහතා පොලිස් නිලධාරීන්ට හා ඇතැම් වෙනත් නිලධාරීන්ට වෙන්කොට දෙන ලද නිවාස පිළිබඳ විස්තර අඩංගු ලැයිස්තුවක් ඉදිරිපත් කළේය. මෙම ලැයිස්තුව X 25 ලෙසින් සලකුණු කොට ඉදිරිපත් කෙරිණ. ලබාගැනීමට ඇති කරුණු වලින් පෙනී යන පරිදි, මෙම නිවාස ප්‍රධාන වශයෙන්ම එවකට පැලියගොඩ පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩග්ලස් පීරිස් මහතාට භාරකර ඇත්තේය. මෙම නිවාස අතුරින් පළමුවැන්න ( අංක A1/4 දරන නිවස) 1986 දෙසැම්බර් මස 16 වන දින සහකාර පොලිස් අධිකාරී ආර්. ධර්මරත්න මහතාට වෙන්කර දී ඇත්තේය. ඉන් පසුව නොයෙක් අවස්ථාවලදී නිවාස ගණනාවක් වෙන්කරදී තිබේ. ලබාගැනීමට තිබෙන කරුණු සමස්තයක් ලෙස ගෙන බලන විට, සංස්ථාවෙන් මෙම නිවාස භාරගෙන තිබෙන නිලධාරියා ඩග්ලස් පීරිස් මහතා බව පැහැදිලිය. ඔහු ඉන් පසුව මෙම නිවාස වෙනත් නොයෙක් නිලධාරීන්ට වෙන්කර දී තිබේ.

කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ ( C.S.U.) පොලිස් නිලධාරීන්ගේ පදිංචිය සඳහා බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස 10ක් පමණ අවශ්‍ය බව සඳහන් කරමින් සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතා විසින් එවන ලද ලිපියක් ,1989 අගෝස්තු මස 02 වන දින හෝ ඒ ආසන්න දිනයකදී අසෝක සේනානායක මහතාට ලැබී තිබේ. එම කාලයේදී ද කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ පොලිස් නිලධාරීන් අංක B 6, B8, B 10, B 13, B 20, B21, A 2/5 යන නිවාසවල පදිංචිව සිටින බව ඔහු පෙරකී ලිපියෙහි සඳහන් කර

තිබේ. අංක A 2/15 හා A 1/5 දරන නිවාසද වෙන්කොට මුදාලන ලෙස ඔහු ඉල්ලා තිබේ. මෙම ලිපියෙහි පිටපතක් X 65 යනුවෙන් සලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි.

රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව පොලිස් මූලස්ථානය හෝ අදාළ පොලිස් නිලධාරීන් සමග මෙම නිවාස මුදාලන ලද අවස්ථාවේ හෝ ඊට පසුව කිසිත් විධිමත් ගිවිසුමකට එළඹ නැත. ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන්ට නිවාස වෙන්කොට දුන් අවස්ථාවේ අනුගමනය කරන ලද පිළිවෙල මීට වෙනස්ය. එම අවස්ථාවේ විධිමත් පිළිවෙලක් අනුගමනය කර ඇත. බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාසූ අත්කොට ගත් වෙනත් නිලධාරීන් මෙන් නොව මෙම නිවාසවල පදිංචිව සිටි පොලිස් නිලධාරීන්ට නිවාස කුළී ගෙවීමක්වත් කිරීමට සිදුනොවිය. ඔවුන්ට ගෙවීමට නියම කරනු ලැබුයේ විදුලි හා වතුර බිල් පමණකි.

පොලිස් දෙපාර්තමේන්තුවේ තත්ත්වය ගැන කොමිෂන් සභාව එකල පොලිස්පතිවරයා වූ අර්නස්ට් පෙරේරා මහතාගෙන් ප්‍රශ්න කළේය. තමා හෝ පොලිස් දෙපාර්තමේන්තුව මෙම ගනුදෙනුවට සම්බන්ධ නැති බව ඔහු සාක්ෂි දෙමින් සහතික කළේය. අදාළ අවස්ථාවෙහි කිසිවෙකු මේ ගැන ඔහුගේ උපදෙස් නොගත් බවත්, ඔහු මෙම කාරණයට සම්බන්ධ නැති බවත් පෙරේරා මහතා ප්‍රකාශ කළේය. මෙම කාරණය ගැන දැනට ලබාගැනීමට තිබෙන කරුණු සලකා බලන විට මෙය තමාට " ඩග්ලස් පීරිස් මහතා හා සංස්ථාවේ නිලධාරීන් සහ අදාළ අමාත්‍යවරයා අතර පෞද්ගලික ගණුදෙනුවක්" සේ පෙනෙන්නේ යයි ද ඔහු ප්‍රකාශ කළේය.

පොලිස් නිලධාරීන්ට ඔවුන්ගේ නිල නිවාස ලෙස පාවිච්චි කිරීම සඳහා නිවාස අත්කර ගැනීමේදී අනුගමනය කිරීමට තිබෙන විධිමත් කාර්ය පරිපාටිය පරීක්ෂා කිරීමෙහිලා ගරු ඇටෝර්නි ජනරාල්වරයා නියෝජනය කළ නීතිඥවරයාද කොමිෂන් සභාවට ආධාර කළේය.

අදාළ කාලසීමාවේදී අනුගමනය කිරීමට තිබුණු ක්‍රම මෙසේය:

(අ) පොලිස් දෙපාර්තමේන්තුව නිවාස ඒකක තනා ඉක්බිතිව ඒවා පොලිස් නිලධාරීන්ට වෙන්කර දෙනු ලැබේ. මෙම නිවාස වලින් බොහොමයක් පිහිටා තිබෙන්නේ පොලිස් ස්ථානවල පරිශ්‍රවලමය. නිවාස බාහිර ස්ථානයන්හි පිහිටි තවත් යම් යම් ස්ථානද තිබේ. කොළඹ 2, කොම්පඤ්ඤ වීදියේ, කිවු පාරෙහි එබඳු නිවාස පංතියක් තිබේ.

(ආ) පොලිස් නිලධාරීන් සඳහා ඒ ඒ පුද්ගලයින්/ සංවිධාන/ ආයතන සතු නිවාස කුලියට ගැනීමට පොලිස් දෙපාර්තමේන්තු ව්‍යවස්ථා B 11 යටතේ පහසුකම් යෙදේ. මෙම ක්‍රමය යටතේ එක්තරා කාර්ය පරිපාටියක් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. අදාළ කාර්ය පරිපාටිය අනුව ගනුදෙනුවට සම්බන්ධ පාර්ශවයන් අතර විධිමත් ගිවිසුමක් ඇතිකර ගැනීමද අවශ්‍යය. එබඳු ස්ථාන කුලියට හෝ බද්දට ගැනීමේදී අවශ්‍ය පියවර ගැනීමට නියමිත පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝජිතයා වන්නේ අදාළ පොලිස් කොට්ඨාසයේ කාර්යභාර නිලධාරියා බව පැහැදිලිය. ( B 11 ) X62 වශයෙන් සලකුණු කර කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි.

(ඇ) මෙම කොමිෂන් සභාවට අදාල කාලසීමාවේදි විධායකය විසින් මහජනාරක්ෂක ආඥා පනතේ විධිවිධානයන් යටතේ හදිසි අවස්ථා රෙගුලාසි ප්‍රකාශයට පත්කොට තිබිණ. යම් පුද්ගලයෙකු/සංවිධානයක්/ආයතනයක් සන්තකයේ පවතින නිශ්චල දේපලවල බුක්තිය අත් කොටගෙන එම දේපල ඕනෑම පුද්ගලයෙකුට එම පුද්ගලයාගේ ප්‍රයෝජනය සඳහා තාවකාලිකව පැවරීමට, 1989 ජූනි මස 20 වන දින රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1989 අංක 1 දරන හදිසි අවස්ථා ( විවිධ විධිවිධාන හා බලතල) ව්‍යවස්ථාවල 8 (7) ව්‍යවස්ථාවෙන් රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ට බලය පැවරේ. අදාල ගැසට් පත්‍රයේ පිටපතක් X 83 වශයෙන් සලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි. එවකට සිටි පොලිස්පති අර්නස්ට් පෙරේරා මහතා හා නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර් (මෙරිල්) ගුණරත්න මහතා තර්ක කරමින්, රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ට පවරා තිබෙන මෙම බලය නිසා පොලිස් නිලධාරීන්ට කඩිනමින් නිවාස ඒකක ලබාගැනීමට පහසුව සළසන බව ප්‍රකාශ කළහ.

1989 මැද භාගයේදි කඩාකප්පල්කාරීන් පොලිස් නිලධාරීන්ට හා ඔවුන්ගේ පවුල්වලට තර්ජනය කිරීමටත්, ඔවුන් තම පහරදීම්වලට ඉලක්ක කිරීමටත් පටන් ගත් අවස්ථාවෙහි පොලිස් නිලධාරීන්ට හා ඔවුන්ගේ පවුල්වලට ආරක්ෂා සහගත ලෙස ජීවත්විය හැකි නිවාස සැපයීම අවශ්‍ය විය. ඔවුන්ට ආරක්ෂිත ස්ථානවල පදිංචිය සළසාදීමට අවශ්‍ය විය. නලින් දෙල්ගොඩ, එම්.එම්.ආර්. ගුණරත්න රනිල් වික්‍රමසිංහ යන මහතුන් ප්‍රකාශ කරන අන්දමට, කඩාකප්පල්කාරීන්ගේ තර්ජනයට ලක්ව සිටි ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්ට තාවකාලික වාසස්ථාන ලබාදීමට සුදුසුම ස්ථානය වූයේ බටලන්ද නිවාස ක්‍රමයයි.

පොලිස් දෙපාර්තමේන්තු නියෝග B 11 හි නියම කොට තිබෙන කාර්ය පරිපාටිය බෙහෙවින් අපහසු එකක් වුනෙත්, එය කඩිනමින් නිවාස ඒකක ලබාගැනීමට පාවිච්චි කළ නොහැකි විය. එහෙයින්, කලින් සඳහන් කළ හදිසි අවස්ථා රෙගුලාසි ප්‍රකාශයට පත් කරන ලදි. හදිසි අවස්ථා ව්‍යවස්ථා මගින් සපයා ඇති ක්‍රමය ඉතා ඵලදායි බවත්, කාර්යක්ෂම බවත් අදාල බලධාරීන් විසින් පිළිගන්නා ලදි. යම් පොලිස් ඒකකයකට ආරක්ෂා සහගත නිවාස අප්‍රමාදව අවශ්‍ය නම්, අදාල කාර්යය සඳහා හඳුනාගෙන තිබෙන නිවාසවල බුක්තිය අත්කොට ගන්නා ලෙස ( උචිත මාර්ගයෙන්) රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගෙන් ඉල්ලා සිටීමට නොහැකිවීමට හේතුවක් නැත. නිවාස අත්කොට ගැනීමට අනුගමනය කෙරෙන කාර්ය පරිපාටිය කුමක් වුවත්, ස්ථාන කිසිවක් පොලිස් නිලධාරීන්ගේ පදිංචිය සඳහා පාවිච්චි කරන විට (ඒවා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් වුවත් නැතත්) අදාල නිවාස අධීක්ෂණය කළයුත්තේ අදාල පොලිස් කොට්ඨාසයේ කාර්ය භාර නිලධාරී තැන විසින් බවද පොදු අදහසය. නිවාස වෙන් කොටදීමේ රාජකාරිය පැවරෙන්නේත් ඔහුටය. ඒවා දෙවර්ෂයකට වරක් බැගින් පෞද්ගලිකව පරීක්ෂා කර බැලීමත් ඔහුගෙන් අපේක්ෂා කෙරේ. පොලිස් කොට්ඨාශයේ කාර්ය භාර නිලධාරියා විසින් අදාල නිවාස වෙන්කොටදීම හා ඒවායේ පාවිච්චිය පිළිබඳ විස්තර විශේෂ ලේඛනයක වාර්තා ගත කළයුතුය.

පොලිස් නිලධාරීන් විසින් නිල නිවාස වශයෙන් පාවිච්චි කරන නිවාස වෙන්කොටදීම හා ඒවායේ අධීක්ෂණය පැහැදිලිවම අදාල පොලිස් කොට්ඨාසයේ කාර්ය භාර නිලධාරියාට භාරවන බැවින් නීතිඥ තැන විසින් නලින් දෙල්ගොඩ මහතාගෙන් පුළුල් වශයෙන් ප්‍රශ්න කරන ලදි. අදාල

කාලසීමාව තුළදී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකු වූ නලින් දෙල්ගොඩ මහතා කැළණිය පොලිස් කොට්ඨාසයේ කාර්ය භාර නිලධාරියා විය. බටලන්ද නිවාස යෝජනා ක්‍රමය, කැළණිය පොලිස් කොට්ඨාසයේ විෂය සීමාව තුළට (සපුගස්කන්ද පොලිස් ස්ථානයේ බල ප්‍රදේශය තුළ) වැටෙන අතර, මෙම නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිවී සිට ඇති සියළුම පොලිස් නිලධාරීහු කැළණිය පොලිස් කොට්ඨාසයට අනුයුක්ත කොට සිට ඇත.

දෙල්ගොඩ මහතා කියන ලෙසට, ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්ට බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස සංඛ්‍යාවක් මුදාලන ලෙසට රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ඉල්ලා සිටින ලද්දේ ඩග්ලස් පීරිස් මහතා විසිනි. දෙල්ගොඩ මහතා පීරිස් මහතාගේ ඉහළ නිලධාරියා වුවද, මෙම ඉල්ලීම කිරීමට ප්‍රථම පීරිස් මහතා ඔහුගේ අවසරය ඉල්ලා නැත. කිසිම අවස්ථාවක, ප්‍රදේශයේ පොලිස් නිලධාරීන් සඳහා ආරක්ෂා සහගත ස්ථානයකින් නිවාස ලබාගැනීමේ අවශ්‍යතාව ගැන පීරිස් මහතා සාකච්ඡා කර නැත. රනිල් වික්‍රමසිංහ මහතාගෙන් අනුමැතිය ලබා ගත්තායින් පසු පීරිස් මහතාට සංස්ථාවේ ඇවරකරුගෙන් නිවාස ලැබිණ. නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස ලබාගත්තාට පසු පීරිස් මහතා තම සගහන් වූ නිලධාරීන්ට හිතුවක්කාර ලෙස නිවාස වෙන්කොට දුන්නේය. එම අවධියේදීත් දෙල්ගොඩ මහතාගෙන් උපදෙස් ලබාගැනීමක් කර නැත.

සිය සගයන් වූ නිලධාරීන්ට නිවාස ලබාගැනීමේ කාර්යය පීරිස් මහතාට නිල වශයෙන් භාර නොකරන ලද බව දෙල්ගොඩ මහතා තවදුරටත් කීය. තත්ත්වය එසේ වුවද, පීරිස් මහතා රනිල් වික්‍රමසිංහ මහතාගෙන් මෙම ඉල්ලීම කර ඇත. ඩග්ලස් පීරිස් මහතාට නිවාස මුදාලීමට පෙර හෝ ඊට පසුව හෝ එමකාරණය ගැන වික්‍රමසිංහ මහතා හෝ සංස්ථාවේ ඇවරකරු ඔහුගේ නිරීක්ෂනයන් හෝ අදහස් විමසා නැත. තවද, සාක්ෂිවලින් පැවසුනු අන්දමට, වික්‍රමසිංහ මහතාගේ අනුමැතිය නැතිව කිසිත් පොලිස් නිලධාරියෙකුට බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස ලබාගැනීමට හැකිවූයේ නැත.

තමාගේ පොලිස් කොට්ඨාසයේ පොලිස් නිලධාරීන් (විශේෂයෙන්ම කැළණිය කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මාර්දන ඒකකයේ නිලධාරීන් ) නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිව සිටින බව දෙල්ගොඩ මහතාට දැනගන්නට ලැබිණ. මෙම මුළු මහත් ගණුදෙනුවම නිල නොවන පදනමකින් සිදුකර තිබෙන බවත්, අක්‍රමවත් බවත්, එසේම අදාල කාලසීමාවේදී ක්‍රියාත්මකව තිබුණු පොලිස් දෙපාර්තමේන්තු ව්‍යවස්ථාවලට පටහැනි බවත් දෙල්ගොඩ මහතා පිළිගත්තේය. පොලිස් කොට්ඨාසයේ කාර්ය භාර නිලධාරියාවූ ඔහුට පොලිස් නිලධාරීන් පදිංචි වන නිවාස භාරව සිටීමට හා ඒවා අධීක්ෂණය කිරීමට අදාල ව්‍යවස්ථාවෙන් නියමිත නමුත්, දෙපාර්තමේන්තු ව්‍යවස්ථාවලින් නියමිත එබඳු රාජකාරී කිසිවක් ඔහු විසින් ඉටුකරනු ලැබුවේ නැත.

පොලිස් නිලධාරීන් පදිංචි වන පරිශ්‍ර පිළිබඳ පොලිස් ව්‍යවස්ථා, අප විසින් පරීක්ෂා කර බැලූ විට, එම ව්‍යවස්ථා සැළසුම් කොට තිබෙන්නේ, එම දේපල වෙන්කොට දීම හා ඒවායේ පාවිච්චිය කාර්යක්ෂමව පාලනය කිරීමට බව අපට පැහැදිලි විය. එම ව්‍යවස්ථා තවදුරටත් සැළසුම් කොට තිබෙන්නේ, එම පරිශ්‍රයන් නීතිවිරෝධී ක්‍රියාවන්ට පාවිච්චි නොකිරීම සහතික කරනු පිණිසය. තවද, නිසි අධීක්ෂණයක් පැවතුන හොත්, එම ස්ථාන යම් නීතිවිරෝධී ක්‍රියාවක් සඳහා පාවිච්චි කොට තිබෙන බව හෙළිදරව් වූවහොත්, එම නීති විරෝධී ක්‍රියාව සිදුවීම ගැන යම් හඳුනාගත හැකි නිලධාරියෙකු ඊට වගකිවයුතු බවට තීරණය කළහැකිය.

මෙම නිවාස ලබාගෙන වෙන්කොට දී තිබෙන ආකාරය සලකා බලන ලදුව, මෙම නිවාස තුළ සිදුවුයේ කුමක්දැයි උසස් නිලධාරීන්ගේ නිසි අධීක්ෂණයත් කරණකොට ගෙන හෙළිදරව් නොවීම දෙල්ගොඩ මහතා විසින් සහතික කොට තිබෙන බව අපට පැහැදිලිව පෙනී යයි.

කෙසේ වුවද, ඩග්ලස් පීරිස් මහතා පොලිස් නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා නිවාස ලබාගැනීම සම්බන්ධයෙන් පිළිගත් පොලිස් ව්‍යවස්ථාවලට පැහැදිලිවම පටහැනිව ක්‍රියා කොට ඇතත්, දෙල්ගොඩ මහතා අදාල පොලිස් ව්‍යවස්ථා ක්‍රියාත්මක වන්නට සැලැස්වූයේ නැත යන චෝදනාවෙන් සම්පූර්ණයෙන් නිර්දෝෂ කල හැකිද? ඩග්ලස් පීරිස් මහතා අදාල රෙගුලාසිවලට පටහැනිව ක්‍රියා කොට තිබෙන බව පැහැදිලිය. දෙල්ගොඩ මහතා මෙය පිළිගත්තේය. එසේ නම් කැලණිය පොලිස් කොට්ඨාසයේ කාර්ය භාර නිලධාරියා ලෙසට ගත් පියවර කුමක්ද? ඔහු පීරිස් මහතාගෙන් නිදහසට කරුණු අසා නැත. ඔහු මෙම අක්‍රමිකතාව ගැන පොලිස් මූලස්ථානයට දන්වා නැත. මෙම අක්‍රමිකතාව පසුව විධිමත් තත්ත්වයට පත්කිරීමට ඔහු පියවර ගෙන ඇත්තේත් නැත.

මේ සම්බන්ධ වැදගත් කරුණක් නම්, දෙල්ගොඩ මහතා බටලන්ද නිවාස ගනුදෙනුවෙන් තම දුරස්තර බවක් පෙන්වීමට තැත් කලත්, එමෙන්ම මේ කාරණය සම්බන්ධයෙන් පීරිස් මහතා ගත් ක්‍රියා මාර්ගයට තමාගේ සම්බන්ධතාවක් නැතැයි පෙන්නීමට තැත් කළත් මෙම "ව්‍යාපෘතියෙන්" ඔහුටත් ප්‍රතිලාභ ලැබී තිබීමය. දෙල්ගොඩ මහතා කියන පරිදි බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ එක් නිවාසයක් " කැලණිය කොට්ඨාසයේ පොලිස් අධිකාරී" සඳහා ඔහු විසින් (සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින්) වෙන්කොට තිබෙන බව සහකාර පොලිස් අධිකාරී පීරිස් ගෙන් ඔහුට දැනගන්නට ලැබී ඇත. මෙම කාලසීමාව තුළදී කැලණිය කොට්ඨාශයේ පොලිස් අධිකාරී වී ඇත්තේ දෙල්ගොඩ මහතාය. අදාල නිවාසය සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින් තමාගේ අවසරය ඇතිව සංස්ථාවෙන් ලබා නොගත් බව දෙල්ගොඩ මහතා කිය. තමා කිසිවිටෙකත් අදාල නිවසේ පදිංචියට නොගිය බවත්, තමා එම නිවස තුළට වත් ගොස් නැති බවත් ඔහු සාක්ෂි දෙමින් කීය. අදාල කාලසීමාව තුළදී තමාටම අයත් කිරුලපන පිහිටි නිවසේ ජීවත් වූයේ යයි දෙල්ගොඩ මහතා කීය. අදාල නිවසේ යතුරු කිසිවිටෙකත් තමා සමග නුවූ බවත්, ඒවා සපුගස්කන්ද පොලිස් ස්ථානයේ තබා තිබුණු බවත් ඔහු තවදුරටත් කීය. කෙසේ වුවද දෙල්ගොඩ මහතා තමා විසින් මෙම නිවස පාවිච්චි නොකරන හෙයින් එය ආපසු සංස්ථාවට දීමට පියවර ගෙන නැත. එය තමාගෙන් පසු තම අනුප්‍රාප්තිකයා ලෙස පැමිණෙන ඕනෑම නිලධාරියෙකුගේ ප්‍රයෝජනය සඳහා යයි ඔහු කරුණු පහදාදීමක් ලෙස කිය. එසේ වුවද, එවකට පොලිස්පතිව සිටි අර්නස්ට් පෙරේරා මහතාගේ ස්ථාවරය වූයේ දෙල්ගොඩ මහතා ඇත්ත වශයෙන්ම බටලන්ද නිවාසයේ පදිංචිව නොසිටියේ නම් ඔහු එය තවත් නිලධාරියෙකුගේ අනාගත ප්‍රයෝජනය සඳහා නිවස කිසිවිටෙකත් පදිංචිය නැති හිස් නිවසක් ලෙස තිබෙන්නට නොහැරිය යුතුව තිබුනේ යයි ඔහු කීය. කුමක් නිසාද යත්, මෙම හිස් ස්ථානය කිසියම් පුද්ගලයකු විසින් නුසුදුසු ක්‍රියාවක් සඳහා පාවිච්චි කළහැකිව තිබුණු බැවිනි. තවද, කොමිෂන් සභාවට සහාය වූ නීතිඥවරයා, සපුගස්කන්දේ ග්‍රාමසේවක විසින් නිකුත් කරන ලද 1990 සැප්තැම්බර් මස 24 වන දින දරන සහතිකයක් දෙල්ගොඩ මහතාට ඉදිරිපත් කළේය. එම සහතිකයට බියගම සහකාර දිසාපතිවරයා අනු අත්සන් තබා තිබිණ. මෙම ලියවිල්ල X 91 ලෙස සළකුණු කොට ඉදිරිපත් කරන ලදී. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එන්.එස්.ඩබ්ලිව්. දෙල්ගොඩ මහතා රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවට අයත් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙහි ස්ථිරව

පදිංචි කරුවෙකු වී යයි මෙම ලියවිල්ලෙන් කියවිණ. මේ සම්බන්ධව කරුණු පහදාදීමක් හැටියට දෙල්ගොඩ මහතා කීවේ, මෙම ලියවිල්ල 1990 දී කුමන තත්ත්වයක් යටතේ නිකුත් කරන ලද්දක් දැයි තමා නොදන්නා බවය. තවද, කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරියෙකු වූ පොලිස් සැරයන් 4157 මහදුරගේ රණතුංග පුළුල් ලෙස ප්‍රශ්න කරනු ලැබූ අවස්ථාවේ, දෙල්ගොඩ මහතා ඔහුට වෙන්කොට දෙන ලද නිවසට නිතර යන එන සිරිතක් වූ බවත්, ඔහු ඉඳහිට ඇඳ සිටි ඇඳුම් මාරු කර ගත් බවත් හෙළිකරනු ලැබිණ. කෙසේ වුවද, සංස්ථාවේ ඇවරකරු වූ අසෝක සේනානායක මහතා විසින් කොමිෂන් සභාවට සපයන ලද කරුණු අනුව අංක A/1/5 දරන නිවස 1989 අගෝස්තු මස 02 වන දින සිට 1990 මැයි මස 09 වන දින දක්වා කාලයට පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ මහතාට වෙන් කොටදී තිබේ. මීට අදාල බහුවිධ වූ සාධකවලින් සමන්විත තත්ත්වයන් අනුව, දෙල්ගොඩ මහතාට පොලිස් නිලධාරීන් සඳහා මෙම නිවාස ලබා ගැනීමෙන් හා වෙන්කොට දීමෙන් දුරස්තර වීමට ඉඩදිය නොහැකි බව අපගේ අදහසයි.

1990 වර්ෂයේ මුල් හරියේදී යම් යම් පොලිස් නිලධාරීන් පිළිගත් කාර්ය පරිපාටීන්ට පටහැනිව තාවකාලික නිවාස පහසුකම් යම් යම් ප්‍රදේශවල ලබාගෙන තිබෙන බව ලබාගැනීමට තිබෙන කරුණු වලින් පැහැදිලිය. එබඳු අවිධිමත් කාර්ය පරිපාටීන් අනුව පැනනැඟිය හැකි ප්‍රශ්න ද එබඳු ස්ථාන නීතිවිරෝධී ක්‍රියා සඳහා උපයෝගී කරගැනීමට ඇතිවන ඉඩකඩකද සැළකිල්ලට ගෙන 1990 පෙබරවාරි මස 14 වන දින නියෝජ්‍ය පොලිස්පති ( සහායක සේවා) කිංස්ලි වික්‍රමසූරිය මහතා ( පොලිස්පති වෙනුවෙන්), අක්‍රමවත් ක්‍රියා ක්‍රමවත් කිරීමේ අරමුණින් නියෝග මාලාවක් නිකුත් කර ඇත. ( මෙය පොලිස් ගැසට් පත්‍රයේ පලකර ඇත.) අදාල ගැසට් පත්‍රයේ පිටපතකුත් X 64 ලෙසින් සලකුණු කොට ඉදිරිපත් කර ඇත. එසේ වුවද, එබඳු නියෝග ලැබීමෙන් පසුවද කැලණිය කොට්ඨාශයේ කාර්ය භාර නිලධාරී දෙල්ගොඩ මහතා හෝ එම නිවාස ලබාගත් නිලධාරියා වන පීරිස් මහතා හෝ බටලන්ද නිවාස අත්කොට ගැනීම ක්‍රමවත් කිරීමට කිසිත් පියවරක් ගෙන නැත. එම අවධියේ සිට හෝ ( නියෝග වලින් නියම කරන ලද පරිදි) එක් නිලධාරියෙකුමුත් සංස්ථාවට නිවාස කුලී ගෙවීම ආරම්භ කර නැත.

මීට කලින් සඳහන් කරන ලද පරිදි අදාල කාලසීමාව තුළදී කැලණිය පොලිස් කොට්ඨාසය මහ කොළඹ පොලිස් දිසාවේ විෂය සීමාව තුළට අයත් විය. අදාල පොලිස් දිසාව භාරව සිටියේ නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්. (මෙරිල්) ගුණරත්න මහතාය. පාලනය සඳහා නියෝග දීමේ අනුපිළිවෙල අනුව සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ මහතාට වගකිවයුතු විය. දෙල්ගොඩ මහතා නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්.(මෙරිල්) ගුණරත්න මහතාටත්, ගුණරත්න මහතා පොලිස්පති අර්නස්ට් පෙරේරා මහතාටත් වගකිවයුතු විය. එමනිසා බටලන්ද නිවාස ලබාගැනීම හා වෙන්කොට දීම ගැන ගුණරත්න මහතාගේ ස්ථාවරය දැනගැනීමට අවශ්‍ය විය. තමා මහ කොළඹ පොලිස් දිසාවේ නියෝජ්‍ය පොලිස්පති ලෙසට රාජකාරි භාරගත් විගසම 1989 වර්ෂයේ යම් කාලසීමාවක කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ යම් යම් නිවාසවල පදිංචිව සිටින බව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ මහතා නිල නොවන සාකච්ඡාවකදී තමාට දැන්වූ බව ඔහු කීය. මෙම කාරණය ගැන විධිමත් ලිඛිත දැනුම්දීමක් සිදුවී නැත. තමාටත් එක් නිවසක් ලැබුණු බව දෙල්ගොඩ මහතා කියා ඇත. පොලිස් නියෝග ( B 11 - X 62 ) අපහසු ස්වභාවයේ ඒවා හා කඩිනමින් ක්‍රියාත්මක කළ නොහැකි ඒවා වන නමුත් හදිසි අවස්ථා නියෝගවල (X 93) නියම කොට තිබෙන කාර්ය

පරිපාටිය ඉතාමත් ඵලදායී හා කාර්යක්ෂම වන බවට ගුණරත්න මහතා පිළිගත්තේය. බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස අත්කර ගැනීම සඳහා ඒවා පාවිච්චි කිරීමට ඇති කිසිත් බාධාවක් ඔහු දැක්කේ නැත.

බටලන්ද නිවාස අවිධිමත් ලෙසට ලබාගෙන තිබෙන බව ගුණරත්න මහතා පිළිගත්තේය. තර්ජනයකට මුහුණදී සිටි පොලිස් නිලධාරීන්ගේ තාවකාලික ප්‍රයෝජනය සඳහා බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ලබාගැනීමට වලංගු හේතු ඇති නමුත් මේ සම්බන්ධයෙන් අනුගමනය කර තිබෙන කාර්ය පරිපාටිය නිසා නීති විරෝධී ක්‍රියා සඳහා පවා මං සැලසී තිබෙන බව ඔහුගේ ස්ථාවරය විය. සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතා විසින් අනුගමනය කර තිබෙන අනියම් කාර්ය පරිපාටිය නිසා ප්‍රශ්න ඇතිවිය හැකිව තිබුණු බව ඔහු පිළිගත්තේය. පොලිස් නිලධාරීන් විසින් එලෙසින් අවිධිමත් ආකාරයට හා පිළිගත් සියළුම ව්‍යවහාරයන්ට හා කාර්ය පරිපාටීන්ට පටහැනිව නිවාස පහසුකම් ලබාගෙන ඇති මුළු මහත් රටේම වෙනත් කිසිත් ස්ථානයක් ගැන තමා නොදන්නා බව ගුණරත්න මහතා ප්‍රකාශ කළේය. එසේ නම් මෙම ``ව්‍යාපෘතිය `` ගැන තොරතුරු ලැබීමෙන් පසුව හෝ ගුණරත්න මහතා විසින් මෙම ක්‍රියාව ගැන ගෙන තිබෙන පියවර මොනවාද?. මෙම කාරණය ක්‍රමවත් කිරීමට හෝ වෙනස් කිරීමට තමා කුමන පියවරක්වත් නොගත් බව ඔහු පිළිගත්තේය.

මීට ඉහතින් සඳහන් කරන ලද පරිදි කඩාකප්පල්කාරී ක්‍රියා උච්ඡ අවස්ථාවට නැග තිබුණු අවධියෙහි ඇත්ත වශයෙන්ම පොලිස් හා සන්නද්ධ සේවා නිලධාරීන්ට තර්ජනයක් එල්ලවී තිබිණ. 1989 වර්ෂයේ මැද භාගය වනවිට කඩාකප්පල්කාරීන්ට විරුද්ධව සෘජුවම විමර්ශන සිදුකිරීමෙහි හා මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ යෙදී සිටි නිලධාරීන්ට පමණක් නොව සියළුම අනිකුත් නිලධාරීන්ටද තදබල තර්ජනයක් එල්ලවී තිබිණ. දකුණු දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වූ ධර්මදාස උඩුගම්පොල මහතාගේ මව සහ ඉතා සමීප පවුල් සාමාජිකයින් තිදෙනෙක් ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරීන් විසින් ඝාතනය කරනු ලැබූ අතර, ගාල්ලේ පිහිටි ඔහුගේ පරම්පරාවට අයත් නිවස ගිනි තබන ලදී. තවත් පොලිස් නිලධාරීන් කිහිපදෙනෙක් ද ඝාතනය කරනු ලැබූහ. පොලිස් අධිකාරී ටෙරන්ස් පෙරේරා මහතා ද මේ අතර විය. කැලණියේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ කාර්ය භාර නිලධාරියා වූ ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ මහතා ඝාතනය කිරීමට ද දෙවරක් උත්සාහ දරන ලදී. මෙම තත්ත්වය යටතේ තර්ජන එල්ලව සිටි අයගේ වාසය සඳහා ආරක්ෂා සහගත ස්ථාන ලබාගැනීම ඉතා යුක්ති සහගත වූ බව සැලකිය හැකිය. එසේ වුවද අදාල බලධාරීන් මේ ගැන ක්‍රියාරම්භ කළයුතුව තිබුණේ කෙසේද? එය කළයුතුව තිබුණේ ක්‍රියාත්මකව පැවති නීතිය හා ව්‍යවස්ථාවලට අනුකූලවය. තවද එය කළයුතුව තිබුණේ අදාල ස්ථාන වැරදි සහගත ලෙසට භාවිතා කිරීමට ඉඩ නොසැලසෙන අයුරුය. තවද, මේ සම්බන්ධයෙන් "වසන් කළ න්‍යාය පත්‍රයක්" නොතිබියයුතුය.

තවද, නිවාස ලබාගැනීම හා ඒවා වෙන්කොටදීම කරන ලද්දේ මෙහි ඉහතින් සඳහන් හේතු නිසා නම්, තාවකාලික නිවාස පහසුකම් ලබාදියයුතුව තිබුනේ ඒ සඳහා නියම අවශ්‍යතාවක් තිබුනු විටය. සියළු පොලිස් සාක්ෂිකරුවන් කී ආකාරයට කඩාකප්පල්කාරීන්ගෙන් නියම වශයෙන් හා සෘජුව තර්ජනයක් එල්ල වූයේ 1989 වර්ෂයේ මැද භාගයේ යම් අවස්ථාවක සිටය. රනිල් වික්‍රමසිංහ මහතාද ප්‍රකාශ කළේ කඩාකප්පල්කාරීන්ගෙන් නියම වශයෙන් තර්ජනය එල්ලවූයේ 1989 ජූලි - අගෝස්තු කාලසීමාවේ යම් අවස්ථාවක සිටය. ලබාගැනීමට තිබෙන

තොරතුරු වලින් ප්‍රකාශ වන පරිදි, පොලිස් නිලධාරීන්ට හා සන්නද්ධ සේවා සාමාජිකයින්ට සිය තනතුරු වලින් ඉල්ලා අස්වන ලෙසට නියම කළ "දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය" නම් සංවිධානයකින් නිකුත් කරන ලදැයි කියන පෝස්ටර රට පුරාම ප්‍රදර්ශනය කෙරිණ. එසේ නොකලහොත් ඔවුන් හා ඔවුන්ගේ පවුල් ඝාතනය කරනු ලබනවා ඇතැයි ප්‍රකාශ කොට තිබිණ. මෙම පෝස්ටර් ප්‍රදර්ශනය කොට තිබුනේද 1989 වර්ෂයේ මැද්දිය. කෙසේ වුවද රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව විසින් සපයන ලද තොරතුරු අනුව ( මෙම තොරතුරුවලට අභිකූත් සාක්ෂිකරුවන් විසින් අභියෝග කර නැත.) බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙන් පළමුවෙන්ම නිවසක් ලබාගත්තා ලද නිලධාරියා වූ කැළණිය පොලිස් කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරී ආර්. ධර්මරත්න මහතා නිවසක් ලබාගෙන තිබෙන්නේ 1986 දෙසැම්බර් මස 16 වන දිනය. ඔහු ලබාගෙන තිබෙන්නේ අංක A 1 / 4 දරන නිවසය. මෙම නිලධාරියාට 1986 වර්ෂයේදී නිවසක් ලබාදීමට තිබුණු අවශ්‍යතාවය කුමක්ද?.

තවද, පොලිස් නිලධාරීන්ට තාවකාලිකව ලබාදී තිබෙන නිවාස රටේ තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට පැමිණි වහාම ඒවා අයිතිකරුවන්ට ආපසු දියයුතුව තිබුණු බව පොලිස් මූලස්ථානයේ සැලකිල්ලට භාජන විය.

ලබාගැනීමට තිබෙන තොරතුරු අනුව රටේ තත්ත්වය, ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය ඝාතනය කර දැමීමෙන් පසු අනුක්‍රමයෙන් සාමාන්‍ය අතට හැරිණ. 1990 මැද කාලසීමාව වනවිට ආරක්ෂක තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට පැමිණ පොලිස් නිලධාරීන්ට එල්ලවූ තර්ජනය මගහැරී තිබිණ. එමනිසා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ( පාලන) පොලිස්පතිවරයා වෙනුවෙන් ක්‍රියා කරමින් අංක 839/90 ( 1990 පෙබරවාරි මස 13 වන දිනෙන් යුත්) චක්‍රලේඛයක් මගින් සියළුම පොලිස් කොට්ඨාසවල කාර්ය භාර නිලධාරීන්ට නියෝගයක් නිකුත් කළේය. එයින් නියෝග කර තිබුණේ හදිසි අවස්ථා ව්‍යවස්ථා යටතේ අත් කොට ගෙන තිබුණු සියළුම නිවාස හා වෙනත් ගොඩනැගිලි ඒවායේ අයිතිකරුවන්ට වහාම ක්‍රියාත්මක වන පරිදි ආපසු භාර දෙන ලෙසය. මෙම චක්‍රලේඛයේ පිටපතක් X 93 වශයෙන් සළකුණු කර කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. එසේ වුවද කැළණිය පොලිස් කොට්ඨාසය භාර නිලධාරියා වූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ මහතා මේ සම්බන්ධයෙන් කිසිත් පියවරක් ගෙන නැති බව අපට පෙනී යයි. පොලිස් නිලධාරීන් විසින් අත්කොට ගෙන තිබුණු බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ආපසු භාරදීමට ඔහු ක්‍රියා කර නැත. එම නිවාස සංස්ථාවට භාර නොදෙන ලද්දේ ඒවා හදිසි අවස්ථා ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ ලබාගෙන නොතිබුන නිසාය යන විත්තියේ තර්කය අපි පිළි නොගනිමු. ඉහතින් සඳහන් චක්‍රලේඛයේ හරය වූයේ තර්ජනය පැවති කාලසීමාවේ තාවකාලිකව ලබාගන්නා ලද සියළුම නිවාස එවකට තවදුරටත් තර්ජනයක් නොතිබුණු බැවින් ආපසු භාරදෙන ලෙසය. ඒ වෙනුවට අදාල පොලිස් නිලධාරීහු 1994 අවසානය වනතුරු මෙම නිවාස පාවිච්චි කිරීමෙහි යෙදී සිටියහ. ඇත්ත වශයෙන්ම, ඔවුන්ගෙන් ඇතැමෙක් මෙම කොමිෂන් සභාව පිහිටුවන තුරුම එම නිවාස පාවිච්චි කළහ. මෙම තත්ත්වය පහදා දෙන්නේ කෙසේද?

කොමිෂන් සභාවට ලබාගැනීමට තිබෙන තොරතුරු අනුව, බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ලබාගැනීම හා වෙන්කොට දීම සම්බන්ධයෙන් සඳහන් කරතොත් එම කටයුත්තට ප්‍රධාන වශයෙන්ම සහභාගීවී තිබෙන්නේ එවකට කර්මාන්ත අමාත්‍යවරයාව සිටි රනිල් වික්‍රමසිංහ මහතා හා පැලියගොඩ පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරියා වූ ( ඔහු පසුව කැළණිය

පොලිස් කොට්ඨාසයේ මෙහෙයුම් භාර සහකාර පොලිස් අධිකාරීවරයා විය.) ඩග්ලස් පීරිස් මහතාය. කලින් සඳහන් කරන ලද පරිදි මෙම කොමිෂන් සභාව ක්‍රියාත්මක වූ කාලසීමාවේදී ඔහු සැබවි සිට ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටියේය. එමනිසා අපට පීරිස් මහතාගෙන් ප්‍රශ්න කොට ඔහුගේ සාක්ෂි සටහන් කරගැනීමට නොහැකි විය. පීරිස් මහතා වෙනුවෙන් ඉදිරිපත් කර ඇති කරුණු කිසිවක් නොමැති බැවින් මෙම කාරණය ගැන ඔහු කරන විස්තරය හා නිදහසට ඉදිරිපත් කරන කරුණු අපට සලකාබැලීමට පුළුවන්කමක් නැත. එසේ වුවද තීරණවලට බැසීමේදී ඔහුගේ නීතිඥවරයා විසින් සාක්ෂිකරුවන් වෙත ඉදිරිපත් කරන ලද ස්ථාවර අප විසින් සලකා බලන ලදී. තවද, ඔහු සැබවි සිටියේ වෙනත් කරුණුවලට අමතරව බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ලබාගැනීම හා වෙන්කොට දීම සම්බන්ධ ඔහුගේ හැසිරීම පහදාදීමට ඔහුට හැකියාවක් නොතිබුණු නිසා වියහැකිය. කෙසේ වුවද රනිල් වික්‍රමසිංහ මහතා පරීක්ෂණයට ලක්කිරීමේ අවස්ථාව කොමිෂන් සභාවට තිබිණ.

මෙම කාරණය ගැන ඔහු කරන විස්තරය අපි දැන් සලකා බලමු.

රනිල් වික්‍රමසිංහ මහතාගේ සාක්ෂිය අනුව, 1989 යේදී එවකට සිටි ජාතික ආරක්ෂක අමාත්‍ය අභාවප්‍රාප්ත රන්ජන් විජේරත්න මහතා පොලිසියට හා යුද්ධ හමුදාවට බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස කිහිපයක් මුදාලන ලෙස ඔහුගෙන් ඉල්ලා ඇත. යුද්ධ හමුදාවෙන් හා පොලිසියෙන් ලද ඉල්ලීම්වලින් මෙම ඉල්ලීමට සහාය පළව තිබිණ. එබඳුම ඉල්ලීමක් ඩග්ලස් පීරිස් මහතා විසින් වික්‍රමසිංහ මහතාට කර තිබිණ. ගම්පහ පවත්වනු ලැබූ රැස්වීමකදී පොලිසිය විසින් මෙම ඉල්ලීම කළ බව වික්‍රමසිංහ මහතා සිහිපත් කළේය. පීරිස් මහතා හැරුණුවිට පොලිසිය වෙනුවෙන් එබඳු ඉල්ලීමක් කළ වෙනත් කිසිත් විශේෂ නිලධාරියෙකුගේ නමක් ඔහු සඳහන් කළේ නැත. කොට්ඨාසය භාර නිලධාරියාවූ නලින් දෙල්ගොඩ මහතා විසින් එබඳු ඉල්ලීමක් කරන ලද්දේද යන්න ගැන ප්‍රශ්න කළ විට වික්‍රමසිංහ මහතා "ඔව්" කියා හෝ " නැ" කියා හෝ පිළිතුරු දුන්නේ නැත. දෙල්ගොඩ මහතාගේ ස්ථාවරය වූයේ තමා එබඳු ඉල්ලීමක් නොකළ බවයි. කිසියම් පොලිස් නිලධාරියෙකුගෙන් හෝ පොලිස් මූලස්ථානයෙන් හෝ තමාට කිසිත් ලිඛිත ඉල්ලීමක් විතැයි වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කළේ නැත. ඇත්ත වශයෙන්ම මේ සම්බන්ධයෙන් වාචිකව ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙසට තමා අදාළ නිලධාරීන්ට කී බවට ඔහු සාක්ෂි දුන්නේය. කෙසේ වුවද, ලිඛිතව ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ට තමා උපදෙස් නුදුන්නේ කුමක් නිසාදැයි ඔහු කීවේ නැත. ඉක්බිතිව යම් අවධියකදී, ඩග්ලස් පීරිස් මහතා සංස්ථාවේ ඇවරකරුට ලිඛිතවත් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර, ඔහු එය වික්‍රමසිංහ මහතාගේ අමාත්‍යාංශයට ( කර්මාන්ත අමාත්‍යාංශය) යවා ඇත. ගම්පහ පවත්වන ලද බවට කලින් සඳහන් කරන ලද රැස්වීම පැවැත්වූ විගසම තමා, පොලිස් හා යුද්ධ හමුදා නිලධාරීන්ට දීම සඳහා නිවාස ටිකක් වෙන්කරන ලෙස ඇවරකරුවූ අසෝක සේනානායක මහතාට උපදෙස් දුන්නේ යයි වික්‍රමසිංහ මහතා පිළිගත්තේය. රජයේ තීරණයක් අනුව නිවාස දෙන බව ඔහු කියා ඇත. ඉක්බිතිව පීරිස් මහතා ඇවරකරුට ලිපියක් ඉදිරිපත් කර. ඇති ( X65) අතර, සංස්ථාව පොලිස් නිලධාරීන්ට නිවාස මුදාහැර ඇත. ඇවරකරු පොලිස් නිලධාරීන්ට නිවාස දී තිබෙන්නේ තමා එසේ කරන ලෙසට ඇවරකරුට උපදෙස් දුන් නිසා යයි වික්‍රමසිංහ මහතා පිළිගත්තේය. ත්‍රස්තවාදීන්ගෙන් පොලිස් නිලධාරීන්ට තර්ජනයක් එල්ල වන්නටත් කලින් 1986 දී, වික්‍රමසිංහ මහතා යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යවරයාව සිටියදී, සහකාර පොලිස් අධිකාරී ධර්මරත්න මහතාට නිවසක් මුදාලීමට එම ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙසට වූ තම තත්ත්වය පදනම් කොට අනුමතිය දී තිබේ.

එසේ වුවද, තමා අදාල ප්‍රදේශයේ ( බියගම) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වුවද, සංස්ථාව භාර අමාත්‍යවරයාවත් නොවී තමාට එබඳු අනුමැතියක් දීමට හැකිවූයේ කෙසේද යන්න පහදාදීමට වික්‍රමසිංහ මහතා ඉදිරිපත් වූයේ නැත.

මෙම නිවාසවල නිවාස භුක්තිය අත්කර ගැනීම සම්බන්ධව පොලිස් දෙපාර්තමේන්තු ව්‍යවස්ථාවලට හා හදිසි අවස්ථා ව්‍යවස්ථාවලට පටහැනිව ඔහුගේ උපදෙස් පිට පොලිස් නිලධාරීන්ව මුදාහැර ඇති බව වික්‍රමසිංහ මහතාට ඍජුව කියාපාන ලදුව, අදාල කාලසීමාව තුළදී නිවාසවලට බලෙන් කඩා වැදී හෝ ( පදිංචිය සඳහා) ඇතුළුවන්නට රජය විසින් බලය දී තිබ්බැයි වික්‍රමසිංහ මහතා කිය. එසේ වුවද, රජය විසින් පොලිසියට එබඳු බලතල පවරා තිබුණු බවට කිසිදු ලියවිල්ලක් ඉදිරිපත් කිරීමෙන් ඔප්පු කිරීමට වික්‍රමසිංහ මහතාට නොහැකිවිය. ඔහු කියන අන්දමට එබඳු බලතල අභාවප්‍රාප්ත රන්ජන් විජේරත්න මහතා විසින් වාචිකව දී තිබිණ. මෙම කාරණය ගැන කලින් සිටි පොලිස්පති අර්නස්ට් පෙරේරා, එවකට මහ කොළඹ ප්‍රදේශය බාරව සිටි නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර් ( මෙරිල්) ගුණරත්න, එවකට කැලණිය පොලිස් කොට්ඨාසයේ කාර්ය භාර නිලධාරියාව සිටි නලින් දෙල්ගොඩ යන මහත්වරුන්ගෙන් පෘථුල ලෙස ප්‍රශ්න කරන ලදුව පොලිස් නිලධාරීන්ට එබඳු "වාචික බලතල" පැවරීමක් ගැන සඳහන් නොකිරීම පුදුමය එළවයි. එබඳු බලතල දී තිබිණි නම්, මෙම නිලධාරීන් අතුරින් කිසිවකු විසින් ඒ බව සඳහන් නොකිරීමට හේතුවක් අපට නොපෙනේ. තවද, එබඳු වැදගත් කාරණයක් ගැන කුමණ හෝ වගකීමේ හැඟීමෙන් යුත් රජයක අමාත්‍යවරයකු වාචික උපදෙස් පමණක් දෙනු ඇතැයි අපට බලාපොරොත්තු විය නොහැකිය. අවස්ථාවේ අවශ්‍යතාව සලකා වාචික පිළිතුරු දීමට සිදුවුවත්, එම උපදෙස් පසුව ලිඛිතව අනුමත කිරීම යමෙකු විසින් බලාපොරොත්තු වියයුත්තකි. එම තත්ත්වය නිසා, රන්ජන් විජේරත්න මහතා විසින් පොලිස් නිලධාරීන්ට එබඳු ලසු හා අවිධිමත් ආකාරයට නිවාසවල බුක්තිය අත්කර ගැනීමට වාචික බලය දී තිබුනේ යයි වික්‍රමසිංහ මහතා ගෙන තිබෙන ස්ථාවරය අපි ප්‍රතික්ෂේප කරමු.

හදිසි අවස්ථා ව්‍යවස්ථා වලින් අවසර දී නොමැති අන්දමට රජයේ ආයතනයකට අයත් නිවාස යුද්ධ හමුදා හා පොලිස් නිලධාරීන්ට දී තිබෙන තවත් ස්ථානයක් පිළිබඳ උදාහරණයක් වික්‍රමසිංහ මහතා ගෙනහැර දැක්වූයේය. ඔහු කියන අන්දමට මහවැලි අධිකාරියට අයත් "දිගන" නිවාස යෝජනා ක්‍රමයේ යම් යම් නිවාස බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස පොලිස් නිලධාරීන්ට දෙන ලද අන්දමට සමාන අන්දමකින් දී තිබේ. ඒ බව ඔප්පු කරන ලියවිලි කිසිවක් ඔහු ඉදිරිපත් කලේ නැත. නමුත් දිගන නිවාස කිසිවක් එබඳු අවිධිමත් ලෙසින් යුද්ධ හමුදා හා පොලිස් නිලධාරීන්ට වෙන්කොට දී නොමැති බව පසුව ( වික්‍රමසිංහ මහතා සාක්ෂිදීමෙන් පසුව) මේ ගැන කරන ලද විමර්ශණ වලින් පෙනී යයි. තවද, එබඳු බලය නොලත් කාර්ය පරිපාටියක් දිගන අනුගමනය කර තිබුනත් , බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස කිසිවක් අක්‍රමවත් ලෙසින් පොලිස් නිලධාරීන්ට මුදාලීමට එය හේතුවක් කොට ගත නොහැකිය. තවද, ඉහත සඳහන් ආකාරයෙන් මුළු මහත් දිවයිනේම වෙනත් ස්ථානයක පොලිස් නිලධාරීන්ට නිවාස වෙන්කොටදීමක් ගැන ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් අතුරින් කිසිවෙකු දැන සිටියේ නැත. කඩාකප්පල්කාරී ක්‍රියා වැඩියෙන්ම සිදුවූ කාලයෙහි පොලිස් නිලධාරීන්ට හා ඔවුන්ගේ පවුල්වලට තාවකාලික නිවාස පහසුකම් සැපයීම සඳහා පාසල් හා ප්‍රජා මධ්‍යස්ථාන අත්කර ගත් අවස්ථා තිබිණ. එසේ වුවද ඔවුන්ගේ දැනුමේ හැටියට, පොලිස් නිලධාරීන්ට නිවාස පහසුකම් සළසාදීම සඳහා රජයේ අමාත්‍යවරයකු මැදිහත්වූ වෙනත් අවස්ථාවක් නොවීය. දීර්ඝ කාලීන පදනමකින් නිවාස ලබාගත් අතිකුත් සියළුම අවස්ථාවල, එක්කෝ හදිසි අවස්ථා ව්‍යවස්ථාවල නියම කොට

තිබෙන කාර්ය පරිපාටිය අනුගමනය කර තිබිණ. නොඑසේ නම්, කලින් සඳහන් කරන ලද පොලිස් දෙපාර්තමේන්තු ව්‍යවස්ථා වලින් නියම කරන ලද පරිදි වූ කාර්ය පරිපාටිය අනුගමනය කරමින් ස්ථාන ලබාගෙන ඇත. එහෙයින්, පොලිස් නිලධාරීන්ට බටලන්ද නිවාස වෙන්කොට දීම, අඩුම වශයෙන් කියතොත්, " අති විශේෂ" ආකාරයට හා "සම්පූර්ණයෙන්ම අක්‍රමවත්" ආකාරයට කරන ලද්දකි.

කලින් සඳහන් කරන ලද පරිදි, තමා හුදෙක්ම, අභාවප්‍රාප්ත රන්ජන් විජේරත්න මහතා හා පොලිස් නිලධාරීන් ( ගම්පහදී පවත්වන ලද ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණ රැස්වීමේදී) විසින් කරන ලද ඉල්ලීම ඉටු කලා පමණක් යයි කොමිෂන් සභාවට පිළිගැන්වීමට තැත් කලේය. රන්ජන් විජේරත්න මහතාගේ අකාල මරණය නිසා ඔහු පරීක්ෂණයට ලක් කිරීමට දැන් කොමිෂන් සභාවට අවස්ථාවක් නොමැති බැවින්, මෙම කාරණය ගැන වික්‍රමසිංහ මහතාගේ සාක්ෂියේ හරි වැරදි බව පරීක්ෂා කිරීමට අපට හැකියාවක් නැත. තවද, ඔහුගේ සාක්ෂිය තහවුරු කරන ලියවිලි කිසිවක් නැත. කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් ( ගම්පහ දිසාපති කාර්යාලයේ පවත්වන ලද ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණ රැස්වීමටත් සහභාගිවූ ) ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීහු කිසිවෙක් සාක්ෂි දෙමින් එසේ ප්‍රකාශ නොකලහ. එසේම, එම රැස්වීමේදී පොලීසිය විසින් එබඳු ඉල්ලීමක් කරන ලද නම්, එම ඉල්ලීම තහවුරු කරන ලිඛිත ඉල්ලීමක් කරනු නොඅනුමානයි. නිවාස ඉල්ලා සිටිමින් ඩග්ලස් පීරිස් මහතා විසින් සංස්ථාවට යවන ලද ලිපියේත්, ගම්පහ පවත්වන ලද ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණ රැස්වීමකදී ගන්නා ලද තීරණයක් ගැනවත්, අභාවප්‍රාප්ත රන්ජන් විජේරත්න මහතා විසින් කරන ලද ඉල්ලීමක් ගැනවත් සඳහන් නොවේ. එසේ වූ ඉල්ලීමක් වී නම්, පොලිස් මූලස්ථානය ඊට නිල වශයෙන් සම්බන්ධවනු ඇත. මෙම සම්පූර්ණ ගනුදෙනුවට ඩග්ලස් පීරිස් මහතාගේ ( පෞද්ගලික) ගනුදෙනුවක් වූයේ යයි අර්නස්ට් පෙරේරා මහතා කී බව අපට මතකය. පොලීසිය විසින් රනිල් වික්‍රමසිංහ මහතාට කරන ලද නිල ඉල්ලීමක්වී නම්, කලින් සිටි පොලිස්පතිවරයා හෝ කැලණිය පොලිස් කොට්ඨාසයේ කලින් සිටි කාර්ය භාර නිලධාරියා එය තහවුරු කරමින් සාක්ෂි දෙනු ඇත. ඉහත සඳහන් හේතු නිසා යම් යම් නිවාස පොලිස් නිලධාරීන්ට මුදාලීමට පොහොර නිෂ්පාදන සංස්ථාවට නියම කිරීමට හේතුවිනැයි කියන කාරණය ගැන රනිල් වික්‍රමසිංහ මහතා කරන විස්තරය අපි ප්‍රතික්ෂේප කරමු.

## නීති විරෝධී ක්‍රියා සඳහා බටලන්ද නිවාස පාවිච්චි කිරීමට හේතු:

කඩාකප්පල්කාරීන්ගෙන් ඉදිරිපත්වූ තර්ජනය වැඩිවෙත්ම එය රජයේ බරපතල සැලකිල්ලට ලක්විය. රජයේ සැලකිල්ල යොමුවූ ප්‍රධාන කාරණය වූයේ එන්ට එන්ටම වැඩිවූ ප්‍රචණ්ඩක්‍රියා රැල්ල මැඩපැවැත්වීමටය. පාලක පක්ෂයේ දේශපාලනඥයින්ට එල්ලවූ තර්ජනය බරපතලය. ඔවුන් බොහොමයක් දෙනාට ජීවිතයේ සාමාන්‍ය කටයුතු කරගෙන යාමත් දුෂ්කර විය. ප්‍රචණ්ඩ ක්‍රියා වැඩිවීම රජය අස්ථාවර කරන බලපෑමක් ඇති කලේය. එය රාජ්‍යපාලන ක්‍රියාවලියට ද බලපැවේය. පාලක එක්සත් ජාතික පක්ෂයට ප්‍රධාන තර්ජනය එල්ලවූනේ ජනතා විමුක්ති පෙරමුණෙනි: ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ව්‍යාපාරය නීත්‍යානුකූලව හා ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ක්‍රියා කරමින් සිටි රජයේ විරුද්ධවාදීන්ට උපකාරී වන බව එකල පැවති රජයට අවබෝධ විය. ජනතා විමුක්ති පෙරමුණ ක්‍රියා කරන පිළිවෙල එක්සත් ජාතික පක්ෂයේ අනිකුත් දේශපාලන විරුද්ධවාදීන් ක්‍රියා කරන පිළිවෙලට බෙහෙවින් වෙනස් වුවද, ජනතා විමුක්ති පෙරමුණේ පාක්ෂිකයින් හා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂවල ( එක්සත් ජාතික

පක්ෂයට විරුද්ධ පක්ෂවල) දේශපාලන ක්‍රියාකාරකම්හි යෙදුණු අය ප්‍රජාතන්ත්‍රවාදී කටයුතු වල සමාන්තරව කටයුතු කරන බවට පර්යන්ත මට්ටමින් සාක්ෂි තිබිණ. පාලක එක්සත් ජාතික පක්ෂයට විරුද්ධ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂවල සාමාජිකයින් අතරට, ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයින් රහසේ ඇතුළුවී තිබෙන බව අඟවන රහස් තොරතුරු ලැබී තිබිණ. උපාය මාර්ගික අංශයෙන් බලන විට, ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරීන්ටද මෙය උපකාරවත් වියහැකිව තිබිණ. කුමක් නිසාද යත්, එවිට ඔවුන්ගේ දේශපාලන අනන්‍යතාවය වසන් වන බැවිනි. එමනිසා කඩාකප්පල්කාරීන් සිදුකරන ප්‍රචණ්ඩ ක්‍රියා මෙල්ල කිරීමට පියවර ගැනීමට බොහෝ හේතු තිබිණ.

රජය ප්‍රධාන වශයෙන්ම කඩාකප්පල්කාරීන්ට විරුද්ධව ක්‍රියා කිරීමට පොලිසිය පාවිච්චි කලේය. කැරැල්ලේ පසු අවධිය වනවිට එය මෙල්ල කිරීමට පොලිසිය පමණක් ප්‍රමාණවත් නොවූ බවට සාක්ෂි තිබේ. එහෙයින් ඔවුන්ට විරුද්ධව පියවර ගැනීමට යුද්ධ හමුදාව සම්බන්ධ කරවීමට සිදුවිය. දේශපාලනඥයින් හා රජයේ දේපළ මුරකිරීම හැරුණු විට කඩාකප්පල්කාරී ක්‍රියා සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමට පොලිසියට නියම කරන ලදී. රහස් තොරතුරු එක්රැස් කිරීම කඩාකප්පල්කාරීන්ට විරුද්ධ මෙහෙයුමේ වැදගත් අංශයක් විය. කඩාකප්පල්කාරී ව්‍යාපාරය සම්බන්ධ රහස් තොරතුරු එක්රැස් කරන ලද්දේ තොරතුරු සපයන්නන් මාර්ගයෙන් පමණක් නොවේ. කඩාකප්පල්කාරී ක්‍රියා ගැන සැක කොට පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන රඳවා ගෙන සිටින ලද පුද්ගලයින්ගෙන් ප්‍රශ්න කිරීමෙන්ද රහස් තොරතුරු ලබාගන්නා ලදී. මෙය කඩාකප්පල්කාරී ව්‍යාපාරය හා එහි සැලසුම් සම්බන්ධ විශ්වාසදායක රහස් තොරතුරු සෘජුවම ලබාගතහැකි ක්‍රමයක් විය. එහෙයින් පොලිස් අත්අඩංගුවේ පසුවන කඩාකප්පල්කාරී සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම ජනතා විමුක්ති පෙරමුණට විරුද්ධ මෙහෙයුමේ ඉතා වැදගත් කාර්ය භාරයක් විය.

සියළුම පොලිස් කොට්ඨාසවල පිහිටුවා තිබුණු කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකක ජනතා විමුක්ති පෙරමුණට විරද්ධව මෙහෙයවන පොලිස් ක්‍රියා මාර්ගයේ ප්‍රධාන උපකරණයක් විය. මෙම ඒකක මෙහෙයවනු ලැබුයේ "සහකාර පොලිස් අධිකාරී - මෙහෙයුම්" යනුවෙන් හඳුන්වනු ලැබූ සහකාර පොලිස් අධිකාරීවරුන් විසිනි. මෙම සහකාර පොලිස් අධිකාරීවරුන් වගකිවයුතු වූයේ අදාල පොලිස් කොට්ඨාසවල කාර්ය භාර නිලධාරීන්ටය. (සාමාන්‍යයෙන් එම නිලධාරීන් වූයේ පොලිස් අධිකාරී තනතුරු හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරු දැරුවෝය.) එම නිලධාරීන් වගකිවයුතු වූයේ අදාල පොලිස් දිසාවල නියෝජ්‍ය පොලිස්පතිවරුන්ටය. එක් එක් ඒකකයක කාර්ය භාර නිලධාරියෙකු ( ඔවුහු සාමාන්‍යයෙන් පොලිස් පරීක්ෂකවරයෙකුගේ හෝ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකුගේ තනතුරු දරන්නෝ වූහ.) හා 10 සිට 15ක් පමණ වූ කණිෂ්ඨ නිලධාරී සංඛ්‍යාවක් වූහ. කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකවලට ඒවායේ වැඩ කටයුතු පළාතේ පොලිස් ස්ථානවල කාර්ය භාර නිලධාරීන්ගේ ආධාරය ඇතිව සම්බන්ධීකරණය කිරීමට නියම කරන ලදී. පොලිස් ස්ථානවල කාර්ය භාර නිලධාරීහු විමර්ෂණ නිසි මගට මෙහෙයවමින් හා කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකක වලින් ගෙන යන විමර්ෂණවලට ආධාර කරමින් එම ඒකක සමග ඉතා සමීපව කටයුතු කලෝය. කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකවලට සහායක සේවා සපයන ලෙසද ඔවුන්ට නියම කරන ලදී. ඇතැම් අවස්ථාවල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අතිරේක මිනිස් බලය සැපයීමටද ඔවුන්ට සිදුවිය. බොහෝ ප්‍රදේශවල කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය පිහිටුවා තිබුණේ අදාල පොලිස් කොට්ඨාසය තුළ පොලිස් ස්ථානයකය. කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකක විසින්

අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවෝ ප්‍රධාන වශයෙන්ම අදාල ඒකකයේ අධීක්ෂණය යටතේ අදාල පොලිස් ස්ථානයේ සිරකුඩුවල රඳවා තබනු ලැබූහ. බොහෝ ප්‍රදේශ වල කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකවලට සැකකරුවන් රඳවා තැබීමට තමන්ගේම සිරකුඩුවක් නොතිබිණ. විශේෂ අවස්ථාවලදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (C.I.D.) සහ අපරාධ පරීක්ෂණ කාර්යාංශය (C.D.B.) ආදී විශේෂිත පොලිස් ශාඛාවන්ට කඩාකප්පල්කාරීන් විසින් සිදුකරන ලදැයි කියනු ලැබූ වැරදි ගැන විමර්ශන පැවැත්වීමට නියම කරන ලදී.

කඩාකප්පල්කාරීන්ට විරුද්ධ රජයේ මෙහෙයුම වැඩි වැඩියෙන් වේගවත් වෙත්ම රජයට විරුද්ධව නැගුණු චෝදනා මතුපිටට එන්නට පටන් ගත්තේය. පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයෝ අතුරුදහන්වෙතියි කියන ලදී. අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සම්බන්ධයෙන් නීතියේ නිසි ක්‍රියාදාමය ක්‍රියාත්මක නොකරන ලදැයි කියවිණ. කඩාකප්පල්කාරී ක්‍රියාවලට සම්බන්ධ යයි චෝදනා ඉදිරිපත්ව අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයින් කෲර හා අමානුෂික වදදීම් වලට ලක් කරන ලද බවටද චෝදනා පැන නැඟිණ. (කඩාකප්පල්කාරී ක්‍රියා සම්බන්ධයෙන් සැකයට ලක්වූවෙකැයි කියන ලද පුද්ගලයෙකු වෙනුවෙන් පවරන ලද එක් විශේෂ මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩුවකදී එක් පොලිස් පරීක්ෂකවරයෙකු විසින් එම සැකකරු වධයට පාත්‍ර කරන ලදැයි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලදී. මෙහිදී අදාල පොලිස් පරීක්ෂකවරයා අත් අඩුවකින් සැකකරුගේ දත් උගුල්ලන ලදැයි කියන ලදී.) රජයේ සංවිධාන විසින් අත්අඩංගුවට ගන්නා ලද ඇතැම් අය මරණයට පත්කරන ලදැයි කියන ලදී. (මෙය සිදුකරන ලද්දේ ඔවුන් බරපතල ලෙස වධදීම්වලට ලක්කිරීමෙන් පසුව වියහැකිය.) මරා දමා ප්‍රසිද්ධ ස්ථානවලට දමන ලද ඇතැමුන්ගේ සිරුරු මත ටයර් දමා ගිනි තබන ලදැයි චෝදනා කරන ලදී. මෙම අස්වාභාවික දර්ශණය හැඳින්වූයේ පොදුවේ "ටයර් සෑයවල්" යනුවෙනි. තරුණ තරුණියන්ගේ පිළිස්සී ගිය සිරුරු ප්‍රසිද්ධ ස්ථානවලින් මතුවීම ගැන ගරු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේදී පවා ප්‍රශ්න කළ බව රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කළේය. එබඳු සිරුරු සොයා ගනු ලැබූවිට පොලිසිය , යුද්ධ හමුදාව මහජනයාගේ හා විපක්ෂයේ දේශපාලනඥයින්ගේ බරපතල විවේචනයට ලක්විය. විවේචකයින් විසින් ඉදිරිපත් කරන ලද න්‍යාය වූයේ මෙම මරණ සිදුකොට ඇත්තේ පොලිසිය හා හමුදාව වියයුතුය, නොඑසේ නම්, පොලිසියේ හා යුද්ධ හමුදාවේ අනුග්‍රහය ඇතිව වෙනත් අය විසින් වියයුතුය යන්නය. රජයේ අනුග්‍රහය ලබන්නක් මෙන් පෙනුණු මෙම අතුරු මිලිටරි කණ්ඩායම් හඳුන්වනු ලැබුයේ සෝදිසි කම්ටු ලෙසිනි. "ප්‍රා" "කොළකොටි", " කහ බලල්ලු", "කළු බලල්ලු", "දිවි මකුළුවා" යන නම් මෙම කණ්ඩායම් හැඳින්වූ ඇතැම් නම්ය. ඔවුන් පොලිසිය, යුද්ධ හමුදාව සමග ඉතා කිට්ටු ඇසුරින් ක්‍රියා කළහැයි කියන ලදී. මෙම කණ්ඩායම්වල සාමාජිකයින්ගේ අනන්‍යතාව සැක සහිත විය. රටේ යම් යම් ප්‍රදේශවල පොලිසියේ අය මෙම කණ්ඩායම්වල සාමාජිකයින් ලෙස ක්‍රියා කරමින් ඝාතන සිදුකිරීම් සවාරියක යෙදෙන්නේ යයි කියන ලදී. ඇත්ත වශයෙන්ම, "කළු බලල්ලු" නමින් හැඳින්වුණු කණ්ඩායම පොලිස් නිලධාරීන්ගෙන් යුක්තවූ බවත්, එය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (C.I.D) මෙන්ම පොලිසියේ අංශයක් විනැයි තම අදහසවූ බව හිටපු අමාත්‍යවරයෙකු වූ ජෝන් අමරතුංග මහතා කීය. වගකිවයුතු ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙකු ලෙස හා හිටපු අමාත්‍යවරයෙකු ලෙස එම හැඟීම දැරීමට වලංගු හේතු තිබෙන්නට ඇතැයි අපට විශ්වාසයි. එම හැඟීම ඇතිකර ගැනීමට අවශ්‍ය තොරතුරු ඔහු රැස්කර ගන්නට ඇත. එහෙයින් මෙම සෝදිසි කණ්ඩායම් වල වැඩට පොලිසියේන් සහභාගීත්වයක් තිබෙන්නට ඇතැයි සිතීමට වලංගු හේතු තිබුණු බව පෙනේ. ඔවුන්ගේ අනන්‍යතාව කුමක් වුවත් ඔවුන්ගේ ක්‍රියා කුමක් වූයේද යන්න පැහැදිලිය. ඔවුහු, කඩාකප්පල්කාරීන් ලෙස සැක කළ පුද්ගලයින් සොයා ඔවුන් ඝාතනය කළහ.

නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්.(මෙරිල්) ගුණරත්න කියන ලෙසට පිළිස්සූ සිරුර සොයාගත් විට ඔහු අදාල පොලිස් ප්‍රදේශයේ කාර්ය භාර නිලධාරියාට විරුද්ධව ක්‍රියා කිරීම , ඔහුගේ සිරිතව තිබී ඇත. තිට්ටඹුවේ සිදුවූ සිද්ධියක් ඔහු උදාහරණයක් ලෙස ගෙනහැර දක්වා ඇත. එම සිද්ධියේදී ඔහු එම ප්‍රදේශයේ කාර්ය භාර නිලධාරියාවූ පොලිස් පරීක්ෂක ලන්ත්‍රා ගැන ඔහුට විරුද්ධව යන අදහස් පළකර ඇත. ගුණරත්න මහතා දැරූ ස්ථාවරය නම් සදෝෂත්වය අවුම මට්ටමින් සඳහන් කරතොත් , "එබඳු ක්‍රියා යටත් පිරිසෙයින් කාර්ය භාර නිලධාරියාගේ දැනුමෙන් බාහිරව සිදු නොවිය හැකිය" යන්නය. නියම තත්ත්වය ඊට වෙනස් වූවා විය හැකිය. තත්ත්වය වඩාත් නරක අතට හැරුනෙත්, මෙම විෂය ගැන චක්‍රලේඛයක් නිකුත් කිරීමට පොලිස්පතිට සිදුවිය. සියළුම නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට හා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් අමතා යවන ලද අංක SCD / චක්‍රලේඛ/18/90 හා 1990 අගෝස්තු 31 වන දින දරන චක්‍රලේඛයෙන් අර්නස්ට් පෙරේරා මහතා මෙසේ කියයි. " ම විසින් 90.03.02 හා 90.03.08 යන දිනයන්හි දුරකථන පණිවිඩ (TMN) එවා තිබියදීත් පුළුස්සා හා වෙනත් අයුරින් විරූප කරන ලද මළ සිරුරු බොහෝ පොලිස් ස්ථාන බල ප්‍රදේශයන්හි තිබී හමුවේ. මෙම සිරුරු වලින් බොහොමයක් රාත්‍රී කාලයේ දී ගෙනවුත් ඒවා තිබී සම්භවන ස්ථානවල හැර දමා යන බවක් පෙනේ. "

මෙම ක්‍රියා ගැන චෝදනා වැඩිවත්ම පුරවැසියන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යහපත් චේතනාවෙන් යුක්ත වූ කණ්ඩායම් රටේ පිරිහෙමින් යන ආරක්ෂක තත්ත්වය ගැන උද්ඝෝෂණය කිරීමට පටන් ගත්තේය. ශ්‍රී ලංකාවේ තත්ත්වය ගැන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම පවා සිය බරපතළ සැලකිල්ල යොමු කළ බව පෙනෙන්නට තිබේ. එම කොමිෂන් සභාවේ ජිනීවා නුවර පැවති ද්විවාර්ශික සැසියේදී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ තත්ත්වය ගැන සාකච්ඡා කරන ලදී. ඇටෝර්නි ජනරාල්වරුන් දෙදෙනෙක් ( මුලින් ජනාධිපති නීතිඥ සුනිල් ද සිල්වා මහතා හා පසුව ජනාධිපති නීතිඥ තිලක් මාරපන යන මහත්වරු) ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා එම කොමිෂන් සභාවට යවනු ලැබූහ. තත්ත්වය කෙතරම් බිය උපදවන සුළුවී ද යත් 1989 දී රතුකුරුස සංවිධානයේ ජාත්‍යන්තර කමිටුව ( I C R C) ශ්‍රී ලංකාවේ තත්ත්වය සමීක්ෂණය සඳහා නිරීක්ෂකයින් කණ්ඩායමක් එවීමට තීරණය කළේය. මෙම නියෝජිත කණ්ඩායම් පොලිස් ස්ථාන හා වෙනත් නීත්‍යානුකූල රැඳවුම් ස්ථානවලට ගොස් සැකකරුවන්ගේ ශුභසාධනය ගැන විමසුවේය. ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරනු ලැබුයේ පොලිස් භාරයේ සිටින කඩාකප්පල්කාරී සැකරුවන් කෲර අමානුෂික හා ආත්ම ගෞරවය කෙලෙසන වධදීම්වලට භාජනය කරනු ලැබේ දැයි විමසීමටය. කඩාකප්පල්කාරී ක්‍රියා සම්බන්ධ සැකකරුවන් පොලිස් භාරයේ සිටියදී අතුරුදහන් වෙතැයි කරන ලද චෝදනා හා පොලිස් භාරයේ සිටියදී එම සැකකරුවන්ට සිදුවන මරණ ගැනත් ඔවුහු සැළකිලිමත් වූහ. ශ්‍රී ලංකාවේ පවත්නා තත්ත්වය ගැන විදේශීය නිරීක්ෂකයින් කෙතරම් අහිතකර අදහස් ප්‍රකාශ කොට තිබුණේද යත්, 1990 ජූනි මාසයේදී එවකට සිටි පොලිස්පති අර්නස්ට් පෙරේරා මහතාට මෙම තත්ත්වය ගැන පොලිස් නිලධාරීන්ට අවවාද කිරීමට සිදුවූ බවක් පෙනී යයි. 1990 ජූනි මස 26 වන දින දරන චක්‍රලේඛයෙන් ( අංක SCD /චක්‍ර/9/90 දරන) වෙනත් කාරණාවලට අමතරව පොලිස්පති විසින් පොලිස් දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට හා පොලිස් කොට්ඨාසයන්හි කාර්ය භාර නිලධාරීන්ට මෙසේ දන්වා ඇත. "දැනට ශ්‍රී ලංකාවට පැමිණ සිටින රතු කුරුස සංවිධානයේ ජාත්‍යන්තර කමිටුව, පොලිස් භාරයේ තබා සිටින රැඳවුම්කරුවන් අතර සිදුවන මරණ ගැන අහිතිකර අදහස් පළකර තිබේ. උපරිම වශයෙන්ම ආරක්ෂක විධිවිධාන සළස්වා

ඔබ භාරයේ සිටින රැඳවුම්කරුවන්ගේ ආරක්ෂාව සළසන ලෙසට ඔබට උපදෙස් දෙමි . . . . . ."
(මෙම චක්‍රලේඛයේ පිටපතක් වෙනත් පොලිස් දෙපාර්තමේන්තු ලියවිලි සමග X 100 වශයෙන් සලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි)

මෙම හේතු නිසා කඩාකප්පල්කාරී ක්‍රියා සම්බන්ධ සැකකරුවන් නිල වශයෙන් පොලිස් භාරයේ සිටියදී හා ඔවුන් පොලිස් ස්ථානවල රඳවා සිටියදී ඔවුන් සම්බන්ධයෙන් නීති විරෝධී ක්‍රියාවල යෙදීම වඩ වඩාත් දුෂ්කර වන්නට ඇත. එම නිසා අමානුෂික හා නීති විරෝධී ක්‍රියාවන්හි තවදුරටත් යෙදීමට අවශ්‍යවූවන්ට ඒ සඳහා වෙනත් ස්ථාන සොයා ගැනීමට සිදුවිය. ඇත්ත වශයෙන්ම එම පීඩනය පැමිණෙන්නට මත්තෙන්ම දක්ෂ අය ( පොලිස් නිලධාරීහු) සුදුසු විකල්ප ස්ථාන, කඩාකප්පල්කාරීන්ට විරුද්ධව සිදුකළ "යුද්ධය" ආරම්භයේදීම සොයා ගන්නට ඇත.

## බටලන්ද නිවාස පුද්ගලයින් නීති විරෝධීව රඳවා ගැනීමට හා ඔවුන්ට වධ දීමට පාවිච්චි කිරීම.

නීති විරෝධීව පුද්ගලයින් රඳවා ගෙන ඔවුන් කෲර අමානුශික ආත්ම ගෞරවය කෙලෙසන ක්‍රියාවලට භාජනය කිරීමට සුදුසු ස්ථානයක් වන්නට ඇත්තේ කුමන ආකාරයේ ස්ථානද? එය ආරක්ෂා සහගත ස්ථානයක් වියයුතු විය. එම ස්ථානය සාමාන්‍ය මහජනයාට පැමිණිය හැකි ස්ථානයක් නොවිය යුතු විය. එය අදාල පුද්ගලයින්ගේ පාලනය යටතේ පවත්නා ස්ථානයක් වියයුතු විය. අවට පුද්ගලයින්ට, එහි සිදුවන ක්‍රියාවල ස්වභාවය ගැන තොරතුරු එක් රැස්කර ගැනීමට ඇති අවස්ථාව දුර්ලභ විය යුතුය. එය රඳවා තබාගැනීමේ පිළිගත් හෝ ලියාපදිංචි කළ හෝ ස්ථානයක් නොවිය යුතුය. මෙම අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් පොලීසියට නිකුත් කරන ලද බටලන්ද නිවාසවල තත්ත්වය සලකා බැලීමට අපි කැමැත්තෙමු.

බටලන්ද නිවාස, පොලිස් නිලධාරීන් පදිංචි නිල නිවාස වශයෙන් නිල වශයෙන් පිළිගැණුනේ නැත. ඇත්ත වශයෙන්ම පොලිස් නිලධාරීන් එහි පදිංචිව සිටින බව හඟවන ලියවිලි කිසිවක් පොලිස් මූලස්ථානයේ නොවිය. නිවාස යෝජනා ක්‍රමය මැනවින් ආරක්ෂා සහගත විය. එය මහජනයාට විවෘතවම යාහැකි තැනක් නොවිය. එම නිවාසවල පදිංචිව සිටියේ තෝරාගත් අයවලුන් පමණකි. මුළු මහත් නිවාස යෝජනා ක්‍රමයම යුද්ධ හමුදා නිලධාරීන් හා පොලිස් නිලධාරීන් විසින් මුර කරනු ලැබිය. බලධාරීන්ගෙන් කලින් ලබා ගන්නා අනුමතියක් නොමැතිව පිටතින් පැමිණෙන පුද්ගලයින්ට නිවාස පරිශ්‍රමයට පැමිණිය නොහැකි විය. මෙම හේතු නිසා බටලන්ද නිවාස මෙම කාර්යය සඳහා අතිශයින්ම සුදුසු විය. ඇත්ත වශයෙන්ම, නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්.(මෙරිල්) ගුණරත්න මහතාගේ සාක්ෂියද වූයේ කැළණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ පොලිස් නිලධාරීන්ට සැකකරුවන් නීති විරෝධීව රඳවා තබා වධදීමට අවශ්‍ය වූයේ නම් පොලිස් නිලධාරීන්ට වෙන්කොට දෙන ලද බටලන්ද නිවාස " මෙම කාර්යය සඳහා අතිශයින්ම සුදුසු " ඒවා වූ බවයි.

කැළණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන් විසින් ඇත්ත වශයෙන්ම මේ කාර්ය සඳහා බටලන්ද නිවාස පාවිච්චි කරන ලද්දේ නම් ඒ බවට ඔවුන්ගෙන් සාක්ෂි ලබා ගැනීමට හැකිවන්නට ඉඩ තිබුනේ ද? සැකකරුවෙක් එබඳු නීති විරෝධී රැඳවුම් ස්ථානයකට ගෙන යනු

ලැබුයේ නම්, සැකකරු විසින් එම රැඳවුම් ස්ථානය හඳුනාගැනීම වැළැක්වීමට අදාල පොලිස් නිලධාරීන් විසින් පියවර ගන්නට ඇත. එසේ කරන සාමාන්‍ය පිළිවෙලක් නම් යම් සැකකරුවෙකු එතැනට ගෙන යන විට ඔහුගේ ඇස් වසා බැඳීමය. එම නිසා මෙම කථාන්තරය කීමට යම් සැකකරුවෙක් ජීවත්ව සිටිය ද ඔහු ඇතැම් විට තමා රඳවා සිටි ස්ථානය හඳුනාගැනීමට අපොහොසත් වනු ඇත. කැලණිය පොලිස් කොට්ඨාසයේ පොලිස් ස්ථානයකට ගෙන යාමට ප්‍රථම ඇස් වසා බැඳ කිසියම් " රඳවා තැබීමේ නොදන්නා ස්ථානයකට" ගෙන ගොස් රඳවා තබන ලද සාක්ෂිකරුවන් 10 දෙනෙකුගේ පමණ සාක්ෂි මෙම කොමිෂන් සභාව විසින් ලබාගන්නා ලදී. තවද, යම් සැකකරුවෙකු නීති විරෝධීව අත් අඩංගුවට ගෙන රඳවා ගනු ලැබීමෙන් පසු දරුණු වධයට පාත්‍ර කරන ලද්දේ නම්, ඔහුට වැඩි කලක් ජීවත්වන්නට ඉඩ හරිනු ලැබේද යන්න සැක සහිතය. මෙබඳු අමානුෂික ක්‍රියා සිදුකරන පුද්ගලයින් එසේ බරපතල ලෙස වධ දෙනු ලැබූ පුද්ගලයෙකුට පසුයම් අවස්ථාවක ඒ ගැන හෙළිකරමින් කථා කිරීමට හැකිවන ලෙසට ඔහුට ජීවත්වීමට ඉඩ නොදෙනු ඇත. යම් කාලසීමාවක් නීති විරෝධීව රඳවා ගනු ලැබ වධ දීමෙන් පසු නීත්‍යානුකූල රඳවා ගැනීමේ ස්ථානයකට මාරුකිරීමට අදාල පොලිස් නිලධාරීන්ට සිදුවූ පුද්ගලයින් සිටිය හැකිය. එබඳු පුද්ගලයින් සිටිය හැක්කේ ඉතා විරලවය.

මෙම හේතු නිසා සැකකරුවන් නීති විරෝධීව රඳවා ගෙන වධදීම් සඳහා බටලන්ද නිවාස පාවිච්චි කරන ලද්දේද යන්න හැඟවීමට උපකාර වන සාක්ෂි හමුවිය හැක්කේ කලාතුරකින් බව කොමිෂන් සභාව දැනුවත්ව සිටියේය. එසේ වුවද විමර්ශණ ඒකකය වෙහෙස නොබලා දරන ලද ප්‍රයත්නය නිසාත්, ඇතැම් සාක්ෂිකරුවන්ගේ ධෛර්ය නිසාත්, බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ ඇතැම් නිවාස ඇත්ත වශයෙන්ම පුද්ගලයින් නීති විරෝධීව රඳවා ගෙන වධදීම සඳහා පාවිච්චි කරන ලද බව ඉතා පැහැදිලිව හඟවන සාක්ෂි කොමිෂන් සභාවට ලැබිණ. දැන් අපි මීට අදාල සාක්ෂි සමහරක් ලුහුඩින් ලැයිස්තු කොට දැක්වීමට අදහස් කරමු.

**අර්ල් සුගී පෙරේරා.**

අර්ල් සුගී පෙරේරා 1988 සිට සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත කම්කරුවෙකි. අදාල සිද්ධිය සිදුවූ කාලසීමාවෙහි ඔහු රාගම පුනරුත්ථාපන රෝහලෙහි සේවය කර ඇත. දලුගම කැලණිය පදිංචිකරුවෙකු වූ සුගී පෙරේරා රාගම රෝහලේ වැඩ කිරීමට අමතරව " අර්ධකාලීන ව්‍යාපාරයක්" කළේය. ඔහු කිරිබත්ගොඩ මංසන්ධියේ (තරුණ බෞද්ධ සංගම් ගොඩනැගිල්ල ඉදිරිපිට) සංවර්ධන ලොතරැයි පත් විකිණීම සඳහා " මුර කුඩුවක " පිළිවෙලේ කවුළුවක් පැවැත්වූයේය. අර්ල් සුගී පෙරේරා රෝහලේ රාජකාරිය හැර ආපසු පැමිණීමෙන් පසු ටිකට් පත් විකිණීමේ කවුළුවේ වැඩ කිරීම පුරුද්දක් කරගෙන සිටියේය.

1990 මාර්තු මස 23 වන දින පස්වරු 7.30ට පමණ අර්ල් සුගී ටිකට් කවුළුවෙහි සිටින විට සුදු වෑන් රථයක් හදිසියේම කවුළුව ලඟට පැමිණියේය. වෙස් මුහුණු පැළඳ ගිනි අවි අතැතිව සිටි දෙදෙනෙක් වෑන් රථයෙන් බැස ඔහු ලඟට අවුත් ඔහු " සිඩ්නි" නමැති අය දැයි ඇසූහ. සුගීගේ ගෙය අසල ජීවත් වූ අය ඔහුට " සිඩ්නි " යනුවෙන් ඇමතීම පුරුද්දක් විය. එසේ වුවද, ඔහු බියට පත්වූයෙන් තමා "සිඩ්නි" නොවේ යයි සන්නද්ධ පුද්ගලයින්ට කීවේය. සන්නද්ධ පුද්ගලයින් මෙම පිළිතුරෙන් සතුටට පත් නුවූයෙන් ඔහු ටිකට් කවුළුවෙන් එළියට ඇද වෑන් රථය ඇතුලට තල්ලු කළහ. වෑන් රථය එයින් පසු ධාවනය කරන්නට විය. තවත් සන්නද්ධ පුද්ගලයින් කිහිපදෙනෙක්

වැන් රථය තුළ වූහ. වැන් රථය තුළදී මේ මිනිසුන් දෙදෙනා සිය වෙස් මුහුණු ගැලවූහ. එම අවස්ථාවේ අර්ල් සුගී තමා පැහැරගෙන යන එක් පුද්ගලයෙක් කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ සාර්ජන්ට් මේජර් රත්නායක බව හඳුනා ගත්තේය. පැහැරගෙන යැමට සහභාගීවූ අනිකුත් අය ඔහුට හඳුනා ගැනීමට හැකිවී නැත. වැන් රථය මහනුවර පාරේ කඩවත දෙසට විනාඩි කිහිපයක් ධාවනය කලේය. වේවැල්දූවේදී වැන් රථය නවත්වන ලදුව, යම් පුද්ගලයෙක් වැන් රථයට ගොඩවිත. මොහු කප්පාගොඩ නම් පොලිස් නිලධාරියා ලෙස සුගී විසින් හඳුනා ගෙන .ඇත. ( ඔහු කිරිබත්ගොඩ ප්‍රදේශයේ වැඩ කරන නිසා සුගී ඔහු දැනගෙන සිටි පුද්ගලයෙක් විය.) කප්පාගොඩ වැන් රථයේ සිටි අනික් අය අමතා "අරූ ඉන්නවා" යි කියා ඇත. ඊට පසු වැන් රථය නැවතත් ටිකදුරක් ගොස් එක්තරා ස්ථානයකදී වැන් රථය නවතා ඇත. සුගී වැන් රථයේ නවතා ඔහු මුර කිරීමට තවත් පුද්ගලයකු යොදවා අනිකුත් අය පිටව ගොස් ඇත. ටික වේලාවකට පසු ඔවුන් " කපිල" ලෙසින් සුගී දැන හැඳින සිටි තවත් තරුණයෙකු සමග ආපසු පැමිණියහ. කපිලත් පැහැර ගෙන එන බව සුගීට පැහැදිලිවී ඇත. ඉන්පසු සුගී හා කපිල ඇස්වසා බැඳ වැන් රථය විනාඩි පහලොවක් පමණ ධාවනය කර ඇත.

එක් ස්ථානයකදී වැන් රථය නවතා ඔවුන් දෙදෙනාම වැන් රථයෙන් එලියට ගනු ලැබූහ. ඉන්පසුව ඔවුහු ගොඩනැගිල්ල තුළට ගෙනයනු ලැබූහ. එය නිවාසයක්ය යන හැඟීම සුගීට ඇතිවිය. ඔහුට ටෙලිවිෂන් යන්ත්‍රයක හඬ ඇසින. ඔවුහු ඉන්පසුව කාමරයක් ඇතුලට ගෙන යනු ලැබූහ. ඔවුන් දෙදෙනා ගෙන යන විට තමන් නොයෙක් ස්ථානවලදී රවුමට හරවනු ලැබූ බව සුගී සාක්ෂි දෙමින් කිය. මෙම පුද්ගලයින් පැහැර ගෙන ගිය අය එසේ කලේ පැහැර ගැනීමට ගොදුරුවූවන් වැන් රථයෙන් බස්සවා ගනු ලැබූවාට පසු තමන් ගෙන යනු ලබන්නේ කවර දිසාවකටද යන්න තේරුම් ගැනීම වැලැක්වීමට යයි අපි අනුමාන කරමු.

කාමරයට යැමෙන් පසු තම මිතුරා වන කපිලට වූයේ කුමක් ද යන්න ගැන දැනුමක් නැති විය. සුගීගේ අත්වලට මාංචු දමා දෙපා දම්වැලකින් බඳිනු ලැබිණ. එදින රාත්‍රී ඔහුගෙන් ප්‍රශ්න කරන අතර තුර ඔහුට පුද්ගලයන් කිහිපදෙනෙකු විසින්ම පයින් පහර දෙන ලදී. සුගීගේ මිතුරන් වාසය කරන්නේ කොහේදැයි සුගීගෙන් ප්‍රශ්න කෙරිණ. සුගී මෙම ප්‍රශ්නවලට විස්තරාත්මක පිලිතුරුදී නැත. එදින රාත්‍රී තවත් පුද්ගලයින් කෑ ගසනු හා හඬනු සුගීට ඇසිණ. ඔහුට එක් පුද්ගලයකු " අනේ සර් මට තවත් ගහන්නේ නැතිව මා මරන්න" යයි ඉල්ලා සිටිනු ඔහුට ඇසිණ. එදින රාත්‍රී අර්ල් සුගීට නිදාගැනීමට අමාරු විය.

පසුදින, සුගී තමාට ශරීර කෘත්‍යය සඳහා යැමට අවසර දෙන ලෙස තමන් පැහැරගෙන ආ පුද්ගලයින්ගෙන් අවසර ඉල්ලා ඇත. එම අවස්ථාවෙහි ඔහුගේ ඇස් වසා බැඳි රෙදි පටිය හා ඔහුගේ අත් හා පා බැඳි දම්වැල ඉවත් කොට ඔහු එම ගොඩනැගිල්ල තුළම පිහිටි වැසිකිලියකට ගෙන යන ලදී. ඔහු වැසිකිලිය ඇතුලට ගිය පසු ඔහු කුඩා කවුළුවකින් පිටතට එබී බැලීය. මෙම ගොඩනැගිල්ල එක් විශේෂ ඉඩම් කැබෙල්ලක පසු කොටසෙහි පිහිටා තිබෙන බව ඔහුට පෙනිණ. ඉඩම් කොටසේ පසු පස මායිම දිගේ කටු කම්බි ගසා තිබිණ. කම්බි වැටට එපිටින් කුඩා ගෙවල් කිහිපයක් දුරින් පිහිටා තිබිණ. කවුළුව තුලින් ප්‍රදේශය දුටු අර්ල් සුගී තමා දුටුවේ බටලන්ද ගමේ නිවාසයයි නිගමනය කලේය. තමන්ගේ මිතුරන් මෙම ගමෙහි වාසය කල නිසා ඔහු මෙම ගමට බොහෝ වාරයක් පැමිණ තිබිණ. බටලන්ද ගමට යාව රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවට අයත් නිවාස යෝජනා ක්‍රමය පිහිටි බවත්, එහි සමහර නිවාසවල

පුද්ගලයින් රඳවා වධ දෙන බවත් අර්ල් සුගී ටික කලක සිට දැනගෙන සිට ඇත. මෙම හේතු නිසා තමා කලින් රාත්‍රී බටලන්ද නිවාස යෝජනා ක්‍රමයට ගෙනවුත් රඳවා තිබෙන බව නිගමනය කලේය.

ඊළඟට වූ දිනවල තමාට වූ දේ අර්ල් සුගී විස්තරාත්මකව ප්‍රකාශ කලේය. යම් යම් පුද්ගලයින් විසින් ඔහුට බරපතල ලෙස පහරදී ඇත. ඔහුට පහර දෙන ගමන්ම ඔහු ඇසුරු කරන්නන් ගැන පුළුල් ලෙස ප්‍රශ්න කරන ලදී. එම ප්‍රශ්න කිරීමේ ස්වභාවයේ හැටියට අර්ල් සුගීගෙන් ප්‍රශ්න කර තිබෙන්නේ සැක කෙරෙන කඩා කප්පල්කාරී ක්‍රියා සම්බන්ධයෙන් යයි පෙනේ. අර්ල් සුගීගෙන් විධිමත් ප්‍රකාශයක් වාර්තාගත කොට ගෙන නැත. මෙම ගොඩනැගිල්ල තුළම රඳවා ගෙන සිටි තවත් පුද්ගලයින්ට පහර දෙනු ඔහු දැක ඇත. විශේෂයෙන්ම රාත්‍රී කාලයේදී පුද්ගලයින් වේදනාවෙන් කෑගසනු ඔහුට ඇසී තිබේ. එක්තරා දිනයක පුද්ගලයින් දෙදෙනෙකු හිස පහළට සිටින සේ එල්ලා සිටිනු ඔහු දැක ඇත. එම පුද්ගලයින්ගේ සිරුරුවලින් ලේ වැගිරෙනවාත් සුගී දැක තිබේ.

රඳවා සිටීමෙන් දින කිහිපයකට පසු සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් තමා රඳවා සිටින ගොඩනැගිල්ල තුළට පැමිණියේය. මෙම සිද්ධියට ප්‍රථම සුගී, සහකාර පොලිස් අධිකාරී පීරිස් දැන සිටියේය. ඔහු එම මහතා කිරිබත්ගොඩ ප්‍රදේශයෙහි ගමන් කරනු දැක ඇත. ඔහු ( සුගී) සිඩ්නි යයි කියන පුද්ගලයා දැයි සහකාර පොලිස් අධිකාරී පීරිස් මුරකාරයින්ගෙන් විමසීය. ඉන් පසු සහකාර පොලිස් අධිකාරී පීරිස් සුගීට පහර දී පිටවී ගියේය. සහකාර පොලිස් අධිකාරී පීරිස් අවුත් පරීක්ෂා කලාට පසුවත් මෙම ගොඩනැගිල්ලෙහි පුද්ගලයෝ ගෙනවුත් රඳවනු ලැබූහ.

රඳවා සිටි කාලසීමාවේදී කිහිපවතාවකම සුගීට ගැහැණු ඇඳුම් අන්දවා ඔහුට බොරු ගැහැණු කොණ්ඩයක් පලඳවන ලදී. සැරයන් රත්නායක ඇතුළු කණ්ඩායම විසින් ඔහු කිරිබත්ගොඩ ටවුමට ගෙන යන ලදී. කිරිබත්ගොඩදී ඔහුට තම මිතුරන් පෙන්වන ලෙස කීය. සුගී තම මිතුරන් කිහිපදෙනෙකුම එහා මෙහා යනු දුටුවද, සුගී ඔවුන් කිසිවකු රත්නායකට පෙන්නා නැත. කුමක් නිසාද යත්, ඔවුනුත් පැහැර ගෙන බටලන්දට ගෙන යනු ඇතැයි ඔහු බියවූ බැවිනි. නිවාස යෝජනා ක්‍රමයෙන් ඉවතට ගෙන යන විට හා නැවත ආපසු ගෙනෙන විට බටලන්ද නිවාස යෝජනා ක්‍රමය පැහැදිලිව හඳුනා ගැනීමට සුගීට හැකිවී ඇත. මෙම ආකාරයෙන් ඇඳුම් අන්දවා ඔහු ඉවතට ගෙන යෑම හැරුනු විට, ඔහු නිවාස යෝජනා ක්‍රමයේ තවත් නිවාස දෙක තුනකට ගෙන ගොස් තිබේ. මෙම නිවාස තුළදී සුගීට නොයෙක් වෙනත් පුද්ගලයින් පෙන්වා ඔහු එයින් කිසිවකු දැන සිටියේ දැයි අසා ඇත. මෙම නිවාසවල රඳවා සිටි පුද්ගලයින් යටත් පිරිසෙයින් හැට දෙනෙකු පමණ සුගීට පෙන්නා තිබේ. ඔවුන් බොහොමයක් දෙනාට දරුණු ලෙස පහර දී තිබිණ. ඔවුන්ගේ සිරුරුවල වූ සමහර තුවාල හොඳ හැටි පෙනෙන්නටම තිබිණ.

සුගී බටලන්ද නිවාසයේ දින 22ක් රඳවා තබා තිබිණ. තමා නිදහස් කරන්න යන්නේ නැද්දැයි මෙම කාලසීමාවේදී සුගී සහකාර පොලිස් අධිකාරී පීරිස්ගෙන් අසා තිබේ. මෙම කාරණය ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කොට තිබෙන බවත්, අමාත්‍යාංශය එසේ කරන ලෙසට උපදෙස් දුනහොත් ඔහු නිදහස් කරන බවත් සහකාර පොලිස් අධිකාරී පීරිස් පිළිතුරු දී තිබේ.

රඳවා සිටි 22 වන දිනයෙහි අර්ල් සුගී ජීප්රථයකට නංවන ලදී. රත්නායක හා තවත් පුද්ගලයෝ දෙදෙනෙකු ද ජීප් රථයට ගොඩවූහ. සහකාර පොලිස් අධිකාරී පීරිස් රියැදුරු අසුනට

තැග ඔහු බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙන් පිටතට ගෙන ගියේය. අතරමගදී සහකාර පොලිස් අධිකාරී පීරිස් සූගී අමතා මෙසේ කීය. " ඔහේ ගෙදර ගියාම එක මහත්තයෙකුට යුතුකමක් ඉටුකරන්න ඕන. තමුසේ එය ඉටුකරනවා. උඹ එය ඉටුකරන්නේ නැත්නම් උඹ මරා දමනවා". එම යුතුකම මොකක්දැයි සූගී ඇසීය. ඒ යුතුකම මොකක්දැයි පවුලේ සාමාජිකයින් දන්නවා ඇතැයි පීරිස් පිළිතුරු දුන්නේය. ඔහු එය ඔවුන්ගෙන් අසා දැනගත යුතුයි පීරිස් කීය. ඉන්පසු ගෙදරට සැතපුම් බාගයක් පමණ ඈතින් වූ ස්ථානයක සූගී බස්සවා ගොස් ඇත. සූගී වහාම ගෙදර දුව ගියේය.

1996 මැයි මස 24 වන දින මෙම කොමිෂන් සභාව කොමිෂන් සභාවට අනුයුක්ත නිලධාරීන් ද කැටුව, නීතිඥයින්, ජනමාධ්‍යවේදීන් හා පොලිස් නිලධාරීන්ද විශාල සංඛ්‍යාවකගේ මධ්‍යයේ බටලන්ද නිවාස යෝජනා ක්‍රමය බැලීමට ගියේය. නීතිඥ නෙවිල් අබේරත්න මහතා හා ඔහුගේ කණිෂ්ඨ නීතිඥ තැනද නිවාස යෝජනා ක්‍රමයේ සංචාරයට එක්වී සිටියහ. තමන් පැහැරගෙන ගොස් මෙම නිවාසවල නීති විරෝධීව රඳවා තබා වධ දෙන ලදැයි එවකට කියා සිටි සාක්ෂිකරුවන්ගෙන් ටික දෙනෙක්ද නිවාස යෝජනා ක්‍රමයට ගෙන යනු ලැබූහ. බටලන්ද නිවාස යෝජනා ක්‍රමයට පැමිණි පසු, මින් එක් එක් සාක්ෂිකරුට තමන් රඳවා සිටි නිවාස ස්වාධීනවම කොමිෂන් සභාවට පෙන්වන ලෙස කීය.

මේ අනුව අර්ල් සූගී පෙරේරා කොමිෂන් සභාව හා එහි නිලධාරීන් අංක B8 දරන නිවසට ගෙන ගියේය. මෙම නිවස අංක A 2/5 දරන නිවස ඉදිරිපිටම පිහිටා ඇති තනි මහලේ නිවාසයකි. අංක A 2/5 වූකලී සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් හා ඔහුගේ පවුල 1989 අගෝස්තු මස 02 වන දින සිට 1995 මැද දක්වා වාසය කළ නිවසයි. මෙම නිවසේ ලොක වීදුරු ජනේල පියනක " Black Cats " යන වචන පින්තාරු කර තිබේ. මෙම නිවස 1988 සිට 1991 දක්වා සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ට පවරා සිටි ආරක්ෂක නිලධාරීන්ට වෙන් කොට තිබිණ. මෙම නිවසට කාමර කිහිපයක් තිබිණ. අර්ල් සූගී තමන් පිටත දුටු වැසිකිළිය කොමිෂන් සභාවට පෙන්නා දුන්නේය. මෙම වැසිකිළියේ කුඩා කවුළුවෙන් පිටත බැලීමේදී කොමිෂන් සභාවේ සාමාජිකයින්ට නිවසට පිටුපසින් ආසන්නතමව තිබෙන කටු කම්බි වැටත්, ඈතින් තිබෙන බටලන්ද ගමේ නිවාසත් පෙනිණ. මෙම නිවසේ හා බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ පිහිටීම ගැන සාක්ෂිකරු විසින් දෙන ලද සාක්ෂිත්, බටලන්ද නිවාස යෝජනා ක්‍රමයට කොමිෂන් සභාව ගිය ගමනේදී නිරීක්ෂණය කළදේත්, සමාන වන බව අපගේ නිරීක්ෂණයට ලක්විය.

සූගී පෙරේරාගේ පියා වන තියෝබෝල්ඩ් පැට්‍රික් පෙරේරා ( වයස අවුරුදු 65කි) පවසන ලෙසට, සූගී පෙරේරා පැහැර ගෙන ගිය දින පස්වරු 10 ට පමණ අර්ල් සූගී නාඳුනන පුද්ගලයින් විසින් ගෙන ගොස් තිබෙන බව තමාට තමාගේ තවත් පුතෙකු ගෙන් දැනගන්නට ලැබී ඇත. එම නිසා එදින රාත්‍රියේම ඔහු පැලියගොඩ පොලිස් ස්ථානයට ගොස් තම පුතා පැහැර ගෙන යාම ගැන පැමිණිල්ලක් කර ඇත. ඔහුගේ පැමිණිල්ල වාර්තාගත කර ගෙන තිබෙන්නේ පස්වරු 11.50 ටය. එම පැමිණිල්ලේ පිටපතක් X 29 ලෙසින් සලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. ඔහුගේ මෙම පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබුවද, එහි සඳහන් කාරණය ගැන විමර්ශණය කර අර්ල් සූගී සිටින තැන සොයාගැනීමට පොලිසිය ප්‍රයත්නයක් දරා නැත.

දින කිහිපයකට පසු ඔහු පොලිස් මූලස්ථානයට ගොස් එවකට සිටි පොලිස්පති අර්නස්ට් පෙරේරා මහතා ඔහුගේ කාර්යාලයේදී හමුවී ඇත. ඔහුට අර්නස්ට් පෙරේරා මහතාට දුර නැකමක් තිබී ඇත. පැට්‍රික් පෙරේරා තමාගේ පුතාට සිදුවී තිබෙන දේ ගැන පොලිස්පතිවරයාට පැමිණිලි කොට අර්ල් සුගී සොයා ගැනීමට තමාට ආධාර කරන ලෙස ඔහුගෙන් බැගැපත්ව ඉල්ලා ඇත. අර්නස්ට් පෙරේරා ඔහු නියෝජ්‍ය පොලිස්පති ෆ්‍රැන්ක් සිල්වා වෙත යොමු කළේය. ෆ්‍රැන්ක් සිල්වා ඔහුට සවන් දීමෙන් පසු ඔහු තවත් නිලධාරියෙකුට යොමු කළේය. එම නිලධාරියාගේ අනන්‍යතාව ඔහු නොදනී. මෙම නිලධාරියා පැමිණිල්ල ගැන ඇසීමෙන් පසු පෑලියගොඩ පොලිස් ස්ථානයට දුරකථන ඇමතුමක් ගෙන සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතාට කථා කළේය. එම නිලධාරියා එම අවස්ථාවේ මෙම සිද්ධිය ගැන දුරකථනයෙන්ම සහකාර පොලිස් අධිකාරී පීරිස්ට විස්තර කර දෙන ලෙස පැට්‍රික් පෙරේරාට උපදෙස් දුන්නේය. ඒ අනුව පැට්‍රික් සහකාර පොලිස් අධිකාරීවරයාට සිදුවූ කරුණු ගැන විස්තර කර දුන් අතර, තම පුතා සිටින තැන සොයා දෙන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේය. අර්ල් සුගීගේ ජායා රූපයක් තමාට ලබාදෙන ලෙස සහකාර පොලිස් අධිකාරී පීරිස් කීය. ඒ අනුව පැට්‍රික් පෙරේරා වහාම ගෙදර ගොස් තම පුතාගේ ජායාරූපයක පිටපතක් ගෙන පෑලියගොඩ පොලිස් අධිකාරී පීරිස් හමුව ඔහුට එම ජායාරූපය දුන්නේය.

ටික දිනකට පසු, පැට්‍රික් පෙරේරා සහකාර පොලිස් අධිකාරී පීරිස් මහතා හමුව, කටයුත්ත ගැන ප්‍රගතියක් තිබේදැයි ඔහුගෙන් විමසීය. එබඳු පුද්ගලයකු එතැන නොවන බව පීරිස් කියා ඇත. සහකාර පොලිස් අධිකාරී පීරිස් මේ ගැන විස්තර කියා නැත. කෙසේ වූවද නගරයේ පැතිර යන ආරංචිය නම් සැරයන් රත්නායක පැමිණ ඔහුගේ පුතා පැහැරගෙන ගිය බව යයි පැට්‍රික් පෙරේරා කීය. මේ අවස්ථාවේ සහකාර පොලිස් අධිකාරී පීරිස් කෝපයට පත්ව, ඔහු ඒ බව කලින් නොකීවේ මන්දැයි ඔහුට සැර කළේය. සහකාර පොලිස් අධිකාරී පීරිස් වහාම ජායාරූපය ආපසුදී පැට්‍රික් පෙරේරාට පිටව යන ලෙස නියම කළේය.

දින කිහිපයකට පසු පැට්‍රික් පෙරේරා කිරිබත්ගොඩ මංසන්ධියේ ලොතරැයි ටිකට් කවුන්ටරයෙහි සිටින විට යම් නොහඳුනන පුද්ගලයකු පැමිණ ඔහුට කඩදාසි තුණ්ඩුවක් දී මෙසේ කීය. " ඔබට ඔබේ පුතා සොයාගැනීමට හැකිවේවි. ගොසින් මෙම මහත්මයා හමුවෙන්න". ඉක්බිතිව මෙම නොහඳුනන පුද්ගලයා යන්ට ගියේය. පැට්‍රික් පෙරේරා තුංඩුව පරීක්ෂා කර බැලීයෑ ඔහු " නීතිඥ ලක්ෂ්මන් රණසිංහ" යන අය වූ අතර, එහි දුරකථන අංක දෙකක් ( එනම් 502850 හා 24853 ) විය. මෙම කඩදාසි කැබැල්ල X 27 ලෙසින් සලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. පැට්‍රික් පෙරේරා වහාම දුරකථනයකට ගොස් මෙයින් එක් අංකයකට ඇමතුමක් ගත්තේය. නීතිඥ ලක්ෂ්මන් පෙරේරා මහතා එම අවස්ථාවේ ස්ථානයේ නැති බවත්, ඔහු වැඩට ගොස් ඇති බවත් දුරකථන ඇමතුමට පිළිතුරු දුන් කාන්තාවක් කීවාය. ලක්ෂ්මන් රණසිංහ මහතා ගොස් සිටින්නේ කොතැනද යන්න ගැන විමසූ විට එම කාන්තාව, කියා තිබෙන්නේ ඔහු කොළඹ කොටුව ගෆූර් ගොඩනැගිල්ලේ පිහිටි රාජ්‍ය ඖෂධ සංස්ථාවට ගොස් තිබෙන බවය. එමනිසා පැට්‍රික් පෙරේරා එම සංස්ථාවට ගොස් විමැසීය. එසේ විමැසීමේදී හෙළිවූයේ නීතිඥ රණසිංහ එම සංස්ථාවේ සභාපති බවයි. ඔහු එවිට සභාපතිවරයාගේ කාර්යාලයට ගොස් ලක්ෂ්මන් රණසිංහ හමුවිය. ඔහු එවිට තුණ්ඩුව රණසිංහට පෙන්වා අර්ල් සුගීට කුමක්වූයේද යන්න ඔහුට විස්තර කළේය. තම පුතා මුදාලීමට කටයුතු කරන ලෙස පැට්‍රික් පෙරේරා රණසිංහගෙන් බැගැපත්ව ඉල්ලා සිටියේය. මෙම කාරණය ඉතාම සංකීර්ණ දුෂ්කර එකකැයි රණසිංහ කීය. එම කාරණයට හුඟක් මුදල් වියදම් වනු ඇ‍ායි ඔහු කීය. රුපියල් පනස් දහසක් (50,000/-ක්) දිය හැකිදැයි රණසිංහ විමසීය. මුදලේ ප්‍රමාණය අඩු කිරීමට තමන්ට

හැකියාවක් නැතැයි රණසිංහ පිළිතුරු දී ඇත. අන්තිමේදී රණසිංහට අවශ්‍ය මුදල් ප්‍රමාණය ඉඩමක් විකුණා හෝ දීමට පැට්‍රික් පෙරේරා එකඟවිය. එවිට රණසිංහ පෙරේරාට කාමරයෙන් පිටතට යන ලෙස කී අතර තමා දුරකථන ඇමතුමක් ගෙන ඒ ගැන විමසා බලන බව කීය. ටික වේලාවකට පසු පෙරේරා ආපසු කැඳවා තමාට රු:10,000/- ක් ගෙනවුත් දෙන ලෙස කීය. මෙම මුදල් භාරදීමට තමා කොතැනට පැමිණිය යුතුදැයි පැට්‍රික් පෙරේරා රණසිංහගෙන් විමැසීය. එවිට රණසිංහ ඔහුට තව තුණ්ඩුවක් දුන්නේය. එහි " B /3, 8 වන පටුමග, කොල්ලුපිටිය, කොළඹ 03, ටෙලිෆෝන් 502750" යන ලිපිනය සඳහන් විය. X 28 යනුවෙන් සඳහන් කර මෙම කඩදාසි කැබෙල්ලේ පිටපතක් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

පැට්‍රික් පෙරේරා පෙරළා ගෙදර පැමිණ නීතිඥ ලක්ෂ්මන් රණසිංහ පිළිබඳ සිද්ධිය පවුලේ අනිකුත් සාමාජිකයින්ට දැන්විය. මෙය පැට්‍රික් පෙරේරා රැවටීමට කෙරෙන මහන්සියක් යයි හැඟී යන බැවින් රණසිංහට මුදල් නොදෙන ලෙස පවුලේ සාමාජිකයෝ පැට්‍රික් කැමතිකරවා ගත්හ. පොලිස්පතිවරයා තමන්ගේ නෑයකු වන බැවින් අර්ල් සුගී නිදහස් කරවා ගැනීමට මුදල් අවශ්‍ය නොවන්නේ යයි ද ඔවුන් කියා තිබේ.

දින කිහිපයකින්, එනම්, අප්‍රේල් 13 වැනි දා අර්ල් සුගී ගෙදර ආපසු පැමිණියේය. යම් මහත්තයෙකුට යුතුකමක් ඉටුකිරීම සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරී පිරිස් තමාට කී දේ ගැන සුගී පැට්‍රික් පෙරේරාට කීය. ඒ නීතිඥ රණසිංහ යයි පෙරේරා අනුමාන කළේය. එහෙයින් පසු දිනම ඔහු අර්ල් සුගී කැටුව X 28 හි සඳහන් ලිපිනයට ගියේය. එම නිවසේදී ඔවුහු නීතිඥ ලක්ෂ්මන් රණසිංහ හමුවූහ. අර්ල් සුගී රණසිංහට වැඳ වැටී තම නිදහස ලැබීම සහතික කිරීම ගැන ස්තූති කළේය. ඉල්ලා ඇති මුදල ලබාගැනීමට තමාට අමාරු තත්ත්වයක් තිබෙන බව කී පැට්‍රික් පෙරේරා ඒ මුදල් පසුව රැගෙන ඒමට පොරොන්දු විය.

ටික දිනකට පසු පැට්‍රික් පෙරේරා, ගොස් අර්නස්ට් පෙරේරා හමුව සිදුවූ සියල්ල ඔහුට කීය. නීතිඥ රණසිංහට මුදල් නොගෙවන ලෙසත්, අර්ල් සුගී දිගින් දිගට ගෙදර තබා නොගන්නා ලෙසත් අර්නස්ට් පෙරේරා පැට්‍රික්ට අවවාද කළේය. කිසිත් අවස්ථාවක තමා නීතිඥ ලක්ෂ්මන් රණසිංහට මුදල් නොගෙවූ බව පැට්‍රික් පෙරේරා සාක්ෂි දෙමින් කීය. අප්‍රේල් මස 19 වන දින ඔහු පෑලියගොඩ පොලිස් ස්ථානයට ගොස් තම පුතා ආපසු ගෙදර පැමිණ සිටින බවට ප්‍රකාශයක් කර ඇති හෙයින් කලින් කරන ලද පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනීමට අවශ්‍ය බව කීය. X 30 යනුවෙන් සලකුණු කොට මෙම ප්‍රකාශයේ පිටපතක් කොමිෂන් සභාවට ඉදිරිපත් කර තිබේ. පැට්‍රික් පෙරේරා ඉතා අවංක සාක්ෂිකරුවෙකුගේ හැසිරීමෙන් යුක්ත වූ බව අපි සඳහන් කරනු කැමැත්තෙමු.

කොමිෂන් සභාව හිටපු පොලිස්පති අර්නස්ට් පෙරේරා මහතාගෙන් ප්‍රශ්න කරනු ලැබූ අවස්ථාවෙහි, පැට්‍රික් පෙරේරා විසින් විස්තර කොට දක්වා ඇති කථාන්තරය නිවැරදි යයි සහතික කළේය. පැට්‍රික් පෙරේරා පැමිණ තමන් පසුව තම පුතා පැහැරගෙන යාම ගැන පැමිණිලි කරනු තමන්ට මතක බවත් ඔහු කීය. පසුව තම පුතා නිදහස් කරවාදීමට රු. 50,000/- ක් ඉල්වී යයි තමන්ට පැමිණිලි කරනු තමන්ට මතක බවත්, අර්නස්ට් පෙරේරා මහතා කීය. මෙම සිද්ධියට ඩග්ලස් පිරිස් සම්බන්ධ බව පෙරේරා තමාට දැන්වූ බව මතක බවත් කීය.

කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් නීතිඥ ලක්ෂ්මන් රණසිංහ ගෙන්ද ප්‍රශ්න කළේය. රණසිංහ මහතා අලුත්කඩේ මහේස්ත්‍රාත් උසාවියේ අපරාධ නඩුවලට පෙනී සිටින ජ්‍යෙෂ්ඨ

නීතිඥයකු ලෙස ක්‍රියා කරයි. රණසිංහ මහතා මෙම සිද්ධියට සම්බන්ධ තොරතුරු සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළේය. එසේ වුවද, කුඩා කඩදාසි කැබැල්ලෙහි ( X 28) ඇතුලත් දුරකථන අංක සහ අනික් කඩදාසි කැබැල්ලෙහි සඳහන් ලිපිනය නිවැරදි බව ඔහු පිළිගත්තේය. අදාල දුරකථන අංක අදාල කාලසීමාවේදී තමන් පාවිච්චි කළ දුරකථනවල අංක බව ඔහු පිළිගත්තේය., අදාල කාලසීමාවේදී තමන් රාජ්‍ය ඖෂධ සංස්ථාවේ සභාපති ලෙස ක්‍රියා කළ බව හා තම කාර්යාලය කොළඹ කොටුවේ ගෆූර් ගොඩනැගිල්ලේ පිහිටි බවත් ඔහු පිළිගත්තේය. ඔහුගේ ස්ථාවරය වූයේ විරුද්ධවාදීන් සමහරක් සම්පූර්ණ අසත්‍යයක් වන මෙම කථාව කීමට පැට්‍රික් පෙරේරා කැමති කරවා ගෙන තිබෙන බවයි. කෙසේ වුවද, පැට්‍රික් පෙරේරාගේ කතාව සත්‍ය බව අර්නස්ට් පෙරේරා මහතා විසින් පිළිගනු ලැබුයේ කෙසේද යන්න පහදාදීමට ඔහුට හැකිවූයේ නැත. මෙම කථාව ගෙනීමට කිසියම් තුන්වන පාර්ශ්වයකට පැට්‍රික් පෙරේරා ආධාර කිරීමට තිබිය හැකි පෞද්ගලික හේතුවක් ගැන තමා නොදන්නා බව රණසිංහ මහතා පිළිගත්තේය. තවද, කිසියම් තුන්වන පාර්ශ්වයකට ලක්ෂ්මන් රණසිංහට විරුද්ධව මෙබඳු අසත්‍ය චෝදනාවක් නැගීමට අවශ්‍ය වී නම් ඔවුන් 1990 සිට කුමන්ත්‍රණයක යෙදී සිට ඇති බවක් හැඟෙන බව මෙම කොමිෂන් සභාවේ සැලකිල්ලට භාජනය වේ. නමුත් 1990 වර්ෂය වන විට බටලන්ද කොමිෂන් සභාව පිහිටුවනු ලැබිය හැකි බවක් පෙනෙන්නට නොතිබිණ. එබඳු කුමන්ත්‍රණයක් තිබිනැයි අප විශ්වාස කළත්, 1990 දීම මෙම කථාව ගෙනීමට ඔවුන් පැට්‍රික් පෙරේරාට කැමති කරවා ගෙන තිබේයයි එයින් හැඟේ. කුමක් නිසාද යත්, නීතිඥයකු විසින් අල්ලසක් ලබාගැනීමට 1990 දී දරන ලද ප්‍රයත්නයක් ගැන පැට්‍රික් පෙරේරා ඔහුට දැන්වූ බවට අර්නස්ට් පෙරේරා එකඟ වන බැවිනි. ලක්ෂ්මන් රණසිංහ අල්ලසක් ඉල්ලීම සම්බන්ධයෙන් ව්‍යාජ කතාවක් ගෙනීමට එබඳු කණ්ඩායමක් කුමන්ත්‍රණය කළා නම් පැට්‍රික් පෙරේරා ලවා අල්ලස් කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුවට 1990 දී ම පැමිණිලි කරවීමට හැකිව තිබිණ. මෙහි ඉහතින් සඳහන් හේතු නිසා මෙම කොමිෂන් සභාවට ලක්ෂ්මන් රණසිංහ තමන් නිදොස් යයි කීම පිළිගත නොහැකිය.

## වාසල ජයසේකර.

වාසල ජයසේකර ( 38 වියැති) මහජන බැංකුවේ 1990 දී කැළණිය ශාඛාවට අනුයුක්ත ලිපිකරුවෙකි. ඒ වන විට ඔහු මහජන බැංකුවේ වර්ෂ 09ක් පමණ සේවය කොට තිබිණ. 1990 ඔක්තෝබර් 16 වන දින එදිනට ගනුදෙනුකරුවන් සඳහා බැංකුව වැසුවාට පසු හා බැංකුවේ සේවකයින්ගෙන් සමහර දෙනෙක් ( අන් ඇතැම් සේවකයින් බැංකුවේ සිටියදී) බැංකුවේ වැඩ එදිනට අවසන් කර පිටව ගියාට පසු සන්නද්ධ කණ්ඩායමක් ගොඩනැගිල්ලට ඇතුළු විය. බැංකු සේවකයින්ට තර්ජනය කිරීමෙන් පසු, සොරු බැංකු සුරක්ෂිතාගාරයෙහි තිබුණු රුපියල් දෙලක්ෂයක් පමණ ගෙන ගියහ. මෙම සිද්ධිය පොලීසියට වාර්තා කරන ලදුව, පැලියගොඩ පොලීසිය විමර්ශණය අප්‍රමාදව ඇරඹිය. විමර්ශණය ආරම්භ කරනු ලැබූ වහාම සොරකම සිදුවුනු අවස්ථාවෙහි බැංකුවේ සේවයෙහි යෙදී සිටි පෞද්ගලික ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙක් ප්‍රශ්න කිරීම සඳහා පොලීසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදහ.

ඔක්තෝබර් මස 18 වන දින පැලියගොඩ පොලිසියේ පොලිස් නිලධාරීහු ( මොවුන් අතරට පොලිස් පරීක්ෂකවරයෙක් හා සුමනසිරි නමැති සැරයන්වරයකු ඇතුලත් වූහ.) බැංකුවට පැමිණ වාසල ජයසේකර අත්අඩංගුවට ගත්හ. අත්අඩංගුවට ගත්තායින් පසු ඔහු

පැලියගොඩ පොලීසියට ගෙන යන ලදී. ඉක්බිතිව ඔහු සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් ඉදිරියට පමුණුවනු ලැබීය. සහකාර පොලිස් අධිකාරී පීරිස් තමාගෙන් මෙම සොරකම ගැන ප්‍රශ්න කළ බව ජයසේකර සාක්ෂි දෙමින් කීය. බැංකුවේ ප්‍රධාන දොරටුවේ යතුර ඔහු ළඟ ( වාසල ළඟ) තිබුණු හෙයින් සොරුන් කිසිත් බලයක් නොයොදා දොර හැරගෙන බැංකුව තුළට පැමිණියේ කෙසේදැයි ඔහු දැන සිටිය යුතු බව කියා ඇත. ජයසේකරගේ ස්ථාවරය වූයේ ඔහු මෙම සිද්ධියට කිසිසේත් සම්බන්ධ නැති බවත්, තමන් භාරයේ තිබුණු යතුර කිසිවෙකුට නොදුන් බවත්ය. ප්‍රධාන දොරටුවේ යතුරක් කළමනාකරු වෙත තිබෙන බවත් ඔහු කීය. සොරුන් බැංකුව තුළට පැමිණි අවස්ථාවෙහි ප්‍රධාන දොරටුව වසා තිබුණේද කියා තමන් නොදන්නා බවත් ඔහු කීය. කෙසේ වෙතත් ආරක්ෂක නිලධාරීන් ප්‍රධාන දොරටුවෙහි මුර සේවයෙහි යෙදී සිටින බව ඔහු කීය. තමාගෙන් ප්‍රශ්න කරන විට සහකාර පොලිස් අධිකාරී තමාට පටියකින් පහර දුන් බව ජයසේකර කීය. කෙසේ වුවද, සිද්ධියට තමාගේ සම්බන්ධයක් නැතැයි ජයසේකර දිගටම කීය.

ජයසේකර ඉන්පසුව පොලිස් ස්ථානයේ ගොඩනැගිල්ලේ ඉහළ මාලයට ගෙන යන ලදී. ඔහු කාමරයකට දමා ඔහු නිර්වස්ත්‍ර කොට ඔහු නිර්වස්ත්‍රව සිටියදී පොලිස් නිලධාරීන් කණ්ඩායමක් ඔහුට අනුකම්පා විරහිතව පහර දුන්නෝය. මෙම කණ්ඩායම කොස්තාපල් හීන්බණ්ඩා, පොලිස් සරයන් උපාලි ලක්හේවා, කොස්තාපල් ජයවර්ධන සහ පොලිස් කොස්තාපල් රියැදුරු ( PCD) රංජිත් ගෙන් සමන්විත වූ බව ඔහු පසුව දැනගත්තේය. මෙම පොලිස් නිලධාරී කණ්ඩායමට නායකත්වය දී ඇත්තේ සහකාර පොලිස් අධිකාරී පීරිස්ය. ජයසේකර චෝදනාවට වරදකරු නොවේ යයි දිගටම කී බැවින් පහර දුන් අය ඔහුගේ ඇස්වලට මිරිස් කුඩු දමා ඔහුගේ ඇඟිලිවලට ඇල්පෙනෙත්ති කටුවලින් ඇන්නෝය. මෙයින් ජයසේකරට ඉමහත් වේදනාවක් ඇතිවිය. සොරකම ගැන ජයසේකර ගෙන් තොරතුරු හෙළිකර ගැනීමට ඔවුන් හොඳටම මහන්සි ගෙන ජයසේකර කාමරයේ ගෘහ භාණ්ඩයකට තබා දම්වැලකින් බැඳ තබා ඔවුහු කාමරයෙන් පිටව ගියහ.

තුන් (3) දිනක් පමණ වාසල ජයසේකර මෙම කාමරයෙහි රඳවා සිටියේය. මෙම කාලය තුළදී ඔහු කිසිවිටෙකත් පොලිස් ස්ථානයේ සිර කුඩුවට නොදැමූ අතර, ඔහු මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පත් කළේත් නැත. තුන්වන දින සැන්දෑවෙහි වාසල ජයසේකර කාමරයෙන් පිටතට ගෙන මෝටර් රථයකට නංවන ලදී. සහකාර පොලිස් අධිකාරී පීරිස් හා පොලිස් කොස්තාපල් ජයවර්ධනද මෝටර් රථයට ගොඩවිය. වාහනය පොලිස් ස්ථානයේ සිට කිරිබත්ගොඩ හන්දිය දක්වා ධාවනය කළේය. මෝටර් රථය පදවන ලද්දේ පොලිස් කොස්තාපල් රියැදුරු රංජිත් විසිනි. කිරිබත්ගොඩ හන්දියේදී මෝටර් රථය දකුණත පැත්තේ පාරකට හැරවීන. ඉන්පසුව රථය මිනිත්තු කිහිපයක් ගමන් කළේය. සාක්ෂිකරු යුද්ධ හමුදා කඳවුරක් ලෙසට විස්තර කළ ස්ථානයකට රථය පැමිණියේය. එම පරිශ්‍රයේ දොරටුවේ යුද්ධ හමුදා මුර සෙබලු වූහ. කොස්තාපල් ජයවර්ධන වාහනයෙන් බැස ගොස් මුර සෙබලුන් හා කථා කළ විට ඔවුහු ගේට්ටුව ඇරියහ. එවිට වාහනය පරිශ්‍රය තුළට ගොස් වමට හැරුණේය. එය ඉන්පසු ටික දුරක් ධාවනය කොට පාර දෙකට බෙදී ගිය ස්ථානයක නතර විය. වාහනය නැවැත්වූ ස්ථානයේ දකුණත පැත්තේ හිස් තණ බිමක් හා ජල කුළුණක් විය. ඉඩමෙහි තැනින් තැන පොල්ගස් ටිකක් විය. වම් අත් පැත්තේ ගෙයක් විය. එය පිහිටා තිබුනේ පල්ලමකය. සහකාර පොලිස් අධිකාරී වාසල ජයසේකරට මාංචු දමා ගෙය තුළට ගෙන යන ලෙස කොස්තාපල් ජයවර්ධනට නියම කළේය. පීරිස් ඉන්පසුව මෝටර් රථයෙන් එපිටට පා ගමනින් ගියේය. ජයවර්ධන ගෙය ළඟට ගොස් ගෙය තුළ සිටි යම් පුද්ගලයෙකුට කථා කළ අතර, ඉන් පසුව ඔහු ගෙය තුළට ගෙන ගියේය.

ගෙය තුළ පුද්ගලයන් කිහිප දෙනෙකු නිර්වස්ත්‍රව බිම වැතිර වේදනාවෙන් කෙඳිරි ගාමින් සිටිනු ජයසේකර දැක්කේය. ඔවුන්ට මාංචු දමා තිබිණ. සමහර අය බිම නිදා ගෙන සිටියහ. ජයසේකර කාමරයකට ගෙන ගොස් නිර්වස්ත්‍ර කරන ලදි. ඉන් පසුව ඔහු කාමරයේ නතර කොට සිටියේය. කාමරයේ සිටින විට පුද්ගලයින් ගෙන් ප්‍රශ්ණ කරන අතර තුර ඔවුන්ට පහර දෙනු ජයසේකරට ඇසිණ. මිනිසුන් වේදනාවෙන් හඬනු දිගටම ඔහුට ඇසිණ.

පසුදින සහකාර පොලිස් අධිකාරි පීරිස්, උප පොලිස් පරීක්ෂක දෙල්ගහගොඩ , පොලිස් සැරයන් උපාලි ලක්හේවා සහ පොලිස් කොස්තාපල් රියැදුරු රංජන් නිවසට පැමිණියහ. ඔවුන් ජයසේකරට පහර දෙන්ට වූ අතර, ඉක්බිතිව තවත් මෙහි රඳවා සිටිය අය කාමරය තුළට ගෙනවුත් පෙන්වා ඔවුන් කිසිවෙක් හඳුනන්නේදැයි ජයසේකරගෙන් ඇසූහ. ඔහු නැතැයි උත්තර දුන්නේය. ජයසේකර මෙම නිවාසයෙහි දිගටම තුන් දිනක් රඳවා සිටියේය. මෙම කාලසීමාවේදී කලින් සඳහන් කල පොලිස් නිලධාරීහු ඔහුගෙන් කිහිපවාරයක්ම ඔහු ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියා වලට සම්බන්ධය යන චෝදනාව ගැන ප්‍රශ්න කළහ. තමා ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාවලට සම්බන්ධ නැතැයි ජයසේකර දිගටම කියා සිටියේය.

තමාට පහර දෙන අතරතුර තමාගෙන් ප්‍රශ්න කරන ලද්දේ යයි ජයසේකර කීය. ඇතැම් පහරදීම් නිසා ලේ ගලන තුවාල ඇතිවී යයි ඔහු කිය. ප්‍රශ්න කිරීමෙන් පසු විධිමත් ප්‍රකාශයක් සටහන් කර ගනු ලැබුවේ නැත. තමා රඳවා සිටි කාලසීමාව තුළ ඉහතින් සඳහන් නිලධාරීන් හා ප්‍රධාන පරීක්ෂක වික්‍රමසිංහ විසින් තවත් රැඳවුම් කරුවන්ට පහර දෙනවා ඔහු දැක ඇත. ඇතැම් අවස්ථාවල ප්‍රශ්න කරන පුද්ගලයින් විසින් රැඳවුම්කරුවන් ප්‍රශ්න කරනු ලබන අතරතුර කියූ දේ ගැන අර්ධ කඩදාසි කොලවල සටහන් ලියා ගනු ඔහු දැක්කේය. රඳවා සිටින සමහර පුද්ගලයින්ගේ තුවාල වලින් ලේ ගැලිය. මෙම නිවාසයේ රඳවා සිටි කාලයේ ඔහුට සහ අනිකුත් රැඳවුම්කරුවන්ට දිනකට දෙනු ලැබුයේ එක ආහාර වේලක් පමණකි. ඒ පෙරවරු 10.00ට පමණය බොහෝ අවස්ථාවල කෑම නරක්වී තිබිණ. ජයසේකරට කෑම නොකා ඉවත දැමීමට සිදුවිය. රඳවා සිටින කාලයේ ඔහුට කිරීමට භාර කොට තිබුණු එක් කටයුත්තක් නම් තමා සමඟ රඳවා සිටි අයගේ අසූචි ඉවත් කිරීමය. එම අසූචි එකතු කොට නිවාසය තුළ පිහිටි වැසිකිලියකට දමන ලෙස ඔහුට නියම කළේය. මෙහි නේවාසිකව සිටි සමහර අය පිටතට ගෙන යන විට තවත් අය නිවස තුළට ගෙන එනු ලැබුහ. පිටතට ගෙන ගිය අය ඉන්පසු නැවත ගෙය තුළට ගෙන එනු ලැබුයේ නැත.

ටික දිනකට පසු ජයසේකර ගෙයින් පිටතට ගෙන වාහනයක නංවා පැලියගොඩ පොලිස් ස්ථානයට ගෙන යන ලදි. පොලිස් ස්ථානයේදී ඔහු නැවත ගොඩනැගිල්ලේ පළමු මහලට ගෙන යනු ලැබුවේය. ඔහු පළමුවන වතාවේ රඳවා සිටි කාමරයෙහි නොවැම්බර් මස 26 වන දින දක්වා රඳවා තබනු ලැබුවේය. එදින ඔහු අළුත්කඩේ මහේස්ත්‍රාත් උසාවියට ගෙන ගොස් අංක 5 දරණ උසාවියේ නඩු විනිශ්චය කරමින් සිටි මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කරනු ලැබුවේය. ඔහු මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කරනු ලැබුවේ පැලියගොඩ පොලිසියේ අපරාධ අංශයේ කාර්ය භාර නිලධාරියා වූ පොලිස් පරීක්ෂක ඔක්කම්පිටිය විසිනි. ගරු මහේස්ත්‍රාත්වරයා ජයසේකර අමතා ඔහුට යමක් කියන්නට තිබේදැයි විමසීය. එම අවස්ථාවෙහි, තමාට පොලිසිය විසින් පහර දෙන ලදැයි ද, ඔහුගෙන් මුත්‍ර සමග ලේ පිටවන්නේ යයිද, තම සිරුර විශේෂයෙන්ම තම හිස කකියන්නේ යයි ද ඔහු කිය.

කොමිෂන් සභාව, ජයසේකර ගරු මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පැමිණවීම සම්බන්ධ නඩු වාර්තාව කැඳවා පරීක්ෂා කර බැලුවේය. නඩු අංකය වූයේ B 1700/5 යි. නඩු වාර්තාවේ

5-H 007107

තිබුණු සටහන් අනුව 1990 නොවැම්බර් මස 26 වන දින එච්.ජී. වාසල ජයසේකර නමැති සැකකරුවෙක් උගත් මහේස්ත්‍රාත් වරයා වෙත ඉදිරිපත් කොට තිබිණ. සැකකරුවා ඉදිරිපත් කිරීමත් සමග පොලීසිය මහේස්ත්‍රාත් උසාවියෙහි වාර්තාවක් ගොනු කර ඇත. එහි සඳහන් කර තිබුණේ මෙම සැකකරු කැළණිය මහජන බැංකු ශාඛාවෙන් කරන ලද මුදල් සොරකමට සම්බන්ධ බවය. ඔහු රඳවා ගනු ලබන්නේ හදිසි අවස්ථා ව්‍යවස්ථාවල 19 (2) ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද රැඳවුම් නියෝගය යටතේ යයි ද එහි සඳහන් කර තිබිණ. අදාල රැඳවුම් නියෝගය නිකුත් කර තිබුනේ සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් විසිනි. සැකකරු පැලියගොඩ පොලිස් ස්ථානයෙහි රඳවා තැබියයුතු බව එහි කියා තිබිණ. මෙසේ ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී , තමාට පොලීසිය විසින් හිස මතට පහර දෙන ලදැයි ද, ඔහුගේ හිස කකියන්නේ යයි ද ඔහුගේ වළලු කරවල් තුවාල වී ඇතැයි ද ඔහුගේ මූත්‍ර සමග ලේ පිටවන්නේ යයි ද සැකකරු මහේස්ත්‍රාත්වරයාට දන්වා ඇත. සැකකරු වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කර ඔහුට ප්‍රතිකාර ලබාදී ඔහු අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කර වාර්තාවක් ලබාගන්නා ලෙස මහේස්ත්‍රාත්වරයා පොලිස් පරීක්ෂක ඔක්කම්පිටියට නියම කර ඇත. පොලීසිය විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතක් සලකා බලා සැකකරු තවත් එක් මාසයක් පොලිස් භාරයේ තබාගැනිමට මහේස්ත්‍රාත්වරයා විසින් පොලීසියට අවසර දෙන ලදී. තවද, 1990 දෙසැම්බර් මස 26 වන දින සැකකරු තමා වෙත ඉදිරිපත් කරන ලෙස මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. එසේ වුවද, එම දිනයෙහි සැකකරු මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර නැති බව උසාවි වාර්තාවෙන් දැක්වේ. පසුව ඔහු ඉදිරිපත් කර තිබෙන්නේ 1991 ජනවාරි මස 04 වන දිනය. තවදුරටත් විමර්ශණය කිරීම සඳහා සැකකරු රඳවා ගැනිමට අවස්ථාව දෙන ලෙස එදින පොලීසිය මහේස්ත්‍රාත්වරයා ගෙන් ඉල්ලා ඇත. මේ අනුව සැකකරු පොලීසිය භාරයේ රඳවා තබා තමා වෙත 1991 පෙබරවාරි මස 07 වන දින ඉදිරිපත් කරන ලෙස මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. එම දිනයෙහි පොලීසිය සැකකරු මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර ඔහු තවදුරටත් රඳවා තබා ගැනිමට අවස්ථාව ඉල්ලා සිටියේය. එම ඉල්ලීම කරන ලද්දේ පොලීසිය රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයෙන් නව රඳවා ගැනීම් නියෝගයක් සඳහා ඉල්ලුම් කර ඇත යන පදනමිනි. එම අවස්ථාවෙහි, සැකකරු නැවත පොලිස් භාරයට ගෙන ඔහු තමන් වෙත මාර්තු මස 07 වන දින ඉදිරිපත් කරන ලෙස මහේස්ත්‍රාත්වරයා නියෝග කර ඇත. පොලීසිය පෙබරවාරි මස 15 වන දින තවදුර වාර්තාවකුත් සමග සැකකරු මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන ලදී. නව රැඳවුම් නියෝගයක පිටපතක් උසාවියට ඉදිරිපත් කළේ නැත. සැකකරුට විරුද්ධ සාක්ෂි නොමැති බැවින් ඔහු නිදහස් කරන ලෙස රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශය විසින් තමන්ට දන්වා ඇතැයි මෙම වාර්තාවෙහි පොලීසිය විසින් සඳහන් කර තිබේ. ඒ අනුව මහේස්ත්‍රාත්වරයා සැකකරු නිදහස් කර ඔහුට සතියකට වරක් කැළණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය වෙත පෙනී සිටින ලෙස නියෝග කළේය. ඉහත දැක්වෙන උසාවි දිනයන් කිසිවකදී නීතිඥවරයකු ඔහු වෙනුවෙන් පෙනී සිටි බවක් උසාවි වාර්තාවේ සඳහන් නොවේ. 1991 ජුනි මස 03 වන දින නීතිඥ අතිල් ගුණවර්ධන මහතා සැකකරු වෙනුවෙන් පෙනී සිටිමින් ඉහත සඳහන් නියෝගය ලිහිල් කරන ලෙස ඉල්ලා සිටියේය. මේ අනුව සැකකරු සතියකට වරක් නොව මසකට වරක් කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය හමුවෙහි පෙනී සිටින ලෙස නියෝග කළේය. ඉහත සඳහන් සටහන් අන්තර්ගත වූ මුල් අධිකරණ වාර්තාව X 36 වශයෙන් සලකුණු කර කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී.

වාසල ජයසේකරගේ සාක්ෂිය ගැන නැවත සඳහන් කරනොත්, ඔහු තමාට පොලිසිය විසින් සිදුකරන ලද හිරිහැර ගැන මහේස්ත්‍රාත්වරයාට පැමිණිලි කිරීමෙන් පසු ඔහු උසාවියේ සිට පොලිස් ජීප් රථයක ආපසු ගෙන එනු ලැබූ වහාම ඔහුට පොලිසිය විසින් පහර දෙන ලද බව ඔහු කීය. ජයසේකර විසින් මහේස්ත්‍රාත්වරයාට කරන ලද ප්‍රකාශ ගැන පොලිස් නිලධාරීන් කෝපයට පත්වී සිටි බව පැහැදිලිය. මෙම තත්ත්වය අනුව, සැකකරු පොලිස් පහරදීම ගැන තමාට පැමිණිලි කරනු ලැබුවායින් පසු මහේස්ත්‍රාත්වරයා මෙම සැකකරු නැවතත් පොලිස් භාරයට පත්කිරීම කෙතරම් ප්‍රඥාගෝචරද යන්න ගැන අපට සැක සිතේ.

එදිනම, ඔහු පැලියගොඩ පොලිස් ස්ථානයට නැවතත් ගෙන යනු ලැබීමෙන් පසු සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් සහ ඔහුගේ කණ්ඩායම ඔහු රඳවා සිටි කාමරයට පැමිණ ඔහුට නැවතත් පහර දුන්හ. සැකකරු උසාවියට ගෙන ගිය පොලිස් නිලධාරියෙකු විසින්, ඔහු පොලිසිය විසින් තමාට පහර දුන්නේ යයි මහේස්ත්‍රාත්වරයාට පැමිණිලි කල බව ඔවුන්ට දැනුම් දුන්නා විය හැකිය. පසුව මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද පරිදි පොලිසිය සැකකරු අධිකරණ වෛද්‍යවරයාට ඉදිරිපත් කළේය. ජයසේකර තමාට සිදුවූ දේ ගැන අධිකරණ වෛද්‍යවරයාට දැනුම් දුන්නේය. ඉක්බිතිව, අධිකරණ වෛද්‍යවරයා විසින් ඔහු පරීක්ෂා කර ඇත. මෙම කොමිෂන් සභාවේ විමර්ෂණ ඒකකය විසින් අදාල අධිකරණ වෛද්‍ය වාර්තාව ලබාගැනීමට ගත් මහන්සියෙන් ඵලදායී ප්‍රතිඵලයක් ලැබුණේ නැත. අවසන් මාසය තුළ ඔහු පැලියගොඩ පොලිස් ස්ථානයේ රඳවා සිටියේ පොලිස් ස්ථානයේ සිර මැදිරියකය. එය පිහිටා තිබුනේ බිම් මහලයෙහිය. එතැනට පැමිණ ජයසේකර දැකීමට ඔහුගේ පියාට අවසර දෙන ලදී. එම කාලසීමාවෙහි එක් දිනක පොලිස් සැරයන් උපාලි ජයසේකර වෙත අවුත්, සිරෙන් නිදහස්වීමට කැමැත්තක් දක්වන්නේ නම් ඔහුගේ පියාට ගොස් අනිල් ගුණවර්ධන නම් නීතිඥ මහතෙකු හමුවන ලෙස කීය. මෙම නීතිඥවරයා වාසය කරන්නේ කැලණිය වරාගොඩ පාරේ යයි ඔහු කියා තිබේ. වාසල ජයසේකර පොලිස් සැරයන් උපාලි කී දෙය ඔහුගේ පියාට දැනුම් දුන්නේය.

වාසල ජයසේකරගේ පියා වන සාලින්ද ජයසේකර ඉන්පසුව ගොස් නීතිඥ අනිල් ඉන්ද්‍රජිත් ගුණවර්ධන හමුවූයේය. මෙම නීතිඥයා ජීවත්වූයේ කැලණියේය. ඔහු වාසලට සිදුවී තිබෙන දෙයත්, පෙරකී පොලිස් නිලධාරියා කී දෙයත් නීතිඥයාට දැන්වූයේය. ටික දිනකට පසු, තමා යම් යම් විමසීම් කල බවත්, වාසලගේ නිදහස ලබාගැනීමට ඔහුට රුපියල් 50,000/- ක් අවශ්‍ය බවත් නීතිඥවරයා වාසලගේ පියාට කියා ඇත. මෙම මුදල අවශ්‍යවී තිබෙන්නේ සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ට දීමට යයි නීතිඥවරයා කියා ඇත. මේ අනුව එම මුදල නීතිඥවරයාට දෙන ලදී. ටික දිනකට පසු එනම්, 1999 පෙබරවාරි මස 15 වන දින පොලිස් නිලධාරී උපාලි විසින් උසාවියට ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් අනුව මහේස්ත්‍රාත්වරයා විසින් වාසල ජයසේකර මුදාහරින ලදී.

කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිදීම සඳහා නීතිඥ අනිල් ගුණවර්ධන කොමිෂන් සභාව ඉදිරියට කැඳවන ලදී. තමා මහේස්ත්‍රාත් උසාවියේදී වාසල ජයසේකර වෙනුවෙන් පෙනී සිටි බව පිළිගත් නීතිඥවරයා කිසිත් මුදලක් තමා වාසල ජයසේකරගේ පියාගෙන් ඉල්ලීමක් හෝ පිළිගැනීමක් නොකළේ යයි කියා සිටියේය. කෙසේ වුවද, වලංගු රැඳවුම් නියෝගයක් නොමැතිව වාසල ජයසේකර කලක් රඳවා සිටි නමුත් තමා වාසල වෙනුවෙන් පෙනී සිටීමට පටන් ගත් සුළු කලකට පසු ඔහු හදිසියේ නිදහස් කරනු ලැබූ බව

ගුණවර්ධන මහතා පිළිගත්තේය. තමා වාසල ජයසේකර වෙනුවෙන් පෙනී සිටීමට පටන් ගත් විගසම පොලීසිය වාසල සම්බන්ධයෙන් දැරූ ආකල්පය වෙනස් වූයේ කෙසේදැයි විස්තර කිරීමට ගුණවර්ධන මහතාට හැකිවූයේ නැත.

## තලේරත්න මුදලිගේ බන්දුල.

වී.එම්. බන්දුල ( වයස අවුරුදු 37යි) කැළණිය දළුගමගොඩ පුද්ගලයෙකි. ඔහු ක්ලෝක් ඕවර්සීස් කොම්පැනි නම් පුද්ගලික සමාගමක විදුලි ශිල්පියෙකු ලෙස කටයුතු කළේය. මෙම සමාගම මෙම කාලසීමාවේදී වසර කිහිපයක් ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ උප කොන්ත්‍රාත්කාර සමාගමක්. ලෙස ක්‍රියාකර ඇත. මෙම කාලසීමාව තුළදී බටලන්ද නිවාස සංකීර්ණයේ කිසියම් වැඩ කොටසක් කිරීමට ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට කොන්ත්‍රාත් දී තිබුණේය. එහෙයින් බන්දුල ද බටලන්ද නිවාස යෝජනා ක්‍රම වැඩ බිමෙහි සේවය කර ඇත. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ (බටලන්ද නිවාස යෝජනා ක්‍රම වැඩබිමේ ) වැඩ බිම් ඉංජිනේරු තැන විසින් තමාට 1978 පෙබරවාරි මස 16 වන දින නිකුත් කරන ලද සේවා සහතිකයක් බන්දුල කොමිෂන් සභාවට ඉදිරිපත් කළේය. මෙම සහතිකය අනුව බන්දුල බටලන්ද නිවාස යෝජනා ක්‍රම වැඩ බිමේ මාස 14ක් වැඩ කර ඇත. මෙම සහතිකය සලකුණු කර තිබුණේ X 38 යනුවෙනි. තමා බටලන්දෙහි වැඩ කළ කාලසීමා ව තුළදී මෙම පෞද්ගලික සමාගම විසින් තමාට නිකුත් කොට තිබුණු හැඳුනුම්පතද සාක්ෂිකරු ඉදිරිපත් කළේය. මෙම ලියවිල්ල සලකුණු කර තිබුණේ X 37 යනුවෙනි. වර්ෂ 1979 සිට ඔහු අභාවප්‍රාප්ත ඔසී අබේගුණසේකර මහතා දැන හැඳින ගෙන සිට ඇත. අබේගුණසේකර මහතා සමග බන්දුල ද දේශපාලන කටයුතුවලට බැස්සේය. ඔහු ශ්‍රී ලංකා මහජන පක්ෂයට වැඩ කළේය. ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායක විජය කුමාරණතුංග මහතා 1983 දි ඝාතනය කරනු ලැබුවායින් පසු අබේගුණසේකර මහතා තමා වෙත ආරක්ෂක නිලධාරියෙකු ලෙස සේවය කිරීමට බන්දුලට ආරාධනා කළේය. බන්දුල මෙම ආරාධනය පිළිගෙන අබේගුණසේකර මහතාට පූර්ණකාලීන පදනමින් වැඩ කිරීමට පටන් ගත්තේය. අබේගුණසේකර මහතා ගමන් බිමන්වල යෙදෙන විට බන්දුල ඔහුගේ මෝටර් බයිසිකලයෙන් ඔහුට ආරක්ෂාව සළසමින් ඔහු කැටුව ගියේය. ඔහු 1988 පළාත් සභා මැතිවරණයේදීත්, 1988 ජනාධිපතිවරණයේදීත්, 1989 මහ මැතිවරණයේදීත්, ශ්‍රී ලංකා මහජන පක්ෂ ව්‍යාපාරයට ක්‍රියාශීලිව සහභාගි විය. මෙම කාලසීමාවේදී තමාට ජනතා විමුක්ති පෙරමුණෙන් ප්‍රශ්ණ ඇතිවූ බව ඔහු කීය. පොලිස් පරීක්ෂක වැදිසිංහ තමා හොඳින් දැන සිටි බවත්, තමාට ජනතා විමුකිත් පෙරමුණෙන් එල්ලවී තිබුණු තර්ජන ගැන ඔහුට කී බවත් බන්දුල කීය. 1990 දී බන්දුල වාසය කර තිබෙන්නේ පමුණුවිල කුලී නිවසකය. ඔහු තම බිරිඳ හා ළමයින් දෙදෙනා සමග එහි වාසය කර ඇත. 1990 ජනවාරි මස 27 වන දින උදයෙහි බන්දුල තම පරම්පරාවට අයත් මුල් නිවසට ගොස් ඇත. එම නිවස පිහිටා තිබුණේ දළුගමය. එය තිබුනේ සැතපුම් භාගයක් පමණ එපිටිනි. ඔහුට තම අසල්වැසියෙකු වූ කමල් ඉන්ද්‍රජිත් හමුවූ අතර මාළු ටිකක් මිළදී ගැනිම සඳහා කඩපොළට යාමට ඔහු පාපැදියක් ලබාගත්තේය. මෙම පාපැදිය ලබාගෙන පැදගෙන ගියේය. අතර මග ෆ්‍රැන්සිස් පටුමගේදී එක් ටයරයක හුලං බැස්සේය. බන්දුල එම බයිසිකලය කිට්ටුව පිහිටි බයිසිකල් වැඩපලකට ගෙන ගොස් සයිකල් ටියුබ් එක අළුත්වැඩියා කර ගත්තේය. ඉන් පසුව ඔහු තම ගමනේ යෙදිණ. තම පිටුපසින් රතුපාට මෝටර් රථයක් පැමිණි අතර එය තමන් පසුකර යන විට තලාව ශබ්ද කළේය. එම මෝටර් රථය යාර කිහිපයක් ගොස් නැවතින. එහි ගමන් කළ අය මෝටර් රථයෙන් බැස බන්දුල වෙත පැමිණියහ. ඉන් එක් අයෙක්

ආයුධ සන්නද්ධව සිටියේය. අනිකුත් පුද්ගලයා ඔහුගේ බෙල්ලට පහර දුන්නේය. බන්දුල බයිසිකලයෙන් බිමට වැටිණ. සන්නද්ධ පුද්ගලයා ගිනි අවිය තම කණට එල්ල කළ බව මතක යයි බන්දුල කීය. මෙම පුද්ගලයා සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් බව බන්දුල හඳුන ගත්තේය. ඩග්ලස් පීරිස් බොහෝ කලක සිටම ඔහු දැන සිටියේය. ඔවුන් දෙදෙනා අතර ඇසුරක් නොතිබුණත් බන්දුල කැලණිය ප්‍රදේශයේදී, විශේෂයෙන්ම මැතිවරණ ව්‍යාපාරය තුළදී, ඔහු බොහෝ වාරයක් දැක ඇත. ඔහු සහකාර පොලිස් අධිකාරී පීරිස් මහතා නොවේදැයි බන්දුල අසා ඇත. එවිට තමා සහකාර පොලිස් අධිකාරී පීරිස් බව පවසමින් " ඔහේ මයිගේ පුද්ගලික ආරක්ෂකයා නොවේදැයි "ඇසීය. එසේ කියමින් ඔහු වාහනයට නගින ලෙස බන්දුලට නියම කර ඇත. බන්දුලට වෙඩි තබන බවට ඔහු තර්ජනයද කර ඇත. ඉන්පසුව බන්දුල වාහනයට නංවාගන්නා ලදි. ඔහු පසු පස අසුනට නංවා ගත් අතර, නාඳුනන පුද්ගලයෝ දෙදෙනෙක් ඔහු දෙපට වී සිටියහ. සහකාර පොලිස් අධිකාරී පීරිස් ඉදිරි පස අසුනට ගොඩ විය. ඔහු මිනීමැරීම් හා සොරකම් වැනි බරපතල වැරදිවලට සම්බන්ධවී ඇති බවත්, ඔහු මෙසේ අත්අඩංගුවට ගැනීමට හේතුව එය බවත් පීරිස් කීය. වාහනය ධාවනය කෙරන අතර තුර බන්දුලගේ දෙපැත්තෙන් වාඩිවී සිටි පුද්ගලයින් දෙදෙනා බන්දුලට පහර දෙන්නට පටන් ගත්හ. තමාට පහර නොදෙන ලෙස බැගෑපත්ව කී බන්දුල, තමා අසනීපයෙන් සිටින පුද්ගලයෙකැයි කීය. තම හෘදයවස්තුවේ සිදුරක් තිබෙන බවත්, එහෙයින් තමා මරණයට පත්වීමට ඉඩ තිබෙන බවත් බන්දුල කීය. එය ප්‍රශ්ණයක් නොවන බවත්, කෙසේ වුවත් ඔහු මාරා දැමීම සඳහා ගෙන යන බවත් පහර දෙන්නෝ කීහ. සහකාර පොලිස් අධිකාරී පීරිස්ගේ උපදෙස් පිට ඉන්පසුව බන්දුලගේ ඇස් වසා බැඳ ඇත. බන්දුල අත්අඩංගුවට ගත් විගසම ඔහුට මාංචු දමා ඇත. ඔහු රැගත් වාහනය විනාඩි 10 ක් පමණ ගමන් කර ඇත. එය ඉන් පසුව නැවතිණ. බන්දුල මෝටර් රථයෙන් එළියට ගත් අතර, ගොඩනැගිල්ලක් තුළට ගෙන යන ලදි. මිනිසුන් කථා කරනු ඔහුට ඇසිණ. ඔහුට ඇසුණු ශබ්ද අනුව මෙය පැලියගොඩ පොලිස් ස්ථානය යයි ඔහුට සිතිණ. ගොඩනැගිල්ල තුළ පොලිස් නිලධාරීන් රේඩියෝ පණිවුඩ හුවමාරු යන්ත්‍රය ඔස්සේ එකිනෙකා සමග කථා බහ කරනු ඔහුට ඇසිණ, ඔවුන් මෙසේ කියනු ඔහුට ඇසිණ. " ඔව් මේ පැලියගොඩ පොලිසිය තමයි, කථා කරන්න.. . . . ." . එහෙයින් තමා පැලියගොඩ පොලිස් ස්ථානයට ගෙන එන ලද්දේ යයි ඔහු සිතිය. විනාඩි කිහිපයක් පොලිස් ස්ථානයේ තබා සිට බන්දුල තවත් වාහනයකට නංවනු ලැබිණ. මෙම වාහනය තුළදී ඔහුට මුහුණ යටි අතට සිටින සේ වැතිර සිටින ලෙස නියෝග කරනු ලැබිණ. මෙම වාහනය වෑන් රථයක් යයි ඔහුට සිතිණ. ඉන් පසුව ඔහුගේ සිරුර මත ටයර් කිහිපයක් පටවණ-ලදි. තවත් කිහිප දෙනෙක් වෑන් රථයට ගොඩවූ අතර, ඔවුන් තමා ගාල්ලේ බූස්සේ රැඳවුම් කඳවුරට ගෙන යන්නේ යයි එක් පුද්ගලයෙක් කීය. ඉන් පසු වාහනය ගමන් කිරීම ඇරඹිණ. වාහනය සැතපුම් දෙකක් පමණ ගමන් කළේය. ඉන්පසුව එය නැවතිණ. බන්දුල වෑන් රථයෙන් එළියට ගෙන ගොඩනැගිල්ලක් තුළට ගෙන යන ලදි. ගොඩනැගිල්ල තුළදී එක් මාංචුවක් ගලවා එය ශක්තිමත් වස්තුවකට සවි කරන ලදි. එමනිසා බන්දුලට බේරී යාමට නොහැකි විය. ඒ විගසම ඔහු පැහැර ගෙන ගිය අය ස්ථානයෙන් පිටව ගියහ. ටික වේලාවකට පසු නිදහස්ව තිබෙන අතේ උදව්වෙන් බන්දුල තම ඇස් වසා බැඳ තිබුණු පටිය ඉස්සිය. තමා කාමරයක සිටින බවත්, කාමරය තුළ තවත් දෙදෙනෙක් ඇස් වසා බැඳ සිටින බවත් ඔහු දුටුවේය. ඔහු මෙතැනට ගෙනවුත් තිබෙන්නේ කුමක් නිසාදැයි බන්දුල එක් පුද්ගලයෙකුගෙන් ඇසීය. තමා මුලින් සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින් හොර මත්පැන් පෙරීම සම්බන්ධ චෝදනාවක් උඩ අත්අඩංගුවට ගත් බවත්, අත්අඩංගුවට ගැනීමෙන් පසු සහකාර පොලිස් අධිකාරී පීරිස් තමාට තදබල ලෙස පහර දුන් බවත් ඔහු කිය. ඉන් පසුව මෙම පුද්ගලයා තමාට පහරදීම ගැන සහකාර පොලිස් අධිකාරී පීරිස්ට

විරුද්ධව උසාවියේ නඩු පැවරීය. උසාවිය ඔහුට පක්ෂව තීන්දුව දුන් අතර, (එනම් ඔහු සහකාර පොලිස් අධිකාරී පිරිස්ට විරුද්ධ නඩුවෙන් ජය ගත්තේය.) ඔහුට වන්දියක් ලැබිණ. සුළු කලකට පසු පොලිස් සැරයන් රත්නායක ඔහු අත්අඩංගුවට ගෙන මෙම නිවාසයට ගෙන ආවේය.

රාත්‍රියේදී පෙරකී පුද්ගලයින් ගොඩනැගිල්ලට පැමිණ බන්දුලගේ මාංචු ගැලවූහ. ඔහුගේ අත් හා පා බඳින ලදී. ඔහුගේ සිරුර අත් ඉහලට සිටින සේ පොළවෙන් ඉස්සූ අතර, ඔහු වහලයෙන් එල්ලනු ලැබිණ. ඉන් පසුව ඔහු ඒ පැත්තට මේ පැත්තට පැද්දූ අතර, පුද්ගලයෝ ඔහුට පොලුවලින් පහර දුන්හ. ඔහුගේ සිරුර ඔරලෝසු බට්ටකු මෙන් පැත්තෙන් පැත්තට පැද්දෙන්නට විය. බන්දුල අපරාධකාරී ක්‍රියාවලට සහභාගීවී තිබෙන බවත්, ඇතැම් අවස්ථාවල ඔහු කිරිබත්ගොඩ පොලිස් පරීක්ෂක වැදිසිංහ සමග මංකොල්ලකෑම් වල යෙදී තිබෙන බවත්, ඔහුට පහර දෙන අතරතුර ඔහුට චෝදනා කරන ලදී. ඔහු ජනතා විමුක්ති පෙරමුණු ක්‍රියාවලට සහභාගීවී ඇත්දැයිද ඔහුගෙන් අසන ලදී. මෙම කිසිත් චෝදනාවකට තමා වැරදිකරුවන්නේ නැතැයි බන්දුල පිළිතුරු දි තිබේ. . බන්දුල වේදනාවෙන් කෑගැසීය. ඉක්බිතිව ඔහු කෑගැසීම වළක්වනු පිණිස ඔහුගේ මුඛයට පාත්කඩ එබූ අතර, ඔහුට පහරදීම යළි පටන් ගැනිණ. ටික වේලාවකට පසු බන්දුල සිහි නැතිවූවා වාගේම තත්ත්වයකට පත්විය. අත් නැතිවාක් මෙන් ඔහුට දැනිණ. ඔහුගේ අත්වල ස්පර්ශයක් ඔහුට නොදැනිණ. ටික වේලාවකට පසු පහරදීම නැවතිණ. බන්දුල බිම දමා සිටියේය. එම අවස්ථාවේ ඔහුට පහර දුන් කිසිවෙක් හඳුනාගත හැකිවූයේ නැතැයි බන්දුල කීය.

පසු දින උදෑසන බන්දුල නිවසින් එළියට ගෙන වාහනයකින් තවත් නිවාසයකට ගෙන එන ලදී. වාහනය ටික දුරක් පමණක් ගිය තැන එය නවතා ඔහු එළියට ගෙන තවත් නිවසකට ගෙන යන ලදී. තමා මංකොල්ලකෑම්වලට සම්බන්ධ යයි කියන චෝදනා ගැන එදිනත් බන්දුලගෙන් ප්‍රශ්න කරන ලදී. ඔහුගෙන් ප්‍රශ්න කළ අය ඔහුට පහරදීම දිගටම කරගෙන ගියහ. බන්දුල ඔහුගේ ස්ථාවරය වෙනස් කළේ නැත. ඩෙන්සිල්, බැසිල්, උපාලි හා ක්වින්ටස් අත්අඩංගුවට ගෙන මෙම නිවසේදීම ඝාතනය කළේ තමන් විසින් යයි කියමින් ඔවුහු බන්දුල ලවා විස්තර හෙළිකරවා ගැනීමට පහර දුන්නෝ නැත් කළහ. එමනිසා ඇත්ත කියන ලෙස ඔවුහු බන්දුලට බලකර සිටියහ. ඇත්ත වශයෙන්ම තමන් විසූ ගමේම සිට මෑතදී අතුරුදහන්වූ ඩෙන්සිල් නමැති පුද්ගලයෙකු ගැන බන්දුල දැන සිටියේය. මෙම හේතු නිසා බන්දුල අතිශයින්ම බියට පත්විය. පහරදීම නැවති පහර දෙන්නන් ස්ථානයෙන් පිටව ගියවිට බන්දුල ඔහුගේ ඇස් වසා බැඳ තිබුණු පටිය උස්සා වටපිට බැලීය. එම කාමරයේ බිත්තිවල තිබූ ලේ පැල්ලම්ද, ටයර එකක් දෙකක් හා පොළොව මත හිස් මත්පැන් බෝතල ටිකක් ඔහු දුටුවේය. ලේ පැල්ලම් දැක බන්දුල බියෙන් වෙව්ලන්නට විය. ඔහු ටික වේලාවක් මෙම නිවාසයේ සිටියේය. ඔහුගේ පිටකොන්දෙන් වේදනාව දැනුනු බැවින් ඔහුට බිම වාඩිවිය නොහැකි විය. එමනිසා ඔහු දණ බිම ගසාගෙන සිටියේය.

– එදින උදෑසන තමාට පහර දුන් පුද්ගලයින්ගෙන් එක් අයෙකු තමා රඳවා සිටින කාමරයට පැමිණ ඔහුට කථා කළේය. ඔවුන් (පහර දුන්නන්) බන්දුලට පහරදීම නිෂ්ඵල ක්‍රියාවක්වී යයි_ ඔහු කීය. බන්දුල අත්අඩංගුවට ගෙන ඇත්තේ අසත්‍ය තොරතුරක් පදනම් කරගෙනය. ඔවුන් බන්දුල නිදහස් කිරීමට යන බව කී මෙම පුද්ගලයා තමන්ට වූ දේ ගැන " ඔයි"ට නොදන්වන ලෙස ඉල්ලා සිටියේය. ඔවුන් එදින රාත්‍රී බන්දුල ගෙන ගොස් නිදහස් කිරීමට යන බවද ඔහු කියා තිබේ. එසේ කියා මෙම පුද්ගලයා පිටව ගියේය. එසේ වුවද

ටික වේලාවකට පසු ගොඩනැගිල්ලෙන් පිටත පුද්ගලයින් කතාබහේ යෙදී සිටිනු බන්දුලට ඇසිණ. " මෙම පුද්ගලයා ( මෙසේ කියන ලද්දේ තමන් ගැන යයි බන්දුල සිතයි. ) අහිංසකයි". මෙම තැනැත්තා (බන්දුල) කලින් දින පහර දෙනු ලැබූ නමුත් කිසිත් තොරතුරක් හෙළිදරව් නොකළේ යයි කියා ඔවුන් පවසා ඇත. නමුත් එය ඔවුන්ගේ " ලොක්කා" ගෙන් ලැබුණු නියෝගයක් නිසා ඔවුන්ට වෙන යමක් කළහැකි වූයේ නැතැයි ද ඔවුන් කියා තිබේ. ඔවුන් එදින රාත්‍රියේම ගෙන ගොස් රත්ගහවත්ත පාලම ළඟදී කණ ළඟට වෙඩි තබා අතේ මාංචු ගලවා දමා ඔහු ගඟට තල්ලු කර දමනවා යයි කියා කියනු බන්දුලට ඇසිණ. එම ස්ථානයේ ඇතැම් විට යුධ හමුදා නිලධාරීන් සිටින නිසා . සමහර විට ඔවුන්ට එසේ කිරීමට නොහැකි වන්නටත් ඉඩ තිබේ යයි කියූ ඔවුහු එසේ වුවහොත් ඔහු වෙනත් තැනකට ගෙන ගොස් ටයර් දමා පුළුස්සා දැමීමට සිදුවනු ඇතැයි ද ඔවුහු කීහ.

තමාට පහර දුන් පුද්ගලයා කලින් කුමක් කීවද එදින රාත්‍රී තමන් මරා දැමීමට ඔවුන් තීරණය කර තිබෙන බව මේ වන විට බන්දුලට තේරුම් ගියේය. බන්දුල සෙමින් කාමරයේ පස්සා පැත්තට ගියේය. ඔහු තම ඇස් වසා බැඳ තිබුණු පටි උස්සා වට පිට බැලීය. කිට්ටුව ජනේලයක් තිබිණි. මෙම ජනේලය තුලින් ඔහු අවට පෙදෙස දැක්කේය. බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ගොඩනඟන අවධියෙහි තමා සැහෙන කාල සීමාවක් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙහි වැඩ කොට තිබුණු හෙයින් බන්දුලට මෙම ස්ථානය හුරු පුරුදු එකක් විය. අවදානමකට මුහුණදී තමා රඳවා සිටින නිවාසයෙන් බේරී යාමට බන්දුල තීරණය කළේය. තමාගේ අත් පිටිපසට තබා මාංචු දමා තිබෙන බව බන්දුලට පෙනී ගියේය. තම අත් එසේ තිබියදී බේරී පලා යාමට දුෂ්කර වන බව ඔහු තේරුම් ගත්තේය. එමනිසා ඔහු තමාට ශරීර කෘත්‍යය සඳහා යෑමට හැකිවන ලෙසට තම අත් මාංචුවෙන් මුදාහරින ලෙස ඉල්ලා සිටියේය. ඔහු ආධාර ඉල්ලා කෑ ගැසීය. නිවාසයෙන් පිටත මුර සේවයෙහි යෙදී සිටි පුද්ගලයා මීට කැමති විය. බන්දුල වැසිකිළියට ගොස් ආපසු පැමිණ නැවතත් ඔහුගේ අත්වලට මාංචු දැමීම අපේක්ෂාවෙන් දැත් ඉදිරිපසට තබාගෙන සිටියේය. බන්දුල තම පිටුපසට තිබුණු අත් ඉදිරි පසින් තබාගෙන ඒවා කලින් තිබුණු තත්ත්වය වෙනස් කොට ගෙන සිටින බව නොදත් මුරකරුවෝ ඔහුගේ අත්වලට මාංචු දැමූහ.

මුරකරුවන් කාමරයෙන් පිටව ගිය පසු බන්දුල ජනේලයක් ළඟට ගොස් අනුක්‍රමයෙන් එය විවෘත කර පිටතට පැන්නේය. පිටි පැත්තෙන් ඔහු ජනේලය සෙමින් වැසුවේය. ඉන්පසු නිවසේ පසු පසින් තිබුණු කටුකම්බි වැටකින් රිංගා ඔහු මිදුලෙන් එපිටට ගියේය. බන්දුල ගමන් කළ ප්‍රදේශය බටලන්ද ගමයි. ඔහු ඊටපසු කිට්ටුව පිහිටි බඳුගෙවත්ත නමැති ගමකට දිව්වේය. එම ගමෙහි ඊටින් සිංකෙදෝ නමැති ඔහුගේ මාමා කෙනෙකු පදිංචිව සිටියේය. බන්දුල ඊටින් සිංකෙදෝගේ නිවසට යන විට වේලාව පස්වරු 7.30 පමණ විය. ඊටින් සහ ඔහුගේ පුතා වන විජිත එහි වූහ. තමන්ට සිදුවූයේ කුමක්ද යන්නත්, තමන් රඳවා සිටි ස්ථානයෙන් බේරී ආ සැටිත් බන්දුල ඔවුන් දෙදෙනාට කීවේය. ඔවුන්ගේ ප්‍රධාන සැලකිල්ල යොමු වූයේ බන්දුලගේ අතට දමා තිබුණු ගාංචු කැඩීමටය. විජිත කොළර දෙක සම්බන්ධ කළ දම්වැල අලවංගුවක් මත තබා මන්නා පිහියකින් ඊට ගැසීය. මෙයින් කොළර දෙක වෙන්ව ගියේය. මාංචුවේ ලෝහ වළලු දෙක අත් දෙකෙහි වෙන වෙනම තිබිණි. එසේ වුවද මෙම වළලු දෙක එකටෙක දම්වැලින් සම්බන්ධවී නොතිබුණු නිසා ඔහුට නිදහසේ අත් දෙක ඒහා මෙහා කළහැකි විය.

බන්දුල ජටින් සිංඤෝගේ නිවසෙහි තවදුරටත් සිටීමට අදහස් කළේ නැත. කුමක් නිසාද යත්, ඔහුගේ පැහැර ගෙන යැමට හා රඳවා තැබීමට සම්බන්ධ අය මේ වන විට ඔහුගේ පලා යැම ගැන දැන ගෙන සිටිය හැකි නිසා ඔහු සොයා ඔවුන් පැමිණිය හැකි යයි ඔහු බියවූ බැවිනි. විජිත ඔහුගේ පාපැදිය මත බන්දුල තබාගෙන පිටත්ව ගියේය. ඔවුන් දෙදෙනාම ගල්වල හන්දිය දෙසට ගියහ. ගල්වල හන්දිය ලඟ පියදාස නම් බන්දුලගේ තවත් මාමා කෙනෙක් ජීවත් විය. බන්දුල පියදාසගේ නිවසට ගොස් ඔහු හමුවිය. තමන්ට සිදුවූ දෙය ඔහු පියදාසට කීය. ඔහුගේ මාමා සමග තවත් අසල්වැසියෙක්ද විය. මාංචුවෙන් ඉතිරි වූ වළලු දෙක බන්දුලගේ අත්වල තිබීමම තර්ජනයක් බැවින් එම වළලු ඉවත් කොට දැමීමට ඔවුහු තීරණය කළහ. පෙරකී අසල්වැසියා තම නිවසින් දුනු කියතක් ගෙනවුත් සෙමින් එම වළලු කපා දැමීය. එක් අවස්ථාවකදී දුනු කියත් තලය බන්දුලගේ අතේ ස්පර්ශ වී ඔහුගේ අතේ සීරීමක් සිදුවිය. මෙයින් ඔහුගෙ අත සුළු වශයෙන් තුවාල විය. ඔවුන්ට එම ලෝහ වළලු ඉවත් කොට දැමිය හැකි විය. බන්දුල මාංචුවේ කැබෙලි පියදාසට දී තවත් ආරක්ෂක ස්ථානයක් සොයා පියදාසගේ නිවසින් පිටත්ව ගියේය.

බන්දුල පිටත්ව ගිය පසු පියදාස මාංචුවේ වළලු දෙක වැසිකිළි වළකට දැම්මේය. කොමිෂන් සභාව සිය පරීක්ෂණය ඇරඹූ පසු බන්දුලගේ සාක්ෂියේ සත්‍යතාව සොයා ගනු පිණිස පුළුල් ලෙස විමර්ශණය කරන ලදී. ජටින් සිංඤෝ, පියදාස හා පියදාසගේ අසල් වැසියා බන්දුලගේ සාක්ෂිය තහවුරු කරමින් සාක්ෂි දුන්හ. පියදාස විසින් සපයන ලද තොරතුරු පදනම් කර, පියදාසගේ නිවසේ මිදුල පිටුපස පිහිටි පැරණි වැසිකිළි වළක් හිස් කොට බලන ලදී. කොමිෂන් සභාවට අනුයුක්ත විමර්ශකයෝ අඩ වශයෙන් මලකඩ කා තිබුණු මාංචුවේ වළලු දෙක මෙම වැසිකිළි වළ තුළින් ආපසු සොයා ගත්හ. මාංචුවේ කොළර එකිනෙකට සම්බන්ධ කර තිබුණු දම්වැලේ කොටස් වළලුවලට සම්බන්ධව තිබිණ. මෙම වළලු X 39 ලෙසින් සලකුණු කර ඒවා සොයා ගත් දිනම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. විමර්ශන නිලධාරීන්ගේ සාක්ෂිය අනුව වැසිකිළි වළ හිස් කිරීම හා මාංචුවේ වළලු එයින් සොයාගැනීම කරන ලද්දේ ප්‍රදේශයේ ගම්මුන් විශාල සංඛ්‍යාවක් ඉදිරියේදීය. මෙම සෙනග අතරට ප්‍රදේශයේ ග්‍රාමසේවකද ඇතුළත් විය. මෙම පරීක්ෂණ සාක්ෂියෙන් බන්දුලගේ සාක්ෂිය පැහැදිලිවම තහවුරු වේ.

බන්දුල පියදාසගේ නිවසින් පිටත්ව යැමෙන් පසු පා ගමනින් ගොස් ඉන්පසුව ත්‍රීරෝද රථයකින්ද ගමන් කළේය. එසේ දිගු ගමනකින් පසු කොළඹ 07, ජාවත්ත පාරේ පිහිටි අභාවප්‍රාප්ත ඔසී අබේගුණසේකර මහතාගේ නිවසට ගියේය. ඔහු අබේගුණසේකර මහතාගේ නිවසේදී අබේගුණසේකර මහතා මුණ ගැසුණේය. බන්දුල සම්පූර්ණ සිද්ධිය පිළිබඳ විස්තර ඔහුට කීවේය. ඔහුට සිදුවූ දෙයට වගකිවයුතු එක් පුද්ගලයෙක් නම් සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් යයි පැවසීය.

බන්දුලට ඔහුගේ ගමේ තනිවම ජීවත්වීම ආරක්ෂා සහගත නැති බවට ඔහු මෙන්ම අබේගුණසේකර මහතාත් කල්පනා කළේය. සහකාර පොලිස් අධිකාරී පීරිස් සහ ඔහුගේ කණ්ඩායම බන්දුල සොයා අබේගුණසේකර මහතාගේ නිවසට පැමිණීම සැකසහිත බැවින් ටික දිනක් බන්දුලට තම නිවසේ ජීවත්වීමට අබේගුණසේකර මහතා අවසරය දුන්නේය. මේ අනුව බන්දුල අබේගුණසේකර මහතාගේ නිවසෙහි මාස 4ක් නැවතී සිටියේය. එම කාලසීමාව අවසන්වන විට පොලීසිය ඔහු සොයා එන බවට සලකුණු කිසිවක් නොතිබිණ. එමනිසා බන්දුල

අබේගුණසේකර මහතාගේ නිවසින් පිටව ගෙදර ගියේය. එසේ වුවත් ඔහු එතැන සිටීමට බියවිය. බන්දුල විදේශික රැකියාවක් සෙවූ අතර, ටික කලකට පසු ඔහුට සෞදි අරාබියාවේ රැකියාවක් ලබාගැනීමට හැකි විය. බන්දුල පිටරට ගොස් 1993 ජූලි මාසය තෙක් සෞදි අරාබියාවේ වැඩ කිරීමෙහි යෙදුණේය. " එම කාලය වන විට ඔහු ශ්‍රී ලංකාවට ආපසු පැමිණියහොත් ඔහු නැවත අත්අඩංගුවට ගැනීම අඩමාන බව ඔහුට පැහැදිලි විය. එමනිසා බන්දුල පෙරළා ශ්‍රී ලංකාවට පැමිණියේය.

1994 අගෝස්තු මාසයේදී නව රජය පිහිටීමෙන් පසු බුන්දුල ඉහත සඳහන් සිද්ධිය ගැන අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් කළේය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔහුට කරන ලද ඉල්ලීමක් අනුව ඔහු අපරාධ විමර්ෂණ නිලධාරීන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයට එක්කරගෙන ගියේය. එසේ ගොස් එම නිවාස ක්‍රමයෙහි තමා රඳවා සිටි නිවාස දෙක ඔවුන්ට පෙන්නුවේය. මෙම කොමිෂන් සභාව ක්‍රියාත්මක වීම ආරම්භ කළ අවස්ථාවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බන්දුල විසින් කරන ලද ප්‍රකාශයේ උධෘතයකුත්, එම ප්‍රකාශය අනුව ඔවුන් විසින් කරන ලද විමර්ශණ වල සටහනුත් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල විමර්ශණ සටහන් අනුව ( බන්දුල විසින් හඳුනා ගන්නා ලද නිවාස දෙක පිළිබඳ නිරීක්ෂණ සටහන්ද ඇතුළුව) ඔහු පළමුව අංක B 7 දරණ නිවසේත්, ඊට පසුව අංක B 2 දරණ නිවසේත් ඔහු රඳවා සිට ඇත. කොමිෂන් සභාව බටලන්ද නිවාස යෝජනා ක්‍රමය පරීක්ෂා කිරීමට ගිය අවස්ථාවෙහි අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීහු අදාල නිවාස දෙක කොමිෂන් සභාවට පෙන්නා දුන්නේය. මෙහි අවට පරිසරය, ඇත්ත වශයෙන්ම බන්දුල කොමිෂන් සභාව ඉදිරියේ දුන් වාචික සාක්ෂිවල සහ ඔහු අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුවට දුන් ප්‍රකාශයේ සඳහන් විස්තරවලට බෙහෙවින් සමාන බව අපි නිරීක්ෂණය කලෙමු.

## අතුරනගේ විමල් අත්තනායක.

විමල් අත්තනායක ආයුර්වේද වෛද්‍යවරයෙකි. ඔහු 1983දී ගම්පහ ආයුර්වේද විද්‍යාලයෙන් උපාධිය ලබාගත් පසු බියගම මැතිවරණ කොට්ඨාශයේ බොල්ලෑගල පෞද්ගලික වෛද්‍ය වෘත්තියක් 1984 දී ආරම්භ කළේය. ඔහුට පුළුල් හා ලාභදායක " වෛද්‍ය වෘත්තියක් ගොඩනැඟුනේය. අත්තනායක හා ඔහුගේ පවුල ඔහුගේ වෛද්‍ය සායනය අසළම ජීවත් වූහ. ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්ද වෛද්‍ය ප්‍රතිකාර සඳහා තමා වෙත පැමිණි බව අත්තනායක කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කළේය. ප්‍රතිපත්තිමය කරුණක් වශයෙන් ඔහු පොලිස් නිලධාරීන්ට ලබා දුන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ගාස්තුවක් අය කළේ නැත. මෙසේ වෛද්‍ය ප්‍රතිකාර සපයන අතර තුර අත්තනායක කැලණිය පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරී පොලිස් පරීක්ෂක සුනිල් බණ්ඩාර තිස්ශංක දැන හැඳින ගත්තේය.

1990 වර්ෂයේ දිනක පොලිස් පරීක්ෂක තිස්ශංක තම පොලිස් නිලධාරීන් කණ්ඩායමක් ද සමග අත්තනායක හමුවීමට පැමිණියේය. ඔහු තමා සමග තුවාල ලබා සිටි පුද්ගලයින් තුන් දෙනෙක් ගෙනැවිත් සිටියේය. ඔවුන්ගේ තුවාලවලට ප්‍රතිකාර කරන ලෙස පොලිස් පරීක්ෂක තිස්ශංක ඔහුගෙන් ඉල්ලා සිටියේය. ඔහු තුවාල වූ අය පරීක්ෂා කළේය. තුවාල ලබා සිටි අයගේ සිරුරු වල තැලීම් තිබිණි. සමහර තුවාල පැසවා තිබිණ. තුවාල වී සිටි අයට මාංවූ දමා තිබිණ.

ඔවුන්ට තුවාල සිදුවුයේ කෙසේදැයි අත්තනායක එම තුවාලකරුවන්ගෙන් විමසුවේය. තුවාල ලබා සිටි පුද්ගලයෝ පොලිස් පරීක්ෂක තිස්ශංක දෙස බලා පසුව නිහඬව සිටියෝය. තුවාල ලබා සිටින අය පොලිස් අත්අඩංගුවේ සිටින අය බව අත්තනායක සිතා ගත්තේය. ඔවුන්ට සිදුවී තිබෙන්නේ කුමක්දැයි ඔහු තේරුම් ගත් නමුත්, ඔවුන්ට ප්‍රතිකාර කිරීම හැර වෙන කිසිවක් ඔහුට කළ නොහැකි විනැයි ඔහු ප්‍රකාශ කලේය. එමනිසා ඔහු තුවාලකරුවන්ට ප්‍රතිකාර කලේය. ඉන්පසුව පොලිස් පරීක්ෂක තිස්ශංක ඔවුන් ගෙන ගියේය. ( සාක්ෂිකරු කියන අන්දමට තම බොල්ලැගල පිහිටි සායනය හා කැලණිය පොලිස් ස්ථානය අතර දුර ප්‍රමාණය සැතපුම් 2 ක් පමණ වේ.)

මෙම සිද්ධියෙන් තුන් දිනකට පසු, කලින් අවස්ථාවේ අත්තනායක ප්‍රතිකාර කළ පුද්ගලයින් තුන්දෙනාට තවදුරටත් ප්‍රතිකාර කළයුතුව තිබෙන බැවින් පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස ඉල්ලමින් පොලිස් පරීක්ෂක තිස්ශංක පොලිස් නිලධාරියෙකු මගින් අත්තනායකට පණිවිඩයක් යැවිය. මේ අනුව අත්තනායක තම පාපැදියෙන් කැලණිය පොලිස් ස්ථානය බලා ගියේය. පොලිස් ස්ථානයේදී අත්තනායකට පොලිස් පරීක්ෂක තිස්ශංක හමුවිය. ඔහු අත්තනායක පොලිස් ස්ථානයේ පස්සා පැත්තට එක්කර ගෙන ගියේය. මිදුලේ පසු පස කොටසෙහි, අත්තනායක විසින් පසුගිය අවස්ථාවේදී ප්‍රතිකාර කරන ලද එක් තුවාලවූ පුද්ගලයෙක් සිටියේය. ඔහු වැලි සහිත බිමෙහි වැතිර සිටියේය. අත්තනායක පුද්ගලයා පරීක්ෂා කර බැලුවේය. ඔහු බරපතල අසනීප තත්ත්වයක සිටියේය. සමහර තුවාල පැසවා තිබිණ. තුවාල ලබා සිටින පුද්ගලයාගේ තත්ත්වය ඔහු තිස්ශංකට විස්තර කර දුන්නේය. තුවාලවී සිටින පුද්ගලයාට ප්‍රතිකාර කොට කෙසේ හෝ රෝගියා තවත් එක් දිනක් හෝ ජීවත් කරවන ලෙසට තිස්ශංක අත්තනායකගෙන් ඉතා ඕනැකමින් ඉල්ලා සිටියේය. අත්තනායක තුවාලකරුවාට ප්‍රතිකාර කලේය. ඉන්පසුව ඔහු, ඔහුගේ නිවසට පැමිණියේය.

දිනකට දෙකකට පසු, පසුගිය අවස්ථාවේ පැමිණි පොලිස් නිලධාරියාම (එනම් , පොලිස් පරීක්ෂක තිස්ශංකගේ පණිවිඩය රැගෙන පැමිණි නිලධාරියාම) පැමිණ අත්තනායක හමුවිය. අත්තනායකට තවත් තුවාලකරුවන් ටිකදෙනෙකුට ප්‍රතිකාර කිරීමට තිබෙන බව පවසා එදින සැන්දෑවෙහි එම තුවාලකරුවන් සිටින ස්ථානයට යෑමට සූදානම්ව සිටින ලෙස දැනුම් දුන්නේය. එදා සැන්දෑවෙහි පොලිස් ජීප් රථය සායනය වෙත පැමිණියේය. පොලිස් පරීක්ෂක තිස්ශංක සහ තවත් පොලිස් නිලධාරීන් කිහිපදෙනෙක් ජීප් රථය ඇතුලෙහි සිටියහ. ජීප් රථයට නගින ලෙස තිස්ශංක අත්තනායකගෙන් ඉල්ලා සිටියේය. අතරමගදී ජීප් රථය "දළුගම ෆාමසිය" නම් ෆාමසියක් ළඟ නවත්වන ලදී. පොලිස් පරීක්ෂක තිස්ශංක අත්තනායකට රුපියල් 200/-ක් දී ෆාමසියට ගොස් අවශ්‍ය ඖෂධ මිලදී ගන්නා ලෙස කිය. මේ අනුව අත්තනායක ෆාමසියට ගොස් ඖෂධ ටිකක් මිලදී ගත්තේය. ඉන්පසුව ඔවුහු ජීප් රථයෙන් ගමන් ගොට අන්තිමේදී බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ ප්‍රධාන දොරටුව වෙත පැමිණියහ. තමා 1973 සිට කැලණිය ප්‍රදේශයේ ජීවත්වී ඇති බවත්, එමනිසා එම සම්පූර්ණ ප්‍රදේශය ගැනම තමන් හොඳින් දන්නා බවත් අත්තනායක විස්තර කලේය. තවද, ඔහුගේ මිතුරන් කිහිපදෙනෙකු බටලන්ද ගමෙහි ජීවත් වන නිසා ඔහු මීට කලින් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ දොරටුව දැක ඇත. පොලිස් ජීප් රථය පැමිණෙනු දුටු යුද්ධ හමුදා මුර සෙබලා මුර පොලේ _බාධකය උස්සා ජීප් රථයට ඇතුළුවීමට ඉඩ දුන්නේය. ජීප් රථය නිවාස යෝජනා ක්‍රමය තුලට ගොස් එක්තරා නිවසක් වෙත පැමිණ නැවතිණ. පොලිස් කණ්ඩායම නිවස තුලට ගියේය. නිවස තුලට පැමිණෙන ලෙස තිස්ශංක අත්තනායකට ආරාධනා කලේය. නිවසට ඇතුළුවන විට සන්නද්ධ පුද්ගලයින්

කිහිපදෙනෙකුත් නිවස මුර කරනු ඔහු දුටුවේය. නිවසට ඇතුළුවූ පසු නිස්ශංක ඔහු කාමරයකට කැඳවා ගෙන ගියේය. කාමරය තුළ විශාල යකඩ ඇඳක් තිබිණ. පුද්ගලයෝ හය දෙනෙක් හෝ අට දෙනෙක් ඇඳේ පැති විට්ටම්වලට දම්වැල් වලින් බැඳ තිබිණ. ඔවුන් සියළුදෙනාගේම වාගේ සිරුරු වල බරපතල තුවාල තිබිණ. පසුගිය අවස්ථාවේ අත්තනායක කැළණිය පොලිස් ස්ථානයේදී ප්‍රතිකාර කල පුද්ගලයාද ඔවුන් අතර විය. මෙම තුවාලකරුවන්ට ප්‍රතිකාර කරන ලෙස නිස්ශංක අත්තනායකට කීය. අත්තනායක එක් එක් පුද්ගලයා අමතමින් ඔහුට තිබෙන ප්‍රශ්න මොනවාදැයි ඇසීය. තම මුඛය පුළුස්සන ලද බැවින් එයින් වේදනාවක් ඇතිවේ යයි එක් පුද්ගලයෙක් කීය. තමාගේ පිටිකොන්ද වේදනා ගෙන දෙන්නේ යයි තවත් පුද්ගලයෙක් කීය. ඔවුන් සියළුදෙනා තදබල වේදනාවෙන් පසුවන බව අත්තනායකට පෙනී ගියේය. අත්තනායක තමා විසින් කැළණිය පොලිස් ස්ථානයේදී ප්‍රතිකාර කරන ලද තුවාල ලත් පුද්ගලයා පරීක්ෂා කර බැලීය. ඔහු බරපතල තත්ත්වයක සිටියේය. තුවාල පැසවා තිබිණ. සමහර තුවාලවල ඉහඳ තබා තිබිණි. තුවාලකරුවන්ට ප්‍රතිකාර කිරීමට අත්තනායකට අවශ්‍ය වුන නමුත්, තුවාලකරුවන්ගෙන් අතිශයින්ම අප්‍රියකර දුර්ගන්ධයක් විහිදුන බැවින් තවදුරටත් කාමරය තුළ සිටීමට ඔහුට නොහැකි විය. එහෙයින් ඔහු කාමරයෙන් පිටතට පැමිණ බරපතල ලෙස තුවාලවී සිටින අය එළියට ගෙනෙන ලෙස ඔහු නිස්ශංකට කීය. ආයුධ සන්නද්ධ මිනිස්සු තුවාලකරු (ඔහු විසින් කලින් ප්‍රතිකාර කරන ලද පුද්ගලයා ) ලෑල්ලක තබා පිටතට ගෙනාවේය. අත්තනායක තුවාල සෝදා පිරිසිදු කලේය. පැසවූ තුවාල වලින් ඉහඳ පණුවන් ඉවත් කරන ලදී. ඔහු ඊට පසු තුවාලවලට ප්‍රතිකාර කලේය. අත්තනායක තුවාලකරුවන්ට ප්‍රතිකාර කලායින් පසු නිස්ශංක ඔහු සමග එන ලෙස අත්තනායකට කීය. නිස්ශංක තවත් නිවසකට ගෙන යන ලදී. ඔහුට තම අත් සෝදා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසනු ලැබීය. ඉන්පසු ඔහුට තේ කෝප්පයකින් සංග්‍රහ කෙරිණ. තමා ගෙන යනු ලැබූ දෙවන නිවස ( මෙම නිවසද පිහිටියේ බටලන්ද නිවාස යෝජනා ක්‍රමය තුළය.) එහි වටපිටාවේ තත්ත්වය අනුව එය පොලිස් පරීක්ෂක නිස්ශංකගේ නිල නිවස බව අත්තනායක අවබෝධ කර ගත්තේය. ( රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරු විසින් සපයන ලද තොරතුරු අනුව අංක A 2/12 දරන නිවස කැළණිය පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරියාට 1989 අගෝස්තු මස 2 වන දින සිට 1996 දක්වා කාලය තුළ වෙන්කොට දී තිබුණු බව සැලකිල්ලට ගතයුතුය. විශේෂයෙන්ම 1990 සැප්තැම්බර් මාසයේ සිට 1996 දක්වා පොලිස් පරීක්ෂක නිස්ශංක මෙම නිවසේ වාසය කර ඇත) ඉන්පසුව අත්තනායක ඔහුගේ නිවසට ගෙන ගොස් බස්සන ලදී.

කොමිෂන් සභාවේ විමර්ෂණ ඒකකය එවකට කැළණිය පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරියා වූ පොලිස් පරීක්ෂක නිස්ශංකගේ ප්‍රකාශය වාර්තාගත කර ගත්තේය. තමා තුවාලකරුවන්ට ප්‍රතිකාර කිරීම සඳහා අත්තනායකගෙන් ඉල්ලා සිටියේය යන්න ඔහු ප්‍රතික්ෂේප කලේය. එසේ වුවද, තමා අත්තනායක දැන සිටි බවත්, තමා කැළණිය පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරියා වූ බවත්, අදාළ කාලසීමාව තුළදී තමා බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාසයක වාසය කල බවත් ඔහු පිළිගත්තේය. කෙසේ වුවද, මෙබඳු සාක්ෂිදීමට අත්තනායකට ඇති කිසියම් නිශ්චිත හේතුවක් දැක්වීමට පොලිස් පරීක්ෂක නිස්ශංකට නොහැකි විය. නිස්ශංක තමා වෙනුවෙන් නීතිඥයෙකු පෙනී සිටීමට සලස්වා සාක්ෂිකාර අත්තනායක පරීක්ෂා කරන ලෙස ඔහුට උපදෙස් දුන්නේ නැත. ඇත්ත වශයෙන්ම වෙනත් පොලිස් නිලධාරීන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයින් විසින් අත්තනායක පරීක්ෂා කරනු ලැබුයේ නැත. කොමිෂන් සභාවේ සැසි වාරයකදී පොලිස් පරීක්ෂක නිස්ශංක දිවුරුම් දීම මත පරීක්ෂා කිරීමට කොමිෂන් සභාව තීරණය කලේය. කෙසේ වුවද, සාක්ෂිදීමට පොලිස් පරීක්ෂක නිස්ශංක කැඳවීමට ටික

වේලාවකට ප්‍රථම ඔහු ( නිස්ශංක) තමාටම වෙඩි තබාගෙන සිය දිවි හානිකර ගෙන ඇති බව කොමිෂන් සභාවට වාර්තා කරන ලදී.

තුවාල වූ පුද්ගලයින් රඳවා සිටි නිවාසවල අනන්‍යතාව නිසැක වශයෙන්ම නිශ්චය කිරීමට අත්තනායක විසින් දී තිබෙන සාක්ෂි ප්‍රමාණවත් නැත. එසේ වුවද මෙම නිවාසය බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස වලින් එකක් බව පැහැදිලිය. මෙම නිවාසය පොලිස් නිලධාරීන්ට ආගිය හැකිව තිබුණු හා ඔවුන්ගේ පාලනය යටතේ තිබුණු නිවාසයක් බවත් පැහැදිලිය. අංක B 8, B 34 හා B 2 දරන නිවාසවල පුද්ගලයින් නීතිවිරෝධිව රඳවා සිටි බව අර්ල් සුගි පෙරේරා, වාසල ජයසේකර හා තලේරත්න මුදලිගේ බන්දුල දී තිබෙන සාක්ෂි වලින් පෙන්නුම් කෙරේ. අත්තනායක විසින් විස්තර කරන ලද නිවාසය අංක B 34 දරන නිවාසය විය නොහැකිය. කුමක් නිසාද යත් යමෙකු නිවාස යෝජනා ක්‍රමයට ඇතුළුවන විට වම් පැත්තට ඇති මාර්ගයේ එය පිහිටා තිබෙන බැවිනි. ජීප් රථය නිවාස යෝජනා ක්‍රමයට ඇතුල්වී දිගටම ඔබ්බට ධාවනය කල බව අත්තනායක කීය. එහෙයින් අදාල නිවාසය B 34 හෝ B 2 හෝ පොලිසිය පාලනය යටතේ පැවති වෙනත් නිවාසයක් හෝ විය හැකිය.

ඇත්ත වශයෙන්ම පුද්ගලයින් වෙනත් නිවාසවලත් නීති විරෝධිව රඳවා සිටි බව පෙන්නුම් කරන සාක්ෂි හා වෙනත් කරුණු සලකා බැලීමට අපි දැන් ඉදිරිපත් වෙමු.

**අජිත් ජයසිංහ.**

1989 අගෝස්තු මාසයේදී උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ ජාඇල පොලිස් ස්ථානයට අනුයුක්ත පොලිස් නිලධාරියෙකු විය. ( මෙම නිලධාරියා පිලිබඳ විස්තර මෙම වාර්තාවේ VIII වන පරිච්ඡේදයෙහි ඇතුලත් වේ.) සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ගේ ප්‍රධානත්වයෙන් වූ පොලිස් නිලධාරීන් විසින් මෙම නිලධාරියා අත්අඩංගුවට ගෙන රඳවා තැබීම පිලිබඳ සිද්ධියක් පරීක්ෂාවට භාජනය කරන ලෙස මෙම කොමිෂන් සභාවට නියම කරන ලදී. අදාල සිද්ධීන්ට සම්බන්ධ විස්තර මෙම වාර්තාවේ VIII වන පරිච්ඡේදයේ දැක්වේ.

අජිත් ජයසිංහගේ සාක්ෂිවලින් පැවසෙන අන්දමට 1989 අගෝස්තු මස යම් අවස්ථාවක ජයන්ත නමැති පුද්ගලයෙකු ජාඇල පොලිස් ස්ථානයට පැමිණ යම් පුද්ගලයෙකු වෙඩි තැබීමෙන් තමන් මැරීමට තැත් කල බවට පැමිණිලි කර ඇත. ජයන්ත, පාර්ලිමේන්තු මන්ත්‍රී හා එවකට පැවති රජයේ කැබිනට් අමාත්‍යවරයෙකු වූ ජෝෂප් මයිකල් පෙරේරා මහතාගේ කිට්ටු හිතවතකු විය. පහරදීමට පැමිණි පුද්ගලයා එම ප්‍රදේශයේම සිටින බවත්, ඔහු තමා (ජයන්ත) සමග පැමිණියහොත් තමාට සැකකරු සිටින ස්ථානය පෙන්නුම් කලහැකි බවත්, ජයන්ත, අජිත් ජයසිංහට දැන්විය. අජිත් ජයසිංහ එවකට පොලිස් ස්ථාන රාජකාරි භාර නිලධාරියා ( S.D.O.) විය. එහෙයින් ජයසිංහ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් ද රැගෙන පැමිණිලි කරු සමග සැකකරු සොයා වහාම පිටත්වී ගියේය. ඔවුන් ජ්කලට ගිය අතර, සැකකරු වූ ගාමිණී හෙට්ටිආරච්චි නමැත්තෙක් අත්අඩංගුවට ගැනීමට සමත් විය. පොලිස් නිලධාරී කණ්ඩායම සැකකරු සමග ආපසු ජාඇල පොලිස් ස්ථානයට පැමිණියහ. පොලිස් ස්ථානයේදී සැකකරු ඉදිරිපත් කරනු ලැබිණ. අදාල ස්ථාවර නියෝග අනුව සැකකරු අත්අඩංගුවට ගැනීම ගැන

එවකට පැලියගොඩ පොලිස් ස්ථානයේ සිට ක්‍රියා කල කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට වාර්තා කලේය. මෙම සිද්ධිය සම්බන්ධ විමර්ෂණ සිදුකිරීම පෙරකී කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට නියම වින. මෙසේ කරන ලද්දේ අදාළ සිද්ධිය කඩාකප්පල්කාරී ක්‍රියාවක ස්වභාවයේ එකක් ලෙසිනුත්, ගාමිණී හෙට්ටිආරච්චි කඩාකප්පල්කාරී පුද්ගලයෙකු ලෙසිනුත් සැක කරන ලද බැවිනි.

එදිනම සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් සැකකරු මුදාලන ලෙස ජාඇල පොලිසියට උපදෙස් දුන්නේය. ඒ වන විට සිද්ධිය පිළිබඳව විමර්ෂණ කිසිවක් සිදුකර තිබුයේ නැත. එසේ වුවද කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය භාර සහකාර පොලිස් අධිකාරීවරයා විසින් උපදෙස් දී තිබුණු බැවින් ගාමිණී හෙට්ටිආරච්චි පොලිස් භාරයෙන් එදින සැන්දෑවේම නිදහස් කරන ලදී. සැකකරු මුදාලීම ලියාපදිංචි කෙරිණ. ඔහුගේ පියාට පොලිස් ස්ථානයට පැමිණීමට නියම කරනු ලැබූ අතර, ඔහුට සැකකරු සඳහා (ගාමිණී) " පොලිස් ඇප" සැපයීමට සිදුවිය. ගාමිණී හෙට්ටිආරච්චි මුදාලීමට සුළු වේලාවකට ප්‍රථම, කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන් දෙදෙනෙක් (පොලිස් කොස්තාපල් රියැදුරු රංජිත් සහ පොලිස් සැරයන් ලක්ෂ්මන්) සහ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට සේවය කල තවත් පුද්ගලයෙක් ( ඔහු පොලිස් නිලධාරියෙකු නොවුවත්) එනම්, රාජේන්ද්‍ර නමින් හැඳින්වූ පුද්ගලයෙක් ජාඇල පොලිස් ස්ථානයට පැමිණියහ. මෙම පුද්ගලයින් පොලිස් ස්ථානය තුළ සිටියදී පොලිස් ස්ථානයෙන් පිටත සුදු පැහැති වෑන් රථයක් නවතා තිබෙනු හා උප පොලිස් පරීක්ෂක දෙල්ගොඩ එහි අසුන් ගෙන සිටිනු අජිත් ජයසිංහ දුටුවේය. මෙය කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය විසින් එහි කටයුතු සඳහා පාවිච්චි කරන වෑන් රථයකියි ජයසිංහ කීය. පොලිස් ස්ථානය තුළට පැමිණි පොලිස් නිලධාරීහු තමන් සැකකරු ( ගාමිණී) ජාඇල පොලිස් ස්ථානයෙන් විධිමත් ලෙස මුදාලීමෙන් පසු සොයා යන බව කීහ. සැකකරු පොලිස් ස්ථානයේ සිරකුඩුවෙහි සිටිනු ඔවුහු දැක්කෝය. ඉන්පසුව ඔවුහු පොලිස් ස්ථානයෙන් පිටව ගියහ.

සැකකරු ගාමිණී හෙට්ටිආරච්චි මුදාලනු ලැබූ විගසම, ඔහුගේ පියා පොලිස් ස්ථානයට පැමිණ ඔවුන් පාරේ යමින් සිටින විට ( පොලිස් ස්ථානයෙන් පිටව යෑමෙන් අනතුරුව ) තම පුතා නැවතත් පැහැර ගෙන යන ලද බව පැමිණිලි කලේය. සැකකරු ගාමිණී ජාඇල පොලිස් ස්ථානයෙන් මුදාලනු ලැබූ විගසම කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන් විසින් පැහැර ගෙන යන ලද බව පසුබිමේ තත්ත්වය අනුව ජයසිංහ අවබෝධ කර ගත්තේය.

ටික දිනකට පසු ජයසිංහ පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ මහතා (කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ කාර්ය භාර නිලධාරියා) හමුව කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන් විසින් රැගෙන යන ලද සැකකරුට ( සැකකරු ගාමිණී හෙට්ටිආරච්චි ගැන කරන ලද සඳහනක්) කුමක්වී දැයි විමසීය. පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ තමන් සමග තවත් ස්ථානයකට යෑමට පැමිණෙන මෙන් ජයසිංහට කීය. ඔවුන් දෙදෙනාම කලින් සඳහන් කල වෑන් රථයෙන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයට ගියේය. බටලන්ද නිවාස ක්‍රමයේදී වික්‍රමසිංහ ඔහු නිවාසයකට කැඳවා ගෙන ගියේය. මෙම නිවාසය ( පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ අජිත් ජයසිංහ ගෙන ගිය නිවාසය) පසුව ජයසිංහ විසින් අංක A1/8 දරන නිවාසය ලෙසින් හඳුනා ගන්නා ලදී. මෙම හඳුනාගැනීම සිදුවූයේ කොමිෂන් සභාව බටලන්ද නිවාස යෝජනා ක්‍රමය පරීක්ෂා කිරීමට ගිය ගමනේදීය. අජිත් ජයසිංහ නිවසට ඇතුළුවූ අවස්ථාවෙහි පුද්ගලයින් තුන්දෙනෙකු ඔවුන්ගේ පා වලින් උඩ එල්ලා සිටිනු දුටුවේය. මවුන්ගෙන් එක් අයෙක් වූයේ

ගාමිණී හෙට්ටිආරච්චිය. මෙම සැකකරු වැදගත් සැකකරුවෙකු බව වික්‍රමසිංහ කී අතර, සැකකරු විසින් සපයන ලද තොරතුරු පදනම් කරගෙන ඔහු (වික්‍රමසිංහ) විසින් තුවක්කුවක් හා බෝම්බයක් සොයා ගෙන තිබෙන බව කීය. මෙම හේතු නිසා සැකකරු ඇත්ත වශයෙන්ම ජනතා විමුක්ති පෙරමුණු පාක්ෂිකයෙකැයි ජයසිංහ සිතා ගත්තේය. ඉන්පසුව ජයසිංහ නිවාසයෙන් පිටව ගියේය. දින කිහිපයකින් පසු ජයසිංහ නැවතත් වික්‍රමසිංහ මුණ ගැසුණේය. සැකකරුට කුමක් වී දැයි ජයසිංහ ඔහුගෙන් විමසුවේය. (ඔහුට වැඩේ දුන්නා යයි වික්‍රමසිංහ පිළිතුරු දුන්නේය. )

**තිස්ස පලිපාන.**

1989 ජනවාරි මස 31 වන දින වන විට තිස්ස පලිපාන කැළණිය, බොල්ලැගල, මානෙල්වත්ත විහාරයේ බෞද්ධ භික්ෂුවක් විය. විහාරයේ විහාරාධිපතීන් වහන්සේ වූයේ ඔහුගේ මාමා කෙනෙකු වූ කාන්කුලමේ ධර්මකීර්ති නම් භික්ෂූන් වහන්සේ නමකි. 1989 ජනවාරි මස 31 වන දින තිස්ස පලිපාන විහාරය ලඟ සිටියදී ආයුධ සන්නද්ධව සිවිල් ඇඳුමෙන් සැරසුනු පුද්ගලයින් කිහිපදෙනෙක් වෑන් රථයකින් ඔහු වෙත පැමිණ බලයෙන් ඔහු පැහැර ගෙන ගියහ. ඔහු ගෙන යනු ලැබුයේ සැතපුම් 4ක් පමණ එපිටින් පිහිටි බටලන්ද නිවාස යෝජනා ක්‍රමයටය. තමා බටලන්ද නිවාස යෝජනා ක්‍රමයට ගෙන යන බව අවබෝධ කර ගැනීමට ඔහුට හැකිවිය. මක්නිසාද යත්, ඔහු කලින් බටලන්ද ගමේ ගෙවල්වලට ගොස් තිබෙන බැවිනි. මෙම නිවාස ක්‍රමයේ පිහිටි එක් නිවාසයක ඔහු දින කීපයක් රඳවා තබනු ලැබ සිටියේය. මෙම කාලසීමාව තුළදී ජනතා විමුක්ති පෙරමුණු ක්‍රියාවලට සම්බන්ධ විය යන චෝදනාව මත ඔහුගෙන් ප්‍රශ්න කරන ලදි. ප්‍රශ්න කරන අතර තුර ඔහුට පහර දෙනු ලැබිණ. නිවාසයේ රඳවා සිටින කාලයේ ඔහුගේ සිවුරු ගලවා ඔහු නිර්වස්ත්‍රව තබන ලදි. ඔහුට පයින් පහර දෙන ලදැයි හා පුළුස්සන ලදැයි ඔහු කීය.

පහර දුන් එක් අයෙක් කාන්තාවක් වූයේ යයි තිස්ස පලිපාන කීවේය. ඇය ගැන අනිකුත් පහර දුන්නන් සඳහන් කලේ "මැඩම්" යනුවෙනි. කැළණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන් සාක්ෂිදීම සඳහා කොමිෂන් සභාව ඉදිරියට කැඳවන ලද දිනක පලිපාන විසින් මෙම නිලධාරිනිය හඳුනා ගන්නා ලදී. හඳුනා ගන්නා ලද පොලිස් නිලධාරිනිය වූයේ කාන්තා උප පොලිස් පරීක්ෂක පද්මිණී ප්‍රේමලතා ය. තමා බටලන්ද නිවාස යෝජනා ක්‍රමයට ගෙන යන ලද බව තමාට ඒත්තු ගිය නමුත් තමා නියම වශයෙන්ම රඳවා සිටි නිවාසය තමාට හඳුනාගත නොහැකි බව ඔහු ප්‍රකාශ කලේය.

මේ අතර තුර විහාරාධිපතීන් වහන්සේ පලිපානට කුමක් වූයේද යන්න ගැන විමසීම් කර ඇත. ඔහු (පලිපාන) පොලීසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදැයි තමාට දැනගන්නට ලැබුණු පසු විහාරාධිපතීන් වහන්සේ රජයේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකුට පැමිණිලි කලේය. ඉන් නොබෝ කලකින් පලිපාන රඳවා තැබීමෙන් නිදහස් කරන ලදී. තදබල පිළිකුල හා කලකිරීම නිසා පලිපාන සිවුරු හැරීමට තීරණය කලේය. ඉන් ටික කලකට පසු සිවුරු හැර විහාරස්ථානයෙන් පිටව ගියේය.

## පීඩාවට ගොදුරු වූ තවත් බොහෝ අය.

පැහැර ගෙන යනු ලැබූ කැලණිය පොලිස් කොට්ඨාසය තුල ජීවත් වූ තවත් බොහෝ අය පිළිබඳ සාක්ෂි හා වෙනත් කරුණු කොමිෂන් සභාව විසින් සලකා බලන ලදි. මොවුන්ගෙන් බොහෝ දෙනෙක් කැලණිය පොලිස් කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන් විසින් මෙම කොමිෂන් සභාවට අදාල කාලසීමාව තුළදී (1988 ජනවාරි මස 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වන දින දක්වා) පැහැර ගෙන යන ලද්දෝ වූහ. පීඩාවට පත්වූවන්ගෙන් බොහෝ දෙනා පැහැර ගෙන යනු ලැබීමෙන් පසු අතුරුදහන්වූ අතර, ටික දෙනෙක් ජීවතුන් අතර වූහ. ජීවතුන් අතර සිටි ඇතැමෙක් කැඳවා ගතහැකි විය. ඔවුහු ස්වේච්ඡාවෙන්ම සාක්ෂි දුන්හ. සමහර අයට තමන් පැහැර ගෙන යනු ලැබීමට වගකිවයුතු අය ස්ථිරවම හඳුනා ගත හැකි විය. බොහෝ සිද්ධි සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් ප්‍රමුඛ තැනක් ගත්තේය. පීඩාවට පත්වූ බොහෝ දෙනෙක් පැහැර ගෙන යනු ලැබ ඔවුන් නොදන්නා තැන්වලට ගෙන යනු ලැබූහ. එසේ ගෙන ගොස් එම ස්ථානයන්හි වැරදි සහගත ලෙස සිරකර තබනු ලැබූහ. මෙම කාලසීමාව තුළදී ඔවුන්ට අමානුෂික ලෙස වද දෙන ලදි. ඔවුන් පැහැර ගෙන යන ලද පිළිවෙල, රඳවා තබන ලද පිළිවෙල හා වධයට භාජනය කරනු ලැබූ පිළිවෙල ඉහතින් සාකච්ඡා කරන ලද පිළිවෙලවල් වලට සමානය. එසේ වුවද ඔවුන් රඳවා සිටි හා වධයට ලක් කළ නිවාසවල අනන්‍යතාවය සම්බන්ධයෙන් තීරණයකට බැසීමට තරම් ප්‍රමාණවත් වන සාක්ෂි අපට ලැබුණේ නැත. එහෙයින් එම සාක්ෂි ගැන විස්තරාත්මකව අප විසින් සඳහන් කරනු නොලැබේ.

## එම ක්‍රියාවලියට වගකිවයුතු වූවෝ.

පොලිස් නිලධාරීන් බටලන්ද නිවාස සංකීර්ණයේ ජීවත්වීමට පැමිණියේ කුමණ තත්ත්වයන් යටතේද යන්න අපි ඉහතින් සඳහන් කලෙමු. පොලිස් නිලධාරීන්ට වෙන් කොට දෙන ලද නිවාස ඔවුන්ට පාවිච්චි කිරීමට ඉඩ ලැබුණු පිළිවෙල හා ඒවා ඔවුන්ගේ පාලනයට නතුවූ පිළිවෙලද එම ක්‍රියාවලියේදී අපි සාකච්ඡා කලෙමු. අදාල නිවාසවල වාසය කිරීමට කැලණිය පොලිස් කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන්ට අවස්ථාවක් දෙන ලද බවත්, නිවාස ලබාගත් කාර්ය පරිපාටිය මෙතෙක් පොලිස් දෙපාර්තමේන්තුවට දැනගන්නට නැති බවත් කොමිෂන් සභාව ඉදිරියට පත්වූ සාක්ෂිවලින් සෘජුවම පෙන්නුම් කරයි. අදාල පොලිස් නිලධාරීන්ට නිවාස වෙන්කර දීමේ හා මුදාලීමේ නිසි කාර්ය පරිපාටියක් අනුගමනය නොකරන ලද බවද හෙළිවිය. රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරු විසින් අදාල පොලිස් නිලධාරීන්ට නිවාස මුදාලන ලද්දේ එවකට කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාව සිටි රනිල් වික්‍රමසිංහ මහතාගේ නියම කිරීම් අනුව බව පැහැදිලිය. කෙසේ වුවද කලින් සඳහන් කරන ලද පරිදි පොලිස් නිලධාරීන්ට නිවාස මුදාලීම සම්බන්ධයෙන් උපදෙස් දීමට පටන් ගත්තේ ඔහු රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව භාර අමාත්‍යවරයා ලෙස පත්කරනු ලැබීමටත් පෙර සිටය. පොලිස් නිලධාරීන්ගේ පාවිච්චිය සඳහා අවශ්‍ය වන නිවාස සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් මුදාහැර තිබෙන බවත්, ඇතැම් අවස්ථාවල නිවාස වෙන්කොට දී ඇති පොලිස් නිලධාරීන් අදාල නිවාස වල වාසය නොකල බවත්, කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ වූ සාක්ෂි වලින් හෙළිවේ. තවද, එම නිවාස සම්බන්ධයෙන් අධීක්ෂණයක් නොපැවති අතර, ඒවා යම් නීති විරෝධී ක්‍රියා සඳහා පාවිච්චි

කරනු නොලැබීම කිසිවෙකු විසිනුත් සහතික කරනු නොලැබිණ. මීට අමතරව ඇතැම් අවස්ථාවල තමන්ට මුදාහැර නොමැති නිවාසවලට පොලිස් නිලධාරීන්ට ප්‍රවේශය තිබුණු බවත් හෙළිවිය. ප්‍රධාන වශයෙන්ම කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ පොලිස් නිලධාරීන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ප්‍රයෝජනයට ගනු ලැබුයේ මෙබඳු වාතාවරණයක් යටතේය.

පුද්ගලයින් පැහැර ගෙන ගොස් ඉන්පසුව මෙම නිවාස සමහරක නීති විරෝධීව රඳවා තැබූ බවට ඔප්පුවී ඇති අවස්ථා සමහරක් අප ඉහතින් විස්තර කර ඇත. ඔප්පුවී ඇති අවස්ථා බොහොමයකදී අයුතු ලෙස රඳවා සිරකර ගෙන සිටි කාලසීමාවේදී පීඩාවට පත්වූවන්ට වධදී ඇත. අදාල නිවාස නීති විරෝධී රඳවා ගැනීමේ ස්ථාන හා වධකාගාර පවත්වා ගෙන යාම සඳහා පාවිච්චි කරන ලද බව පෙන්නුම් කරන සියළුම සාක්ෂි මෙම වාර්තාවේ විස්තර කොට දක්වා නැත. අදාල සාක්ෂි පරීක්ෂණ කටයුතු වාර්තාවල ඇතුලත් වේ. එම කටයුතු වාර්තා මෙම වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් වේ.

අදාල පුද්ගලයින් පැහැරගෙන යෑම්, අයුක්ති සහගත ලෙස රඳවා ගෙන තැබීම් සහ වධයට පාත්‍ර කිරීම් සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් විසින් වරදට පටලවන ලද පුද්ගලයින්ගේ ස්ථාවරය දැනගනු පිණිස කොමිෂන් සභාව විසින් අදාල පොලිස් නිලධාරීහු සාක්ෂිකරුවන් ලෙසින් කැඳවනු ලැබුහ. මේ සම්බන්ධයෙන් නිරන්තරව කැපී පෙනෙන තත්ත්වයට පත්වූ පොලිස් නිලධාරියා, එනම්, ඩග්ලස් පීරිස් මහතා එසේ කැඳවීමට නොහැකි විය. කුමක් නිසාද යත්, ඔහු කැඳවනු ලැබීමට අවශ්‍ය වූ කාලය වන විට ඔහු හොර රහසේම ශ්‍රී ලංකාවෙන් පිටව ගොස් සිටි බැවිනි. එසේ වුවද, අදාල කාලසීමාවේදී කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ ක්‍රියාවලට සම්බන්ධව සිටි අනිකුත් නිලධාරීහුන් කැඳවනු ලැබුහ. ඔවුන් සියළුදෙනාම කිසිත් නීති විරෝධී ක්‍රියාවකට සම්බන්ධවී සිටි බවට කෙරෙන චෝදනාව ප්‍රතික්ෂේප කළහ. එම ප්‍රතික්ෂේපය බලාපොරොත්තුවන ලද්දකි. ඉහතින් සඳහන් කර ඇති සියළුම සාක්ෂිකරුවන්ට සහ නීති විරෝධී රුඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවීම හා පැවැත්වීම සනාථ කරමින් සාක්ෂි දුන් අනිකුත් සියළුදෙනාට බොරු සාක්ෂිදීමට අවශ්‍ය වූ කිසියම් විශේෂිත හේතුවක් දක්වා සිටීමට කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ කිසිදු නිලධාරියෙකුට හැකිවූයේ නැත. කෙසේ වුවද රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව විසින් කොමිෂන් සභාවට සපයන ලද කරුණු අනුව බටලන්ද නිවාස ක්‍රමයේ වාසය කරන ලදැයි අදහස් කරන ලද සියළුදෙනාම එහි වාසය කළ බව පිළිගත්හ. ඔවුන් ගත් ස්ථාවරය නම් අදාල නිවාසවල පදිංචිව සිටින ලෙසට සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් හෝ එවකට කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ කාර්ය භාර නිලධාරියාව සිටි ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ විසින් ඔවුන්ට නියම කරන ලද බවයි. ඔවුන්ට නිවාස ලබාදීමට සහකාර පොලිස් අධිකාරී පීරිස් පුරෝගාමී වූ බව ඔවුන් සියළුදෙනාම දැන සිටියහ. මෙම ස්ථානයට ගොස් එක් නිවසක පාවිච්චිය භාර ගන්නා ලෙස සහකාර පොලිස් අධිකාරී පීරිස් ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහට නියම කර ඇත. නීති විරෝධීව පුද්ගලයින් රඳවා ගැනීමේ හා ඔවුන්ට වධදීමේ ස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ කොමිෂන් සභාවේ තීරණ IX වන පරිච්ජේදයේ සඳහන් කෙරෙනු ඇත.

### නීති විරෝධී වැඩ පිළිවෙලට සම්බන්ධ වෙනත් අය:

නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවීම හා පැවැත්වීම සම්බන්ධ ක්‍රියාවලට සම්බන්ධ කිහිප වර්ගයකට අයත් පුද්ගලයින් සිටිය හැකිය. පළමුවන වර්ගය නම් ඉහත සඳහන් ස්ථාන පිහිටුවීම සඳහා සෘජුවම වගකිවයුතු අයය. දෙවන වර්ගය වන්නේ එම නීති විරෝධී ක්‍රියා ගැන දැන සිටි අයය. දැන සිටි අය අතර, අනු වර්ග දෙකට වැටෙන පුද්ගලයෝ සිටිති. පළමුව ඒ ගැන දැන සිටිය නමුත් ඔවුන් කිසියම් අධිකාරී බලයක් නොමෙහෙයවූ පුද්ගලයින් බැවින් ඒ ගැන කිසිත් ප්‍රතිකර්මයක් යෙදිය හැකි තත්ත්වයේ නොසිටි අයයි. පීඩාවට පත්වූවන්ව සිට තවමත් ජීවතුන් අතර සිටින අය මෙම අනු වර්ගයට වැටේ. දෙවන අනු වර්ගය නම් කෙළින්ම බලධරයන්ව සිටි නමුත් අදාළ නීති විරෝධී ක්‍රියා ගැන දැනුවත්වීමෙන් පසුවද ඒවා ඉවසා සිටීමෙන් එම නීති විරෝධී ක්‍රියාවන් තවදුරටත් සිදුවීමට ඉඩ දුන් පුද්ගලයෝය. මෙම තත්ත්වය අනුව මෙම වර්ගයේ අය නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර දිගින් දිගටම පවත්වා ගෙන යනු ලැබීම ගැන අනියමින් වගකිවයුතු වන්නෝය. සදෝෂත්වය හා සදෝෂත්වයේ ප්‍රමාණය ගැන සඳහන් කරතොත් සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්, ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ සහ කැළණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ වෙනත් යටත් නිලධාරීන් යන අය වරදට සහායවීම ගැන කිසිත් සැකයක් නැත. නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පැවැත්වීම සම්බන්ධයෙන් ඔවුන් සෘජුවම වගකිවයුතුය. සාක්ෂිකරුවන් පෙළකින්ම සෘජු සාක්ෂි ලැබේ. මෙයින් ඇතැමෙක් ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවන්ට ගොදුරු වූවෝය. එසේ වුවද වෙනත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ හා රනිල් වික්‍රමසිංහ මහතාගේ තත්ත්වය තරමක් වෙනස්වන අතර, එය ප්‍රවේශමෙන් පරීක්ෂා කළයුතු වේ.

මේ සම්බන්ධයෙන් සිදුකිරීමට අපේක්ෂා කරන ලද්දේ ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවලට මෙම පුද්ගලයන් සම්බන්ධ වන ප්‍රමාණය පරීක්ෂා කිරීමය.

### වින්සන්ට් ප්‍රනාන්දු

මේ සම්බන්ධයෙන් සාක්ෂිකරු රෙජිනෝල්ඩ් සිල්වෙස්ටර් වින්සන්ට් ප්‍රනාන්දු දුන් සාක්ෂි ලුහුඬින් විස්තර කොට නොදක්වතොත් අපගේ රාජකාරිය හරිහැටි ඉටුකළා වන්නේ නැත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂි රහසේ වාර්තා කොට ගන්නා ලදී. කොමිෂන් සභාවට ආධාර කළ නීතිඥවරු හැරුණු විට කොමිෂන් සභාවට ආධාර කළ නිලධාරීහු හා සාක්ෂිකරු රංජිත් වික්‍රමසිංහ නියෝජනය කළ නීතිඥවරයාද එම අවස්ථාවේ සිටියහ. කොමිෂන් සභාවට වෙත්කොට දෙන ලද පොලිස් විමර්ශකයින්ට මෙම සාක්ෂිකරු විසින් කරන ලද ප්‍රකාශය කෙරෙහි සැලකිල්ල දැක්වීමෙන් පසු මෙම සාක්ෂිකරුගේ සාක්ෂි රහසේ ලබාගැනීමට තීරණය කරන ලදී. ඉහත සඳහන් ප්‍රකාශයේ අන්තර්ගත කරුණු අනුව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය පාර්ලිමේන්තුවේ වර්තමාන විපක්ෂ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී රනිල් වික්‍රමසිංහ මහතාගේ නෛතික අයිතිවාසිකම්වලට හා දේශපාලන තත්ත්වයට බලපාන බව පෙනෙන්නට තිබිණ. යම් යම් සංවේදී කරුණුද ප්‍රකාශයට ඇතුළත්ව තිබිණ. තවද, ප්‍රකාශයේ අන්තර්ගත කරුණු ගැන කොමිෂන් සභාව දැන සිටියද සාක්ෂිකරු එම කරුණුම කොමිෂන් සභාවට ප්‍රකාශ කරනු ඇත්ද

නොඑසේ නම් ඔහු මෙම ප්‍රකාශයේ දක්වා තිබෙන කරුණුවලට අමතරව තවත් කරුණුද සනාථ කරමින් සාක්ෂි දෙනු ඇත්ද යන්න එතරම් පැහැදිලි නැතිවිය. මෙම හේතුවලට අමතරව, සාක්ෂිකරු සිය ප්‍රකාශයේ සඳහන් කාරණාවලට පුළුල් ප්‍රසිද්ධියක්දීම සිදුවන්නට සැලැස්වීමට ප්‍රථම ඒවා සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශණයන් කිරීමට සැලැස්වීම අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකන ලදි. ඒ අනුව මෙම සාක්ෂිකරුගේ සාක්ෂි රහස්‍ය ලෙස සලකා බැලීමට තීරණය කරන ලදී. . මෙම තීරණය ගන්නා ලද්දේ වික්‍රමසිංහ මහතාගේ උපරිම යහපත සඳහාය. එසේ වුවද, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ ලුහුඩු විස්තරයක් මහජනතාවගේ දැනුම සඳහා නිකුත් කිරීම දැන් කොමිෂන් සභාවේ යුතුකමක්ව පවතී. මෙහි සඳහන් වන්නේ කොමිෂන් සභාවේ අධිකාර පත්‍රයේ නිර්ණේය විෂයයන්ට අන්තර්ගත වන සාක්ෂි පමණකි. මෙම සාක්ෂි මෙම වාර්තාවේ පිටපත් කර දක්වා තිබෙන්නේ මෙම සාක්ෂි බලපාන අයට ඔහුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාව සලසාදීමෙන් පසුවය. රනිල් වික්‍රමසිංහ මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු හා යම් යම් පොලිස් නිලධාරීන් නියෝජනය කළ නීතිඥවරු මෙම සාක්ෂිකරුගේ සාක්ෂිවල සහතික කළ පිටපත් ලබාගත්හ. කොමිෂන් සභාව සිය රැස්වීම් පැවැත්වීම නිම කිරීමට ටික කලකට පෙර සාක්ෂිකරු මියගියද, සාක්ෂිකරු සාක්ෂිදීමෙන් වර්ෂයකට වැඩි කාලයක් ගතවන තුරුම ඔහු නීතිඥවරුන් විසින් හරස් ප්‍රශ්න ඇසීම සඳහා කැඳවා ගතහැකිව තිබිණ. එසේ වුවද, ඉහත සඳහන් කාරණය සඳහා සාක්ෂිකරු කැඳවීමට නීතිඥවරුන් විසින් අයදුම්පතක් ඉදිරිපත් නොකරන ලදී. විශේෂයෙන්ම මෙම සාක්කිකරු වික්‍රමසිංහ මහතාට විරුද්ධව, එම මහතා බරපතල වරදට පටලවන සාක්ෂි දී තිබුණද රනිල් වික්‍රමසිංහ මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු සාක්ෂිකරු පරීක්ෂාවට භාජනය කිරීමට තීරණය නොකළේ මන්ද යන්න කොමිෂන් සභාවට විමතියකි. රනිල් වික්‍රමසිංහ මහතාට සිතාසි කිරීමට ටික දිනකට කලින් මෙම සාක්ෂිකරු මියගොස් ඇති බව කොමිෂන් සභාවට වාර්තා කරන ලදී. මරණය සිදුවන විට ඔහුගේ වයස අවුරුදු 36ක් විය. ඔහු නියම වශයෙන්ම කුමණ තත්ත්වයන් යටතේ මරණයට පත්වූයේද යන්න කොමිෂන් සභාව විසින් විමර්ශණයට භාජනය නොකරන ලදී. කුමක් නිසාද යත් ඊට අවශ්‍ය බලය කොමිෂන් සභාවට නොතිබුණු බැවිනි. කොමිෂන් සභාව සිය තීරණවලට බැසීමේදී වෙනත් විශ්වාස කටයුතු සාක්ෂිවලින් තහවුරු නොවන හෝ අදාළ සාක්ෂිකරුවන් විසින් පිළිනොගන්නා ලද මෙම සාක්ෂිකරුගේ සාක්ෂි සැලකිල්ලට නොගන්නා ලදී. එසේ වුවද, ඔහුගේ සාක්ෂිවලින් වැඩිහරියක්ම වෙනත් අදාළ සාක්ෂිකරුවන් විසින් පිළිගෙන ඇති ඒවා බවත්, විශ්වසනීය කරුණු වලින් සම්පූර්ණයෙන්ම තහවුරු වන ඒවා බවත් සැලකිල්ලට ගැනීම උචිතය. කොමිෂන් සභාව සිය තීරණවලට බැසීමේදී එබඳු සාක්ෂි ප්‍රයෝජනයට ගෙන ඇත.

කොමිෂන් සභාව ඉදිරියේදී සාක්ෂි දෙන විට වින්සන්ට් ප්‍රනාන්දුගේ වයස අවුරුදු 35ක් විය. 1980 දී ජාතික තරුණ සේවා සභාව විසින් ඔහු ත්‍රිකුණාමලයේ නිලාවේලිහි පිහිටි සභාවේ සංචාරක බංගලාවක භාරකරුවෙකු ලෙසින් එම සභාව විසින් රැකියාවේ යොදවා සිටියේය. වින්සන්ට් 1980 සිට 1982 මාර්තු මාසය දක්වා එම සංචාරක බංගලාවේ භාරකරු ලෙසින් ක්‍රියා කළේය. එම කාලසීමාවේදී, තරුණ කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යවරයා වූ රනිල් වික්‍රමසිංහ මහතා ( ජාතික තරුණ සේවා සභාව අයත් වූයේ ඔහුගේ විෂය පථයටය.) මෙම සංචාරක බංගලාවට කිහිපවතාවක්ම ගොස් එහි රාත්‍රිය ගත කළේය. සාක්ෂිකරු වික්‍රමසිංහ මහතා හොඳින් දැන-හැඳින ගත්තේය. මෙම එක් ගමනකදී වික්‍රමසිංහ මහතා බටලන්ද නිවාස ක්‍රමයේ පිහිටි ඔහුගේ සංචාරක බංගලාවේ භාරකාරකම පිළිගැනීමට වින්සන්ට්ට ආරාධනා කළේය. ඇත්ත වශයෙන්ම වික්‍රමසිංහ මහතා, තමාට තම මැතිවරණ කොට්ඨාසය වූ බියගම නිවසක් තිබෙන බව කියා ඔහුට (වින්සන්ට්ට ) එහි පැමිණෙන ලෙස කියා ඇත. වින්සන්ට් මෙම

යෝජනාවට එකඟ විය. මෙම ආරාධනාව ලැබීමෙන් සතියක් තුළ නව තනතුරට ඔහු පත්කරමින් එවූ විධිමත් පත්වීමේ ලිපියක් ජාතික තරුණ සේවා සභාවෙන් වින්සන්ට්ට ලැබිණ. 1982 අප්‍රේල් මස 01 දින සිට වින්සන්ට් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ වූ වික්‍රමසිංහ මහතාගේ සංචාරක බංගලාවේ භාරකාර තනතුර භාර ගත්තේය. අංක A2 /2 දරන නිවස වික්‍රමසිංහ මහතාගේ සංචාරක බංගලාව වූ නිවාසය විය. පළමුව 1982 අප්‍රේල් මාසයේ සිට 1985 දක්වා වින්සන්ට් මෙම නිවසේ භාරකරු ලෙස ක්‍රියා කළේය. එම කාලසීමාවට පසු ඔහු නැවතත් නිලාවේලි වලට ස්ථාන මාරුවක් ලබාගත්තේය. ඊට හේතුව ඔහු එම ප්‍රදේශයේ කෙනෙකුවීම හා ඔහුගේ දෙමාපියන් අසනීපව සිටින බැවින් ඔවුන් රැකබලා ගතයුතුව තිබීමය.

1987 ජනවාරි මස 01 වන දින වින්සන්ට් නැවතත් බටලන්ද සංචාරක බංගලාවට පත්කරනු ලැබිණ. එම වතාවෙහි ඔහු බටලන්ද සංචාරක බංගලාවෙහි 1994 ජනවාරි මස 31 වන දින දක්වාම වැඩ කළේය.

මෙහි ඉහතින් සඳහන් දෙවන කාලසීමාවේදී අංක A 2/2 දරන නිවසට නියම කර සිටි එකම භාරකරු වින්සන්ට් පමණක් විය. 1983 මාර්තු මස 02 වන දින සිට 1989 අප්‍රේල් මස 30 වන දින දක්වා A2/2 දරන නිවාසය යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශයට රනිල් වික්‍රමසිංහ මහතාගේ සංචාරක බංගලාව ලෙසින් පවරා තිබුණු බව රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව විසින් පවත්වන ලද නිල වාර්තාවලින්ද පෙන්නුම් කෙරේ. ඉන් පසුව 1989 අප්‍රේල් මාසයේ සිට 1994 අගෝස්තු මාසය දක්වා එම නිවාසයම කර්මාන්ත අමාත්‍යාංශයට රනිල් වික්‍රමසිංහ මහතාගේ නිල නිවාසය ලෙසින් පවරන ලදී. වින්සන්ට් ප්‍රනාන්දු මෙම නිවාසයේ (A2/2) භාරකරු ලෙස වැඩ කළ බව රනිල් වික්‍රමසිංහ මහතා සාක්ෂි දෙමින් පිළිගත්තේය. මෙම නිවසේ භාරකරු ලෙසට ඔහුට නිවාසය සොයා බලා ගැනීමට සිදුවූ අතර, වික්‍රමසිංහ මහතා සඳහා ආහාර පිසීමටද නියම කරන ලදී. 1988 සිට 1990 දක්වා වූ කාලය තුළ වික්‍රමසිංහ මහතා නිතර දෙවේලේ සංචාරක බංගලාවට පැමිණි අතර, එම බොහෝ අවස්ථාවල රාත්‍රිය එහි ගත කළේය. මෙය බොහෝ සෙයින්ම සති අන්තවල සිදුවිය. කාලය ගතවෙත්ම වින්සන්ට්, වික්‍රමසිංහ මහතාගේ විශ්වාසවන්ත සේවකයෙකු වූ බව පැහැදිළිය.

කඩාකප්පල්කාරී ක්‍රියා සිදුවූ කාලසීමාව වින්සන්ට් මතකයට නගාගෙන කථා කළේය. මෙම කාලසීමාව තුළ පොලිස් නිලධාරීන් කිහිපදෙනෙකු වික්‍රමසිංහ මහතා හමුවීමට නිවසට පැමිණ කඩාකප්පල්කාරී ක්‍රියා පිළිබඳ කාරණා ගැන සාකච්ඡා කිරීම සිරිතක්ව තිබුණු බව ඔහු කීය. මෙහි පැමිණි පොලිස් නිලධාරීන් අතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ, සහකාර පොලිස් අධිකාරී පිරිස් යන අය වූහ. ඔවුහු සංචාරක බංගලාවේ රැස්වීම් පැවැත්වූහ. මෙම රැස්වීම්වලට වික්‍රමසිංහ මහතා පැමිණියේය. සහභාගිවන අයට තේ වලින් සංග්‍රහ කිරීමට වින්සන්ට්ට නියම විය. එබඳු අවස්ථාවලදී ඇතැම් සාකච්ඡාවලට සවන් දීමට ඔහුට අවස්ථාව ලැබිණ. ජනතා විමුක්ති පෙරමුණ විසින් දියත් කොට තිබුණු ශිෂණය ගැන රැස්වීම්වලට සහභාගිවූවන් සාකච්ඡා කරනු ඔහුට ඇසිණ.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාසවල රඳවා සිටින පුද්ගලයන් ගැනද සාකච්ඡා සිදුවිය. එම අවස්ථාවල කඩාකප්පල්කාරී සැකකරුවන් ගැන සඳහන් කරමින් වික්‍රමසිංහ මහතා පොලිස් නිලධාරීන් අමතමින් " ඔවුන් ඉවත් කර දමන්න" ( "get them out") යනුවෙන් කියනු

ඔහුට ඇසිණ. පැවති තත්ත්වය යටතේ තාමාට වැටහුනේ වික්‍රමසිංහ මහතාට අවශ්‍ය වූයේ සැකකරුවන් විනාශ කර දැමීම යයි වින්සන්ට් සඳහන් කලේය.

නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිව සිටි පොලිස් නිලධාරීන් බොහොමයක් දෙනෙකුත්, සංචාරක බංගලාව මුර කල අයත් වින්සන්ට් දැන සිටියේය. ඔහු ඔවුන් හා කථා බහ කිරීම සිදුවිය. ඔවුන්ගේ අනන්‍යතාවය ඔහු දැන සිටියේය. සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් යටතේ වැඩ කල පොලිස් නිලධාරීන් හා රනිල් වික්‍රමසිංහ මහතාට ආරක්ෂාව සැලසූ පොලිස් නිලධාරීන් අතර පැවති සාකච්ඡාවලට තමන්ට සවන්දීමට අවස්ථාව ලැබුණු බව වින්සන්ට් කීය. සැකකරුවන් පිළිබඳ විස්තර ඔහුට අසන්නට ලැබිණ. ඔවුන්ගෙන් සමහර දෙනෙකු මරණයට පත්කරන ලද බවත් එම විස්තර අතර විය. නිවාසවල රඳවා තැබීම සඳහා සැකකරුවන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයට ගෙනෙනු තමන් දුටුවේ යයි වින්සන්ට් කියා සිටියේය. එසේ පුද්ගලයින් රඳවා සිටි නිවාස සමහරක් නම් අංක B8, B4 හා B1 යන නිවාසය. එක්තරා අවස්ථාවක අක B8 දරන නිවාසය මුර කරමින් සිටි සහකාර පොලිස් අධිකාරී පීරිස්ට යටත් පොලිස් නිලධාරීහු එම නිවසේ රඳවා සිටි සැකකරුවෙකු පැන ගොස් ඇති බව සාක්ෂිකරුට කියා යම් සැකකටයුතු පුද්ගලයෙකු ඔහු දැක්කේදැයි විමසීය.

වින්සන්ට් ප්‍රනාන්දු සාක්ෂි දෙමින් සංචාරක බංගලාව අවට වූ නිවාස වල පදිංචිව සිටි අය ගැන විස්තර කීය. සංචාරක බංගලාවෙහි එක් පැත්තක නිවාස අංක A2/3 නිවස විය. රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ නිල වාර්තා අනුව මෙම නිවාසය වික්‍රමසිංහ මහතාගේ උපදෙස් මත 1988 නොවැම්බර් මස 01 වන දින සිට 1989 ඔක්තෝබර් මස 25 වන දින දක්වා මිනිස් බල ඒකාබද්ධතා අමාත්‍යාංශයට පවරා දී තිබිණ. මෙම අමාත්‍යාංශය ක්‍රියාත්මක වූයේ වික්‍රමසිංහ මහතා යටතේය. ඊට පසු 1989 ඔක්තෝබර් මස 25 වන දින සිට 1994 අගෝස්තු මාසය දක්වා මෙම නිවාසය වෙන්කොට දී තිබුනේ සංචාරක බංගලාවේ භාරකරු වූ වින්සන්ට් ප්‍රනාන්දුටය. කෙසේ වුවද, වින්සන්ට් ප්‍රනාන්දුගේ සාක්ෂි අනුව මෙම කොමිෂන් සභාවට අදාල සියළු කාලය තුලම මෙම නිවස වික්‍රමසිංහ මහතාගේ කාර්ය මණ්ඩලය විසින් පාවිච්චි කරනු ලැබිණ. එය පාවිච්චි කොට තිබුණේ වික්‍රමසිංහ මහතා සම්බන්ධ ප්‍රචාරක කටයුතුවලටය. උදාහරණයක් වශයෙන් කියතොත් එම නිවස තුල පෝස්ටර ගබඩා කොට තිබිණ.

. අංක A2/3 දරන නිවසට යාබදව පිහිටියේ අංක A1/7 දරණ නිවසය. වින්සන්ට් ප්‍රනාන්දුගේ සාක්ෂි අනුව, පොලිස් පරීක්ෂක ගුණසේකර නමැති වික්‍රමසිංහ මහතාගේ ආරක්ෂක නිලධාරියෙකු එහි පදිංචිව සිට ඇත. පොහොර නිෂ්පාදන සංස්ථාව විසින් තබා තිබෙන නිල වාර්තා අනුව එය වික්‍රමසිංහ මහතාගේ ආරක්ෂක කාර්ය මණ්ඩලයට වෙන්කොට තිබිණ. සංස්ථාවේ ඇවරකරුවන අශෝක සේනානායක මහතාගේ සාක්ෂිය අනුව අංක A1/7 දරන නිවසට යාබදව පිහිටි නිවස, එනම්, A1/8 දරන නිවස පොලිස් නිලධාරීන්ගේ පාවිච්චිය සඳහා මුදාහැර නොතිබිණි. එනමුත් පොලිස් නිලධාරීන් කිසිත් බලයක් නොමැතිව මෙම නිවාසය පාවිච්චි කල බව ඔහු දැන-සිටියේය. තවද, උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහගේ සාක්ෂිය අනුව සැකකරු ගාමිණී හෙට්ටිආරච්චි මෙම නිවස තුල උඩ එල්ලා සිටිනු ඔහු දැක ඇත. වික්‍රමසිංහ මහතා පොලිස් නිලධාරීන්ගේ මෙම හැසිරීම අනුමත නොකලේ නම් ( එනම්, පුද්ගලයන් රඳවා තබා වධදීම අනුමත නොකලේ නම්) වික්‍රමසිංහ මහතාගේ ආරක්ෂක නිලධාරියා එබඳු ක්‍රියා ඉවසයිද? තවද, වික්‍රමසිංහ මහතාගේ නිල සංචාරක බංගලාවට මෙතරම් කිට්ටු නිවාසයක සිදුවන දේ ගැන ඔහු වික්‍රමසිංහ මහතාට දන්වා නොසිටිද?

සාක්ෂිකාර වින්සන්ට් ප්‍රනාන්දුගේ විශ්වසනියත්වය තක්සේරු කිරීමේදී කොමිෂන් සභාව විසින් සළකා බැලූ කාරණා දෙකක් ගැන අපි අදහස් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු. පළමුව, අදාළ දැනුම ඒකරාශී කර ගැනීමට සාක්ෂිකරුට ඉඩකඩ තිබුණේද? තවද, අදාළ තොරතුරු එක්රැස්කර ගැනීමට ඔහුට අවස්ථාව තිබුණේද? වින්සන්ට් ප්‍රනාන්දු තමාගේ සංචාරක බංගලාවේ භාරකරු හැටියට ක්‍රියා කළ බව රනිල් වික්‍රමසිංහ මහතා පිළිගත්තේය. එහෙයින් අවශ්‍ය දැනුම ලබාගැනීමේ ඉඩකඩ හා අවස්ථාව ඔහුට තිබිණ. තවද, බොහෝ කාරණා පිළිබඳ ඔහුගේ සාක්ෂි අභියෝගයට ලක් නොවූ සාක්ෂිවලින් තහවුරු කරන ලද්දේය. මේ සම්බන්ධයෙන් සළකා බලන ලද දෙවන කාරණය නම්, වික්‍රමසිංහ මහතා බොරුවට මෙම වරදට පටලැවීමට වින්සන්ට් ප්‍රනාන්දුට යම් හේතුවක් (හෝ චේතනාවක්) තිබුණිද? වින්සන්ට් ප්‍රනාන්දු තමාට විරුද්ධව බොරු සාක්ෂි (තමාට අහිතකර වන) දීමට තිබිය හැකිව තිබුණු කිසිත් නිශ්චිත සාධු හේතු කිසිවක් වික්‍රමසිංහ මහතා දුන්නේ නැත. එසේ වූ හේතු නැතිව තිබියදී වින්සන්ට් ප්‍රනාන්දු අසත්‍ය ප්‍රකාශ කළයුත්තේ ඇයි? මේ සම්බන්ධයෙන් ලබාගැනීමට තිබෙන කරුණු සමස්තයක් ලෙස සළකා බලන ලදුව, වින්සන්ට් ප්‍රනාන්දුගේ සාක්ෂි ප්‍රතික්ෂේප කිරීමට මෙම කොමිෂන් සභාවට හේතුවක් නොපෙනේ.

නිවාස වෙන්කොට දීම හා රනිල් වික්‍රමසිංහ මහතා සහ ඔහුගේ ආරක්ෂක නිලධාරීන් විසින් පාවිච්චියට ගෙන තිබුණු නිවාස ගැන රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරු විසින් දෙන ලද සාක්ෂිවල පරස්පර විරෝධයක් නැත. වික්‍රමසිංහ මහතාද එම සාක්ෂිවලට එකඟ විය. පරස්පරවිරෝධී නොවූ සාක්ෂි අනුව මෙම නිවාස පිළිබඳ තත්ත්වය මෙසේය:

1. A2/2 - රනිල් වික්‍රමසිංහ මහතාගේ සංචාරක බංගලාව
2. A2/1 - රනිල් වික්‍රමසිංහ මහතාගේ ආරක්ෂක නිලධාරීන් විසින් අත්කර ගෙන සිටින ලදී.
3. A2/3 - රනිල් වික්‍රමසිංහ මහතාගේ බංගලා භාරකරුට වෙන්කර දෙන ලදී.
4. A1/7 - රනිල් වික්‍රමසිංහ මහතාගේ ආරක්ෂක නිලධාරියෙකු විසින් අත්කර ගෙන සිටින ලදී.
5. B2 - රනිල් වික්‍රමසිංහ මහතාගේ කාර්යාලයක් ලෙස පාවිච්චි කරනු ලැබූ අතර, වික්‍රමසිංහ මහතාගේ ආරක්ෂක නිලධාරීන් විසින් ද පාවිච්චි කරන ලදී.
6. B1 - රනිල් වික්‍රමසිංහ මහතාගේ ආරක්ෂක නිලධාරීන් විසින් අත්කර ගෙන සිටින ලදී.

මෙම නිවාස පිහිටියේ බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ කොනේම බව සැළකිය යුතුය. මෙම ගෙවල්වලට පිටිපසින් නිවාස යෝජනා ක්‍රමයේ පසුපස වැට පිහිටා තිබිණ. එම වැට ළඟට ලොකු කුඹුරක් විය. වික්‍රමසිංහ මහතා එහි ජීවත්වූ බැවින් මෙම ප්‍රදේශය අධි ආරක්ෂක කලාපයක් විය. නිවාස යෝජනා ක්‍රමයේ අනිකුත් සිවිල් පදිංචිකරුවන්ට පවා මෙම ප්‍රදේශයේ නිදහසේ එහා මෙහා ගමන් කිරීමට අවසර නොදෙන ලදී. ඇත්ත වශයෙන්ම එය කිට්ටුව බාධකයක් ගොඩනගා තිබේ. එමනිසා එය නිවාස යෝජනා ක්‍රමය තුළ හොඳින් ආරක්ෂා කළ කුඩා

සංකීර්ණයකි. එක් වධකාගාරයක් (B2 - ටී.එම්. බන්දුලගේ සාක්ෂි බලන්න.) "මෙම කුඩා සංකීර්ණය" තුළ පිහිටා තිබුණේය. ( මෙය වික්‍රමසිංහ මහතාගේ සෘජු පාලනය තුළට අයත් විය.)

ටී.එම්. බන්දුල යන නමින් යුත් සාක්ෂිකරුවෙකු තමා (බන්දුල) මෙම B2 නිවාසයෙහි නීති විරෝධීව රඳවා සිටි බවට සාක්ෂි දුන් බව වික්‍රමසිංහ මහතාට ප්‍රකාශ කරන ලදී. ඔහුගේ සාක්ෂි වික්‍රමසිංහ මහතාට ලුහුඩින් විස්තර කර දෙනු ලැබිණ. එබඳු නිවාසයක එබඳු දෙයක් ( එනම්, පුද්ගලයෙකු නීති විරෝධීව රඳවා ඔහුට වධදීම) සිදුවිය නොහැකි බව වික්‍රමසිංහ මහතා කීය. ඇත්ත වශයෙන්ම එබඳු දෙයක් සිදුවූයේ නම් තමා එම නිවස පාවිච්චි කළ බැවින් එය තමා අවශ්‍යයෙන්ම දැන සිටියයුතු වූයේ යයි ඔහු තවදුරටත් කීය. තමාගේ දැනුමක් නැතිව B2 නිවාසය නීති විරෝධී ක්‍රියා සඳහා පාවිච්චි කලා වියහැකි බවක් වික්‍රමසිංහ මහතා මොහොතකටවත් පිළිගත්තේ නැත. තත්ත්වය අවසන් වශයෙන් විශ්ලේෂණය කර බලන විට, මෙම කොමිෂන් සභාව ( සමස්තයක් වශයෙන් වූ සාක්ෂි හා වෙනත් කරුණු සලකා බැලීමෙන් පසු) ටී.එම්. බන්දුලගේ සාක්ෂි ස්ථිරවම විශ්වාස කිරීමට තීරණය කර අවසන් බැවින්, නොවැළැක්විය හැකි ලෙසම බැසියයුතුව තිබෙන නිගමනය නම් වික්‍රමසිංහ මහතා ( අඩුම වශයෙන් කියතොත්) B2 නිවාසය ඉහතින් සඳහන් නීති විරෝධී ක්‍රියා සඳහා පාවිච්චි කරනු ලැබූ බව දැන සිටි බවය.

දෙවැනි වධකාගාරය පිහිටියේ මෙම කුඩා සංකීර්ණයට යාර කිහිපයක් (ආසන්න වශයෙන් යාර 100ක්) දුරිනි; වික්‍රමසිංහ මහතාගේ තවත් ආරක්ෂක නිලධාරියෙකු වූ පොලිස් පරීක්ෂක සුදත් චන්ද්‍රසේකර විසූ අංක B 7 දරන නිවාසයට යාබදවය. මෙම දෙවැනි නිවාසය B8 වැනි නිවාසය වූ අතර එයද පිහිටියේ සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ගේ නිවාසය ඉදිරිපිටය. අංක B 8 දරන නිවාසය, මෙම කුඩා සංකීර්ණයට යන මාර්ගයෙහි පිහිටා තිබිණි. සැබැවින්ම, වික්‍රමසිංහ මහතා සාක්ෂි දෙමින් තමා අංක B8 දරන නිවාසය පසුකර යද්දී පොලිස් නිලධාරීන් සිවිල් ඇඳුමෙන් සැරසී අංක B 8 දරන නිවාසය රැකවල්හි යෙදී සිටිනු දැක ඇතැයි පිළිගත්තේය. ඉහත සඳහන් කෙරුණු නීති විරෝධී කටයුතු සඳහා පාවිච්චියට ගනු ලැබූ තෙවැනි නිවාසය මෙකී කුඩා සංකීර්ණයට යාබදවම පිහිටා තිබිණි. අංක A 1/8 දරන එම නිවාසය පිහිටියේ වික්‍රමසිංහ මහතාගේ ආරක්ෂක නිලධාරීන් පදිංචි වී සිටි අංක A 1/7 දරන නිවාසය අසලමය. කලින් සඳහන් කෙරුණු ආරක්ෂක මාර්ග බාධකය පිහිටුවා ඇත්තේ මෙම නිවාසයට නුදුරිනි. සංස්ථාවේ ඇවරකරුගේ සාක්ෂියට අනුව පොලිස් නිලධාරීන් කිසිදු අධිකාරී බලයක් නොලබා මෙම නිවාසය අසල නිතොර දෙවේලේ ගැවසෙමින් සිටි බවක් කියැවිණි. හෙට්ටිආරච්චි නම් වූ සැකකරු මෙම නිවාසය අසළ උඩ එල්ලා දමනු ලැබ තිබෙනු තමා දුටුවේ යැයි අජිත් ජයසිංහ සඳහන් කර සිටියේය. මෙම නිවාසයද වධකාගාරයක් ලෙසින් පාවිච්චි කරනු ලැබ තිබූ බවට පැහැදිලි සාක්ෂි තිබිණි. තතු මෙසේ හෙයින්, මෙම නිවාස දෙකෙහි සිදුවෙමින් පැවති දෑ නමන් නොදනිතියි වික්‍රමසිංහ මහතා කියනු විශ්වාස කළ හැකිද?

කෙසේ වුවද, වධකාගාරයන්හි සිදුවූ දෑ පිළිබඳව බලයේ සිටි පුද්ගලයින්ට හුදෙක් අල්පමාත්‍රයකට වැඩි දැනුමක් තිබිණිදැයි යන්න නිශ්චය කරගනු පිණිස මෙම කොමිෂන් සභාවේ පරීක්ෂණය තවදුරටත් පවත්වාගෙන යන ලදී.

## බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙහි පැවති රැස්වීම්. . . .

බටලන්ද නිවාස යෝජනා ක්‍රමය තුළ යම් යම් සාකච්ඡාවත් හෝ රැස්වීම් පවත්වන ලද බව මෙම කොමිෂන් සභාව හමුවේ පැවති නඩු විභාගයේදී අනාවරණය විය. එකී රැස්වීම් සහ නීති විරෝධී රැඳවුම් මධ්‍යස්ථාන සහ බන්ධනාගාර පිහිටුවා පවත්වාගෙන යාම අතර කිසියම් සම්බන්ධතාවක් තිබිණි දැයි නිශ්චය වශයෙන් සොයා දැන ගැනීමේ මූලික අරමුණින් එකී රැස්වීම්වල තිසි ස්වභාවය විස්තරාත්මකව සලකා බැලීම අවශ්‍ය විණි. පූර්වෝක්ත රැඳවුම් මධ්‍යස්ථානයන් පිහිටුවා පවත්වාගෙන යාමට තුඩු දුන් කිසියම් කුමන්ත්‍රණයක් බටලන්ද නිවාස යෝජනා ක්‍රමය තුළ විණිදැයි විභාග කර බැලීම අධිකාර පත්‍රයේ නිර්ණේය කරුණු ප්‍රකාර කළයුතු කාර්යයක් විණි. මෙම රැස්වීම් පැවැත්වීමත් එම රැස්වීම්වලදී සාකච්ජාවට ලක්විණැයි කියනු ලබන කරුණුත් පිළිබඳව එම රැස්වීම්වලට සහභාගීවූ වැදගත් පුද්ගලයින් සමහරකු විසින් දෙනු ලැබූ සාක්ෂි අපි දැන් සලකා බලනු කැමැත්තෙමු.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තලින් දෙල්ගොඩ මහතා කැළණි පොලිස් කොට්ඨාශයෙහි ජ්‍යෙෂ්ඨතම පොලිස් නිලධාරියා වූයේය. කැළණිය කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් විසින් කැළණි ප්‍රදේශය තුළ රැස්වීම් පැවැත්විණි නම්, එම රැස්වීම් පිළිබඳව දෙල්ගොඩ මහතා දැනුවත්ව සිටිය යුතුවූවා පමණක් නොව ඒවා කෙරෙහි සෘජු පාලනයක් ද ඔහු විසින් පවත්වා ගෙන යායුතුව තිබිණි. එහෙයින් මෙම රැස්වීම් පිළිබඳව දෙල්ගොඩ මහතා පළ කළ අදහස් සැලකිල්ලට යොමු කිරීමෙන් මෙම විභාගය ඇරඹීම අවස්ථාවෝචිත යැයි අපි අදහස් කරමු.

තලින් දෙල්ගොඩගේ සාක්ෂියට අනුව, මෙම කොමිෂන් සභාවේ පරීක්ෂණයට අදාළ වූ කාලපරිච්ඡේදය තුළදී හෙතෙම බටලන්ද නිවාස සංකීර්ණයෙහි පැවැති රැස්වීම් දෙකකට හෝ තුනකට සහභාගීවී ඇත. මෙම රැස්වීම් පැවැති නියම ස්ථානය පිළිබඳව ප්‍රශ්න කරන ලදින්, සාක්ෂිකරු මුලින්ම කියා සිටියේ ඒවා වික්‍රමසිංහ මහතාගේ සංචාරක බංගලාවෙහි පවත්වනු ලැබූ බවය. පසුව ස්වකීය ස්ථාවරය වෙනස් කරමින් මෙකී රැස්වීම් සංචාරක බංගලාව ඉදිරිපිට පිහිටි නිවාසයෙහි පවත්වනු ලැබූ බව හෙතෙම පැවසීය. මෙම රැස්වීම් පැවැත්වීමට තුඩුදුන් හේතුව වශයෙන් දෙල්ගොඩ ප්‍රකාශ කළේ කැරැල්ල පැවැති කාලසීමාව තුළදී ප්‍රදේශයේ ආරක්ෂක විධිවිධාන සම්බන්ධීකරණය කරලීම බවය. මෙම රැස්වීම් වික්‍රමසිංහ මහතාගේ නායකත්වය යටතේ පවත්වනු ලැබූ බව දෙල්ගොඩ කිය. වික්‍රමසිංහ මහතා මෙම රැස්වීම්වල මූලාසනය දරා ඇත. මෙම අසාමාන්‍ය රැස්වීම් පවත්වන්නට තුඩුදුන් නියම හේතුන් රජයේ නීතිඥවරයාගේ මෙහෙයවීම යටතේ විස්තරාත්මක පරීක්ෂාවට ලක්කෙරිණි. දෙල්ගොඩ මුලින්ම කියා සිටියේ මෙම රැස්වීම් නීතිය හා මහජන සාමය සුරැකීම සහතික කරගනු පිණිස පවත්වන්නට යෙදුණු බවය. දීර්ඝ වශයෙන් ප්‍රශ්න කරන ලදින් මෙම රැස්වීම්වලදී ප්‍රදේශයේ සිදුවන කඩාකප්පල්කාරී ක්‍රියාවන්හි ස්වභාවය ඔවුන් විසින් රපෝර්තු කරනු ලබන බව හෙතෙම පැවසීය. කඩාකප්පල්කාරීන් මර්දනය කරලීම පිණිස කවර ස්වභාවයේ ක්‍රියා මාර්ගයන් ගතයුතු දැයි යන්න මෙම රැස්වීම්වලදී ඔවුන් විසින් සාකච්ජා කෙරුණු බවට හෙතෙම අවසානයේදී බොහෝ අකමැත්තෙන් යුතුව නීතිඥවරයා සමග එකඟවිය. මෙම සාක්ෂිය එළිපිටම ප්‍රකාශ කරන්නට සාක්ෂිකරු මැළිකමක් දැක්වූයේ ඇයි දැයි යන්න අපේ විමතිය දනවන්නකි. ඊට හේතුව, " කඩාකප්පල්කාරීන් මර්දනය කිරීම" යන්නෙන්, අධිකරණමය ක්‍රියාදාමයෙන් පරිබාහිරව ඉවත්කරලීම වැනි පොලීසියට නීත්‍යානුකූලව බලයක් පැවරී නොතිබූ දෑ කිරීමක් අදහස් කෙරුණු නිසාද?

මෙම රැස්වීම්වල මූලාසනය දැරීමට වික්‍රමසිංහ මහතාට අවශ්‍ය වූයේ ඇයිදැයි නීතිඥවරයා ප්‍රශ්න කළේය. විශේෂයෙන්ම, වික්‍රමසිංහ මහතා රාජ්‍යාරක්ෂක අමාත්‍යවරයාවත් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාවත් නොවූ බැවින් මෙම රැස්වීම්වල මූලාසනය දැරීමට ඔහු අවශ්‍ය වූයේ ඇයි දැයි අපි මෙම සාක්ෂිකරුගෙන් විමසුවෙමු. වික්‍රමසිංහ මහතා විසින් පොලිස් නිලධාරීන්ට " දේශපාලන නායකත්වයක්" දීමේ කර්තව්‍යය පහසුකරලීම පිණිස එපරිදි ක්‍රියා කරන ලදැයි දෙල්ගොඩ මහතා පැහැදිලි කළේය. මෙම අවස්ථාවේදී නීතිඥවරයා සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කරමින් නීතිය ක්‍රියාවට නැංවීම සඳහා දේශපාලන නායකත්වයක් අවශ්‍ය වනුයේ ඇයිදැයි ඇසීය. එම වකවානුව තුළ පැවැති තත්ත්වය නිසා දේශපාලන නායකත්වයක් ලබාගැනීමට අවශ්‍ය වූ බවත්, දේශපාලන නියෝගයන් පිළිපැදීම හැර මෙකරුණ සම්බන්ධයෙන් තමන්ට වෙනත් විකල්පයක් නොතිබූ බවත් එකී පැණයට පිළිතුරු දෙමින් දෙල්ගොඩ පැවසීය. කළු ගලක තම හිස ගසා ගැසීමට තමනට නොහැකි බව දෙල්ගොඩ පැහැදිලි කළේය. මෙහිදී සාක්ෂිකරු කියන්නට වෑයම් කළේ මෙ කරුණෙහි ලා කිසිදු විකල්පයක් තමනට නොතිබුණු බවත්, මෙම තත්ත්වය වෙනස් කරන්නට තමා වෑයම් කළේ නම් නැතහොත් දේශපාලන නායකත්වයේ නියෝගයන් ඉටු කිරීමට තමා ප්‍රතික්ෂේප කළේ නම් එය තමන් කෙරෙහි බරපතල ප්‍රතිවිපාක ගෙන දෙන්නක් වියහැකිව තිබුණු බවයි. මෙම රැස්වීම් පැවැත්වීම සාධාරණීකරණය කරන්නට දෙල්ගොඩට නුපුළුවන්වූ අතර, මෙම රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද්දාවූ කරුණු ඔහු බොහෝදුරට වසන් කළේය.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙහි පැවැති රැස්වීම්වලට නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්.( මෙරිල්) ගුණරත්න ද සහභාගී වී යැයි තම සාක්ෂියේදී නලින් දෙල්ගොඩ සඳහන් කළේය. එබැවින්, මෙම රැස්වීම්වලට අදාළ වැඩි විස්තර නිශ්චය වශයෙන් සොයා දැනගනු වස් මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න ප්‍රශ්න කිරීමට භාජනය කෙරිණි. මෙම සාක්ෂිකරු විසින් දෙනු ලැබූ සාක්ෂිවලට අනුව, ඔහු රැස්වීම් තුනකට සහභාගීවී ඇත. මින් එක් රැස්වීමක් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ දී පවත්වන ලද්දකි. අනෙක් රැස්වීම් දෙකම පවත්වන ලද්දේ කර්මාන්ත අමාත්‍යාංශයෙහි පිහිටි රනිල් වික්‍රමසිංහ මහතාගේ කර්යාලයේ දිය. සිරිත් ප්‍රකාර ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීම් සාමාන්‍යයෙන් පැවැත්වෙනුයේ ප්‍රදේශයේ ප්‍රධාන අමාත්‍යවරයාගේ හෝ ආණ්ඩුවේ දිසාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් වන බැවින් ඉහතකී රැස්වීම් එබඳු සම්බන්ධීකරණ රැස්වීම් ලෙසින් සැලකීමට නොහැකි බව ගුණරත්න මහතා පිළිගත්තේය. තවද, එබඳු රැස්වීම් දිසාපති කාර්යාලයෙහි පවත්වනු ලැබූ නමුත් ගුණරත්න මහතා සහභාගීවූ වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීම් වෙනත් තැන්හිදී පැවැත්විණි.

මෙම රැස්වීම්වලට තමන් සහභාගීවූ බවට පිළිගත් තවත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකු වූයේ සහකාර පොලිස් අධිකාරී රාජා වයස් ය. රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීම් කිහිපයකටම තමන් සහභාගී වූ බව හෙතෙම පැවැසීය. මෙම රැස්වීම් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙහි පිහිටි නිවාස දෙකකදී පවත්වන්නට යෙදී ඇත. මින් එකක් රනිල් වික්‍රමසිංහ මහතා පදිංචිව සිටි නිවාසය වූ අතර, අනෙක වූයේ සංචාරක බංගලාව ඉදිරිපිට පිහිටි නිවාසයකි. මෙය හුදකලාව පිහිටි නිවාසයකි. මෙම හුදකලා නිවාසයෙහි පැවැති රැස්වීම්වලද වික්‍රමසිංහ මහතා මුලසුන දැරීය. මෙකී රැස්වීම්වලට නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ , සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් , පොලිස් පරීක්ෂකවරුන් වන අතපත්තු, රංජිත් වික්‍රමසිංහ සහ කැලණි ප්‍රදේශයෙහි පිහිටි සෙසු පොලිස් ස්ථාන භාර නිලධාරීහුද සහභාගී වූහ. වික්‍රමසිංහ මහතාගේ ආරක්ෂක නිලධාරීහු මෙම හුදකලා නිවාසයෙහි නතරවී සිටියහ. එය සංචාරක බංගලාව ඉදිරිපිට පිහිටා තිබිණි. යම් යම් රැස්වීම්

පැවැත්විණැයි කියනු ලබන මෙම නිවාසය, අංක B 2 දරන නිවාසය බව මෙම කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කෙරුණු රාජ්‍ය පොහොර නිෂ්පාදන නීතිගත සංස්ථාව භාරයේ පැවති වාර්තා වල පැහැදිලිව සඳහන් වෙයි. තමාට ආරක්ෂාව සැපයීමේ කාර්යය පැවරී ඇති ආරක්ෂක නිලධාරීන්ට අංක B 2 දරන නිවාසයෙහි නවාතැන් පහසුකම් සලසනු ලැබූ බව රනිල් වික්‍රමසිංහ මහතාද පිළිගත්තේය. ටී. එම්. බන්දුල නමැති සාක්ෂිකරු පවසන අන්දමට ඔහු පැනයාමට පෙර මෙම නිවාසයෙහි රඳවා ගනු ලැබ සිට ඇත. මේ අනුව පෙනී යනුයේ පුද්ගලයින් නීති විරෝධීව රඳවා ගනු ලබන්නාවූ නිවාසයක මෙම රැස්වීම් පවත්වනු ලැබ ඇති බවකි. මෙය, එලෙසින් රඳවා ගනු ලබන තැනැත්තන්ට වධ පමුණුවාලීම සඳහා පාවිච්චි කරනු ලැබූ නිවාස වලින් එකක්ද විණි. මෙම අවස්ථානුගත කාරණා අනුව පෙනී යනුයේ මෙම රැස්වීම් පැවැත්වීම, නීතිවිරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාමට සම්බන්ධවූවක් බවයි. තවද, මෙම අංක B 2 දරන නිවාසයෙහි පුද්ගලයින් රඳවා තබාගැනීම හා වධ පමුණුවාලීම කෙරෙමින් තිබූ බවක් තමන් නොදනිතියි එම නිවාසයෙහි පැවැති මෙකී රැස්වීම්වලට සහභාගීවූ පුද්ගලයෙකුට කිසිවිටකත් කියා සිටිය හැකිද?.

සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස්ගේ සාක්ෂියට අනුව, සංචාරක බංගලාවෙහි රැස්වීම් පවත්වන ලද්දේ පොලිස් නිලධාරීන් කිහිපදෙනෙකු සඳහා පමණකි. ඔහුද එම රැස්වීම්වලට සහභාගී වූයේය. මෙම රැස්වීම්වලට සහභාගි වන මෙන් ඇරයුම් කරමින් රනිල් වික්‍රමසිංහ මහතා විසින් පොලිස් ස්ථානාධිපතිවරුන් වෙතද ලිපි යවන ලදි. මෙබඳු සාකච්ඡාවන් සඳහා පොලිස් නිලධාරීන්ට ඇරයුම් කිරීමේ අසාමාන්‍ය පියවර වික්‍රමසිංහ මහතා විසින් ගන්නා ලද්දේ ඇයිදැයි අපි විමතිය පළකරමු. මෙම සාකච්ඡාවන්ට සහභාගී වන මෙන් දෙනු ලබන උපදෙස් පොලිස් මූලස්ථානය විසින් හෝ අදාල පොලිස් කොට්ඨාසය භාර නිලධාරීන් විසින් පොලිස් නිලධාරීන් වෙත යැවීම සාමාන්‍ය ක්‍රියා පිළිවෙත විණි.

මෙම කාරණයට අදාලව ඉදිරිපත්ව තිබූ සාක්ෂිවලින් නිසැකයෙන්ම පෙනී යනුයේ මෙම " රැස්වීම්" සම්බන්ධයෙන් ප්‍රධාන භූමිකාවක් රඟපෑ පුද්ගලයින් දෙදෙනෙකු සිටි බවය. සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් සහ රනිල් වික්‍රමසිංහ යන අය මෙම පුද්ගලයෝ වූහ. මේ සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ගේ සාක්ෂිය සැලකිල්ලට භාජනය කිරීමේ අවස්ථාව මෙම කොමිෂන් සභාවට නොලැබීම අභාග්‍යයකි. කෙසේ වුවද, රනිල් වික්‍රමසිංහ මහතා මෙම කොමිෂන් සභාව හමුවේ පෙනී සිටි අතර මේ සම්බන්ධයෙන් ඔහු පිරික්සුමට භාජනය කරන ලදී.

වික්‍රමසිංහ මහතාගේ සාක්ෂියට අනුව දෙවර්ගයක රැස්වීම් පවත්වන්නට යෙදී ඇත. ගම්පහ දිසා ලේකම් කාර්යාලයෙහි පවත්වන්නට යෙදුණු දිස්ත්‍රික් ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීම් මින් පළමු වර්ගය විණි. මෙම රැස්වීම්වල මූලාසනය -එක්කෝ රන්ජන් විජේරත්න මහතා ( හිටපු රාජ්‍යාරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය) විසින් නැතහොත් තමා විසින් දරනු ලැබ තිබිණි. දෙවනුව සඳහන් වර්ගයේ රැස්වීම් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙහි අංක B 2 දරන නිවාසයෙහිදී පවත්වනු ලැබ ඇත. ඉහත සඳහන් වන නිලධාරීන් මෙම රැස්වීම්වලට සහභාගිවූ බව වික්‍රමසිංහ මහතා පිළිගත්තේය. මෙම රැස්වීම්වලට අදාලව මෙම කොමිෂන් සභාව විසින් පරීක්ෂාවට ලක් කෙරුණු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සමහරෙකු සඳහන් කර සිටි අන්දමට මෙම රැස්වීම්වලදී සාමාන්‍ය ආරක්ෂක තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරනු ලැබ ඇත. විශේෂයෙන්ම, රජයේ ආයතනයන් කෙරෙහි එල්ලවී ඇති තර්ජනයන්, කඩාකප්පල්කාරීන් විසින් මහජන සාමය කෙරෙහි

එල්ල කෙරුණු තර්ජනයත් මෙකී සාකච්ඡාවන්හි මුඛ්‍ය තේමාවන්වී ඇත. තමන් මෙම රැස්වීම් කැඳවූ බවත්, එම රැස්වීම්වලට සහභාගී වන ලෙස අවශ්‍ය පොලිස් නිලධාරීන් වෙත ඇනුම්දීම් කල බවත් හෙතෙම පිළිගත්තේය. බස්නාහිර පලාත් සභාවේ එවක අධ්‍යාපන අමාත්‍ය සුරනිමල රාජපක්ෂ මහතාද මේ රැස්වීම්වලට සහභාගීවී ඇත. මෙම රැස්වීම්වලට සහභාගීවූ දේශපාලනඥයින් දෙපොල වූයේ ඔවුන් දෙදෙනා පමණකි. තමන් විසින්ම කැඳවන ලදුව, තමා මුලසුන ඉසුලූ මෙම රැස්වීම් එසේ පවත්වන්නට පාදකවූ කිසිදු නිශ්චිත රජයේ තීරණයක් ගෙනහැර පැමට වික්‍රමසිංහ මහතා අපොහොසත් වූයේය. තවද, බටලන්දෙහි පැවැති රැස්වීම්වලදී නීතිය හා සාමය පිළිබඳ යම් යම් අංශයන් , (එනම්, කඩාකප්පල්කාරීන් විසින් ප්‍රදේශයෙහි ආරක්ෂාවට එල්ල කෙරුණු තර්ජනය ) පමණක් සාකච්ඡා කරන ලද්දේ මක්නිසාදැයි යන්නත් එම ප්‍රදේශය තුල පුද්ගලයින් පැහැරගෙනයාම සහ මළ සිරුරු දක්නට ලැබීම වැනි සෙසු කාරණා පිළිබඳව එහිදී සාකච්ඡා නොකරන ලද්දේ ඇයිදැයි යන්නත් පැහැදිලි කරන්නට ඔහුට නුපුළුවන් විය. තවද, කඩාකප්පල්කාරීන් විසින් පොලිස් නිලධාරීන් කෙරෙහි එල්ල කෙරුණු තර්ජනය පිළිබඳව ඔවුන් සාකච්ඡා කලේ යැයි කීම ඇත්තක් බව වික්‍රමසිංහ මහතා මුලදී පිළිගත් අතර, එබඳු කාරණා සාකච්ඡා කරන ලදැයි කීම ප්‍රතික්ෂේප කිරීමට දෙවනුව ඔහු වැයම් කලේය. එමගින් මෙම සාකච්ඡාවන්ගෙන් ඈත්ව සිටීම ඔහුගේ උත්සාහය විය.

වික්‍රමසිංහ මහතා පවසන අන්දමට, මෙම රැස්වීම් ( අංක B 2 නිවාසයෙහි පැවැති) නිමාවූ විට ඊට සහභාගීවූ අය අතුරින් කිහිපදෙනෙකු තේ පැන් සංග්‍රහයක් සඳහා අංක 2 දරන නිවාසය ඉදිරිපිට පිහිටි සංචාරක බංගලාවට කැඳවීම ඔහුගේ සිරිතක්ව පැවැතිණි. සංචාරක බංගලාවේදී ඔවුන් ආරක්ෂක තත්ත්වය පිළිබඳව විස්තරාත්මකව සාකච්ඡා නොකල බව හෙතෙම ප්‍රකාශ කලේය. වික්‍රමසිංහ මහතා මෙම කාරණය ගැන සාක්ෂි දෙද්දී වින්සන්ට් ප්‍රනාන්දුගේ සාක්ෂිය අපගේ මතකයට නැඟුණි. මෙකී අමුත්තන්ට ආහාර පාන ගෙනැවිත් දීමෙන් සංග්‍රහ කටයුතු කවුරුන් විසින් කරන්නට ඇද්ද? එලෙස සංග්‍රහ කටයුතුවල නියැළි සිටි තැනැත්තාට එමගින් එවේලෙහි සාකච්ඡා කරනු ලැබූ කාරණා අසාගෙන සිටීමේ අවස්ථාවක් ලැබෙන්නට ඇද්ද? (" දැනගැනීමේ විධි" නමැති පරීක්ෂණය - වින්සන්ට් ප්‍රනාන්දු නමැති සාක්ෂිකරුගේ සාක්ෂිය සම්බන්ධයෙන් භාවිතා කෙරිණි.)

වික්‍රමසිංහ මහතාගේ සාක්ෂිය සම්බන්ධයෙන් අපගේ නිරීක්ෂණය වනුයේ ඔහුගේ පිළිතුරු මගහරින සුළු ඒවා බවයි. තවද, සංචාරක බංගලාවේදී සාකච්ඡාවන් පවත්වන ලද බවට සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් දුන් සාක්ෂිය වික්‍රමසිංහ මහතාගේ දැනගැනීමට යොමු කරනු ලැබූ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් ඔහුට අදහස් කිසිවක් දැක්වීමට නොතිබිණි. තවද, ඔහු වෙනුවෙන් පෙනී සිටි අධිනීතිඥවරයා ද මේ සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට ක්‍රියා නොකලේය. මෙකී රැස්වීම්වලට තමන් සහභාගීවී අදාල නියෝගයන් ක්‍රියාත්මක කලේ තම හිස කළු ගලක ගසා ගැනීමට වුවමනාවක් තමන්ට නොවූ නිසා බවට තලින් දෙල්ගොඩ පිහිටි ස්ථාවරය පිළිබඳවද වික්‍රමසිංහ මහතා අදහස් කිසිවක් පල නොකලේය. එබඳු දෙයක් දෙල්ගොඩ විසින් පවසනු ඇතැයි තමන්ට නොසිතුන බව කියමින් දෙල්ගොඩගේ ප්‍රකාශය ගැන කෙලින්ම අදහස් කිසිවක් දැක්වීම වික්‍රමසිංහ මහතා මගහැරියේය. මෙම කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දුන් අවස්ථාව වන තෙක් කොමිෂන් සභාව හමුවේ කෙරුණු සියළුම විභාගයන්හි නිල වාර්තා කෙලින්ම අධ්‍යයනය කිරීමේ ඉඩ ප්‍රස්ථාවක් ඔහුට නොලැබුණද, වික්‍රමසිංහ මහතාට සාධාරණයක් වනු පිණිස මෙම කොමිෂන් සභාවට සහායවූ නීතිඥවරයා විසින් අදාල සාක්ෂිකරුවන්ගේ අදාල සාක්ෂි ඔහු වෙත යොමු කරන ලද බව මෙහිලා සටහන් කළයුතුව ඇත.

සෙසු සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සම්බන්ධයෙන් කෙළින්ම අදහස් දැක්වීමේ හෝ ඊට අදාළව කරුණු පැහැදිලි කිරීමේ අවස්ථාවක් වික්‍රමසිංහ මහතාට අත්වූයේ එහෙයිනි.

පුද්ගලයින් නීති විරෝධිව රඳවා ගනු පිණිස බටලන්ද නිවාස පාවිච්චියට ගැනීම්, එහි රඳවා ගනු ලැබූවන්ට වධ පමුණුවාලීම් මාර්ගයෙන් තොරතුරු ලබාගත හැක්කේ කෙසේදැයි යන්න සහ අවසානයේදී එබඳු පුද්ගලයින් "නැති භංග කර දැමීම" ආදි සාපරාධී කටයුතු පිළිබඳව තමන් සාකච්ඡා කළ බවක් බටලන්දේ පැවැති රැස්වීම් වලට අදාළව සාක්ෂි දුන් කිසිදු තැනැත්තෙකු විසින් පිළිගනු ඇතැයි මෙම කොමිෂන් සභාව බලාපොරොත්තු නොවීම ස්වභාවිකය.

මෙහිලා සැලකිය යුතු වැදගත් කාරණය වනුයේ බටලන්දේ පැවැති මෙම "රැස්වීම" සම්බන්ධයෙන් සාක්ෂි දුන් කිසිදු සාක්ෂිකරුවන් දෙදෙනෙකුට රැස්වීම් ස්ථානය, පැවැත්වූ රැස්වීම් ගණන , එම රැස්වීම්වලදී කෙරුණු සාකච්ඡාවල ස්වභාවය සහ රැස්වීම්වලින් අනතුරුව ගනු ලැබූ පසු විපරම් කටයුතු පිළිබඳව ඒකාකාරී සාක්ෂිදීමට නොහැකිවීමය. මෙකී රැස්වීම් විධිමත් පරිදි පවත්වන ලද්දේ නම් සහ එම රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද්දේ නෛතික හා නිසියාකාර කරුණු විණි නම් එබඳු වූ විෂමතාවක් සාක්ෂිවල තිබිය යුතුද?

ඉහතින් විස්තර කරන ලද කරුණු අනුව පැහැදිලි වනුයේ බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙහි පවත්වනු ලැබූ රැස්වීම් විධිමත් රැස්වීම් ලෙසින් සැලකිය නොහැකි බවකි. තවද, මෙම රැස්වීම් අවිධිමත් ආකාරයකින් පවත්වන්නට යෙදී ඇති බවක් පෙනෙන්නට ඇත. මෙම රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද කාරණා සහ ගනු ලැබූ තීරණ පිළිබඳව වාර්තා කිසිවක් තබා නොගන්නා ලද බව සාක්ෂිකරුවෝ පිළිගත්හ. මෙකී රැස්වීම්, ආණ්ඩුවේ දිසාපති ( හෝ ප්‍රාදේශීය ලේකම්) කාර්යාලයන්හි පවත්වනු ලැබූ රැස්වීම්වලින් වෙන්කොට හඳුනා ගතයුතු බව මෙහිදී සැලකුව මනාය. කැරැල්ල පැවැති වකවානුව තුළ ගතයුතු ආරක්ෂක ක්‍රියා මාර්ගයන් සම්බන්ධීකරණය සඳහා මෙකී කාර්යාලයන්හිදී විශේෂ රැස්වීම් පවත්වනු ලැබ තිබිණි. පොලිස් නිලධාරීහු , යුද හමුදා නිලධාරීහු මෙන්ම ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීහු මෙම රැස්වීම්වලට සහභාගිවූහ. ඇතැම් අවස්ථාවන්හිදී ප්‍රදේශයේ දේශපාලනඥයෝද මෙම රැස්වීම්වලට සහභාගිවූහ. කැළණි පොලිස් කොට්ඨාසය වෙනුවෙන් මෙම රැස්වීම් පවත්වනු ලැබ ඇත්තේ ගම්පහ දිසාපති කාර්යාලයෙහි දී ය. " දිස්ත්‍රික් ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීම්" යනුවෙන් හැඳින්වෙන මෙකී විධිමත් රැස්වීම් පැවැත්වීම කෙරෙහි විරුද්ධත්වයක් පෑමට මෙම කොමිෂන් සභාව කිසිදු හේතුවක් නොදකී. තවද, පිරිහෙමින් පැවති ආරක්ෂක තත්ත්වය සමාලෝචනය කිරීමේ අවශ්‍යතාව එම තත්ත්වයට මුහුණදීම පිණිස නෛතික උපාය මාර්ග සැළසුම් කිරීම හා නිවාරක ක්‍රියා මාර්ග යෙදීම පිළිබඳව මෙම " විධිමත් දිස්ත්‍රික් ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීම්වලදී" සාර්ථකව තීරණය කරන ලද බැවින් බටලන්දේ පැවැති අතිකුත් රැස්වීම් කැඳවන්නට වික්‍රමසිංහ මහතාට තිබූ අවශ්‍යතාව කුමක්ද? එම රැස්වීම් කැඳවූයේ මෙකී විධිමත් " දිස්ත්‍රික් ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීම්වලදී" සාකච්ඡා කළ නොහැකිවූ කරුණු සාකච්ඡා කිරීම පිණිසද? මෙකී විධිමත් රැස්වීම්වලදී සාකච්ඡා කළ නොහැකිවූ කරුණු මොනවාද? මෙම රැස්වීම්වලදී නෛතිකවූ කිසිදු කරුණක් සාකච්ඡා නොකර තිබෙන්නට කිසිදු හේතුවක් තිබිණිද?

මේ හේතුව නිසා යමෙකුට එළඹිය හැකි එකම නිගමනය වනුයේ බටලන්දේ රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලැබූ කරුණු " නීති විරෝධී" ඒවා බවයි.

කෙසේ වුවද, බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේද පැවැති රැස්වීම් සම්පූර්ණයෙන්ම වෙනස් ස්වරූපයක් ගත් රැස්වීම් විණි. ඒවා පවත්වන ලද්දේ අවිධිමත් තත්ත්වයන් යටතේය. රනිල් වික්‍රමසිංහ මහතා මූලාසනය දැරුවාවූ මෙම රැස්වීම්වල අරමුණු මුළුමණින්ම පැහැදිලි නැත. මෙම රැස්වීම් පවත්වන ලද්දේ කවර හේතුවක් නිසාදැයි පැහැදිලි කිරීමට ඊට සහභාගිවූවන් උත්සාහ දැරුවද අදාල කරුණු පැහැදිලි කිරීම් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව කිසිසේත්ම සෑහීමට පත් නොවේ. පොදු ස්ථාවරය වූයේ ආරක්ෂක තත්ත්වය සමාලෝචනය කිරීම සඳහාත්, පැවැති තත්ත්වයට මුහුණදීම පිණිස උපාය මාර්ග සැලසුම් කිරීම සඳහාත් එම රැස්වීම් පවත්වන්නට යෙදුණු බවයි. කෙසේ වුවත්, මෙම රැස්වීම්වලදී සාකච්ජා කරන ලද්දේ ජේ.වී.පී. සාමාජිකයන් යැයි සැක කරනු ලැබූ තැනැත්තන් විසින් කරනු ලැබූ කඩාකප්පල් ක්‍රියාවන් පමණකැයි සියළුම සාක්ෂිකරුවෝ පිළිගත්හ. කඩාකප්පල්කාරීන් ලෙසින් පෙනී සිටි පොදු අපරාධකරුවන්ගේ ක්‍රියාවන් පිළිබඳව ඔවුහු සාකච්ජා නොකළහ. නවීන අවි ආයුධ අතැතිව, මිනිමැරුම් හා පැහැරගෙන යාම් වැනි බිහිසුණු සාපරාධී කියාවන්හි යෙදෙමින් ලියාපදිංචි අංක තහඩුවලින් තොර වාහනවල නැගී සැරිසරමින් සිටි සන්නද්ධ කණ්ඩායම්වල ("සෝදිසි කණ්ඩායම් " යනුවෙන් හැඳින් වුණු) ක්‍රියාවන් ගැනද ඔවුහු සාකච්ජා නොකළහ. සාක්ෂිකරුවන් බොහෝ දෙනෙකු පිළිගත් පරිදි මෙම කාල පරිච්ජේදය තුළදී සුලබ දසුනක් වූ ප්‍රසිද්ධ ස්ථානයන්හි මළ සිරුරු හා ටයර් සෑයයන් මතුවීම පිළිබඳව ද ඔවුහු සාකච්ජා නොකළහ. ජේ. වී. පී. සාමාජිකයින්ගේ ක්‍රියාවන් පමණක් මෙම සාකච්ජාවන්ට විෂයය වූයේ මක්නිසාද? අදාල රැස්වීම් විධිමත් පදනමක් මත හා රජයේ තීරණයකට අනුව පවත්වන ලද්දේ නම් පූර්වෝක්ත කාරණා සාකච්ජාවට ලක්කොට තිසි තීරණවලට එළඹීම කළ යුතුව නොතිබිණිද?

මෙම කොමිෂන් සභාවේ සැලකිල්ල යොමුවූ අනෙක් කාරණය වනුයේ රනිල් වික්‍රමසිංහ මහතා මෙම රැස්වීම්වල මූලාසනය දැරුවේ ඇයිද යන්නය. වික්‍රමසිංහ මහතා රාජ්‍යාරක්ෂක අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා නොවූයේය. ස්වකීය නිල කාර්යයන් සම්බන්ධයෙන් නම් පොලීසියේ ක්‍රියාකාරකම් ඔහු විසින් අධීක්ෂණය කිරීමක් අවශ්‍ය නොවිණි. නතු එසේ විණි නම්, මෙකී රැස්වීම්වලට සහභාගී වෙමින් ඒවායෙහි මූලාසනය ඔහු විසින් දරන ලද්දේ මන්ද? බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ සිට ඔහු ඇත්ත වශයෙන්ම කැළණි ප්‍රදේශයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය ( CSU) මෙහෙයවමින් සිටියේ ය යන කාරණයෙන් ඔහුගේ ක්‍රියා කලාපය ආරම්භ වූයේද? මේ සම්බන්ධයෙන් වික්‍රමසිංහ මහතාගේ සංචාරක බංගලාවේදී පැවැත්විණැයි කියනු ලබන රැස්වීම්වලට අදාලව වින්සන්ට් ප්‍රනාන්දු නමැති සාක්ෂිකරු විසින් දෙනු ලැබූ සාක්ෂිය කෙනෙකුගේ මතකයට නැගේ. මෙම සාක්ෂියට බද්ධවී ඇත්තේ නීතිඥ විජයදාස ලියනාරච්චිගේ මරණයට අදාලව පවත්නා සාක්ෂියයි.

## නීතිඥ විජයදාස ලියනාරච්චි

නැසීගිය විජයදාස ලියනාරච්චි මහතා වෘත්තියෙන් නීතිඥවරයෙක් වූයේය. අළුත්කඩේ උසාවි සංකීර්ණයෙහි ස්වාධීනව නීතිඥ වෘත්තියෙහි නියැලීමට අමතරව, එක් අවධියක තඩු පැවැරුම් අධ්‍යක්ෂවරයා මෙන්ම ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ හිටපු සභාපතිවරයකු වූ ජනාධිපති නීතිඥ රංජිත් අබේසූරිය මහතාගේ කණිෂ්ඨ නීතිඥවරයෙකු වශයෙන් ද හෙතෙම ක්‍රියා කෙළේය. 1988 අගෝස්තු 25 වැනි දින හෝ එදිනදී පමණ හදිසියේම ඔහු අතුරුදහන් වූයේය. ඉක්බිතිව, නීතිඥවරයාගේ ආරක්ෂාව ගැන බලවත් සේ සැලකිලිමත් වූ අබේසූරිය මහතාත් සෙසු අයත්

වහාම මෙම අතුරුදහන්වූ තැනැත්තා සෙවීම පිණිස නොඉවසිලිමත්ව ක්‍රියා කළහ. ඔවුන් කෙළින්ම ගියේ මේ සම්බන්ධයෙන් යා යුතු යැයි ප්‍රත්‍යක්ෂ ලෙසින්ම පෙනී ගියාවූ ආයතනය වන පොලිසිය වෙතය. මීට හේතු වූයේ යමෙකු විසින් මෙම නීතිඥවරයා පැහැරගෙන යනු ලැබ ඇති බවට සැක කෙරෙන බවට සැකයක් තිබූ නිසා පමණක් නොව පොලිසිය විසින් මොහු සිරභාරයට ගෙන තිබෙන්නට ඉඩ ඇතැයි සැක කෙරුණු නිසාය. මෙම සැකයට තුඩුදුන් එක් හේතුවක් වූයේ නීතිඥ ලියනාරච්චි මහතා, පොලිසිය විසින් සිරභාරයට ගෙන රඳවා ගනු ලැබ තිබූ ජේ.වී.පී. සාමාජිකයන් යයි සැක කෙරුණු තැනැත්තන් වෙනුවෙන් ද ඔවුන් වෙනුවෙන් ගොනු කෙරුණු " හබයාස් කෝපුස් අයදුම්පත් සම්බන්ධයෙන්ද නිරතුරුවම පෙනී සිටි බැවිනි. මේ නිසා, මෙම නීතිඥවරයාට ජනතා විමුක්ති පෙරමුණ සමග සමීප සම්බන්ධතාවක් තිබිණැයි ඇතැමෙක් විශ්වාස කළහ. පොලිසිය විසින් මොහු සිරභාරයට හෙන තිබෙන්නට ඉඩ ඇතැයි සැක කරන ලද්දේ එහෙයිනි.

පොලිසිය විසින් ලියනාරච්චි මහතා සිරභාරයට ගනු ලැබ ඇත්දැයි අගෝස්තු මස 29 වැනි දිනදී අමාත්‍යාංශයේ ලේකම්වරයා එවක පොලිස්පතිවරයා ගෙන් විමසා ඇත්තේය. පොලිස්පතිවරයා මෙම කාරණය පිළිබඳව පෞද්ගලිකව කිසිවක් නොදත් බැවින් මේ සම්බන්ධයෙන් හෙතෙම මහ කොළඹ ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පති වෙතින් විමසීම් කළේය. තමන් යටතේ සේවය කරන පොලිස් නිලධාරීන් විසින් ලියනාරච්චි මහතා සිරභාරයට ගැනීමක් සිදුකරනු ලැබ නොමැති බවට ඔහු තහවුරු කළේය. අදාළ කාලසීමාව තුළදී රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ආරක්ෂක උපදේශක ලෙසින් ක්‍රියා කළාවූ රවි ජයවර්ධන මහතා ( හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාගේ පුත්‍රයා වන) පුදුම සහගත ලෙස එදිනම පොලිස්පතිවරයා වෙත ඇහවීමක් කරමින් නීතිඥ ලියනාරච්චි තංගල්ල පොලිසිය විසින් සිරභාරයට ගනු ලැබ " තිබිය හැකි" බව කීවේය. එබඳු හැඟීමක් රවි ජයවර්ධන මහතාට ඇතිවූයේ කෙසේදැයි අපි නොදනිමු. කෙසේ වුවද, ජයවර්ධන මහතා පොලිස්පතිවරයාට අහවා සිටි කාරණය කෙරෙහි පොලිස්පතිවරයා ඇඩි අවධානය යොමු කළේය. හෙතෙම වහාම දකුණු දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රේමදාස උඩුගම්පොල මහතාට ( තංගල්ල ප්‍රදේශය මොහුගේ අධීක්ෂණය යටතේ පැවැතිණි) කථා කොට අතුරුදහන්වී ඇති තැනැත්තා ගැන ඔහුගෙන් විමසා සිටියේය. එබඳු සිරභාරයට ගැනීමක් පිළිබඳව තමන් කිසිවක් නොදන්නා බව උඩුගම්පොල දැන්වූයේය. අනතුරුව, පොලිස්පතිවරයා, තංගල්ල භාර පොලිස් අධිකාරී කරවිටගේ ධර්මදාස මහතාගෙන් මෙම තත්ත්වය නිවැරදිදැයි සොයාබැලීමට ක්‍රියා කළේය. එවිට අදාළ නීතිඥවරයා තංගල්ල පොලිස් අත්අඩංගුවේ පසුවන බව හෙතෙම "අනියම් වශයෙන්" පිළිගත්තේය.

ලියනාරච්චිගේ ආරක්ෂාව ගැන දැඩිසේ සැලකිලිමත්වූ රංජිත් අබේසූරිය මහතා සහ සෙසු අයද මෙම නීතිඥවරයා තංගල්ලෙහි අත්අඩංගුවේ පසුවෙතැයි ඒ වන විට දැනගෙන සිටි බවක් පෙනී යයි. අගෝස්තු මස 31 වැනි දින උදෑසන අබේසූරිය මහතා රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වූ ජෙනරාල් සේපාල ආටිගල මහතා අමතමින් ලියනාරච්චි දකුණු පළාතෙහි රඳවා තබාගෙන සිටිද්දී ඔහුගේ ආරක්ෂාව සැක සහිත තත්ත්වයක පැවැතීම භීතිය දනවන කරුණක්ව ඇති බවට කරුණු සැලකර සිටියේ එබැවිනි. ලියනාරච්චි රඳවා තබා ගැනීම විධිමත් කරවා ගත යුතුයැයි අමාත්‍යාංශයේ ලේකම්වරයා ද අදහස් කළේය. ඒ අනුව, ලියනාරච්චි නම් සැකකරු වෙත රඳවා තබා ගැනීමේ නියෝගයක් භාරදීමට පියවර ගන්නා ලෙසින් හෙතෙම නියෝජ්‍ය පොලිස්පතිවරයාට (උඩුගම්පොල මහතාට) නියම කළේය. මෙම රඳවා තබාගැනීම විධිමත් කරනු ලැබූ පසු අදාළ බලධාරීන් විසින් ලියනාරච්චිට අධිකරණමය ක්‍රියා දාමයෙන්

පරිබාහිරව කිසිවක් නොකෙරුණු ඇති බවට එමගින් සහතික කෙරෙනු ඇතැයි ආටිගල මහතා විශ්වාස කළේය. කෙසේ වුවද, සැකකරු තවදුරටත් දකුණු පළාතෙහි රඳවා තබා ගැනීම ගැන රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාත්, පොලිස්පතිවරයාත් යන දෙදෙනාම කැමැත්තක් නොදැක්වූහ. නීතිඥවරයා දකුණු පළාතෙහි රඳවා තබාගෙන සිටියදී ඔහුගේ ආරක්ෂාව සහතික කර ගැනීම ඔවුන්ට නුපුළුවන් බවක් පෙනී ගිය හෙයින් සැකකාර නීතිඥවරයා කොළඹට මාරු කිරීම සඳහා කටයුතු සැලසීමට ඔවුන් විසින් තීරණය කරන ලදී. සැකකරුගේ ආරක්ෂාව තහවුරු කරගනු පිණිස ඔහු කොළඹට ගෙනෙනු ලබන බවට එදිනම ඔවුහු අබේසූරිය මහතාට සහතික වූහ.

මේ අතර, අර්නස්ට් පෙරේරාගේ සාක්ෂියට අනුව 31 වැනි දින දහවල් 12.00 ට පමණ රනිල් වික්‍රමසිංහ මහතා ඔහුට දුරකථනයෙන් කථා කොට, සැකකරු කොළඹට ගෙනැවිත් " කැලණි කොට්ඨාසය තුළ ක්‍රියාත්මක වන විශේෂ කණ්ඩායමට" භාරදීමට පොලිස්පතිවරයා විසින් කටයුතු සලස්වාලීම " තමා අපේක්ෂා කරන" බව දන්වා සිටියේය. මේ අනුව, මෙම සැකකරු තංගල්ලේ සිට වික්‍රමසිංහ මහතා විසින් සඳහන් කෙරුණු පොලිස් ඒකකයට මාරුකිරීම පිණිස කටයුතු සලස්වාලන මෙන් පොලිස්පතිවරයා විසින් තිසි උපදෙස් දෙන ලදී. ලියනාරච්චි ගෙනෙනු ලැබූ විගස ඔහු භාරගැනීමට ක්‍රියා කරන ලෙස පොලිස්පතිවරයා සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් ද කැඳවා ඔහුට උපදෙස් දුන්නේය. තසැප්තැම්බර් මස පළමුවැනි දිනදී මාතර පොලිසියේ පරීක්ෂක කුලරත්න විසින් සැකකරු ලියනාරච්චි තංගල්ලේ සිට සපුගස්කන්දට මාරු කරන ලදී. සපුගස්කන්දට ගෙනෙනු ලැබූ විට ඔහු භාරගන්නා ලද්දේ කැලණි ප්‍රදේශයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි ස්ථාන භාර නිලධාරී පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ විසිනි.

ලබාගතහැකි සාක්ෂිවලට ( කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ (CSU) පරීක්ෂක වික්‍රමසිංහ සහ සෙසු නිලධාරීන් විසින් ඇතුලත් කෙරුණු සටහන් මත පදනම්ව ඇති) අනුව ලියනාරච්චි තරමක් අසනීප තත්ත්වයෙන් පසුවූ බැවින් ඔවුන් විසින් ඔහුගෙන් ප්‍රශ්න කිරීම නොකරනු ලැබ ඇත. සැප්තැම්බර් 02 වැනි දින සැන්දෑව වන විට ලියනාරච්චිගේ තත්ත්වය නරක අතට හැරිණ. කොළඹ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ උපදෙස් මත පරීක්ෂක වික්‍රමසිංහ විසින් සැප්තැම්බර් මස 02 වැනි දින ප.ව. 11.00ට පමණ ලියනාරච්චි කොළඹ මහ රෝහලේ හදිසි අනතුරු සේවා අංශයට ඇතුලත් කරන ලදී. අනතුරුව, ලියනාරච්චි එම රෝහලේ දැඩි සත්කාර ඒකකයට මාරු කෙරිණි. මධ්‍යම රාත්‍රිය පසුවී විනාඩි තිහකට පමණ පසුව මෙම රෝගියාගේ හුස්ම ගැනීම ඇණහිටි අතර, හදවත පණ ගැන්වීමට ගත් උත්සාහය ව්‍යර්ථවිය. ඔහු මියගිය බවට පසුදින පෙ.ව. 12.55ට සහතික කෙරිණි. මියගිය පුද්ගලයාගේ පශ්චාත් මරණ පරීක්ෂණය කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරී - වෛද්‍ය එල්.බී. ද අල්විස් මහතා විසින් පවත්වනු ලැබිණි. ඔහුගේ නිගමනයන්ට අනුව විජයදාස ලියනාරච්චි මියගොස් ඇත්තේ " මොට ආයුධ වලින් සිදුකෙරුණු බහුවිධ පේශි හා සැකිලි තුවාල නිසා හටගත් කම්පනයෙන් හා ලේ ගැලීමෙනි" මියගිය ලියනාරච්චිගේ සිරුරෙහි තිබී ඔහුගේ මරණයට පෙර සිදුවූ බාහිර තුවාල ආසන්න වශයෙන් 207ක් වෛද්‍ය අල්විස් මහතා විසින් සටහන් කරගනු ලැබ ඇත. මෙය, මියගිය අයගේ සිරුර පුරාම තිබූ නොයෙකුත් අභ්‍යන්තර තුවාලවලට අමතර වශයෙන් වූවකි. අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් කරන්නට යෙදුණු පුළුල් පරීක්ෂණයන්ට ( ඖතිකවේදිය අධ්‍යයනයන් ලෙසින්) අනුව ලියනාරච්චිගේ සිරුරෙහි දක්නට ලැබුණු තුවාල වලින් බොහොමයක්ම ඔහුගේ මරණයට දින තුනකටත් අටකටත් අතර කාලයකට පෙර සිදුව තිබූ ඒවා විණි. මෙය වූකලී " පොලීසිය විසින් පහරදීම" නිසා සිදුවූ මරණ පිළිබඳ තවත් අපූර්ව නිදසුනකි.

මෙම මතය, ලියනාරච්චිගේ මරණයට හේතුවූ තුවාල ඔහුට සිදුකිරීම සම්බන්ධයෙන් හඳුනාගත හැකි පුද්ගලයින්ට වගකීම පවරනු පිණිස විමර්ශකයින්ටත් නඩු පැවරුම් බලධාරියාටත් ප්‍රත්‍යක්ෂ වශයෙන්ම උපකාරීවී තිබේ. තමන් තවත් පොලිස් නිලධාරීන් දෙදෙනෙකුත් සමග කොළඹට විත් අගෝස්තු මස 22 වැනි දිනදී ලියනාරච්චි මහතා අත්අඩංගුවට ගත් බවත්, අනතුරුව ඔහු තංගල්ලට ගෙනැවිත් තම "නිල නිවාසයෙහි" රඳවා තබා ගත් බවත් විජයදාස ලියනාරච්චිගේ මරණය පිළිබඳව පැවැති මරණ පරීක්ෂණයේදී තංගල්ල පොලිස් අධිකාරී කරව්ටගේ ධර්මදාස විසින් පිළිගන්නට යෙදුණි. රඳවා තබා ගනු ලැබූ කාලපරිච්ඡේදය තුළ ඔවුන් ලියනාරච්චිගෙන් ප්‍රශ්න කිරීම් කළ බව පිළිගත් නමුත් තමන් විසින් සැකකරුට වධ පමුණුවාලීම කරන ලදැයි කීම ඔවුහු ප්‍රතික්ෂේප කළහ. ඉහතින් පිළිගන්නට යෙදුණු කරුණුත් අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ මතයත් පාදක කොට ගෙන ගරු නීතිපතිවරයා විසින් පොලිස් අධිකාරී කරව්ටගේ ධර්මදාසටත් ඔහුගේ යටත් නිලධාරීන් දෙදෙනාටත් එරෙහිව මිනීමැරීමට කුමන්ත්‍රණය කිරීම සහ ලියනාරච්චිගේ මරණය සිදුකිරීම සම්බන්ධයෙන් අධි චෝදනා ඉදිරිපත් කරන ලදී.

මෙම නඩු විභාගය මහාධිකරණ විනිසුරුවරුන් තිදෙනෙකුගෙන් සැදුම්ලත් ජූරි සභාවක් රහිත විනිශ්වය මඩුල්ලක් ඉදිරියේ පැවැත්විණ. මෙම නඩු විභාගය ආරම්භ කරන ලද්දේ 1989 දෙසැම්බර් මාසයේදීය. අධිචෝදනා පත්‍රයෙහි අඩංගු චෝදනාවන්ට තමන් "නිවැරදි කරුවන් බව" චූදිතයෝ කියා සිටියහ. ඒ අනුව, නඩු විභාගය ඇරඹිණ. මෙම නඩු විභාගය අවසානයේදී තීන්දුව ප්‍රකාශ කිරීමට පෙර හදිසියේන්ම හා අනපේක්ෂිත අන්දමින් චූදිතයෝ තමන් ලියනාරච්චි පැහැරගෙන යාම සහ අයුතු ලෙස සිරකර තැබීම සම්බන්ධයෙන් වරදකරුවන් යැයි කියා සිටියහ. අධිකරණය ඉදිරියෙහි සිටින වරදකරු විසින් සැබවින්ම ලියනාරච්චි ඝාතනය කරන ලද බව සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමට පැමිණිල්ලට නොහැකි වී ඇතැයි යන පදනම මත විශේෂ අධිකරණ විභාගය විසින් මෙම චූදිතයෝ මිනී මැරීමේ චෝදනාවෙන් නිදොස් කර නිදහස් කරනු ලැබූහ. මෙහිදී සලකා බැලීම සඳහා මතුවන ප්‍රශ්නය වනුයේ අධිචෝදනා ලැබුවෝ ලියනාරච්චිගේ මරණයට හේතුවූ නිර්දය ලෙස පහරදීම සම්බන්ධයෙන් වගකිවයුත්තන් නොවෙත් නම්, එම පහරදීම කළේ කවුරුන් දැයි යන්නයි. ලියනාරච්චිගේ මරණය සම්බන්ධයෙන් සැබැවින්ම වගකිවයුත්තෝ කවුරුහුද? කරව්ටගේ ධර්මදාස සහ ඔහුගේ නිලධාරීන් හැරුණුවිට, වෙනත් පුද්ගලයෝ ලියනාරච්චිට පහරදීම කළෝද? එසේ නම්, එපරිදි පහරදීම කරන ලද්දේ ඔහු තංගල්ලේ රඳවාගනු ලැබ සිටිද්දීද නැතහොත් ඔහු සපුගස්කන්දේ සිටිද්දීද? මෙම ප්‍රශ්න වලට උත්තර දිය හැක්කේ අදාළ සාපරාධී ක්‍රියාවට වගකිවයුතු පුද්ගලයින්ට පමණකි.

කෙසේ වෙතත්, ලියනාරච්චි සපුගස්කන්දේ රඳවාගනු ලැබ සිටි කාලසීමාවට අදාළව පහත සඳහන් ලක්ෂණයන් අපි නිරීක්ෂණය කරමු. ලියනාරච්චි සපුගස්කන්ද පොලිස් ස්ථානයට ගෙන එනු ලැබිණැයි කියනු ලබන දිනදීම, ඒ මොහොත වනතෙක්ම පෑලියගොඩ පොලිස් ස්ථානයේ සිට ක්‍රියාත්මක වූ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය (CSU) සපුගස්කන්ද පොලිස් ස්ථානයට මාරු කරනු ලැබීම පුදුම එළවන කාරණයකි. සත්‍ය වශයෙන්ම, නිල සටහන් වලට අනුව, මෙම කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය මාරු කරනු ලැබූවායින් පසුව සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි රඳවාගනු ලැබූ පළමුවෙනි සහ එකම සැකකරු වූයේ ලියනාරච්චි ය. ඉහත කී මාරුකිරීම සම්බන්ධයෙන් වලංගු හේතුන් කිසිවක් දැක්වීමට නොහැකි වී ඇත. මෙම කොමිෂන් සභාව විසින් ප්‍රශ්න කරන්නට යෙදුණු කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි කිසිදු පොලිස් නිලධාරීන් දෙදෙනකුට මෙම කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය පෑලියගොඩ සිට සපුගස්කන්දට ගෙනයාම පිළිබඳව එකම සාක්ෂියක් දිය නොහැකි විණි. මෙලෙසින් කරන ලදැයි

කියනු ලබන කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය පැලියගොඩ සිට සපුගස්කන්දට මාරු කිරීමේ පරමාර්ථය සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාවට බලවත් සැකයන් ඇතිවී තිබේ. ලියනාරච්චිගේ මරණයෙන් පසුව අතීතයට බලපාන පරිදි එය ක්‍රියාත්මක කරන ලද්දේද? ඉහතින් සඳහන් කෙරුණු පරිදි කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය මුලින්ම පිහිටුවන ලද්දේ පැලියගොඩ පොලිස් ස්ථානයෙහිය. පැලියගොඩ පොලිස් ස්ථානය ප්‍රධාන නුවර පාරේ පිහිටා තිබේ. කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය, පැලියගොඩ පොලිස් ස්ථානයෙහි පිහිටා තිබූ බව සාමාන්‍යයෙන් කවුරුත් දන්නා කරුණකි. ලියනාරච්චි කොළඹට මාරු කරනු ලැබූ පසු ඔහු කැලණි ප්‍රදේශයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි රඳවාගෙන සිටින බව ඔහුගේ ආරක්ෂාව පිළිබඳ උනන්දුවක් දැක්වූ පුද්ගලයින් ( රංජිත් අබේසූරිය මහතා වැනි) වෙත දැනුම් දෙන්නට පොලිස්පතිවරයාට සිදුවූයේය. එසේ නම්, අබේසූරිය මහතා සහ සෙසු නීතිඥයින් නිශ්චිතවම අදාල බලධාරීන්ගෙන් අවසරය ලබා ලියනාරච්චි බැලීම පිණිස පැලියගොඩ පොලිස් ස්ථානය වෙත යන්නට ඉඩ තිබිණි. මෙම අවස්ථාව වනවිට, ලියනාරච්චිගෙන් ප්‍රශ්න කිරීමේ සහ ඔහුට වධ පමුණුවාලීමේ කටයුතු වලට සම්බන්ධ වූ තැනැත්තෝ ලියනාරච්චි කිසිදු පිටස්තරයකුට පෙන්වන්නට සූදානම් නොවූහ. හෙතෙම සත්තකින්ම කිසිවකුට පෙන්විය හැකි තත්ත්වයක නොසිටියේය. තවද, මෙම අවස්ථාව වනවිට, සැබැවින්ම ලියනාරච්චි බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙහි රඳවාගනු ලැබ සිටියේය. සපුගස්කන්ද පොලිස් ස්ථානයේදී කරන ලදැයි කියනු ලබන ලියනාරච්චිට ආරක්ෂාව සැපයීමට අදාල ව සාක්ෂි දුන් පොලිස් නිලධාරීන්ගේ සාක්ෂි සියල්ලක්ම සැලකිල්ලට ගන්නා ලදුව එකී සාක්ෂි අපි සහමුලින්ම ප්‍රතික්ෂේප කරමු. එසේ කරන ලදැයි කියනු ලබන කැලණි කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය පැලියගොඩ සිට සපුගස්කන්දට මාරු කිරීම එපරිදි ක්‍රියාත්මක කරන ලද්දේ හුදෙක්ම ලියනාරච්චි, සපුගස්කන්දේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි රඳවාගනු ලැබ සිටින බව හඟවනු පිණිසය යන නිගමනයට මෙම කොමිෂන් සභාව ස්ථිර වශයෙන්ම එළඹී ඇත.

මේ සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ මහතා මැදිහත්වූයේ ඇයිද යන්නත්, ලියනාරච්චි කොළඹට ගෙනැවිත් කැලණි කොට්ඨාසයේ ක්‍රියාත්මක වන විශේෂ ඒකකයට භාරදෙන මෙන් ඔහු දන්වා සිටියේ ඇයිද යන්නත් සැකයට තුඩු දෙන්නකි. මෙම සැකකරු, කැලණි කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට භාරදෙනු ලැබීමක් වික්‍රමසිංහ මහතා බලාපොරොත්තු වූ බව පැහැදිලි කරුණකි. මෙම කොමිෂන් සභාව හමුවේ වික්‍රමසිංහ මහතා පිහිටා සිටි ස්ථාවරය වූයේ එලෙස ක්‍රියා කරන මෙන් තමන් කිසිදු අවස්ථාවකදී දුරකථනයෙන් පොලිස්පතිවරයා අමතා උපදෙස් නොදුන් බවයි. පොලිස්පතිවරයා දුරකථනයෙන් තමාට කථා කොට ලියනාරච්චි තංගල්ලේ සිට කොළඹට මාරු කිරීමට ඔවුන් එළඹී තීරණය තමාට දැනුම්දුන් අතර, ලියනාරච්චි රඳවා තබාගැනීම සඳහා සපුගස්කන්දට එවනු ලැබීම ගැන තමන්ගේ විරුද්ධත්වයක් ඇත්දැයි ඔහු විමසා සිටියේය යන්න වික්‍රමසිංහ මහතාගේ ස්ථාවරය විය. ඊට තමාගේ `විරුද්ධත්වයක් නොමැති බව වික්‍රමසිංහ මහතා පළ කළේය. මෙම තත්ත්වය, 1999 සැප්තැම්බර් මස 06 වෙනි දිනදී තමන් විසින් පිළියෙල කෙරුණු සටහනක් පාදක කොටගෙන මෙම කොමිෂන් සභාව හමුවේ පොලිස්පතිවරයා ප්‍රකාශ කර සිටි කරුණු වලට ඉඳුරාම වෙනස් වූවකි. `එක්ස් `85 යනුවෙන් ලකුණු කොට මෙකී ලේඛණයෙහි පිටපතක් ඔහු විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. ලියනාරච්චි අත්අඩංගුවට ගැනීමට සහ රඳවා ගැනීමට තුඩුදුන් සිද්ධීන් මාලාව විස්තරාත්මකව දැක්වෙන සටහනක් පිළියෙල කරන මෙන් ලියනාරච්චිගේ මරණය සිදුවී වැඩි කලක් යාමට පෙර ලලිත් ඇතුලත්මුදලි මහතා පොලිස්පතිවරයාට දැනුම් දුන්නේය. ඇතුලත්මුදලි මහතා

එසේ දැනුම් දී සිටියේ ලියනාරච්චිගේ මරණය පිළිබඳව පාර්ලිමේන්තුවේදී අසනු ලැබූ ප්‍රශ්ණයකට පිළිතුරු සපයන්නට මෙම සටහන අවශ්‍යව තිබූ බැවිනි. ` එක්ස් ` 85 යනුවෙන් ලකුණු කොට ඇත්තේ මේ සම්බන්ධයෙන් අර්නස්ට් පෙරේරා විසින් සකස් කරන්නට යෙදුනු සටහනෙහි පිටපතකි. මෙම සැකකරු කොළඹට ගෙනැවිත් කැළණි පොලිස් කොට්ඨාසයෙහි ක්‍රියාත්මක වන විශේෂ ඒකකයට භාරදෙන මෙන් දන්වා සිටියේ රනිල් වික්‍රමසිංහ මහතා බව එම සටහනෙහි පැහැදිලිව දැක්වෙයි. රනිල් වික්‍රමසිංහ මහතා කෙරෙහි අහිතකරව බලපාන්නා වූ සමකාලීන වැරදි සටහනක් 1988 වර්ෂයේදී තරම් ඉහතදී පොලිස්පතිවරයා විසින් කරන ලද්දේ ඇයි? සත්‍ය වශයෙන්ම, අර්නස්ට් පෙරේරා මෙම කොමිසන් සභාව හමුවේ මීට අදාලව ප්‍රකාශ කලා වූ කරුණු සාවද්‍ය විණි නම්, වික්‍රමසිංහ මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා අර්නස්ට් පෙරේරාගෙන් හරස් ප්‍රශ්න ඇසීමට ඉදිරිපත් නොවූයේ ඇයි? වික්‍රමසිංහ මහතා වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීම සඳහා එබඳු අයදුමක් කරනු නොලැබිණි. තවද, මේ සම්බන්ධයෙන් වික්‍රමසිංහ මහතා සඳහන් කල දැ නිවරැදි විණැයි අප උපකල්පනය කලා වුවද, කර්මාන්ත අමාත්‍යවරයා කැළණි ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ විශේෂ ඒකකය සැබැවින්ම පාලනය කිරීමක් හා මෙහෙයවීමක් කරමින් නොසිටියේ නම්, ලියනාරච්චි රඳවා තබාගැනීම සඳහා සපුගස්කන්දට ( අමාත්‍යවරයා විසින් නියෝජනය කෙරුණු මැතිවරණ කොට්ඨාසය තුල පිහිටි ) ගෙනෙනු ලැබීම ගැන ඔහුගේ කිසියම් විරුද්ධත්වයක් තිබේද යන වග මෙරට පොලිස්පතිවරයා ඔහුගෙන් ඇසිය යුත්තේ ඇයි? කෙසේවතුදු, මෙම ප්‍රශ්නයට ලක්වී ඇති කාරණය පිළිබඳව වූ අර්නස්ට් පෙරේරාගේ සාක්ෂිය සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාවට කිසිදු සැකයක් නොමැති අතර ඒ අනුව, මෙම කොමිෂන් සභාව වික්‍රමසිංහ මහතාගේ සාක්ෂිය එකහෙලා ප්‍රතික්ෂේප කරන බව අපි පැහැදිලිවම සඳහන් කරනු කැමැත්තෙමු.

එම තර්කාංගය මත පිහිටා උත්තර දියයුතුව ඇති ප්‍රශ්නය වනුයේ පූර්වෝක්ත විශේෂ ඒකකයට ලියනාරච්චි භාරදෙන ලෙස වික්‍රමසිංහ මහතා පොලිස්පතිවරයාට දන්වා සිටියේ ඇයිද යන්නය. මෙකී ` පොලීසියට අදාල වූ කාරණයෙහි` ලා පැටලෙන්නට වික්‍රමසිංහ මහතාට තිබූ අවශ්‍යතාව කුමක්ද? ඔහුගේ ක්‍රියා කලාපය, කැළණි කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි කටයුතු වලට ඔහුගේ ඇති සම්බන්ධකම තුලින් මතුවූවක්ද? එය සැබැවින්ම කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් ඔහු විසින් කෙරුණු නිල කටයුත්තක් නොවූයේය. ලියනාරච්චිගෙන් ප්‍රශ්න කිරීමෙහිලා කැළණි කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය උනන්දුවක් දැක්වූවා වූවද එම කාර්යය සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් විසින් ඉටු කලයුතුවූවක් විණි. මෙම සිද්ධිය වූකලී වික්‍රමසිංහ මහතා කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි කටයුතු වලට කෙතෙක්දුරට පැටලී තිබේදැයි යන්න පැහැදිලිවම කියා පාන්නකි. බටලන්ද නිවාස සංකීර්ණයෙහි පවත්වනු ලැබූවා යැයි සම්මත ` රැස්වීම් ` කෙතෙක්දුරට මෙහිලා අදාල වනුයේද යන්න කෙනෙකුට දැන් පෙනී යනු ඇත. මීට අමතරව පොලිස්පතිවරයාගේ සාක්ෂිය ඇති අතර එමගින් ඔහු කියා සිටියේ බටලන්ද නිවාස සංකීර්ණය තුල පිහිටි නිවසක සිට මෙකී ` විශේෂ ඒකකය` ඇත්තවශයෙන්ම ක්‍රියාත්මක වූ බවක් තමා දන්නා වගය. එසේ නම්, ලියනාරච්චි සත්‍ය වශයෙන්ම ගෙනෙන ලද්දේ කවර ස්ථානයකටද? එකී ස්ථානය සපුගස්කන්ද පොලිස් ස්ථානය නොව බටලන්ද නිවාස සංකීර්ණයෙහි පිහිටි නිවාසයක් බව පෙනෙන්නට ඇත.. ලියනාරච්චි ඝාතනය සම්බන්ධයෙන් පොලිස් අධිකාරී කරවිටගේ ධර්මදාස සහ ඔහුගේ යටත් නිලධාරීන් වරදකරුවන් නොකිරීමෙන් විශේෂ අධිකරණ විභාගයේදී

විනිසුරුවරුන් දක්වා ඇති දූරදර්ශීභාවය මෙම කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබූ විමර්ෂණයන් ගෙන්ද කොමිෂන් සභාව හමුවේ අනාවරණය වූ සාක්ෂි වලින්ද පැහැදිලිව හෙළිවන්නකි.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙහි පිහිටි නිවාසයන්ට අදාලව ඒවායේ පිහිටීම සැකෙවින් දැක්වෙන උපලේඛණයක් මීට යාකර ඇත.

## VI වන පරිච්ඡේදය

### සපුගස්කන්ද පොලිස් ස්ථානයට පහරදීම

කලින් සඳහන් වුණු පරිදි, කැලණි කොට්ඨාසය තුළ ක්‍රියාත්මක වූ සපුගස්කන්ද පොලිස් ස්ථානය සාපේක්ෂ වශයෙන් කුඩා පොලිස් ස්ථානයකි. 1989 වර්ෂයේදී එය ' සී ' ශ්‍රේණියේ පොලිස් ස්ථානයක් වශයෙන් වර්ග කරනු ලැබ ඇත. මෙම පොලිස් ස්ථානයේ ප්‍රධාන මහල් ගොඩනැගිලි දෙක තරමක් අළුත් ගොඩනැගිලි වූ අතර එය පිහිටියේ කිරිබත්ගොඩ - බියගම මාර්ගයෙන් මීටර් 10 ක් පමණ ඈතිනි. සපුගස්කන්ද පොලිස් ස්ථානයේ නිලධාරීන්ට පැවරී තිබූ ප්‍රධාන රාජකාරිය වූයේ සපුගස්කන්ද තෙල් පිරිපහදුවට ආරක්ෂාව සැපයීමය. කෙසේ වුවද එම ආයතනයෙහි අභ්‍යන්තර ආරක්ෂාව සලසාලීම සපුගස්කන්ද පොලිස් ස්ථානයට පවරනු ලැබ නොතිබිණි. වෙනත් කවර පොලිස් ස්ථානයක මෙන් මෙම පොලිස් ස්ථානයෙහි නිලධාරීන් විසින්ද සාමාන්‍ය ආරක්ෂක හා පොලිස් රාජකාරි ඉටුකලයුතු විණි. ඔවුනට පැවරී තිබූ එක් ප්‍රධාන ආරක්ෂක රාජකාරියක් වූයේ රනිල් වික්‍රමසිංහ මහතා මෙම ප්‍රදේශයට පැමිණි විටදිත් බටලන්ද නිවාස සංකීර්ණයෙහි ඔහු පදිංචිව සිටින විටදිත් ආරක්ෂාව සැපයීමය. වික්‍රමසිංහ මහතා පදිංචි වූ අදාල නිවාසයෙහි ආරක්ෂක රුකවලෙහි යෙදීමත් හාන්පස ප්‍රදේශයෙහි රුකවල් රාජකාරියෙහි යෙදීමත් මෙම පොලිස් ස්ථානයෙහි නිලධාරීන් වෙත පැවරී තිබිණි.

1989 ජුලි 11 වන දිනදී පොලිස් පරීක්ෂක ලලිත් මහානාම මහතා සපුගස්කන්ද පොලිස් ස්ථානාධිපති වශයෙන් රාජකාරි භාරගත්තේය. මෙම පොලිස් ස්ථානයෙහි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති වූයේ උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශණ මහතායි.

1989 ජුලි 16 දින රාත්‍රිය සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි නිලධාරීන්ට විශේෂ දිනයක් නොවිණි. අළුතින් පත්වූ පොලිස් ස්ථානාධිපති ලලිත් මහානාම මහතා උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශණ ද කැටුව සාමාන්‍ය රාජකාරියක යෙදී පෙරළා පොලිස් ස්ථානයට විත් පොලිස් ස්ථානයෙහි බිම් මහලේ පිහිටි විවේකාගාරයෙහි විවේක ගනිමින් සිටියේය. උප පොලිස් පරීක්ෂක ප්‍රියදර්ශණ මහතා තවදුරටත් රාජකාරියෙහි නිරත වූයේය. මොහු මෙම පොලිස් ස්ථානයෙහි ඊළඟට ජ්‍යෙෂ්ඨතම නිලධාරියා විය. ලලිත් මහානාම විසින් ප්‍රියදර්ශණ වෙත උපදෙස් දෙන ලද පරිදි හෙතෙම තවත් නිලධාරීන් සිව් දෙනකු කැටුව 17 වෙනි දින අළුයම 2.00 පමණ ජංගම රාජකාරියෙහි යෙදෙනු පිණිස පොලිස් ස්ථානයෙන් බැහැරව ගියේය.

අළුයම 2.55 ට පමණ හිටි හැටියේම පොලිස් ස්ථානයේ ඉහළ මාලයේ පසු භාගයෙහි විශාල පිපිරීමක් හට ගත්තේය. මෙම විශාල පිපුරුම ඇසීමෙන් නිලධාරීහු ස්වකීය විවේකස්ථානයන්හි සිට සැණෙකින් නින්දෙන් අවදිවූහ. මෙම පිපිරීමේ ශබ්දය සැතපුම් ගණනාවක් දුරින් පදිංචිව සිටි තැනැත්තන්ට පවා ඇසී ඇත. සත්‍ය වශයෙන්ම, ඒ වනවිට සැතපුම් ගණනාවක් ඈත මාවරමංඩියෙහි සිටි උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශණ ඇතුළු කණ්ඩායමටද මෙම ශබ්දය ඇසිණි. යමක් සිදුවී ඇතැයි සැක කළ ඔවුහු වහාම රාජකාරි ස්ථානය බලා ආපසු ඒමට පිටත් වූහ. එසේ ආපසු ඒමට පෙර සපුගස්කන්ද පොලිස් ස්ථානය ඇමතීමට උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශණ උත්සාහ දැරුමුත් ජංගම පණිවුඩ

හුවමාරු යන්ත්‍රය සමඟ සම්බන්ධතාවක් ඇතිකර ගැනීමට ඔහුට නොහැකි විණි. ඉක්බිතිව හෙතෙම කඩවත පොලිස් ස්ථානයට කථා කොට තමන්ට ඇසීමට ලැබුණු විශාල ශබ්දය පිළිබඳව එම නිලධාරියාට අනතුරු ඇඟවීමක් කළේය. තවද, සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි යම් කරදරයක් සිදුවී ඇතැයි අවට පොලිස් ස්ථාන වලට දන්වා සිටින ලෙසද හෙතෙම ඉල්ලීමක් කළේය. සපුගස්කන්ද ගුවන් විදුලි පණිවුඩ හුවමාරුවෙහි නිරතව සිටි නිලධාරියා ඔහුගේ ඇමතුමට පිළිතුරු නොදුන් හෙයින් හෙතෙම මෙම නිගමනයට එළඹෙන්නට ඇතුවා විය හැක.

සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි මෙම ශබ්දය ඇතිවීමත් සමඟම ගොඩනැගිල්ලේ දකුණු පැත්තෙන් පොලිස් ස්ථානයට වෙඩිතැබීමෙන් පහරදීමක් එල්ල වී තිබේ. ගොඩනැගිල්ලේ එම පැත්තෙහි හදිසි මරණ පරීක්ෂකවරයකුට අයත් හිස් ඉඩමක් පිහිටා තිබිණි. පොලිස් ස්ථානයෙහි ප්‍රධාන දොරටුව ( මෙය ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපිට පිහිටා ඇත) අසල මුරපොළෙහි ආරක්ෂක රාජකාරියෙහි නිරත නිලධාරීහු මෙම හිස් ඉඩම පැත්තෙන් පොලිස් ස්ථානයේ ප්‍රධාන ගොඩනැගිල්ලට කිසියම් පුද්ගලයින් පිරිසක් විසින් වෙඩි ප්‍රහාරයක් එල්ල කරනු දැක ඇත්තාහ. පොලිස් ස්ථානය පිහිටි භූමි භාගයත් හිස් ඉඩමත් වෙන් කෙරෙන තාප්පය උඩට ඇතැම් ප්‍රහාරකයෝ නැඟගත්හ. ප්‍රහාරකයන් අතුරින් ඇතමෙකු පොලිස් ස්ථානය පිහිටි භූමිභාගයට ඇතුළුවී පොලිස් ස්ථානය පිහිටි ගොඩනැගිල්ලටද වැදී සිටිනු දක්නට ලැබී ඇත. නින්දෙන් අවදි වූ පොලිස් පරීක්ෂක ලලිත් මහානාම මෙකී ප්‍රහාරකයින්ට වෙඩි තැබීමෙන් ප්‍රති ප්‍රහාරයක් එල්ලකිරීම අරඹා ඇත. කෙසේ වෙතත්, එක් ප්‍රහාරකයකු මහානාම සිටි කාමරය සමීපයටම විත් ඔහුට වෙඩි තබා මරා දමන්නට සමත්වී ඇත. මෙම අවස්ථාවේදී හෝ එම වේලාවේදී පමණ අතිකුත් නිලධාරීන් යටත් වියයුතු යයි ප්‍රහාරකයෝ බලකර සිටියහ. පොලිස් සැරයන් රූපානන්ද සහ ආරියරත්න අතිකුත් නිලධාරීනුත් සමඟ මෙම ප්‍රහාරයට ප්‍රති ප්‍රහාරයක් වශයෙන් වෙඩි තැබීමට නිර්භයව ඉදිරිපත් වූහ. මෙම වෙඩි ප්‍රහාරය තරමක වේලාවක් පැවතිණි. පොලීසියේ ප්‍රති ප්‍රහාරය හමුවේ මෙම ප්‍රහාරකයෝ පොලිස් ස්ථානය පිහිටි භූමි භාගයට ඇතුළු වූ මාර්ගයෙන්ම පසුබසින්නට වූහ. මෙම වෙඩි ප්‍රහාරය නිමාවට පත්වෙන්ම යුධ හමුදා නිලධාරීන් කණ්ඩායමක්ද සිද්ධිය වූ ස්ථානයට ආහ. එම අවස්ථාව වනවිටදීම උප පොලිස් පරීක්ෂක ප්‍රියදර්ශණ ඇතුළු කණ්ඩායමද පෙරලා පැමිණ සිටියහ. මෙම කණ්ඩායම් දෙකම තුවක්කු ප්‍රහාර එල්ල කරන්නට වූහ. කෙසේ වුවද, මෙම ප්‍රහාරයට නිර්භීතව මුහුණ දෙමින් ප්‍රහාරකයන් පලවා හැරීමේ ප්‍රධාන බලවේගය සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි එම ප්‍රහාරය එල්ල වූ අවස්ථාවේ සිටි නිලධාරීන් ස්වල්පදෙනා බව ඔවුනට ප්‍රශංසා මුඛයෙන් සඳහන් කළයුතුව ඇත. පරීක්ෂක මහානාම, උපසේවා කොස්තාපල් 6584 සරත් කුමාර සහ 12336 දයානන්ද වැනි පොලිස් ස්ථානය පිහිටි ගොඩනැගිල්ලේ ඇතුළත සිට ප්‍රති ප්‍රහාර එල්ල කළාවූ නිලධාරීන් ඇතමෙකු ප්‍රහාරයේදී ලත් තුවාල හේතුකොට ගෙන ජීවිතක්ෂයට පත්විමෙනුත් සැරයන් රූපානන්ද සහ තවත් තැනැත්තකු වෙඩි වැදී තුවාල වීමෙනුත් මෙකරුණ පැහැදිලි වන්නේය. තවද, ප්‍රධාන ගොඩනැගිල්ල ඇතුළත සිටි එමෙන්ම ගොඩනැගිල්ල ඉදිරිපිට රැකවල් රාජකාරියෙහි යෙදී සිටි පොලිස් නිලධාරීන් විසින් කෙරුණු ප්‍රති ප්‍රහාර එල්ල කිරීම හේතුකොට ගෙන ප්‍රහාරයකයින් දෙදෙනක් ද මරුමුවට පත්වූහ.

ප්‍රහාරකයින් සිද්ධිය වූ ස්ථානයෙන් පලාගොස් මොහොතකට පසුව පොලිස් නිලධාරීන් අවට ප්‍රදේශය සෝදිසියට ලක් කළෙත්, ඉහත කී හිස් ඉඩමෙහි තිබී ප්‍රහාරකයින් දෙදෙනකුගේ මළ සිරුරු හමුවිණි. රෝහිත ප්‍රියදර්ශණ විසින් තුවාල ලත් අය රෝහලට වහා

පිටත් කර යවනු ලැබූහ. එම නිලධාරීන් අතුරින් තිදෙනකු ප්‍රහාරයේදී ලත් තුවාල හේතුකොට ගෙන මරණයට පත්වූ බව රෝහලේදී දැනගන්නට ලැබිණි. පොලිස් ස්ථානය සෝදිසි කිරීමේදී ප්‍රහාරකයින් අවිආයුධ 03 ක්; එනම්: 84 එස් රයිෆලයක්, පරීක්ෂක ලලිත් මහානාමගේ සේවා රිවෝල්වරය, නිලධාරී සරත් කුමාර භාරයේ තිබූ රිපීටර් වර්ගයේ පතරොම් තුවක්කුවක් රැගෙන පලාගොස් ඇති බව හෙළිවිණි. පොලිස් ස්ථානය පිහිටි ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ පසුපස වැසිකිළිය අවට ප්‍රදේශයට බරපතළ හානි සිදුවී තිබිණි. සිලිම කැඩීගොසිණි. අසල බිත්ති කීපයක් විශාල වශයෙන් හානියට පත්වී තිබිණි. ගොඩනැගිල්ලට සිදුවී ඇති හානිය වැසිකිළිය ඇතුලත තිබූ බෝම්බයක් පිපිරීම හේතුකොට ගෙන සිදුවූවක් බවට මෙම සිද්ධිය සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් කළ සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් වැනි නිලධාරීන් පැහැදිලිව වටහාගෙන තිබිණි. මෙම සිද්ධිය වූ ස්ථානය පරීක්ෂා කිරීමට ආණ්ඩුවේ රස පරීක්ෂක කැඳවිය යුතු යැයි මෙම ප්‍රහාරය සිදුවී පැය කීපයක් තුළ එම ස්ථානයට පැමිණි කිසිදු නිලධාරියකු කල්පනා නොකළ බව මෙම අවස්ථාවේ සටහන් කිරීම උචිත යැයි සිතමු. ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ ( සපුගස්කන්ද පොලිස් ස්ථානය මොහුගේ භාරයේ විණි ) සහ සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් ඇතුළු නිලධාරීන්ගේ ප්‍රධාන අරමුණු අතුරින් එකක් වූයේ මෙම ගොඩනැගිල්ලට සිදු වූ හානිය පිළිසකර කිරීම බවක් පෙනේ. මෙම සිද්ධියට අදාළව නිලධාරීන්ගේ අමුත්තන්ගේ පොතෙහි ඇතුලත් කෙරුණු සටහන්, විශේෂයෙන්ම මෙම සිද්ධිය වී පැය කිහිපයක් තුළ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ විසින් කෙරුණු සටහන් සලකා බලන විට, මෙම කරුණ පැහැදිලිවන්නේය. සිද්ධිය වූ ස්ථානය පරීක්ෂා කර බැලීමට රජයේ රස පරීක්ෂක කැඳවනු නොලද්දේ ඇයි දැයි යන්න පිළිබඳව අප සෑහීමට පත්වන පරිදි කරුණු පැහැදිලි කිරීමට ඉහත කී එකදු නිලධාරියකුට නොහැකිවිණි. මෙම ස්ථානයෙහි හිස් පතරොම් කිහිපයක්ම තිබී හමුවූ බැවින් සිද්ධිය වූ ස්ථානයට රජයේ රස පරීක්ෂක කැඳවීම බෙහෙවින් වැදගත් කාර්යයක් විණි. මෙම ප්‍රහාරයට හවුල් වූ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම, මෙහිදී පාවිච්චි කළැයි සැක කළ හැකි අවිආයුධ හමුවීම වැනි සිද්ධියකදී සැකකරුවන් එක් එක් තැනැත්තකු විසින් ක්‍රියාකරනු ලැබ ඇති ආකාරය තහවුරු කරලීම පිණිස රජයේ රස පරීක්ෂකගේ සාක්ෂිය අතිශයින්ම වැදගත් සාධකයක් වියහැකිව තිබිණි. මෙබඳු ස්ථානයක් පැමිණ පරීක්ෂා කර බැලීමට රජයේ රස පරීක්ෂක කැඳවීම මූලික යුතුකමකි. මෙහිදී ඉන්දිය අගමැති රජීව් ගාන්ධි මැතකදී ඝාතනයට ලක්වීමේ සිද්ධිය කෙනෙකුගේ මතකයට තැගෙන්නකි. මෙම සිද්ධිය වූ ස්ථානය වසර දෙකක් පමණ කාලයක් යනතෙක් කිසිදු බාධාවකින් තොරව මුල් අවස්ථාවේ පැවති ආකාරයෙන්ම තබා ගැනිණි. එම සිද්ධිය හා සසඳා බලන විට මෙම අවස්ථාවේදී ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ක්‍රියා කළේ කෙබඳු ආකාරයෙන්ද? ඔවුහු මෙම ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට වහාම පෙදරේරුවන් ගෙන්වා ගත්හ. එබන්දක් කිරීමට ඇති කඩිනම කුමක්ද? ප්‍රහාරකයන්ගේ අනන්‍යතාව තහවුරු විය හැකි යම් සාක්කියක් වසන් කිරීමෙහිලා යමෙක් උනන්දුවක් දැක්වූයෙහිද?

මේ සිද්ධිය වූ ස්ථානයට පළමුවෙන්ම පැමිණි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනා වූයේ සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් මහතා හා සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ය. ඔවුන් එදින අළුයම 3.15 ට පමණ මෙම සිද්ධිය වූ ස්ථානයට පැමිණ ඇති බවක් පෙනේ. කලින් සඳහන් කෙරුණු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩගේ සටහන් වලට අනුව, ඔහු සිද්ධිය වූ ස්ථානයට පැමිණ ඇත්තේ අළුයම 3.20 ට පමණය. එසේ වුවත්, නලින් දෙල්ගොඩගේ වාචික සාක්ෂි වලට අනුව ඔහු සිද්ධිය වූ ස්ථානයට පැමිණි වේලාව වනවිට

උදේ පහන්වීමට ආසන්නව පැවති අතර ප්‍රදේශයට එළිය වැටෙන්නට පටන්ගෙන තිබිණි. මෙබැවින් නලින් දෙල්ගොඩගේ වාචික සාක්ෂිත් ඔහුගේ සටහනුත් අතර පැහැදිලි වශයෙන්ම පරස්පරතාවක් පවතිනුයේ ඇයි දැයි යන්න අපේ විමතියට කරුණකි. අළුයම 4.00 පමණ වනවිට නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න සිද්ධිය වූ ස්ථානයට පැමිණ ඇත.

## අනතුරුව ආරම්භ වූ විමර්ශණයන්. . . . . . .

සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ලවුණු ප්‍රහාරය, නීතිය ක්‍රියාවට නැංවීමේ නියෝජිතායතනයන්හි බලවත් කම්පනයට හේතුවක් වන්නට ඇත. 1971 අප්‍රේල් මාසයේදී ජනතා විමුක්ති පෙරමුණ (JVP) විසින් පොලිස් ස්ථානයන් වෙත එල්ල කෙරුණු ප්‍රහාරයන් මෙහිදී නිරායාසයෙන්ම කෙනෙකුගේ මතකයට නැගෙන්නට ඇත. එබැවින් මෙම පහරදීමට අදාලව පොලීසිය විසින් කෙරුණු විමර්ෂණයන් පිළිබඳව අපි පුළුල් වශයෙන් පරීක්ෂා කළෙමු. මෙම පහරදීම බැලූ බැල්මටම මනා ලෙස සංවිධානය වූ කණ්ඩායමක් විසින් කරන ලද්දක් බව පෙනී ගියද ප්‍රහාරකයින්ගේත්, කුමන්ත්‍රණකරුවන්ගේත් සහ ප්‍රහාරකයින්ට අධාර අනුබල දුන් තැනැත්තන්ගේත් අනන්‍යතාව නිශ්චිත වශයෙන් තහවුරු කරගැනීමේ අරමුණින් මෙම කාරණය පිළිබඳව පුළුල් වශයෙන් පරීක්ෂා කිරීම විමර්ෂකයන් විසින් කළයුතු විණි. මෙම ප්‍රහාරයේ අභිප්‍රාය නිශ්චිත වශයෙන් සොයා දැනගැනීමද අතිශයින් වැදගත් කරුණක් විය. තවද, ප්‍රදේශයේ ආරක්ෂාව පිළිබඳව පැවති තත්ත්වයද මෙම ප්‍රහාරයෙන් පැහැදිලිවිණි. සපුගස්කන්ද වූ කලී සතියකට යටත් පිරිසෙයින් දින දෙකටත් තුනටත් අතර කාලයක් තුළ කැබිනට් අමාත්‍යවරයකු පදිංචි වී සිටි ප්‍රදේශයකි. පුළුල් පරීක්ෂණයක් කිරීම වෙනත් කරුණක් සඳහාද අවශ්‍යවිණි. කිසියම් තැනැත්තකු පොලිස් ස්ථානයෙහි ඉහළ මාලයේ පිහිටි වැසිකිළියෙහි පුපුරණ උපකරණයක් අටවා තබා ඇති බව පැහැදිලි කරුණකි. මෙය කර ඇත්තේ කවුද? මීට අභ්‍යන්තරව යමකු සම්බන්ධ වී තිබේද? මේ සම්බන්ධයෙන් කෙරුණු විමර්ෂණයන් අපි දැන් පරීක්ෂා කර බලමු.

නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න මහතාත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දෙල්ගොඩ මහතාත් සිද්ධිය වූ ස්ථානයට පැමිණ ස්ථානය පරීක්ෂාවට ලක්කොට ස්වකීය නිරීක්ෂණයන්ට අදාලව සටහන් ඇතුලත් කිරීම් කර ඇත්තාහ. මෙම විමර්ශණයන් කළයුතු ආකාරය පිළිබඳව උපදෙස් දුන් ඔවුහු විමර්ෂණය ද අධීක්ෂණය කළහ. මෙම විමර්ශණය පැවැත්වීමේ කාර්යය සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් වෙත පවරනු ලැබ තිබිණි. රාජා ඩයස් විසින් මූලික විමර්ශණ සටහන් ගොනු කරන ලදැයි කියනු ලබන ලිපිගොනුව කැළණි පොලිස් කොට්ඨාසයෙන් අස්ථානගත වී තිබූ බැවින් එය සෙවීමට මෙම කොමිසන් සභාව දැරූ උත්සාහයන් ව්‍යර්ථ විණි. කෙසේ වුවද, රාජා ඩයස් ගේ යටත් නිලධාරියකු වශයෙන් මෙම විමර්ෂණය පැවැත්වූ කැළණි කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ මහතාගේ සටහන් ලබාගත හැකිවිණි.

කලින් සඳහන් කෙරුණු පරිදි, මෙම ප්‍රහාරකයින් පලවා හරිනු ලැබූ විගස පොලිස් ස්ථානයෙහි දකුණු පසින් පිහිටි හිස් ඉඩමෙහි තිබී ප්‍රහාරකයින් දෙදෙනකුගේ මළසිරුරු හමුවිය. මෙම මළසිරුරු සොයාගැනීම ප්‍රහාරකයින් පලවා හැර විනාඩි ගණනාවක් ඇතුලත සිදුවිණි. මෙරිල් ගුණරත්න, නලින් දෙල්ගොඩ සහ රාජා ඩයස් ඇතුළු සිද්ධිය වූ ස්ථානයට පැමිණ සිටි සියළුම ජ්‍යෙෂ්ඨ නිලධාරීහු මෙම මළසිරුරු සොයාගැනීම ගැන දැන සිටියහ. මෙම

මළසිරුරු දෙක හමුවීම පළමු සොයාගැනීමක් සේ සලකා මළසිරුරු වහාම හඳුනාගැනීම සඳහා පරීක්ෂණ පැවැත්වීමත් එතැන් සිට ඉදිරියට පරීක්ෂණ කටයුතු කරගෙන යාමත් විමර්ෂකයින් විසින් කළයුතුව තිබිණි. මෙම ප්‍රහාරය සඳහා, වගකිවයුතු මූළ කණ්ඩායමම හඳුනාගැනීම පිණිස මෙම මළසිරුරු දෙක හඳුනාගැනීම ඉමහත් රුකුලක් වන්නට ඉඩ තිබුණු අතර එමගින් ප්‍රහාරකයින්ගේ අභිප්‍රාය පිළිබඳව ඉඟියක් ලබා ගන්නට ද ඉඩ තිබුණු බව මෙහිලා සඳහන් කළ යුතු නොවේ.

මෙම මළසිරුරු හමුවීමත් සමඟම තවත් එක් මළසිරුරක් සුමිත් පෙරේරා හෙවත් කළුවා යන අයගේ බව එම ප්‍රදේශයෙහි නිලධාරීහු හඳුනාගත්හ. ජූලි 17 වන දින උදැසනින්ම පරීක්ෂක වික්‍රමසිංහ ( කඩාකප්පල්කාරී මර්දන ඒකකයෙහි ස්ථානාධිපති) වහාම බියගම පොලිස් ස්ථානය බලා ගොස් පොලිස් කොස්තාපල් 27388 සුජීව ධම්මික සපුගස්කන්ද පොලිස් ස්ථානයට ගෙන ආවේය. ඔහු සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් හමුවට ඉදිරිපත් කරනු ලැබිණි. සුජීව ධම්මිකගේ මස්සිනා වන කෙනෙකු සපුගස්කන්ද පොලිස් ස්ථානයට පහරදීමට හවුල් වී ඇති බවත් එහිදී ඇතිවූ සටනේදී ඔහු මරුමුවට පත්වූ බවත් සහකාර පොලිස් අධිකාරී, ඉහත කී සුජීව ධම්මිකට දන්වා තිබේ. හෙතෙම එකී මළසිරුර තිබූ ස්ථානයට ගොස් සුමිත් පෙරේරා හෙවත් කළුවා නැමති අයගේ සිරුර හඳුනාගෙන ඇත. මෙම අවස්ථාවේදී සුජීව ධම්මික අත්අඩංගුවට ගන්නා ලදී. අනතුරුව දින 14 ක කාලයක් සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි රඳවා තබා ගනු ලැබූ බවක් පෙනෙන්නට ඇත. එම කාලසීමාව අවසානයේදී ඔහු මහෙස්ත්‍රාත්වරයකු හමුවට ඉදිරිපත් කරන ලදුව ඇප පිට නිදහස් කරනු ලැබ ඇත. මෙම නඩුව තෙවතාවකදී මහෙස්ත්‍රාත් උසාවියේදී කැඳවනු ලදුව පසුව හෙතෙම නිදහස් කරනු ලැබ ඇත. ඔහුට එරෙහිව කිසිදු පියවරක් ගනු ලැබ නොතිබිණි. හෙතෙම දිගටම සේවයෙහි නිරතවී සිට ඇත.

මෙම ප්‍රහාරය සිදුවූ දින උදැසන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ මහතා විසින්ම සුමිත් පෙරේරා හෙවත් කළුවා යන අයගේ භාර්යාව වන ශිරාණි පෙරේරා හෙවත් ලලිත රේණුකා අත්අඩංගුවට ගනු ලැබ තිබිණි. ඇය පදිංචිව සිට ඇත්තේ ගෝනවල, ජයවීර මාවතේ, අංක 50 දරණ ස්ථානයෙහිය. ඇය අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවේදී ඇයගේ ස්වාමිපුරුෂයා වන කළුවා නැමති අය සපුගස්කන්ද පොලිස් ස්ථානයට පහරදීමේ යෙදී සිටිද්දී මරුමුවට පත්වූ බව වික්‍රමසිංහ මහතා ඇයට දන්වා තිබිණි. ඇය අත්අඩංගුවට ගන්නා ලදුව සපුගස්කන්ද පොලිස් ස්ථානයට ගෙනෙනු ලැබ ඇති අතර එහිදී ඇය ඉහත කී කළුවා නැමැති අයගේ සිරුර හඳුනා ගත්තාය. රැඳවුම් නියෝගයක් මත ඇයද සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි රඳවා ගනු ලැබිණි. 1989 අගෝස්තු 10 වන දිනදී ඇය මහෙස්ත්‍රාත්වරයකු හමුවට ඉදිරිපත් කරනු ලදුව තවදුරටත් නඩු විභායකින් තොරව නිදහස් කෙරිණි.

මෙබැවින් මෙකී සුමිත් පෙරේරා නොහොත් කළුවා යන අය කවරෙකුද යන්න නිශ්චය වශයෙන් සොයා දැනගන්නට මෙම කොමිසන් සභාව පියවර ගත්තේය. සුමිත් පෙරේරා යනු ගෝනවල පියදාස පෙරේරාගේ පුත්‍රයා විය. පියදාස පෙරේරාට සහෝදරයින් හත්දෙනෙක් සිටියහ. මොවුහු සැම් පෙරේරා, හැරල්ඩ් පෙරේරා, වින්සන්ට් පෙරේරා, සිරිල් පෙරේරා, ෂෙල්ටන් පෙරේරා, සුනිල් පෙරේරා හෙවත් ගෝනවල සුනිල් සහ ට්යුඩර් පෙරේරා වෙති. සුමිත් පෙරේරා `නැමති අය සුපවයිසර් කෙනෙකු වශයෙන් බර්ගත් ලංකා නැමති

පෞද්ගලික සමාගමෙහි සේවය කරමින් සිට ඇත. 1985 දී හෙතෙම ශිරාණි පෙරේරා හෙවත් ලලනි රේණුකා සමඟ විවාහ වී ඇත.

ගෝනවල පෙරේරා පවුල යනු එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරී ආධාරකරුවන් බව ප්‍රසිද්ධ කාරණයකි. ක්‍රියාකාරී දේශපාලනයෙහි නිරතවූවන් අතර සුමිත් පෙරේරාගේ බාප්පා කෙනෙකු වන සුනිල් පෙරේරා හෙවත් ගෝනවල සුනිල් වූයේය. රනිල් වික්‍රමසිංහ මහතාට අනුව ගෝනවල සුනිල් ඔහුගේ ක්‍රියාකාරී ආධාරකරුවකු වූ අතර හෙතෙම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය නායකයකු වශයෙන් ක්‍රියාකර ඇත්තේය. ගෝනවල සුනිල්, වික්‍රමසිංහ මහතා සමඟ දීර්ඝ කාලයක් සමීපව ඇසුරු කරමින් සිට ඇත. වික්‍රමසිංහ මහතාට ගෝනවල සුනිල්ගේ නිවසෙහි පැවති සාදයන්ට පවා ආරාධනා කරනු ලැබ තිබිණි. වික්‍රමසිංහ මහතා එතෙර සිට පෙරලා ශ්‍රී ලංකාවට පැමිණෙන අවස්ථාවන්හිදී ඔහු පිළිගන්නට කටුනායක ගුවන් තොටුපළ බලා යෑම ගෝනවල සුනිල්ගේ පුරුද්දක්ව තිබිණි. ගුවන් තොටුපළේදී වික්‍රමසිංහ මහතා ගෝනවල සුනිල් සහ සෙසු පුද්ගලයින් සමඟ සිටි ඡායාරූපයක් පෙන්වනු ලදුව, වික්‍රමසිංහ මහතා මේ බව පිළිගත්තේය. එක්සත් ජාතික පක්ෂයේ සුළු කණ්ඩායම් රැස්වීම් සඳහා ගෝනවල සුනිල්ගේ නිවාසය නිරතුරුවම පාවිච්චියට ගනු ලැබ ඇත. වික්‍රමසිංහ මහතා බටලන්දෙහි පදිංචිව සිටි සංචාරක බංගලාවෙහි භාරකරු වන වින්සන්ට් පෙරේරාගේ සාක්ෂියට අනුව වික්‍රමසිංහ මහතා සංචාරක බංගලාවෙහි පදිංචිව සිටි විට ගෝනවල සුනිල් නිතරම එහි යන එන තැනැත්තෙක් වූයේය.

ස්වකීය දේශපාලන ක්‍රියාකාරකම් හැරුණු විට, ගෝනවල සුනිල්ට සාපරාධී ක්‍රියා සම්බන්ධයෙන් වාර්තාවක් ද තිබූ බවක් පෙනේ. 1970 දශකයේ අවසාන භාගයේදී හෙතෙම වෛද්‍ය පෝල් නැමැති මහතකුගේ දියණියක දූෂණය කළේය. නඩු විභාගයෙන් පසුව ගෝනවල සුනිල් වරදකරු වූයෙන් ඔහුට පහළොස් වසරක සිරදඬුවමක් පමුණුවනු ලැබිණි. මේ සම්බන්ධයෙන් කෙරුණු අභියාචනයේදීද ඔහු වරදකරු බව තහවුරු වූයෙන් අභියාචනය නිශ්ප්‍රභා කරන ලදී. කෙසේ වුවද, අභියාචනය අසා වැඩි කලක් යාමට පෙර ඒ දවස පැවති ආණ්ඩුවෙන් ගෝනවල සුනිල්ට සමාවක් ලැබුණු අතර ඒ අනුව හෙතෙම බන්ධනාගාරයෙන් නිදහස් කෙරිණි. ඔහුට සමාව ලැබුණේ කවර හේතුන් යටතේද යන්න තවමත් සැකයට තුඩුදෙන කාරණයකි. මෙම සිද්ධිය හැරුණු විට, කොලොන්නාවේ සිට සපුගස්කන්ද දක්වා භූගත නළ මාර්ගයකින් ගෙන යනු ලැබූ තෙල් සොරාගැනීමකටද ගෝනවල සුනිල් සම්බන්ධ වී තිබිණැයි කියනු ලැබේ. කෙසේ වුවද, ඔහුට එරෙහිව කිසිදු සාපරාධී නඩුවක් පවරනු ලැබ ඇති බවක් පෙනෙන්නට නැත. සාපරාධී ක්‍රියාවන් පිළිබඳ වාර්තාවක් තිබියදීත් ඒ ගැන නොතකා ගෝනවල සුනිල් මුළු දිවයිනටම බලපාන පරිදි සාම විනිසුරුවරයකු වශයෙන් පත්කරනු ලැබ තිබිණි. මෙම කොමිසන් සභාව හමුවේ ඉදිරිපත් කෙරුණු සියළුම සාක්ෂි වලින්ද මෙම කොමිෂන් සභාවට ලබාගත හැකි වූ වෙනත් සියළුම සාක්ෂි වලින්ද ඉතා පැහැදිළිව පෙනී යනුයේ ගෝනවල සුනිල් යනු එවකට රාජ්‍ය බලයේ සිටි පුද්ගලයින්ගේ ආශිර්වාදය ලත් තැනැත්තෙකු බවයි. 1988 වර්ෂයේ මුල් භාගයේදී, කඩාප්පල්කාරීන් යයි සැක කරනු ලැබූවන් විසින් ගෝනවල සුනිල්ට වෙඩි තබා ඝාතනය කරනු ලැබිණි. ගෝනවල සුනිල් එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරී ආධාරකරුවෙකු වූ බැවින් ඔහු කඩාකප්පල්කාරීන් විසින් ඝාතනය කරන ලදැයි යන්න පුළුල් වශයෙන් පිළිගැනුණු මතය විණි. ගෝනවල පෙරේරා පවුලේ කිසිදු සාමාජිකයකු එක්සත් ජාතික පක්ෂය හැරුණුවිට සෙසු කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයින් හෝ ආධාරකරුවන් වූ බවට මෙම කොමිෂන් සභාව හමුවේ කිසිදු සාක්ෂියක්

නොතිබේ. සුමිත් පෙරේරා හෙවත් කළුවා නමැති අය සම්බන්ධයෙන් වන තත්ත්වයද මීට වෙනස් නොවන්නකි.

සුමිත් පෙරේරාගේ අනෙක් බාප්පා වන ෂෙල්ටන් පෙරේරා නමැත්තා ද අයද සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරය එල්ල කෙරුණු දිනදී සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් විසින් අත්අඩංගුවට ගනු ලැබිණි. ෂෙල්ටන්ගේ භාර්යාව වන මුණසිරි කංකානම්ගේ රංජනී විසින් මේ බව රනිල් වික්‍රමසිංහ මහතාගේ අවධානයට යොමු කරනු ලැබ ඇත. ඉන් අනතුරුව කල් නොයවාම ජූලි මස 18 වන දින දී ෂෙල්ටන් පෙරේරා අත්අඩංගුවෙන් නිදහස් කරනු ලැබ ඇත. එසේ නිදහස් කිරීමට පෙර ෂෙල්ටන් ගෙන් ප්‍රශ්න කරනු ලැබ ඇති අතර ඔහුගේ ප්‍රකාශය සටහන් කරගන්නා ලද්දේ පරීක්ෂක වික්‍රමසිංහ විසිනි. මෙම ප්‍රකාශය මගින් හෙතෙම ස්ථිර වශයෙන්ම පවසා ඇත්තේ ඔහුට ජනතා විමුක්ති පෙරමුණ හෝ වෙනත් කිසිදු කඩාකප්පල්කාරී කණ්ඩායමක් සමඟ සම්බන්ධයක් නොමැති බවකි. කෙසේ වෙතත්, තමාත් කළුවා නමැත්තාත් සොත්ති උපාලි, රාජගිරියේ අනිල් හා කොහොල්වල ඩෙන්සිල් ( මොහු ෂෙල්ටන් කියන පරිදි පෝල් පෙරේරා මහතාගේ නිවසෙහි සේවය කරමින් සිට ඇත.) වැනි පාතාල ලෝකයෙහි ඇතැම් පුද්ගලයින් සමඟ සමීප ඇසුරක් පවත්වාගෙන ගොස් ඇති බව ඔහු පවසා ඇත.

ෂෙල්ටන් පෙරේරා පවසන අන්දමට මෙම පුද්ගලයින් කිසිවකුට කඩාකප්පල්කාරීන් සමඟ සම්බන්ධකම් නොතිබිණි. ඉකුත් දෙවසර තුළදී කළුවා ජනතා විමුක්ති පෙරමුණේ කටයුතු වලට සහභාගී වී ඒ සම්බන්ධයෙන් පොලීසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදුව අවවාද කොට නිදහස් කරන ලදැයි ස්වකීය ප්‍රකාශය මගින් ෂෙල්ටන් සඳහන් කර ඇති බව මෙහි ලා සැලකිය යුතුය. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර කිසිවක් ඔහු සඳහන් කර නොමැතිවා පමණක් නොව මීට අදාලව ඔහුගෙන් ප්‍රශ්න කිරීමක්ද නොකෙරිණි. මෙහිලා විමතිය දනවන කරුණ වනුයේ පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ මහතා මේ සම්බන්ධයෙන් ෂෙල්ටන්ගෙන් තවදුරටත් ප්‍රශ්න නොකලේ ඇයිද යන්නය. තවද, ජනතා විමුක්ති පෙරමුණේ යයි සැක කෙරුණු කටයුතු සම්බන්ධයෙන් ෂෙල්ටන් ඉහත දී අත්අඩංගුවට ගනු ලැබ තිබිණි නම් ඔහු අවවාද කොට නිදහස් කිරීමට පොලීසිය ක්‍රියා කලේ ඇයි? අනික් අතින් බලන විට, කළුවා ` ජනතා විමුක්ති පෙරමුණු ආකාරයේ ` කටයුතු වලට සහභාගී වූයේ පෞද්ගලික ලාභ ප්‍රයෝජනයක් තකාද ? නොඑසේ නම්, වෙනත් කිසියම් පක්ෂයක උපදෙස් මතද? එපරිදි කල්පනා කිරීම සාධාරණ වනුයේ පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ මහතාගේ සාක්ෂි අනුවත් අදාල බලධාරීන් සතුව ඇති රහස්‍ය තොරතුරු අනුවත් කළුවා වූ කලී ජනතා විමුක්ති පෙරමුණේ කඩාකප්පල්කරුවකු යැයි විශ්වාස කරන්නට ඔවුනට කිසිදු හේතුවක් නොතිබූ බැවිනි. කළුවාද ජනතා විමුක්ති පෙරමුණේ කඩාකප්පල්කාරීන්ගෙන් කෙනෙකු වෙතැයි යන බවක් පොලිස් අත්අඩංගුවේ පසු වූ වෙනත් කිසිදු ජනතා විමුක්ති පෙරමුණේ සැකකරුවකු පොලීසියට අනාවරණය කර නොමැත. එබැවින්, කළුවා යනු කවරෙකුද? ඔහුගේ සම්බන්ධකම් කවරේද? සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරයක් එල්ල කළ කල්ලිය හෝ කණ්ඩායම කුමක්ද? ඔවුන් ප්‍රහාරයක් දියත් කලේ කවර කරුණක් නිසාද? පූර්වෝක්ත කරුණු අනුව බලන විට, මුළු සිද්ධිය සම්බන්ධයෙන්ම පුළුල් විමර්ශනයක් කිරීමේ වගකීම අදාල විමර්ෂකයින් වෙත පැවරී තිබිණි. එහෙත් එබඳු විමර්ශණයක් නොපැවැත්විණි. සත්‍ය අනාවරණය කර ගැනීමට කිසිදු උත්සාහයක් නොදරන ලදී.

ෂෙල්ටන් සඳහන් කරන පරිදි, මෙම ප්‍රහාරයට පූර්ව කාලපරිච්ඡේදය තුළදී කළුවාත් ඔහුත් සොත්ති උපාලි වැනි පාතාල ලෝකයේ බලගතු තැනැත්තන් සමඟ සමීප ඇසුරක් පවත්වාගෙන ගොස් ඇත. එබඳු තැනැත්තන් ගෙන් ප්‍රශ්න කිරීම යෝග්‍ය යයි විමර්ෂණ ඒකකයේ කිසිදු අයකු කල්පනා නොකල බවක් පෙනේ. සත්‍ය වශයෙන්ම ඔවුන් කළේ කුමක්ද? ඔවුහු ස්වකීය අත්අඩංගුවේ පසු වූ සියළුම සැකකරුවන් මුදාහළහ.

කෙසේ වෙතත්, එ කල්හි සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි සේවයේ නිරතව සිටි තාවකාලික කම්කරුවකු වූ අද්දුම හෙට්ටි විදානෙලාගේ ශාන්තලාල් අත්අඩංගුවට ගැනීමත් සමඟ, ඉහත කී සිද්ධිය සම්බන්ධයෙන් තවදුරටත් කරුණු අනාවරණය විය. හෙතෙම 1989 අගෝස්තු 15 වන දිනදී පරීක්ෂක වික්‍රමසිංහ විසින් අත්අඩංගුවට ගනු ලැබුවෙකි. ශාන්තලාල් තවදුරටත් රඳවා තබා ගැනීමට තරම් ප්‍රබල හේතූන් ඇතැයි අගෝස්තු 23 දින වන විටදී පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ මහතාට වැටහී ඇති අතර ඒ අනුව ඔහු විසින් සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් වෙතින් රැඳවුම් නියෝගයක් ලබා ගන්නා ලදී. මෙම රැඳවුම් නියෝගය තෙමසක කාලසීමාවක් සඳහා වලංගු වූවකි. සපුගස්කන්ද පොලිස් ස්ථානයට බෝම්බය ඇටවීමට ශාන්තලාල් සම්බන්ධ වී ඇතැයි විමර්ෂකයින් විසින් සැකකරනු ලැබ ඇත. එබැවින් මොහුගෙන් දීර්ඝ වශයෙන් ප්‍රශ්න කරනු ලදුව ප්‍රකාශයක්ද සටහන් කරගන්නා ලදී. යළිත් 89.08.01 වන දිනදී සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් විසින් ඔහුගෙන් තවත් ප්‍රකාශයක් සටහන් කරගනු ලැබ ඇත. මෙම ප්‍රකාශයන් දෙකම පාපෝච්චාරණයක ස්වභාවයෙන් යුක්තවිණි. ( හදිසි අවස්ථා රෙගුලාසි හෝ ත්‍රස්තවාදය වලක්වාලීමේ පනතේ විධිවිධාන යටතේ ඉදිරි තවූ විභාගයකදී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු පිණිස මෙබඳු පාපෝච්චාරණයක් සහකාර පොලිස් අධිකාරීවරයකු විසින් සටහන් කරගැනීම සාමාන්‍යයෙන් පිළිගත් ක්‍රියා පිළිවෙත වෙයි.) මෙකී ප්‍රකාශය `එක්ස්` 112 වශයෙන් ලකුණු කොට මෙම කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කරන ලදී. සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරය එල්ල කිරීමේදී තමන් ඊට හවුල් වූයෙන් තම පාපසහායකතාව මෙකී පාපෝච්චාරණය මගින් ශාන්තලාල් පිළිගෙන ඇත. ස්වකීය ප්‍රකාශයට අනුව ඔහු විජයතිලක නම් වූ පොලිස් කොස්තාපල්වරයකු දැන හැඳිනගෙන සිට ඇත. මෙම ප්‍රහාරයට කලින් වෙනත් සිද්ධියක් සම්බන්ධයෙන් විජයතිලකගේ රාජකාරී වැඩ තහනම් කරනු ලැබ තිබිණි. ශාන්තලාල්, කළුවා නමැත්තා දැන හැඳිනගෙන ඇත්තේ විජයතිලක මාර්ගයෙනි. මෙම ප්‍රහාරය සිදුවූ දින සන්ධ්‍යාවේදී මොවුන් දෙදෙනා පොලිස් ස්ථානයට නුදුරු තැනකදී හමුවී ඇත. කළුවා සහ විජයතිලක ඔහුට පාර්සලයක් දී එය පොලිස් ස්ථානයට ගෙන ගොස් පොලිස් ස්ථානයේ ඉහළ මහලයේ පිහිටි වැසිකිළියේ තබන ලෙස ඔහුට කියා ඇත. මෙම පාර්සලයේ අඩංගු දෑ හෝ මුළු සැලැස්ම කුමක්විද යන්න හෝ තමන් දන්නා බවට ඔහුගේ ප්‍රකාශයෙන් ඉඟියක් නොලැබේ. එහෙත් ඒ ආශ්‍රිත අවස්ථානුගත කරුණු අනුව බෙහෙවින්ම පැහැදිළි වනුයේ ශාන්තලාල් හිතාමතාම මෙම සිද්ධියට සහභාගී වූවෙකු බවකි. මෙම පාර්සලය ලබාගැනීමෙන් අනතුරුව හෙතෙම එය පොලිස් ස්ථානය තුළට ගෙනැවිත් අදාල වැසිකිළියෙහි ඇතුලත සඟවා තබා ඇත. එදින රාත්‍රියේදී පොලිස් ස්ථානයට ප්‍රහාරයක් එල්ල කෙරුණු අතර වැසිකිළිය තුල පිපිරීමක් සිදුවී තිබේ. පසුදින උදෑසන හෙතෙම කළුවා නමැත්තාගේ මළසිරුර දැක ඇත. මෙම සිද්ධියෙන් පසුවද වරක් ඔහුට විජයතිලක මුණගැසී ඇත. ඉහත කී පාපෝච්චාරණය මගින් ශාන්තලාල් තමන්ට ජනතා විමුක්ති පෙරමුණ සමඟ කිසියම් සම්බන්ධයක් තිබිණැයි යන්න නිශ්චිත වශයෙන්ම ප්‍රතික්ෂේප කර ඇත. කළුවා නමැත්තා හෝ විජයතිලක ජනතා විමුක්ති පෙරමුණේ කටයුතු වලට පටැලවී ඇති බවකුදු හෙතෙම පවසා නොමැත.

මෙකී ඵලදායක පාපෝච්චාරණය සටහන් කරගනු ලැබූවායින් පසුව ශාන්තලාල් 1989 නොවැම්බර් මස 28 වන දින තෙක් සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි රඳවා ගනු ලැබිණි. මෙම කාලපරිච්ඡේදය තුළදී හෙතෙම මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීමක් නොකෙරිණි. ඔහුට එරෙහිව සාපරාධී නීති කෘත්‍යයක් ආරම්භ කිරීමට උත්සාහයකුදු නොදරන ලදී. රැඳවුම් භාරයේ සිටියදී ඔහු බලන්නට ඔහුගේ මව වන යූ.විමලාවතී සහ පියා වන එම්.එච්.ප්‍රේමරත්න යන අය පැමිණියහ. ශාන්තලාල් රඳවා තබාගැනීම සම්බන්ධයෙන් ඔවුහු සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මුණගැසුණහ. තිළ වශයෙන් කෙරුණු ප්‍රකාශය අනුව 1989 නොවැම්බර් මස 28 වෙනි දින තරම් පසුකාලීනව පරීක්ෂක වික්‍රමසිංහගේ උපදෙස් මත කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ සැරයන් රත්නායක විසින් විජයතිලකගේ අතුරුදහන්වීම පිළිබඳව ශාන්තලාල් ගෙන් ප්‍රකාශයක් සටහන් කරගනු ලැබිණි. ( මේ කාරණය සම්බන්ධයෙන් පළමු අවස්ථාවේදීම විමර්ෂකයන් විසින් ශාන්තලාල් ගෙන් ප්‍රශ්න කළයුතුව තිබිණැයි කෙනෙකුට සිතිය හැකිය.) බියගම, හෙයියන්තුඩුවේ රත්ගහවත්තේ පිහිටි තම කාමරයට විජයතිලක එදින එන බවක් ස්වකීය ප්‍රකාශයෙන් ශාන්තලාල් සඳහන් කර ඇතැයි කියනු ලැබේ. අගෝස්තු මස 15 වෙනි දින සිට දිගටම පොලිස් අත් අඩංගුවේ පසු වූ ශාන්තලාල් එදින විජයතිලක ඔහුගේ කාමරයට යාමට නියමිතව ඇතැයි දැනගත්තේ කෙසේද යන්න කෙනෙකුගේ විමතිය දනවන කරුණකි. ඉක්බිති සැරයන් රත්නායකගේ මූලිකත්වයෙන් යුත් පොලිස් නිලධාරීන් පිරිසක් විසින් ශාන්තලාල්, විජයතිලකගේ කාමරයට ගෙනයනු ලැබිණැයි කියනු ලැබේ. ශාන්තලාල් දුන් මාර්ගෝපදේශ අනුව තමන් එහි ගිය බව ඔවුහු කීහ. ඔවුන් එහි ගියවිට කාමරය අගුල්ලා තිබිණි. ඔවුන් සැඟවී සිටියහොත් විජයතිලක ග්‍රහණයට ගැනීමට හැකි බව ශාන්තලාල් නිලධාරීන්ට පවසා ඇත. රාත්‍රී 10.00 ට පමණ පුද්ගලයින් දෙදෙනෙක් යතුරුපැදියකින් මෙම ස්ථානයට ආහ. ශාන්තලාල් පිටුපස අසුනේහි සිටි පුද්ගලයා පෙන්නුම් කොට ඔහු විජයතිලක බවට ඇඟවීමක් කර ඇත. විජයතිලක පෙන්වාදීමට ශාන්තලාල්ට සිදුවූයේ ඇයිදැයි යන්න විමතිය තුඩුදෙන්නකි. විජයතිලක යනු සපුගස්කන්දේ සේවයෙහි නිරතව සිටි නිලධාරියෙකි. මෙම ගමනෙහි යෙදුණු අනෙක් නිලධාරීහු විජයතිලක නොදන්නාහුද? සැකකරුවන් අත්අඩංගුවට ගනු පිණිස සැඟවී සිටි නිලධාරීන් යතුරුපැදිය දෙසට ගමන් කර ඇත. සැණෙකින් සැකකරුවෝ යතුරු පැදියෙන් පලාගියහ. රත්නායක පවසන හැටියට මෙම කණ්ඩායමට අයත් එක් නිලධාරියෙක් යතුරුපැදියෙන් පලායමින් සිටි සැකකරුවන් දෙසට දෙවරක් වෙඩිතබා ඇත. කෙසේවතුදු ඔවුන් ස්වකීය ග්‍රහණයට ගැනීමට මෙම නිලධාරීහු අසමත් වූහ. ස්වකීය අත්අඩංගුවේ සිටි ශාන්තලාල්ද අතුරුදහන් වී ඇති බව මේ අවස්ථාවේදී ඔවුනට සැණෙකින් වැටහිණි.

තමන් මෙම ගමන අරඹද්දී ශාන්තලාල්ට මාංචු දමා නොතිබුණැයි රත්නායක පිළිගත්තේය. ඒ මොහොත වනවිට ඇඳිරිවැටී තිබුණද ඔවුහු විදුලි පන්දමක් රැගෙන ගොස් නොසිටියහ. ශාන්තලාල්ට ඇඩිසේ මුරකාවල් යොදා තිබියදී ඔහු පලාගියේ කෙසේදැයි පැහැදිලි කිරීමට ඔහුට නුපුළුවන් විය. මෙසේ සිදුවිණැයි කියනු ලබන පලායාමෙන් අනතුරුව ශාන්තලාල් යළි අත්අඩංගුවට ගැනීමට පියවර නොගන්නා ලද්දේ ඇයිදැයි පැහැදිලි කිරීමටද ඔහු අසමත් වූයේය. මෙම මොහොතින් පසුව කිසිවෙක් ශාන්තලාල් ගැන කිසිදු තොරතුරක් අසා හෝ ඔහු දැක හෝ නොමැත. මෙබඳු සැකකරුවෙකු පලාගොස් ඇති බවත් ඔහුගේ ආ ගිය තැන් පිළිබඳව තොරතුරු සපයන ලෙසත් පොදු මහජනයාට දැනුම්දෙන නිවේදනයක් පුවත්පත්හි පළකිරීමටද ඔවුන් පියවර නොගත් බව රත්නායක පිළිගත්තේය. තවද සැකකරුවන් පලාගිය විටදී සාමාන්‍යයෙන් ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ගයන් ගැනීමටද කටයුතු නොකෙරිණි. මෙම සිද්ධියට අදාලව කිසිදු තිළ පරීක්ෂණයක් නොපවත්වන ලදී. ස්වකීය හැසිරීම සම්බන්ධයෙන්

රත්නායකට තරවටුවක් නොකෙරිණි. ඔහුට එරෙහිව විනයානුකූල පියවර ගනු ලැබ නොතිබිණි. සැප්තැම්බර් මස 01 වන දින වනතෙක්ම මෙම සිද්ධියට විජයතිලකගේ සම්බන්ධකම ගැන ශාන්තලාල් සඳහන් කර තිබියදීත් නොවැම්බර් 28 දිනතෙක් විජයතිලක සෙවීමට ඔවුන් නොගියේ ඇයිදැයි පැහැදිලි කරන්නට සාක්ෂිකරුවන් කිසිවෙකුට නොහැකිවිය. පූර්වෝක්ත සිද්ධියෙන් පසුව විජයතිලක අත්අඩංගුවට ගැනීමෙහිලා විමර්ෂකයින් උනන්දු නොවූ බවක් ද පෙනී යයි. ඔහු අත්අඩංගුවට ගැනීමට ඔවුහු කිසිදු උත්සාහයක් නොදැරූහ. කෙසේ වුවද, 1990 ඔක්තෝබර් මස 22 වෙනි දිනදී නියෝජ්‍ය පොලිස්පති තලින් දෙල්ගොඩ ගේ නියමය මත විජයතිලක යළි සේවයෙහි පිහිටුවනු ලැබ ඇත. හෙතෙම තවමත් සේවයෙහි නිරතව සිටී. 1996 පෙබරවාරි මස 17 වෙනි දිනදී මෙම කොමිසන් සභාවට අනුයුක්ත විමර්ෂකයින් විසින් ඔහුගෙන් ප්‍රශ්න කරනු ලදුව ප්‍රකාශයක් සටහන් කර ගැනිණි. එතෙක් සපුගස්කන්ද පොලිස් ස්ථානයට පහරදීමට අදාලව තමන්ට ඇතැයි කියනු ලබන සම්බන්ධකම් පිලිබඳව කිසිදු විමර්ෂකයකු එතෙක් ඔහුගෙන් ප්‍රශ්න කර නොමැත. කොමිෂම වෙත කරනු ලැබූ ප්‍රකාශය මගින් අප බලාපොරොත්තු වූ පරිදි මෙම සිද්ධියෙහිලා තමන්ට සම්බන්ධකමක් ඇතැයි කීම ඔහු ප්‍රතික්ෂේප කළේය. ඉහත කී හේතූන් මත මෙම කොමිෂන් සභාව පොලිස් අත්අඩංගුවේ සිට ශාන්තලාල් විසින් කරන ලදැයි කියනු ලබන පලායාමට අදාලව දෙනු ලැබූ රත්නායකගේත් අනිකුත් පොලිස් සාක්ෂිකරුවන්ගේත් සාක්ෂි සභාව සහමුලින්ම ප්‍රතික්ෂේප කර සිටියි. එසේ වුවද 1989 නොවැම්බර් මස 28 වෙනි දින හෝ ඉන් පසුව යම් අවස්ථාවකදී ශාන්තලාල් නම් වූ සැකකරු ස්ථිර වශයෙන්ම පොලිස් අත්අඩංගුවෙන් අතුරුදහන් වූ බව අපි නිගමනය කර සිටිමු. ශාන්තලාල් රැඳවුම් භාරයේ සිටියදී හෝ ඔහු අතුරුදහන්වීමෙන් පසුව හෝ ඔහුට එරෙහිව නඩුවක් පවරනු ලැබිණි නම් සපුගස්කන්ද පොලිස් ස්ථානයට පහරදීමට සම්බන්ධ වූයේ කවුරුන්ද යන්නත් එම පහරදීමේ අභිප්‍රාය, සූදානම්වීම් වල ස්වභාවය සහ පහරදීමට සම්බන්ධ වූ වෙනත් තැනැත්තන් වැනි අනිකුත් වැදගත් තොරතුරුත් බොහෝ සෙයින් හෙළිවන්නට ඉඩ තිබූ බවද පැහැදිලිය.

ශාන්තලාල් පොලිස් අත්අඩංගුවෙන් පලා නොගියේ නම් ඔහුට කවරක් සිදුවන්නට ඉඩ තිබිණිද? ඔහු නීතිමය ක්‍රියාදාමයෙන් පරිබාහිරව ජීවිතක්ෂයට පත් කෙරිණිද? නොඑසේ නම්, වෙන කවර දෙයක් ඔහුට සිදුවන්නට ඉඩ තිබිණිද? ඔහු එලෙසින් ජීවිතක්ෂයට පත් කෙරිණි නම් එබඳු ඝාතනයකට තුඩුදුන් අභිප්‍රාය කුමක් වියහැකිව තිබිණිද? ශාන්තලාල් විසින් මෙම පහරදීම පිලිබඳව වැදගත් වූ කරුණු අනාවරණය කිරීමෙන් අනතුරුව මෙකී පහරදීමට යම් යම් තැනැත්තන්ගේ සම්බන්ධවීම් පිලිබඳව විමර්ෂකයින් මුළුමනින්ම සැඟීමට පත්විණිද? එසේ සැඟීමට පත්වන්නට හේතුව කවරේද? ශාන්තලාල් සදහටම නිහඬ කරවන්නට අවශ්‍ය වී ඇත්තේ කවරෙකුට විය හැකිද? එම තැනැත්තන් පොලිසියේ නිලධාරීන්ම වියහැකිව තිබිණිද? එසේ නැතහොත් කැළණි කොට්ඨාසයේ කඩාකප්පල් ක්‍රියා මර්දන ඒකකයේ කටයුතු සහ සපුගස්කන්ද පොලිස් ස්ථානයේ අනිකුත් නිලධාරීන් පාලනය කිරීමට බලතල තිබූ බලාධිකාරී තත්ත්වයක සිටි කිසියම් වෙනත් පුද්ගලයකු වියහැකිව තිබුණිද? මෙම ප්‍රශ්ණ වලින් සමහරකට කිසිදාක පිළිතුරු ලබාගත නොහැකි විය හැකිය.

## VII වන පරිච්ඡේදය

## උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශණ අතුරුදහන්වීම

**පසුබිම . . . . . . ..**

කොළඹ නාලන්ද විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ රෝහිත ප්‍රියදර්ශණ ආධුනික උප පොලිස් පරීක්ෂකවරයකු ලෙසින් 1986 දී පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුනේය. නාලන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වූ අජිත් ජයසිංහ ද රෝහිත ප්‍රියදර්ශනත් සමඟ පොලිස් බලකායට බැඳුනු අයෙකි. රෝහිත ප්‍රියදර්ශණත් සමඟ අජිත් ජයසිංහ ගේ ඇසුර ඔවුන් දෙදෙනා නාලන්දය වෙනුවෙන් ක්‍රිකට් ක්‍රීඩාවෙහි නිරත වූ වකවානුව දක්වාම දිවෙන්නකි.

කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයෙහි මූලික පුහුණුවෙන් පසුව ඔවුන් දෙදෙනාම විශේෂ කාර්ය බලකායට ඇතුලත් කර ගන්නා ලදුව වැඩිදුර පුහුණුවක් දෙනු ලැබූහ. 1986 මැද භාගයේදී රෝහිත තිරුක්කෝවිල්හි පිහිටි විශේෂ කාර්යය බලකායීය කඳවුරට අනුයුක්තව සිටියේය. ඉන්දිය සාමසාධක හමුදාව ශ්‍රී ලංකාවට පැමිණීමත් සමඟ තිරුක්කෝවිල් කඳවුරෙහි සිටි විශේෂ පොලිස් බලකායීය නිලධාරීන් පිටතට මාරු කරනු ලැබූ බවක් පෙනේ. මෙම ක්‍රියාවලියේදී 1987 නොවැම්බර් මාසයේ රෝහිත ප්‍රියදර්ශණ වැල්ලවත්ත පොලිස් ස්ථානයට මාරු කරනු ලැබිණි. මෙම ස්ථාන මාරුවට ප්‍රධාන හේතුව පොලිස් ක්‍රිකට් කණ්ඩායම වෙනුවෙන් ක්‍රිකට් ක්‍රීඩාවේ නිරතවීමට ඔහුට පහසුකම් සැලසීම බවක් පෙනී යයි. 1988 වර්ෂයේ අවසානය තෙක්ම හෙතෙම දිගටම කොළඹ සේවයෙහි නිරතව සිටියේය. 1989 ජනවාරි 02 වෙනි දිනදී ඔහු කැලණි පොලිස් කොට්ඨාසයට මාරු කරනු ලදුව පැලියගොඩ මූලස්ථාන පොලිස් ස්ථානයට අනුයුක්ත කෙරිණි. 1989 ජූනි මාසයේදී රෝහිත ප්‍රියදර්ශණ සපුගස්කන්ද පොලිස් ස්ථානයට මාරු කරනු ලැබ ඇත. හෙතෙම එම පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයට අනුයුක්තව සිටියේය. සපුගස්කන්ද පොලිස් ස්ථානයට මාරුවී යාමෙන් යම්තම් මසක කාලයක් ඇතුළත එම පොලිස් ස්ථානයට ඉහත කී ප්‍රහාරය එල්ල විණි.

මෙම කාල පරිච්ඡේදය තුළදී උපාලි සමූහ ව්‍යාපාරයට අයත් පුවත්පත් වලට අනුයුක්තව සිටි මාධ්‍යවේදී බන්දුල දිනපුර්ණ සාපරාධී ක්‍රියාවන්ටත් නීතිය ක්‍රියාවට නැංවීමටත් අදාළ ප්‍රවෘත්ති කෙරෙහි අවධානය යොමු කරමින් එවැනි පුවත් එක්රැස් කිරීමෙහි නිරතව සිටියේය. එම ව්‍යායාමය ඇසුරෙන් ඔහු සොයාගත් තොරතුරු අළලා වාර්තා දිවයින සහ අයිලන්ඩ් පුවත්පත් වල පළවිය. අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීමේ එක් ක්‍රමයක් වූයේ පොලිස් නිලධාරීන් සමඟ ඇසුරක් පවත්වාගෙන යමින් ඔවුන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙනි. රෝහිත ප්‍රියදර්ශණ ඉහත කී ගණයෙහිලා සැලකිය හැකි පොලිස් නිලධාරියෙකි. දිනපුර්ණට අනුව රෝහිත වූ කලී යොවුන් වියේ පසු වූ උද්‍යෝගිමත් නිලධාරියෙකි. ඔහු එඩිතරය ; ස්වකීය විමර්ෂණ කාර්යයන්හිලා හෙතෙම නිර්භීතව ඉදිරිපත් වූයේය. කැලණි කොට්ඨාසය තුළ සිදුවූ සොරකම් රැසක් මෙන්ම වෙනත් බරපතළ අපරාධයන් ගණනාවක් එළිදරව් කිරීමෙහිලා හෙතෙම සාර්ථක මෙහෙයක් ඉටු කළේය. නොයෙකුත් සාක්ෂිකරුවන් පැවසූ අන්දමට ඇතැම් අපරාධකරුවෝ කඩාකප්පල්කාරීන් වශයෙන් ව්‍යාජයෙන් පෙනී සිටිමින් සොරකම් වලට සහ වෙනත් දරුණු අපරාධ වලට ඇබ්බැහි වී සිටියහ. රෝහිත ප්‍රියදර්ශණ මෙම මාදිලියේ ක්‍රියාකාරකම් කෙරෙහි සංවේදීව සිට ඇත. එබඳු කටයුතු නොසලකා හැරීමට ඔහු කිසිදිනක

සුදානම් නොවීය. කඩාකප්පල්කාරීන් මෙන්ම පොදු අපරාධකරුවන් යන දෙකොට්ඨාසයම එකම ගණයෙහිලා ඔහු විසින් සැලකිණි. ස්වකීය විවිධාකාර කුප්‍රසිද්ධ සාපරාධී ක්‍රියාවන් හේතුවෙන් ගෝනවල සුනිල්ගේ මහා පවුලද ප්‍රියදර්ශණගේ උකුසු ඇසට ලක්වෙමින් තිබුණු බව අපට ලබාගත හැකි සාක්ෂි මත නිගමනය කිරීම යුක්ති සහගත කරුණකි. මෙම ප්‍රදේශයේ පොදු අපරාධකරුවන් ඇතමෙකු ලත් දේශපාලන අනුග්‍රහය කෙරෙහි හෙතෙම සැලකිලිමත් නොවීය. පොදු අපරාධකරුවන් සාර්ථකව ග්‍රහණයට ගනිමින් අපරාධ විසඳීමෙහිලා ඔහු ඉටු කලා වූ මෙහෙයය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ වැනි ප්‍රදේශය භාරව සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ පැසසුමට ලක්විණි. අපරාධ විමර්ෂණ ක්‍රියාවලියෙහිලා රෝහිත ප්‍රියදර්ශණ විසින් කෙරුණු සාර්ථක ප්‍රයත්නයන් සමහරක් හෙළිකෙරෙන ලේඛණයන් මෙම කොමිසන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. රෝහිත ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීමත් ඔහුට එරෙහිව ඇතැම් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් විසින් කරන්නට යෙදුණු චෝදනාවනුත් සලකා බැලිය යුතු වන්නේ මෙම පසුබිම තුළ සිටය.

ඉමිහියාගේ චන්ද්‍රලතා පෙරේරා පවසන අන්දමට 1990 පෙබරවාරි 08 වන දිනදී ඇගේ සැමියා වූ ටියුඩර් පෙරේරා (මොහු ගෝනවල සුනිල්ගේ සහෝදරයෙකි) කැලෑ ඇඳුමින් සැරසුණු පුද්ගලයින් කණ්ඩායමක් විසින් පැහැරගෙන යනු ලැබ තිබිණි. එවේලෙහි ඇගේ නිවසට පැමිණ සිය සැමියා රැගෙන ගිය තැනැත්තන් කිසිවකු හඳුනාගැනීමට ඇය අපොහොසත් වී ඇත. පෙබරවාරි 20 වෙනි දින සපුගස්කන්ද පොලිස් ස්ථානයෙන් රෝහිත ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීමට අදාලව පෙබරවාරි මාසයේ අවසන් සතියේ පුවත්පත් කිහිපයකම ඔහුගේ ජායාරූපය පලවී තිබිණි. සිය සැමියා පැහැරගෙන යාමට පැමිණි එක් පුද්ගලයකු වශයෙන් රෝහිත ප්‍රියදර්ශණ චන්ද්‍රලතා විසින් හඳුනාගන්නට යෙදී ඇත්තේ මෙම අවස්ථාවේදිය. පෙබරවාරි මස 09 වන දින චන්ද්‍රලතා සිය සහෝදරයා කැටුවවිත් ටියුඩර් පැහැරගෙන යාම පිළිබඳව රනිල් වික්‍රමසිංහ මහතා හමුවූවාය. ඇය වික්‍රමසිංහ මහතාට පැමිණිල්ලක් කරමින් ටියුඩර් නිරුපද්‍රිතව මුදාගැනීම සඳහා ඔහුගේ සහාය පැතුවාය. සිය නිවසට විත් ටියුඩර් පැහැරගෙන ගිය තැනැත්තන් ඔවුන් කවුරුන්දැයි හැඳින්වීමක් නොකළද ඔවුන් පොලිස් නිලධාරීන් යැයි විශ්වාස කරන්නට තරම් ඇයට හේතුන් තිබූ බවක් ඇයගේ හැසිරීමෙන් පෙනී යයි. කැලණි පොලිස් ස්ථානයට ගොස් මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කරන ලෙසටත් ඇයට බියවීමට කිසිදු කරුණක් නොමැති බවටත් වික්‍රමසිංහ මහතා චන්ද්‍රලතාට උපදෙස් දුන්නේය. මේ අනුව චන්ද්‍රලතා කැලණි පොලිස් ස්ථානයට ගොස් සිය සැමියා පැහැරගෙන යාම සම්බන්ධයෙන් පැමිණිලි කලාය. පෙබරවාරි මස 13 වෙනි දිනදී සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතා ඇය වෙත පණිවුඩයක් යවමින් බියගම පොලිස් ස්ථානයටවිත් තමා හමුවන මෙන් ඇයට දැන්වීය. ඇය එපරිදි කටයුතු කලාය. සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින් දෙන ලද උපදෙස් පරිදි කාන්තා පොලිස් නිලධාරිනියක විසින් චන්ද්‍රලතාගේ ප්‍රකාශයක් සටහන් කර ගැනිණි. චන්ද්‍රලතා පවසන පරිදි ටියුඩර් පැහැරගෙන යාමට රෝහිත ප්‍රියදර්ශණ සත්‍ය වශයෙන්ම සම්බන්ධ වූයේ නම් යටත් පිරිසෙයින් ටියුඩර් පැහැරගෙන යාමෙන් ඉක්බිතිවම මෙකී සිද්ධිය පිළිබඳව සහකාර පොලිස් අධිකාරී පීරිස් දැනගෙන සිටින්නට ඇතැයි සිතන්නට බෙහෙවින්ම ඉඩ ඇත. කෙසේ වුවද, ටියුඩර් පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලද බවක් සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි ඇති නිල වාර්තා වලින් හෙළිනොවේ. මෙම සිද්ධියෙන් ඉක්බිතිවම රෝහිත ප්‍රියදර්ශණ අජිත් ජයසිංහට පවසා ඇත්තේ තමන් විසින් සෙසු පොලිස් නිලධාරීනුත් කැටුවවිත් ටියුඩර් අත්අඩංගුවට ගන්නා ලද්දේ සාපරාධී කටයුතු සම්බන්ධයෙන් ඔහු හවුල්වී තිබීමේ හේතුවෙන් බවය. මෙම සාක්ෂිය හැරෙන්නට, රෝහිත ප්‍රියදර්ශණ සහ ඔහුගේ පොලිස් කණ්ඩායම විසින් ටියුඩර්

අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව ඔහුට කුමක් සිදුවී දැයි යන්න සම්බන්ධයෙන් මෙම කොමිසන් සභාවට කිසිවක් නිශ්චිත වශයෙන් දැනගත නොහැකි වූ බව මෙහිලා සටහන් කළයුතුව ඇත. මෙම වකවානුව තුළ සිදුවූ වෙනත් බොහෝ අතුරුදහන්වීම් වලදී මෙන් වියුවර් නැමැත්තා ද පොලිස් අත්අඩංගුවේදී ජීවිතක්ෂයට පත්කරන ලදැයි යන්න නිගමනය කිරීම හැර වෙනත් විකල්පයක් අපට නොතිබේ. මෙම ප්‍රකාශය, ගෝනවල සුනිල්ගේ පවුලට සම්පව සිටි සියල්ලන්ටත් ඔවුන්ට අනුග්‍රහය දැක්වූ අයටත් නිසැකයෙන්ම නුරුස්සන්නක් වන්නට ඉඩ ඇත. මේ වූ කලී රාජ්‍ය බලයේ සිටි පුද්ගලයින්ට සම්පවීමේ අවකාශය ලත් තැනැත්තකු පොලිසිය විසින් ජීවිතක්ෂයට පත්කරනු ලද්දා වූ සුවිශේෂි අවස්ථාවක් බව පෙනේ. රෝහිත ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීම මෙම පසුබිමෙහි සිට සලකා බැලිය යුතුව ඇත. ඉහත සඳහන් වුණු සිද්ධිය නිසා රෝහිත ප්‍රියදර්ශණ ' නැතිහංග කර දමන්නට ' යම් යම් පාර්ශවයන් කුමන්ත්‍රණය කළේද? පොලිසියේ බලාධිකාරිය නොදැනුවත්ව හා ඔවුන්ගේ අනුදැනුමකින් තොරව රෝහිත ප්‍රියදර්ශණ වියුවර්ට කළ දේ ඔහු විසින් කරන ලද්දක් නම් ඔහුගේ ක්‍රියා කලාපය නිසා ඔවුන් ඔහු කෙරෙහි උරණවිද? නොඑසේ නම්, ඔහුගේ ක්‍රියාකලාපය නිසා ඔවුහු අසීරුතාවයකට පත්වූවෝද? නැතහොත් ප්‍රියදර්ශණ කළ දේට ' ඔහුට ' දඩුවම් ' දිය යුතු යැයි රාජ්‍ය බලයේ සිටි තැනැත්තෝ ඉඟියක් කළෝද?

**අතුරුදහන්වීම . . . . . . . .**

1990 පෙබරවාරි මාසය වනවිට පරීක්ෂක කීර්ති අතපත්තු සපුගස්කන්ද පොලිස් ස්ථානාධිපතිවරයා වුයේය. රෝහිත ප්‍රියදර්ශණ මෙම පොලිස් ස්ථානයෙහි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා විය.

ප්‍රියදර්ශණගේ වැඩිමහල් සහෝදරයා වූ සුචිතනාගොඩ මාතන්තලාගේ දිනේෂ් ඉඳගිට ප්‍රියදර්ශණට දුරකථනයෙන් කතා කළේ ඔහුගේ සුවදුක් විමසීමේ අටියෙනි. මීට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ප්‍රියදර්ශණගේ පවුලේ උදවිය රද්දොළුගම නිවාස යෝජනා ක්‍රමයෙහි විසූ අතර ඔහු සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි නිලධාරී නිවාසයන්හි වාසය කිරීමයි. මෙකී නිලධාරී නිවාසයන් පොලිස් ස්ථාන ගොඩනැගිල්ලෙහි ඉහළ මාලයේ පිහිටා තිබිණ. පෙබරවාරි මස 02 වන දින සන්ධ්‍යාව සුපුරුදු පරිදි විය. දිනේෂ් පස්වරු 5.30 ට පමණ ස්වකීය බාල සහෝදරයාට දුරකථනයෙන් ඇමතිමක් කළේය. සාමාන්‍ය කරුණු සම්බන්ධයෙන් ප්‍රියදර්ශණ, දිනේෂ්ට කථා කර තිබූ අතර ප්‍රියදර්ශණ මැසීම සඳහා රද්දොළුවේ ඇඳුම් මහන්නෙකුට දී තිබූ ඇඳුම් වගයක් රැගෙන එන ලෙසද දිනේෂ්ට කියා තිබිණි. එම ඇඳුම් ලබාගෙන පසුදින ඒවා පොලිස් ස්ථානයට ගෙනැවිත් දෙන ලෙස ප්‍රියදර්ශණ, දිනේෂ්ට දන්වා තිබේ.

පස්වරු 6.00 ට පමණ ප්‍රියදර්ශණ පොලිස් ස්ථානයෙහි කාර්ය භාර නිලධාරී (SDO) වශයෙන් රාජකාරි භාරගෙන ඇත. සාමාන්‍යයෙන් එබදු නිලධාරීන් පත්කරනු ලබනුයේ නිත්‍ය කාර්ය භාර නිලධාරීන් නොමැති අවස්ථාවලදී ඔවුන් වෙනුවෙන් වැඩබැලීම පිණිසය. සෑම රාත්‍රියක් සඳහාම එබදු නිලධාරියකු පත්කිරීම සාමාන්‍ය පිළිවෙතව පැවතිණි. මෙම පත්වීම ස්ථානාධිපති විසින් කරනු ලබන්නකි. මෙම අවස්ථාවේදිද ප්‍රියදර්ශණ ස්ථානයෙහි කාර්ය භාර නිලධාරී වශයෙන් පත් කරන ලද්දේ පොලිස් ස්ථානාධිපති / පරීක්ෂක කීර්ති අතපත්තු විසිනි.

එදින සන්ධ්‍යාවේ පසුභාගය වනවිට කීර්ති අතපත්තු බියගම පිහිටි 'බියගම විලේජ් හොටෙල්' හි රැස්වීමකට සහභාගි වනු පිණිස පොලිස් කොස්තාපල් රියදුරු කෙනෙකු කැටුව පොලිස් ස්ථානයෙන් බැහැර ගොස් ඇත. පොලිසියේ වහරන බසින් නිලධාරීන් වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරී සමඟ පවත්වන්නා වූ නිල සාකච්ඡාවන් 'රැස්වීම්' යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම රෙස්ටුරන්ට් හි අයිතිකරු වූයේ ගාමිණී ජයරත්න නැමැත්තෙකි. මෙම ස්ථානය නීත්‍යානුකූල මෙන්ම එතරම් නීත්‍යානුකූල නොවූ විවිධාකාර කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන්නක් බවට සාක්ෂි ඉදිරිපත් කෙරිණි. සත්‍ය වශයෙන්ම එක් සාක්ෂිකරුවකු සඳහන් කර සිටියේ මෙම 'ස්ථානය' විවිධාකාර කටයුතු සඳහා ජෝඩු විසින් පාවිච්චි කරනු ලබන බවකි. මෙබඳු ස්ථානයක ස්වකීය සාකච්ඡාවන් පැවැත්වීම සුදුසු යයි මෙම කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් කල්පනා කළේ ඇයි දැයි යන්න පිළිබඳව කිසිදු සහේතුක කරුණක් කෙනෙකුට සිතාගත නොහැක.

සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි ප්‍රධාන කවුළුවෙහි රාජකාරියෙහි නිරතව සිටියේ පොලිස් සැරයන් 11343 සිරිවර්ධන නැමති අයෙකි. ඔහුගේ පත්වීම උපසේවා කාර්ය භාර නිලධාරී යනුවෙන් හඳුන්වනු ලබන්නකි. 'උපසේවා කාර්ය භාර නිලධාරීන්ගේ' කර්තව්‍යයන්ට පොලිස් ස්ථානයට ගෙනෙනු ලබන සැකකරුවන් සහ නඩු භාණ්ඩ නිල වශයෙන් භාරගැනීම, දුරකථන ඇමතුම් ලබාගැනීම (දුරකථන ක්‍රියාකරු නොමැති විටදී) පැමිණිලි භාරගැනීම ආදිය ඇතුළත් වෙයි. අදාළ දිනදී සිරිවර්ධන නැමති අය පස්වරු 2.00 සිට පස්වරු 10.00 දක්වා රාජකාරියෙහි නිරතව සිටියේය. සිරිවර්ධන වූ කලී මෙම පොලිස් ස්ථානයට නවක නිලධාරියෙක් නොවේ. 1990 පෙබරවාරි මාසය වනවිට හෙතෙම වසරකට ආසන්න කාලයක් සපුගස්කන්ද පොලිස් ස්ථානයට අනුයුක්තව සිට ඇත. එබැවින් සියළුම නිලධාරීන් තමන් දන්නා හඳුනන බවත් තමාට කවර නිලධාරියකුගේ වුවද කටහඬ දුරකථනයෙන් හඳුනාගත හැකි බවත් හෙතෙම කියා සිටී.

පස්වරු 7.30 පමණ වනවිට ප්‍රියදර්ශණ පොලිස් ස්ථානයෙහි අපරාධ විමර්ශන අංශයෙහි සිට ඇත. හෙතෙම එම අවස්ථාවේදී මාධ්‍යවේදී බන්දුල දිනපූර්ණත් නජ් සහ ගාමිණී නම් වූ තවත් දෙදෙනකුත් සමඟ සාකච්ජාවක නිරතව සිට ඇත. බන්දුල දිනපූර්ණ ප්‍රියදර්ශණ හමුවීමට ගොස් ඇත්තේ එම ප්‍රදේශයෙහි සාපරාධී විමර්ශන කටයුතු පිළිබඳවත් එබඳු කටයුතු සම්බන්ධයෙන් කෙරුණු විමර්ෂණයන්හි ප්‍රගතිය පිළිබඳවත් ප්‍රවෘත්ති ලබාගනු පිණිසය. ස්වකීය පෞද්ගලික කරුණු දෙකක් සම්බන්ධයෙන් උදව් උපකාර ලබාගනු පිණිස නජ් සහ ගාමිණී යන දෙදෙන ප්‍රියදර්ශණ හමුවන්නට ගොස් ඇත.

පස්වරු 8.00 ට පමණ පොලිස් ස්ථානාධිපතිවරයාගේ මේසය මත වූ දුරකථනය නාද වෙන්නට විය. එබැවින් සිරිවර්ධන දුරකථනය වෙත ගොස් එම ඇමතුමට පිළිතුරු දුන්නේය. සිරිවර්ධනට අනුව එම ඇමතුම දී ඇත්තේ පොලිස් ස්ථානාධිපති පරීක්ෂක අතපත්තු මහතා විසින්මය. අමතන්නාගේ කටහඬ කිසිදු අපහසුවකින් තොරව හෙතෙම හඳුනා ගත්තේය. තවද අමතන්නා තමා ස්ථානාධිපති යනුවෙන් හැඳින්වීමක්ද කර ඇත. ප්‍රියදර්ශණ එතැනට කැඳවන මෙන් හෙතෙම සිරිවර්ධනට දන්වා ඇත්තේය. මේ අනුව සිරිවර්ධන ඉහත කී තිදෙනා සමඟ සාකච්ජාවක නිරතව ප්‍රියදර්ශණ සිටි තැනට ගොස් ස්ථානාධිපති දුරකථනයෙන් කථා කරන බවත් ප්‍රියදර්ශණට කථා කිරීමට ඔහුට අවශ්‍ය වී ඇති බවත් දන්වා සිටියේය. මේ අනුව ප්‍රියදර්ශණ දුරකථනය තිබූ තැනට ගොස් එම ඇමතුමට පිළිතුරු දී ඇත. ස්ථානාධිපතිවරයා සහ

ප්‍රියදර්ශණ අතර ඇති වූ කථා බහ තමාට ඇසුණු බවක් සිරිවර්ධන නොකියයි. කෙසේ වුවද රිසිවරය ආපසු තැබීමෙන් පසුව ප්‍රියදර්ශණ යළිත් අමුත්තන් සිටි තැනට විත් එම ඇමතුම පොලිස් ස්ථානාධිපතිගෙන් ලද්දක් බවත් තමාට බියගම විලේජ් හෝටලයට එන ලෙස ස්ථානාධිපතිවරයා දන්වා සිටි බවත් එම රෙස්ටුරන්ට් එකට ඒම පිණිස වාහනයක් ඔහු විසින් එවනු ලබන බවත් බන්දුල දිනපූර්ණටත් අනෙකුත් දෙදෙනාටත් ඔහු දන්වා සිටියේය. මෙම කරුණු වලින් පැහැදිලිවම පෙනී යනුයේ පොලිස් ස්ථානාධිපති ප්‍රියදර්ශණට දුරකථනයෙන් කථා කළේ බියගම විලේජ් හෝටලයෙහි සිට බවය. මක් නිසාදයත්, ඔහු ප්‍රියදර්ශණට දන්වා සිටියේ ` බියගම විලේජ් හෝටලයට එන ලෙස ` මිස එකී හෝටලයට ` යන ` ලෙස නොවන බැවිනි. තවද, ප්‍රියදර්ශණ හැරුණු විට ( මොහු අපරාධ විමර්ශන අංශයෙහි ස්ථානාධිපති විය ) කීර්ති අතපත්තු හැර වෙනත් ස්ථානාධිපතිවරයකු නොවූයෙන් ` ස්ථානාධිපති ` ගේ අනන්‍යතාවද බෙහෙවින් පැහැදිලි වන්නකි.

ඉක්බිති ප්‍රියදර්ශණ පොලිස් ස්ථානය පිහිටි ගොඩනැගිල්ලේ ඉහළ මාලයට නැඟ පොලිස් සැරයන් 8577 තන්දසේන විවේක ගනිමින් සිටි කාමරයට විත් ස්ථානාධිපති තමාට දුරකථනයෙන් කථා කොට ` සාකච්ඡාවක් ` සඳහා බියගම විලේජ් හෝටලයට එන ලෙස දන්වා සිටි බව ඔහු කීය. පොලිස් ස්ථානයෙන් තමන් පිටත්ව යන විට කාර්ය භාර නිලධාරී රාජකාරිය තන්දසේනට භාරදෙන ලෙස ` ස්ථානාධිපති ` තමාට දැන්වූ බවද ප්‍රියදර්ශණ තන්දසේනට කීය. මේ අනුව, තන්දසේන පොලිස් ස්ථානයෙහි කාර්ය භාර නිලධාරී ලෙසින් රාජකාරි භාරගත්තේය.

කලින් නිල ඇඳුමින් සැරසී සිටි රෝහිත ප්‍රියදර්ශණ විනාඩි දහයක පමණ වේලාවකින් කමිසයක් සහ කලිසමකින් සැරසී ආපසු උපසේවා නිලධාරියා රාජකාරියෙහි නිරතව සිටි ස්ථානයට විත් අදාල නිල ලේඛණයෙහි ( සාමාන්‍ය තොරතුරු පොත) සටහනක් ඇතුලත් කළේය. ප්‍රියදර්ශණ භාරයේ තම රාජකාරී සේවා රිවෝල්වරය තිබූ බව සාක්ෂි වලින් කියැවිණි. අනතුරුව, හෙතෙම බන්දුල දිනපූර්ණ සහ අනිකුත් අමුත්තන් දෙදෙනා සිටි තැනට ගොස් ඔවුන්ගෙන් ` සමුගත්තේය.` දිනපූර්ණ පොලිස් ස්ථානයෙහි ප්‍රධාන දොරටුව තෙක් ප්‍රියදර්ශණ කැටුව පසුපසින් ගියේය. එසේ පිටවී යද්දී බියගම විලේජ් හෝටලයට යාමට එන ලෙස හෙතෙම දිනපූර්ණට ද ඇරැයුම් කර ඇත. ප්‍රියදර්ශණ විසින් කලින් ලේඛණයෙහි ඇතුලත් කෙරුණු සටහන සාමාන්‍ය රාජකාරිමය වශයෙන් කරන ලද්දේ පොලිස් ස්ථානයේ සිට ඔහුගේ පිටවී යාම සාධාරණීකරණය කරනු පිණිස බව මින් හැඟෙන්නකි. පොලිසියේ වහරන බසින් එබඳු සටහන් ඇතුලත් කිරීම ` බටා පිට බැහැර යාම් ` යනුවෙන් හඳුන්වනු ලබන බව පොලිස් සාක්ෂිකරුවෝ පැවසූහ. මෙබඳු අන්දමේ සටහන් ඇතුලත් කරනුයේ යැපීම් දීමනා ඉල්ලුම් කරනු පිණිසත් බැහැරයෑම් සඳහා නිල තත්ත්වයක් ලබාගනු පිණිසත්ය. ප්‍රියදර්ශණ කැටුව යාමට බන්දුල දිනපූර්ණ ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වුවද, පොලිස් ස්ථානයෙන් බැහැර සුදු පැහැයෙන් යුත් මෝටර් රියක් නවතා තිබෙනු දිනපූර්ණ දැක ඇත. මෙම මෝටර් රියෙන් පිටත එක් පුද්ගලයෙක් හිටගෙන සිටියේය. මෙම පුද්ගලයා දිනපූර්ණ කලින් දන්නා අයකු නොවිණි. ප්‍රියදර්ශණ මෝටර් රිය තිබූ ස්ථානයට ගොස් වාහනයේ ඉදිරිපස අසුනෙහි වාඩිවී ඇත. අනතුරුව, කලින් සඳහන් වුණු පුද්ගලයා විසින් පදවනු ලැබූ මෝටර් රිය බියගම විලේජ් හෝටලය දෙසට ගමන් කර ඇත්තේය. මෙම මෝටර් රිය පිටත්වන අවස්ථාව වනවිට පස්වරු 8.30 පමණ වී ඇත. ඔහු හෝ ඇය ප්‍රියදර්ශණ ජීවමානව සිටිනු දුටු බව මෙම කොමිෂන් සභාව හමුවේ කිසියම් පුද්ගලයකු කියා සිටි අවසන් අවස්ථාව මෙය වූයේය. මෙම මොහොතින් පසුව ප්‍රියදර්ශණ ආගිය අතක් ඔහුගේ පවුලේ උදවියට පවා අසන්නට ලැබී නැත.

කීර්ති අතපත්තු පස්වරු 11.00 ට පමණ පොලිස් ස්ථානයට පෙරලා පැමිණ ඇත. පොලිස් ස්ථානයට ආ පසු හෙතෙම විවේක ගැනීම පිණිස රාජකාරියෙන් මිදී යන බවට සටහනක් ඇතුලත් කර ඇත. එම වේලාවේ වුවද ප්‍රියදර්ශණී පොලිස් ස්ථානයෙහි නොමැත්තේ ඇයිද යනුවෙන් හෙතෙම කිසිදු විමසීමක් කර නැත. ප්‍රියදර්ශණී වෙනුවට වෙනත් ස්ථාන කාර්ය භාර නිලධාරියකු සේවයෙහි නිරතව සිටිනුයේ ඇයි දැයි යනුවෙනුදු ඔහු විමසා නැත. අතපත්තු කියන හැටියට, තමා අදාල දුරකථන ඇමතුම ප්‍රියදර්ශණීට දෙමින් ඔහු බියගම විලේජ් හෝටලයට ගෙන්වා නොගත්තේ නම් ප්‍රියදර්ශණී ස්ථාන කාර්ය භාර නිලධාරී වශයෙන් වැඩ බලමින් එවේලෙහි නොසිටියේ මන්ද යන්න තම මවිතයට කරුණක් වන්නට තිබිණි.

ඊලඟ පසුදින උදැසන ( පෙබරවාරි මස 21 වෙන දින) පොලිස් ස්ථානයෙහි නිලධාරීහු ප්‍රියදර්ශණීට සිදුවූයේ කුමක්දැයි මවිතය පල කරන්නට වූහ. අතපත්තු විසින් දෙනු ලැබූ දුරකථන ඇමතුමක් අනුව ප්‍රියදර්ශණී බැහැර ගිය බව සිරිවර්ධන, අතපත්තුට දන්වා සිටියේය. අතපත්තු විසින් ප්‍රියදර්ශණීට දුරකථන ඇමතුමක් දී ඔහු බියගම විලේජ් හෝටලයට ගෙන්වා ගත් බවට පලමු වතාවට මේ අවස්ථාවේදී යමෙකු කියා සිටි විට වුවද අතපත්තු ඒ බවට නිල වශයෙන් සටහනක් ඇතුලත් නොකලේය. සියළුම සාක්ෂි වලින් පෙනී යනුයේ එසේ තමන් දුරකථන ඇමතුමක් දුන් බව කීම ප්‍රතික්ෂේප කිරීමට නිල වශයෙන් පියවර ගැනීමක් අතපත්තුට අවශ්‍ය නොවන බවය. හෙතෙම එබඳු සටහනක් ඇතුලත් කලේ නම් තමන් ඉකුත් දින රාත්‍රියෙහි එම ඇමතුම දුන් බවට සිරිවර්ධනගේ ප්‍රකාශය ද එම සටහනට ඇතුලත් කිරීමට ඔහුට සිදුවන්නට තිබිණි. එබඳු සටහනක් ඔහු ඇතුලත් කලේ නම් එමගින් සිරිවර්ධනගේ ප්‍රකාශයෙහි විශ්වසනීයත්වය තහවුරු වන්නට ඉඩ තිබිණි. එබඳු දුරකථන ඇමතුමක් තමා විසින් දෙන ලදැයි කීම ප්‍රතික්ෂේප කිරීම හැරුණු විට, ස්වකීය සාක්ෂියේදී පවා සිරිවර්ධන විසින් තමන්ට එරෙහිව සාවද්‍ය සාක්ෂියක් දී ඇත්තේ ඇයි දැයි නිශ්චිතව හේතු දක්වන්නට අතපත්තු අපොහොසත් වනු ඇත. අනෙක් අතට, සිරිවර්ධන කියා ඇත්තේ තමා මුලදීම අදාල සිද්ධිය පිළිබඳව විවෘතව කරුණු හෙළි කර තිබූ බැවින් අතපත්තු තමාට හිරිහැර කල බවය. කෙසේ වුවද, ප්‍රියදර්ශණීගේ අතුරුදහන්වීම පිළිබඳව විමර්ෂණයක් කරන ලෙස අතපත්තු එදිනම එම පොලිස් ස්ථානයේ උප පරීක්ෂක ජමල්ඩීන්ට නියම කර ඇත. මේ සම්බන්ධයෙන් මූලික ප්‍රශ්නයක් පැන නගී. මේ අවස්ථාව වනවිට සිරිවර්ධන කියා සිට ඇත්තේ අතපත්තු ගෙන් ලද දුරකථන ඇමතුමක් අනුව ප්‍රියදර්ශණී පොලිස් ස්ථානයෙන් බැහැරව ගිය බවකි. මෙම කරුණු අනුව අතපත්තු ප්‍රියදර්ශණීගේ අතුරුදහන්වීමට සම්බන්ධ වූ පුද්ගලයකු වන්නේය. කෙසේ වුවද, අතපත්තු මෙම කාරණය වහාම ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකුගේ අවධානයට යොමු නොකලේය. හෙතෙම ස්වකීය අධීක්ෂණය යටතේ මෙම අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් විමර්ෂණයක් පැවැත්වීම සඳහා ස්වකීය ආසන්නතම යටත් නිලධාරියකු වන ජමල්ඩීන් පත්කිරීම නිසි පියවර ගැනීමක් ලෙසින් සැලකීය. ජමල්ඩීන් විසින් අදාල පරීක්ෂණය පවත්වනු ලැබූ ආකාරය ඉතාමත් අවුල් සහගතය. මෙබඳු අවස්ථාවන්හි අපේක්ෂිත පරිදි ජමල්ඩීන් විසින් අතපත්තුගේ ප්‍රකාශය සටහන් කර ගනු ලැබ නොතිබිණි. ඉකුත් දින රාත්‍රියේ රුස්වීමක් සඳහා අතපත්තු බියගම විලේජ් හෝටලයට ආවේද යන වගත් පසුව ප්‍රියදර්ශණී ද එහි ආවේද යන වගත් ජමල්ඩීන් එම හෝටලයට ගොස් විමසීම් කර නැත. ප්‍රියදර්ශණී ගෙදර ආවේදැයි යන්න නිශ්චිතව දැනගනු පිණිස ප්‍රියදර්ශණීගේ මව්පියන්ගෙන් විමසීම් කර නැත. ප්‍රියදර්ශණී ජීවිතක්ෂයට පත්කරන ලද්දේද යන වගත් ඔහුගේ මල සිරුර හඳුනන සහ අයිතිකරුවන් නොමැති මල සිරුරු තැන්පත් කර තැබෙන පොලිස් මෘත ශරීරාගාරයට යවනු ලැබ තිබේ දැයි යන වගත් නිශ්චිත වශයෙන් සොයා දැනගැනීමට කිසිදු උත්සාහයක් දරනු ලැබ නොතිබිණි. ප්‍රියදර්ශණී විසින් එදින රාත්‍රියේ

පොලිස් ස්ථානයෙන් පිටතදී කිසියම් විමර්ෂණයක් කරනු ලැබ තිබිණි දැයි යන්න සොයා දැනගනු පිණිස කිසිදු උත්සාහයක් දරා නොතිබිණි. ජමල්ඩීන් ද, ප්‍රියදර්ශණට සිදුවූ දේ පිළිබඳව දැන ගෙන සිටි බැවින් ඔහු අතුරුදහන්වීම පිළිබඳව මූලික විමර්ෂණයන් කිරීමට පියවර නොගත් බවට යමෙකුට පැහැදිලිවම හැඟී යනු ඇත.

මේ අතර, ස්වකීය සහෝදරයා අතුරුදහන් වී ඇති බවක් කිසිසේත් නොදත් දිනේෂ්, 21 වෙන දිනදිම පෙරවරු 8.30 ට පමණ ප්‍රියදර්ශණට කථා කිරීමේ අටියෙන් පොලිස් ස්ථානයට දුරකථන ඇමතුමක් දුන්නේය. මෙම ඇමතුම දෙනු ලැබ ඇත්තේ ප්‍රියදර්ශණ විසින් මැසීම සඳහා දී ඇති ඇඳුම් ගෙන ඒම සම්බන්ධයෙනි. අතපත්තු මෙම ඇමතුමට උත්තර දී ඇත. තමා ප්‍රියදර්ශණ තිළ කාර්යයක් සඳහා බැහැර යවනු ලැබ ඇති බැවින් එම වේලාවේදී ඔහු පොලිස් ස්ථානයෙහි නොසිටින බව දැන්වීම හැරුණු විට ඉකුත් රාත්‍රියේ පොලිස් ස්ථානයෙන් බැහැර ගිය පසු ඔහු පෙරලා පොලිස් ස්ථානයට නොපැමිණි බවක් හෙතෙම දිනේෂ්ට පවසා නැත. ප්‍රියදර්ශණ ගෙදර ආවේ දැයි යන්නවත් අතපත්තු ඔහුගෙන් විමසා නොමැත. ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීම පිළිබඳව කිසිදු තොරතුරක් දිනේෂ්ට දෙනු ලැබ නොතිබිණි. දහවල් කාලයේදී පමණ පොලිස් ස්ථානයට එන ලෙස අතපත්තු දිනේෂ්ට උපදෙස් දී තිබේ. එබැවින් දිනේෂ් කිසිදු කණස්සල්ලකට පත්වී නොමැත. මේ අනුව, දහවල්හි දී පමණ දිනේෂ් පොලිස් ස්ථානයට ගොස් ඇත. එම අවස්ථාවේදී අතපත්තු ක්ෂණිකව විමසුමක් කරමින් ප්‍රියදර්ශණ ගෙදර ආවේ දැයි දිනේෂ් ගෙන් ඇසීය. ඊට ` නැත ' යනුවෙන් දිනේෂ් පිළිතුරු දී ඇත. දිනේෂ් එවිටම අතපත්තුගෙන් විමසා සිටියේ ඔහු විසින් ප්‍රියදර්ශණ තිළ කාර්යයක් සඳහා යවන ලදැයි දුරකථනයෙන් පැය කිහිපයකට උඩදී තමන්ට දැන්වූ බැවින් මෙබඳු විමසුමක් කරනුයේ ඇයිද යන්නය. දිනේෂ් සඳහන් කරන අන්දමට එම විමසුමට අතපත්තුට කිසිදු පිළිතුරක් දෙන්නට නොතිබිණි. කෙසේ වුවද, එම වේලාව වනවිට යම් කරදරයක් සිදුවී ඇතැයි දිනේෂ් තුළ සැකයක් ඇතිවිණි. මීට අර්ථ වශයෙන් හේතු වූයේ දිනේෂ්ට පොලිස් ස්ථානයේදී නජ් නැමැත්තා මුණගැසී තිබීමය. ඉකුත් දින රාත්‍රියේ ස්ථානාධිපතිගෙන් (අතපත්තු ) ලද දුරකථන ඇමතුමක් අනුව ප්‍රියදර්ශණ පොලිස් ස්ථානයෙන් බැහැර ගිය බව නජ් දිනේෂ්ට පැවසුවේය. මේ අනුව, දිනේෂ් වහාම ආපසු ගොස් අතපත්තු මුණ ගැසුනේය. තමාට ලැබී ඇති තොරතුර සාවද්‍ය බවත් ප්‍රියදර්ශණ ටික වේලාවකින් ආපසු පැමිණෙනු ඇති බවත් අතපත්තු දිනේෂ්ට පැවසීය.

පසුදින උදැසන දිනේෂ් සහ තම පියා සපුගස්කන්ද පොලිස් ස්ථානයට ගොස් ඇත. පොලිස් ස්ථානයේදී ඔවුනට ජමල්ඩීන් මුණ ගැසිණි. ප්‍රියදර්ශණ නුදුරු ස්ථානයකට ගොස් ඇති බවත් ඒ සම්බන්ධයෙන් බියට පත්වීමට කිසිදු හේතුවක් නොමැති බවත් ඔහු ඉක්මණින්ම ආපසු පැමිණෙනු ඇති බවත් ජමල්ඩීන් ඔවුනට කියා ඇත. ඔවුන් අතපත්තු හමු වූ විටදී ඔහුත් එම තත්ත්වයම යළිත් තහවුරු කර ඇත.

එදිනම දිනේෂ් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තලිත් දෙල්ගොඩ මුණගැසී මෙම සිද්ධිය පිළිබඳව දන්වා සිටියේය. තමන් අදාළ සිද්ධිය පිළිබඳව දන්නා බව පැවසූ දෙල්ගොඩ මෙම කාරණය සම්බන්ධයෙන් සොයා බලන්නට තමන් විසින් කණ්ඩායමක් යොදනු ලබන බවට හෙතෙම ප්‍රතිඥා දී ඇත. සත්‍ය වශයෙන්ම මෙහිදී දෙල්ගොඩ කර ඇත්තේ ` හෙතෙම අවංක නිලධාරියෙකි. ඔහු වූ කලී නීතිය අකුරටම පිළිපදිමින් ක්‍රියා කළ නිලධාරියෙකි.` යනුවෙන් පවසමින් ` චරිත සහතිකයක් දීමය.` අනතුරුව, දිනේෂ්ට හා ඔහුගේ පියා වන

එස්.එම්.අමරසේන යන අයට ඇති වූ හැඟීම වූයේ ප්‍රියදර්ශණට කුමක් සිදුවී දැයි නියත වශයෙන්ම සොයා දැනගැනීමෙහිලා දෙල්ගොඩ සැබැවින්ම උනන්දුවක් නොදක්වන බවකි.

මෙම මොහොත වනවිට ලහපාත පිහිටි පොලිස් ස්ථානයන්හි සේවයෙහි නිරත ප්‍රියදර්ශණගේ සමීප මිතුරෝ ද ප්‍රියදර්ශණ සෙවීමෙහි නිරතව සිටියහ. පැලියගොඩ පොලිස් ස්ථානයට අනුයුක්ත අජිත් ජයසිංහ සහ සුහසිංහ යන අයත් කිරිබත්ගොඩ පොලිස් මුරපොලට අනුයුක්ත වැදිසිංහ යන අයත් මොවුන් අතර වූහ.

පෙබරවාරි මස 23 වෙනි දින සන්ධ්‍යාවේදී දිනේෂ්ට ලැබුණු තොරතුරක් මත හෙතෙම පැලියගොඩ පොලිස් ස්ථානය බලා ගියේය. ඔහු එම පොලිස් ස්ථානයට ළඟා වනවිට බෙහෙවින් සැන්දෑ වී තිබිණි. කැලණි නදිය ගලා බසින්නේ මෙම පොලිස් ස්ථානය පිටුපසට නුදුරිනි. පොලිස් ස්ථානයේදී දිනේෂ්ට සුහසිංහ සහ වැදිසිංහ යන අය හමුවී ඇත. වැදිසිංහ සහ අනිකුත් අය කැලණි ගං ඉවුර තෙක් දිනේෂ්ව කැඳවාගෙනැවිත් ප්‍රියදර්ශණගේ හැඩරුව ඇති මළ සිරුරක් ගඟේ පාවෙමින් පහළට ගසාගෙනැවිත් ඇති බවක් ඔහුට දන්වා එය ප්‍රියදර්ශණගේ දැයි බලන ලෙස දිනේෂ්ට කීය. එවිට දිනේෂ් ගඟ අසබඩට ගිය අතර ඒ මොහොත වනවිටත් මළ සිරුර ගඟ මැද පාවෙමින් තිබිණ. පොලිස් නිලධාරීහු එවිට මළසිරුර ගං ඉවුරට ඇද ගත්හ. එම මළ සිරුරට හානි සිදුවී ඇති බවක් දිනේෂ් දුටුවේය. සිරුරේ මුහුණෙහි කොටසක් නොතිබිණි. අත් පා ආදියෙහි කොටස්ද තුවාල වී තිබිණි. එහි මුහුණ හඳුනාගැනීමට දිනේෂ්ට නොහැකි විය. මළ සිරුර ඉදිමී ගොසිනි. එසේ වුවත් ප්‍රියදර්ශණගේ සිරුරෙහි තිබූ සුවිශේෂී ලක්ෂණයක් එහි දක්නට ලැබිණි. එම ලක්ෂණය වනුයේ උපතින්ම ප්‍රියදර්ශණගේ පසු පෙදෙස මත තනපුඩු හතරක් තිබීමය. එක පැත්තක තනපුඩු දෙක බැගින් ඒවා දෙපසෙහිම පිහිටා තිබිණි. මෙම තනපුඩු හතරින් සිරුරෙහි එක පැත්තක තනපුඩු දෙකක් තිබුණු බවත් අනික් පැත්තෙහි එකක් තිබුණු බවත් දිනේෂ් දැක ඇත. එක් තනපුඩුවක් පමණක් දක්නට ලැබුණු පැත්තෙහි පසු ප්‍රදේශයේ (මෙහි මුලදී තනපුඩු හතරක්ම තිබිණි ) හම පළුදු වී තිබිණි. මෙකී නියත හඳුනාගැනීමට අමතරව මළ සිරුර කලිසමකින් සැරසී තිබුණ බවත් එය දිනේෂ් සහ ප්‍රියදර්ශණ යන දෙදෙනාම හවුලේ පාවිච්චි කළ එකක් බවත් දිනේෂ්ට වැටහිණි. තමන් දෙදෙනාම ශාරීරික පෙනුමින් සහ ප්‍රමාණයෙන් එක සමාන වූ බැවින් මෙපරිදි ඇඳුම් හවුලේ පාවිච්චි කිරීම පොදු ලක්ෂණයක් විණි. මෙම සිද්ධිය වූ ස්ථානයේ සිටි දිනේෂ් සහ අනිකුත් නිලධාරීන්ට මුහුණේ හැඩරුවෙන් සිරුර හඳුනාගත නොහැකි වුවද ඉහත කී හේතූන් නිසා එම සිරුර සත්‍ය වශයෙන්ම ප්‍රියදර්ශණගේ බවට ඔවුහු සැහීමට පත්වූහ. ප්‍රියදර්ශණගේ සිරුරෙහි තනපුඩු හතරක් තිබිණැයි යන කාරණය ඔහුන් සමඟ පොලිස් අභ්‍යාස විද්‍යාලයේ සිටි ඔහුගේ මිත්‍රයින් සාක්ෂි දුන් විට සනාථ විණි. ප්‍රියදර්ශණගේ සිරුරෙහි තනපුඩු හතරක් තිබුණැයි යන්න කාරණය පුළුල් වශයෙන් ප්‍රචලිත කරුණකි. අදාල කාරණය සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියා කිරීම පිණිස පසු දින ආපසු පැමිණෙන මෙන් මෙම නිලධාරීන් විසින් දිනේෂ්ට උපදෙස් දෙන ලදී. මෙහිදී සාමාන්‍ය පිළිවෙත අනුව මරණ පරීක්ෂණයක් පැවැත්විය යුතුව තිබුණැයි යනුවෙන් හැඟීමක් කෙනෙකු තුළ ඇත්වන්නේය.

මෙම මළ සිරුර හඳුනාගනු ලැබුවායින් පසුව එම ස්ථානයෙහි සිටි නිලධාරීහු මළ සිරුර ගඟේ පාවෙමින් තිබියදීම එය ලණුවක ආධාරයෙන් අසල පිහිටි ගසක බැඳ තැබූහ. පොලිසියෙහි මෙම ක්‍රියා කලාපය නියත වශයෙන්ම අසාමාන්‍ය වූවකි. කෙසේ වුවත්, මෙම අසාමාන්‍ය ක්‍රියා

කලාපයට තුඩු දී ඇත්තේ මෙම මුළු සිද්ධිය පිළිබඳව නිසි විමර්ශණයක් පවත්වන්නට පොලිස් බලාධිකාරිය කැමැත්තක් නොදැක්වීම බවක් පෙනෙන්නට ඇත.

පසුදින උදෑසනම දිනේෂ් තම පියාත් කැටුව පොලිස් ස්ථානයට පෙරලා පැමිණියේය. පොලිස් ස්ථානයේදී ඔවුනට ප්‍රියදර්ශණගේ මිතුරන් හමු වූ අතර ඔවුහු ප්‍රියදර්ශණට කුමක් සිදුවී දැයි යන්න නිශ්චිත වශයෙන්ම සොයා දැනගැනීමෙහිලා අවංකවම උනන්දුවක් දැක්වූහ. ඉනික්බිතිව ඔවුහු ගං ඉවුර අසලට ගියහ. එවේලෙහි එම මළ සිරුර එහි නොතිබීම ඔවුනගේ විමතියට කාරණයක් විය. මළ සිරුර ගසක බැඳ තැබීමට පාවිච්චි කෙරුණු කඹය කපා දමා තිබිණි. මළ සිරුරට කුමක් වී දැයි යන්න පිළිබඳව කරුණු පැහැදිලි කර දෙමින් ඔවුනට සහායවීමට එම රාත්‍රිය තුළ පැලියගොඩ පොලිස් ස්ථානයෙහි රාජකාරියෙහි නිරතව සිටි නිලධාරිහු අසමත් වූහ. පැලියගොඩ පොලිස් ස්ථානය බෙහෙවින් ආරක්ෂක රැකවල් යෙදූ ස්ථානයක් බව සාක්ෂි වලින් කියැවිණි. ඇත්ත වශයෙන්ම, පොලිස් ස්ථානය පිහිටි භූමියෙහි පසුභාගයේ හොඳින් විදුලි ආලෝකය දල්වා තිබිණි. ප්‍රියදර්ශණගේ සිරුරට සිදුවූයේ කුමක්ද? පැලියගොඩ පොලිස් ස්ථානයෙහි බලධාරීන්ගේ එකහත්වයෙන් තොරව ක්‍රියාත්මක වූ පිටස්තරයකු විසින් ප්‍රියදර්ශණගේ මළ සිරුර ඉවතට ගෙනයන්නට ඇත්ද? එසේ නැතහොත්, එවැන්නකු විසින් කඹය කපා දැමීම නිසා මළ සිරුර ගඟ දිගේ මුහුදට පාවී යන්නට ඇත්ද?

මේ අවස්ථාව වනවිට ප්‍රියදර්ශණගේ පවුලේ උදවියගේ සිත්හි පැහැදිලි වශයෙන්ම තිබූ හැඟීම වූයේ ප්‍රියදර්ශණ අතුරුදහන්වීම සම්බන්ධයෙන් විමර්ශණයන් පැවැත්වීමෙහිලා ප්‍රදේශයේ පොලිස් බලධාරීන් හැකි උපරිම මට්ටමින් උනන්දුවක් නොදක්වන බවකි. එබැවින් 1990 පෙබරවාරි මස 24 වන දින පස්වරු 7.00 ට ප්‍රියදර්ශණගේ පියා පොලිස් මූලස්ථානය බලා ගොස් ප්‍රියදර්ශණ අතුරුදහන්වීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් කළේය.

මෙකල්හිදී හෝ මෙකල්හිදී පමණ වැදිසිංහ සහ සුභසිංහ යන අය ස්ථානාධිපති අතපත්තු හමුවී ප්‍රියදර්ශණට කුමක් සිදුවී තිබිණි දැයි ඔහුගෙන් විමසූහ. මෙම කාරණය සම්බන්ධයෙන් කටයුතු කෙරෙන ආකාරය පිළිබඳව ඔවුහු ස්වකීය අසතුට පළ කර සිටියහ. ` බල්ලෙක් මළත් මීට වඩා හොඳ පරීක්ෂණ පවත්වනවා ` යනුවෙන් ප්‍රකාශ කර සිටි ඔවුහු මෙම අතුරුදහන්වීම සම්බන්ධයෙන් ඔබ පරීක්ෂණයක් නොකරන්නේ මන්දැයි යනුවෙනුත් විමසා සිටියහ. ` සිදු වී ඇති දේ කුමක්දැයි තමන් නොදන්නා බවත් ඔහු ගිය කොතැනකින් හෝ එනු ඇතැයි ` යනුවෙන් අතපත්තු තර්ජනාත්මක විලාශයකින් පිළිවදන් දී ඇත.

සපුගස්කන්ද පොලිස් ස්ථානයෙන් පිටවී ගොස් පැය දෙකක කාලයක් ඇතුළතදී මවුන් දෙදෙනාට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දෙල්ගොඩ ගෙන් රාජකාරී පණිවුඩයක් ලැබී ඇත. තමාට ඔවුන් දෙදෙන නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න හමුවට ඉදිරිපත් කරන්නට සිදුව ඇති බැවින් පසුදින උදෑසනින්ම තමා ඉදිරියේ පෙනී සිටින ලෙස එම පණිවුඩ වලින් ඔවුනට නියම කෙරිණි. කලින් දිනයේදී ඔවුන් සපුගස්කන්ද පොලිස් ස්ථානයට ගොස් පොලිස් ස්ථානයට හානි කිරීමට ( ` සමතලා කරන්නට ` ) තර්ජනය කළේ ඇයිදැයි දෙල්ගොඩ විමසීය. එවැන්නක් කළැයි කීම ඔවුන් දෙදෙනා ප්‍රතික්ෂේප කර සිටියහ. කෙසේ වුවද, දෙල්ගොඩ විසින් ඔවුන් මෙරිල් ගුණරත්න හමුවට ඉදිරිපත් කරන ලදී. `` මියගිය තැනැත්තන් සොයා යාමෙන් කරදරයට පත්නොවන්නැයි `` නියෝජ්‍ය පොලිස්පති වැදිසිංහට අවවාද කළේය. තමන් තවදුරටත් ප්‍රියදර්ශණ සෙවීමට කටයුතු කළහොත් යාපනයට මාරු කරන බවට නියෝජ්‍ය පොලිස්පති

මෙරිල් ගුණරත්න සුහසිංහට අවවාද කළේය. ඔවුන් දෙදෙනා නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්නගේ කාර්යාලයේ සිට ආපසු පැමිණෙද්දී ඔවුනට අතපත්තු මුණ ගැසිනි. තමන් පොලිස් ස්ථානය සමතලා කරන්නට යන බවට ඔවුන් ඔහුට කියා ඇති බවට අසත්‍යයක් උසස් නිලධාරීන්ට පැවසුවේ ඇයිදැයි ඔවුහු නිතැතින්ම අතපත්තුගෙන් විමසූහ. මේ සම්බන්ධයෙන් මුණගැසී කරුණු පැහැදිලි කර ගැනීම සඳහා තමන් සමඟවිත් නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න හමුවන ලෙස ඔවුහු අතපත්තුගෙන් ඉල්ලා සිටියහ. අදාල සිද්ධිය සම්බන්ධයෙන් උසස් නිලධාරීන්ට තමා දන්වා ඇතැයි කීම අතපත්තු ප්‍රතික්ෂේප කළේය. වැදිසිංහ හා සුහසිංහ කැටුව නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න ගේ කාර්යාලයට යාමටද ඔහු ප්‍රතික්ෂේප කළේය.

ඉනික්බිතිව, පැලියගොඩ පොලිස් ස්ථානයේදී වැදිසිංහට සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මුණගැසුණි. ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීම සම්බන්ධයෙන් දැහලීමක් නොකරන ලෙස වැදිසිංහට තර්ජනය කර සිටි සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් තමන් මේ අයුරින් දිගටම ක්‍රියා කලහොත් ප්‍රියදර්ශණට සිදුවූ ඉරණමටම තමන්ටත් මුහුණපාන්නට සිදුවන බව ඔහු කියා සිටියහ. කෙසේ වුවද, වැදිසිංහ සහ සුහසිංහ තවදුරටත් ප්‍රියදර්ශණ සෙවීම සඳහා ක්‍රියා කළහ. මේ අතර, අජිත් ජයසිංහ ද ප්‍රියදර්ශණ සොයා යමින් සිටියේය. අජිත් ජයසිංහ නිවාඩු ලබාගෙන පූර්ණ කාලීනව ප්‍රියදර්ශණ සෙවීමේ ව්‍යායාමයෙහි නිරතවිය. මෙම කාලසීමාව තුළදී වැදිසිංහට ලැබුණු තොරතුරකින් කියැවුණේ අජිත් ජයසිංහ, ප්‍රියදර්ශණ සෙවීමෙහිලා අවංකවම උනන්දුවක් දක්වන බැවින් සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් උරණ වී ඇති බවකි. එබැවින් ජයසිංහ ලුහුබැඳ යාමට ඔහු විසින් කණ්ඩායම් දෙකක් යොදවනු ලැබ ඇතැයි ද එම තොරතුරින් වැඩිදුරටත් කියැවිණි. ජයසිංහ පැහැරගෙන යාමටත් ඔහුට හානි පමුණුවන්නටත් ඉඩ ඇතැයි වැදිසිංහ භීතියට පත්වී සිටියේය. එබැවින්, මේ සම්බන්ධයෙන් හෙතෙම ජයසිංහට අවවාද කර ඇත.

කෙසේ වුවද, තමන් පිස්තෝලයක් සහ අත් බෝම්බයක් රැගෙන යමින් සිටින බැවින් තමන් භීතියට පත් නොවන බවත් තවදුරටත් ප්‍රියදර්ශණ සෙවීමේ ව්‍යායාමයෙහි තමන් නිරත වන බවත් ජයසිංහ කියා සිටියේය. සිය ක්‍රියා කලාපය නිසා ජයසිංහට සත්‍ය වශයෙන්ම කුමක් සිදුවීද යන්න ඊළඟ පරිච්ඡේදයෙන් විස්තර කෙරේ.

ප්‍රියදර්ශණ අතුරුදහන්වීමෙන් අනතුරුව ගෙවී ගිය මුල් කාලපරිච්ඡේදය තුළදී ඔහු කිසිදු නීති විරෝධී කටයුත්තක හෝ වෙනත් අපකීර්තිමත් චර්යාවක යෙදී සිටි බවට ඔහුට එරෙහිව කිසිවකු විසින් කිසිදු චෝදනාවක් නොනැඟුණු බව සැලකුව මනාය. ඇත්ත වශයෙන්ම, එකල්හි කාගේත් පොදු මතය වූයේ ප්‍රියදර්ශණ වූ කලී අවංකභාවය හා කාර්යක්ෂමතාව අතින් කිසිවකුට ප්‍රශ්න කළ නොහැකි වූ විශිෂ්ඨ ගණයේ නිලධරයකු බවයි.

ප්‍රියදර්ශණ අතුරුදහන් වූ තැන් පටන් ගත වී ඇති කාලයත් ( හත් වසරකි) ඔහුගේ මළ සිරුර සොයා ගැනීමත් ( අදාල මළ සිරුරෙහි අනන්‍යතාව නීත්‍යානුකූල වශයෙන් නිශ්චිතව තහවුරු කරනු ලැබ නොතිබිණි.) හේතු කොටගෙන මෙම කොමිෂන් සභාව එළඹී ඇති නිගමනය වනුයේ ප්‍රියදර්ශණ බියගම විලේජ් හෝටලයේදී හෝ එම හෝටලයේ සිට ඔහු ගෙන යනු ලැබූ වෙනත් ස්ථානයකදී මරණයට පත් කරනු ලැබූ බවය. මෙම නිගමනයට එළඹෙන්නට අප පෙළඹී ඇත්තේ, විශේෂයෙන්ම 20 වෙනි දින රාත්‍රියෙහි පොලිස් ස්ථානයට එකී දුරකථන ඇමතුම දුන් බව කීම සහ ප්‍රියදර්ශණ එම හෝටලයට කැඳවූ බව කීම පොලිස් පරීක්ෂක අතපත්තු

ප්‍රතික්ෂේප කළ හෙයිනි. එතෙකුදු වුවත්, එදින සන්ධ්‍යාවෙහි සාකච්ඡාවක් සඳහා තමන් එම හෝටලයට ගිය බව අතපත්තු පිළිගත්තේය. ප්‍රියදර්ශණ පොලිස් ස්ථානයෙන් නික්ම ගිය මොහොතේ සිට ඔහුට සිදුවූයේ කුමක්දැයි නිශ්චිත වශයෙන් සොයා දැනගනු පිණිස මෙම කොමිසන් සභාවට අනුයුක්ත විමර්ෂකයින් විසින් දරන ලද විමර්ෂනාත්මක ප්‍රයත්නයන් තුලින් කිසිදු නියත ප්‍රතිඵලයක් අති නොවුණි. මේ සම්බන්ධයෙන් කිසියම් අතිශයින් වැදගත් හෝඩුවාවන් සැපයිය හැකි තත්ත්වයක සිටි සියළුම පුද්ගලයෝ එම සිද්ධිය සම්බන්ධයෙන් කිසිවක් දත් බව කීම ප්‍රතික්ෂේප කළහ. නැතහොත් නිරුත්තරව සිටියහ. ප්‍රියදර්ශණට කවර ඉරණමකට මුහුණ පෑමට සිදුවූයේ ද යන්න ඔහුගේ අතුරුදහන්වීමට සම්බන්ධ වූවන් පමණක් දන්නා කරුණක් වන අතර ඔවුනට ස්වකීය ජීවිතයේ ඉතිරි කාලය පීඩාකාරී හෘද සාක්ෂියකින් ( ඔවුනට එවැන්නක් ඇතොත්) යුතුව ගත කරන්නට සිදුවනු ඇත.

# VIII වන පරිච්ඡේදය

## උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ අත් අඩංගුවට ගැනීම හා රඳවා තබාගැනීම

**පසුබිම. . . . .**

**ප්‍රියදර්ශණ සොයා යාම . . . . . . . . . ..**

ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීමෙන් පසුව ඇති වූ තත්ත්වයන්හි ස්වභාවය පිළිබඳව කැලණි පොලිස් කොට්ඨාසයේ සේවයෙහි නිරතව සිටි ඔහුගේ සමීප මිත්‍රයින් සෑහීමට පත්ව නොසිටි බව පැහැදිලි කරුණකි. මෙම කාරණය සම්බන්ධයෙන් පොලිසියේ උසස් බලධාරීන් ඇඩි උනන්දුවක් නොදක්වනුයේ ඇයි දැයි යන්න පිළිබඳව ඔවුහු කනස්සල්ලට පත්ව සිටියහ. අදාළ විමර්ෂණය සඳහා විශේෂ විමර්ෂණ ඒකකවකදු පිහිටුවනු ලැබ නොතිබිණි. අතපත්තුගේ ( මොහුද තමනට එරෙහිව චෝදනාවක් පැවති අයෙකි) අධීක්ෂණය යටතේ ජමල්ඩීන් විසින් යම්තමින් කරනු ලැබූ විමර්ෂණයන් පිළිබඳව මොවුහු නිසැකයෙන්ම සෑහීමට පත් වී නොසිටියහ. එබැවින් ප්‍රියදර්ශණට සිදුවූයේ කුමක්දැයි යන්න නිසැකයෙන්ම සොයා දැනගනු පිණිස අනියම් වශයෙන් විමර්ෂණයන් පවත්වන්නට පොලිසියෙහි නිරත ඔහුගේ මිතුරන් පිරිසක් කටයුතු ඇරඹූහ. අජිත් ජයසිංහ එවැනි මිතුරෙක් වූයේය.

ප්‍රියදර්ශණට කෙබන්දක් සිදුවූයේ දැයි දින කීපයකට පසුව වුවද සොයා දැනගන්නට අපොහොසත් වූයෙන් අජිත් ජයසිංහ සහ සෙසු අයගේ සිත්හි කලකිරීමක් හටගනිමින් තිබූ බවක් පෙනේ. ප්‍රියදර්ශණ අතුරුදහන්විම සම්බන්ධයෙන් පෙබරවාරි මස 23 වෙනි දිනදී පමණ පෑලියගොඩ පොලිස් ස්ථානයෙහි ` චෝදනාගාරය ` තුළදී අජිත් ජයසිංහ මහත් ශබ්ද නඟා කථා කර ඇත්තේය. ` කවුරු ප්‍රියදර්ශණ මරා දැමුවත් එම තැනැත්තා සොයා මරා දමනවා යැයි ` හෙතෙම කියා ඇත. ප්‍රියදර්ශණ 23 වෙනි දින වනවිට දි ජීවතුන් අතර නොසිටින බවට ජයසිංහ ගේ සිත්හි සැකයක් පැවති බවක් මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වෙයි. මෙම අවස්ථාව වනවිට මළ සිරුර සොයාගැනීම සම්බන්ධ සිද්ධිය ප්‍රියදර්ශණගේ සහෝදරයා වන දිනේෂ් විසින් ඔහුට දන්වනු ලැබ තිබීම මීට හේතු වූවා විය හැකිය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමෙහිලා පොලිසියේ උසස් නිලධාරීන්ගේ මන්දෝත්සාහී බවක් පෙනෙන්නට තිබූ බැවින් ඊට පොලිසිය සම්බන්ධ වී ඇතැයි ප්‍රියදර්ශණගේ මිත්‍රයින් සැකකොට ඇති බවක් පෙනේ. 20 වෙනි දින රාත්‍රියේ ප්‍රියදර්ශණ, පොලිස් ස්ථානයෙන් නික්ම ගොස් ඇත්තේ අතපත්තු විසින් දෙනු ලැබූ දුරකථන ඇමතුමක් අනුව බව ඔවුනට දැනගන්නට ලැබීම නිසා මෙම මතය තහවුරු වන්නට ඇත. ඇත්ත වශයෙන්ම මෙම සිද්ධියෙන් ඉක්බිතිවම ප්‍රියදර්ශණ සෙවීම සඳහා තමන් කටයුතු නොකරනුයේ ඇයිදැයි ජයසිංහ අතපත්තුගෙන් විමසා සිටි කල්හි අතපත්තු කලබලයට පත්ව එම ප්‍රශ්නයට උත්තර දීම මඟහැර ඇත. පොලිස් ස්ථානයේදී මෙම කාරණය සම්බන්ධයෙන් ශබ්ද නඟා- කථා කරන්නට ජයසිංහ අදහස් කළේ ඇයිදැයි යන්න මෙම පසුබිම් කරුණු වලින් පැහැදිලිවෙයි. එම ස්ථානය අවට සිටි තැනැත්තන් මාර්ගයෙන් මෙම පණිවුඩය අදාළ පාර්ශවයන්ට ඇනුම්දීමට ඔහුට වුවමනා වූවා විය හැකිය. එය ඉටු වී ඇති බවක් පෙනෙන්නට ඇත.

මෙදින පමණදී සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ට ජයසිංහ මුණගැසී ඇති අතර ප්‍රියදර්ශණ සෙවීම සඳහා ඔහු කටයුතු නොකරන්නේ දැයි එවිට හෙතෙම ජයසිංහ ගෙන් බෙහෙවින් උපහාසාත්මක අයුරින් විමසා ඇත. දිනකින් හෝ දෙකකින් ` යම් තොරතුරක් ` ඔහුට (ජයසිංහට ) ලැබෙනු ඇතැයි එවේලෙහි ඩග්ලස් පීරිස් තවදුරටත් පවසා ඇත. එවැන්නක් කී විටදී සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් කුමක් සිතාගෙන සිටියේද? ප්‍රියදර්ශණගේ ` සමීප මිතුරා ` කවුදැයි යන්නත් පීරිස් විමසා ඇත. සමීප මිතුරා තමා බවත් එබැවින් ප්‍රියදර්ශණ සෙවීමට තමන් සෑම පියවරක්ම ගන්නා බවත් ජයසිංහ පිළිවදන් දී ඇත.

මෙම සිද්ධියෙන් දිනක් හෝ දෙකක් ඇතුළත උප පොලිස් පරීක්ෂක දෙල්ගහගොඩ (මොහුද කැළණි කොට්ඨාසයෙහි නිලධාරියෙකි) ජයසිංහ මුණ ගැසී ඔහුට දන්වා සිටියේ ප්‍රියදර්ශණ තමාගේ භාර්යාවට පෙම් කරමින් සිටිද්දී දෙහිවල පදිංචි තැනැත්තෙකු විසින් ඔහු අල්ලා ගනු ලැබ ඇතැයි සහකාර පොලිස් අධිකාරී පීරිස් තමාට කී බවයි. මෙකී තැනැත්තා ප්‍රියදර්ශණගේ ලිංගික අවයවයන් කපා දමා අප්‍රසිද්ධ ස්ථානයක ඔහු රඳවා ගනු ලැබ ඇති බවයි. ප්‍රියදර්ශණගේ හොඳම මිතුරා තමා මුණගැසෙන්නට බටලන්දට ආවොත් මේ කාරණය සම්බන්ධයෙන් යම් ඉතා වැදගත් තොරතුරක් තමා හෙළිදරව් කරන බව සහකාර පොලිස් අධිකාරී පීරිස් දෙල්ගහගොඩට කියා ඇත. ප්‍රියදර්ශණගේ `හොඳම මිතුරා ` බටලන්දට ගෙන්වා ගැනීමට සහකාර පොලිස් අධිකාරී පීරිස්ට වුවමනා වූයේ ඇයි? මේ කාරණය ගැන ජයසිංහ තම මිතුරන් සමඟ සාකච්ඡා කළේය. බටලන්දට නොයන්නැයි ජයසිංහ ගේ මිතුරෝ ඔහුට උපදෙස් දුන්හ. කෙසේ වුවද, තමා බියපත් නොවන බවත් මේ සම්බන්ධයෙන් බටලන්දට යන්නට තමන් ලෑස්තිව සිටින බවත් ජයසිංහ පවසා ඇත. කෙසේ වුවත්, ඉතික්බිතිව ඇති වූ සිද්ධීන් නිසා ජයසිංහ බටලන්දට යෑම වැලකිණි.

මෙම කාලසීමාව තුළදී ජයසිංහ පැලියගොඩ පොලිස් ස්ථානයෙහි පිහිටි අවිවාහක නිලධාරී නිවාසයන්හි නතර වී සිටියේය. මෙම කාරණයට අදාලව පවත්නා සාක්ෂි වලින් පැහැදිලි වනුයේ පෙබරවාරි මස 22 වෙනි දින සිට දවසේ වැඩි කාලයක් ජයසිංහ, ප්‍රියදර්ශණ සෙවීම සඳහා ගත කරමින් සිට ඇති බවකි. ඇතැම් වේලාවන්හිදී හෙතෙම පැලියගොඩ පොලිස් ස්ථානයෙහි නොසිටියේය. `කෙසේ වුවත්, රෑ බෝ වනවිට හෙතෙම පොලිස් නිවාසය කරා පැමිණෙන්නට පුරුදුව සිටියේය. මේ අනුව පැහැදිලි වශයෙන්ම පෙනී යනුයේ ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීමෙන් අනතුරුව ජයසිංහ සැඟවී සිටින්නට කිසිදු උත්සාහයක් දරා නොමැති බවයි. මෙම ප්‍රකාශයේ වැදගත්කම හෙළිවනුයේ ජයසිංහ හිරභාරයට ගැනීම හා රඳවා තබාගැනීම පිළිබඳව කෙරුණු බලධාරීන්ගේ ප්‍රකාශය අප විග්‍රහ කරන විටදීය. ජයසිංහ රාත්‍රී කාලය තුළදී පැලියගොඩ පොලිස් ස්ථානයෙහි නිලධාරී නිවාසයන්හි සිටි බැවින් ඔහු මුණගැසීමට උනන්දුවක් දක්වන කවරෙකුට වුවද ඔහු සොයා යාමක් අවශ්‍ය නොවිණි.

**ජයසිංහ සිරභාරයට ගැනිණි. . . . .**

25 වෙනි දින සන්ධ්‍යාවේදී ජයසිංහ, පොලිස් පරීක්ෂක මාරසිංහ (එවක පැලියගොඩ පොලිස් ස්ථානාධිපති) වෙත ඉල්ලීමක් කරමින්, පසු දිනදී පොලිස් රෝහලින් වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට ලිඛිතව අවසරයක් ලබා දෙන මෙන් දන්වා ඇත. මේ අනුව, අවශ්‍ය ලිඛිත අවසරය මාරසිංහ විසින් ජයසිංහ වෙත ලබාදෙන ලදී. පසුදින උදෑසන සරත් බණ්ඩාර නැමති සිය මිතුරකු

ද කැටුව ජයසිංහ එකල්හි බොරුල්ලෙහි පිහිටි පොලිස් රෝහල බලා ගියේය. ඔවුන් බොරුල්ලට ගියේ සරත් බණ්ඩාරගේ යතුරු පැදියෙනි. එය බණ්ඩාර විසින් පදවන ලදී . ඔවුහු බේස්ලයින් පාර දිගේ ගමන් කොට, දෙමටගොඩ දුම්රිය හරස් පාර තෙක් පැමිණියහ. දුම්රිය හරස් පාර අසලදී ඉදිරිපසින් සහකාර පොලිස් අධිකාරී පිරිස්, තම පොලිස් කොස්තාපල් රියදුරු රංජිත් විසින් පදවනු ලැබූ නිල් පැහැති ලාන්සර් වර්ගයේ මෝටර් රථයෙන් එනු ජයසිංහ දැක ඇත. එවේලෙහි සහකාර පොලිස් අධිකාරී පිරිස් ස්වකීය නිල ඇඳුමින් සැරසී සිට ඇත. සහකාර පොලිස් අධිකාරී පිරිස් ජයසිංහ දැක ඔහුට නවතින ලෙස සංඥාවක් කළේය. මේ අනුව, ජයසිංහ බණ්ඩාරට කියා යතුරුපැදිය නවතා ගෙන ඉන් බැස ඇත. සහකාර පොලිස් අධිකාරී පිරිස් ද මෝටර් රියෙන් බැස සිටි අතර දෙදෙනාම එකිනෙකාට ආසන්න වූහ. ජයසිංහ සිරුවෙන් සිට සහකාර පොලිස් අධිකාරීට ආචාර කළේය. සහකාර පොලිස් අධිකාරී සිය අවිය (පිස්තෝලය) එළියට ඇද එය ජයසිංහ ගේ බෙල්ලට එල්ල කළේය. පිරිස් ගේ අනික් අතින් හෙතෙම ජයසිංහ ගේ කමිසයේ කරපටියෙන් ඇද්දේය. මින් තිගැස්සුණු ජයසිංහ තමනට යම් දරුණු දෙයක් සිදුවෙතැයි බියට පත්විය. මෙය ප්‍රියදර්ශණට සිදුවූ දෙයටත් ප්‍රියදර්ශණට සිදුවූයේ කුමක්දැයි නිශ්චිත වශයෙන් සොයා දැනගැනීමේ අටියෙන් තමන් දැරූ උත්සාහයන්ටත් සම්බන්ධ වූවක් වියහැකි බව ජයසිංහට වැටහිණි.

ජයසිංහ අඩි කීපයක් පසුපසට විත් අසල වූ විදුලි කණුවක් අල්ලා ගත්තේය. මෙම මොහොතේදී පැලියගොඩ ප්‍රදේශයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි (CSU) වෑන් රථය ( මෙය V වෙනි පරිච්ඡේදයෙහි විස්තර කැර ඇත) සහකාර පොලිස් අධිකාරීගේ මෝටර් රිය පිටුපස නවතා තිබෙනු ජයසිංහ දුටුවේය. ඒ අසලම පැලියගොඩ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට අනුයුක්ත නිලධාරීන් කීපදෙනෙක්ද වූහ. මොවුහු පොලිස් සැරයන් ජයරත්න, පොලිස් සැරයන් ලක්ෂ්මන්, පොලිස් සැරයන් රණතුංග, පොලිස් සැරයන් රත්නායක සහ සිවිල් ඇඳුමින් සැරසී සිටි රාජේන්ද්‍ර නැමැත්තා වූහ. ජයසිංහගේ සාක්ෂියට අනුව දකුණු පළාතේ ඌරුගස්මංහන්දියේ අයෙකු වන රාජේන්ද්‍ර සහකාර පොලිස් අධිකාරී පිරිස් ඇසුරු කරන අයෙකි. කඩාකප්පල්කාරීන්ට එරෙහිව කරනු ලැබූ මෙහෙයුම් වලදී පිරිස් විසින් ඉහත කී රාජේන්ද්‍ර යොදා ගන්නා ලදී. ජයසිංහ බලෙන් අල්ලා ගෙන වෑන් රියට දමා ගන්නා ලෙස එම ස්ථානයෙහි සිටි කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන්ට සහකාර පොලිස් අධිකාරී පිරිස් උපදෙස් දුන්නේය. ඈතින්ම විදුලි කණුව වැරෙන් අල්ලා ගෙන තරමක වේලාවක් ජයසිංහ එම උත්සාහයට විරෝධය පෑහ. කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීහු ජයසිංහ ගේ ඉනෙහි සහවා තිබූ නිල අවිය බලෙන් ගත්තේය. ඉන් අනතුරුව කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන් ජයසිංහ මෙල්ල කොට ගෙන බලෙන්ම ඔහු අල්ලා වෑන් රියට දමා ගත්තේය. ජයසිංහ ගේ මිතුරා වන බණ්ඩාර ද වෑන් රියට දමා ගන්නා ලදී.

මේ අතර, ජයසිංහ තමන් ඇඳ සිටි යතුරු පැදි කබායෙහි තිබී අත් බෝම්බයක් එළියට ගෙන දත් වලින් හපා එහි තිරාපද ඇණය එළියට ඇද්දේය. ජයසිංහ එකී තිරාපද ඇණය අදින්ම වෑන් රිය තුළ සිටි නිලධාරීහු එළියට පැනගත්හ. සහකාර පොලිස් අධිකාරී පිරිස් ඔහු වෙත පැමිණ අත් බෝම්බය භාර දෙන ලෙස ඔහුට නියෝග කළේය. ජයසිංහ තමනට යම් දරුණු දෙයක් සිදුවනු ඇතැයි බියෙන් තමන් පැලියගොඩ පොලිස් ස්ථානයට රුගෙන යන ලෙසත් එවිට අත් බෝම්බය භාරදෙන බවත් සහකාර පොලිස් අධිකාරී පිරිස්ට කීවේය. මේ ආකාරයෙන් අනවරයට ලක්කරනු ලැබීමට තරම් කිසිදු වරදක් තමන් කර නොමැති බවද හෙතෙම තවදුරටත් කීය.

තමන්ට යටත් වන ලෙස ජයසිංහට ඒත්තු ගන්වන්නට සහකාර පොලිස් අධිකාරී පිරිස් උත්සාහ ගත්තේය. එක් අවස්ථාවකදී හෙතෙම ජයසිංහ සමග අතීත`ත ගෙන සුහදතාවය පළ කරන්නට වැයම් කළේය. එවිට ජයසිංහ වැන් රියෙන් බැස්සේය. සහකාර පොලිස් අධිකාරී පිරිස් ඉවත්ව ගියේය. මේ අවස්ථාවේදී යුධ හමුදා වාහනයක් එතැනට පැමිණ ඇති බවක් ජයසිංහ දුටුවේය. ඒ අසළ යුධ හමුදා නිලධාරීන් හත් දෙනෙකුටත් අට දෙනෙකුටත් අතර පිරිසක් සිටියහ. ජයසිංහ වහා ඔවුන් වෙත ගොස් ස්වකීය පොලිස් හැඳුනුම් කාඩ්පත ඔවුනට පෙන්වා සිදු වූ දේ විස්තර කළේය. තමන් ජනතා විමුක්ති පෙරමුණේ අයෙකු හෝ පොදු සොරෙකු නොවන බව ඔහු කීවේය. තමන් කැළණිය කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාට භාරදෙන මෙන් හෙතෙම ඔවුන්ගෙන් ඉල්ලා සිටියේය. ජයසිංහ සහකාර පොලිස් අධිකාරී පිරිස්ගේ භාරයේ යෑමට බියපත්ව සිටි බව මින් පැහැදිලිවෙයි. මෙම අවස්ථාවේදී යුධ හමුදා නිලධාරීන් ජයසිංහ වටා රොක් වී, ජයසිංහ පොලිස් නිලධාරීන්ගේ භාරයට ගැනීම වළක්වා, යුධ හමුදා වාහනය වෙත ඔහු රැගෙනවිත් එම වාහනය තුළට දමා ගත්තේය. තම අතෙහි තිබූ අත් බෝම්බය ජයසිංහ විසින් එක් හමුදා නිලධාරියෙකුට භාරදෙන ලදී. එකී හමුදා නිලධාරියා එය අසළ පාළු ස්ථානයකට ගෙන ගොස් පුපුරුවා දැමීමට ( එම මොහොත වනවිට එහි නිරාපද ඇණය ජයසිංහ ගලවා තිබිණි.) කටයුතු යෙදුවේය. ජයසිංහ ළඟ තවත් අත් බෝම්බයක් තිබිණි. එයද ඔහු විසින් හමුදා නිලධාරීන්ට භාරදෙන ලදී. ජයසිංහ රැගෙන යාමට ගත් උත්සාහයන් සහකාර පොලිස් අධිකාරී පිරිස් අත්නොහළේය. සිය පිස්තෝලය අතැතිව සහකාර පොලිස් අධිකාරී පිරිස් හමුදා ට්‍රක් රථය තුළට ගොඩවී තමනට ජයසිංහ භාර දෙන ලෙස හමුදා නිලධාරීන්ට බල කළේය. එසේ වුවත්, හමුදා නිලධාරීහු එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් කලින් පොරොන්දු වූ පරිදිම ජයසිංහ කැළණි කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත භාරදෙන බව කීහ. මෙම පොරොන්දුව සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරී පිරිස් සෑහීමකට පත්නොවීය. හමුදා ට්‍රක් රථය තුළට ගොඩ වූ හෙතෙම මාංචු යුගලක් ගෙන එකක් ජයසිංහ ගේ පාදයටත් අනෙක ට්‍රක් රථයේ බඳේ කොටසකටත් දැම්මේය.

ඉක්බිතිව, මෙම යුධ හමුදා නිලධාරීහු ජයසිංහ පෑලියගොඩ පොලිස් ස්ථානයට රැගෙන ගියහ. එම පොලිස් ස්ථානයේදී ඔහු කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට රැගෙන යන ලදී. එම ඒකකයේදී සහකාර පොලිස් අධිකාරී පිරිස් හෝ වෙනත් කිසිවකු විසින් ජයසිංහ එම ස්ථානයට භාරදුන් යුධ හමුදා නිලධාරීන් කිසිවකුගෙන් ප්‍රකාශයක් සටහන් කර නොගැනිණි. ජයසිංහ එම ස්ථානයට භාර දුන් යුධ හමුදා නිලධාරීන්ගේ අනන්‍යතාව පිළිබඳව කිසිදු සටහනක් ඔවුන් විසින් නොකැරිණි. කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේදී ජයසිංහට පුටුවක වාඩි වන ලෙස නියම කොට එම පුටුවට සම්බන්ධ කොට ඔහුට මාංචු දමන ලදී. සිද්ධිය වූ ස්ථානයේදී ජයසිංහ අත්අඩංගුවට නොගන්නා ලදින් ඔහු කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි සිර කරනු ලැබූ අවස්ථාවේදී අත්අඩංගුවට ගන්නා ලදැයි නිගමනය කළ යුතුව තිබේ. ` තමන් අත්අඩංගුවට ගැනීම` හෝ `රඳවා තබා ගැනීම`. සම්බන්ධයෙන් කිසිදු පොලිස් නිලධාරියෙක් කවර අවස්ථාවකදී වත් කිසිදු හේතුවක් ඔහුට නොදැක් වූයේය. මෙම සිද්ධිය පිළිබඳව ස්වකීය වාචකය දක්වමින් සහකාර පොලිස් අධිකාරී පිරිස් ක්ෂණිකව සටහන් කිසිවක් ඇතුළත් කර නොමැත. ජයසිංහගෙන් වහාම ප්‍රශ්ණ කොට ඔහුගේ ප්‍රකාශයක් සටහන් කර නොගැනිණි. මේ සිද්ධියත් ජයසිංහ පෑලියගොඩ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි රඳවා තබාගැනීමත් පිළිබඳව ඔහුගේ පවුලේ උදවියට දන්වනු ලැබ නොතිබිණි.

එදින සන්ධ්‍යාවේදී ජයසිංහ බැලීමට අමුත්තෙක් පැමිණ සිටියේය. එම අමුත්තා වූයේ කැලණි කොට්ඨාසය භාර නිලධාරී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දෙල්ගොඩ මහතාය. හෙතෙම ජයසිංහට බැණ වැදී, සිය පිස්තෝලයෙන් ඔහුට අතුල් පහරක් දුන්නේය. එදින පස්වරු 7.00 ට පමණ පරීක්ෂක වික්‍රමසිංහ, පොලිස් සැරයන් උපාලි සහ තවත් පොලිස් නිලධාරීන් දෙදෙනක් ජයසිංහ ජීප් රියක දමා බියගම පොලිස් ස්ථානයට ගෙන ගියහ. මෙම මාරුකිරීමට හේතූන් පරීක්ෂක වික්‍රමසිංහ විසින් අදාල ලේඛණයන්හි සටහන් කරනු ලැබ නොතිබිණි. ජයසිංහ මාරුකර යැවීම හැරුණු විට, ඔහු කිසිදු විමර්ෂණයක් ( ඔහුගේ නිවාසය හෝ පදිංචි ස්ථානය සෝදිසි කිරීම වැනි) සඳහා ගෙනියනු නොලැබිණි.

**ජයසිංහ රඳවා තබාගැනීම ඇරඹෙයි. . . . . . . .**

කැලණිය ප්‍රදේශයෙහි ජනතා විමුක්ති පෙරමුණු හමුදා අංශයේ නායකයා අත්අඩංගුවට ගැනීමට කැලණි කොට්ඨාශයේ පොලීසිය සමත් වී ඇතැයි පසුදින ජනමාධ්‍යය ඔස්සේ නිවේදනය කෙරිණි. මෙම නිවේදනය, පැලියගොඩ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය විසින් ' ජිතේ ' නැමැත්තකු අත්අඩංගුවට ගන්නා ලදැයි කියනු ලබන සිද්ධියට අදාලව කරන ලද්දකි. ( ප්‍රියදර්ශණ අතුරුදහන්වීම සහ ජයසිංහ අත්අඩංගුවට ගැනීම හා රඳවා තබාගැනීම සම්බන්ධයෙන් විශේෂ වැදගත්කමක් ගත් මෙම කාරණයට අදාල සිද්ධීන් පිළිබඳව පසුව විස්තර කෙරෙනු ඇත.)

ජයසිංහ ' අත්අඩංගුවට ' ගනු ලැබූ දිනට පසුදින උදැසන හෙතෙම බියගම පොලීසියේ සිර මැදිරියෙහි සිට පොලිස් ස්ථානාධිපතිගේ කාමරයට ගෙන යන ලදී. එවේලෙහි එම කාර්යාලයෙහි සහකාර පොලිස් අධිකාරී පීරිස්, සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස්, පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ සහ කාන්තා පොලිස් කොස්තාපල්වරියක වන සේපාලිකා යන අය සිටියහ. සහකාර පොලිස් අධිකාරී පීරිස් පිස්තෝලයක් අතැතිව සිටියේය. මෙම කාර්යාලයෙන් බැහැරව ඊට ආසන්නවම ආයුධ සන්නද්ධ තවත් පොලිස් නිලධාරීන් කීපදෙනෙක්ම වූහ. තමාගේ ප්‍රකාශයක් සටහන් කර ගැනීමට ඔවුන් කටයුතු කරන බව සහකාර පොලිස් අධිකාරී පීරිස් ජයසිංහට කීවේය. සහකාර පොලිස් අධිකාරී පීරිස්ගේ උපදෙස් පිට තවත් පොලිස් නිලධාරියෙක් කාමරයෙන් පිටවී ගොස් ටික වේලාවක් ඇතුලත තවත් තැනැත්තකු එතැනට ගෙන ආවේය. මැදිවියේ පසු වූ මුඩු හිසින් යුත් පිරිමි තැනැත්තකු වූ මොහු දුබල තත්ත්වයක සිටින බවක් පෙනිණි. හෙතෙම බැගයක් අතැතිව සිටියේය. මෙම තැනැත්තාට මාංචු ලා තිබිණි. තමාට මෙම තැනැත්තා පලමු වතාවට 1989 සැප්තැම්බර් මාසයේදී හමුවූයේ ප්‍රියදර්ශණ දන්නා හඳුනන පුද්ගලයෙකු ලෙසිනැයි මෙම කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දෙමින් ජයසිංහ පවසා ඇත. මෝටර් රථ වෙලඳ ව්‍යාපාරයක නියැලී සිටි මොහු දිවුලපිටියේ ' තිලක් ' නැමැත්තකු වශයෙන් හෙතෙම දැන හැඳිනගෙන සිටියේය. ඔහුට ජා ඇල පොලිස් ස්ථානයේදී වරක් සුළු වේලාවක් මේ තැනැත්තා මුණගැසී ඇත. යළිත් වැල්ලවත්තේදී_හමුවී ඇත. ජයසිංහ පවසන හැටියට ඔහු මුලුමනින්ම විනාඩි 15 කට වඩා මේ තැනැත්තා සමඟ කථා බස් කර නොතිබිණි. අනෙකුත් පොලිස් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වලට අනුව ජයසිංහ, ' තිලක් ' යනුවෙන් දැන හැඳින සිටි මේ තැනැත්තා ' ජිතේ ' නැමැත්තෙකි. මොහු කැලණිය ප්‍රදේශයෙහි ජනතා විමුක්ති පෙරමුණු හමුදා අංශයෙහි නායකයා යයි කියනු ලැබූ අතර එකල්හි පැලියගොඩ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය යටතේ අත්අඩංගුවේ පසුවිය.

` කතන්දරය ` හෙළිදරව් කරන මෙන් `ජිනේ ` වෙත සහකාර පොලිස් අධිකාරී පීරිස් උපදෙස් දුන්නේය. ජිනේ බෙහෙවින් අකමැත්තෙන් ජයසිංහ දෙසට අත් දිගුකොට `මොහු මට පතරොම් 17 ක්` `දුන්නා ` යැයි කීය. ජයසිංහ වහාම ` මා දුන්නේ දැයි ` ? ඔහුගෙන් ඇසීය. එවිට ජිනේ නිරුත්තරව සිටියේය. ජිනේ රැගෙන යන ලෙස සහකාර පොලිස් අධිකාරී පීරිස් වහාම සෙසු පොලිස් නිලධාරීන්ට නියෝග කලේය. එබැවින් ජයසිංහ සමඟ ` ජිනේ` ට තිබුණේ යයි කියනු ලබන සම්බන්ධතාව නිශ්චිත වශයෙන් සොයා දැනගැනීමට සෙසු පොලිස් නිලධාරීන්ට නොහැකි විණි. ජිනේ සමඟ පවත්වනු ලදැයි කියනු ලබන කිසියම් නීතිවිරෝධී සම්බන්ධතාවකින් නිදොස් වීමට ජයසිංහට ද ඉඩක් නොලැබිණි. මෙම කෙටි `මුණගැසීමෙන්` අනතුරුව ජයසිංහගෙන් ප්‍රශ්ණ කිරීමට සහකාර පොලිස් අධිකාරී පීරිස් කටයුතු ඇරඹීය. පීරිස් විසින් දෙන ලද උපදෙස් අනුව ක්‍රියා කරමින් කාන්තා පොලිස් නිලධාරිනී සේපාලිකා, පීරිස් විසින් කියැවුණු ප්‍රකාශයක් යතුරුලියනය කලාය. මෙවේලෙහි සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් ඒ අසළින්ම සිටියේය. ජිනේ සමඟ කිසිදු නීතිවිරෝධී සම්බන්ධතාවක් තමාට තිබිණැයි කීම ජයසිංහ ස්ථිර වශයෙන්ම ප්‍රතික්ෂේප කලේය. තමා ජනතා විමුක්ති පෙරමුණ සමඟ සම්බන්ධ වූවකු නොවන බව හෙතෙම නිශ්චිතවම ප්‍රකාශ කලේය. එසේ වුවත්, සහකාර පොලිස් අධිකාරී පීරිස් වෙත ජයසිංහ විසින් කරන්නට යෙදුණු ` ප්‍රකාශය ` (පොලිස් ලියකියවිලි අනුව මෙම ප්‍රකාශය සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් වෙත කරන ලද්දකි) කියවා බැලීමේදී මෙම කොමිෂන් සභාවට පැහැදිලිව පෙනී ගිය කරුණක් වූයේ සටහන් කරනු ලැබූ ප්‍රකාශය ජයසිංහ විසින් කරනු ලැබූ ප්‍රකාශයට සහමුලින්ම වෙනස් වූවක් බවයි. මෙම ප්‍රකාශයෙහි පිටපතක් ` එක්ස් එක්ස් ` යනුවෙන් ලකුණු කොට මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. වාර්තාගතව ඇති මෙම ප්‍රකාශය අනුව ජයසිංහට එරෙහිව නැගුණු ප්‍රධාන චෝදනාව වූයේ හෙතෙම සහකාර පොලිස් අධිකාරී පීරිස් ඝාතනය කිරීමට ( ඔහු සිරභාරයට ගනු ලැබූ අවස්ථාවේ දෙමටගොඩ දී ) තැත් කළ බවය. ජිනේ සමඟ ඔහුට තිබිණැයි කියනු ලබන සම්බන්ධකම එම සිද්ධියට ආනුෂංගික වූවක් පමණකි. ජයසිංහ, සහකාර පොලිස් අධිකාරී පීරිස් ඝාතනය කරන්නට තැත් කළේ යැයි චෝදනා කරන ලද්දේ නම්, සහකාර පොලිස් අධිකාරී පීරිස් මෙහිදී එක්කෝ පැමිණිලිකරු නැතහොත් එම ඝාතනයට ගොදුරු වීමට සිටි තැනැත්තා වෙයි. එසේ නම්, අදාල සිද්ධිය සම්බන්ධයෙන් අදාල විමර්ෂණය කිරීමෙහිලා ඔහුට සහභාගී විය හැකිද? මෙම සිද්ධියට ( මෙහිදී ඔහු විසින් ජිනේ ට පතරොම් දෙන ලදැයි චෝදනා කෙරී ඇත.) අදාලව සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින් තමාගෙන් ප්‍රශ්න කරනු ලැබූ විටදී තමන් ජිනේ ට පතරොම් දී ඇතැයි කීම තමා ප්‍රතික්ෂේප කළ බව ජයසිංහ මෙම කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කලේය. කෙසේ වෙතත්, ඔහුගේ වාර්තාගත ප්‍රකාශය අනුව පතරොම් දී ඇතැයි යන්න හෙතෙම පිළිගෙන ඇත. මෙහිදී තමාට අවස්ථාවක් දෙන ලද්දේ වාර්තාගත ප්‍රකාශයෙහි පළමු පිටුව පමණක් කියවීමට බව ජයසිංහ වැඩිදුරටත් කීවේය. සහකාර පොලිස් අධිකාරී තමාට බැණ වැදී වාර්තාගත ප්‍රකාශය තම අතින් උදුරාගත් බැවින් එම ප්‍රකාශය තවදුරටත් කියවීමෙන් හෙතෙම වලක්වාලන ලදී. කෙසේ වුවද, අවසානයේදී එම වාර්තාගත ප්‍රකාශයට අත්සන් තබන ලෙස ඔහුට නියෝග කරනු ලැබී ඇත.

1990 පෙබරවාරි මස 26 වෙනි දින සිට ඔක්තෝබර් මස 27 දක්වා ජයසිංහ දිගටම බියගම පොලිස් ස්ථානයෙහි රඳවා තබා ගැනිණි. මෙම කාලසීමාව තුළ ඔහුටරැඳවුම් නියෝගයක් කිසිවක් හාරදී නොතිබේ. කෙසේ වුවද, මැයි මස 25 වෙනි දිනදී ජයසිංහ අළුත්කඩේ මහෙස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කරනු ලැබ ඇත. එම අවස්ථාවේදීම ජිනේ නැමැති අයද අධිකරණය හමුවට ඉදිරිපත් කෙරිණි. ජයසිංහ පවසන අන්දමට, ඔවුන් දෙදෙනාම අධිකරණය

හමුවට ඉදිරිපත් කලා වූ පැලියගොඩ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි පොලිස් සැරයන් උපාලි ඔවුනට එකිනෙකා සමඟ කථා කරන්නට ඉඩ දී නැත. තමන් වෙනුවෙන් නීතිඥයකුට අධිකරණයෙහි පෙනී සිටීමේ අවස්ථාවක්ද ඔවුන් දෙදෙනාට ලබාදී නොතිබිණි. ඔවුන් අධිකරණය හමුවට ඉදිරිපත් කරනු ලබන බවක් පොලිසිය විසින් ඔවුන් දෙදෙනාගේ පවුලේ උදවිය වෙතද දැනුම්දීමක් නොකෙරිණි. ලබාගත හැකි සාක්ෂි අනුව පෙනී යනුයේ මහෙස්ත්‍රාත් අධිකරණය හමුවට ඔවුන් දෙදෙනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔවුන් පොලිස් භාරයේ සිටියදීම එක් එක් පොලිස් රැඳවුම් ස්ථානයන් වෙත පොලිසිය විසින් ආපසු ගෙන යනු ලැබූ බවකි. ජයසිංහට අන්තිම වරට ජනේ හමුවී ඇත්තේ මැයි මස 25 වෙනි දිනදී ය. ඇත්ත වශයෙන්ම ඉන් පසුව ජනේ මහේස්ත්‍රාත්වරයකු හමුවට ඉදිරිපත් කරනු ලැබ නොතිබිණි.

මැයි මස 26 වෙනි දිනදී ජයසිංහ බියගම පොලිස් ස්ථානයෙහි රඳවා තබාගෙන සිටිද්දී පොලිස් පණිවුඩ හුවමාරු යන්ත්‍රය ඔස්සේ හුවමාරු කෙරුණු පොලිස් පණිවුඩයකට ඔහු අහම්බෙන් ඇහුම්කන් දී ඇත. ජනේ පොලිස් අත් අඩංගුවෙන් පලාගොස් ඇති බව එම පොලිස් පණිවුඩයෙන් කියැවිණි. පොලිස් පණිවුඩය අනුව ජනේ විසින් කරන ලදැයි කියනු ලබන පොලිස් අත්අඩංගුවෙන් පලා යාම පිළිබඳව වැඩිදුර විස්තර පසුව සාකච්ඡා කෙරෙනු ඇත.

රැඳවුම් භාරයේ සිටි කාලසීමාව තුලදී වරක් සහකාර පොලිස් අධිකාරී පීරිස්, ජයසිංහ ලඟට විත් සියළුම නාලන්ද සිසුන් ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වූවන් යැයි පවසා ඇත. ප්‍රියදර්ශණ සහ ජයසිංහ යන දෙදෙනාම නාලන්ද විද්‍යාලයේ ආදි සිසුන් වූ බව සැලකිල්ලට ගත යුතු කරුණකි. ` පියා ට වැඩේ දුන්නා. ` ( මින් කියවෙනුයේ ප්‍රියදර්ශණ ගැනය.) යනුවෙන් සහකාර පොලිස් අධිකාරී තවදුරටත් ප්‍රකාශ කර ඇත. තවද, වෙනත් අවස්ථාවකදී පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ තමා ලඟට විත් කියා ඇත්තේ ` රෝහිත ප්‍රියදර්ශණ ජපානයට ගිහින් ඔහුගේ පවුලට ලියුම් එවා ඇත. ඔබට ඔහු ලියුමක් එව්වේ නැද්ද` යනුවෙනි .

1990 ඔක්තෝබර් මස 27 වෙනි දිනදී පැලියගොඩ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි පොලිස් කොස්තාපල් රියදුරු රංජිත්, ජයසිංහ රඳවා ගෙන සිටි තැනටවිත් ඔහුට දන්වා සිටියේ ජයසිංහ පැලවත්ත රැඳවුම් මධ්‍යස්ථානයට ( මෙම කාලසීමාව තුල කඩාකප්පල්කාරී සැකකරුවෝ මෙම රැඳවුම් මධ්‍යස්ථානයෙහි රඳවා ගනු ලැබ සිටියහ . මෙම මධ්‍යස්ථානය යුද හමුදාව මගින් පවත්වාගෙන යන ලද්දකි.) මාරු කරන ලෙස නියෝජ්‍ය පොලිස්පතිවරයා දන්වා ඇති බවය. එදිනම ජයසිංහ පැලවත්ත රැඳවුම් කඳවුරට මාරු කරන ලදී. 1990 ඔක්තෝබර් මස 27 වෙනි දින සිට 1992 ජනවාරි 07 වෙනි දින දක්වා කාල පරිච්ජේදය තුල ජයසිංහ මෙකී රැඳවුම් මධ්‍යස්ථානයෙහි රඳවාගනු ලැබ සිටියේය. මෙම කාලපරිච්ජේදය තුලදී ජයසිංහ ගේ පවුලේ උදවියට ඔහු බැලීමට යාම සඳහා අවසර දෙන ලදී. තමා දැනට පසුවන තත්ත්වය කෙබඳු දැයි ස්වකීය මව්පියන් මාර්ගයෙන් සොයා දැනගන්නට ජයසිංහ උත්සාහ ගත්තේය. තමා කෙදිනක මුදා හරිනු ලැබේද යන්නත් තමනට එරෙහිව නඩු පැවරීමට පොලිසිය අදහස් කරන්නෙහිද යනාදියත් නිශ්චිත වශයෙන් සොයා දැනගැනීමට හෙතෙම උනන්දුවක් දැක්වූයේය. අදාල සාක්ෂි පොලිසිය විසින් ඉදිරිපත් කරනු ලැබූ විට ගරු නීතිපතිවරයා විසින් තමනට එරෙහිව නඩුවක් ගොනු කරනු ඇතැයි යන්න හෙතෙම දැන සිටියේය. එම කාරණය නිවැරදි දැයි සොයා බලන මෙන් හෙතෙම තම මවට දන්වා ඇත. ඔහුගේ මව මෙකරුණ පිළිබඳව යම් යම් විමසීම් කලාය. අදාල විමර්ෂණයන් පිළිබඳව උපදෙස් විමසමින් නැතහොත් ඔහුට එරෙහිව නඩුවක් ගොනුකරන මෙන් ඉල්ලීමක් කරමින් පොලිසිය විසින් අවශ්‍ය සාක්ෂි ගරු නීතිපතිවරයා

වෙත ඉදිරිපත් කොට නොමැති බව ජයසිංහගේ මව පසුව සොයාගත් තොරතුරු අනුව ඔහුට දන්වා සිටියේය. මෙම කොමිෂන් සභාවට අනුයුක්ත විමර්ෂකයන් විසින් කෙරුණු විමර්ෂණයන් අනුව මෙම තත්ත්වය නිවැරදි බවට සනාථ විණි. ජයසිංහට අදාල විමර්ෂණයන් පිළිබඳව කිසිදු අවස්ථාවක නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ඉල්ලා නොමැති බව පැහැදිලි විණි. මෙම අතපසුවීම සිදුවූයේ ඇයිදැයි යන්න පිළිබඳව කරුණු පහදා දීමට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩට පවා නුපුළුවන් විණි. මෙම අතපසුවීම බරපතල කරුණක් වනුයේ ජයසිංහට එරෙහිව නඩුවක් ගොනු කිරීමට කටයුතු කරගෙන යනු ලැබෙතැයි යන ස්ථාවරය මත විමර්ෂකයන් විසින් ජයසිංහ තවදුරටත් රඳවා තබාගනු ලැබ ඇති බැවිනි. ජයසිංහට එරෙහිව කෙරුණු චෝදනාවන් අධිකරණයකදී පහසුවෙන් තහවුරු කල නොහැකි වන බවක් පොලීසිය දැනගෙන සිටි බැවින් ඔහුට එරෙහිව නඩුවක් පැවරීමෙහිලා ඔවුන් කිසියේත් උනන්දුවක් නොදක්වන බව කීම පෙනෙන්නට ඇති පරිදි මෙකරුණෙහිලා පොලීසියේ මන්දෝත්සාහීභාවය පැහැදිලි කළ හැකි එක් ක්‍රමයකි. තමාට කරන ලදැයි කියනු ලබන අත්අඩංගුවට ගැනීමට තුඩුදුන් අවස්ථානුගත කරුණු විස්තර කිරීමෙන් පමණක් සෑහීමට පත් නොවී ප්‍රියදර්ශණට සිදුවූ දෑ පිළිබඳව කරුණුද ජයසිංහ විසින් කියාපාන්නට ඉඩ තිබිණි. කැලණි කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි ක්‍රියාකාරකම් පිළිබඳව ජයසිංහ දැනගෙන සිටි බැවින් තමා වෙනුවෙන් අධිකරණයේදී සාක්ෂිදීමේ අවස්ථාවක් ඔහුට ලබා දුනහොත් ඔහු විසින් ' රහසක් හෙළිදරව් කරන්නට ' පිළිවන් බවද අදාල නිලධාරීහු දැන සිටියා විය හැකිය.

## ජයසිංහ නිදහස් කෙරිණි . . . . . .

වෘත්තියෙන් ව්‍යාපාරිකයෙකු වූ තිලංග සුමතිපාල, ජයසිංහගේ සමීප මිතුරෙකි. සිය සුමිතුරා නිදහස් කර ගැනීමෙහිලා හෙතෙම උනන්දුවක් දැක්විය. එබැවින් මේ සම්බන්ධයෙන් කිපවතාවක්ම උත්සාහ දැරිය. පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි රඳවා ගනු ලැබූ කඩාකප්පල්කාරී සැකකරුවන් භාරව සිටි නිලධාරියා වූයේ බ්‍රිගේඩියර් නන්ද වීරසේකරය. ජයසිංහ නිදහස් කර ගැනීමේ අටියෙන් සුමතිපාල කිපවිටෙකදීම බ්‍රිගේඩියර් වීරසේකර මුණ ගැසී සාකච්ඡා කර ඇත. ලබාගත හැකි වූ සාක්ෂි අනුව පෙනී යනුයේ ජයසිංහ මුදා හරිනු ලැබුවහොත් ඔහු එතෙර යවනු ලබන බවට අදාළ බලධාරීන් වෙත සුමතිපාල ප්‍රතිඥාවක් දී ඇති බවයි. මෙම පොරොන්දුව ජයසිංහගේ උපරිම යහපත ද සැලකිල්ලට ගෙන දෙන ලද්දක් බව පෙනෙන්නට ඇත. මෙය ජයසිංහ මුදාහැරීමෙන් අනතුරුව ඔහුගේ ජීවිතයට හානියක් සිදුනොවෙතැයි සහතික කරගත හැකි එක් ක්‍රමයකි. තමන් මුදාහැරීමට පෙර දින දී ජයසිංහ විසින් ලියවිල්ලකට අත්සන් කළයුතු විණි. ඊට සුමතිපාල ද අත්සන් තබා ඇත. මෙම ලියවිල්ලෙහි ස්වභාවය ඉඳුරාම පැහැදිලි නැත. එම ලියවිල්ල සොයා ගැනීම පිණිස මෙම කොමිෂන් සභාවේ විමර්ෂණ ඒකකය දැරූ උත්සාහයන්ගෙන් තියත ප්‍රතිඵල අත්නොවිණි. එසේ වුවද, අපට ලබාගත හැකි වූ සාක්ෂි අනුව, සුමතිපාල ඇපකරු වශයෙන් ඇතිව සැකසුණු මෙම ලියවිල්ල කිසියම් ආකාරයක ' කොන්දේසි සහගත මුදාහැරීමක් ' බව පෙනෙන්නට තිබේ.

1992 ජනවාරි මස 07 වෙනි දිනදී ජයසිංහ අවසන් වශයෙන් රුඳවුම් භාරයෙන් මුදාහරිනු ලැබිණි. ඉක්බිතිව ජනවාරි මස 11 වෙනි දිනදී සුමතිපාල, ජයසිංහ කැටුව එංගලන්තය බලා පිටත්ව ගියේය. එදින සිට ඉදිරියට ජයසිංහ ගේ තත්ත්වාකාර 'පිටුවහල් කිරීම' ( de facto exile) ඇරඹිණි. එංගලන්තයේදී ජයසිංහ මුද්‍රණ ශිල්පය විෂයයෙහි පාඨමාලාවක් හදාරා තිබේ.

1992 ජූලි මස 28 වෙනි දින හෙතෙම ශ්‍රී ලංකාවට පෙරලා පැමිණියේය. ශ්‍රී ලංකාවට ආ පසු, ජයසිංහ කලක් සැඟවී සිට ඇත. සුමතිපාලට අයත් නොයෙකුත් ව්‍යාපාරයන්හිත් ස්වකීය සෙසු සමීප මිත්‍රයින් විසින් සැපයුණු ස්ථානයන්හිත් ජයසිංහ නතරව සිටියේය. 1994 අප්‍රේල් මස 08 වෙනි දින දී, ඔහු ඊජිප්තුව බලා පිටත්ව ගියේය. ජයසිංහ පවසන අන්දමට, ඔහු ශ්‍රී ලංකාවේ සිටි කාලය තුළදී නිරතුරුවම කල් ගෙවා ඇත්තේ සහකාර පොලිස් අධිකාරි පිරිස් සහ ඔහුගේ කණ්ඩායම විසින් තමන් සිරභාරයට ගනු ඇතැයි යන බියෙනි. 1994 අගෝස්තු මාසයේදී ආණ්ඩුවේ වෙනසක් වන තෙක්ම ( 1994 අගෝස්තු මාසයේදී මහා මැතිවරණය පැවැත්වීමත් සමඟ) හෙතෙම ඊජිප්තුවේ කාලය ගත කළේය.

1995 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකාවට පෙරලා පැමිණි හෙතෙම තමන් යළි සේවයෙහි පිහිටුවන මෙන් අයදමින් පොලිස්පතිවරයා වෙත ආයාචනයක් කළේය. ස්වකීය සේවය අවසන් කිරීමට හේතු වූ අවස්ථානුගත කරුණු ස්වකීය අභියාචනය මගින් ජයසිංහ පැහැදිලි කැර සිටියේය. මෙම අභියාචනය ලැබී, එහි අන්තර්ගත කරුණු කෙරෙහි අවධානය යොමු කළා වූ පොලිස්පතිවරයා ජයසිංහ යළි සේවයෙහි පිහිටුවාලීම පිළිබඳව වූ කාරණය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කළේය. මුලදී ජයසිංහගේ සේවය අවසන් කිරීම යුක්තිසහගත නොවූවක් බැවින් ඔහු යළි සේවයෙහි පිහිටුවිය යුතු යන්න තම මතය වන බව පොලිස්පතිවරයා අදාළ සංදේශය මගින් දන්වා සිටියේය. මෙකී නිර්දේශයට මීට අදාළව කෙරුණු නිසි කරුණු විභාගයන් පදනම් වී ඇත. ජයසිංහගේ අභියාචනයත් පොලිස්පතිවරයාගේ නිර්දේශයත් යන දෙකම මෙම කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කෙරිණි. පසුව උද්ගත වූ තත්ත්වයන් සැලකිල්ලට ගෙන, 1995 අගෝස්තු මස 16 වෙනි දිනදී ජයසිංහ උප පොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට පත්කොට, යළි පොලිස් සේවයෙහි පිහිටුවන ලදී. ජයසිංහ මෙම කොමිෂන් සභාව හමුවෙහි සාක්ෂි දුන් අවස්ථාව වනවිට හෙතෙම අමාත්‍ය ආරක්ෂක අංශයට අනුයුක්ත නිලධාරියෙක්ව සිටියේය.

## කඩාකප්පල්කාරීන් සමඟ ජයසිංහට සහ ප්‍රියදර්ශණට තිබූ සම්බන්ධකම්. . . .?

රෝහිත ප්‍රියදර්ශණ සහ අජිත් ජයසිංහ යන දෙදෙනා සම්බන්ධයෙන් පැවති යම් යම් සිද්ධීන් සහ චෝදනාවන් ගෙනහැර දක්වමින් කරුණු විග්‍රහයක යෙදෙනු වස් මෙකී පරිච්ඡේදයේ මෙම කොටස මිඩංගු කිරීමට අපි අදහස් කරමු. සැකෙවින් කිවහොත් මතු දැක්වෙන සාක්ෂිකරුවන් එනම්, නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න, නියෝජ්‍ය පොලිස්පති නලින් දෙල්ගොඩ, සහකාර පොලිස් අධිකාරි (විශ්‍රාමික) රාජා ඩයස් සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ යන අයගේ ස්ථාවරය (ඔවුන් විසින් දෙන ලද සමස්ථ සාක්ෂි පාදක කොට ගෙන) වශයෙන් පෙනී යනුයේ ප්‍රියදර්ශණ සහ ජයසිංහ යන දෙදෙනාම කදුරුවෙහේනගේ ජිනදාස හෙවත් ජිනේ ( සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ල කෙරුණු පහරදෙමේ සැලසුමෙහි නිර්මාතෘ මොහු විය.) නැමති කඩාකප්පල්කාරි තැනැත්තා සමඟ සම්බන්ධකම් පැවැත්වූවන් බවයි . ජිනේ නැමැත්තා යුද හමුදාව විසින් සිරභාරයට ගන්නා ලදැයි යන තොරතුර ලැබීමෙන් පසුව ප්‍රියදර්ශණ 1990 පෙබරවාරි මස 20 වෙනි දින සිට සැඟවී සිටියේය. තවද, ජිනේ සමඟ තිබිණැයි කියනු ලබන සම්බන්ධකම් වලට අදාළව ප්‍රශ්න කිරීම සඳහා ජයසිංහ පොලිසියට අවශ්‍ය පුද්ගලයකු වුයෙන් සහකාර පොලිස් අධිකාරි පිරිස් විසින් හෙතෙම අත්අඩංගුවට ගනු ලැබිණි. තවද, ජයසිංහ රඳවා

තබාගැනීමට තුඩුදුන් අමතර හේතුවක් වූයේ ඔහු අත්අඩංගුවට ගැනීමට සහකාර පොලිස් අධිකාරී පීරිස් උත්සාහ ගත් විටදී එම සහකාර පොලිස් අධිකාරීවරයා මරා දමන්නට ජයසිංහ තැත් කිරීමයි.

## ජිතේගේ වැදගත්කම . . . . .?

ප්‍රියදර්ශණී සහ ජයසිංහ යන දෙදෙනාට එරෙහිව නැඟුණු ඉහත කී චෝදනාවන් නිසා, මෙම කොමිෂන් සභාවේ නිර්ණේය විෂයය සම්බන්ධයෙන් වන තාක්දුරට, කදුරුවෙහෙනගේ ජිනදාස හෙවත් ජිතේ නැමැත්තා අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, විමර්ෂණයන් පැවැත්වීම සහ අනතුරුව ඔහු අතුරුදහන්වීම යන සිද්ධීන්ට තුඩුදුන් අවස්ථානුගත කාරණා මෙහිදී අදාල මෙන්ම වැදගත් වූ මාතෘකා විණි. ජිතේ නැමැත්තා අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, විමර්ෂණයන් කිරීම සහ අවසන් වශයෙන් අතුරුදහන්වීම පිළිබඳව කෙරුණු නිල ප්‍රකාශයන්හි විශ්වසනීයත්වය සහ ඒවාට දියහැකි අගය යන කාරණා ප්‍රියදර්ශණීට හා ජයසිංහට එරෙහිව බලධාරීන් විසින් එල්ල කෙරුණු චෝදනාවන්හි සත්‍යාසත්‍යතාවය තිශ්චය කිරීමේදී වැදගත් සාධකයෝ වෙති. ජිතේ නැමැත්තාට කඩාකප්පල්කාරී හා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වලට තිබිණැයි කියනු ලබන සම්බන්ධතාවයෙහි ස්වභාවයත් ප්‍රියදර්ශණී සහ ජයසිංහ යන දෙදෙනා සමඟ ඔහුට තිබුණැයි කියනු ලබන ආශ්‍රයත් සලකා බලන විට, එකී ජිතේ නැමැත්තා අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම සහ ඊට අදාල විමර්ෂණයන් කෙරෙහි ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් වන නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ සහ සහකාර පොලිස් අධිකාරී පීරිස් යනාදීන්ගේ අවධානය අවස්ථානුකූලව යොමු වන්නට තිබිණි. විශේෂයෙන්ම කඩාකප්පල්කාරීන් සමඟ පෙනෙන්නට කිසිදු සම්බන්ධතාවක් නොතිබූ යම් යම් තැනැත්තන් (කළුවා වැනි) සපුගස්කන්ද පොලිස් ස්ථානයට පහරදීමට හවුල් වූ බවට මුල් බැල්මටම පෙනී යන සාක්ෂි තිබූ නිසා ජිතේ සහ ඔහුගේ කඩාකප්පල්කාරීන් කණ්ඩායම (ජනතා විමුක්ති පෙරමුණට අයත්) ඉහත කී පහරදීමට සම්බන්ධ විණැයි යන නිගමනයට එළඹෙන්නට මත්තෙන් අදාල විමර්ෂකයන් විසින් නිසි හා පුළුල් පරීක්ෂණයන් කලයුතුව තිබිණැයි කෙනෙකුට සිතිය හැක. තවද, එම අවස්ථාව වනතෙක්ම ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සියල්ලන්ගේම විශ්වාසය දිනා ගනිමින්, විශිෂ්ඨ අන්දමින් පොලිස් සේවයෙහි නිරතව සිටි පොලිස් නිලධාරීන් දෙදෙනකු ජිතේ නැමැත්තා විසින් පටලවනු ලැබ තිබීම නිසා එකී කඩාකප්පල්කාරී සැකකරු විසින් කෙරුණු අදාල චෝදනාවෙහි සත්‍යාසත්‍යතාවය සැකයෙන් තොරව දැනගනු පිණිස විමර්ෂකයන් විසින් පුළුල් පරීක්ෂණයක් පැවැත්විය යුතුව තිබිණි. ජිතේ විසින් ප්‍රියදර්ශණීට සහ ජයසිංහට එරෙහිව කරනු ලදැයි කියනු ලබන චෝදනාවන් තහවුරු කිරීමට හෝ බිඳලීමට ඉවහල් වන සාක්ෂි එක්රැස් කිරීම පිණිස ඔවුන් විසින් තවදුරටත් විමර්ෂණයන් කලයුතුව තිබිණැයි කෙනෙකුට සිතිය හැක.

## ජිතේ අත්අඩංගුවට ගැනිණි. . . . . .

ජිතේ නැමති කඩාකප්පල්කාරී සැකකරුවකු යුද හමුදාව විසින් අත්අඩංගුවට ගනු ලැබ මත්තේගොඩ හමුදා කඳවුරෙහි රඳවාගෙන සිටින බව 1990 පෙබරවාරි මස 25 වෙනි දින උදෑසන සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින් ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ වෙත දන්වන ලදැයි කියනු ලැබේ. මත්තේගොඩ හමුදා කඳවුර බලා ගොස් ජිතේ නැමැත්තා ස්වකීය භාරයට ගෙන කැලණි කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට ගෙනෙන ලෙස සහකාර පොලිස් අධිකාරී පීරිස්, ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ වෙත උපදෙස් දී තිබේ. කෙසේ වුවද, සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින් එලෙසින් දෙන ලදැයි කියනු ලබන උපදෙස් ලිඛිතව

දෙනු ලැබ නොතිබුණු බව මෙම කොමිෂන් සභාවේ නිරීක්ෂණයට යොමු වී ඇත. ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහගේ මෙම ස්ථාවරය නිවැරදි දැයි යන්න තහවුරු කරනු පිණිස ඇති සාක්ෂිය වනුයේ ඔහු විසින් කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි තොරතුරු පොතෙහි ඒ බවට කෙරුණු සටහනකි.

තමා ජිනේ නැමැත්තා භාරගන්නට යෙදුණේ කවරකුගේ භාරයෙන්ද යන වග පිළිබඳව ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහට සාක්ෂි දිය නොහැකි විණි. පොලිස් නිලධාරියා විසින් යටත් පිරිසෙයින් අදාළ යුධ හමුදා නිලධාරියාගේ නමවත් සටහන් කරගත යුතුව තිබිණි. සැබැවින්ම ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ වැනි පළපුරුදු පොලිස් නිලධාරියකුට අදාළ යුද හමුදා නිලධාරියාගේ ප්‍රකාශය සටහන් කරගන්නට ඉඩ තිබිණැයි යන්න කෙනෙකු බලාපොරොත්තු වනු ඇත. තවද, එකී ජිනේ නැමැත්තා අත්අඩංගුවට ගනු ලැබූ දිනය, ඔහු එසේ අත්අඩංගුවට ගන්නට තුඩුදුන් හේතුන්, ජිනේ නැමැත්තා එකී කාලය මුළුල්ලේම මත්තේගොඩ හමුදා කඳවුරෙහි රඳවාගෙන සිටියේද? නැතහොත් වෙනත් ස්ථානයන්හි රඳවාගනු ලැබ සිටියේද? යන්න සහ මෙකී සැකකරු රඳවා තබාගැනීමට අවසරය දෙන රැඳවුම් නියෝගයක් තිබිණිද? යනාදියට අදාළ තොරතුරු තමන් යුද හමුදාව වෙතින් ලබා නොගත් බවට ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ පිළිගත්තේය. තවද, තමාගෙන් ප්‍රශ්න කිරීමේදී සැකකරු විසින් යුද හමුදා නිලධාරීන් වෙත හෙළිකොට තිබෙන්නට ඇති කරුණු නිශ්චිත වශයෙන් සොයා දැනගෙන ඒ බවට සටහනක් ඇතුළත් කිරීමට ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ කිසිදු උත්සාහයක් දරා නොතිබේ. යම් හෙයකින් තමන් යුද හමුදාව විසින් අත්අඩංගුවට ගැනීම හා රඳවා තබාගැනීම ජිනේ නැමැත්තා විසින් අභියෝගයට ලක් කරනු ලැබිණි නම් ඊට අදාළව කිසිදු කරුණු පැහැදිලි කිරීමක් කරන්නට ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහට නුපුළුවන් වන්නට තිබිණි. ජිනේ නැමැත්තා අත්අඩංගුවට ගත් යුද හමුදා නිලධාරියාගේ අනන්‍යතාවත් ජිනේ නැමැත්තා අත්අඩංගුවට ගන්නා ලද්දේ කවර හේතුන් නිසාදැයි යන්නත් හෙතෙම නොදන්නේය. තවද, යුද හමුදා කඳවුරෙහි රඳවා තබාගෙන සිටිද්දී යුද හමුදා නිලධාරීන් විසින් තමාට වධ පමුණුවාලීමක් නැතහොත් අන්‍යාකාරයකින් හිරිහැර කිරීමක් කරන ලදැයි ඔහු පසුව අධිකරණයකදී චෝදනාවක් එල්ල කළෙහි නම් එබඳු වූ චෝදනාවක් බිඳහෙළීමට ඉවහල් වන සාක්ෂි ලබාගන්නට ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ අපොහොසත් වන්නට ඉඩ තිබිණි. මේ සම්බන්ධයෙන් වූ නොපැහැදිලි අතපසුවීම් සමහරක් වූ කලී කවර පොලිස් විමර්ෂකයකු විසින් වුවද ගනු ලබන මූලික ක්‍රියාමාර්ගයන් විණි. මෙකී සියළුම අදාළ කාරණා ( ඉහත කී අතපසුවීම්, අක්‍රමිකතා සහ ඊට අදාළ සැක කටයුතු අවස්ථානුගත කාරණා ) සැලකිල්ලට ගන්නා ලදුව අප එළඹි නිගමනය වන්නේ ජිනේ නම් වූ සැකකරු මත්තේගොඩ යුද හමුදා කඳවුරේ සිට ස්වකීය භාරයට ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ විසින් දෙනු ලැබූ සාක්ෂිය කිසිදු විශ්වසනීයත්වයකින් තොරවූවක් බවය. එබඳු සිද්ධියක් කිසි විටෙක සිදුවිණැයි යන්න අපි ප්‍රතික්ෂේප කර සිටිමු. මෙම කාරණය පිළිබඳව ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ සාක්ෂි දී ඇති ඉතාමත් අස්වාභාවික ආකාරය මෙහිලා අපි විශේෂයෙන් සටහන් කරමු.

**ජිනේ පාපෝච්චාරණය කරයි. . . . . . ?**

ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ පවසන අන්දමට ජිනේ නැමැත්තා ස්වකීය භාරයට ගැනීමෙන් අනතුරුව එකල්හි පැලියගොඩ පොලිස් ස්ථානයෙහි පිහිටි කැළණි

කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට ගෙනෙනු ලැබ ඇත. ඒනේ නැමැත්තා එකී කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට ගෙනෙනු ලැබ පැය කිහිපයක් ඇතුළත දී වික්‍රමසිංහ විසින් එකී සැකකරු සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස්ගේ කාමරයට ගෙන ගොස් එම සහකාර පොලිස් අධිකාරීවරයා හමුවට ඉදිරිපත් කරන ලදී. සැකකරු එපරිදි ඉදිරිපත් කරනු ලදුව ඔහුගෙන් ` පාපෝච්චාරණයක් ` සටහන් කර ගන්නා මෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ සහකාර පොලිස් අධිකාරී ඩයස් ගෙන් ඉල්ලා සිටියේය.

විශ්‍රාමික සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස්ගේ සාක්ෂියට අනුව මෙකී ඒනේ නම් වූ සැකකරු එදින පස්වරු 1.00 ට පමණ ඔහු හමුවට ඉදිරිපත් කරනු ලැබ ඇත. සැකකරු මත්තේගොඩ හමුදා කඳවුරේ සිට ගෙනෙනු ලැබූ බව තමනට දන්වා සිටි ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ, සැකකරුගෙන් ` පාපෝච්චාරණයක් ` සටහන් කරගන්නා මෙන් ඔහු ගෙන් ඉල්ලා ඇත. එබඳු පාපෝච්චාරණයක් සටහන් කර ගැනීමට පෙර නිශ්චය කරගත යුතු මූලික කාරණයක් වනුයේ සැකකරු තිසි භාරයෙහි සිටීත්ද යන්නයි; එනම්, සැකකරු වලංගු රැඳවුම් නියෝගයක් මත රඳවාගනු ලැබ සිටීත්ද යන්නයි. ඒනේ නම් වූ සැකකරු රැඳවුම් නියෝගයක අධිකාර බලය යටතේ රඳවාගනු ලැබ සිටීද යන්න තමන් ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහගෙන් නොවිමසූ බව සහකාර පොලිස් අධිකාරී ඩයස් මේ අවස්ථාවේදී පිළිගත්තේය. තවද, මෙබඳු වෙනත් අවස්ථාවන්හිදී කරනු ලැබ ඇති පරිදි වික්‍රමසිංහ විසින් හෝ වෙනත් පොලිස් නිලධාරියකු විසින් සැකකරුගෙන් මූලික ප්‍රකාශයක් සටහන් කරගන්නා ලද්දේ දැයි තමන් ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ ගෙන් නොවිමසූ බව සහකාර පොලිස් අධිකාරීවරයා පිළිගත්තේය.

සහකාර පොලිස් අධිකාරී ඩයස්ට අනුව, තමන් හමුවට මෙකී සැකකරු ඉදිරිපත් කරනු ලැබුවායින් පසුව සිය කාර්යාලයෙන් ඉවත් ව යන මෙන් හෙතෙම ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහට නියෝග කර ඇත. ( මෙය පාපෝච්චාරණය කිරීම පිණිස සැකකරුට කිසියම් පෙළඹවීමක් හෝ පෙළඹවීම් ස්වභාවයේ යමක් එකී සැකකරු ඉදිරිපත් කරන්නා වූ නිලධාරියා විසින් නොකරනු ලබන බවට සහතික කරගනු පිණිස ගනු ලබන සාමාන්‍ය පියවරකි.) සැකකරු ස්වකීය කාර්යාලයට ගෙනෙනු ලැබ විනාඩි 05 ක් ඇතුළත පාපෝච්චාරණය කරන්නට පටන් ගත් බව සහකාර පොලිස් අධිකාරී ඩයස් මුලදී සාක්ෂි දෙමින් කියා සිටියේය. කෙසේ වුවත්, මේ සම්බන්ධයෙන් රජයේ නීතිඥවරයා විසින් යළි යළිත් ඔහුගෙන් ප්‍රශ්න කරනු ලැබීමේදී සහකාර පොලිස් අධිකාරී ඩයස් ස්වකීය ස්ථාවරය වෙනස් කළේය. එවිට ඔහු කියා සිටියේ විනාඩි 15 කට පසුව සැකකරු පාපෝච්චාරණය කරන්නට පටන් ගත් බවකි. මේ ගැන නැවත කල්පනා කැර බලා තමන් විසින් පාපෝච්චාරණයක් කළයුතුදැයි යන්න සලකා බැලීම පිණිස තමන් සැකකරුට සෑහෙන කාලවේලාවක් ඉඩ දුන් බව පැහැදිලි කිරීමට සහකාර පොලිස් අධිකාරී ඩයස් උත්සාහ ගත්තේය. එසේ වුවද, එලෙසින් නැවත කල්පනා කර බැලීම සඳහා සැකකරුට එබඳු අවස්ථාවක් ලබාදුන් බවට කිසිදු සටහනක් සහකාර පොලිස් අධිකාරී ඩයස් විසින් මෙම සිද්ධියට අදාළ නිල වාර්තාවෙහි ඇතුළත් කරනු ලැබ නොතිබිණි. එම වාර්තාවට අනුව සැකකරු ඔහුගේ කාර්යාලයට ගෙනෙනු ලැබූ වේලාවේ (පස්වරු 1.00 සිට) සිටම පාපෝච්චාරණය කිරීමට පටන් ගෙන ඇත. සහකාර පොලිස් අධිකාරී ඩයස්ගේ වාචික සාක්ෂි අනුව, ස්වකීය ප්‍රකාශය කළ අවස්ථාවේදී මෙකී සැකකරු ශාරීරික මෙන්ම මානසික අතින් යහපත් තත්ත්වයක පසු වී ඇත. යළිත්, සහකාර පොලිස් අධිකාරීවරයා ඒ බවට කිසිදු සටහනක් ඇතුළත් කොට නැත.

ජිනේ නැමැත්තාගේ පාපෝච්චාරණය යතුරුලියනය කරනු පිණිස සහකාර පොලිස් අධිකාරි ඩයස්, කාන්තා පොලිස් කොස්තාපල්වරියක වන 2021 විමලාවති නමැති අය ගෙන්වාගෙන ඇත. මෙම ප්‍රකාශය සටහන් කර ගැනීම එදින රාත්‍රී 7.00 වනතෙක් කෙරී ඇත. එය පිටු ගණනාවකින් යුත් ප්‍රකාශයකි. ප්‍රකාශයේ පිටපතක් මෙම කොමිෂන් සභාව හමුවට ඉදිරිපත් කෙරිණි. ප්‍රකාශය අවසානයෙහි අත්සනක් යොදා තිබූ අතර සහකාර පොලිස් අධිකාරි ඩයස් පවසන අන්දමට එය එකී සැකකරුගේ අත්සන විය.

## ප්‍රියදර්ශණ සහ ජයසිංහ පහරදීමට සම්බන්ධවීම . . . . . . . . .?

ජිනේ විසින් කරන ලදැයි කියනු ලබන පාපෝච්චාරණයට අනුව ඔහු 1977 වර්ෂයේ අවසාන භාගයේ පටන් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකුව සිට ඇත. ඉන් පසුව හෙතෙම ක්‍රියාකාරිකයෙක්ව සිටියේය. 1989 අප්‍රේල් මාසයේදී ඔහු ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතා විමුක්ති පෙරමුණු යුද හමුදා අංශයෙහි සංවිධායක වූයේය. එම කාලපරිච්ඡේදය තුළදී ගම්පහ දිස්ත්‍රික්කයෙහි යුද හමුදා අංශයේ නායකයා වූයේ අනුර හෙවත් අනුරාධ නැමැත්තෙකි. සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරයක් එල්ල කිරීමෙන් එ කල්හි එකී පොලිස් ස්ථානයෙහි සිරභාරයේ රඳවාගෙන සිටි ජනතා විමුක්ති පෙරමුණු සාමාජිකයකු මුදවාගැනීමේ හැකියාව ගැන ජිනේ සහ අනුරාධ සාකච්ඡා කර ඇත. මෙම ප්‍රහාරක උපායමාර්ගය දියත් කරලීම පිණිස එහි ඇතුලත අයකුගේ සහාය ලබාගැනීමේ වැදගත්කම පිළිබඳව අනුරාධ, ජිනේ තුළ වැටහීමක් ඇති කළේය. මේ සඳහා සපුගස්කන්ද පොලිස් ස්ථානයට අනුයුක්තව සිටි පොලිස් නිලධාරියකුගේ සහාය ලබාදීමට ජිනේ පොරොන්දුවිය. ජිනේ මෙම ප්‍රතිඥාව දී ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණේ පරිපාලන කටයුතු භාරව එ කල්හි සිටි පුද්ගලයකු වූ ජයසූරිය නැමැත්තකුගේ මාර්ගයෙන් මෙම සාකච්ජාව පැවැත්වීමට දෙමසකට පමණ උඩදී හෙතෙම රෝහිත ප්‍රියදර්ශණ දැන හැඳිනගෙන සිටි බැවිනි. මෙම සාකච්ජාව පවත්වා ස්වල්ප දිනකට පසුව ජිනේ රද්දොළුවේ පිහිටි නිවසේදී රෝහිත ප්‍රියදර්ශණ මුණගැසී ජනතා විමුක්ති පෙරමුණෙහි දේශපාලන දර්ශණය ඔහුට පැහැදිලි කර දුන්නේය. තමන් ඉන්දිය සාම සාධක හමුදාව පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය අනුමත නොකරන බව ජිනේට කියා සිටි ප්‍රියදර්ශණ ජනතා විමුක්ති පෙරමුණේ කටයුතු වලදී එම පක්ෂයට ආධාර කිරීමට එකඟත්වය පල කළේය. ජනතා විමුක්ති පෙරමුණේ කටයුතු සඳහා එ කල්හි ජා ඇල පොලිස් ස්ථානයෙහි සේවයේ නියැලී සිටි ස්වකීය මිතුරකු වූ ජයසිංහ නැමැත්තකුගේ සහාය තමන් ලබාදෙන බවද ප්‍රියදර්ශණ කියා ඇත. ජිනේ නැමැත්තාගේ පාපෝච්චාරණයට අනුව ඔහු ප්‍රියදර්ශණ මුණ ගැසුණු දිනදී ප්‍රියදර්ශණගේ පියා සහ සහෝදරියද එම නිවසෙහි සිට ඇත. ඉන් අනතුරුව සිව් වතාවක් හෝ පස් වතාවක් ජිනේ නැමැත්තා ප්‍රියදර්ශණගේ නිවසේදී ප්‍රියදර්ශණත් ජයසිංහත් හමුවී ඇත්තේය. මින් දෙවතාවකදීම ජිනේ ප්‍රියදර්ශණගේ නිවසේදී ආහාර ද ගෙන ඇත. එබඳු එක් අවස්ථාවකදී ප්‍රියදර්ශණ විසින් ඔහුට ජීව තුවක්කු පතරොම් 20 කුත් 84එස් වර්ගයේ අවි පතරොම්- 60 කුත් දී ඇත. ජිනේ මෙම පතරොම් තම නායකයා වන අනුරාධට දී ඇත.

පහරදීම සිදුකෙරුණු දිනදී ජිනේ සහ අමරේ යන දෙදෙනාම ජිනේ ගේ කුලී නිවාසයේදී ප්‍රියදර්ශණ මුණගැසී ඇත. සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි දළ සටහනක් ( මෙම දළ සටහන මගින් පොලිස් ස්ථානයෙහි පිහිටීමත් මුරකාවල් පිහිටි ස්ථානත් පෙන්නුම් කැර තිබිණි. ) අමරේ විසින් එවේලෙහි ප්‍රියදර්ශණට පෙන්වනු ලැබ ඇත. මෙම දළ සටහන කලින් දිනයේදී තමා

විසින් අදින ලද්දේ තුදුරින් පිහිටි ළිදක් අසල සිට පොලිස් ස්ථානයෙහි පිටුපසින් එදෙස බැලීමෙන් බව අමරේ සඳහන් කර ඇත. මෙම දළ සටහන නිවරැදි එකක් දැයි අමරේ ප්‍රියදර්ශණගෙන් විමසා තිබේ. එම දළ සටහන නිවැරැදි වූවක් බවට ප්‍රියදර්ශණ ප්‍රතිචාර දක්වා ඇත. එවිට අමරේ නැමැත්තා ප්‍රියදර්ශණට කියා ඇත්තේ එදින රාත්‍රියේදී ඔවුන් සපුගස්කන්ද පොලිස් ස්ථානයට පහර දීමට සැලසුම් කර ඇති බවය. තවද, කාල බෝම්බයක් පොලිස් ස්ථානය තුළට ගෙන ගොස් එය පොලිස් ස්ථානය ඇතුළත තැබිය හැකි දැයි අමරේ ප්‍රියදර්ශණගෙන් විමසා ඇත. මෙම කාල බෝම්බය ගෙන යාම පිණිස බෑගයක්ද රැගෙන එදින සැන්දෑවෙහි ආපසු එන්නැයි අමරේ එවිට ප්‍රියදර්ශණට කියා ඇත. ඉන් අනතුරුව මොවුන් තිදෙන විසිර ගියහ. එදින සැන්දෑවේදී මොවුන් තිදෙනාම යළි හමුවූහ. ප්‍රියදර්ශණ බෑගයක් රැගෙනවිත් තිබිණි. අමරේ කාල බෝම්බය ප්‍රියදර්ශණ අතට දී ඇත. මෙම බෝම්බය ප්‍රමාණයෙන් හතරැස් හැඩයක එකකි. එය අළුයම 3.00 ට පුපුරායාමට සැලසුම් කරන ලද්දකි. මෙම බෝම්බය සුදුසු ස්ථානයක තබන මෙන් ප්‍රියදර්ශණට දන්වනු ලැබ ඇත. ප්‍රියදර්ශණට පවසා ඇති අන්දමට මෙම ප්‍රහාරයෙහි අරමුණ වූයේ සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි රඳවා ගනු ලැබ සිටි ප්‍රියන්ත නැමැති ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකු ( මොහු ගම්පහ ප්‍රදේශයේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් වශයෙන් ක්‍රියාකාරීව සිට ඇත) මුදවාගැනීමත් ස්වකීය සංවිධානය සඳහා අවි ආයුධ ලබාගැනීමත් බවය. ඉනික්බිතිව, ජිනේ තම මෝටර් රථයෙන් ප්‍රියදර්ශණ කිරිබත්ගොඩ මංසන්ධිය තෙක් කැඳවාගෙන ගිය අතර එහිදී ප්‍රියදර්ශණ රියෙන් බැස ගියේය.

තිල වශයෙන් වාර්තාගත පාපෝච්චාරණයට අනුව මෙම පොලිස් ස්ථානයට පහර දීම පිළිබඳ වැඩිදුරටත් කිසිදු විස්තරයක් ජිනේ සඳහන් කර නොතිබිණි. එමගින් ඔහු පවසා ඇත්තේ සපුගස්කන්ද පොලිස් ස්ථානයට ජනතා විමුක්ති පෙරමුණ ප්‍රහාරයක් එල්ල කර ඇති බවක් තමනට පසුදින ගුවන් විදුලිය මගින් දැනගන්නට ලැබුණු බවකි. තමා හෝ අමරේ නැමැත්තා සැබැවින්ම නියම ප්‍රහාරයට සහභාගී වූයේ දැයි යන්න හෙතෙම සඳහන් කර නොමැත. මෙම ප්‍රහාරය සැලසුම් කරන ලද්දේ කෙසේද යන්නත් ප්‍රහාරකයින්ගේ අනන්‍යතාවනුත් ප්‍රහාරකයින් පසුබැස ගිය ආකාරයත් යනාදිය ද හෙතෙම සඳහන් කර නැත. මෙකරුණ සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරී ඩයස් එකදු ප්‍රශ්ණයක් අසා නොතිබීම විමතියට කරුණකි. මෙම කාරණයට අදාල වූ අතිශයින් වැදගත් විස්තර නියත වශයෙන්ම සොයා දැනගැනීමෙහිලා සහකාර පොලිස් අධිකාරී ඩයස් උත්සුක නොවූයේද? මෙම පහරදීමේ කුමන්ත්‍රණයටත් නියම පහරදීමටත් ජිනේ සත්‍ය වශයෙන්ම හවුල් වී නොමැති බවක් සහකාර පොලිස් අධිකාරී ඩයස් දැනගෙන සිටියේද? මෙම ප්‍රහාරයෙහිලා ප්‍රියදර්ශණගේ සම්බන්ධකම් පිළිබඳව විස්තර ලබාගැනීමට වෑයම් කරනු ලදුව එම තොරතුරු සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරී ඩයස් සෑහීමට පත්ව සිටියේද? නොඑසේ නම්, මෙකී පාපෝච්චාරණය සටහන් කර ගැනීමේ සමස්ත ක්‍රියාදාමයම සහකාර පොලිස් අධිකාරී ඩයස්ගේ සහ අනිකුත් බලධාරීන්ගේ දිජ්නිමත් පරිකල්පනයෙහි කොටසක්ද?

කෙසේ වුවද, මෙම පාපෝච්චාරණයට අනුව මෙම සිද්ධියෙන් දින කීපයකට පසුව තමන්ට අමරේ මුණ ගැසුනු බව ජිනේ පවසයි. ප්‍රහාරකයින්ට බෝම්බ රැගෙන යාමට නොහැකිවීම ප්‍රධාන වශයෙන්ම හේතුකොට ගෙන ප්‍රහාරය අසාර්ථක වූ බව අමරේ පවසා ඇත. ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකු සහ පොලිස් නිලධාරීන් තිදෙනකු මෙම ප්‍රහාරයේදී ජීවිතක්ෂයට පත්වූ බවත් ප්‍රහාරකයින්ට අවි ආයුධ කිසිවක් පොලිස් ස්ථානයෙන් රැගෙන යාමට නොහැකි වූ බවත් හෙතෙම පවසා ඇත. අනතුරුව, දින කිහිපයකට පසුව

ප්‍රියදර්ශණගේ නිවසේදී ජිනේ ට ප්‍රියදර්ශණ හා ජයසිංහ හමුවී ඇත. ප්‍රහාරය අසාර්ථකවීම සම්බන්ධයෙන් ප්‍රියදර්ශණත් ජයසිංහත් සිය නොසතුට පළ කර ඇත. ඉන් දෙසතියකට පසුව ජිනේ ට ජා ඇල පොලිස් ස්ථානයේදී ජයසිංහ මුණගැසී තිබේ. එම අවස්ථාවේදී ජයසිංහ විසින් මිලිමීටර් 09 වර්ගයේ ජීව පතරොම් 17 ක් ජිනේ ට දෙනු ලැබ ඇත. ජිනේ විසින් එකී පතරොම් කොළඹ කලාප - 1 භාර ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන නායකයා වූ රාජා නමැත්තකුට දෙන ලදී.

1989 දෙසැම්බර් මාසයේදී මහනුවර දිස්ත්‍රික්කයේ ජනතා විමුක්ති පෙරමුණේ දිසා ලේකම් වශයෙන් ජිනේ මහනුවරට මාරු කරනු ලැබ ඇත. ඔහු ජනතා විමුක්ති පෙරමුණේ කාර්යයන්හි නියැලෙමින් කුරුවිට ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරියකුගේ නිවසක සිටියදී යුද හමුදාව විසින් අත් අඩංගුවට ගනු ලැබ ඇත. ඔහු එපරිදි අත් අඩංගුවට ගන්නා ලද්දේ කෙදිනක දැයි විමසීමට සහකාර පොලිස් අධිකාරී ඩයස් තැකීමක් කර නැත. අදාල ක්‍රියාකාරිකයාගේ අනන්‍යතාව ගැන හෙතෙම විපරම් කිරීමක් ද කර නැත. මොහු අත්අඩංගුවට ගැනීමට තුඩුදුන් හේතූන් පිළිබඳව විස්තර කිසිවක් ලබා නොගැනිණි . යුද හමුදාව යටතේ රඳවා තබාගැනීම පිළිබඳවද ඔහුගෙන් ප්‍රශ්ණ නොකෙරිණි. මෙබඳු තත්ත්වයන් යටතේ සහකාර පොලිස් අධිකාරීවරයකු විසින් ඇසිය යුතු මූලික ප්‍රශ්ණයක් වනුයේ සැකකරු රඳවුම් භාරයේ සිටි කාලසීමාව තුළදී ඔහුට හිරිහැර කරනු ලැබිණි ද යන වගය. ජිනේ හමුදා භාරයේ සිට පොලිස් භාරයට මාරු කරන ලද්දේ කෙසේද යන්න පිළිබඳව කිසිදු ප්‍රශ්ණයක් ඔහුගෙන් අසනු ලැබ නොමැත. ජිනේ එසේ මාරු කරන ලද්දේ කවදාද යන්න ඔහුගෙන් අසනු ලැබ නොමැත. එසේ මාරු කිරීමෙන් අනතුරුව ඔහු කවර ස්ථානයක රඳවා තබාගෙන සිටියේද යන්නද ඔහුගෙන් අසා නොමැත. මෙකරුණ සම්බන්ධයෙන් විමසීමක් කිරීම අතිශයින්ම අවශ්‍ය කරුණක් ලෙස සැලකෙනුයේ එමගින් පාපෝච්චාරණය ස්වේච්ඡාවෙන් දෙන ලද්දක් ද යන්න තහවුරු කරගත හැකි බැවිනි. එසේ වුවද, සහකාර පොලිස් අධිකාරී ඩයස් මෙම ප්‍රශ්න සැකකරු වෙත යොමු කර නොමැත. තමා යුද හමුදාවේ හෝ පොලිසියේ නිලධාරීන් වෙත කලින් කිසියම් ප්‍රකාශයන් කලේ දැයි යන වගත් තමන් සහකාර පොලිස් අධිකාරීවරයකුට පාපෝච්චාරණයක් කිරීමට කැමැත්තෙන් සිටිත බවක් ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහට හෝ වෙනත් නිලධාරියකුට දැනුම් දුන්නේ දැයි යන වගත් සහකාර පොලිස් අධිකාරී ඩයස් ජිනේ ගෙන් නොවිමසුවේය.

**කළුවා සහ ශාන්තලාල් . . . . . . . . . . . . .**

සපුගස්කන්ද පොලිස් ස්ථානයට පහරදීමේදී කළුවා සහ ශාන්තලාල් වෙත පැවරී තිබූ කාර්ය භාරය කවරේද යන්න ඉහත කී පහරදීම පිළිබඳව වූ පරිච්ඡේදයෙහි විස්තර කරනු ලැබ ඇත. ඉහතින් සඳහන් වුණු කරුණක් යළි සැකෙවින් කිවහොත් කළුවා ( ගෝනවල සුනිල්ගේ බෑණා කෙනෙකි.) සපුගස්කන්ද පොලිස් ස්ථානයට පහරදීමට නියත වශයෙන්ම සහභාගී වී ඇත. පොලිසිය විසින් එල්ල කෙරුණු ප්‍රතිප්‍රහාරයේදී හෙතෙම මරුමුවට පත්වූ අතර ඔහුගේ මළ සිරුර පොලිස් ස්ථානය අසළ මිදුලේ තිබී ප්‍රහාරය අවසන් වූ සැණෙකින් හමුවී ඇත. ශාන්තලාල් යනු සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි සේවයේ නිරතව සිටි කම්කරුවෙකි. පොලිස් ස්ථානයට පහරදීමට සම්බන්ධකම් ඇතැයි කියනු ලැබීම නිසා එම පහරදීමෙන් පසුව දින කිහිපයක් ඇතුළත ඔහු අත්අඩංගුවට ගැනිණි. අත්අඩංගුවේ පසුවෙද්දී හෙතෙම ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ වෙත ප්‍රකාශයක් කරමින් තමන් එකී පහරදීමට හවුල් වූ බව පිළිගත්තේය. කළුවා නමැත්තා තමාට බෝම්බයක් දුන් බවත් තමා එය පොලිස් ස්ථාන ගොඩනැගිල්ලේ පළමුවෙනි මාලයේ පිහිටි

වැසිකිළිය තුළ තැබූ බවත් හෙතෙම ප්‍රකාශ කළේය. 1989 ජූලි මස 16 වෙනි දින අළුයම 3.00 ට පුපුරා ගොස් ඇත්තේ මෙම බෝම්බය වූ අතර ඉන් පසුව යැණෙකින් ප්‍රහාරය ආරම්භ වී ඇත. ශාන්තලාල් ද සහකාර පොලිස් අධිකාරී පීරිස් වෙත මෙයාකාරයෙන්ම පාපෝච්චාරණයක් කර ඇත්තේය. එකී පාපෝච්චාරණය කිරීමෙන් දින කිහිපයකට පසුව ශාන්තලාල් සැක කටයුතු මෙන්ම අභිරහස් අන්දමින් කැලණි කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන්ගේ භාරයෙන් අතුරුදහන් විණි. සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස්, පොලිස් ස්ථානයට එල්ල කෙරුණු ප්‍රහාරය සම්බන්ධයෙන් කෙරුණු විමර්ෂණයන් අධීක්ෂණය කිරීමේ කාර්යය පැවරී තිබූ නිලධාරියා වූයේය. මෙම සිද්ධිය විමර්ෂණයට ලක් කොට ඊට අදාළ සත්‍ය කරුණු නිශ්චිත වශයෙන් සොයා දැනගන්නා ලෙස නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දෙල්ගොඩ විසින් ඔහුට උපදෙස් දෙනු ලැබ තිබිණි. මෙලෙසින් සොයා දැනගත යුතු වූ කරුණු වලට මෙම ප්‍රහාරයට අදාළ අවස්ථානුගත කාරණා මෙන්ම සියළුම ප්‍රහාරකයින්ගේ සහ අදාළ කුමන්ත්‍රණකරුවන්ගේ අනන්‍යතාවන් පිළිබඳව තොරතුරු ද ඇතුළත් විණි.

කළුවා සහ ශාන්තලාල්ට අදාළ වූ සාක්ෂි පසුබිමේ තිබියදීත් මෙම සිද්ධියට සම්බන්ධවිණැයි කියනු ලබන කුමන්ත්‍රණකරුවකු (ජිනේ) විසින් පාපෝච්චාරණයක් කරනු ලබද්දීත් සහකාර පොලිස් අධිකාරී ඩයස් කළේ කුමක්ද ? කළුවාට හෝ ශාන්තලාල්ට අදාළව ජිනේ ගෙන් එකදු ප්‍රශ්ණයක් නොඇසීමට හෙතෙම ඉටා ගත්තේය. මීට අදාළව ප්‍රශ්න නොඇසීම සම්බන්ධයෙන් සාධාරණ කරුණු පැහැදිලි කිරීමක් කරන්නට සහකාර පොලිස් අධිකාරී ඩයස් අපොහොසත් වූයේය. මෙම ප්‍රහාරයට ශාන්තලාල්ගේ සම්බන්ධකම ගැන තමන් නොදැන සිටි බැවින් අදාළ ප්‍රශ්න ඇසීමට තමන් කටයුතු නොකළ බව පැහැදිලි කරන්නට හෙතෙම උත්සාහ කළේය. ශාන්තලාල් අත්අඩංගුවට ගනු ලැබ තිබීමත් ඔහු පාපෝච්චාරණයක් කර තිබීමත් සිය අවධානයට ලක් කිරීමට ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ කටයුතු නොකළ බව හෙතෙම පැවසීය. ශාන්තලාල් යන නම පවා තමාට දැනගන්නට ලැබුණේ පළමුවතාවට කොමිෂන් සභාවේ නඩු විභාගයේදී බව හෙතෙම සඳහන් කළේය. එක් අතෙකින් සහකාර පොලිස් අධිකාරී ඩයස්ගේ මෙම ස්ථාවරය සහමුලින්ම තහවුරු කළ නොහැක්කක් බව අපි අදහස් කරමු. ශාන්තලාල් අත්අඩංගුවට ගැනීමත් ඔහු පාපෝච්චාරණය කරමින් කියා සිටි කරුණුත් තමන් නොදැනිතියි ප්‍රධාන විමර්ෂක නිලධාරියා වශයෙන් ඔහුට පැවසිය නොහැක. අනෙක් අතට, හුදෙක් එම තර්කය මත පිහිටා ශාන්තලාල් පිළිබඳව වූ සහකාර පොලිස් අධිකාරී ඩයස්ගේ ස්ථාවරය අප පිළිගතහොත් ඉන් මතුවන නිගමනයන් කවරේද? එයින් අදහස් කෙරෙනුයේ සහකාර පොලිස් අධිකාරී පීරිස් සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ යන දෙදෙනාම ශාන්තලාල්ට අදාළ සිද්ධිය ප්‍රධාන විමර්ෂක නිලධාරී වෙතින් වසන් කොට ඇති බවකි. එසේ වූයේ නම්, ඒ කවර හේතූන් නිසාද? ශාන්තලාල් පිළිබඳ ප්‍රශ්නය යටපත් කරන්නට මෙම නිලධාරීන් දෙදෙනාටම වුවමනා වනුයේ ඇයි ? කළුවා මෙම ප්‍රහාරයට සහභාගීවූවා පමණක් නොව ශාන්තලාල්ට බෝම්බයද සපයා තිබිණැයි යන කාරණය වසන් කරන්නට ඔවුනට වුවමනාවීද?

එය නිර්දෝෂී අතපසුවීමකැයි සහකාර පොලිස් අධිකාරී ඩයස් පවසනු අපට විශ්වාස කළ නොහැකිය. එබඳු ස්ථාවරයක පිහිටා ඔහු ක්‍රියා කළහොත්, සහකාර පොලිස් අධිකාරී ඩයස් යනු ශ්‍රී ලංකා පොලිසිය තුළ කිසිදු නිලයක් දැරීමට නොහොබිනා පුද්ගලයකු වෙතැයි යන නිගමනයට අපට එළඹෙන්නට සිදුවනු ඇත. කෙසේ වුවද, පොලිස් හමුදාව තුළ සහකාර පොලිස් අධිකාරී ඩයස්ගේ වෘත්තීය චරියාවත් ඔහුගේ අතීත පලපුරුද්දත් අනුව සලකන විට ඔහු එබඳු අදක්ෂ

නිලධාරියකු විණැයි අපට නිගමනය කල නොහැකිය. එබැවින්, මෙම පහරදීමට අදාල සත්‍ය කරුණු සහ මුළු සිද්ධියටම වගකිවයුතු වූ සියළුම තැනැත්තන්ගේ නිසි අනන්‍යතාවන් වාර්තාගත කිරීමට තමන්ට වුවමනාවක් නොවූයෙන් කළුවා සහ ශාන්තිලාල් පිළිබඳව ජිනේ ගෙන් කරුණු විමසා සිටීමෙන් සහකාර පොලිස් අධිකාරී ඩයස් වුවමනාවෙන්ම සහ හිතාමතාම වැළකී සිටියේය යන මතයට අපි ස්ථිර වශයෙන්ම එළඹ සිටිමු.

සහකාර පොලිස් අධිකාරී ඩයස් විසින් කෙරුණු අනපසුවීම් වල ලැයිස්තුව කෙතරම් දිර්ඝ වුවක් දැයි කිවහොත් එය මුළුමනින්ම මෙහිලා ගෙනහැර දැක්වීම ප්‍රායෝගික වශයෙන් කල නොහැක්කකි. කෙසේවුවත්, සැකකරු විසින් කරන ලදැයි කියනු ලැබූ පාපෝච්චාරණය සටහන් කර ගැනීමට තුඩුදුන් අවස්ථානුගත කරුණු සහ එකී වාර්තාගත ප්‍රකාශයෙහි ස්වභාවය මුළුමනින්ම සැලකිල්ලට ගත් කල්හි එවැනි පාපෝච්චාරණයක් කිසිදු විටෙක දී සටහන් කරගත්තා ලදැයි යන ස්ථාවරය ප්‍රතික්ෂේප කරන්නට ඉතා පැහැදිලි හේතූන් ඇති බව මෙහිලා සඳහන් කල හැක.

## `පාපෝච්චාරණය` කුමන අරමුණක් සඳහාද . . . . . . . . ?

ප්‍රධාන පොලිස් පරික්ෂක වික්‍රමසිංහ පිළිබඳ කාරණයට යළි සැලකිල්ල යොමුකල විට, අපට ඇසිය හැකි ප්‍රශ්නය වනුයේ ජිනේ නැමැත්තා සහකාර පොලිස් අධිකාරී ඩයස් හමුවට ඉදිරිපත් කිරීමට ඔහු පියවර ගත්තේ ඇයි ද යන්නය. මත්තේගොඩ සිට යද්දී තමා පාපෝච්චාරණයක් කිරීම පිණිස සහකාර පොලිස් අධිකාරීවරයකු හමුවට ඉදිරිපත් කරන ලෙස ජිනේ ඔහුගෙන් ඉල්ලා සිටි බවට වික්‍රමසිංහ සාක්ෂි නොදුන්නේය. තවද, වික්‍රමසිංහ මෙම අසාමාන්‍ය පියවර ගත් අවස්ථාව වන විට ඔහු විසින් ජිනේ නැමැත්තාගෙන් ප්‍රශ්න කරනු ලදුව එකී ජිනේ නමැත්තාගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන නොතිබිණි. මෙම කොමිෂන් සභාව හමුවෙහි සාක්ෂි දුන් සියළුම පොලිස් නිලධාරීන්ගේ පොදු මතය වූයේ මෙබඳු අවස්ථාවන්හිදී සාමාන්‍යයෙන් අනුගත මෙන්ම පිළිගත් ක්‍රියා පිළිවෙත වනුයේ කණිෂ්ඨ නිලධාරියකු විසින් මුලින්ම කඩාකප්පල්කාරී සැකකරුවකුගෙන් ප්‍රශ්න කොට ප්‍රකාශයක් සටහන් කර ගැනීමත් ඉන් අනතුරුව එකී සැකකරු යම් හෙයකින් සහකාර පොලිස් අධිකාරීවරයකු වෙත පාපෝච්චාරණයක් කරනු කැමැත්තෙහි නම් එම තැනැත්තා තත් කාර්යය සඳහා සහකාර පොලිස් අධිකාරීවරයකු හමුවට ඉදිරිපත් කිරීම බවය.

එබඳු ක්‍රියාදාමයක අරමුණ වනුයේ සැකකරු විසින් කරන ලදැයි කියනු ලබන වරදවල්වලට අදාලව එම සැකකරුට එරෙහිව පැවැත්වෙන නඩු විභාගයකදී, එකී සැකකරු විසින් සහකාර පොලිස් අධිකාරීවරයකු වෙත කරනු ලැබූ එබඳු පාපෝච්චාරණයක් උපයෝගී කරගැනීමය. මෙබඳු පාපෝච්චාරණයන් ත්‍රස්තවාදය වැළැක්වාලීමේ පනතෙහිත් මහජන ආරක්ෂක පනතෙහිත් ( ` හදිසි අවස්ථා නියෝග` යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන) විධිවිධානයන් යටතේ සාක්ෂි වශයෙන් පිළිගත හැකිය. එබඳු පාපෝච්චාරණයන් සාක්ෂි වශයෙන් පිළිගත හැක්කේ ඒවා සැකකරුවන් විසින් ස්වේච්ඡාවෙන්ම (එනම්; පොරොන්දුවකින්, පෙළඹවීමකින් හෝ තර්ජනයකින් තොරව) කරනු ලැබ ඇතොත් පමණකි. අදාල නෛතික විධිවිධානයන් යටතේ පැමිණිලි පාර්ශවයන් විසින් එබඳු පාපෝච්චාරණයන්හි අන්තර්ගත කරුණු සාක්ෂි වශයෙන් මෙහෙයවීමට අදහස් කරන විටදී, එම පාපෝච්චාරණය ස්වේච්ඡාවෙන්ම කරන ලද්දක් ය යන කාරණය තහවුරු කිරීමේ වගකීම චූදිතයා පිට පැවරෙන්නකි. සාමාන්‍ය නීතිය

යටතේ පළමුවෙන්ම පොලිස් නිලධාරීන් ( නිලධාරීන්ගේ නිල තත්ත්වය නොසලකා ) වෙත කරනු ලැබූ සියළු පාපෝච්චාරණයන් ( මහෙස්ත්‍රාත්වරුන් වෙත කරන ලද පාපෝච්චාරණයන් හැර) පිළිගත නොහැකිය. දෙවනුව, යම් සැකකරුවකු විසින් වෙනත් බලධාරියකු වෙත පාපෝච්චාරණයක් කරනු ලැබ ඇතොත් සහ එකී පාපෝච්චාරණය සාක්ෂි වශයෙන් මෙහෙයවීමට අදහස් කරනු ලැබෙතොත් අදාල පාපෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දක්ය යන කාරණය ඔප්පු කිරීමේ වගකීම පැමිණිලි පාර්ශවය වෙත පැවරෙන්නකි. සැකකරුවන් විසින් මහෙස්ත්‍රාත්වරුන් වෙත ප්‍රකාශයන් කරනු ලැබ ඇති අවස්ථාවන්හිදී මෙබඳු ක්‍රියා පරිපාටියක් අනුගමනය කරනු ලැබේ. එසේකුදු වුවත්, ස්වකීය නීතීඥවරයා වෙත නිසි ආකාරයෙන් උපදෙස් දීමටත් ස්වේච්ඡාවෙන් දෙන ලදැයි කියනු ලබන පාපෝච්චාරණය පිළිගනු ලැබීම අභියෝගයට ලක් කිරීමටත් හැකි වනුයේ ස්වකීය නඩු විභාගයේදී පැමිණ සිටින චූදිතයකුට පමණකි. පොලිස් නිලධාරීන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමෙන් තමන් වෙනුවෙන් සාක්ෂිදීමෙන් සහ තමන් වෙනුවෙන් අනෙකුත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙහෙයවීමෙන් මෙය කළ හැකිය. මෙබඳු සෑම අවස්ථාවකදීම තමන් විසින් සහකාර පොලිස් අධිකාරීවරුන් වෙත කරනු ලැබ ඇතැයි කියනු ලබන පාපෝච්චාරණයන් පිළිගැනීම චූදිතයන් විසින් අභියෝගයට ලක් කෙරේ.

යම් හෙයකින්, චූදිතයා නඩු විභාගයට පැමිණ නොසිටිය හොත් සහ ඔහු වෙනුවෙන් නීතිඥයකු පෙනී නොසිටියහොත් මෙකී කරුණු පිරික්සුමට ලක් කළ නොහැකිය. එවිට, උසාවිය හමුවෙහි තිබෙනුයේ පොලීසිය විසින් ඉදිරිපත් කරනු ලැබූ අභියෝගයට ලක් නොකෙරුණු සාක්ෂියයි. එබැවින්, එබඳු අවස්ථාවන්හිදී නඩු විභාගය පවත්වන්නා වූ විනිසුරුවරයාට එකී පාපෝච්චාරණය සාක්ෂියක් වශයෙන් පිළිගැනීමට සිදුවනු ඇත. මක්නිසාද යත්, පොලිස් සාක්ෂිකරුවන්ගේ ස්ථාවරය ප්‍රතික්ෂේප කළ හැකි වෙනත් කිසිදු පාදක කරුණු එකී විනිසුරුවරයා හමුවෙහි නොමැති බැවිනි. තවද, චූදිතයා නඩු විභාගයට පැමිණ සිටිය හොත් නඩු විභාගය පවත්වන්නා වූ අධිකරණයට එකී කරනු ලදැයි කියනු ලබන පාපෝච්චාරණයෙහි සත්‍යාසත්‍යතාවය පිළිබඳව නිගමනයකට එළඹිය හැකිය. චූදිතයා නඩු විභාගයට පැමිණ නොසිටියහොත් මේ කාරණයෙහිලා අධිකරණය දුෂ්කරතාවකට මුහුණපානු ඇත. යුක්තිය නිසියාකාර පසිඳලීම සඳහා චූදිතයා නඩු විභාගයට පැමිණ සිටීම අතිශයින් වැදගත් වනුයේ එබැවිනි.

ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ යනු සාපරාධී විමර්ෂණ ක්ෂේත්‍රයෙහි නියැලී නිසැකවම සැහෙන විෂය සබඳතාවක් ගොඩ නගාගත් කෘතහස්ත පොලිස් නිලධාරියෙකි. හෙතෙම, සාපරාධී නඩු විශාල සංඛ්‍යාවකදී සාක්ෂි දී ඇත්තේය. එම නඩු විභාගයන්හිදී කඩාකප්පල්කාරී සැකකරුවන් විසින් සහකාර පොලිස් අධිකාරීවරුන් වෙත කෙරුණු පාපෝච්චාරණයන් පිළිගැනීම අභියෝගයට ලක් කෙරිණි. එබැවින්, හෙතෙම අදාල සියළුම කාර්ය පරිපාටීන් පිළිබඳව දැනුවත්ව සිටි බවට නිගමනය කිරීම සාධාරණය. නීතිඥවරයා විසින් ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ ගෙන් ප්‍රශ්න කරනු ලැබූ විටදී මෙම කොමිෂන් සභාවට පැහැදිලිව පෙනී ගියේ ඔහු සහකාර පොලිස් අධිකාරීවරයකු විසින් පාපෝච්චාරණයක් සටහන් කර ගැනීමෙන් නිමාවට පත්වන්නා වූ අදාල කාර්ය පරිපාටිය ඇරඹිය යුතු අන්දම මැනවින් දැනුවත්ව සිටි බවකි. අදාල පිළිගත් කාර්ය පරිපාටීන් අනුගමනය නොකළහොත්, සැකකරුට එරෙහිව සාර්ථකව නඩු පැවරීමටත් අදාල පාපෝච්චාරණය සාක්ෂි වශයෙන් පිළිගැනීමටත් නුපුළුවන් වන බව හෙතෙම දැන සිටියේය. මෙහිදී ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ විසින් මූලික විමර්ෂණාත්මක කාර්ය පරිපාටීන් සමහරක් පිළිපදිනු ලැබ නොතිබිණි. එබැවින්, ජනේ නැමැත්තා

සහකාර පොලිස් අධිකාරී රාජා ධයස් හමුවට ඉදිරිපත් කරනු ලැබ තිබුණා වුවද එකී ජිනේ නැමත්තා විසින් පාපෝච්චාරණය කරන ලදැයි කියනු ලබන ක්‍රියාකාරකම් මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් හෝ ඔහු පාපෝච්චාරණය කර තිබුණා වුවද අධිකරණයක් හමුවට ඉදිරිපත් කොට ඔහු (ජිනේ නැමැත්තා ) පැමිණ සිටි අවස්ථාවක පැවැත්වුණු නඩු විභාගයක් මගින් ඔහුට නඩු පැවරීමට ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ කිසිදු විටෙක අදහස් කර නොසිටි බව පැහැදිලි කරුණකි. නීතියේ විධිවිධානයන්ට අනුකූලව ජිනේ නැමැත්තාට ( ඔහු පැමිණ සිටියදී ) නඩු පැවරීමේ අවසාන අරමුණ මුදුන්පත් කර ගැනීමට වික්‍රමසිංහ අදහස් කර සිටියේ නම්, ඔහුට තියැකවම අවශ්‍ය විමර්ශණාත්මක පියවරයන් ගන්නට ඉඩ තිබිණි. සහකාර පොලිස් අධිකාරී ධයස් වෙත තමන් විසින් කරන ලදැයි කියනු ලබන පාපෝච්චාරණය අභියෝගයට ලක් කරන්නට ඉදිරියේදී, ජිනේ නැමැත්තා නොසිටිනු ඇතැයි ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ මුල පටන්ම දැන සිටියේය. එසේ නම්, නඩු විභාගයට මුහුණ දීම පිණිස ජිනේ නැමැත්තාට අවසර නොදීමට අදාල බලධාරීන් තීරණය කැර තිබුණේ කවර හේතුන් නිසාද? ඊට හේතුව වූයේ ජිනේ කළැයි කියනු ලබන එකී පාපෝච්චාරණය එසේ කිරීමට තුඩුදුන් හේතුන් , පොලිසියේ වාටකයට හාත්පසින්ම වෙනස් වූ නිසාද? එසේ කළැයි කියනු ලබන පාපෝච්චාරණය බොරුවක් වූ නිසාද? ජිනේ නිර්දෝෂී වූවකු නිසාද? ජිනේ කළැයි කියනු ලබන පාපෝච්චාරණයෙහි ප්‍රියදර්ශණට හා ජයසිංහට අදාල කොටස බොරුවක් බව වික්‍රමසිංහ හා අනිකුත් අය දැනගෙන සිටි නිසාද?"

**ජිනේට සිදුවූයේ කුමක්ද. . . . . . ..**

ජිනේගේ ' පාපෝච්චාරණය ' සටහන් කරගනු ලැබුවායින් පසුව ඔහු රඳවා තබාගැනීම පිණිස යළිත් සපුගස්කන්ද පොලිස් ස්ථානයට යවන ලදී. මෙම රඳවා තබාගැනීමේ අරමුණ වූයේ වැඩිදුරටත් විමර්ෂණ කර ගෙන යැමේ කටයුතු පහසු කරලීමත් නඩු විභාගය පවත්වනු ලබන තෙක් සැකකරු රඳවා තබාගැනීමත් බව කෙනෙක් සිතනු ඇත. එසේ වුවත්, ඉහත කී සැකකරු විසින් කරන ලදැයි කියනු ලබන ප්‍රකාශය සටහන් කරගැනීමෙන් පසුව මේ සම්බන්ධයෙන් කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය විමර්ෂනයන් කිසිවක් පවත්වා නොතිබේ. ජිනේ තවදුරටත් රඳවා ගනු ලැබිණි.

කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි පොලිස් සැරයන් රත්නායක පවසන අන්දමට, 1990 මැයි මස 23 වෙනි දිනදී මෙකී සැකකරුගෙන් රහස්‍ය ප්‍රකාශයක් සටහන් කර ගන්නා මෙන් සහකාර පොලිස් අධිකාරී පීරිස් ඔහුට උපදෙස් දී ඇත. එබැවින්, රත්නායක සපුගස්කන්ද පොලිස් ස්ථානය බලා ගොස් ජිනේ පොලිස් ස්ථානයෙහි රථවාහන අංශයට ගෙන්වා ගත්තේය. රථවාහන අංශයේදී රත්නායක, සැකකරුගෙන් පේලි අටක ප්‍රකාශයක් සටහන් කැරගෙන ඇත. ලුහුඩු ප්‍රකාශයක් යයි කියනු ලබන එකී ප්‍රකාශය මගින් ජිනේ ප්‍රකාශ කර ඇත්තේ ඔහු ජනතා විමුක්ති පෙරමුණේ එවක නායකයා වූ සෝමවංශ අමරසිංහ දැනසිටි බවත් එකී සෝමවංශ අමරසිංහ සමඟ ඔහු සමීප ඇසුරක් පවත්වා තිබූ බවත්ය. සෝමවංශ අමරසිංහ තමනට දක්නට ලැබුණහොත් ඔහු හඳුනාගත හැකි බවද සැකකරු විසින් ප්‍රකාශ කරන ලදැයි කියනු ලැබේ. සැකකරු විසින් කරන ලදැයි කියනු ලබන එකී ප්‍රකාශයට අනුව, සෝමවංශ අමරසිංහ වාසය කරනුයේ කොහේද යන වගත් එදින ඔහු නතර වී සිටිය හැක්කේ කවර ස්ථානයකද යන වගත් ජිනේ ප්‍රකාශ කර නොමැත. තවද, එකී සෝමවංශ අමරසිංහ නිතර දෙවේලේ ගැවසෙන ස්ථානයන් ගැනද සැකකරු සඳහන් කර නොතිබිණි. සෝමවංශ අමරසිංහ සම්බන්ධයෙන් ජිනේ ගෙන් ප්‍රශ්න කරන ලෙස සහකාර පොලිස් අධිකාරී පීරිස් පොලිස් සැරයන් රත්නායකට දන්වා නොතිබුණු බව මෙහිලා

සැලකිය යුතු කරුණකි. තවද, රත්නායක, ජිනේ ගෙන් සෝමවංශ අමරසිංහ ගැන ප්‍රශ්න කර ඇති බවක් මෙකී ප්‍රකාශයේ නිල වාර්තාවෙන් නොදැක්වේ. එබඳු ප්‍රශ්නයන් සැකකරුගෙන් අසන ලද්දේ නම්, සැකකරු වෙත යොමු කෙරුණු යම් යම් ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් සැකකරු විසින් එකී ප්‍රකාශය කරන ලදැයි වාර්තාගත කිරීම රත්නායක පිට පැවරුණු වගකීමකි. එලෙසින් සැකකරුගෙන් අසන ලද ප්‍රශ්නවල ස්වභාවය ද රත්නායක විසින් වාර්තා ගත කළයුතුව තිබිණි. එබඳු සටහන් කිසිවක් ඇතුලත් කෙරී නොතිබුණෙන් අපට නිගමනය කිරීමට සිදුව ඇත්තේ සැකකරු කළැයි කියනු ලබන එකී ප්‍රකාශය ජිනේ නම් වූ එකී සැකකරු විසින් ` සිය සිතැඟි අනුව ` කරන ලද්දක් බවකි. එසේ නම්, සහකාර පොලිස් අධිකාරී ඩයස් වෙත කරන ලදැයි කියනු ලබන පාපෝච්චාරණය මගින් ඔහු මෙම කරුණු හෙළිදරව් කිරීමක් නොකළේ මන්ද? තවද, එබඳු කරුණු හෙළිදරව් කිරීමක් නොකර සිටීමෙන් පසුව 1990 මැයි මස 23 වෙනි දින වනවිට එබඳු අතිශයින් වැදගත් තොරතුරක් හෙළි කිරීමට ජිනේ තීරණය කළේ ඇයි ? අනෙක් අතට, එසේ කරන ලදැයි කියනු ලබන ප්‍රකාශය සටහන් කර ගැනීම, ඉන්පසුව සිදුවිණැයි කියනු ලබන සිද්ධියකට හේතු දක්වනු පිණිස සහකාර පොලිස් අධිකාරී පීරිස් සහ පොලිස් සැරයන් රත්නායක විසින් ස්වකීය පරිකල්පනය මෙහෙයවා ගනු ලැබූ තවත් පියවරක්ද? ජිනේ ගේ ප්‍රකාශය සටහන් කරගැනීම සඳහා පොලිස් සැරයන් රත්නායක ඉතාමත් අසාමාන්‍ය ස්ථානයක් තෝරාගෙන ඇතැයි යන කාරණයද අපි මෙහිලා සටහන් කරමු. ජිනේ රඳවා ගනු ලැබ සිටියා වූ සපුගස්කන්ද පොලිස් ස්ථානයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහිදීම රත්නායක මෙම ප්‍රකාශය සටහන් නොකළේ ඇයි? මෙම ප්‍රකාශය සටහන් කරගැනීම පිණිස ජිනේ නම් වූ සැකකරු කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙහි සිට පොලිස් ස්ථානයේ රථවාහන අංශයට ගෙන්වා ගැනීමට හේතුවූ කාරණය මෙම කොමිෂන් සභාව සෑහීමට පත්වන අයුරින් පැහැදිලි කිරීමට රත්නායකට නොහැකි විණි.

ඉන් අනතුරුව, පොලිස් සැරයන් රත්නායක පවසන අන්දමට ඔහු පොලිස් කොස්තාපල් රියදුරු 15175 රංජිත්, පොලිස් සැරයන් 19605, පොලිස් කොස්තාපල් 20963 ඇතුළු තවත් නිලධාරීන් කිපදෙනකු කැටුව ජිනේ නම් වූ සැකකරු මෝටර් රියකින් සෝමවංශ අමරසිංහ සෙවීම සඳහා ගෙන ගොස් ඇත. රත්නායක මෙම පියවර ගත්තේ ඇයි ද යන ප්‍රශ්නය මෙම අවස්ථාවේදීම අපි මතු කරනු කැමැත්තෙමු. සෝමවංශ අමරසිංහ සැඟවී සිටින හෝ වාසය කරන ස්ථානය නැතහොත් එම දිනදීම එකී සෝමවංශ අමරසිංහ පැමිණීමට නියමිත වූ ස්ථානය විමර්ෂකයින් වෙත පෙන්වා දීමට තමන්ට හැකි යයි ජිනේ නම් වූ සැකකරු සිය ප්‍රකාශයෙහි සඳහන් කර නොතිබිණි. ඔහු විසින් එබඳු තොරතුරක් සැපයිණි නම් එබඳු වැදගත් තොරතුරක් ජිනේගේ ප්‍රකාශයෙහි ඇතුලත් කිරීමට රත්නායක විසින් පියවර ගතයුතුව තිබිණි. අතිශයින්ම අසාමාන්‍ය වූ සිය හැසිරීම පිළිබඳව සතුටුදායක අයුරින් කරුණු පැහැදිලි කිරීමට මෙහිදී යළිත් රත්නායක අපොහොසත් විය. එක් අවස්ථාවකදී රත්නායක ප්‍රකාශ කර සිටියේ තමන් විසින් කෙරුණු සියළුම කටයුතුත් ඊට හේතුනුත් මෙම සිද්ධිය පිළිබඳව වූ තම නිල සටහන් වලට ඇතුලත් කරනු ලබන බවකි. එම අවස්ථාවේදී උගත් රජයේ නීතිඥවරයා අදාල සිද්ධිය, පිළිබඳව වූ සාක්ෂිකරුගේ නිල සටහන් ඔහුට පෙන්වා සිටියේය. කෙසේ වුවද, ජිනේ නම් වූ සැකකරු බැහැර ගෙනයැමට හේතු වූ කරුණු ඇතුලත්ව තිබුණු සිය සටහන් වල අදාල කොටස මෙම කොමිෂන් සභාවට පෙන්වීමට සාක්ෂිකරුට නොහැකි වූයේය. තවද, තමන් ජිනේ නම් වූ සැකකරු මෙම වැදගත් මෙහෙවර පිට බැහැර ගෙනයන බව කිසිදු ජ්‍යෙෂ්ඨ නිලධාරියකුට රත්නායක විසින් දන්වන ලද බවක් එකී සටහන් වලින් හෙළි නොවේ. ජිනේ ගෙන් තවදුරටත් ප්‍රකාශයක් සටහන් කරගන්නා මෙන් මුලින්ම තමන්ට උපදෙස් දුන්නේ යැයි කියනු ලබන

සහකාර පොලිස් අධිකාරී පිරිස්ට වුවද රත්නායක මේ බව දන්වා නොමැත. පොලිස් සැරයන් රත්නායක වැනි කණිෂ්ඨ නිලධාරයකු විසින් ජ්‍යෙෂ්ඨ නිලධාරියකුගේ අවසරයක් නොලබා මෙබඳු වූ වැදගත් ගණයෙහි ලා සැලකෙන සැකකරුවකු රැඳවුම් ස්ථානයෙන් බැහැරට ගෙනයාමක් කෙනෙකුට බලාපොරොත්තු විය හැකිද?

### ජනේ අතුරුදහන් වෙයි.

ජනේ අත්වලට මාංචු දමා පොලිස් ස්ථානයෙන් පිටතට ගෙන ගොස් ඇත. අදාල කණ්ඩායම පිටව ගොස් තිබෙන්නේ පස්වරු 8.55ට පමණය. ඉන්පසු ඔහු මීගමුව දෙසට ගොස් ඇත. පෙරවරු 9.30 සිට මධ්‍යාහ්න 12.00 දක්වා මෙම කණ්ඩායම කටුනායක කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලට හැරෙන හන්දිය ළඟ ( කොළඹ මීගමුව ප්‍රධාන මාර්ගයේ) සෝමවංශ අමරසිංහ වාහනයකින් එතැන පසුකර යනු ඇත්ද කියා බලනු පිණිස නැවතී සිට ඇත. සෝමවංශ අමරසිංහ ස්ථානය පසුකර යනු ඇත්දැයි බැලීමට නැවතී සිටින අතරතුර, ජනේගේ මාංචු ඔහුගේ අත්වලින් ගලවා ඇත. මෙම අස්වාභාවික හැසිරීමට පිළිගත හැකි හේතුවක් දක්වනු ලැබුවේ නැත. ජනේට බේරියාමට පහසු කරවනු පිණිස ඔවුහු අත් මාංචු ගැලවූවෝද? ඉන්පසුව එම කණ්ඩායම ජාඇල ටවුම දෙසට ආපසු පැමිණ පස්වරු 1.00 සිට පස්වරු 3.00 දක්වා ජාඇල සුපිරි වෙළඳසැල ඉදිරියේ සෝමවංශ අමරසිංහ එනු ඇත්දැයි බැලීමට නැවතී සිට ඇත. පස්වරු 4.00ට පමණ ඔවුහු වත්තලට ගොස් සමුද්‍රා සිනමා ශාලාව ළඟ නැවතත් සෝමවංශ අමරසිංහ බලාපොරොත්තුවෙන් සිටියෝය. මෙම අවස්ථාවේදී පොලිස් සැරයන් රත්නායක ජනේට වාහනයෙන් පිටතට පැමිණ නැවතී සිටීමට අවසරදී ඇත. තමා ජනේට වාහනයෙන් පිටතට පැමිණීමට ඉඩ දුන්නේ කුමක් නිසාද යන ප්‍රශ්නයට සතුටුදායක පිළිතුරක් දීමට රත්නායක නැවතත් අසමත් විය. තවද, ඉතාමත් වැදගත් කරුණ නම්, ඔවුන් මේ සියළුම ස්ථානවලට ගොස් තිබෙන්නේ ජනේ විසින් කිසිත් තොරතුරක් සපයා නොතිබියදීය. එසේ නම් රත්නායක මෙම සියළු ස්ථාන වලට ගියේ ඇයි? මෙම ස්ථානවලට සෝමවංශ අමරසිංහ එදින එනු ඇතැයි බලාපොරොත්තු වීමට ඔහුට අනුන්ගේ සිත් දැනගැනීමේ නුවණක් තිබුණේද? ජනේ සිට ගෙන සිට ඇත්තේ නිලධාරීන් දෙදෙනෙකු අතරය. මෙම නිලධාරීහු ආයුධ සන්නද්ධව සිටියෝය. හදිසියේම පස්වරු 6.00ට පමණ ජනේ අතුරුදහන්විය. මෙය කිසිවිටෙකත් සිදුවිය හැක්කක්ද? රත්නායක හෝ වෙනත් අතිකුත් නිලධාරියෙකු හෝ විසින් ජනේට කුමක්විදැයි දැක නැත. ජනේ එතැනින් බේරී පැන යනු හෝ ඔවුන් දැක නැත. මෙම නවීන ලෝකයෙහි කිසිවෙකු යම් පුද්ගලයෙකු "අතුරුදහන් වූයේ යයි" කියනු ඇසිය හැකිද? ඊට පසු සැකකරු සඳහා අවට පෙදෙස සුළුවෙන් පරීක්ෂා කල නමුත්, එයින් ප්‍රතිඵලයක් ලැබී නැත. පොලිස් සැරයන් රත්නායකගේ නිල සටහන් අනුව, පස්වරු 6.45ට පමණ අදාල කණ්ඩායම එතැනින් සපුගස්කන්ද කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය බලා පිටත්ව ගොස් ඇත. කෙසේ වුවද, ඔහු කොමිෂන් සභාව ඉදිරියෙහි සාක්ෂි දුන් අවස්ථාවෙහි, එම ස්ථානය සොයා බැලීමෙන් පසු ඔහු කිට්ටුම පොලිස් ස්ථානයවූ වත්තල පොලිස් ස්ථානයට ගොස් ජනේ සොයා ගැනීමට ඔවුන්ගේ ආධාරය ඉල්ලුවේ යයි ඔහු තවදුරටත් කරුණු දක්වමින් පැවසිය. ඔහු ඔවුන් සමග ජනේ අතුරුදහන්වූ ස්ථානයට ගොස් ජනේ ඒ අවට සිටියේදැයි සොයා බලා ඇත. ඔහු එම ප්‍රදේශයෙහි සිට නැත. රත්නායක ඉන්පසු වත්තල පොලිස් ස්ථානයට ආපසු ගොස් ජනේගේ අතුරුදහන්වීම ගැන සහකාර පොලිස් අධිකාරී පිරිස්ට පණිවිඩයක් දී ඇත. රත්නායක වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන් සමග එකියන සොයා බැලීම කලේ නම් ඔහු ඊට සම්බන්ධ සටහනක් තැබියයුතුව තිබිණ. එසේ වුවද මෙම සිද්ධිය සම්බන්ධ සටහන්වල එබන්දක් ගැන සඳහන් වන්නේ නැත.

තවද, එවකට වත්තල පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරියා වූ පොලිස් පරීක්ෂක නිල් හෙට්ටිආරච්චි කොමිෂන් සභාවේ විමර්ෂණ ඒකකයට ප්‍රකාශයක් කරමින් කිසිත් අවස්ථාවක පොලිස් සැරයන් රත්නායක හෝ වෙනත් නිලධාරියෙක් ඔහුගේ පොලිස් ස්ථානයට පැමිණ ජීනේ අතුරුදහන්වී ඇති බවට තමාට හෝ වත්තල පොලිස් ස්ථානයට දැනුම්දී ඔහු සොයා ගැනීමට ඔවුන්ගේ සහාය ඉල්ලා නැතැයි ප්‍රකාශ කර ඇත. තවද, වත්තල පොලීසියේ නිලධාරීන් අදාළ ස්ථානයට එම ප්‍රදේශයේ ජීනේ සොයාගැනීම සඳහා ගොස් නැත. එහෙයින් පොලිස් සැරයන් රත්නායක කියා ඇති පරිදිවූ මෙම සිද්ධිය පිළිබඳ විස්තරය විශ්වාස කළහැකිද?

පොලිස් සැරයන් රත්නායකගේ වාචික සාක්ෂිය අනුව, එදින රාත්‍රී ඔවුන් පිටකොටුව බස් නැවතුම්පොලට ගොස් ජීනේ සිටී දැයි එම ප්‍රදේශයෙහි සොයා බලා ඇත. එම රාත්‍රියෙන් පසු සපුගස්කන්ද කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය ජීනේ සිටින තැනක් ගැන විමසීමක් කර නැත. ජීනේ සදහටම අතුරුදහන්විය. අද වනතුරු ජීනේට කුමක් වීද යන්න ගැන සාක්ෂියක් නැත. එවක් පටන් ඔහුගේ පවුලේ සාමාජිකයින්ද ඔහු ගැන කිසිත් ආරංචියක් ලබා නැත.

ජීනේ ආගිය අතක් ගැන ආරංචි සපයන ලෙසට පොලීසිය මහජනයාට ආරාධනා කිරීමට කිසිත් පියවරක් ගෙන නැත. තොරතුරු ඉල්ලා සිටින නිවේදන පළකර නැත. සැකකරු ජීනේ අතුරුදහන්වීම හෝ පැන යාමක් ගැන රටේ කිසිත් පොලිස් ස්ථානයකට දන්වා නැත. ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණ ඒකකය, අපරාධ පරීක්ෂණ කාර්යාංශය හා අපරාධ විමර්ෂණ ඒකකය ආදී පොලීසියේ විශේෂ ඒකක මේ ගැන සාවධාන කර ඇත්තේද නැත. සැකකරුවෙකු පොලිස් භාරයෙන් පැන යාම ගැන ගතයුතු බවට පොලිස් දෙපාර්තමේන්තු ව්‍යවස්ථාවලින් නියම කෙරෙන කිසිත් පියවරක් මෙම සිද්ධිය සම්බන්ධයෙන් ගෙන නැත. එම නිසා ජීනේ අතුරුදහන්විය යන්න ගැන පොලිස් සැරයන් රත්නායක කියා ඇති පරිදි වූ විස්තරය මෙම කොමිෂන් සභාව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරයි.

කිසිත් උසස් නිලධාරියෙකුගේ අවසරයක් නොමැතිව පොලිස් සැරයන් රත්නායක විසින් කැඳවා ගෙන යන ගමනකදී ජීනේගේ අතුරුදහන්වීම සිදුවී ඇති නමුත් එම සිද්ධියෙන් පසු, එසේම කඩාකප්පල්කාරී ක්‍රියා ගැන ඉතා වැදගත් සැකකරුවෙකු පොලිස් සැරයන් රත්නායකගේ භාරයේ සිටියදී පැන ගොස් සිටියදීත් රත්නායකට විරුද්ධව විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගෙන නැත. තවද මෙම සිද්ධිය ගැන විමර්ෂණයක් සිදුකර නැත. පරීක්ෂණයක් සිදුවන තුරු පොලිස් සැරයන් රත්නායකගේ රාජකාරි තහනම් කිරීමක් කර නැත. යටත් පිරිසෙයින් රත්නායක කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයෙන් මාරු කොට යවනු ඇතැයි යමෙකුට බලාපොරොත්තු විය හැකිව තිබිණ. ඉහළ මට්ටම්වල පොලිස් නිලධාරීන් විසින් මේ සම්බන්ධයෙන් ගතයුතුව තිබුණු කිසිත් පියවරක් ගෙන නැත. පොලිස් කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ සහ සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් බිඳු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සහ කැළණිය පොලිස් කොට්ඨාසය භාර වඩාත්ම ජ්‍යෙෂ්ඨ නිලධාරියා වූ නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න යන අයූ මෙම සිද්ධිය ගැන කිසිත් දැන සිට නැත. කෙසේ වුවද, මෙම කාරණය සම්බන්ධයෙන් ඔවුන් විසින් ගෙන තිබුණු කිසිත් ප්‍රයෝජනවත් හෝ නිසි පියවරක් ගැන ඔවුන්ට කොමිෂන් සභාවට දන්වා සිටීමට හැකිවූයේ නැත. මෙම හේතු නිසා සිද්ධිය ගැන පොලිස් සැරයන් රත්නායක ප්‍රකාශ කරන විස්තරය ප්‍රතික්ෂේප කිරීම හැරුණු විට, නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ සහ සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් ජීනේට ඇත්ත වශයෙන්ම සිදුවූ දේ ගැන දැන සිටියෝය කියාත් ඔවුන් එම වරද ඉවසුහ කියාත් අපි අනුමාන කරමු. අප විසින් බටලන්ද පිළිබඳ

කලින් පරිච්ඡේදයේ ප්‍රකාශ කර ඇතිවාක් මෙන් ජිනේට සිදුවූ දෙය "සැකකරුවෙකු ඔතැකමින්ට අතුරුදහන් කිරීමකි" . අදාල කාලසීමාව තුළදී මෙය හැඳින්වූයේ " සැකකරුවෙකු ඉවත් කර දැමීම" යනුවෙනි. එය විධිමත් ආකාරයෙන් සඳහන් කරතොත්, කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට අනුයුක්ත නිලධාරීන් විසින් අධිකරණ ක්‍රමයෙන් බාහිර ආකාරයට ජිනේ ඝාතනය කරන ලදැයි අපි තීරණය කරමු. කෙසේ වුවද, ජිනේගේ ඝාතනයට පොලිස් සැරයන් රත්නායක සම්බන්ධ බවක් පෙනෙන්නට ඇතැයි සඳහන් කිරීමට අමතරව ඝාතනයට සහභාගීවූ නිලධාරීන්ගේ අනන්‍යතාවන් සනාථ කිරීමට අපට නොහැකිය.

ජිනේ ඉවත්කොට දැමීමට තිබිය හැකිවූ අභිප්‍රාය ගැන ලුහුඩින් අප අදහස් ප්‍රකාශ කිරීම දැන් අපගේ යුතුකමක්ව පවතී. ප්‍රියදර්ශන හා ජයසිංහ යටත් පිරිසෙයින් කඩදාසි මත හෝ වරදට හසුකර තිබේ යයි කියනු ලබන්නේ ජිනේ විසින් පමණකි. සහකාර පොලිස් අධිකාරී පිරිස්, ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රමසිංහ හා මෙරිල් ගුණරත්න සහ නලින් දෙල්ගොඩ යන අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පෙනී සිටි නීතිඥතැන විසින් ගනු ලැබූ ස්ථාවරය නම් ප්‍රියදර්ශන 1990 පෙබරවාරි මස 20 වන දින රාත්‍රියේ සපුගස්කන්ද පොලිස් ස්ථානයෙන් තමන්ගේ ක්‍රියාකාරීත්වයෙන්ම අතුරුදහන්වූයේ යුද හමුදාව විසින් ජිනේ අත්අඩංගුවට ගනු ලැබූ බව ඔහු විසින් දැනගනු ලැබීම හා එහි ප්‍රතිඵලය ලෙසට ජිනේ විසින් රහස් එළිදරව් කරනු ඇත යන බිය නිසාය යන්නය. මෙයින් හැඟී යන්නේ සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ල වූ ප්‍රහාරයට තමන්ගේම ඇති සම්බන්ධය ජිනේ පාපෝච්ජාරණය කරනු ඇත හා එම ක්‍රියාදාමයේදී ප්‍රියදර්ශනත් වරදට පටලවනු ඇත යන්නය. එහෙයින් ප්‍රියදර්ශන පොලිස් ස්ථානයෙන් අතුරුදහන් විය. තවද, ජිනේ ජයසිංහ වරදට පටලැවීය. එයින් ජයසිංහ අත්අඩංගුවට ගෙන රඳවා තැබීමට යුක්තියක් ඇතිවිය.

කෙසේ වුවද, අපරාධ නඩුවකට ( ඔහු විසින්ම කරන ලදැයි කියන පාපෝච්චාරණය පදනම් කොට ) මුහුණදීමට ජිනේ ජීවතුන් අතර සිටියා නම් ඔහු ස්ථිර වශයෙන්ම නඩු විභාගයේදී, අදාල පාපෝච්චාරණය කරනු ලැබුයේ කුමන තත්ත්වයන් යටතේද යන්න ගැන සාක්ෂි දෙනවා ඇත. තමන් එබඳු පාපෝච්චාරණයක් කළේද නැද්ද යන්න ගැනත්, ඔහු සාක්ෂි දෙනවා ඇත. තවද, කරන ලදැයි කියන පාපෝච්චාරණයේ සත්‍යාසත්‍ය භාවයත් ඔහු පෙන්වා දෙනු ඇත. නඩුව විනිශ්චය කරන අධිකරණය ( චූදිතයා වූ ජිනේගේ සාක්ෂි සහ ඔහු විසින් ඉදිරිපත් කිරීමට ඉඩ තිබුනු අතිකුත් සාක්ෂි සලකා බලනු ලැබ) ජිනේ විසින් කරන ලදැයි කියන පාපෝච්චාරණය සත්‍ය නොවන්නේය හෝ එබඳු පාපෝච්චාරණයක් ජිනේ විසින් කිසි විටෙකත් කරනු ලබා ඇත්තේ නැතැයි හෝ තීරණය කරනු ලැබුවහොත් උද්ගත වියහැකි තත්ත්වය කුමක්ද? ප්‍රියදර්ශන හා ජයසිංහ සම්බන්ධ නිල වශයෙන් ප්‍රකාශිත තත්ත්වය සම්බන්ධයෙන් උද්ගත වන තත්ත්වය කුමක් වියහැකිද?

උසාවියක් ඉදිරියේ තම විස්තරය ඉදිරිපත් කරනු සඳහා ජිනේ ජීවතුන් අතර සිටියා නම් සපුගස්කන්ද ප්‍රහාරයට තමන්ගේ සම්බන්ධයක් නැතැයි කීමට ඉඩ තිබීන. ශාන්තලාල් නමැති තවත් සැකකරුවෙකු ප්‍රහාරයට තමාගේම ඇති සම්බන්ධය ගැනත්, මෙම ප්‍රහාරයේදී කලුවා (ගෝනවල සුනිල්ගේ බෑණා) ඉටු කරන ලද කාර්ය භාරය ගැනත් පාපෝච්චාරණයක් කර තිබෙන බව හෙලිවන්නට ඉඩ තිබීන. සපුගස්කන්ද ප්‍රහාරයට කලුවාගේ ( ඔහු වෙත ජනතා විමුක්ති පෙරමුණු අනන්‍යතාවයක් හඟවන්නක් නොවීන.) සහ ඔහුගේ කණ්ඩායමේ ( ශාන්තලාල් ඇතුළුව ) සම්බන්ධය පොලිසියේ අධිකාරීන් විසින් වසන් කරන ලද බව හෙලිවන්නට ඉඩ තිබීන. කලුවා පිළිබඳ විස්තරය හෙලිදරව් වුනේ නම් ( අන්තිමේදී දැන් එය හෙලිදරව්වී ඇති ලෙසට) පොලිස් ස්ථානයට එල්ලවූ

ප්‍රහාරය එල්ලවූයේ ජනතා විමුක්ති පෙරමුණෙන් යයි මහජනතාවට ඒත්තු ගැන්වීමට පොලීසියේ අධිකාරීන්ට දුෂ්කර වන්නට ඉඩ තිබිත. ඉක්බිතිව ජනේ සම්බන්ධව සිදුවූ සිද්ධීන්ගෙන්, අදාළ අධිකාරීන්ට ඔවුන්ගේ අරමුණු යම්කිසි ප්‍රමාණයකට ඉටුකර ගැනීමට හැකිවූ බව පැහැදිලිවම පෙන්නුම් කෙරේ.

**ජනේට විරුද්ධව නඩු පවරයි. . . අනභිමුඛයේ වරදකරු කරනු ලබයි. . . . .**

ජනේ " අතුරුදහන්වීමෙන්" පසු කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය විසින් ජනේට සම්බන්ධ තොරතුරු පොත් උධෘතය ( එහි ඇතුළත් වූයේ ඔහු සහකාර පොලිස් අධිකාරී රාජා වයස් ඉදිරියේ කරන ලදැයි කියන පාපෝච්චාරණය පමණකි. ) සාමාන්‍යයෙන් කරුණු සිදුවන පිළිවෙලට ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදි. ඇටෝර්නි ජනරාල් විසින් 1993 දී කොළඹ හා ගම්පහ මහාධිකරණවල ජනේට විරුද්ධව අධි චෝදනා ඉදිරිපත් කරනු ලැබිණ. ගම්පහ මහාධිකරණයේ ගොනු කරනු ලැබූ නඩුවේ අංකය 161/93 යි. කඳුරුව හේවගේ ජිනදාස හෙවත් ජනේට විරුද්ධව, 1989 ජුලි මස 01 වන දින හා 1989 ජුලි මස 17 වන දින දක්වා වන කාලය තුළ අමරේ, ප්‍රියදර්ශන හා රණසිංහ නමැති පුද්ගලයින් සමග මහජන දේපොළට, එනම්, සපුගස්කන්ද පොලිස් ස්ථානයට, අනර්ථයක් කිරීමට කුමන්ත්‍රණය කිරීම ගැන ත්‍රස්තවාදී ක්‍රියා මර්දන පනතේ 2(1) (ඉ) වගන්තිය සමග කියවනු ලබන එම පනතේ 3 (ආ) වගන්තිය යටතේ කඳුරුව හේවගේ ජිනදාස නොහොත් ජනේට විරුද්ධව අධි චෝදනා ඉදිරිපත් කරන ලදි. කොළඹ මහාධිකරණයේ පවරන ලද්දේ අංක. 6049/93 දරන නඩුවයි. මෙම නඩුවෙන් ජනේට විරුද්ධව 1987 ජුලි මස 01 වන දින හා 1988 ජනවාරි මස 06 වන දින දක්වා වන කාලය තුළ නාරාහේන්පිට බන්දු නම් පුද්ගලයෙකු සමග නීති විරෝධී මාර්ගයෙන් රජය පෙරළීම සඳහා කුමන්ත්‍රණය කිරීම ගැන හදිසි අවස්ථා ව්‍යවස්ථාවල ( මහජන ආරක්ෂක පනතේ විධිවිධාන යටතේ ප්‍රකාශයට පත්කරන ලද) 23 වන ව්‍යවස්ථාව යටතේ ජනේට විරුද්ධව අධි චෝදනා නගන ලදි.

අංක 161/93 දරන නඩුව විනිශ්චයවීම 1995 ජුලි මාසයේදී ආරම්භ විය. චූදිතයා වූ ජනේ උසාවියට නොපැමිණි අතර ඔහු වෙනුවෙන් නීතිඥයකු පෙනී සිටියේද නැත. පොලීසිය විසින් සපයන ලද ලබාගත හැකි කරුණු පදනම් කොට මුලින්ම පැමිණිල්ල විසින් ජනේ පොලිස් භාරයෙන් පැන ගිය බව ඔප්පු කිරීමට සාක්ෂි ඉදිරිපත් කළේය. ඉදිරිපත්ව තිබෙන කරුණු පදනම් කර ජනේ අනභිමුඛයේ නඩුව විනිශ්චය කිරීමට නඩුව විභාග කළ විනිශ්චයකාරවරයා නියෝග කළේය. මෙම වර්ගයේ නඩු විනිශ්චයට "විත්තිකරු අනභිමුඛයේ නඩුව විභාග කිරීම" යනුවෙන් හඳුන්වනු ලැබේ. ඉන්පසුව චෝදක සහකාර පොලිස් අධිකාරී රාජා වයස්ගෙන් සාක්ෂි විමසන ලදි. පාපෝච්චාරණය වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් ඔහු සාක්ෂි දුන්නේය. අනිකුත් සියළුම නඩු විනිශ්චයවලදී චූදිතයා විසින් සහකාර පොලිස් අධිකාරීවරුන්ට කරන ලදැයි කියන පාපෝච්චාරණ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන නමුත් මෙම නඩුවේදී චූදිතයා විසින් කරන ලදැයි කියන පාපෝච්චාරණයේ නිල වාර්තාව සාක්ෂි වශයෙන් සලකුණු කිරීමට පැමිණිලි පක්ෂය ඉදිරිපත්වූ විට කිසිවෙක් ඊට විරුද්ධ වූයේ නැත. එසේ වූයේ චූදිතයා පැමිණ නොසිටි අතර, ඔහු වෙනුවෙන් නීතිඥයකුද පෙනී නොසිටි බැවිනි. සාමාන්‍යයෙන් කරුණු සිදුවන අන්දමට චූදිතයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥයා අදාළ

සාක්ෂි විෂය ඉදිරිපත් කිරීම ගැන විරුද්ධ වන විට නඩුව විනිශ්චය කරන විනිශ්චයකාරතුමාට අදාල පාපෝච්චාරණයේ පිළිගතහැකි බව හෝ නොහැකි බව සම්බන්ධයෙන් තීරණය කිරීමට හැකිවන අයුරු පරීක්ෂණයක් (Viordire නමින් හැඳින්වෙන පරීක්ෂණයක්) පවත්වනු ලැබේ. මීට කලින් විස්තර කරන ලද පරිදි, මෙබඳු අවස්ථාව ත්‍රස්තවාදී ක්‍රියා මර්දන පනතේ විධිවිධාන යටතේ හා හදිසි අවස්ථා රෙගුලාසි යටතේ පාපෝච්චාරණය නොකැමැත්තෙන් ගන්නා ලද්දක්ද යන බව ඔප්පු කිරීමේ වගකීම ( එනම්, එය තර්ජනය කිරීම, පෙලඹවීම හෝ පොරොන්දුදීම යටතේ ලබාගෙන ඇත්ද යන වග) පැවරෙන්නේ විත්තියටය. අදාල නීතිය යටතේ චූදිතයාට භාර වන නෛතික වගකීම හෝ ඔහුට පැවරෙන වගකීම නම්, (පාපෝච්චාරණයේ අන්තර්ගත කරණු සාක්ෂි වශයෙන් නොපිළිගැනීමට අධිකරණය පොලඹවනු පිණිස ) " අදාල පාපෝච්චාරණය කැමැත්තක් නොමැතිව ලබාගන්නා ලද්දක් සේ" උසාවියට පෙනෙන්නට සැලැස්වීමය. ඉහත සඳහන් හේතූන් නිසා මෙහිදී Viordire පරීක්ෂණයක් නොපවත්වන ලදී. ඉදිරිපත් කරන ලද එකම සාක්ෂිය නම් සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස්ගේ සාක්ෂියයි. ලබාගැනීමට තිබුණු සාක්ෂි පමණක් සලකා බැලූ විනිශ්චයකාරතුමා, සැකකරු විසින් කරන ලදැයි කියන පාපෝච්චාරණයේ අඩංගු කරුණු සාක්ෂි වශයෙන් පිළිගනිමින් තීන්දුව දුන්නේය. නඩුව විභාග කල විනිශ්චයකාරවරයා සිය තීන්දුවේදී වෙනත් කරුණුවලට අමතරව මෙසේ ප්‍රකාශ කලේය: " මෙබඳු ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබූ විට අදාල පාපෝච්චාරණය නොකැමැත්තෙන් ලබාගත්තක් ද යන්න ඔප්පු කිරීමේ වගකීම පැවරෙන්නේ (මෙහිදී සඳහන් කර තිබෙන්නේ කරන ලදැයි කියන පාපෝච්චාරණය පිළිබඳ ලිඛිත වාර්තාවය) චූදිතයා මතය. චූදිතයා නඩු විභාගයේදී පෙනී සිටියේ නැත. ඔහු වෙනුවෙන් නීතිඥයෙක්ද නොවීය. එමනිසා මෙම පාපෝච්චාරණය සාක්ෂි වශයෙන් පිළිගැනීමට මට සිදුවේ". නඩුව විභාග කල උගත් විනිශ්චයකාරවරයා ඉන්පසුව චූදිතයා වරදකරු කොට ඔහුට දඬුවම් නියම කලේය.

• අංක 6049/93 දරන නඩුව විනිශ්චය කිරීම 1995 ජනවාරි මස කොළඹ මහාධිකරණයේදී ආරම්භ විය. මෙම නඩුවට සම්බන්ධ තත්ත්වයන්ද මෙහි ඉහතින් සඳහන් නඩුව පිළිබඳ තත්ත්වයන්ට සමානය. චූදිතයා අධිකරණයෙහි පෙනී නොසිටි අතර, ඔහු වෙනුවෙන් නීතිඥයකුද පෙනී සිටියේ නැත. චූදිතයා පොලිස් භාරයෙන් පැන ගොස් ඇත යන්න තහවුරු කිරීමට පැමිණිලි පක්ෂය සාක්ෂි ඉදිරිපත් කලේය. නඩු විනිශ්චයේදී ඉදිරිපත් කල සාක්ෂි චූදිතයා විසින් කරන ලදැයි කියන පාපෝච්චාරණය වාර්තාගත කර ගැනීම සම්බන්ධයෙනි. සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් හා පාපෝච්චාරණය යතුරු ලියූයේ යයි කියන යතුරුලේඛිකාව (කාන්තා පොලිස් කොස්තාපල් නිමල්වතී රණසිංහ) සාක්ෂි දුන්හ. උගත් විනිශ්චයකාරවරයා, චූදිතයා විසින් කරන ලදැයි කියන පාපෝච්චාරණයේ අඩංගු කරුණු සාක්ෂි වශයෙන් පිළිගනිමින් සිය තීන්දුව දෙමින් වෙනත් කරුණුවලට අමතරව මෙසේද කීය. " චූදිතයා විසින් කරන ලදැයි කියන පාපෝච්චාරණය සාක්ෂි ආඥා පනතේ 24 වන වගන්තිය අනුව පිළිගත නොහැකි එකකැයි ඔප්පු කිරීමේ භාරය රඳා පවතින්නේ චූදිතයා මතය". මෙම නඩුවේදී චූදිතයා එම භාරය ඉටුකර නැත . එමනිසා එම ප්‍රකාශයේ අඩංගු වන කරුණු මම සාක්ෂි වශයෙන් පිළිගනිමි. පෙරකී පාපෝච්චාරණය පදනම් කොට ගෙන නඩුව විනිශ්චය කල උගත් විනිශ්චයකාරවරයා චූදිතයා වරදකරු කොට ඔහුට 20 අවුරුද්දක බරපතල වැඩ ඇති සිර දඬුවමක් නියම කර තිබේ.

මෙම කොමිෂන් සභාව විසින් කරන ලද විමර්ෂනවලදී, සහකාර පොලිස් අධිකාරි රාජා ඩයස් විසින් ඉහත සඳහන් නඩු විනිශ්චයවලදී දෙන ලද සාක්ෂි අප හමුවේ දෙන ලද සාක්ෂි සමග සංසන්දනය කර බැලීමේ අවස්ථාව අපට ලැබිණ. වර්තමාන පරීක්ෂණයේදී ඔහුගේ සාක්ෂි පමණක් නොව ප්‍රධාන පරීක්ෂක වික්‍රමසිංහ සහ පොලිස් සැරයන් රත්නායකගේ සාක්ෂි නීතිඥයින් විසින් පුළුල් ලෙස පරීක්ෂණයට ලක්කරන ලදී. එම පරීක්ෂණයේ අරමුණ වූයේ එම සාක්ෂිවල විශ්වාසවන්ත බව පරීක්ෂා කිරීමය. නඩුව විනිශ්චය කළ ඉහතින් සඳහන් උගත් විනිශ්චයකාරවරු ගවේෂණය කිරීමේ සංචාරයක යෙදුනේ නැත. කුමක් නිසාද යත්, ඔවුන්ට නීතියෙන් නියමව තිබුණේ අදාළ පාර්ශ්ව විසින් ( ඉහතින් සඳහන් නඩු දෙකේදී පැමිණිලි පක්ෂය විසින් පමණක්) තමන් ඉදිරියට පමුණුවන ලද සාක්ෂි පදනම් කොට විනිශ්චය කිරීම පමණක් බැවිනි. එසේ වුවද වර්තමාන පරීක්ෂණයේදී, අපි සත්‍ය සොයා ගැනීමට ඉදිරිපත් වුනෙමු. කුමක් නිසාද යත්, මෙම විරුද්ධවාදී පරීක්ෂණ කටයුත්තක් නොව විමර්ෂක පරීක්ෂණ කටයුත්තක් වූ බැවිනි. තවද අපට ඒකපාක්ෂික වශයෙන් හා අභියෝගයට ලක් නොකරන ලද සාක්ෂි නොව පුළුල් ලෙස පරීක්ෂණයට ලක් කළ සාක්ෂිවල ප්‍රයොජනය අත්වුන බැවිනි. එහෙයින් ( වර්තමානයෙහි) ලබාගැනීමට තිබෙන කරුණු පදනම් කොට මෙම කොමිෂන් සභාව විසින් බැස ගන්නා නිගමනය, ඉහතින් සඳහන් නඩු විභාගවල විනිශ්චයකාරවරුන්ගේ නිගමනයට වඩා ( බෙහෙවින් වලංගු හේතු නිසා) වෙනස් වියහැකි බව විශේෂයෙන් කිවයුතු වන්නේ නැත.

සපුගස්කන්ද පොලීසියට එල්ල වූ ප්‍රහාරය සම්බන්ධ විශ්වාසදායක කරුණු සමස්තයක් ලෙසට අප විසින් පරීක්ෂාකාරීව සලකා බලන ලදී. එකී කරුණු අප විසින්, ජනේ විසින් කරන ලදැයි කියන පාපෝච්චාරණයේ අඩංගු කාරණාවලට සංසන්දනාත්මක වශයෙන් තක්සේරුවටත් විශ්ලේෂණයටත් භාජනය කරන ලදී. ජනේ විසින් කරන ලදැයි කියන පාපෝච්චාරණය හැරුණු විට අනිකුත් සියළුම සාක්ෂි විෂයයන් එකිනෙක සමග ගැළපී සිටී. එසේ වුවද මෙම පාපෝච්චාරණයේ අඩංගු කරුණු අදාළ සාක්ෂිවලින් කිසිසේත් තහවුරු නොවනවාත් හැර ඊට ඔප්පු කළහැකි අසත්‍ය කරුණු ද ඇතුලත් වේ. එහෙයින් එකී පාපෝච්චාරණය, සපුගස්කන්ද පොලීසියට එල්ලවූ ප්‍රහාරයට සම්බන්ධ කරුණු පිළිබඳ අසත්‍ය ප්‍රකාශයක්ය යන්න අපගේ ස්ථිර මතයයි. මේ අනුව ජනේ විසින් කරන ලදැයි කියන පාපෝච්චාරණයේ කරුණු ගොතන ලද අසත්‍ය කථාවකැයි අපි නිගමනය කරමු. සහකාර පොලිස් අධිකාරි ඩී. පීරිස්, සහකාර පොලිස් අධිකාරි රාජා ඩයස් සහ ප්‍රධාන පරීක්ෂක වික්‍රමසිංහ යන අය පෙරකී නීතිවිරෝධී හැසිරීමට සෘජු වශයෙන්ම සම්බන්ධ වෙති.

අදාළ බලධාරීන්ට එබඳු නීති විරෝධී ක්‍රියාවල යෙදීමට අවශ්‍ය වූයේ ඇයි. රෝහිත ප්‍රියදර්ශන සම්බන්ධ පරිච්ඡේදයේ අවසන් කොටසේ ප්‍රකාශ කර ඇති පරිදි ප්‍රියදර්ශනගේ අතුරුදහන්වීමත් මරණයත් සිදුවීමෙන් පසු කැළණිය කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ කළමනාකාර බලතල දැරූ අයට, ප්‍රියදර්ශන සපුගස්කන්ද පොලිස් ස්ථානයෙන් ඔහුගේම ක්‍රියාකාරීත්වය උඩ අතුරුදහන් වූයේ යයි කියන කතාවක් ගෙතීමට අවශ්‍ය විය. ප්‍රියදර්ශනට පොලිස් ස්ථානයෙන් අතුරුදහන්වීමට හෝ එයින් පැන යෑමට හේතුවූ චේතනාවක් හෝ කරුණක් නිෂ්පාදනය කර අනිකුත් අයට දැක්වීමට ඔවුහු නැත් කළහ. ප්‍රියදර්ශන විශ්වාස කළ නොහැකිවුත්, නීති විරෝධී හැසිරීම්වලට සම්බන්ධවුත්, පොලිස් සේවයෙහි තනතුරක් දැරීමට නුසුදුසුවුන් පුද්ගලයෙකු ලෙස පෙන්වීමට ඔවුන්ට අවශ්‍ය විය. ප්‍රියදර්ශනගේ අතුරුදහන්වීම ගැන පොලීසියේ ඉහළ මට්ටම්වලින් පැහැදිලිවම ප්‍රදර්ශනය වූ

අක්‍රියශීලී බව ගැන පොලීසිය තුළින් මෙන්ම පිටතින් එන්ට එන්ටම වැඩි වැඩියෙන් එල්ලවූ විවේචන මෙල්ල කිරීමටද ඔවුන්ට අවශ්‍ය විය. මෙම අතුරුදහන්වීමට පොලිසියේ ඉහළ මට්ටම්වල අයත් වෙනත් බලසම්පන්න පුද්ගලයනුත් සම්බන්ධ බවට මිනිසුන් තුළ පැවති සැකය දුරු කිරීමටද අදාළ බලධාරීහු කල්පනා කළහ. එහෙයින් මේ පිළිබඳ සම්පූර්ණයෙන්ම වෙනස් පින්තූරයක් මැවීමට ඔවුන්ට අවශ්‍ය විය. තමාට සම්බන්ධයක් තිබුණු ජ්නේ බලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබෙන බව ඔහුට දැනගන්නට ලැබුණු නිසා යථා කාලයේදී ජ්නේ විසින් තමා වැරදිවලට පටලවනු ඇත යන බිය නිසා ප්‍රියදර්ශන ඕනෑකමින්ම පොලිසියෙන් පැන ගියේය යන්න ඔවුන්ට පින්තාරු කර පෙන්වීමට අවශ්‍යවූ පින්තූරයේ මූලික අංග වේ. ප්‍රියදර්ශනගේ අතුරුදහන්වීමට හා ඝාතනයට සම්බන්ධ පොලීසිය තුළ හා ඉන් පිටත වූ අයට සිය නම් හොඳකර ගැනීමට මෙම ගොතන ලද බොරු කතාන්තරය උපකාර වනු ඇතැයි කල්පනා කරන ලදි.

# IX වන පරිච්ඡේදය.

## තීරණ

අධිකාර පත්‍රයේ අන්තර්ගතවූ නිර්ණේය විෂයයන් පිළිබඳ අපගේ තීරණ මෙහි පහත ලැයිස්තු කොට දක්වමු. මෙම තීරණවලට බැස තිබෙන්නේ, මෙම කොමිෂන් සභාව ඉදිරියේ තබන ලද සියළුම සාක්ෂි සහ කොමිෂන් සභාව විසින් මෙම පරීක්ෂණයේදී සලකා බලන ලද වෙනත් විශ්වාසදායක කරුණු බැරෑරුම් ලෙස සලකා බැලීමෙනි. මීට පූර්වයෙන් වූ පරිච්ඡේදවල සඳහන් කර තිබෙන්නේ මෙම තීරණවලට බැසීමේදී සැලකිල්ලට භාජනය කරන ලද ප්‍රධාන සාක්ෂිවල හා කරුණුවල සම්පිණ්ඩනයකි. මෙම තීරණ ගැනීමට හේතුවූ කාරණා ගැන සම්පූර්ණ අවබෝධයක් ලබාගැනීම සඳහා අතිගරු ඔබතුමිය පරීක්ෂණ කටයුතු වල සම්පූර්ණ වාර්තාව කාරුණිකව සලකා බැලීම සුදුසු යයි යෝජනා කරනු කැමැත්තෙමු. එම පරීක්ෂණ කටයුතු පිළිබඳ වාර්තාව මෙම වාර්තාව සමග ඉදිරිපත් කරනු ලැබේ.

**(අ) සපුගස්කන්ද පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන 1990 පෙබරවාරි මස 20 වන දින හෝ ඊට සමීප කාලයේදී අතුරුදහන්වීමේ සිද්ධියට සම්බන්ධ කරුණු හා එම අතුරුදහන්වීමට වගකිවයුතු පුද්ගලයා හෝ පුද්ගලයින් සහ එම ක්‍රියාවට ආධාර හා අනුබල දුන් පුද්ගලයා හෝ පුද්ගලයින් ;**

උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට හේතුවූ තත්ත්වයන් මෙහි ඉහත 6 හා 7 පරිච්ඡේදවල විස්තරාත්මකව සඳහන් කරන ලදි. එමනිසා එම විස්තර මෙහි නැවත ගෙනහැර දැක්වීමට අදහස් නොකරමු. එසේ වුවද, රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට සම්බන්ධ තත්ත්වයන් සමස්තයක් වශයෙන් තේරුම්ගත හැක්කේ, සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ල කරන ලද ප්‍රහාරය හා ඊට පසුව එම ප්‍රහාරය ගැන කරන ලද විමර්ෂණයන් පසුබිම් කොට ගෙන බව ප්‍රකාශ කරනු කැමැත්තෙමු. මෙම කරුණුවලට කඳුරුවෙත්තගේ ජිනදාස නොහොත් ජිනේ රඳවා තැබීම, විමර්ෂන පැවැත්වීම හා ඔහු අතුරුදහන්වීමත් ඇතුළත් බව සැලකියයුතුය.

සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ල කරන ලද ප්‍රහාරය සම්බන්ධ අපගේ අදහස් මෙසේය:

I. 1989 ජූලි මස 16 වන දින එළිවන යාමයේ පුද්ගලයින් කණ්ඩායමක් සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරයක් එල්ල කළේය.

II. බෝම්බයක් පිපිරීමෙන් ඇතිවූ පිපිරීමකුත් සමග සපුගස්කන්ද පොලිස් ස්ථානයට පිටතින් එල්ලවූ ප්‍රහාරය ආරම්භ විය. බෝම්බය තිබී පිපුරුණේ පොලිස් ස්ථානයේ ඉහළ මාලයේ වැසිකිළියකය.

III. ඉහත සඳහන් ප්‍රහාරයේදී ලද තුවාල නිසා සපුගස්කන්ද පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරී පොලිස් පරීක්ෂක ලලිත් මහානාම ඇතුළු පොලිස් නිලධාරීහු තිදෙනෙක් ජීවිතක්ෂයට පත්වූහ.

IV. සපුගස්කන්ද පොලිසියේ පොලිස් නිලධාරීහු විසින් ප්‍රහාරකයින්ට විරුද්ධව එල්ල කල ප්‍රති ප්‍රහාරයේදී ලද තුවාල වලින් සුමිත් පෙරේරා තොහොත් කලුවා නමින් හැඳින්වෙන පුද්ගලයකු ඇතුළු ප්‍රහාරකයෝ දෙදෙනෙක් මරණයට පත්වූහ.

V. ඉහතින් සඳහන් සුමිත් පෙරේරා, සුනිල් පෙරේරා නොහොත් ගෝනවල සුනිල් යන පුද්ගලයාගේ බෑණා කෙනෙකි. සුමිත් පෙරේරා සහ සුනිල් පෙරේරාගේ (ඔවුනු කැලණිය ප්‍රදේශයේ අයය.) සම්පූර්ණ පවුලම එවකට පාලක පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂයේ සුප්‍රසිද්ධ ක්‍රියාකාරීහු හා හිතවත්තු වූහ.

VI. ඉක්බිතිව, සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ලවූ ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ෂණයන් කරන ලද්දේ ඉක්මන් ස්වභාවයකින් හා මෙම අපරාධය සිදුකල තැනැත්තන් නීතිය හමුවට පැමිණවීමේ අවංක අරමුණ ඇතිව නොවේ.

VII. ප්‍රහාරයෙන් පසු බේරී ගිය අනිකුත් ප්‍රහාරකයින්ගේ අනන්‍යතාවන් ඔප්පු කිරීමට හැකිවී නැත.

VIII. මුල් විමර්ශකයෝ සුමිත් පෙරේරා නොහොත් කලුවාගේ අනන්‍යතාව හෙළිකිරීම ඕනෑකමින්ම යටපත් කර තිබේ.

IX. මුල් විමර්ෂණය අතරතුරේදී ශාන්තලාල් නමින් හැඳින්වුනු සැකකරුවෙක් කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබුවේය. ප්‍රශ්න කිරීමට ලක්කරන ලදුව, ඔහු ඉහත සඳහන් අපරාධයට සම්බන්ධ බව පිළිගත්තේය. ඔහු පොලිස් ස්ථානයේ ඇතුලත මෙහි කලින් සඳහන් කරන ලද සුමිත් පෙරේරා නොහොත් කලුවා විසින් දෙන ලද බෝම්බයක් තැබීමෙන් ඊට සහභාගිවී යයි පිළිගත්තේය.

X. මුල් විමර්ෂකයෝ මෙම සාක්ෂිය ලබාගෙන සිටි නමුත් එය යටපත් කල අතර, ඊට පසුව පෙරකි සැකකරු පොලිස් භාරයේ සිටියදී ඉතාමත් සැකකටයුතු තත්ත්වයන් යටතේ අතුරුදහන්විය.

XI. මුල් විමර්ෂකයෝ ශාන්තලාල්ට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීම උවමනාවෙන්ම මගහැරියහ. එසේ කරන ලද්දේ වෙනත් පුද්ගලයින් මෙම වරදට පටලැවීමට ඔවුන් තැත් කල නිසා හා සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරය එල්ල කල නියම ප්‍රහාරකයින්ගේ අනන්‍යතාවන් යටපත් කිරීමට ඔවුන් අදහස් කල නිසාය.

මෙම පසුබිම ගැන සැලකිලිමත්ව උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට සම්බන්ධව කෙළින්ම කරුණු සලකා බැලීමට අපි අදහස් කරමු.

I. රෝහිත ප්‍රියදර්ශන ශ්‍රී ලංකා පොලිසියේ තරුණ උද්‍යෝගීමත් නිලධාරියෙක් විය. ඔහු අවංක හා නිර්භීත තැනැත්තෙක් විය. ඔහු කැලණිය ප්‍රදේශයේ නිරාකරණය නොකරන ලද අපරාධ පිළිබඳ ප්‍රශ්න විසඳීමට සමත් විය. ඔහුගේ නිල රාජකාරි

ඉවුකිරීමේදී සහ සැකකරුවන් අත්අඩංගුවට ගැනීමේදී ඔහු අපරාධකරුවන්ගේ දේශපාලන සම්බන්ධතා තැකුවේ නැත.

II. සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරය එල්ල කළ අවස්ථාවේදී හා ඔහු ( රෝහිත ප්‍රියදර්ශන) 1990 පෙබරවාරි මස 20 වන දින අතුරුදහන් වන තුරු රෝහිත ප්‍රියදර්ශන අනුයුක්තව සිටියේ සපුගස්කන්ද පොලිස් ස්ථානයටය.

III. සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරය එල්ලවූ අවස්ථාවේ රෝහිත ප්‍රියදර්ශන අනිකුත් නිලධාරීන්ද සමග රාජකාරි සඳහා පොලිස් ස්ථානයෙන් පිටව ගොස් සිටි අතර, පිපිරීම හා තුවක්කු වෙඩි ශබ්දය ඇසීමෙන් පසු පොලිස් ස්ථානය කරා වහාම පැමිණියේය.

IV. රෝහිත ප්‍රියදර්ශන, සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ලවූ ප්‍රහාරයට හා ඊට සම්බන්ධ කුමන්ත්‍රණයට කිසි ලෙසකිනුත් සම්බන්ධ බවට සාක්ෂි නැත.

V. 1990 පෙබරවාරි මස මුල හරියේ දිනයකදී රෝහිත ප්‍රියදර්ශන තවත් පොලිස් නිලධාරීන් ඇතැමෙකු සමග බරපතල අපරාධ කිරීමට සම්බන්ධ සැකකරුවකු වූ විජුවර් පෙරේරා නැමැත්තෙක් අත්අඩංගුවට ගත්තේය. එකී විජුවර් පෙරේරාද ඉහත සඳහන් සුනිල් පෙරේරා නොහොත් ගෝනවල සුනිල්ගේ බෑණා කෙනෙක් විය.

VI. ඉහතින් සඳහන් විජුවර් පෙරේරා අත්අඩංගුවට ගැනීමෙන් දින කිහිපයකට පසු එම සැකකරු (විජුවර් පෙරේරා) තත්ත්වාකාර පොලිස් භාරයේ සිටියදී අතුරුදහන්විය. නියම වශයෙන්ම කුමන තත්ත්වයන් යටතේ සැකකරු අතුරුදහන් වූයේද යන වග තහවුරු වී නැත. එම සැකකරු අතුරුදහන්වීමෙන් පසු එය ගැන උනන්දුව දැක්වූ හා අපහසුවට පත් පාර්ශවයන් ( ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ඇතුළුව) විසින් විජුවර් පෙරේරා අතුරුදහන්වීම ගැන රෝහිත ප්‍රියදර්ශන වගකිවයුතු බවට චෝදනා එල්ල කරන ලදී.

VII. විජුවර් පෙරේරා අත්අඩංගුවට ගෙන ඇති බවට විජුවර් පෙරේරාගේ කිට්ටු නෑදෑයෝ රතිල් වික්‍රමසිංහ මහතාට පැමිණිලි කළහ.

VIII. 1990 පෙබරවාරි මස 20 වන දින රාත්‍රී රෝහිත ප්‍රියදර්ශන සපුගස්කන්ද පොලිස් ස්ථානයේ රාජකාරි භාර නිලධාරියා ලෙස ( S.D.O.) කටයුතු කළේය. එසේ කරන ලද්දේ පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරියා වූ පොලිස් පරීක්ෂක කීර්ති අතපත්තු බියගම විලේජ් හෝටලයේ පැවති සාකච්ඡාවකට සහභාගීවීමට ගොස් සිටි බැවිනි.

IX. පෙබරවාරි මස 20 වන දින රාත්‍රී 8.00ට පමණ පෙරකී පොලිස් පරීක්ෂක අතපත්තු රෝහිත ප්‍රියදර්ශණට සපුගස්කන්ද පොලිස් ස්ථානයට දුරකථන

පණිවිඩයක් දී ඔහුට බියගම විලේජ් හෝටලයට පැමිණෙන ලෙස උපදෙස් දුන්නේය.

X. ඊට මඳ වේලාවකට පසු රෝහිත ප්‍රියදර්ශන බියගම විලේජ් හෝටලයට යනු පිණිස සපුගස්කන්ද පොලිස් ස්ථානයෙන් පිටත්ව ගියේය. එතැන් පටන් රෝහිත ප්‍රියදර්ශන සපුගස්කන්ද පොලිස් ස්ථානයට හෝ ඔහුගේ නිවසට ආපසු පැමිණියේ නැත.

XI. නැතිවූ රෝහිත ප්‍රියදර්ශන සොයා ගැනීමට හෝ ඔහුට කුමක් වූයේද යන්න සොයාබැලීමට පොලිස් බලධාරීන් විසින් නිසි ප්‍රයත්නයක් දරනු ලැබුවේ නැත.

XII. පෙබරවාරි මස 23 වන දින හෝ ඊට ආසන්න දිනයකදී රෝහිත ප්‍රියදර්ශනගේ සිරුර පැලියගොඩ පොලිස් ස්ථානය පිටුපස කැලණි ගඟේ පාවෙමින් තිබී හමුවිය.

XIII. රෝහිත ප්‍රියදර්ශනගේ මරණය ගැන විමර්ශනය කිරීමට නිසි ආකාරවූ ප්‍රයත්නයක් දරනු ලැබුයේ නැත. එහෙත් පොලිස් සේවයේ සිටි ඔහුගේ පෞද්ගලික මිතුරෝ ( අජිත් ජයසිංහ ඇතුළුව) ඔහු සොයා ගැනීමට හා ඔහුගේ මරණයට වගකිවයුත්තේ කවුරුන්ද යන්න සොයා ගැනීමට විරෝදාර ලෙස ප්‍රයත්න දැරූහ.

XIV. රෝහිත ප්‍රියදර්ශන ඝාතනය කරනු ලැබ ඇත්තේය යන්න පිළිගැනීමට කැලණිය ප්‍රදේශයේ පොලිස් බලධාරීහු ප්‍රතික්ෂේප කළහ.

XV. අවශ්‍ය විමර්ෂණ කරනු වෙනුවට අදාළ බලධාරීහු රෝහණ ප්‍රියදර්ශන අතුරුදහන්ව ඊට පසුව මරණයට පත්වීම සම්බන්ධ නියම තත්ත්වයන් යටපත් කිරීම අරමුණු කොට කරුණු වසන් කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළහ.

XVI. රෝහිත ප්‍රියදර්ශන " නනතුර අතහැර ගියාසේ සලකන" නිවේදනයක් නිකුත් කිරීම මෙම පියවරවලින් එකකි.

XVII. රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වී ඇත යන කරුණට පොලිස් බලධාරීන් පුළුල් ප්‍රචාරයක් දුන් අතර, ඔහු එසේ අතුරුදහන්වී තිබෙන්නේ සිය කැමැත්තෙන්ම බව අඟවනු ලැබිය. ඔහු එසේ අතුරුදහන්වී තිබේන්නේ කඳුරුවහේනගේ ජිනදාස නමැති සැකකරුවෙකු ( එවකට පොලිස් භාරයේ සිටි ) තමන් වරදට අසු කරන තොරතුරු හෙළි කරනු ඇත යන බියෙන්ය යන්න ඇඟවීමට ඔවුහු තැත් කළහ.

XVIII. කඳුරුවහේනගේ ජිනදාස නොහොත් ජිනේ 1989 සිට 1990 දක්වා වන කාලය තුළ එක්තරා කාලසීමාවක් කැලණිය පොලිස් කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය භාරයේ සිටි බවට ලබාගැනීමට තිබෙන කරුණු වලින් පැහැදිලිවම පෙන්නුම් කෙරේ.

XIX. වාර්තා කර ගන්නා ලදැයි කියන පාපෝච්චාරණයක ස්වභාවයේවූ ඊතේගේ ප්‍රකාශයක් වාර්තා කර ගැනීමට තුඩු දුන් සිද්ධීන්ගේ අනුපිළිවෙල පිළිබඳ තිල විස්තරය ව්‍යාජ එකකි.

XX. කරන ලද්දේ යයි කියන එකී පාපෝච්චාරණය වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් ලබාගැනීමට තිබෙන කරුණු එම පාපෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දකැයි ඔප්පු කිරීමට කිසියේත් ප්‍රමාණවත් වන්නේ නැත.

XXI. පෙරකී ප්‍රකාශයෙහි, සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ලවූ ප්‍රහාරයට සම්බන්ධ තත්ත්වයන් පිළිබඳව වැදගත් වන අසත්‍යයන් අන්තර්ගත වේ.

XXII. රෝහිත ප්‍රියදර්ශන හා අජිත් ජයසිංහ යන උප පොලිස් පරීක්ෂකයින් කෙළින්ම හෝ අනියමින් කිසිත් නීති විරෝධී හෝ අනිසි ක්‍රියාවකට සම්බන්ධ වූයේ යයි හෝ අදාල යයි හෝ නිගමණයකට බැසීමට විශ්වාසය තැබීම සඳහා පෙරකී ප්‍රකාශය කිසියේත් වටින්නේ නැත. පෙරකී නිලධාරීන් දෙදෙනා කිසිත් ආකාරයකින් සපුගස්කන්ද පොලීසියට එල්ලවූ ප්‍රහාරයට සම්බන්ධ යයි හෝ එකී පොලිස් ස්ථානයේ බෝම්බයක් තැබීමෙන් හෝ/ සහ වෙඩි ද්‍රව්‍ය ජනතා විමුක්ති පෙරමුණු ක්‍රියාකාරියෙකුට දීමෙන් හෝ එකී ක්‍රියාවට ඕනැකමින් හෝ වෙනත් ආකාරයකින් ආධාර හෝ අනුබල දුන්නේ යයි හෝ අපහට නිගමනය කළහැකි විශ්වසනීය කරුණු කිසිවක් නැත. එසේම ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාවලට ආධාර කලේ යයි නිගමනය කිරීමට එබඳු කරුණු ඇත්තේද නැත.

XXIII. උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට සම්බන්ධ තිල විස්තරය ව්‍යාජ එකකි. උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන, කඳුරුවගේනගේ ජිනදාස විසින් තමා වරදට පටලවමින්, විශේෂයෙන්ම සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ලවූ ප්‍රහාරය පිළිබඳ වරදට පටලවමින් පොලීසියට සාක්ෂි දෙනු ඇත යන බිය නිසා ඔහු 1990 පෙබරවාරි මස 20 වන දින රාත්‍රියේ පොලිස් සේවයෙන් හදිසියේ බැහැරව ගියේය යන අදහසට කිසිදු පදනමක් නැත.

XXIV. පෙරකී රෝහිත ප්‍රියදර්ශනගේ අතුරුදහන්වීම සිදුකිරීමට සහකාර පොලිස් අධිකාරී කීර්ති අතපත්තුගේ ඍජු සම්බන්ධයක් තිබේ.

XXV. රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමත් සමඟම වූ කාලසීමාවේදී හා එම අතුරුදහන්වීම ගැන මෙම කොමිෂන් සභාව විසින් පරීක්ෂා කර බලනු ලැබූ කාලසීමාවේදී ඊට සම්බන්ධ නිවැරදි සිද්ධීන් යටපත් කිරීමට නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ, සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් සහ සහකාර පොලිස් අධිකාරී කීර්ති අතපත්තු ක්‍රියා කළහ.

XXVI. පෙරකී රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීම සම්බන්ධයෙන් නිසි හා නිත්‍යානුකූල පියවර ගැනීමට නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තලිත් දෙල්ගොඩ සහ සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් අසමත් වූහ.

XXVII. සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්, රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට අනියමින් සම්බන්ධය. ඉහත සඳහන් රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමෙන් පසු ඔහු සොයා ගැනීමට අවංක පියවර ගත් අජිත් ජයසිංහ ඔහු විසින් පැහැර ගෙන ගොස් රඳවා තැබීමෙන් ප්‍රධාන වශයෙන්ම මේ සඳහා වූ සාක්ෂි ලැබේ. ( ඊලඟ තිර්ණෙය විෂය යටතේ මෙම කාරණය ගැන කරුණු සඳහන් කෙරෙනු ඇත.)

(ආ) 1990 පෙබරවාරි මස 24 වන දින හෝ ඊට ආසන්න කාලයේදී පැලියගොඩ පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ අත්අඩංගුවට ගැනීමට හා ඊට පසු රඳවා තැබීමට සම්බන්ධ තත්ත්වයන් සහ එකී අත්අඩංගුවට ගැනීමට හා රඳවා තැබීමට කෙලින්ම හෝ අනියමින් වගකිවයුතු පුද්ගලයා හෝ පුද්ගලයින් සහ පෙරකී අජිත් ජයසිංහ අත්අඩංගුවට ගැනීම හා රඳවා තැබීමට ආධාර හෝ අනුබල දුන් පුද්ගලයින්.

I. 1990 පෙබරවාරි මස 24 දිනට පූර්වයෙන් වූ කාලසීමාවේදි පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ වරදක් වන ක්‍රියාවක් සිදුකර හෝ එබඳු ක්‍රියාවකට සම්බන්ධව සිට නැත. එමනිසා 1990 පෙබරවාරි මස 24 වන දිනට පෙරකී අජිත් ජයසිංහ අත්අඩංගුවට ගැනීමට යුක්තියක් නොතිබුණු බව මෙම කොමිෂන් සභාවේ අදහසයි.

II. 1990 පෙබරවාරි මස 24 වන දිනට පූර්වයෙන්ම වූ කාලසීමාව තුළදී උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ, උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන හදිසියේ අතුරුදහන්වීමට තුඩු දුන් තත්ත්වයන් සම්බන්ධයෙන් අවංකවම විමර්ශණයන් කිරීමටද, එකී රෝහිත ප්‍රියදර්ශන 1990 පෙබරවාරි මස 20 වන දින අතුරුදහන්වීමෙන් පසු ඔහුට සිදුවූයේ කුමක්ද යන්න ගැන විමර්ෂණයන් කිරීමටද, උනන්දු සහගත හා අවංක ඕනෑකමකින් ක්‍රියා කළේය.

III. ඉහතින් වූ ඡේදයෙහි සඳහන් උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහගේ හැසිරීම නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්. (මෙරිල්) ගුණරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තලිත් දෙල්ගොඩ, සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් සහ පොලිස් පරීක්ෂක කීර්ති අතපත්තු ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ විරුද්ධත්වයට භාජනය විය.

IV. උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශනගේ අතුරුදහන්වීම ගැන අජිත් ජයසිංහගේ විශ්වාසය වූයේ එය කැලණිය ප්‍රාදේශයේ උසස් පොලිස් නිලධාරීන් විසින් හෝ ඔවුන්ගේ උපදෙස් මත හෝ සිදුකරන ලද්දක් බවය. 1990 පෙබරවාරි මස 20 වන දින සිට 24 වන දින දක්වා වූ කාලය තුළ අජිත් ජයසිංහ තමාගේ එම විශ්වාසය කැලණිය ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්ට දැනගන්නට සැළැස්විය.

V. 1990 පෙබරවාරි මස 24 වන දින දෙමටගොඩ දුම්රිය හරස් පාර ආසන්නයේදී සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස්ගේ ප්‍රධානත්වයෙන් වූ පොලිස් නිලධාරි කණ්ඩායමක් විසින් උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ පැහැර ගෙන ( මෙය නීති විරෝධී අත්අඩංගුවකට ගැනීමකට සමාන විය.) ඔහු පෑලියගොඩ පොලිස් ස්ථානයට ගෙන ගියේය. එකී පැහැරගෙන යෑමට සහභාගිවූ අනිකුත් පොලිස් නිලධාරීන් වූයේ පොලිස් සැරයන් ජයරත්න, පොලිස් සැරයන් ලක්ෂ්මන්, පොලිස් සැරයන් රණතුංග, පොලිස් සැරයන් රත්නායක හා පොලිස් කොස්තාපල් රියැදුරු රංජිත් යන අයය. ඉහත සඳහන් පොලිස් නිලධාරීන්ට අමතරව රාජේන්ද්‍ර නම් සිවිල් පුද්ගලයෙක්ද ඉහත කී පැහැරගෙන යෑමට සහභාගී විය. එම පැහැරගෙන යන අවස්ථාවේදී හෝ ඉන් පසුව අජිත් ජයසිංහ අත්අඩංගුවට ගැනීමට යුක්තියක් නොතිබුණු බව අපගේ ස්ථිර විශ්වාසයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව යටතේ වූ අජිත් ජයසිංහගේ මූලික අයිතිවාසිකම් සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස් විසින් උල්ලංඝනය කරන ලද්දේය.

VI. 1990 පෙබරවාරි මස 24 වන දින සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස්ගේ උවමනාව පිට උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ පෑලියගොඩ පොලිස් ස්ථානයේ පැය කිහිපයක් වැරදි ලෙස සිරකොට ගෙන සිටින ලදී. මෙම කාලසීමාව තුළදී අජිත් ජයසිංහ රඳවා ගෙන සිටීමට යුක්ති සහගත හේතුවක් තිබුණේ නැත.

VII. 1990 පෙබරවාරි මස 24 වන දින සිට ඔක්තෝබර් මස 27 වන දින දක්වා උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ, සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස්ගේ ඉල්ලීම පිට කිසිත් යුක්ති සහගත හේතුවක් නොමැතිව බියගම පොලිස් ස්ථානයේ සිරකොට තබා ගන්නා ලදී. මෙම වැරදි සහගත ලෙස සිරකර ගෙන සිටි කාලසීමාව පෙරකී අජිත් ජයසිංහ නීති විරෝධී ලෙස රඳවා ගැනීමකට සමාන වන්නේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (13)2 ව්‍යවස්ථාව යටතේ වන ඔහුගේ මූලික අයිතිවාසිකම් සෘජුවම උල්ලංඝනය කරන ලදී.

VIII. ඉහත සඳහන් පරිදි උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගෙන නීති විරෝධීව රඳවා ගෙන සිටීම ගැන සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස් කෙලින්ම වගකිවයුතු වේ.

IX. උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ ඉහතකී පරිදි නීති විරෝධී ලෙස රඳවා ගෙන සිටීම ගැන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නලින් දෙල්ගොඩ, සහකාර පොලිස් අධිකාරි රාජා ඩයස් සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ අතියමින් වගකිවයුතු වෙති.

ඉහතින් සඳහන් (අ) සහ (ආ) නිර්ණේය විෂයයන් සම්බන්ධයෙන් කොමිෂන් සභාව පහත සඳහන් අතිරේක තීරණවලට බැස තිබේ. මෙම තීරණ ඉහත සඳහන් නිර්ණේය විෂයයන් දෙකටම සෘජුවම සම්බන්ධය.

I. උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශනගේ අතුරුදහන්වීමට කරුණු සැලැස්වීමෙන් පසුව හා උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ නීති විරෝධී ලෙස රඳවා තැබීමට සැලැස්වීමෙන් පසු, පෙරකී නීති විරෝධී ක්‍රියාවන්ට වගකිවයුතු අය

(අ) රෝහිත ප්‍රියදර්ශන ඔහුගේ නිදහස් කැමැත්ත අනුවම අතුරුදහන්වී ඇත්තේය හා
(ආ) අජිත් ජයසිංහ කඩාකප්පල්කාරී ක්‍රියාවන්ට ඔහුගේ ඇති සම්බන්ධය නිසා අත්අඩංගුවට ගෙන රඳවා තබන ලද්දේය

යන හැඟීම දිමට තැත් කලෝය.

මේ අනුව, රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වූයේ කුමක් නිසාද යන්න පහදාදීමක් වශයෙනුත් හා අජිත් ජයසිංහ අත්අඩංගුවට ගෙන රඳවා තැබීම යුක්ති සහගත බව දැක්වීමටත් ව්‍යාජ සාක්ෂි ගෙතීමට පෙරකී පුද්ගලයෝ කුමන්ත්‍රණය කලහ.

II. 1990 පෙබරවාරි මස 25 වන දින හෝ ඊට ආසන්න කාලයේදි සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් විසින් ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ සහ සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ගේ ඉල්ලීම පිට කදුරුවහේනගේ ජිනදාස නමැති සැකකරුවකුගෙන් ව්‍යාජ පාපෝච්චාරණ ප්‍රකාශයක්සටහන් කර ගන්නා ලදි. ඉහත සඳහන් ජිනදාස ඇත්ත වශයෙන්ම අදාල පාපෝච්චාරණ ප්‍රකාශයේ සඳහන් වචන කට වචනයෙන් ප්‍රකාශ කරන ලද බව ඔප්පු කරන විශ්වාසදායක සාක්ෂි නැත. මෙම ප්‍රකාශයන් උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන හා උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ ඉහත සඳහන් ජිනදාසට සපුගස්කන්ද පොලීසියට එල්ලවූ ප්‍රහාරය සැලසුම් කිරීමට ආධාර කලේය යන වරදට පටලැවීමට තුඩු දෙන්නේය. ඉහත සඳහන් පාපෝච්චාරණ ප්‍රකාශයෙහි, සපුගස්කන්ද පොලීසියට එල්ලවූ ප්‍රහාරය ගැන පලමු විමර්ෂකයින් විසින් ලබාගන්නා ලද සාක්ෂිවලට පරස්පර විරෝධී වූ කරුණු අන්තර්ගත වන්නේය.

III. ඉහත සඳහන් ජිනදාසගේ පාපෝච්චාරණ ප්‍රකාශයේ වාර්තාව, රෝහිත ප්‍රියදර්ශන සහ අජිත් ජයසිංහ වරදෙහි පටලැවීමට මනාව සැලසුම් කල උපාය මාර්ගයක් බව පෙන්නුම් කරන ප්‍රමාණවත් පැහැදිලි කරුණු තිබෙන බව කොමිෂන් සභාවේ අදහසය. උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන හා උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ වරදෙහි පටලැවීමට තුඩු දෙන ඉහතකී කරුණු අසත්‍ය කරුණු ලෙසට කොමිෂන් සභාවේ සම්පූර්ණ අවිශ්වාසයට ලක්වන අතර කොමිෂන් සභාව ඒවා ප්‍රතික්ෂේප කරයි.

(ඇ) රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ පුද්ගලයින් රඳවා තබා ගැනීමේ ස්ථානයක් හෝ ස්ථාන පිහිටුවා පවත්වාගැනීම සහ 1988 ජනවාරි මස 01 වන දිනෙන් ආරම්භව 1990 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාවේදි එකී ස්ථානයේ හෝ ස්ථානවල කිසියම් පුද්ගලයෙක් හෝ පුද්ගලයෝ රඳවනු ලැබ සිටියෝද, ඔවුනු

**අමාත්‍යාංශික හා ආත්ම ගෞරවය කෙලෙසන ක්‍රියාවන්ට හෝ කුමන්ත්‍රණයක ප්‍රතිඵලය ලෙසට යම් ලිඛිත නීතියක් යටතේ වරදක් වන සැලකිල්ලකට භාජනය කරන ලද්දෝද යන වග සහ එකී ක්‍රියා සඳහා සෘජුවම හෝ අනියමින් වගකිවයුතු වන පුද්ගලයා හෝ පුද්ගලයෝ.**

I. 1986 න් ආරම්භව විවිධ අවධිවලදී රනිල් වික්‍රමසිංහ මහතා ( එම මහතා අදාළ කාලසීමාව තුළදී කැබිනට් අමාත්‍යවරයෙක් විය.) රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ අදාළ බලධාරීන්ට, එකී සංස්ථාවට අයත් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස කැලණිය පොලිස් කොට්ඨාසයේ පොලිස් නිලධාරීන්ට වෙන්කොට මුදාලන ලෙස නියම කර තිබේ.

II. විශේෂයෙන්ම 1988 ජනවාරි 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වන දින දක්වා වන කාලසීමාවේදී රනිල් වික්‍රමසිංහ මහතාගේ නියමය පරිදි රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරු වන අසෝක සේනානායක මහතා ඉහත සඳහන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ දළ වශයෙන් නිවාස දහතුනක් (13ක්) පමණ සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතාට ( කැලණිය පොලිස් කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරී - මෙහෙයුම්) වෙන්කර මුදාහැර තිබේ. ඉහතකී ඩග්ලස් පීරිස් මහතා ඉහතකී නිවාස භාර ගෙන කැලණිය පොලිස් කොට්ඨාශයේ පොලිස් නිලධාරීන්ට විශේෂයෙන්ම කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන්ට වෙන්කර දී තිබේ. පෙරකී සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් රනිල් වික්‍රමසිංහ මහතා මාර්ගයෙන් ඉහතකී නිවාස ඉහතකී පොලිස් නිලධාරීන් සඳහා ලබාගැනීම ගැන වගකිවයුතු වේ.

III. ඉහත සඳහන් නිවාස පොලිස් නිලධාරීන් සඳහා ලබාගැනීමේ කටයුත්ත, සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් විසින් පොලිස් දෙපාර්තමේන්තුවේ කිසිත් අවසරයක් නැතිවත්, පොලිස් දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාවල සඳහන් පිළිගත් පොලිස් දෙපාර්තමේන්තු කාර්ය පරිපාටීන්ට පටහැනිවත් සිදුකර තිබේ. ඒ අනුව පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් ඔහුගේ බලතල මේ සම්බන්ධයෙන් අයුතු ලෙස පාවිච්චි කිරීම ගැන වගකිවයුතු වේ.

IV. රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරුට ඉහත සඳහන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස පොලිස් නිලධාරීන්ට මුදාලීමට නියම කිරීමෙන් රනිල් වික්‍රමසිංහ මහතා කර්මාන්ත අමාත්‍යවරයාගේ තත්ත්වයෙන් වූ ඔහුගේ බලතල අයුතු ලෙස පාවිච්චි කර තිබේ.

V. පොලිස් නිලධාරීන් සඳහා බටලන්ද නිවාස ලබා ගන්නා ලද මුල් අවස්ථාවේ සිටම එකී නිවාස පොලිස් දෙපාර්තමේන්තු රෙගුලාසිවලට පටහැනිව හා ඒවා උල්ලංඝනය කරමින් ලබාගන්නා ලද බවත්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ (එවකට සිටි කැලණිය පොලිස් කොට්ඨාශයේ කාර්ය භාර නිලධාරියා) දැන සිටියේය. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ, එකී ව්‍යවස්ථා උල්ලංඝනය කිරීමට විරුද්ධව කිසි පියවර ගැනීමෙන් ඕනෑකමින්ම වැළකී සිටියේය. මේ සම්බන්ධයෙන් අදාළ පොලිස් දෙපාර්තමේන්තු රෙගුලාසි

ක්‍රියාත්මක නොකිරීම ගැනද ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ වගකිවයුතු වේ.

VI. මෙහි පහතින් නම් ලැයිස්තු කොට දක්වා ඇති කැලණිය පොලිස් කොට්ඨාශයේ පොලිස් නිලධාරීන්ට බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස පහසුකම් සළසා දෙනු ලැබූ අතර, ඔවුනු එම නිවාස පහසුකම් තමන් සඳහා අදාල පොලිස් දෙපාර්තමේන්තු රෙගුලාසිවලට පටහැනිව ලබාගෙන තිබෙන බව දැන දැනම හෝ ඒ බව විශ්වාස කිරීමට හේතු සාධක ඇතිව එම නිවාස පහසුකම් පිළිගත්හ.

(අ) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ
(ආ) සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්
(ඇ) ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ

(ඈ) පොලිස් කොස්තාපල් රණතුංග
(ඉ) පොලිස් සැරයන් රත්නායක
(ඊ) පොලිස් කොස්තාපල් සුනිල් පෙරේරා
(උ) කාන්තා පොලිස් කොස්තාපල් කාන්ති ප්‍රනාන්දු
(ඌ) පොලිස් සැරයන් ලක්ෂ්මන් ඩයස්
(එ) පොලිස් කොස්තාපල් හීන්බණ්ඩා
(ඒ) පොලිස් පරීක්ෂක සුදත් චන්ද්‍රසේකර
(ඔ) ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.මහනායක
(ඕ) සහකාර පොලිස් අධිකාරී එච්.ජී.වික්‍රමසිංහ
(ක) සහකාර පොලිස් අධිකාරී ආර්. ධර්මරත්න
(ග) සහකාර පොලිස් අධිකාරී එච්. චන්ද්‍රදාස
(ජ) පොලිස් පරීක්ෂක එන්.එම්.එස්.බී.තිශ්සංක

( කැලණිය පොලිස් කොට්ඨාශයේ තවත් වෙනත් සමහර පොලිස් නිලධාරීන්ද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ පදිංචි වී සිටි බව විශ්වාස කිරීමට හේතු තිබේ. කෙසේ වුවද ඉහතින් නම් සඳහන් අයට බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස ලැබුණු බවට පැහැදිලි හා තීරණාත්මක සාක්ෂි තිබේ. )

VII. මහ කොළඹ පොලිස් දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස රාජකාරි භාරගෙන සිටි නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්.(මෙරිල්) ගුණරත්න, කැලණිය පොලිස් කොට්ඨාශයේ පොලිස් නිලධාරීන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාසවල පදිංචිව සිටින බව දැන සිටියේය. පෙරකී නිවාස ලබාගෙන තිබුණේ පොලිස් දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාවලට පටහැනිව බව දැන සිටියේය; නොඑසේ නම් ඒ බව විශ්වාස කිරීමට ඔහුට සාධාරණ හේතු තිබුණේය. එසේ වුවද මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩට සහ සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ට ලිඛිත උපදෙස් දීමෙන් ඔහු වැළකී සිටියේය. නියෝජ්‍ය පොලිස්පති ගුණරත්නගේ මෙම

අසමත්වීම නිසා ඉහත සඳහන් පොලිස් නිලධාරීන් බටලන්ද නිවාසවල දිගින් දිගටම පදිංචිවී සිටීම සිදුවිය.

VIII. පොලිස් නිලධාරීන් විසින් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස කිසිත් නීති විරෝධී අරමුණක් සඳහා පාවිච්චි කිරීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීමෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නලින් දෙල්ගොඩ ඕනෑකමින්ම වැලකී සිටියේය.

IX. 1988 ජනවාරි මස 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලසීමාව තුළ බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ යම් යම් නිවාස පුද්ගලයින් නීති විරෝධීව රඳවා ගැනීමට හා ඔවුන්ට වධදීමට පාවිච්චි කර තිබේ. මෙම කාර්යය සඳහා පහත සඳහන් නිවාස පාවිච්චි කර තිබෙන බවට තීරණාත්මක සාක්ෂි තිබේ:

නිවාස පිළිබඳ තත්ත්වය
( නිල වාර්තා පදනම් කොට)

(1) B 2 (අ) 1987 සිට 1989 මැයි දක්වා - හිස්ව තිබිණ.
(ආ) 1989 මැයි සිට 1994 අගෝස්තු මාසය දක්වා රනිල් වික්‍රමසිංහ මහතාගේ කාර්යාලය ලෙස තිබිණ.

(2) B 8 1988 සිට 1991 දක්වා සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස්ට වෙන් කළ ආරක්ෂක නිලධාරීන් විසින් පාවිච්චි කරන ලදි.

(3) B 34 කොමිෂන් සභාවට අදාළ සම්පූර්ණ කාලය තුළම සපුගස්කන්ද පොලිස් ස්ථානයට දී තිබිණ.

(4) A1/8 කිසිත් එක් විශේෂ පොලිස් නිලධාරියෙකුට වෙන්කර දී නොතිබිණි. එසේ වුවද පොලිස් නිලධාරීන්ට ඊට අනවසරයෙන් ප්‍රවේශය ලැබී තිබුණු බව සංස්ථාවේ ඇවරකරුගේ නිරීක්ෂණයට ලක්වී ඇත.

X. 1988 ජනවාරි මස 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලසීමාව තුළ මීට මුලින් වූ ඡේදයෙහි සඳහන් නිවාසවල පුද්ගලයින් නීති විරෝධීව රඳවා තබා වධදීම ගැන මෙහි පහත සඳහන් පොලිස් නිලධාරීහු සෘජුවම වගකිවයුතු වෙති:

1 සහකාර පොලිස් අධිකරි ඩග්ලස් පීරිස්
2 ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ
3 පොලිස් සැරයන් රත්නායක
4 පොලිස් සැරයන් රණතුංග
5 උප පොලිස් පරීක්ෂක දෙල්ගහගොඩ
6 පොලිස් සැරයන් උපාලි ලක්සේනා
7 පොලිස් කොස්තාපල් රියැදුරු රංජිත්
8 පොලිස් කොස්තාපල් ජයවර්ධන
9 පොලිස් කොස්තාපල් හීන්බණ්ඩා
10 පොලිස් සැරයන් කප්පාගොඩ
11 කාන්තා පොලිස් කොස්තාපල් පද්මිනි ප්‍රේමලතා
12 පොලිස් කොස්තාපල් ලක්ෂ්මන්
13 පොලිස් පරීක්ෂක සුනිල් බණ්ඩාර තිස්සංක (ඉන්පසු මියගොස් ඇත.)

ඉහත සඳහන් නිලධාරීන් විසින් සිදුකර ඇති නීති විරෝධී ක්‍රියා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 13(1) හා 13(2) යන ව්‍යවස්ථා උල්ලංඝණය කිරීමකට සමාන වේ.

1988 ජනවාරි මස 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලය තුළ ප්‍රධාන වශයෙන්ම පොලිස් නිලධාරීන් සහභාගිවූ යම් යම් සාකච්ඡා බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ පවත්වා තිබේ. මෙම රැස්වීම් පොලිස් දෙපාර්තමේන්තුව විසින් පිළිගත්තා ලද ඒවා නොවූ අතර, ඒවා සංවිධානය කර තිබුණේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ නියමයන් අනුවද නොවේ. මෙම රැස්වීම්වලට පැමිණි ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගෙන් සමහර දෙනෙක් මෙසේය.

(1) නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්.(මෙරිල්) ගුණරත්න
(2) ජ්‍යෙස්ඨ පොලිස් අධිකාරි නලින් දෙල්ගොඩ
(3) සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස්
(4) සහකාර පොලිස් අධිකාරි රාජා ඩයස්

මෙම සාකච්ඡා පවත්වනු ලැබුයේ අංක B2 ( රනිල් වික්‍රමසිංහ මහතාට වෙන්කොට තිබුණු ඔහුගේ කාර්යාලය වූ නිවසය) හා අංක A2/2 (රනිල් වික්‍රමසිංහ මහතාගේ සංචාරක බංගලාව ලෙසින් වෙන්කර දී තිබුණු නිවසය) යන නිවාසවලය. එකී සාකච්ඡාවල ප්‍රධානත්වය දැරුවේ රනිල් වික්‍රමසිංහ මහතාය. රනිල් වික්‍රමසිංහ මහතාට ( රැස්වීම් කැඳවා තිබුණේ ඔහුය) මෙම රැස්වීම් කැඳවීමට බලයක් නොතිබුණි. රනිල් වික්‍රමසිංහ මහතා මෙම රැස්වීම් කැඳවීමෙන් ඔහුගේ බලතල පැහැදිලිවම අයථා ලෙස පාවිච්චි කර ඇත. තවද, ඉහතින් සඳහන් පොලිස් නිලධාරීහු මෙම රැස්වීම්වලට සහභාගිවීමෙන් අවසර නොලත් කාර්යයකට සහභාගිවූවා වෙති.

XI. ඉහතින් සඳහන් අවසර නොලත් රැස්වීම්වලදී රනිල් වික්‍රමසිංහ මහතා ( රනිල් වික්‍රමසිංහ මහතා එවකට කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයා විය) කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන කටයුතු සම්බන්ධයෙන් පොලීසියේ ක්‍රියා

කලාපයට අදාලව උපදෙස් දී ඇත. වික්‍රමසිංහ මහතාට එබඳු නියමයන් කිරීමට නෛතික බලයක් නොමැති වූ බවත්, ඒ සම්බන්ධයෙන් ද ඔහු තම බලය අයථා ලෙස පාවිච්චි කර ඇති බවත් කොමිෂන් සභාවේ අදහසයි. එසේ උපදෙස් දීමෙන් වික්‍රමසිංහ මහතා නියම් වශයෙන්ම පොලිසිය සතු රාජකාරිවලට හා නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා මාර්ගයට මැදිහත්වී ඇත්තේය.

XII. ඉහත සඳහන් බලය නොලත් රුස්වීම්, බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධි රැඳවීමේ ස්ථාන හා වධකාගාර පැවැත්වීම සමග බේරිය නොහැකි ලෙසින්ම වෙලී පැටලී තිබේ.

XIII. රනිල් වික්‍රමසිංහ මහතා විසින් රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරුට බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස වෙන්කර මුදාලන ලෙසට දෙන ලද උපදෙස් වලින් අංක B2, B8, B34 හා A1/8 යන නිවාසවල නීති විරෝධි රැඳවුම් මධ්‍යස්ථාන පිහිටුවීමට පහසුකම් සැලසිණ.

XIV. රනිල් වික්‍රමසිංහ මහතා හා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නලින් දෙල්ගොඩ මහතා, බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ B2, B8, B34 හා A1/8 යන නිවාසවල නීති විරෝධි රැඳවුම් ස්ථාන හා වධකාගාර පැවැත්වීමට අනියමින් වගකිවයුතු වන්නෝය.

XV. නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්.(මෙරිල්)ගුණරත්න කලින් ජේදයෙහි සඳහන් නීති විරෝධි ක්‍රියාව ගැන දැන ගෙන සිටිමින් හෝ එම නීති විරෝධි ක්‍රියාව සිදුවන බව විශ්වාස කිරීමට හේතු තිබියදී එම නීති විරෝධි කටයුත්ත දිගින් දිගට සිදුවීම වැලැක්වීමට අවශ්‍ය සුදුසු, නීත්‍යානුකූල හා අවශ්‍ය පියවර ගැනීමෙන් වැලකුණේය.

XVI. සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස් සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ, බටලන්ද යෝජනා ක්‍රමයේ ඉහත සඳහන් නීති විරෝධි රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පැවැත්වීම සම්බන්ධයෙන් සෘජුවම වගකිවයුත්තෝය. (පෙරකී නීති විරෝධි රැඳවුම් ස්ථානවල රඳවා ගනු ලැබ සිටි බොහෝ දෙනා ඊට කලින් කැලණිය කඩාකප්පල්කාරි ක්‍රියා මර්දන ඒකකයට අනුයුක්ත පොලිස් නිලධාරීන් විසින් පැහැරගෙන යන ලද බව සැලකියයුතුය.)

XVII. කැලණිය පොලිස් කොට්ඨාසයේ කඩාකප්පල්කාරි ක්‍රියා මර්දන ඒකකය, මෙම කොමිෂන් සභාවට අදාල කාලසීමාව තුලදී එහි බොහොමයක් කටයුතු බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ සිට මෙහෙයවන ලදී.

XVIII. කැලණිය කඩාකප්පල්කාරි ක්‍රියා මර්දන ඒකකයේ කටයුතු, එබඳු කටයුතු පැවැත්වීමට බලයක් නොමැති ස්ථාන වූ බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ

නිවාසවල සිට මෙහෙයවන ලද බව එවකට පොලිස්පති අර්නස්ට් පෙරේරා දැන සිටියේය. ඒ බව දැන සිටියද අර්නස්ට් පෙරේරා මහතා ඒ සම්බන්ධයෙන් උචිත හා අවශ්‍ය පියවර ගැනීමෙන් වැළකී සිටියේය.

## සමාප්ති නිරීක්ෂණ සටහන්.

ප්‍රාරම්භක පරිච්ඡේදයෙහි සඳහන් කරන ලද පරිදි 1988 සිට 1990 දක්වාවූ කාලසීමාව භීෂණ සමයක් විය. ජනතා විමුක්ති පෙරමුණ ( J.V.P.) දරුණු ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකිරීමෙහි යෙදුණු අතර, ඊට එරෙහිව එවකට පැවති රජය ඇතුලත හා පිටත වූ බලවේග විසින් ඒ හා සමානම සාපරාධී ක්‍රියා සිදුකරන ලදී. ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව ක්‍රියා කළ රජය පිටත වූ බලවේග (සෝදිසි කණ්ඩායම් වැනි) පොලීසියේ හා සන්නද්ධ හමුදාවල ආශීර්වාදය ඇතිව එසේ කළහ. ඇතැම් අවස්ථාවල එම බලවේග පොලීසිය බඳු රජයේ බලවේග සමග කුමන්ත්‍රණකාරී සම්බන්ධයෙන් යුතුව ක්‍රියා කළහ. රජය කඩාකප්පල්කාරීන් අත්අඩංගුවට ගැනීමට හා ඉවත් කරලීමට උනන්දුව දැක්වූ නමුත්, එම අරමුණු ඉටුකර ගැනීමට උපයෝගී කර ගන්නා ආකාරය ගැන තැකීමක් නොකළ බව තීරණය කිරීමට ප්‍රමාණවත් වන කරුණු තිබේ. රජයේ බලවේග විසින් ඔවුන්ට එරෙහිව අනුගමනය කරන ලද උපාය මාර්ග අතරට පැහැර ගෙන යෑම හා ඝාතනය කිරීම වැනි අධිකරණ ක්‍රමයෙන් බාහිර ක්‍රියාද ඇතුලත් විය. රජයේ බලවේග විසින් අධිකරණ ක්‍රමයෙන් බාහිර ක්‍රියාවල යෙදීම වැලැක්වීමට ප්‍රමාණවත් පියවර ගැනීමෙන් වැලකිණ. අධිකරණ ක්‍රමයෙන් බාහිර ක්‍රියාවල යෙදෙන බවට චෝදනා ලැබුණු අය රජය විසින් ආරක්ෂා කරනු ලැබිණ. එවකට සිටි රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා යුක්තිය පසිඳලීමේ හා නීතිය ක්‍රියාත්මක කිරීමේ සාමාන්‍ය ක්‍රියාදාමයට මැදිහත්වූ අවස්ථාවක් ගැන එවකට සිටි පොලිස්පතිවරයා සාක්ෂි දුන්නේය. මාධ්‍යවේදී රිචඩ් ද සොයිසා ඝාතනය කිරීමට සම්බන්ධයක් තිබීම නිසා අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලැබ සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු අත්අඩංගුවට නොගැනීමට එකී අමාත්‍යවරයා විසින් පොලීසිය පොළඹවනු ලැබූ බව එවකට සිටි පොලිස්පතිවරයා සාක්ෂිදෙමින් කිය. මෙම කොමිෂන් සභාවට මෙබඳු තවත් අවස්ථාවක් ගැන දැනගන්නට ලැබිණ. නීතිඥ විජේදාස ලියනාරච්චි ඝාතනය කිරීම ගැන ඇටෝර්නි ජනරාල්වරයා විසින් පොලිස් නිලධාරීන් තුන්දෙනෙකුට විරුද්ධව අධි චෝදනා ඉදිරිපත් කරන ලදී. මෙම චූදිතයන් වෙනුවෙන් පෙනී සිටි අධිනීතිඥවරයාගේ ගාස්තු රජය විසින් ගෙවන ලද බවට වන සාක්ෂි කොමිෂන් සභාවට ලැබී තිබේ. එවකට පැවති රජයේ ආකල්පය සමස්තයක් වශයෙන් මෙම සිද්ධීන්ගෙන් පැහැදිලිව පෙන්නුම් කරනු ලැබේ.

ජනතා විමුක්ති පෙරමුණේ හෝ ඊට සම්බන්ධ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය බඳු සංවිධානවල හෝ සාමාජිකයින් විසින් සිදුකරන ලද ත්‍රස්තවාදී ක්‍රියාවලට අප කිසි ලෙසකිනුත් සමාව නොදෙන බව අපි ස්ථිරවම ප්‍රකාශ කරනු කැමැත්තෙමු. ඔවුන් ත්‍රස්තවාදී ක්‍රියාවල යෙදීමට පෙළඹවූ හේතු කුමක් වුවත් දේශපාලන බලය ලබාගැනීම සඳහා 1987 සිට 1990 දක්වා වූ කාලසීමාවෙහි ඔවුන් අනුගමනය කරන ලද ක්‍රමවලට ඇස කණ පියා ගැනීමට අපට නොහැකිය. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචණ්ඩ ක්‍රියාවල ප්‍රතිඵලය ලෙසට දේශපාලනඥයින්, දේශපාලන ක්‍රියාකාරීන්, පොලිස් නිලධාරීන් හා සිවිල් වැසියෝ සිය ගණනක් ජීවිතක්ෂයට පත්වූහ. ප්‍රචණ්ඩ ක්‍රියා රජයේ සංවිධානවල සාමාන්‍ය ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපෑ අතර, ඇතැම්

අවස්ථාවල එම ක්‍රියා නිසා අත්‍යවශ්‍ය සේවා අඩපණ විය. එහි ප්‍රතිඵලය ලෙසට පොදු මහජනතාවට අති විශාල දුෂ්කරතාවලට මුහුණපෑමට සිදුවිය. එමනිසා මෙයින් පැන නැඟුණු තත්ත්වය අති විශේෂ ස්වභාවයේ එකක් විය. එම භීෂණ ක්‍රියා නිසා අරාජික තත්ත්වයක්ම වාගේ උද්ගත විය.

කෙසේ වුවද, පැවති තත්ත්වය කුමක් වුවත්, වගකීමේ හැඟීමෙන් යුත් රජයක් ඊට ප්‍රතිචාර දැක්විය යුත්තේ නීතියේ ආධිපත්‍යයට අනුකූලවය. ආණ්ඩු කිරීම සිදුවිය යුත්තේ පිළිගත් නීත්‍යානුකූලව වලංගු වන සම්මතයන්ට අනුකූලවය. නීති ක්‍රියාත්මක කිරීම සිදුවිය යුත්තේ අදාළ නීතිරීති අනුවය. එහෙයින් ජනතා විමුක්ති පෙරමුණෙන් කෙතරම් ප්‍රකෝප කරනු ලැබීමක් සිදුවුවද, එම ජනතා විමුක්ති පෙරමුණු ක්‍රියාවන්ට ප්‍රතික්‍රියාවක් වශයෙන් එකල රජය විසින් " අධිකරණ ක්‍රමයෙන් බාහිර" ක්‍රියාවන්ට අනුමතිය දී මෙහෙයවීමක් සිදුනොවියයුතු විය. එකල රජය ඇත්ත වශයෙන්ම ජනතා විමුක්ති පෙරමුණෙන් සිදුකරනු ලැබූ ත්‍රස්තවාදී ක්‍රියා රැල්ල පාලනය කිරීම සඳහා අධිකරණ ක්‍රමයෙන් බාහිර ක්‍රම අනුගමනය කර තිබෙන බව අප සැලකිල්ලට ගන්නේ කණගාටුවෙනි. ජනතා විමුක්ති පෙරමුණේ ත්‍රස්තවාදය රාජ්‍ය ත්‍රස්තවාදයෙන් මෙල්ල කිරීමට තැත් කරන ලදී. එම ක්‍රියාදාමයේදී නියම ත්‍රස්තවාදීන් සමහරක් ඉවත් කරනු ලැබුවා පමණක් නොව වෙනත් කිසිත් නීති විරෝධී ක්‍රියාවකට වගකිවයුතු නොවූ අහිංසක තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවකට එක්කෝ හානි පමුණුවනු ලැබූහ; නොඑසේ නම් ඔවුන් ඝාතනය කරනු ලැබූහ. මෙම කාලසීමාවේදී පාලක පක්ෂයේ දේශපාලනඥයෝ පොලිසියේ කටයුතුවලට ක්‍රියාශීලීව සහභාගීවූහ. ඇතැම් අවස්ථාවල ඔවුහු පොලිසියේ කටයුතු මෙහෙයවූහ. ඉහතින් සඳහන් කාලසීමාවේ සිදුවූ කරුණු පිළිබඳව " බටලන්ද සිද්ධිය" එක් උදාහරණයක් පමණකි.

මෙබඳු අවාසනාවන්ත හා තුච්ඡ ක්‍රියා තවත් කිසි දිනෙක ශ්‍රී ලංකාවේ මින්මතු දක්නට නොලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

## X වන පරිච්ඡේදය.

### නිර්දේශය

(1) මුලින් වූ පරිච්ඡේදවල විස්තරාත්මකව පැහැදිලි කරන ලද පරිදි, නීති විරෝධිව රඳවා ගැනීමේ ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාමට තුඩුදුන් එක් ප්‍රධාන හේතුවක් නම් එවකට පැවති රජයේ දේශපාලනඥයින් සහ පොලිසිය 1987 සිට 1990 දක්වා පැවති කැරැල්ලට ප්‍රතිචාරයක් වශයෙන් හැසිරුණු ආකාරයයි. කලින් සඳහන් කරන ලද පරිදි, ප්‍රකෝප කරනු ලැබූ ප්‍රමාණය කොපමණ වුවත් වගකිවයුතු රජයක් හා එහි සංවිධාන කැරැල්ලක් පැවති කාලසීමාවක පවා එම ප්‍රකෝප කිරීමට එරෙහිව ප්‍රතික්‍රියා දැක්වීම සිදුවිය යුතු ආකාරය පාලනය කරන යම් යම් ව්‍යවස්ථා තිබියයුතුය. සිදුකෙරෙන සියළුම ක්‍රියා නීතියේ ආධිපත්‍යයට අනුකූල වියයුතුය. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති සියළුම පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කළයුතුය.

මෙම කාරණා සවිස්තරාත්මකව සාකච්ඡා කොට රටේ සාමයට හා මහජන විනයට බරපතල තර්ජනයක් එල්ලවී තිබෙන අති විශේෂ තත්ත්වයක් පවතින කාලසීමාවන්හිදී දේශපාලනඥයින්ගේ හා නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්ගේ පැවැත්මට අදාළ වන ගුරුපදේශ මාලාවක් යෝජනා කිරීම සඳහා අතිගරු ඔබතුමිය (පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වැනි) මහජන නියෝජිතයින්ට කාරුණිකව ආරාධනා කරනු යෙහෙකැයි අපි නිර්දේශ කරමු. අවශ්‍ය වෙතොත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවත් ඇතුළු වත්මන් නීතිරීතිවලට සුදුසු සංශෝධන ගෙනඒම සලකා බැලියයුතුය. මෙම ක්‍රියාදාමයේදී මහජනතාවට හා සියළු සමාජ කණ්ඩායම්වලට සිය අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාවක් දීම නිර්දේශ කරමු.

මහජන නියෝජිතයින් තමන් සඳහාම " ආචාර රීති පද්ධතියක්" සකස් කොට ගෙන සම්මත කර ගැනීම උචිත වනු ඇත. යම් මහජන නියෝජිතයෙක් (පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු බඳු) පෙරකී ආචාර රීති පද්ධතිය උල්ලංඝණය කිරීමේ වරදට අසුවුවහොත් අදාළ මණ්ඩලයේ අනිකුත් සාමාජිකයින්ට වරදට හසුව සිටින සාමාජිකයාට විරුද්ධව දෝෂාභියෝගයක් ඉදිරිපත් කිරීමේ අයිතිය හිමි වියයුතු යයි නිර්දේශ කරනු ලැබේ. එසේ දෝෂාරෝපණයට ලක්කරනු ලැබීමෙන් පසු අදාළ සාමාජිකයා යම් නියමිත කාලසීමාවකට මහජන නියෝජිතයෙකුවීම අහෝසි විය යුතුය.

(2) මුලින් වූ පරිච්ඡේදවල ප්‍රකාශ කරන ලද පරිදි, ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් විසින් මෙන්ම එවකට පැවති රජයේ දේශපාලනඥයකු විසිනුත් මානව අයිතිවාසිකම් බරපතල ලෙස උල්ලංඝණය කරනු ලැබූ ආකාරය අප විසින්

නිරීක්ෂණය කොට ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා තිබෙන අධිකරණ



නිරීක්ෂණය කොට ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා තිබෙන අධිකරණ බලයත්, එම අධිකරණය විසින් එම අධිකරණ බලය උචිත ලෙස ක්‍රියාත්මක කිරීමත් නොතකාම පෙරකී අයිතිවාසිකම්, දඩුවම් විඳීමට සිදුවන බියක් නොමැතිවම පිට පිට උල්ලංඝණය කර තිබෙන බව අපට පෙනී යයි. විධායකය නියෝජනය කරන යම් යම් පුද්ගලයින් විසින් මූලික මිනිස් අයිතිවාසිකම් දිගින් දිගටම උල්ලංඝණය කරනු ලැබීමට එක් හේතුවක් නම් ඔවුන්ගේ හැසිරීම අප්‍රමාදව ක්‍රියාත්මක වන හා උචිත දඩුවම්වල තරවටුවට ලක් නොවීමය. පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් පිට පිටම උල්ලංඝණය කර ඇතැයි හඳුනාගනු ලබන පුද්ගලයින්ගේ "ප්‍රජා අයිතිවාසිකම් අහිමි කිරීමේ" ස්වරූපයෙන් වූ සුදුසු දඩුවම් එම පුද්ගලයින්ට පැමිණවීමට අවශ්‍ය අතිරේක අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරීම අපි නිර්දේශ කරමු.

(3) බටලන්දේ නීති විරෝධිව පුද්ගලයින් රඳවා ගැනීමේ ස්ථාන හා වධකාගාර පිහිටුවා පැවැත්වීම ගැන සෘජුවම හෝ අනියමින් දැනගන්නට යෙදුණු යම් යම් පුද්ගලයින් ඒ ගැන පොලිසියට පැමිණිලි කිරීමෙන් වැළකී සිටියේ තමන්ට හිරිහැර කරනු ලැබීමේ හා තම ජීවිත අනතුරට පත්වීමේ බිය නිසා බව මෙම පරීක්ෂණය කරන අතරතුරේදී අපගේ නිරීක්ෂණයට ලක්විය. තවත් හේතුවක් නම් මෙම ක්‍රියාවලට වගකිවයුතු අය පොලිස් නිලධාරීන්ම වූ නිසා මෙම තත්ත්වය වැළැක්වීමට ක්‍රියා නොකරනු ඇතැයි විශ්වාස කිරීමට ඔවුන්ට හේතු තිබීමය. එම හේතුව නිසාම සාධාරණ හා අපක්ෂපාතී විමර්ශණයක් ඔවුන් බලාපොරොත්තු වූයේ නැත.

මෙබඳු අවස්ථාවලදී අධිකරණ නිලධාරීන්ට ( මහේස්ත්‍රාත්වරුන් බඳු) විමර්ශණයන් කිරීමට කරුණු සලස්වා ඒවා අධීක්ෂණය කර ඒ සම්බන්ධයෙන් අපරාධ නීති කෘත්‍යය සිදුකිරීම සලකාබැලීම සඳහා තම විමර්ශණාත්මක තීරණ ඇටෝර්නි ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමට බලය පැවරීම් සුදුසු බව අපගේ මතයයි. අදාල අධිකරණ අධිකාරීන්ට, නීති විරෝධී කටයුතු ක්‍රියා සිදුවේ යැයි සැක කරනු ලබන ස්ථානයට ගොස් ඒවා පරීක්ෂා කිරීමට බලය පැවරීම අනිකුත් විමර්ෂක බලතල අතර වියයුතුය. මේ සම්බන්ධයෙන් අතිගරු ඔබතුමිය, මෙහි අන්තර්ගත නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අපරාධ නඩු සංවිධාන සංග්‍රහ පනතට සුදුසු සංශෝධන සකස් කිරීම සලකා බැලීම සඳහා කාරුණිකව කමිටුවක් පිහිටුවීම නිර්දේශ කරමු.

